# THANK YOU. ස්තූතියි. நன்றி

වාර්ෂික වාර්තාව 2020/21

PLC

PEOPLE'S LEASING

පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்

THE TRUSTED LEADER

# THANK YOU. ස්තුතියි. நன்றி

අපගේ වසර අර්ථගැන්වූ සුවිශේෂී හැඟීමක් සමගින්... අපගේ දැවැන්ත සේවා ජාලය නිර්මාණය කරන්නා වූ විශිෂ්ටයින් රැසක් වෙත පමණක් නොව, අපගේ නිපුණත්වය කෙරෙහි විශ්වාසය තබන ලද සුවහසක් ජනතාව වෙනුවන් අපගේ නිහතමානී වූ ප්‍රණාමය මෙසේ පුදනු ලැබේ. මෙම වසරේදී, 25 වසරක් පුරා අපගේ සියලු පාර්ශවකරුවන් සමග වූ සොඳුරු මතකයන් ආවර්ජනය කරමින්, ඉදිරි දශක කිහිපය හා ඉන් ඔබ්බට ජයග්‍රාහීව ගමන් කිරීම සඳහා ඔවුන්ගේ ශක්තිය හා ධෛර්යය නිරන්තරයෙන් ලබාගැනීමට අපි කටයුතු කරමු. අපගේ සාංගමික සංචාරය තුළ ඉදිරියට පියවර තබන සෑම මොහොතකම අපි ඔබට ස්තුතිවන්ත වෙමු.

ඔබගේ නිරන්තර සහයෝගය නොවන්නට අපි පීපල්ස් ලීසිං නොවන්නට ඉඩ තිබිණි.

# WE APPRECIATE YOU

ලොවම අකර්මන්‍ය කරමින් කෝවිඩ් වසංගතය පැතිරුනු කල, ඔවුන්ගේ අචල විශ්වාසය අප කෙරෙහිම තබමින් අප හට අඛණ්ඩව දිදුලන්නට ඉඩහසර විවර කලේ අපගේ පාර්ශවකරුවන්ය.



සියලු බාධක මැද, සන්ධිස්ථානීය වසරක අප වෙත සුබපැතුම් එක් කරමින්, ඔවුන්ගේ මූල්‍යමය තීරණ වල සහකරුවා වශයෙන් අප තෝරාගැනීම වෙනුවෙන් දිවයින පුරා විසිර සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත අපගේ ප්‍රණාමය පුදකරමු.



# ස්තූතියි

# THANK YOU

# உங்களுக்கு எமது நன்றிகள்

පසුගිය වසර 25 ක කාලය පුරා අපගේ කතා පුවතේ වැදගත් කොටසක් වූ අපගේ ගනුදෙනුකාර භවතුන් වෙත අපගේ උපහාරය පුද කරමු. අප දියුණුවේ හිනිපෙත්ත කරා ගිය ගමනේ අඩිතාලම වූයේ ඔබගේ ප්‍රශංසනීය සහයෝගයයි.



සෑම අතින්ම, අප වෙත ඔබගේ අචල විශ්වාසය හිමිවීම අප හට අභිමානයකි. අනාගතයේදීද අඛණ්ඩවම ඔබගේ අවශ්‍යතා ඉටු කිරීමට අපි කැප වී කටයුතු කරන්නෙමු.

# WE ARE GRATEFUL

# THANK YOU



# අපගේ ප්‍රණාමය

අපගේ වටිනාකම් සහ සදාචාරාත්මක අගයන් එලෙසින්ම පවත්වා ගනිමින්, ඔබ වෙත විශිෂ්ට සේවාවක් තහවුරු කරන අතර, අපව දියුණුවේ මාවත කරා යොමු කල අපගේ සියලු පාර්ශවකරුවන් වෙත අපගේ ස්තුතිය හිමි වේ.



මුළු දිවයිනෙන්ම, අපගේ සේවා කණ්ඩායම වැඩි ශ්‍රී ලාංකිකයින් පිරිසක් වෙත අපගේ සන්නාමය සමීප කරවීමෙහිලා අප්‍රතිහත ධෛර්‍යයෙන් යුතුව කටයුතු කරන ලදී. අපගේ ව්‍යාපාරයෙහි ජීවනාලිය වූයේ ඒ ඔවුන්ගේ අවංක වූ කැපවීමයි.



உங்களுக்கு எமது பாராட்டுக்கள்

THANK YOU

# පටුන



9 මෙම වාර්තාව පිළිබඳව
11 අප පිළිබඳව
14 විසිපස් වසරක ගමන් මග
16 කාර්යසාධන විශේෂතා - සමාගම
17 සභාපතිවරයාගේ පණිවිඩය
20 ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය

වටිනාකම් ගොඩනැංවීමේ ආකෘතිය
26 වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය
28 පාර්ශවකාර සහභාගීත්වය
30 මෙහෙයුම් වටපිටාව
32 කෝවිඩ් 19 වෙත අපගේ ප්‍රතිචාරය
34 ප්‍රමාණාත්මක කරුණු නිර්ණය කිරීම
38 අපගේ ක්‍රමෝපාය

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය
41 සමූහ ව්‍යාපාරික රේඛීය විමර්ශනය
53 මූල්‍ය ප්‍රාග්ධනය
59 නිෂ්පාදිත ප්‍රාග්ධනය
63 බුද්ධිමය ප්‍රාග්ධනය
70 මානව ප්‍රාග්ධනය
79 සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය
91 ස්වභාවික ප්‍රාග්ධනය
97 අපගේ සමාජ ආර්ථික බලපෑම

නායකත්වය
100 අධ්‍යක්ෂ මණ්ඩලය
104 ආයතනික කළමනාකරණය
108 අනුකූලතා අවදානම් කළමනාකරණය
111 ආයතනික පාලනය
139 සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
144 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව
146 මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව
148 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව
150 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
153 අවදානම් කළමනාකරන විමර්ශනය

මූල්‍ය වාර්තා
163 මූල්‍ය දින දර්ශනය
164 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම
165 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකත්ව වාර්තාව
166 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
167 ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය
168 ස්වාධීන විගණකවරයාගේ වාර්තාව
172 මූල්‍ය ප්‍රකාශනයන් - පටුන
173 ආදායම් ප්‍රකාශය
174 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
175 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
176 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය
178 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
179 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

අනුශාංගික වාර්තා
309 ආයෝජක සබඳතා
317 කාර්තුමය විශ්ලේෂණය
319 දස වසරක සාරාංශය
321 ආදායම් ප්‍රකාශය ඇමරිකානු ඩොලර් වලින්
322 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ඇමරිකානු ඩොලර් වලින්
323 තිරසාරත්වභාවය වාර්තාකරණය සම්බන්ධ ස්වාධීන සහතිකත්ව වාර්තාව
324 GRI අන්තර්ගත දර්ශකය
326 කෙටි යෙදුම්
328 අනුපාතයන්හි පදනම
329 ආයතනික තොරතුරු
330 රැස්වීම පිළිබඳ දැනුම්දීම
333 පෙරකලාසි පෝරමය
335 ප්‍රතිචාර පෝරමය

17
සභාපතිවරයාගේ පණිවුඩය

20
ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය

162
මූල්‍ය වාර්තා

# මෙම වාර්තාව පිළිබඳව



GRI 102-10, 102-12, 102-45, 102-46, 102-48, 102-49 ,102-50, 102-51, 102-52, 102-53, 102-54, 102-56




පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි මෙම 8 වැනි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මගින් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා එහි කාර්යසාධනය පිළිබඳ සමතුලිත සමාලෝචනයක් ඉදිරිපත් කෙරේ. මෙය සිය ප්‍රගතිය පිළිබඳ සමූහයේ පෙර සන්නිවේදනයන්, 2020 මාර්තු 31 අවසන් වූ වසර සඳහා එහි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මත නිර්මාණය වන අතර, එහිදී ආයතනික වාර්තාකරණය පිළිබඳ ජාත්‍යන්තර යහ ක්‍රියාකාරකම් අනුගමනය කිරීම කෙරෙහි සමූහය සතු අභිලාෂය විදහා දක්වේ.

**පිළියෙල කිරීමේ පදනම**

**විෂයපථය සහ සීමාවන්**

මූල්‍ය වාර්තා වලින් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සහ එහි පරිපාලිත සමාගම් හය ("සමූහය") ආවරණය කරයි.

මෙම වාර්තාවේ තිරසාරත්ව වාර්තාකරණ සීමාව මගින් මව් සමාගමෙහි, එනම් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ("සමාගම") හි මෙහෙයුම් ආවරණය කෙරේ.

**නියාමන රාමු සහ ප්‍රමිතීන්**

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ප්‍රමිති
- ලියාපදිංචි මූල්‍ය කල්බදු සමාගම් වෙත නිකුත් කරන ලද නියෝග, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ
- කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනත

**ස්වේච්ඡාවෙන් ආදේශ කරගන්නා ලද ආකෘතික රාමු**

- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ සභාවේ (IIRC) IR ආකෘතිය 2021
- ග්ලෝබල් රිපෝර්ටින්ග් ව්‍යාපෘතිය මගින් නිකුත් කරන ලද GRI සම්මතයන්
- තිරසාරත්වය පිළිබඳ කොළඹ කොටස් වෙළඳපොල නිර්දේශ
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද සාංගමික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක

මෙම වාර්තාව GRI සම්මතඃ Core option අනුව පිළියෙල කොට ඇත.

**සහතිකත්වය**

අදාළ සටහන් සහිත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරන ලද අතර ඔහුගේ සහතික කිරීමේ වාර්තාව පිටු අංක 168 සිට 171 දක්වා ඉදිරිපත් කෙරේ. විගණකාධිපති විසින් ආයතනික පාලන උපදෙස් සමග සමාගමේ අනුකූලතාව සඳහා බාහිර සහතිකයක් නිකුත් කර ඇත. මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය විගණකාධිපති විසින් සමාලෝචනය කර ඇති අතර ඒ සම්බන්ධ ඔහුගේ මතය 165 පිටුවේ දක්වේ. අවශ්‍යතා සමග අනුකූලතාවය සම්බන්ධ සහතිකත්වය අර්න්ස්ට් ඇන්ඩ් යංග් විසින් සපයනු ලැබ ඇති අතර ඔවුන්ගේ වාර්තාව පිටු අංක 323 හි දක්වේ.

# මෙම වාර්තාව පිළිබඳව

**තිරසාරත්ව තොරතුරු**
මෙම වාර්තාවේ අන්තර්ගතය සමාගමෙහි ස්ථාපිත කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් උකහා ගන්නා ලද අතර එයට මානව සම්පත් තොරතුරු පද්ධතිය, පරිසර කළමනාකරණ ආකෘතිය සහ පාර්ශවකාර ප්‍රතිචාර ලබා ගැනීම සඳහා පවතින ක්‍රියාවලීන් ඇතුළත් වේ. ඒකාබද්ධ චින්තනය සහ වාර්තාකරණය ප්‍රවර්ධනය කරමින් ප්‍රමාණාත්මක බව නිර්ණය කිරීමේ ක්‍රියාවලිය සහ අදාල තිරසාර ව්‍යාපෘතීන් සැකසීම සඳහා මේවා ආදානයන් වශයෙන් යොදාගෙන ඇත.

**වසර තුළ සැලකිය යුතු වෙනස්වීම් සහ ප්‍රතිප්‍රකාශයන්**
වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ සමාගමෙහි හෝ සැපයුම් දාමයේ කිසිදු සැලකිය යුතු වෙනසක් හෝ මූල්‍යමය හෝ තිරසාර තොරතුරු සම්බන්ධ ප්‍රතිප්‍රකාශයන් අවශ්‍ය වන ආකාරයේ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් සිදු නොවිය.

පීපල්ස් ලීසිං මගින් සිය වාර්තාව 2018/19 මූල්‍ය වර්ෂය වන තෙක් GRI සම්මත; පරිපූර්ණ වරනය යටතේ සිදු කරන ලදී. මෙම වාර්තාවේ දර්ශක රැසක් ඇතුලත් කොට තිබුණද අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට රට වසා දැමීම හේතුවෙන් අප හට ඇතිවූ අපහසුතාවය නිසා 2019/20 දී එය නවතා දමන ලදී. මෙම වසරේ වාර්තාව පිළියෙල කරනු ලබන අවස්ථාවේදී වසංගතයේ තෙවැනි රැල්ලට රට මුහුණ දෙමින් පැවති බැවින් ඇති වූ සංචරණ සීමා හේතුවෙන් මෙහිදී ද අපි GRI මූලික වරණය භාවිත කරමු.

**ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශන**
මෙම වාර්තාව අපගේ ව්‍යාපාර මෙහෙයුම් සහ අනාගත ක්‍රමෝපාය පිළිබඳ ඉදිරිය දකින ප්‍රකාශන වලින් සමන්විත වේ. මූල්‍ය තත්ත්වය, ව්‍යාපාර ක්‍රමෝපාය, කළමනාකරණ සැලසුම් සහ අනාගත මෙහෙයුම් සඳහා පරමාර්ථ ඇතුළුව ඓතිහාසික සාධක පිළිබඳ ප්‍රකාශන හැර සියළුම ප්‍රකාශන මෙයට ඇතුළත්ය. අපගේ ප්‍රකාශන වර්තමාන දත්ත මත පදනම් වගකීම් සහගත උපකල්පන සහ අපේක්ෂාවන් වන බැවින්, විශේෂයෙන් කොවිඩ්-19 වසංගතය පැතිරීම සහ ගෝලීය සමාජ-ආර්ථික පරිසරය පිළිබඳ ඇතිවන අවිනිශ්චිතතාවය සහිත වර්තමාන තත්ත්වය යටතේ අනාගත ප්‍රතිඵල පිළිබඳ සහතික කිරීමක් ඉන් අපේක්ෂා නොකෙරේ. නිසි අවධානය සහිතව මෙම තොරතුරු සලකා බලන මෙන් සහ තීරණ ගැනීමේ දී ප්‍රක්ෂේපිත දත්ත අනවශ්‍ය ලෙස පදනම් කර නොගන්නා මෙන් පාඨකයින් වෙත උපදෙස් දෙනු ලැබේ. නව තොරතුරු, අනාගත සිදුවීම් හෝ වෙනත් ආකාරයක ප්‍රතිඵලයක් ලෙස ඉදිරිය දකින ප්‍රකාශන යාවත්කාලීන කිරීමට හෝ සමාලෝචනය කිරීමට අපි අපේක්ෂා නොකරන අතර මෙම අවිනිශ්චිත තත්ත්වය හමුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වාර්තාව සකස් කිරීමට සම්බන්ධ වෙනත් පාර්ශවයන් විසින් යම් බැඳීමක් භාර නොගැනේ.

**ප්‍රතිචාර සහ විමසීම්**
අප විසින් ඔබගේ ප්‍රතිචාර අගය කොට සළකන අතර එළඹෙන වසරේ වාර්ෂික වර්තාව වැඩිදියුණු කිරීම සඳහා ඒවා යොදාගැනේ. වාර්ෂික වාර්තාව පිළිබඳ විමසීම් සඳහා පහත දක්වෙන නිලධාරියා අමතන්න:

ප්‍රධාන කළමනාකරු - මූල්‍ය
**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී**
නො. 1161, මරදාන පාර,
කොළඹ 8, ශ්‍රී ලංකාව.
**තැපැල් කේතය:** 00800
**දුරකථන:** +94 11 263 1631

**පිළිගැනුම**
මෙම වාර්තාවේ ඇතුළත් සියළුම තොරතුරු සමාගමේ කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තරව සමාලෝචනය කරන ලද අතර මෙම වාර්තාවේ ආයතනික පාලනය යටතේ දක්වා ඇති ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් අනුව ස්වාධීනව තහවුරු කොට ඇත.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂිකව වාර්තාවේ මෙම වාර්ෂික වාර්තාව සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිගැනේ. ඒකාබද්ධ වාර්තාවේ සුපිළිපන් බව තහවුරු කිරීම සම්බන්ධ ඔවුන්ගේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලබන අතර 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව <IR> ආකෘතිය 2021 අනුව ඉදිරිපත් කොට ඇති බව ඔවුන්ගේ මතය වේ.

**සුජීව රාජපක්ෂ**
*සභාපති*
*අධ්‍යක්ෂ මණ්ඩලය*

**ෂමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී*




මෙම වාර්තාව මුද්‍රිත මාධ්‍යයෙන් සහ අන්තර්ජාලය ඔස්සේ ලබාගත හැක
www.plc.lk

# අප පිළිබඳව

GRI 102-4, 102-16

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පීපල්ස් ලීසිං/සමාගම) ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ බැංකු නොවන මූල්‍ය ආයතනයක් වන අතර එය මෙරට විශාලතම රාජ්‍ය හිමිකාරීත්වය සහිත බැංකුවක් වන මහජන බැංකුවේ පරිපාලිතයකි. විශේෂිත කල්බදු සමාගමක් වශයෙන් 1996දී මෙහෙයුම් අරඹන පීපල්ස් ලීසිං 2011 දී කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කෙරිණි. එතැන් පටන් පීපල්ස් ලීසිං විවිධාංගීකරණය වූ බැංකු නොවන මූල්‍ය ජනනය සිදුකරන ආයතනයක් වශයෙන් ක්ෂේත්‍රය තුළ වර්ධනය වූ අතර මේ වන විට එය සතුව බංග්ලාදේශයේ විදේශ පරිපාලිතයක්ද සමගින් පරිපාලිතයන් හයක් පවතී.

## අපගේ දැක්ම

ගනුදෙනුකරුවන් සඳහා හිතකාමී, නිර්මාණාත්මක සහ පූර්ණ නව්‍යකරණ විසඳුම් සපයන්නකු ලෙස මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.

## අපගේ මෙහෙවර

තිරසර තරඟකාරී ප්‍රතිලාභ පවත්වා ගනිමින් ආයතනික සේවා විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීම උදෙසා අගය එක් කළ තරඟකාරී සේවා සැපයුමකට කැපවීම




**රු. බිලියන 24.98**
පොලී ආදායම

**රු. බිලියන 4.03**
බදු පසු ලාභය

**රු. බිලියන 164.55**
මුළු වත්කම්

**රු. බිලියන 34.34**
ශුද්ධ වත්කම්

**රු. බිලියන 20.11**
වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය

**A+**
ස්ථාවර ස්වරූපය ශ්‍රේණිගත කිරීම

**රු. බිලියන 8.13**
සන්නාම වටිනාකම

### වෙළඳපොළ කොටස

| 13.39% | 13.33% | 11.82% |
|---|---|---|
| තැන්පතු | ණය සහ අත්තිකාරම් | මුළු වත්කම් |

### සම්බන්ධිත

| 104 | 2,343 | 353,414 |
|---|---|---|
| ශාඛා | සේවකයින් | ගනුදෙනුකරුවන් |

| මනා ආයතනික පුරවැසිභාවය | | | | |
|---|---|---|---|---|
| ආර්ථික වශයෙන් යථා තත්ත්වයට පත් වීම කෙරෙහි දායක වෙමින් වසංගතයෙහි බලපෑමට ලක් වූ ව්‍යාපාරයන්ට සහන ලබා දීම | දුරස්ථ සේවා අත්දැකීමක් සමගින් අත්‍යාවශ්‍ය සේවාවක් වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීම | අඛණ්ඩ කාර්ය මණ්ඩල සහභාගීත්වයක් සමගින් සුරක්ෂිතව සේවය කිරීමේ මාර්ගයන් තහවුරු කිරීම | අවිනිශ්චිත අවස්ථාවන්හිදී ප්‍රජාවන්හි ඔරොත්තුදීමේ ශක්තිය වර්ධනය කිරීම සඳහා අඛණ්ඩ ආයෝජන සිදු කිරීම | පාරිසරික බලපෑම් මැනීම සඳහා කාබන් පියසටහන් පිළිබඳ අන්තර්ජාලගත දත්ත රැස්කිරීම |

GRI 102-5

### මූල්‍ය පහසුකම් ජනනය කරන ආයතනයක් ලෙස

ආරම්භයේ සිටම මූල්‍ය වශයෙන් පරිපූර්ණ ආයතනයක් බවට පත්වීම කෙරෙහි පීපල්ස් ලීසිං කැපවී කටයුතු කළ අතර විවිධ වෙළඳපළ අවශ්‍යතා සහ අපගේම ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලන පරිපාලිතයන්හි සහයෝගය අප හට නොමඳව හිමිවේ. අප මව් සමාගම සතු දේශීය අධිකාරිත්වය සහ අපගේම මූල්‍ය සවිබලය වර්ධනය සඳහා අප විසින්ම සවිමත් පදනමක් නිර්මාණය කොට ඇත.




| පරිපාලිතය | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් |
|---|---|---|---|---|---|---|
| හිමිකාරිත්වය | 75% | 100% | 100% | 100% | 100% | 51% |
| ප්‍රධාන ක්‍රියාකාරකම් | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු සිදුකිරීම | සම්ප්‍රදායික බැංකුකරණ සේවාවන් ලබාගැනීම අසීරු පුද්ගලයින් සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙත බැංකු නොවන මූල්‍ය සේවා ලබාදීම | මෝටර් රථ සමූහ කළමනාකරණය, මෝටර් රථ තක්සේරුකරණය, රක්ෂණ ඇගයුම් සහ මෝටර් රථ අලුත්වැඩියාව | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන් සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම් | කාර්යාල සංකීර්ණයක් මෙහෙයවීම | නිශ්චල සහ චංචල දේපළ වෙත කල්බදු සහ ණය ලබා දීම |
| සංස්ථාපිත රට | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | බංග්ලාදේශය |
| සේවක සංඛ්‍යාව | 624 | 188 | 104 | 7 | 2 | 36 |
| බදු පසු ලාභයට දායකත්වය | 21.5% | 2.4% | 0.7% | 0.6% | 2.7% | 0.1% |
| කාණ්ඩ වත්කම් | රු. මිලියන 11,133.86 | රු. මිලියන 2,684.03 | රු. මිලියන 443.77 | රු. මිලියන 2,601.21 | රු. මිලියන 2,660. 04 | රු. මිලියන 6,327.94 |

PEOPLE'S LEASING
THE TRUSTED LEADER

# 10 OUR CORPORATE GUIDING PRINCIPLES AS A PURPOSEFUL BUSINESS

## යහපත් ව්‍යාපාර අරමුණු සහිත ආයතනික පුරවැසියකු වශයෙන් අපගේ ආයතනික නියාමන මූලධර්ම

## நன்னோக்கம் கொண்ட வியாபாரம் தொடர்பான எமது நிறுவன வழிகாட்டுதல் கோட்பாடுகள்

**1** **Our purpose is to promote financial inclusivity, and to provide advisory solutions to empower businesses and support livelihoods, including those of small and medium entrepreneurs.**
**අපගේ ව්‍යාපාරයේ මුඛ්‍ය අරමුණ වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සහ ජීවනෝපායන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පූර්ණ මූල්‍ය සේවා සහ මූල්‍ය උපදේශණ සේවා ලබා දීමයි.**
சிறிய மற்றும் நடுத்தர தொழில் முயற்சிகள் உள்ளிட்ட வியாபாரங்கள் மற்றும் வாழ்வாதாரத் தொழில்களுக்கு வலுவூட்டுவதற்காக விரிவான நிதிச் சேவைகளையும் ஆலோசனைச் சேவைகளையும் வழங்குவதே எமது நிறுவனத்தின் பிரதான "நோக்கம்" ஆகும்.

**2** **We have an inclusive governance system that safeguards transparency and accountability as we deliver on our purpose.**
**අපගේ එම ව්‍යාපාර අරමුණ සාක්ෂාත් කිරීම සඳහා විනිවිදභාවය සහ වගවීම ආරක්ෂා කරන ආයතනික යහපාලනයක් අප සතුව ඇත.**
இந்த வியாபார நோக்கத்தை அடைவதற்காக, வெளிப்படைத் தன்மை மற்றும் பதில் சொல்லும் பொறுப்பைப் பாதுகாக்கும் வகையில் அனைத்தையும் உள்ளடக்கும் சிறந்த ஆளுகை முறையை எமது நிறுவனம் கொண்டுள்ளது.

**3** **We are committed to achieving our purpose by providing responsible, ethical and inclusive financial solutions, and by ensuring equitable returns to our stakeholders.**
**අපගේ පාර්ශවකරුවන් හට සාධාරණ වූ ප්‍රතිලාභ සහතික කරමින් ව්‍යාපාර ආචාරධර්ම වලට අනුකූලව සහ වගකීම්සහගතව පූර්ණ මූල්‍ය විසඳුම් ලබා දෙමින් අපි අපගේ ව්‍යාපාර අරමුණ සඳහා කැපවී සිටින්නෙමු.**
எமது பங்காளிகளுக்கு நியாயமான பிரதிபலன்கள் கிடைப்பதை உறுதிப்படுத்தும் பொருட்டு பொறுப்புணர்வுள்ள, நெறிமுறையான மற்றும் உள்ளடக்கும் நிதித் தீர்வுகளை வழங்குவதன் மூலம் எமது நோக்கத்தை அடைவதில் நாம் ஆழ்ந்த அக்கறை கொண்டுள்ளோம்.

**4** **Economic viability, environmental responsibility and social accountability stand as the core values inherent in all our business operations.**
**ආර්ථික ශක්‍යතාවය, පාරිසරික වගකීම සහ සමාජ වගවීම අපගේ ව්‍යාපාර අරමුණ සක්‍රීය කරන මූලික වටිනාකම් වේ.**
பொருளாதாரச் சாத்தியத் தன்மை, சூழல் ரீதியான பொறுப்புணர்வு, சமூக ரீதியான பதில் சொல்லும் பொறுப்பு என்பனவே எமது வியாபாரச் செயற்பாடுகளை நெறிப்படுத்தும் அடிப்படை விழுமியங்களாகும்.

**5** **We ensure that our core values are embedded into our management processes, contributing towards a culture of good corporate citizenship.**
**අපගේ මූලික වටිනාකම් කළමනාකරණ ක්‍රියාවලීන් තුළට අන්තර්ග්‍රහණය කරමින් යහපත් ආයතනික පුරවැසිභාවයක් සහිත ආයතනික සංස්කෘතියක් අපි සහතික කරමු.**
சிறந்த நிறுவனப் பிரஜை என்ற கலாசாரத்தை நோக்கிய எமது முகாமைத்துவ நடைமுறைகளில் எமது அடிப்படை விழுமியங்கள் உள்ளடங்கியிருப்பதை நாம் உறுதிப்படுத்துகின்றோம்.

**6** **We strive to minimize our impact on the environment through sustainable resource optimization and responsible lending.**
**තිරසාර සම්පත් ප්‍රශස්ථකරණයෙන් සහ වගකීම්සහගත මූල්‍ය සේවා ලබා දීම තුළින් අපි පරිසරයට අපෙන් සිදුවන බලපෑම අවම කිරීමට කටයුතු කරමු.**
மூலவளங்களின் நிலைபெறு தன்மையுள்ள உபயோகம் மற்றும் பொறுப்புணர்வுள்ள கடன் வழங்கல் மூலம் சுற்றாடல் மீதான எமது தாக்கத்தை இயன்றளவு குறைக்க நாம் முயற்சி செய்கின்றோம்.

**7** **We secure our social license to operate by responding to stakeholder concerns identified through year round effective stakeholder engagement.**
**වසර පුරා අපගේ පාර්ශවකරුවන්ගේ ගැටලු සඳහා ප්‍රතිචාර දක්වමින් අපගේ සමාජ බලපත්‍රය අපි තහවුරු කර ගන්නෙමු.**
ஆண்டு முழுவதும் எமது பங்காளிகளுடன் பயன்முனைப்பான தொடர்புகளைப் பேணி, அவர்களின் பிரச்சினைகளை அடையாளம் கண்டு நடவடிக்கை எடுப்பதன் மூலம் செயற்படுவதற்கான எமது சமூக அனுமதிப்பத்திரத்தைப் பெற்றுக்கொள்கின்றோம்.

**8** **We build our staff capacity, including digital literacy, to ensure that they deliver a superior service experience.**
**ඩිජිටල් සාක්ෂරතාවය සමගින් උසස් සේවා අත්දැකීමක් තහවුරු කිරීම සඳහා නිරතුරුව අප අපගේ කාර්ය මණ්ඩලයේ ධාරිතාවය ඉහළ නංවන්නෙමු.**
எமது அலுவலர்கள் உன்னதமான சேவை அனுபவத்தை வழங்குவதற்கு உதவும் பொருட்டு நாம் அவர்களின் டிஜிட்டல் தொழில்நுட்ப அறிவு உள்ளிட்ட ஆற்றலைக் கட்டியெழுப்புகின்றோம்.

**9** **We celebrate our purposeful business growth by evaluating individual and team contributions of our employees in meeting our purposefully defined business targets.**
**අපගේ ව්‍යාපාර අරමුණට අනුකූලව අර්ථ දක්වා ඇති ව්‍යාපාරික ඉලක්ක සපුරා ගැනීම සඳහා අපගේ කාර්ය මණ්ඩලයේ පුද්ගල සහ කණ්ඩායම් දායකත්වය සාධාරණ ලෙස අගයමින් ඔවුන් හා එක්ව සමරන්නෙමු.**
நன்னோக்கத்துடன் நிர்ணயிக்கப்பட்ட எமது வியாபார இலக்குகளை அடைவதற்கு எமது ஊழியர்கள் தனித்தனியாகவும் அணியாகவும் வழங்கும் பங்களிப்பை நியாயமான முறையில் மதிப்பீடு செய்வதன் மூலம் நாம் எமது நன்னோக்க வியாபாரத்தின் வளர்சியைக் கொண்டாடுகின்றோம்.

**10** **We support the advancement of national and global frameworks that promote sustainable development.**
**තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කරන ජාතික හා ගෝලීය රාමුවල ප්‍රගමනයට අපි සහය ලබා දෙන්නෙමු.**
நிலைபெறு தன்மையுள்ள அபிவிருத்தியை ஊக்குவிக்கும் தேசிய மற்றும் உலகளாவிய கட்டமைப்புகளின் முன்னேற்றத்திற்கு நாம் உதவுகின்றோம்.

Shamindra Marcelline
Chief Executive Officer / General Manager

# විසිපස් වසරක ගමන් මග...

දශක දෙකකට වැඩි කාලයක් මූල්‍ය සේවාවන් සපයමින්, අපගේ පාර්ශවකරුවන් වෙත සාධනීය බලපෑමක් සිදු කිරීමට අප සමත්ව ඇති අතර ආයෝජකයින්, තෘප්තිමත් ගනුදෙනුකරුවන්, උනන්දු සහගත සේවකයින්, ස්තුති පූර්වක ව්‍යාපාරික සහකරුවන් සහ මනා සබඳතාවයක් පවත්වාගෙන යන නියාමකයින් ඒ සඳහා සාක්ෂි සපයයි. එමෙන්ම අප විසින් පොදුවේ සමාජය සහ පරිසරය වෙත ද හිතකර බලපෑමක් සිදු කරන ලදී.

**1995**
පෞද්ගලික සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන් සංස්ථාපනය කෙරුණි.

**1996**
1996 මැයි (31) වැනි දින මහජන බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතයක් වශයෙන් වාණිජ මෙහෙයුම් ඇරඹීය.

සේවකයින් - 3

ශාඛා ජාලය - ශාඛා නොමැත

මුළු ස්කන්ධ - රුපියල් මිලියන 10

තැන්පතු - භාර නොගැනුණි

විවිධාංගීකරණය - කිසිදු පරිපාලිතයක් නැත

සැලසුම් පරාසය - කල්බදු සහ කුලී පිට ගැනුම් පමණි

**1997/98**
අපේක්ෂා සහගත වර්ධන සැලසුමක පළමු පියවර වශයෙන් පළමු ශාඛාව මහනුවර දී විවෘත කෙරිණි

**2002/03**
මෙහෙයුම් අරඹා වසර හතක් වැනි කෙටි කාලයකදී කල්බදු ක්ෂේත්‍රයේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත්විය

**2007/08**
මහජන බැංකුවේ කවුළු කාර්යාල ඔස්සේ සුවිශේෂී සංකල්පයක් හඳුන්වා දෙන ලදී

**2008/09**
නව ව්‍යාපාරයන් වෙත විවිධාංගීකරණය වෙමින් පරිපාලිතයන් දෙකක් එනම් පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් සහ පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් අරඹන ලදී



## සමාජය වෙත අපගේ දායකත්වය



බස්රථ 115,119 ක් යොදවමින් ප්‍රවාහන ජාලය වැඩි දියුණු කිරීම සඳහා කැපවී කටයුතු කිරීම



ලොරි රථ 113,099 ක් ඔස්සේ විශ්වාසයේ ජීවනාලිය නිර්මාණය කිරීම



ත්‍රිරෝද රථ හිමිකරුවන් 115,119 කගේ දිවි පෙවෙත ඉහළ නැංවීම



නව මෝටර් රථ හිමි හිමිකරුවන් 207,847 කගේ සාඩම්බර සහායකයා අපි වෙමු

## අපගේ ආයතනික චාරිකව තුළ ලද සම්මාන සහ ඇගයුම්

### ආයතනික සමාජ වගකීම (CSR)

- විශිෂ්ටතම ආයතනික පුරවැසි තිරසාරත්ව සම්මාන - 2012, 2014 සිට 2019 දක්වා 7 වරක් ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මගින් පිරිනමන ලද විශිෂ්ටතම ආයතනික පුරවැසි සම්මාන 10 අතරට එක්විය
- 2015 (කුසලතා), 2016 (රිදී) 2017 (කුසලතා) - ඉයන් ඩයස් අබේසිංහ අණුස්මරණ ආයතනික සමාජ JASTECA ආයතනික සමාජ වගකීම්/තිරසාරත්ව සම්මානය

### සන්නාම ප්‍රතිරූපය

- SLIM Nielsen – වසරේ මූල්‍ය සේවා සම්පාදක - 2012/13 සිට 2015/16 දක්වා අඛණ්ඩව සිව් වසරක්
- Business Today – විශිෂ්ටතම ලැයිස්තුගත සමාගම් 30 - 2013/14 සිට මේ දක්වා විශිෂ්ටතම සමාගම් 20 අතරට එක් විය
- Brands Annual - වසර 3 ක් මූල්‍ය/කල්බදු ක්ෂේත්‍රයේ අනර්ඝතම සහ වඩාත් ප්‍රියකරන ලාංඡනය

### අනුකූලතාව සහ විනිවිදභාවය

- ආයතනික විනිවිදභාවය පිළිබඳ වාර්තාකරණය (TRAC) මගින් ඉහළම ලැයිස්තුගත සමාගම් 50 අතුරින් අංක 3 ස්ථානයට තේරී පත්විණි.
- STING කන්සල්ටන්ට්ස් මගින් ආයතනික වගවීම සම්බන්ධ 2009 (ස්වර්ණ), 2010 (රිදී), 2011 - 18 (ස්වර්ණ) වර්ගීකරණය

### ආයතනික වාර්තාකරණය

- වරලත් ගණකාධිකාරී ආයතනය මගින් වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී සමස්ත මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ රිදී සම්මානය 2013/2014 වාර්ෂික වාර්තාවට හිමි විය.
- වරලත් ගණකාධිකාරී ආයතනය මගින් ශ්‍රී ලංකා වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී 2008/09 සිට 2017/18 දක්වා අඛණ්ඩව වසර නවයක් පුරා ක්ෂේත්‍රයේ ස්වර්ණ සම්මානය හිමිවිය
- 2016/2017 වාර්ෂික වාර්තාවට ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම වාර්ෂික වාර්තාව වශයෙන් ග්‍රෑන්ඩ් සම්මානය හිමි විය (31 වන ARC උළෙලේදී)
- CMA ශ්‍රී ලංකා ඒකාබද්ධ වාර්තාකරණ විශිෂ්ටත්ව සම්මාන උළෙලේදී 2016/2017 සහ 2017/2018 වාර්ෂික වාර්තා සමස්ත දෙවන ස්ථානය සහ ලීසිං සහ ෆිනෑන්ස් ක්ෂේත්‍රයේ ස්වර්ණ සම්මානය හිමි විය

### මානව සම්පත

- 2017 (Best Employer Brands) සම්මාන උළෙලේදී ලෝක මානව සම්පත් සංවර්ධන කොංග්‍රසය සහ ශ්‍රී ලංකා එම්ප්ලෝයර් බ්‍රෑන්ඩින් ඉන්ස්ටිටියුට් මගින් සමාගම ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සේවා සන්නාමය වශයෙන් ඇගයුමට ලක් කෙරිණි.

**2009/2010**
විවිධාංගීකරණය වූ මූල්‍ය සේවා සම්පාදකයෙකු වශයෙන් සමාගමේ තත්ත්වය තවදුරටත් ස්ථාවර කරමින් පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතයන් වශයෙන් පීපල්ස් ඉන්ෂුවරන්ස් අරඹන ලදී

**2012/13**
2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ෆිනෑන්ස් ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා බලපත්‍රය හිමි විය

**2015/16**
ණය සහ ලැබිය යුතු දෑ කළඹ රුපියල් බිලියන 100 කඩඉම පසු කළේය

**2017/18**
පීපල්ස් ඔන්ලයින් ඇප් එක හඳුන්වාදීම/ බංගලාදේශයේ මෙහෙයුම් ඇරඹීම.

**2011/12**
කොටස් වෙළඳ වෙළඳපොලේ දෙවැනි විශාලතම මූලික කොටස් නිකුතුව ඔස්සේ කොළඹ කොටස් වෙළඳ පොළේ ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත විය

**2013/14**
සිය පරිපාලිතය වන පීපල්ස් ෆිනෑන්ස් පීඑල්සී සමග හවුල්කාරිත්වය සාර්ථකව සම්පූර්ණ කරන ලදී

**2016/17**
විසි වෙනි සංවත්සරය සැමරීම/ බංග්ලාදේශයේ ව්‍යාපාරයක් සඳහා මූලික කටයුතු ඇරඹීම/ සියවෙනි ශාඛාව පිහිටුවීම

## 2021

විවිධාංගීකරණය - පරිපාලිතයන් හයක් (මහජන ලැයිස්තුගත සමාගමක් සහ විදේශීය පරිපාලිතයක් ඇතුළත්ව)

සේවකයින් - 2,343

ශාඛා ජාලය - ශාඛා 104 සහ සේවා මධ්‍යස්ථාන 99

මුළු ස්කන්ධ - රුපියල් මිලියන 34,341

තැන්පතු - බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ විශාලතම තැන්පතු පදනම - රුපියල් මිලියන 101,503

පහසුකම් පරාසය
ණය ලබාදීමේ පහසුකම්
ස්ථාවර තැන්පතු සහ ඉතුරුම්
ඉස්ලාමීය ණය දීමේ පහසුකම්
ඉස්ලාමීය තැන්පතු පහසුකම්

ණය සහ ලැබිය යුතු දෑ කළඹ - රුපියල් මිලියන 144,388



ගොවි පවුල් 15,786 කගේ ජීවන තත්ත්වය නගා සිටුවීම

### තොරතුරු තාක්ෂණ

- APICTA 2017 මගින් මූල්‍ය ක්ෂේත්‍රයේ ස්වර්ණ සම්මානය “SelfeCash” වෙත පිරිනමන ලදී. මෙම සම්මානය ජයග්‍රහණය කළ එකම මූල්‍ය සමාගම පීපල්ස් ලීසිං ආයතනය වේ.
- 2017, 19 වන ජාතික විශිෂ්ඨතම මෘදුකාංග සම්මාන උළෙලේදී ආන්තික වෙළඳාම් පද්ධතිය සඳහා මූල්‍ය ක්ෂේත්‍ර යෙදවුම් වෙනුවෙන් කුසලතා සම්මානය සහ “SelfeCash” යෙදවුම වෙනුවෙන් ස්වර්ණ සම්මානය

සටහන: සිය 25 වසර ආයතනික චාරිකාව තුළ පීපල්ස් ලීසිං බොහෝ ඇගයුම් වලට පාත්‍ර වී ඇති අතර ඉන් කිහිපයක් මෙහි දක්වේ.

# කාර්යසාධන විශේෂතා - සමාගම

GRI 102-7

| | 2020/21 | 2019/20 | 2018/19 |
|---|---|---|---|
| **මූල්‍ය ප්‍රාග්ධනය** | | | |
| ශුද්ධ පොලී ආදායම (රු. බිලියන) | **11.92** | 15.67 | 15.19 |
| බදු වලට පසු ලාභය (රු. බිලියන) | **4.03** | 2.94 | 4.42 |
| අපහායන ගාස්තු සහ වෙනත් අලාභ (රු. බිලියන) | **1.14** | 4.75 | 1.95 |
| මුළු වත්කම් (රු. බිලියන) | **164.55** | 171.66 | 172.54 |
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල් (රු. බිලියන) | **34.34** | 30.25 | 28.60 |
| තැන්පතු (රු. බිලියන) | **101.50** | 106.70 | 88.37 |
| ණය සහ අත්තිකාරම් කළඹ (රු. බිලියන) | **141.39** | 147.75 | 151.71 |
| වෙළඳපොල ප්‍රාග්ධනකරණය (රු. බිලියන) | **20.11** | 19.86 | 21.17 |
| කොටසකට ශුද්ධ වත්කම් (රු.) | **20.15** | 18.58 | 18.10 |
| කොටසකට අවසන් වෙළඳපොල මිල (රු.) | **11.80** | 12.20 | 13.40 |
| ලාභාංශ ගෙවීමේ අනුපාතය (%) | **24.22** | 65.57 | 44.72 |
| **නිෂ්පාදිත ප්‍රාග්ධනය** | | | |
| ශාඛා (සංඛ්‍යාව) | **104** | 103 | 103 |
| සේවා මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | **99** | 101 | 101 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | | |
| සන්නාම වටිනාකම (රු. බිලියන) | **8.13** | 8.79 | 8.72 |
| අස්පෘශ්‍ය වත්කම් (රු.මිලියන) | **146.45** | 257.58 | 324.91 |
| සේවකයින්ගේ සමුච්චිත සේවය (වසර) | **17,000 ඉහළ** | 15,000 ඉහළ | 13,000 ඉහළ |
| **මානව ප්‍රාග්ධනය** | | | |
| මුළු සේවක සංඛ්‍යාව (සංඛ්‍යාව) | **2,343** | 2,401 | 2,329 |
| රදවාගැනීමේ අනුපාතය (%) | **93.80** | 90.82 | 88.90 |
| බඳවාගැනීම් (සංඛ්‍යාව) | **81** | 334 | 492 |
| **සමාජ හා සබඳතා ප්‍රාග්ධනය** | | | |
| ණය ගනුදෙනුකරුවන් (සංඛ්‍යාව) | **117,773** | 126,715 | 121,129 |
| තැන්පතුකරුවන් (සංඛ්‍යාව) | **291,319** | 282,944 | 248,587 |
| නැවත පැමිණෙන ගනුදෙනුකරුවන් (%) | **29.92** | 44.22 | 43.47 |
| රථවාහන සැපයුම්කරුවන් (සංඛ්‍යාව) | **31,665** | 32,406 | 28,661 |
| ප්‍රසම්පාදනය කල රථවාහන සැපයුම්රුවන්ගේ මුළු වටිනාකම (රු. බිලියන) | **51.09** | 60.62 | 66.80 |
| දේශීය ප්‍රජාවන් කෙරෙහි ආයෝජනය (රු. මිලියන) | **20.38** | 55.53 | 120.29 |
| ප්‍රජා සත්කාරයන්හි ව්‍යාප්තිය (සංඛ්‍යාව) | **63** | 79 | 155 |
| **ස්වභාවික ප්‍රාග්ධනය** | | | |
| පුහුණු කරන ලද නව සේවකයින් | **316** | 334 | 492 |
| කාබන් පියසටහන ($tCO_2e$) | **3,833.50** | 5,836.46 | 5,337.96 |
| හරිත ණය ලබාදීමේ පරිමාව (රු. බිලියන) | **1.17** | 1.87 | 5.48 |
| පාරිසරික ව්‍යාපෘති (සංඛ්‍යාව) | **6** | 12 | 31 |
| ස්වභාවික පරිසරය වෙත ආයෝජනය (රු. මිලියන) | **2.77** | 3.32 | 1.94 |

සභාපතිවරයාගේ පණිවිඩය



GRI 102-14

හිතවත් පාර්ශවකරුවනි,

2021 මාර්තු 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී පාරිභෝගිකයින්ට පෙර නොවූ විරූ සහන ලබා දෙමින් හා අභියෝග ජය ගනිමින් සමූහයේ ඉතිහාසයේ ඉහළම ලාභය වූ රුපියල් මිලියන 5,596.33 වාර්තා කිරීමට සමත් විය. අනපේක්ෂිත ආකාරයකින් වෙනස් වූ ව්‍යාපාරික පරිසරයක් තුළ දී පාර්ශවකරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙන නව උපාය මාර්ගික වැඩපිළිවෙළක් සකස් කිරීමේ අවශ්‍යතාව මෙහි දී ඉස්මතු විය. වසංගතයේ මුල් අවධියේදී අපගේ ගනුදෙනුකරුවන්ට, සේවකයින්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට සහයෝගය දැක්වීම සඳහා මණ්ඩලය ගත් තීරණ නිවැරදි බව තහවුරු කරමින් වසර තුළ වාර්තා වූ ප්‍රශංසනීය කාර්ය සාධනය අගය කළ යුතුය.

## සාමාන්‍ය නොවන තත්ත්වයන් හමුවේ

2019 අප්‍රේල් පාස්කු ඉරිදා ප්‍රහාරයේ බලපෑමෙන් රට යහපත් අතට හැරෙමින් තිබියදී කොවිඩ්-19 වසංගතය ආරම්භ වීමත් සමඟ ඇති වූ දැඩි සංචරණ සීමා සමගින් මූල්‍ය වර්ෂය ආරම්භ විය. මගී ප්‍රවාහන ක්‍රියාකාරකම් හදිසියේ හා දිගු කාලයක් සඳහා ඇණහිටි අතර තුන්වන රැල්ල මතුව ඇති මෙම ලිපිය ලියන අවස්ථාව වන විටත් ප්‍රවාහන සේවා පෙර පැවති තත්ත්වයට පැමිණ තිබුණේ නැත. පෙර නොවූ විරූ ආකාරයෙන් දේශසීමා වසා දැමීම් හේතුවෙන් ඍජුව සහ වක්‍රව සැලකිය යුතු රැකියා ප්‍රමාණයක් නිර්මාණය කෙරෙන හා රටට ප්‍රධාන විදේශ විනිමය ගෙන දුන් ප්‍රභවයක් වන සංචාරක කර්මාන්තයට විනාශකාරී බලපෑමක් ඇති කළේය. වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා ලොව පුරා මිනිසුන් සමාජීය වශයෙන් දුරස්ථ ජීවන රටාවකට අනුගත වීම නිසා ඉතා කෙටි කලක් තුළ අන්තර්ජාලය ඔස්සේ රාජකාරී කටයුතු සිදු කිරීමට යොමු වීම, අන්තර් ජාලය මගින් ඉගෙනීම මෙන් ම සමාජගත වීම සාමාන්‍ය දෙයක් බවට පත් විය. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් විශාල කොටසක් දෛනිකව වැටුප් ලබන හෝ ස්වයං රැකියා ශ්‍රමිකයින් වන බැවින් රට පුරා පවුල් විශාල සංඛ්‍යාවක් සැලකිය යුතු ආර්ථික දුෂ්කරතාවන්ට යොමු කිරීමට මෙම තත්ත්වය හේතු විය. විධිමත් රැකියා අංශයේ පවා සේවයෙන් පහ කිරීම සහ වැටුප් කප්පාදු කිරීම් ද අපි දුටුවෙමු.

මෙම දැඩි අවිනිශ්චිත කාල පරිච්ඡේදය තුළදී රජයේ සුබවාදී ස්ථාවරය ව්‍යාපාර වලට විශාල ශක්තියක් විය. පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා බැංකු අංශය හරහා දීර්ඝ සහනයක් ලබා දුන් අතර වර්ෂය තුළ ස්ථාවර මුදල් ප්‍රවාහයක් පවත්වා ගෙන යෑම සඳහා පහසුකම් සැලසීමට පොලී අනුපාතික පහළ දමන ලදී. වෙළඳාමේ අසමතුලිතතාවය සහ ගෙවුම් ශේෂ හිඟය කළමනාකරණය කිරීම සඳහා ආනයන සීමා පැනවීමට කටයුතු කරන ලද අතර එමගින් ආර්ථික ක්ෂේත්‍රයෙහි විවිධ අංශයන් කෙරෙහි ධනාත්මක හා ඍණාත්මක බලපෑම් ඇති කළ අතර දේශීය නිෂ්පාදකයින්ට සමස්තයක් ලෙස යහපත් විය. සමූහයේ ලීසිං කළඹ වර්ධනය කෙරෙහි බලපෑම් ඇති කරමින් වාහන ආනයනය අඛණ්ඩව තුන්වන වසරටත් අඩු විය. සාධනීය කරුණක් නම්, මහ මැතිවරණයත් සමඟම රට තුළ දේශපාලන ස්ථාවරභාවයක් තහවුරු වූ අතර 2020 දෙවන කාර්තුවේ දී ඇති වූ පසුබෑමෙන් පසු තුන්වන කාර්තුවේදී රට තුළ යහපත් ආර්ථික වර්ධනයක් ඇති විය. උද්ධමනය ද වර්ෂය තුළ අපේක්ෂිත ප්‍රතිපත්ති පරාසය තුළ පැවතිණ.

## කාර්ය සාධනය පෙළ ගැස්වීම

මුල සිටම පැහැදිලි වූයේ ප්‍රබල ලෙස වෙනස් වූ මෙහෙයුම් පරිසරයකට ගැළපෙන ආකාරයෙන් අපගේ උපායමාර්ගික අරමුණු නැවත සකස් කර ගැනීම අවශ්‍ය බවයි. පාර්ශවකරුවන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලීම, නම්‍යශීලීභාවය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය මූලික අවශ්‍යතා වූ අතර ඒ අනුව සම්පත් නැවත වෙන් කිරීම අවශ්‍ය විය. අපගේ සේවකයින් ආරක්ෂිත බව සහතික කරන අතරම ගනුදෙනුකරුවන්ට මුදල් අවශ්‍යතා කෙරෙහි ප්‍රවේශ වීම සඳහා රට තුළ සංචරණ සීමා පවතින අවස්ථාවලදී පවා අප විවෘතව සිටියෙමු.

සේවා ස්ථානයේ සෞඛ්‍ය හා ආරක්ෂාව මෙන් ම අපගේ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් අපගේ ප්‍රධාන ප්‍රමුඛතාවයක් බවට පත් වූ අතර සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් පරිදි පූර්වාරක්ෂක පියවර රැසක් ක්‍රියාත්මක කරන ලදී. අපගේ මානව සම්පත පාදක උපායමාර්ගය අපගේ සාර්ථකත්වයට ප්‍රධාන හේතුව වූ අතර, බලපෑමට ලක් වූ ව්‍යාපාර මගින් රැකියා අහිමි වීම සහ වැටුප් කප්පාදු ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඇති වූ මානසික බලපෑම දුරු කරමින් ඔවුන්ගේ වැටුප් ලබා දෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සේවකයින්ට සහතික විය. ගනුදෙනුකරුවන් සහ කොටස් හිමියන් ඇතුළුව අපගේ බාහිර පාර්ශවකරුවන්ට වටිනාකම් ලබා දීම සඳහා අපේ කණ්ඩායම සිදු කළ කැපවීම අප කණ්ඩායම කෙරෙහි ඔවුන්ගේ විශ්වාසවන්තභාවය සහ පාක්ෂිකත්වය දිනා ගැනීම සඳහා බලපෑ ප්‍රධාන සාධකයක් බව සනාථ විය.

ගෙවීම් කල් දැමීම සම්බන්ධයෙන් පාරිභෝගික අයදුම්පත් 57,000 කට අධික ප්‍රමාණයක් සඳහා පමාසහන ලබාදුන් අතර එය රු. බිලියන 67.96 කළඹක් කෙරෙහි බලපෑම් ඇති කළේය. මීට අමතරව, පීපල්ස් ලීසිං සමාගම විසින් පාරිභෝගිකයින් සඳහා ගෙවීමේ සහනය තවදුරටත් දීර්ඝ කළ අතර, පාරිභෝගිකයින් අත්විඳින මූල්‍ය ආතතීන් පිළිබඳව අප සමීපව නිරීක්ෂණය කර දෙවන අදියරේදී ගනුදෙනුකරුවන් 15,722 ක් සඳහා රුපියල් බිලියන 25.36 ක පමාසහනයක් ලබා දීමට කටයුතු කෙරිණ. පාරිභෝගිකයින්ට ප්‍රකෘතිමත් වීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීම සඳහා දඩ පොලී කප්පාදුව මාස හයේ සිට මාස 9 දක්වා දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. මෙම තීරණය නිසා පෙර වසරට සාපේක්ෂව දඩ පොලී 70.77% කින් තියුණු ලෙස පහත වැටීම සිදු වූ අතර සිව්වන කාර්තුවේ ශක්තිමත් ව්‍යාපාර වර්ධනයට එය බලපාන ලදී. තවද ආයතනයේ අකාර්යක්ෂම ණය අනුපාතය බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයේ මට්ටමට වඩා පහළ මට්ටමක පැවතිණ.

නිවසේ සිට සේවා ඉටු කිරීම බොහෝ දෙනෙකු සඳහා ඇති එකම විකල්පය වූ බැවින් තාක්ෂණික ව්‍යාප්තිය වේගවත් කිරීම සඳහා සම්පත් වෙන් කිරීම හදිසි අවශ්‍යතාවයක් විය. සංවේදී කරුණු සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් අතථ්‍ය වේදිකාවන් වෙත මාරු කිරීම අවශ්‍ය විය. නිවසේ සිට සේවා ඉටු කිරීමේ වැඩපිළිවෙළ තුළ දී සමාගමේ පද්ධති සහ තොරතුරු ආරක්ෂා කිරීම සඳහා සයිබර් ආරක්ෂාව ඉහළ නැංවීම ද අපට අවශ්‍ය විය. මහජන බැංකු මුදල් තැන්පතු යන්ත්‍ර හරහා පීපල්ස්

"සමාලෝචනයට ලක් වූ වසර තුළ තනතුර හෙබවූ ප්‍රධාන විධායක නිලධාරීන් දෙදෙනාගේ නායකත්වය සමඟ විවිධ අභියෝග මධ්‍යයේ සුවිශේෂී කාර්ය සාධනයක් ලබා ගැනීම සඳහා සහයෝග යෙන් කටයුතු කළ පීපල්ස් ලීසිං කණ්ඩායමේ සාමාජික සාමාජිකාවන්ට මෙහි දී ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි."

ලීසිං වෙත මුදල් තැන්පත් කිරීමට අවස්ථාව ලබා දීම තුළින් පාරිභෝගිකයින්ට පහසුවක් සැලසීමට මහජන බැංකුව සමගින් සාමූහික වැඩපිළිවෙළකට යෑමට ද හැකි විණ.

**සමූහයේ කාර්ය සාධනය**

පොලී අනුපාත පහත වැටීම සහ මාස 9 ක් තුළ පැවති දඩ පොලී සඳහා සහන ලබාදී තිබියදීත් සමූහයේ කාර්ය සාධනය ඉහළ ගිය අතර බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 9,104.64 ක් බවට පත් විය. අය කර ගැනීම් ශක්තිමත් කිරීම තුළින් ප්‍රතිපාදන ආපසු හැරවීමට හැකි වීම සහ විනයගරුක පිරිවැය කළමනාකරණය කිරීමේ ආන්තිකය වැඩිදියුණු කළ නිසා පීපල්ස් ලීසිං සමාගමට බදු ගෙවීමෙන් පසු ලාභය සඳහා 72% ක දායකත්වයක් පෙන්නුම් කිරීමට හැකි විය. පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම ද බදු ගෙවීමට පෙර ලාභය සඳහා 21.5% ක ශක්තිමත් දායකත්වයක් ලබා දුන් අතර අනෙකුත් උප සමාගම් 6.5% ක දායකත්වයක් ලබා දෙන ලදී.

ව්‍යාපාර පරිසරය සමබර වශයෙන් පවත්වා ගැනීම සඳහා සමූහය පුරා මෙහෙයුම් සමබර ලෙසින් පවත්වා ගෙන යෑමට අප කටයුතු කළ අතර ශේෂ පත්‍රය ඒ අනුව සකස් කෙරිණ. වාහන ආනයනය සීමා කිරීම සහ ණය මුලපිරීම්වල දී ක්‍රියාත්මක කළ විචක්ෂණශීලී ක්‍රියාමාර්ග හේතුවෙන් ලීසිං මෙන් ම ණය සහ ඉස්ලාමීය මූල්‍ය ආයෝජන වර්ෂය තුළ අඩු අගයක් ගත්තේය. ඒ අනුව, ස්ථර 1 (Tier 1) ප්‍රාග්ධන සහ මුළු ප්‍රාග්ධන අනුපාතයන් පෙර වසරේදී 15.12% සහ 15.99% අගයක් වූ අතර එය 17.72% සහ 18.58% දක්වා වැඩි වී තිබේ. ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම විසින් පීපල්ස් ලීසිං සඳහා එහි ස්ථාවර ස්වරූපය තහවුරු කරමින් A+(lka) ශ්‍රේණිගත කිරීමක් ලබා දුන් අතර 2021 මාර්තු මස අවසානයේදී ක්ෂේත්‍රයේහි මුළු වත්කම් වලින් 11.82% ක් දරන ශ්‍රී ලංකාවේ විශාලතම දේශීය මූල්‍ය හා කල්බදු සමාගම් වලින් එකක් ලෙස එහි ස්ථාපිත පිහිටීම සනිටුහන් කළේය. පීපල්ස් ලීසිං හි වත්කම්වල ගුණාත්මකභාවය මෙහෙයුම් තත්වයන්ට වඩාත් මුහුණ දුන් අතර ඉහළ අවදානම් සහිත ණය ගැතිභාවයට නිරාවරණය වීමට මව් සමාගම වෙත විශේෂ ශක්තියක් ගෙන දුන්නේය.

**අසාමාන්‍ය කාලයන් තුළ දී නායකත්වය**

දුෂ්කර වසරක් තුළ කටයුතු කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය සිය අධීක්ෂණ කටයුතු වල දැඩි භාවය ඉහළ නැංවූ අතර අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන්හි ඵලදායි ක්‍රියාකාරිත්වය පිළිබඳ අවධානය වැඩි කළේය. මෙහෙයුම් පරිසරය සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවන් අවබෝධ කර ගැනීම, වෙනස්කම් වලට සහයෝගය දැක්වීම සඳහා උපාය මාර්ග පෙළගැස්වීම සහ සම්පත් නැවත වෙන් කිරීම මගින් කාර්ය සාධනය පහසු කෙරිණ. එදිනෙදා කටයුතු පවත්වා ගෙන යෑමේ දී වර්තමාන මෙහෙයුම් සන්දර්භය සමඟ අනුකූල වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති ගණනාවක් සංශෝධනය කිරීම මෙන් ම හඳුන්වා දීම ද සිදු කරන ලදී.

ඉදිරිපත් කරන ලද කාර්ය සාධනය සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටසකට ශත 0.60ක් වන කොටස්කර ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන ලද අතර 2020 දෙසැම්බර් මාසයේදී එය සමස්තයක් ලෙස රුපියල් මිලියන 996.62 ක් විය. අවසාන ලාභාංශයක් වශයෙන් කොටසකට රු. 0.75 බැගින් වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ අනුමැතිය සඳහා යොමු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතියක් ලබා දුන් අතර මෙමගින් කොටස් හිමියන්ට වර්ෂය සඳහා එක් කොටසකට රු. 1.35ක වටිනාකමක් ලබා ගැනීමට අවස්ථාව උදා විය.

පීපල්ස් ලීසිං හි නායකත්වයේ වෙනසක් ද සිදු වූ අතර පළපුරුදු බැංකුකරුවෙකු වන ෂමින්ද්‍ර මර්සලින් මහතා නව ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් 2020 නොවැම්බර් මාසයේදී පත් කරන ලදී. වසර 3 කටත් වැඩි කාලයක් පීපල්ස් ලීසිං හි නායකත්වය දැරූ සබ්‍රි ඊබ්‍රාහිම් මහතාගේ ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වූ තනතුර සඳහා මර්සලින් මහතා පත් වූ අතර සහ ඊබ්‍රාහිම් මහතාගෙන් ඉටු වූ වටිනා සේවාවන් ගැන අපි ඔහුට ස්තුතිවන්ත වන්නෙමු.

මහජන බැංකුවේ වර්තමාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ලෙස 2020 අගෝස්තු මාසයේදී පත් වූ රංජිත් කොඩිතුවක්කු මහතා සාදරයෙන් පිළිගනිමු. 2020 ජූනි මාසයේදී රසිත ගුණවර්ධන මහතා එම තනතුරෙන් ඉල්ලා අස්වීමෙන් පසු කොඩිතුවක්කු මහතා එම තනතුරට පත් වූ අතර රසිත ගුණවර්ධන මහතා ඉටු කළ අගනා සේවය වෙනුවෙන් ද ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නෙමු.

**වර්ධනය සඳහා හවුල් වීම**

2020 වසර සඳහා බලාපොරොත්තු වූවාට වඩා ආර්ථිකය හැකිලීම අඩු වීම, සහයෝගාත්මක ප්‍රතිපත්ති, සාර්ථක එන්නත් වැඩසටහන් සහ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි අනුවර්තනය වීම මත පදනම්ව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පුරෝකථනය කළ ආර්ථික වර්ධනය 0.8% සිට 6% දක්වා ඉහළ නැංවීම සමගින් ගෝලීය ආර්ථික ඉදිරි තත්ත්වය ධනාත්මක බවක් දැක ගැනීමට ලැබිණ. අසල්වැසි රටවල් සමඟ සැසඳීමේ දී විවිධ කොරෝනා ප්‍රභේද සමඟ අපි තුන්වන රැල්ලක් තුළ අභියෝගයට ලක් වීම නිසා කලාපය තුළ මෙරට ආර්ථික ඉදිරි තත්ත්වය වඩාත් අවිනිශ්චිත විය. කෙසේ වෙතත්, එන්නත් ලබා දීමේ වැඩසටහන කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ආර්ථික ප්‍රතිසාධනය කෙරෙහි ධනාත්මක ලෙසින් බලපාන අතර රජය ආර්ථික වර්ධන හිතවාදී ප්‍රතිපත්තියක් සහිතව කටයුතු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. වසංගත කාලසීමාව තීරණාත්මක සාධකයක් වූ අතර ණය ප්‍රමාණය වැඩි වීම මෙන්ම ණය සේවා ගැටලු සහ මුදල්, පොලී සහ උද්ධමනය කෙරෙහි ඇති වූ බලපෑම හේතුවෙන් අවදානම් සහගත බව වැඩි විය. එසේ වුවද, 2021 පළමු කාර්තුවේදී අපනයන ඉහළ යාම සහ ආර්ථික ක්‍රියාකාරකම්වල සාපේක්ෂ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය වීම සාධනීය දර්ශකයක් වේ. ඉහත විස්තර කර ඇති අවාසි මධ්‍යයේ වුව ද ධනාත්මක චින්තනයක් සහිත ව 2021 වසර සඳහා අපි අපගේ සැලසුම් සකස් කර ඇත්තෙමු.

අයහපත් ආර්ථිකයක් යටතේ පීපල්ස් ලීසිං කාර්යභාරය වශයෙන් අප හඳුනා ගෙන ඇත්තේ අහිතකර ලෙස පීඩාවට පත් වූ අංශවල ගනුදෙනුකරුවන්ට සිය කාර්යයන් පවත්වා ගෙන යෑමට අවශ්‍ය ශක්තිය ලබා දීම සහ ආර්ථිකයේ බිඳ වැටුණු අංශවල වර්ධනය වීම සඳහා සවිය ලබා දීමයි. සමූහයේ අවදානම් රුචිය අනුව අපගේ ප්‍රතිසාධනය සහ ණය උත්පාදන ක්‍රියාවලිය සැලසුම් කර ඇත. විවිධ වෙළඳපල කොටස් හරහා සේවාදායකයින් විසින් පහසුවෙන් අවබෝධ කර ගත හැකි ව්‍යුහාත්මක නිෂ්පාදන පුළුල් පරාසයකින් සමන්විත ව, තිරසාර මූල්‍යකරණයත්, ප්‍රජාවන් ශක්තිමත් කිරීම සහ ආර්ථික අංශ ඉහළ නැංවීම සඳහා දීපව්‍යාප්ත ජාලයක් ඔස්සේ අපගේ සහාය හිමි වේ. ශක්තිමත් ශේෂ පත්‍රයක් තිබීම සමූහයේ වර්ධන සැලසුම් වලට විශාල ශක්තියක් වන අතර විශේෂයෙන් පුද්ගල සංවර්ධන හා තාක්ෂණික පරිවර්තන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් එමගින් සැපයේ.

**ස්තුතිය පළ කිරීම**

මෙම වසර තුළ දී කටයුතු කළ ප්‍රධාන විධායක නිලධාරීන් දෙදෙනාගේ නායකත්වය ද සමගින් විවිධ අභියෝග මධ්‍යයේ සුවිශේෂී කාර්ය සාධනයක් ලබා දීමට සහයෝගයෙන් කටයුතු කළ පීපල්ස් ලීසිං කණ්ඩායමේ සියළුම සාමාජිකයන්හට ස්තුති කිරීමට මෙම අවස්ථාවේ දී කැමැත්තෙමි. වසර තුළ මෙම සුමට සංක්‍රාන්තියක් සහ ප්‍රශංසනීය නායකත්වයක් ලබා දීම සම්බන්ධයෙන් ඊබ්‍රාහිම් මහතාට සහ මර්සලින් මහතාට මගේ ප්‍රශංසාව හිමි වනු ඇත.

අපගේ බාහිර පාර්ශවකරුවන් අප කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය සහ සමෘද්ධිය කරා හවුල් ගමනකට කැපවීම ගැන මම ස්තුතිවන්ත වෙමි. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන වල නිලධාරීන් පිළිබඳ විශේෂයෙන් සිහිපත් කරමින් සමස්තයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් විසින් අප වෙත දෙනු ලබන මග පෙන්වීම සහ උපදෙස් අගය කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ කොටස් හිමියන් අප වෙත තබා තිබෙන අඛණ්ඩ විශ්වාසය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අවසන් වශයෙනුත් ස්තුතිවන්ත වෙමින් මම මගේ පණිවුඩය අවසන් කරමි.



**සුජීව රාජපක්ෂ**
*සභාපති*

2021 ජූලි 07

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය



**"අභියෝගාත්මක වටපිටාවක් තුළ ගනුදෙනුකරුවන් වෙත සහන රැසක් ලබාදෙමින්, පීපල්ස් ලීසිං සමූහය එදා මෙදා තුර ඉහළම බදු වලට පසු ලාභය වන රුපියල් මිලියන 5,596.33ක්, එනම් 55.81% ක වසරින් වසර වර්ධනයක් වාර්තා කිරීම සැබවින්ම ප්‍රශංසනීය වේ. පීපල්ස් ලීසිං ලාභ සඳහා ප්‍රමුඛ දායකත්වය පිරිනමන ලද සමාගම වූ අතර, එයට කැපී පෙනෙන කාර්යසාධනයක් අත්පත් කරගත් සමාගමෙහි ලැයිස්තුගත පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස් හි සහයෝගය හිමිවිය."**

හිතවත් පාර්ශවකරුවනි,

කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් උද්ගත වුණු අති මහත් වූ අභියෝග යන් හමුවේ ගනුදෙනුකරුවන් වෙත ඉහළම සහන ලබාදුන් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසරේදී පීපල්ස් ලීසිං සමූහය එදා මෙදා තුර ඉහළම බදු වලට පසු ලාභය වන රුපියල් මිලියන 5,596.33 වාර්තා කිරීම සැබවින්ම ප්‍රශංසනීය වේ. එය නිසැකවම සමාගම් ඉතිහාසයෙහි වඩාත්ම අභියෝගාත්මක වසර වූ අතර එවන් කාල සමයක අත්පත් කරගත් මෙවැනි ප්‍රතිඵලයකින් විශිෂ්ට කාර්යසාධනයක් ඔස්සේ පාර්ශවකරුවන් වෙත වටිනාකම් එක් කිරීම සඳහා අප සතු වන කැපවීම මැනවින් විදහා දැක්වේ. මෙම අසීරු වසරේදී දක්වන ලද අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් සියලු පාර්ශවකරුවන් හට ස්තුතිය පළ කිරීමට මා මෙය අවස්ථාවක් කොට ගනිමි. අපගේ විසිපස් වෙනි වසර සම්පූර්ණ කරන මේ මොහොතේ දී, වසර ගණනාවක් තිස්සේ සවිමත් පදනමක් මත ගොඩනැගුණු මෙවැනි නවතාවයෙන් යුතු අභියෝග ජය ගන්නා සුළු සමාගමකට නායකත්වය ලබාදීමට හැකි වීම මා හට අතිශය සතුටට කරුණකි.

## අවස්ථානුකූල පරිණාමය

අනාගතය දෙස විමසා බැලීමේදී, සියලු පාර්ශවකරුවන් හට ප්‍රතිලාභ සැලසීමේදී ඩිජිටල් යුගය කරා පරිවර්තනය වීම අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි. ඒ එහි බලපෑමෙන් මිදීමට කිසිවෙකුටත් නොහැකි බැවිනි. මෙම වසරේ දී පැවැති සමාජ දුරස්ථකරණ තත්ත්වයන් තුළ අන් කවරදාටත් වඩා නිවසේ සිට වැඩ කිරීම් වැනි ඩිජිටල් පදනම් වෙත ලොවම සහ ශ්‍රී ලංකාව යොමු වූ බව පෙනී යයි. එමෙන්ම පාරිභෝගිකයින් ද සමාජ දුරස්ථභාවය තුළ සිය භාණ්ඩ ලබා ගැනීමේ දී වැඩි වැඩියෙන් අන්තර්ජාලගත වාණිජ සේවාවන් වෙත යොමු වනු දක්නට හැකි විය. සමස්ත බ්‍රෝඩ්බෑන්ඩ් ව්‍යාප්තිය 79.9% ක් දක්වා ඉහළ ගිය තත්ත්වයක පාර්ශවකරුවන්වන් ඩිජිටල් යුගය කරා සංක්‍රමණය වීම අතිශය සරල කටයුත්තකි. ඩිජිටල් මාධ්‍ය කෙරෙහිම යොමු වූ පරපුරක් තුළ අනාගතයේදී මෙම ප්‍රවණතාව අප කාර්යයන්හි යෙදෙන සහ ජීවත් වන ආකාරය පිළිබඳ බොහෝ බලපෑම් සිදුකරනු ඇත. මෙම අනාගත තත්ත්වයන් කෙරෙහි සූදානම් වීම සඳහා අදාළ ආයෝජන කඩිනමින් සිදු කිරීම අතිශය වැදගත් වේ.

මෙම ඩිජිටල් පරිවර්තනය අභ්‍යන්තර වශයෙන් මෙන් ම බාහිර වශයෙන් ද සිදු විය යුතු අතර එහිදී ආර්ථික ක්‍රියාවලිය වෙනසකට භාජනය වී ගනුදෙනුකරුවන් හට සිය ව්‍යාපාර කටයුතු සිදු කිරීමට පහසු තත්ත්වයක් නිර්මාණය විය යුතු වේ. වෙළඳුන් සහ රාජ්‍ය ආයතන ඇතුළුව පද්ධතීන්ගේ සබඳතාවය තුළින් පුළුල් වටිනාකම් දාමයන් නිර්මාණය කෙරෙන පසුබිමක් තුළ එය අනාගතය සඳහා වන මාවත බව නියාමනයන්ගේ සැලකිල්ලට භාජනය විය යුතුය.

අප විසින් සැබෑ ආර්ථික වර්ධනය අත්කර ගැනීම සඳහා නව ව්‍යාපාරික මාධ්‍යයන් වෙත යොමුවීමේ අවශ්‍යතාව පවතින බැවින් පශ්චාත් වසංගත කාලසමයක අභ්‍යන්තර වර්ධනය සීමිත විය හැක. මෙහිදී ආනයන සීමා යනාදිය හමුවේ අපගේ තරගකරුවන් සිය දිගු කාලීන හා මධ්‍යකාලීන ඉලක්ක වලින් බැහැර විය හැකි බැවින් අදාල වර්ධන ක්ෂේත්‍රයන් හඳුනාගනිමින් අපගේ පාර්ශවකරුවන් වෙත තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම පීපල්ස් ලීසිං හි වගකීම විය යුතුය. කල්බදු වෙතම අවධානය යොමු කරමින් සංකෝචනය වෙමින් පවතින වෙළඳපොලක් තුළ තරගකාරීත්වය තවදුරටත් ඉහළ නංවනු වෙනුවට අප වෙනස් මගක යමින් ආදායම් මාර්ග විවිධාංගීකරණය කරමින් ආර්ථික වර්ධනය අත්පත් කර ගැනීම කෙරෙහි උනන්දු විය යුතු වේ.

වෙළඳපොළට පවතින අනාගත අවස්ථාවන් පිළිබිඹු කරමින් බංග්ලාදේශ ආර්ථිකය 2020 දී පවා අඛණ්ඩව වර්ධනය වූ පසුබිමක් තුළ අපගේ බංග්ලාදේශයේ පිහිටි පරිපාලිතය, එලායන්ස් ෆිනෑන්ස් නව වර්ධන අවස්ථාවන් පිළිබඳ ඉඟියක් සපයයි. මෙය කලාපයේ සෙසු රටවල් සමග සබඳතා ඇති කර ගැනීම සඳහා පදනමක් හෝ ආකෘතියක් වශයෙන් යොදාගත හැක. වෙළඳපොල සහ පහසුකම් විවිධාංගීකරණය ඔස්සේ අපගේ කණ්ඩායම් සාමාජිකයන් හට ආකර්ෂණීය වර්ධන අවස්ථා සැළසෙනු ඇති අතර එහිදී ඔවුන් හට විවිධ රටවල් සහ විවිධ ආර්ථිකයන් වෙත නිරාවරණය වෙමින් අදාල සංස්කෘතීන් සමඟ සවිමත් කුසලතා සංචිතයන් නිර්මාණය කර ගනිමින් අපගේ වර්ධන අභිලාෂයන් සපුරාලිය හැකි වේ.

අප විසින් සුපිලිපන් බව, විනිවිදභාවය සහ වගවීම සම්බන්ධ ඉහළ තත්වයන් අඛණ්ඩව පවත්වාගෙන යන බවට තහවුරු කිරීම සඳහා ආයතනික පාලනයන් සවිමත් කිරීම අවශ්‍ය වන අතර එය අපගේ පරිවර්තනීය ව්‍යාපාරික චාරිකාවේ වැදගත් අංගයක් වනු ඇත. ඉදිරි මාස කිහිපය තුළ අප විසින් අපගේ අරමුණ සඳහා යෝග්‍ය වූ එමෙන්ම අපගේ ව්‍යාපාරයට අදාල අනාගත පාරිසරික හා සමාජයීය දිශානතීන්ට ගැලපෙන ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක්, ක්‍රමවේදයන් සහ ක්‍රියාවලීන් රැසක් ස්ථාපනය කරනු ලැබේ. මෙකී වෙනස්වීම් ව්‍යාපාරය පරිවර්තනයට සහ ඩිජිටල් සේවාවන් මත පදනම් වූ නව සාමාන්‍ය වෙත පිය නැගීමේදී සමාගමට ඉමහත් ශක්තියක් වනු ඇත.

පීපල්ස් ලීසිං හි අනාගතය ඉදිරිය වෙනස් ආකාරයෙන් දකිමින්, ඩිජිටල් හැකියාවන් උපයෝගී කර ගනිමින් කොටස් හිමිකරුවන්ගේ වටිනාකම් ඉහළ නැංවීම සඳහා අපගේ වටපිටාව පරිවර්තනය කරගැනීම මත රඳා පවතිනු ඇත.

## ක්‍රමෝපාය නිසි පරිදි ගලපා ගනිමින්

වසංගතය පැතිරයාම හමුවේ, වෙනස් වෙමින් පවතින පාර්ශවකාර අවශ්‍යතා සහ මෙහෙයුම් වටපිටාව වෙත ප්‍රතිචාර දැක්වීම සඳහා අපගේ ක්‍රමෝපාය නම්‍යශීලී විය යුතු බව පැහැදිලි වේ. ඒ අනුව, පළමු කාර්තුවේ අවධානය යොමු වූයේ සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව උදෙසා දැඩි සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග භාවිත කරමින්, ගනුදෙනුකරුවන් වෙත බාධාවකින් තොරව සේවා සැපයීම කෙරෙහිය. දෙවන කාර්තුවේ දී, අපගේ ගනුදෙනුකරුවන් හට ඔවුන්ගේ ව්‍යාපාරයන් නැවත ගොඩනගා ගැනීම සඳහා සහාය පළ කරනු පිණිස පමාසහනය සම්බන්ධ කටයුතු අවසන් කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු විය. තෙවැනි කාර්තුවේ දී අවධානය යොමුවූයේ නව සාමාන්‍ය තත්ත්වයට හැඩ ගැසීම සඳහා අභ්‍යන්තර පාලනයන් සවිමත් කිරීම් කෙරෙහි වන අතර එහිදී මවිසින් සමාගමෙහි නායකත්වය

බාර ගැනුණි. හතරවෙනි කාර්තුවේ දී සවි බල ගන්වන ලද ණය ක්‍රියාවලිය උපයෝගී කරගනිමින් කඩිනම් ව්‍යාපාර වර්ධනය කෙරෙහි කණ්ඩායම දිරි ගන්වන ලදී. මෙමගින් අප හට සමූහයේ සහ සමාගමෙහි ඉතිහාසය තුළ අත්පත්කර ගත් ඉහළම කාර්තුමය ලාභය වාර්තා කිරීමට හැකි විය.

වැඩිදියුණු කරන ලද කාර්යසාධන නිරීක්ෂණ සමගින්, ශාඛාවන්හි ප්‍රයත්නයන් ඇගයීමට ලක් කරමින් සේවක සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා දියත් කරන ලද නව ව්‍යාපෘතීන් හමුවේ සමූහයේ මානව ක්‍රමෝපාය එහි කාර්යසාධනය කෙරෙහි ප්‍රබල ලෙස ඉවහල් වන බව පැහැදිලි විය. පාලන ආකෘති රාමුව සවිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති මාලාවක් හඳුන්වාදෙන ලද අතර ඒවා වෙනස් වුනු ව්‍යාපාරික වටපිටාව සමඟ ගලපා ගනිමින් අපගේ ව්‍යාපාරික මෙහෙයුම් තුළ ප්‍රබල සේවා චර්යාධර්ම සහ වගකීම් සපිරි වටපිටාවක් නිර්මාණය කරන ලදී.

## අපගේ ගනුදෙනුකරුවන් වෙත සහාය දක්වමින්

වසංගතය පැතිර යාම ඇරඹුණු තැන් පටන්ම, ගනුදෙනුකරුවන් හට මුදල් සැපයුම් මාධ්‍යයන් අවශ්‍ය වූ අතර එය ඉටු කිරීම සඳහා අපි අපගේ ශාඛාවන් විවෘතව පවත්වා ගතිමු. රජය මගින් පමාසහනය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ, අප සමාගම සුදුසුකම් ලත් පහසුකම් සඳහා අදාල ප්‍රතිලාභය ගනුදෙනුකරුවන්ට ලබාදුන් අතර නිරන්තරයෙන්ම ඔවුන් හට සහාය වීම සඳහා නම්‍යශීලීව කටයුතු කරන ලදී. මෙම ක්‍රියාවලිය අතිශය කාලෝචිත ආකාරයෙන් සිදු කෙරුණු අතර ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිර්දේශිත අවසන් දිනයට පසුවද අප විසින් මේ සම්බන්ධ අයදුම්පත් භාර ගත් බව සඳහන් කරනුයේ ඉමහත් සතුටිනි. පමාසහනය සඳහා බැංකු වෙත ප්‍රතිමූල්‍ය සැලසුම් පිරිනමන අවස්ථාවේදී, පීපල්ස් ලීසිං සමාගමේ වියදමෙන් පමාසහනයන් පිරිනමන ලදී. පළමු පමාසහනය ණය පහසුකම් 57,253 කට ලබා දෙන ලද අතර එහි වටිනා වටිනාකම රුපියල් බිලියන 67.96 ක් විය. දෙවන පමාසහනය සඳහා ණය පහසුකම් 15,772 ක් සුදුසුකම් ලැබීය. පමාසහනයක් නොලද ගනුදෙනුකරුවන් හට ඔවුන්ගේ මුදල් ප්‍රවාහ අපේක්ෂාවන්ට සමගාමීව අදාල පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමේ අවස්ථාව ලබා දෙන ලදී.

එයට අමතරව, ගනුදෙනුකරුවා හට යථා තත්ත්වයට පත්වීමට අමතර කාලයක් ලබාදෙමින් මාස නවයක කාලයක් සඳහා දඩ පොළිය ඉවත් කරන ලදී. ඒ අනුව, 2019/20 මූල්‍ය වර්ෂයේදී වාර්තා වූ රු. මිලියන 2,322.58 ට සාපේක්ෂව 2020/21 වසරේදී දඩ පොලී ආදායම රු. මිලියන 678.89 ක් වශයෙන් වාර්තා විය.

## අසාමාන්‍ය කාලසමයකදී කාර්යසාධනය

පැවැති අභියෝගාත්මක වටපිටාව සහ ගනුදෙනුකරුවන් වෙත පිරිනමන ලද සහන මධ්‍යයේ පීපල්ස් ලීසිං සමූහය සිය ඉතිහාසයේ ඉහලම බදු වලට පසු ලාභය වන රුපියල් මිලියන 5,596.33 වාර්තා කරන ලද අතර එය 55.81% ක විශිෂ්ට වර්ධනයකි. පීපල්ස් ලීසිං ලාභ සඳහා ප්‍රධාන දායක සමාගම වූ අතර එයට වාර්තාගත කාර්යසාධනයක් අත්පත් කරගත් අපගේ ලැයිස්තුගත පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස්හි සහය හිමිවිය. පහල යන ව්‍යාපාර පරිමාව, පහළ යමින් පවතින පොලී අනුපාත, දඩ පොලී ආදායම හමුවේ සමූහයේ දළ ආදායම වෙත බලපෑම් ඇති වුවද 2021 මාර්තු මස සවිබල ගන්වන ලද අයකර ගැනීමේ ප්‍රයත්නය මගින් හානිකර ප්‍රතිවර්තනය සිදුකළ හැකි වූ අතර එහිදී ප්‍රබල ශුද්ධ ආදායම් වර්ධනයක් වාර්තා විය. කාර්යසාධනය සම්බන්ධයෙන් අප විසින් නව කඩඉමක් සකසන ලද අවස්ථාවේදී සමූහයේ වත්කම් මත ඉපයීම සහ ස්කන්ධ මත ඉපයීම පිළිවෙලින් 4.26% සහ 14.83% දක්වා වර්ධනය විය.

**ණය, කල්බදු සහ කුලී පිට ගැනුම්** - පළමු කාර්තු තුනෙහි අත්දකින ලද පහළ යාමේ ප්‍රවණතාවය ආපසු හරවමින් අභියෝග මධ්‍යයේ 2021 මාර්තු මස රුපියල් බිලියන 10.90 ක් ලබාදෙමින් ප්‍රධාන ව්‍යාපාර කාණ්ඩය හතරවන කාර්තුවේ දී නව සන්ධිස්ථානයක් සලකුනු කලේය. අප විසින් ණය ගුණාත්මකභාවය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලද අතර එමගින් අප හට අක්‍රීය ණය අත්තිකාරම් අවම කරගැනීමට හැකිවිය. මෙම ප්‍රමුඛ ව්‍යාපාර කාණ්ඩය තවදුරටත් වෙළෙඳපොළ ප්‍රමුඛයා වශයෙන් පසුවන අතර බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ විශාලතම ණය කළඹට හිමිකම් කියයි. කොළඹ කොටස් වෙළඳපොළේ ප්‍රතිසැකසුම සමගින් වසර තුළදී ආන්තික වෙළඳාම සැලකිය යුතු වර්ධනයක් අත්පත් කර ගත්තේය. 2020 මාර්තු මස වාර්තා වූ රුපියල් මිලියන 895.70 ට සාපේක්ෂව රන් ණය කළඹ දෙගුණයකට වැඩි වර්ධනයක් අත්කරගනිමින් වසර අවසානයේදී රුපියල් මිලියන 1,993.51 කරා ලඟා විය.

**තැන්පතු** - බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ විශාලතම තැන්පතු පදනම වන රුපියල් බිලියන 101.50 පීපල්ස් ලීසිං සතු වේ. එය 4.87% කින් පහල ගිය අතර සමාගමෙහි පුරෝකථනය කරන ලද ව්‍යාපාරික අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පැවතුණි. ක්ෂේත්‍රයේ පැවති පසුගාමීත්වය හමුවේ වුවද ඉතුරුම් තැන්පතු රුපියල් බිලියන 6.77 සිට රුපියල් බිලියන 8.50 දක්වා සියයට 25.59 කින් ඉහළ ගියේය. එසේ වුවද වෙළඳපොළෙහි පැවති අතිරික්ත ද්‍රවශීලතාව හේතුවෙන් ස්ථාවර තැන්පතු පදනම සුළු පහළ යාමක් පෙන්නුම් කළේය.

**ඉස්ලාමීය මූල්‍ය** - ඉස්ලාමීය මූල්‍ය ව්‍යාපාර අංශය ද පෙර වසරට සාපේක්ෂව 7.19% වර්ධනයක් සමගින් රුපියල් මිලියන 338.49 ක ආංශික ලාභයක් වාර්තා කළේය.

**පීපල්ස් ඉන්ෂුවරන්ස්** - වසංගත සමයේ රට වසා දැමීම හේතුවෙන් සහ සංචරණ සීමා හේතුවෙන් ඇතිවූ හිමිකම්පෑම් අනුපාතයන්ගේ පහළයාම හේතුවෙන් ඉතිහාසයේ ඉහළම ප්‍රාරක්ෂණ ප්‍රතිඵල සහ ලාභය අත්කර ගැනීමට මෙම සමාගමට හැකිවිය.

**පීපල්ස් මයික්‍රෝ - කොමර්ස්** මෙම ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍රයට මාර්ගෝපදේශ හෝ රෙගුලාසි අඩු වුවද, සමාගම මගින් වසංගතයේ බලපෑමට ලක් වූ සිය ගනුදෙනුකරුවන් හට පමාසහන පිරිනමන ලදී. මෙම ක්‍රියාකාරී දායකත්වය හේතුවෙන් අවසන් මාස හතර තුළ වාර්තාගත රුපියල් මිලියන 133.26 ක බදු වලට පසු ලාභයක් අත්පත් කරගැනීමට සමාග මට හැකි විය. අසීරු මාස අටක කාල සීමාවකට පසු ක්‍රියාත්මක කරන ලද උපායමාර්ග සහ සවිමත් කරන ලද, අයකර ගැනීම් ඒ සඳහා ඉවහල් විය.

**ලන්කන් එලයන්ස් ෆිනෑන්ස්** - ණය වර්ධනය සහ ආයෝජන මෙන්ම තැන්පතු පදනමෙහි සහයෝගයෙන් යුතුව බංග්ලාදේශයේ කෝවිඩ් වසංගත තත්වය හමුවේ වුවද ප්‍රශංසනීය බදු වලට පසු රුපියල් මිලියන 142.07 ක ලාභයක් වාර්තා කිරීමට මෙම සමාගම සමත් විය.

**සෙසු ව්‍යාපාර කාණ්ඩයන්** - අභියෝගාත්මක වටපිටාව හමුවේ අපගේ දේපළ ව්‍යාපාරය මන්දගාමීත්වයක් පිළිබිඹු කලද පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම වසර සඳහා රුපියල් මිලියන 46.05 ක බදු වලට පසු ලාභයක් වාර්තා කළේය.

## අවදානම් කළමනාකරණය

වසර අවසානයේ දී අක්‍රිය ණය අනුපාතය අවම කිරීම සඳහා අපගේ ණය ලබාදීමේ කළඹ අවධානම් රහිත කිරීම වසර තුළ අවධානය යොමුවූ ප්‍රධාන කරුණක් විය. ඒ අනුව, අයකරගැනීමේ ප්‍රයත්නයන් සවිබල ගැන්වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2021 මාර්තු 31 දින වන විට සමස්ත අක්‍රිය ණය අනුපාතය 9.21% වශයෙන් වාර්තා විය. මෝටර් රථ මිල සැලකිය යුතු අයුරින් ඉහළ යාමත් සමග උද්ගත විය හැකි "වත්කම් බුබුළු" අවදානම වලකාගැනීම සඳහා මෝටර් රථ මත පදනම් වූ ණය පහසුකම් සම්බන්ධයෙන් වටිනාකමට අනුව ලබාදෙන ණය කෙරෙහි වැඩි අවධානයක් යොමු විය.

අංගසම්පූර්ණ ක්‍රියාපටිපාටීන් ස්ථාපනය කිරීම, ඒවා නැවත සවිමත් කිරීම, වර්ධනයන් නිරීක්ෂණය කිරීම සහ හදිසි අවස්ථා ප්‍රතිචාර නිර්මාණය කිරීම සඳහා වගකිය යුතු, ඒ සඳහා පත් කරන ලද කෝවිඩ් 19 විශේෂ කාර්ය සාධන බලකායේ උපදෙස් අනුව සියලු ව්‍යාපාර ස්ථානයන්හි දැඩි සෞඛ්‍යය හා ආරක්ෂණ පියවර අනුගමනය කරන ලදී. ව්‍යාපාරික අඛණ්ඩව සැලසුම්කරණය කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු වූ අතර එමගින් අඛණ්ඩවම ගනුදෙනුකරුවන් වෙත සේවාව ලබා දිය හැකි විය. තෙවන රැල්ලේ දී මෙය නිවසේ සිට වැඩ කිරීම දක්වා ඉහළ ක්‍රියාකාරිත්වයක් අත්පත් කර ගත්තේය. ඉහළ යන ඩිජිටල් ගනුදෙනු පරිමාවන් සහ සේවකයින් වෙත ලබා දෙන ලද නිවසේ සිට වැඩ කිරීමේ පහසුකම් හමුවේ තොරතුරු තාක්ෂණ අවදානම් ඇතුලුව සයිබර් ආරක්ෂාව සවිමත් කරන ලදී.

සමාගමෙහි ස්ථර 1 සහ සමස්ත ප්‍රාග්ධන අනුපාතයන් වසර අවසානයේදී පිළිවෙලින් 17.72% සහ 18.58% ක් වශයෙන් පැවතිනි. පවතින අවිනිශ්චිතතාව තුළ අප විසින් ශේෂපත්‍රය සවිමත් කිරීමට අවධානය යොමුකිරීමේදී සමාගම සතුව 33.83% ක හිතකර තැන්පතු වලට අරමුදල් අනුපාතයක්ද පවතී.

### සමූහ ජයග්‍රහණයක්

අපගේ කණ්ඩායම අර්බුදයට මුහුණ දෙමින්, සේවය කිරීමේ නව ක්‍රමවේදයන් සොයා ගනිමින්, පෞද්ගලික ජීවිතයේ සහ සේවා ස්ථානයේ අභියෝග ජය ගනිමින් ප්‍රශංසනීය කාර්යභාරයක් ඉටුකොට අති විශිෂ්ට කාර්යසාධනයක් අත්පත් කරගැනීමට සමත් විය. මෙහිදී විවිධ වූ සීමාවන් හමුවේ දැවැන්ත කාර්යභාරයක් ඉටු කරමින් සුබවාදී ආකල්පයන් සහ අප්‍රකට අප්‍රතිහත ධෛර්‍යය ඔස්සේ අඛණ්ඩ වර්ධනයක් අත්පත් කර ගන්නා ලදී. කඩිනම් ඩිජිටල්කරණය වෙත ක්ෂණිකව අනුගත වීම සතුටට කරුණක් වන අතර එම් නිසා රට වසා තැබූ කාලවලදී නිවසේ සිට වැඩ කිරීම සඳහා පහසුකම් සැලසිය හැකි විය.

ඉහත සඳහන් කරන ලද පරිදි, සෞඛ්‍යය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුකූලව අපගේ සේවකයින් වෙත සුරක්ෂිත සේවා වටපිටාවක් ඇති කිරීම සඳහා පියවර රැසක් ගන්නා ලද අතර එහිදී අපගේ සේවකයින් වෙත රට වසා තැබූ අවස්ථාවලදී ප්‍රවාහන පහසුකම් සපයන ලදී. සේවා සැපයුම ඉහළ නැංවීම සඳහා අංශ අතර සහ සහභාගීත්වය සමගින් සරලම දේ නිවැරදිවම කිරීමේ ආයතනික වටපිටාවක් මේ තුළ බිහි විය. සමාගමෙහි වර්ධන තත්ත්වය යථාතත්වයට පත් කරමින් වෙළඳපොල තුළ එහි තරගකාරී ස්ථාවරය සවිමත් කිරීම සඳහා අවසන් මාස හතර තුළ දරන ලද අමතර ප්‍රයත්නය පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතු අතර වාර්තා වූ විශිෂ්ට කාර්යසාධනය කෙරෙහි හේතු වූ ප්‍රධාන සාධකය ද එයයි. සේවක දැනුම වර්ධනය කරමින් සහ ඔවුන්ගේ වෘත්තීය අභිලාශයන් වෙත සහයෝගය දක්වමින් පුහුණු හා සංවර්ධන වැඩ වැඩසටහන් වසංගතය හේතුවෙන් අන්තර්ජාල පදනම් වෙත මාරු කරන ලදී. ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් විවිධ මට්ටම් වලට අනුව සිදුකරන රැස්වීම් වෙනුවට "ටවුන්හෝල්" සැසි අරඹන ලද අතර එය කාර්යමණ්ඩල සහභාගිත්වය සවිමත් කරන නව අත්දැකීමක් විය.

මෙම වසරේදී අප විසින් අන්තර්ජාල පදනම ඔස්සේ ක්‍රමෝපායික සැලසුම්කරණය සඳහා සමාගම පුරා සේවකයින් සහභාගි කර ගැනුණි. අපගේ සේවා කණ්ඩායමේ කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් සහ අධ්‍යයන කළමණාකරණ පද්ධතියක් ක්‍රියාවට නැංවීම් ඇරඹෙන වසරේ ප්‍රමුඛ අවධානාත්මක කාර්යයක් වේ.

### ප්‍රජාවන් කෙරෙහි වන කැපවීම

සමස්ත ප්‍රජාව සමග සම්පව සම්බන්ධ වූ ව්‍යාපාරයක් වශයෙන්, ඉහත සඳහන් කළ පරිදි අපගේ ප්‍රමුඛතාවය වූයේ මෙම අර්බුදකාරී අවස්ථාවේදී අපගේ ගනුදෙනුකරුවන් වෙත සහාය දැක්වීමයි. අධ්‍යාපනය කෙරෙහි ද අවධානය යොමු කරමින් අපගේ උපාය මාර්ගික පරාර්ථකාමීත්ව ප්‍රයත්නයන් වසර තුළදී අඛණ්ඩවම ක්‍රියාවට නැඟුණි. ශිෂ්‍යත්වලාභී දරුවන් හට අන්තර්ජාලය ඔස්සේ ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා ඉලෙක්ට්‍රොනික මෙවලම් ලබා දෙන ලද අතර කෝවිඩ් ආරක්ෂක ක්‍රම සූදානම් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා අප විසින් පාසැල් වෙත සහය දක්වන ලදී.

කාබන් විමෝචනය පිළිබඳ අවධානයෙන් පසුවන සමාගමක් වශයෙන්, කඩදාසි රහිත ක්‍රියාවලීන් ඔස්සේ සම්පත් උපරිම ආකාරයෙන් භාවිත කිරීමට කටයුතු කෙරේ. අප විසින් අලුතින් හඳුන්වා දෙන ලද ඊ මෙමෝ සමගින් මෙන්ම ඩිජිටල් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා භාරදීම සහ වෙනත් ක්‍රියාවලි වර්ධනයන් රැසක් සමගින් කඩදාසි අපතේයාම වලකා ගෙන ඇත. පාරිසරික දර්ශකයන් හසුකර ගැනීම සඳහා අප විසින් පරිසර කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කරන ලදී. මෙහිදී අපගේ ණය ලබාදීමේ ක්‍රියාකාරකම් වලට සමගාමීව ක්‍රමවත් කළමනාකරණ ක්‍රියාකාරකම්, පුනර්ජනනීය බලශක්තිය යොදාගැනීම් සමගින් විමෝචනයන් ශුන්‍ය කිරීම සඳහා අප විසින් ප්‍රයත්නයන් දරනු ලැබේ. මෙහිදී වඩාත් වැදගත් කරුණ වන්නේ අප විසින් විමෝචන පහත හෙලීම වර්ධනය කරන්නා වූ සැලසුම් හඳුන්වා දෙමින් පහළම මට්ටමේ කාබන් සහිත අනාගතයක් කරා ගමන් කිරීමයි.

සමාජමය වශයෙන් වගකීම් සහසහගත සමාගමක් වශයෙන්, ජාතික ප්‍රමුඛතා සහ තිරසාර සංවර්ධන ඉලක්ක වලට සමගාමීව අඛණ්ඩවම අප මෙහෙයුම් සිදු කරනු ලබන අතර ප්‍රජාවන්ගේ සුභසාධනය සඳහා දායකවනු ඇත

### 2020න් ඔබ්බට

#### මෙහෙයුම් පරිසරය

2020 දෙවන කාර්තුවේ දී රට වසා දැමීමෙන් පසු ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීම දිරිගන්වන පශ්චාත් වර්ධන ප්‍රතිපත්ති 2021 ආර්ථික වර්ධනය සඳහා දායක වනු ඇති බව අපගේ විශ්වාසයයි. 2021 දී පොලී අනුපාත සහ උද්ධමන අනුපාත ස්ථාවරව පවතිනු ඇතැයි අප අපේක්ෂා කරන අතර පුද්ගලික අංශයේ ණය වර්ධනය සඳහා එමගින් සහයෝගය හිමිවනු ඇත. යෝජිත ක්ෂේත්‍ර ඒකාබද්ධකරණය මගින් දුර්වල සමාගම් සන්ධානගත වීම හෝ ඉවත්වීම සිදුවනු ඇති අතර එහිදී ක්ෂේත්‍රය තුළ තරගකාරීත්ව ලක්ෂණ වෙනසකට භාජනය වනු ඇත. කෙසේ වුවද, එය අපගේ අනාගත අවස්ථා හෝ සැලසුම් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපි අපේක්ෂා නොකරමු.



# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය



වසංගතයේ තෙවන රැල්ලට මුහුණ දෙමින් සිටින අතරතුර, එන්නත්කරණ වැඩසටහන් සාර්ථකව දියත් වන පසුබිමක් තුළ තිරිසාර අයුරින් යථා තත්ත්වයට පත්වීමක් අපි අපේක්ෂා කරමු. රටේ ආර්ථිකය ස්ථාවර වීම කෙරෙහි වසංගතයේ කාලසීමාව දැඩි ලෙස බලපානු ඇති අතර එහිදී ලබාදිය හැකි ණය පමාසහනයන් තවදුරටත් පිරිනැමීම අවශ්‍ය විය හැක. නියාමන වෙනස්කම් මගින් ද ක්ෂේත්‍රයේ ස්වරූපය තීරණය විය හැක.

## පීපල්ස් ලීසිං

වසර 25 ක් පුරා ගොඩනගා ගන්නා ලද දේශීය අධිකාරීත්වය උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකු නොවන මූල්‍ය ආයතනය වශයෙන් අපගේ ස්ථාවරත්වය තවදුරටත් සවිබලගැන්වීම කෙරෙහි සමාගමේ සැලසුම් වල අවධානය යොමුවේ. ගනුදෙනුකරුවන් ඩිජිටල් යුගය වෙත රැගෙන යාම සඳහා සහාය දක්වමින් අනුගමනය කෙරෙන සහ ඔවුන් කෙරෙහි අවධානය යොමු කෙරෙන සැලසුම් ක්‍රමෝපාය අපගේ වර්ධන අභිලාෂයන් කෙරෙහි පාදක වේ. අවදානම් කළමනාකරණය සම්බන්ධ අවධානාත්මක වර්ධනයක් මගින් ආයතනික පදනම තවදුරටත් ශක්තිමත් වීම, තිරසාර වර්ධනය සහ වැඩි දියුණු වූ වත්කම් තත්ත්වය, සුරක්ෂිත පද්ධතීන් සහ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියාවලීන් නිර්මාණය වනු ඇත. අප විසින් අපගේ ගනුදෙනුකරුවන් හට ඩිජිටල් යුගය තුළ ඉදිරියට යාමට සහාය ද දක්වන ප්‍රයත්නයේදී මානව සම්පත සහ ඩිජිටල් සවිබලකරණ ක්‍රමෝපායන් වැදගත් තැනක් ගනු ඇත. අපගේ වටපිටාව, සමාජ හා පාලන ක්‍රමෝපායන් මගින් අපගේ පාර්ශවකරුවන්කරුවන් සඳහා දිගුකාලීන වටිනාකම් නිර්මාණය සම්බන්ධ අවශ්‍ය පරීක්ෂාවන් සහ ශේෂයන් සපයනු ඇත.

සමාගමෙහි දිගුකාලීන ඉලක්කය වන්නේ පරිපූර්ණ මූල්‍ය සේවාවක් තුළ තිරසාර සහ ඇගයුමට ලක් වන ව්‍යාපාරික ආකෘතියක් බවට පත්වීමයි. මෙහෙයුම් වටපිටාවේ අවිනිශ්චිතතා හේතුවෙන් මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ඇතුළු මූල්‍ය නොවන අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීම කෙරෙහි දැඩි අවධානයක් අවශ්‍ය වේ. චර්යා ධර්ම සංග්‍රහයක් හඳුන්වාදීම සහ සමාජයීය සහ පාරිසරික අවදානම් වලට එරෙහිව ප්‍රධාන සැපයුම් කරුවන් නිරීක්ෂණය සමගින් වගකීම් සහගත භාණ්ඩ හා සේවා ලබා ගැනීම උදෙසා මෙහෙයුම්වල තිරසාරත්වය වර්ධනය කෙරෙනු ඇත. තිරසාර ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සහාය දැක්වීම සඳහා අරමුණු සහගත ණය ලබාදීමේ ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පීපල්ස් ලීසිං ක්ෂේත්‍රයේ සෙසු සමාගම් සමග එක්ව කටයුතු කරනු ඇති අතර තිරසාර මූල්‍ය සේවාවක් ස්ථාපනය කිරීම උදෙසා ඔවුන් සමග සාමූහික කාර්යභාරයක් ඉටු කරනු ඇත. ක්ෂේත්‍රය ඒකාබද්ධකරණය මගින් හවුල්කාරීත්වයන් සහ අත්පත් කරගැනීම් සඳහා අවස්ථා නිර්මාණය වනු ඇති අතර අප මේ සම්බන්ධයෙන් අවධානයෙන් පසුවේ. එළැඹෙන වසරේදී ණය අවදානම, සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ඇතුළු මෙහෙයුම් අවදානම සහ සයිබර් අවදානම වඩාත් ඉහළ යනු ඇති අතර අප විසින් වාර්තාකරණ වසරේදී ලද අත්දැකීම් උපයෝගී කර කරගනිමින් මෙකී අවදානම් කළමනාකරණය සඳහා අපගේ ක්‍රියාවලීන් ශක්තිමත් කොට ඇත.

## ප්‍රණාමය

අසාමාන්‍ය වූ වසරක පීපල්ස් ලීසිං හි ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් මාගේ භූමිකාවට පිවිසි තැන් පටන් ලබා දෙන ලද උපදෙස් වෙනුවෙන් සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ප්‍රණාමය හිමිවේ. පළමු මාස අටේදී සමාගම මෙහෙයවීම සහ සුමට පරිවර්තනීය ක්‍රියාවලියක් සඳහා සහාය දැක්වීම වෙනුවෙන් හිටපු ප්‍රධාන විධායක නිලධාරි සබ්‍රි ඊබ්‍රහිම් මහතා වෙත මාගේ ස්තුතියි පිරිනැමේ. අපගේ ගනුදෙනුකරුවන් විසින් විදහා දක්වන ලද විශ්වාසය, අපගේ ව්‍යාපාරික සහකරුවන්ගේ අඛණ්ඩ සහභාගිත්වය, ආයෝජකයින් විසින් දිගින් දිගටම අප කෙරෙහි තැබූ විශ්වාසය සහ සෞඛ්‍ය බලධාරීන්, පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව මෙම අභියෝගාත්මක වසරේදී දක්වන ලද සහයෝගය වෙනුවෙන් සියලු දෙනා හටම මාගේ ප්‍රණාමය පුද කෙරේ. ඔවුන් විසින් දක්වන ලද සහයෝගය සහ නියාමන උපදෙස් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අංශයේ නිලධාරීන් වෙත මාගේ කෘතඥතාවය පිරිනැමේ. අසීරු වසරක අප හට සමාගම් ඉතිහාසයේ විශිෂ්ටතම මූල්‍ය ප්‍රතිඵල අත්පත් කර ගැනීමට සඳහා සවිබලය ලබාදුන් පීපල්ස් ලීසිං කණ්ඩායමට මාගේ විශේෂ ස්තුතිය හිමි වේ. සෑම අර්බුදයක්ම අවස්ථාවක් වන අතර අප විසින් අපගේ විසිපස් වැනි සංවත්සරය සමරන මේ අවස්ථාවේදී, එළඹෙන වර්ෂය තුළ එල්ල විය හැකි අභියෝග ජය ගැනීම සඳහා එකාවන්ව අදිටන් කර ගනිමු.



**ෂමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී/*
*සාමාන්‍යාධිකාරී*

2021 ජූලි 07

THANK YOU

ස්තූතියි

# වටිනාකම් ගොඩනැංවීමේ ආකෘතිය

26 වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය
28 පාර්ශවකාර සහභාගීත්වය
30 මෙහෙයුම් වටපිටාව
32 කෝවිඩ් 19 වෙත අපගේ ප්‍රතිචාරය
34 ප්‍රමාණාත්මක කරුණු නිර්ණය කිරීම
38 අපගේ ක්‍රමෝපාය

# වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

වසංගතය

රජයේ ප්‍රතිපත්තිය:
සෞඛ්‍ය,සමාජ,ෆිස්කල් සහ මූල්‍ය

මෙහෙයුම්
වටපිටාව

දැක්ම — මෙහෙවර

## අපගේ සම්පත් (ආදානයන්)

**මූල්‍ය ප්‍රාග්ධනය**
මූල්‍ය වත්කම් සහ වගකීම් වලින් උත්පාදිත මුදල් ප්‍රවාහ, ණය මූලාශ්‍ර සහ බැංකු පහසුකම් වෙත පිවිසුම

මුළු වත්කම්: රු. බිලියන 171.66
මුළු වගකීම්: රු. බිලියන 141.41
ස්කන්ධය: රු. බිලියන 30.25
නව ණය ලබාගැනීම්: රු. බිලියන 1.00

**මානව ප්‍රාග්ධනය**
අපගේ මානව සම්පත

සේවකයින් 2,401

**සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය**
අපගේ ගනුදෙනුකරුවන්, අපගේ ව්‍යාපාරික සහකරුවන්, සැපයුම්කරුවන්, ආයෝජකයින් සහ අප විසින් මෙහෙයුම් සිදුකරනු ලබන ප්‍රජාවන්

400,000 කට ආසන්න ගනුදෙනුකරුවන්
40,910 ක් ව්‍යාපාරික සහකරුවන්
8,634 කොටස් හිමිකරුවන්
දේශීය ප්‍රජාවන් කෙරෙහි ආයෝජනය රු. මිලියන 20.38

**බුද්ධිමය ප්‍රාග්ධනය**
අපගේ සන්නාම, මෘදුකාංග, සමාගම් ව්‍යුහයන්, ප්‍රතිපත්ති රාමු, පද්ධති හා ක්‍රියාවලීන් සහ අපගේ කණ්ඩයමේ ව්‍යංගිත දැනුම

සන්නාම වටිනාකම: රු. බිලියන 8.79
මෘදුකාංග: රු. මිලියන 36.76
ස්ථාපිත පද්ධති සහ ක්‍රියාවලි
මව් සමාගමෙහි සවිබලය
සහතික කිරීම් සහ සම්මාන
ආයතනික සංස්කෘතික රාමුව

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**
ශාඛා ජාලය සහ අස්පෘශ්‍ය වත්කම් දේපළ, පිරියත සහ උපකරණ වලින් නියෝජනය වේ

ශාඛා 103
2020/21 තුළ රු. මිලියන 104.69 ක ප්‍රාග්ධන වියදම්

**ස්වභාවික ප්‍රාග්ධනය**
අපගේ ව්‍යාපාරික කටයුතු සිදුකිරීමේදී පරිභෝජනය කරන ලද ස්වභාවික සම්පත්

බලශක්තිය 2.03 x $10^{13}$ (ජූල)
වසංගතය හේතුවෙන් දුරස්ථ සේවය
කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රියකරණය කෙරෙහි ආයෝජන

පාර්ශවකාර සහභාගිත්වය

ක්‍රමෝපාය

## ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ගාමකයන්

ගනුදෙනුකරුවන් හට පොලී හිමිවන සැලසුම් රැසක් ඔස්සේ තැන්පතු උපයෝජනය

ගනුදෙනුකරුවන් විසින් පොලී හෝ සමාන ගාස්තුවක් ගෙවනු ලබන නිශ්චිත කාලයක් සඳහා ආයෝජන, කාරක ප්‍රාග්ධන සහ පරිභෝජන අවශ්‍යතා සඳහා මූල්‍ය ප්‍රාග්ධනය සැපයීම




අනුපූරක සේවාවන් සපයන ආයතන වල ආයෝජන ඔස්සේ ගනුදෙනුකාර වටිනාකම් සමුදාය පුළුල් කිරීම

වර්ධනය කෙරෙහි පහසුකම් සැලසීම සඳහා විවිධ මූලයන්ගෙන් ණය ප්‍රවාහයන් කෙරෙහි පිවිසුමක් ලබාදෙමින් ගනුදෙනුකරුවන් වෙත සහායවීම

## ප්‍රතිඵලය

**උත්පාදිත නිමැවුම්**
- කල්බදු
- ණය
- තැන්පතු
- ආන්තික වෙළඳාම

**අපේක්ෂා නොකෙරෙන නිමැවුම්**
- විමෝචනයන්
- ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය
- කඩදාසි අපද්‍රව්‍ය
- වෙනත් අපද්‍රව්‍ය

අන්තර්ජාලගත රැස්වීමේ
සහ සේවා ස්ථානය

අවගමනකාරී ආර්ථිකය
සහ අවිනිශ්චිතතාව

වටිනාකම්

## ප්‍රතිඵල

### මූල්‍ය ප්‍රාග්ධනය
+ සවිමත් ශේෂපත්‍රය
+ බදු පසු ලාභය
+ රු. බිලියන 34.34 දක්වා ස්කන්ධ ඉහළනැංවීම

### මානව ප්‍රාග්ධනය
+ සේවක තෘප්තිය
+ ඵලදායිතාවය
+ ව්‍යාංගිත දැනුම

### සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය
+ කල්පිරීමේ පරිවර්තනය
+ විශ්වාසය
+ ප්‍රතිලාභී ප්‍රජාවන්

### බුද්ධිමය ප්‍රාග්ධනය
+ සන්නාම වටිනාකම: රු. බිලියන 8.13
+ ඉහළ නංවන ලද ව්‍යාංගිත දැනුම
+ සෘජු හා කාර්යක්ෂම පද්ධති

### නිෂ්පාදිත ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනයෙහි ක්ෂයවීම ආයෝජන ඉක්මවා යයි

### ස්වභාවික ප්‍රාග්ධනය
+ 238,891 ක් ඩිජිටල් ගනුදෙනු
+ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රියකරණය මගින් කඩදාසි භාවිතයේ 32% ක අඩුවීමක් (කට්ටල 500ක්)
+ සමාගමෙහි කාබන් පියසටහන පහළයාම 2,002.96 $tCO_2e$

## බලපෑම්

### ගනුදෙනුකරුවන්
- රු. බිලියන 50.88 ක ණය ලබාදීම
- 55,000 කට අධික පමාසහන
- 15,000 කට අධික පමාසහන දීර්ඝ කිරීම
- කපා හරින ලද දඩ පොලිය
- අසමසම පහසුව

### සේවකයින්
- පුහුණුව හා සංවර්ධනය සඳහා රු. මිලියන 1.56
- මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ
- වෘත්තීය ප්‍රගතිය සහ සජවර්ධනය
- සවිබලකරණය

### ව්‍යාපාරික සහකරුවන්
- මුළු සැපයුම්කරුවන් 38,890
- විනිවිදභාවය
- දිගුකාලීනව දෙපාර්ශවයටම සිය අරමුණු ළඟාකර ගැනීමට හැකිවීම

### ආයෝජකයින්
- බදු පසු ලාභය රු. බිලියන 4.03
- සවිමත් ශේෂපත්‍රයන්
- ආයෝජන අවස්ථා

### රජය
- බදු වශයෙන් රු. මිලියන 4,203.03
- මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය
- කාර්යක්ෂම ප්‍රාග්ධන ගොඩනැංවීම
- දිළිඳුබව අඩුකිරීම

### දේශීය ප්‍රජාවන්
- උසස් තිරසාර සංවර්ධන ඉලක්ක
- දායක වූ ජාතික ප්‍රමුඛතා
- පුද්ගලයින් 2,343 අඛණ්ඩ සේවා නියුක්තිය

### පරිසරය
- කඩදාසි රහිත කාර්ය වටපිටාවක් වෙත සංස්කෘතික පරිවර්තනය
- 144,504 කින් ඉහළ නජවන ලද ඩිජිටල් ගනුදෙනු
- ඉහළ නංවන ලද කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රියකරණය

තිරසාර වටිනාකම නිර්මාණය

අපගේ මෙහෙයුම් වලට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ත්‍රිත්ව ශුද්ධ ආදායම

# පාර්ශවකාර සහභාගීත්වය

GRI 102-40 , 102-42, 102-43, 102-44

සමාගමේ නාමයෙන්ම හැඟවෙන පරිදි, අප නිරන්තරයෙන් ම අපගේ ව්‍යාපාරය ජනතාවගේ ව්‍යාපාරයක් වශයෙන් සලකන අතර මෙම වසර හිමිකරුවන්ගේ හදිසි අවශ්‍යතාවයනට ප්‍රතිචාර දක්වමින් ඔවුන් කෙරෙහි වන අපගේ අවධානය තුළින් හැඩගැසුනු වසරක් විය. සියළුම මට්ටම්වල තීරණ ගැනීම කෙරෙහි පාර්ශවකරුවන්ගේ ගැටලු සම්බන්ධ ප්‍රතිචාර ලබා ගැනීමට සහ ඒවා අවබෝධ කර කරගැනීමට ස්ථාපනය කරන ලද නිසි ප්‍රතිපත්ති පාදක විය. එහිදී අප විසින් කාලයට ගැලපෙන ප්‍රවේශම් සහගත සේවා තුලනයක් සිදු කරන ලදී. වසර තුළ සිදු වූ දැවැන්ත වෙනස් වීම් හේතුවෙන් මෙම සමතුලිත තාවන්

| පාර්ශවකරු | ගනුදෙනුකරුවන් | ආයෝජකයින් | සේවකයින් |
|---|---|---|---|
| පොදු සහභාගීත්ව යාන්ත්‍රණයන් | වෙබ් අඩවිය → මාධ්‍ය නිවේදන | කාර්තුමය මූල්‍ය ප්‍රකාශ | වාර්ෂික වාර්තාව |
| විශේෂ සහභාගීත්ව යාන්ත්‍රණයන් | ඇමතුම් මධ්‍යස්ථානය<br>ශාඛා ජාලය<br>දුරස්ථ/ඩිජිටල් පදනම්<br>ගනුදෙනුකාර හමුවීම් | කොළඹ කොටස් වෙළඳපොල වෙත නිවේදන<br>වෙබ් අඩවියෙහි විශේෂිත අයෝජක සබඳතා පිටුව<br>මහා සභා රැස්වීම<br>වීඩී සංදර්ශන | අභ්‍යන්තර ජාලය, විද්‍යුත් තැපැල සහ මෙමෝ<br>නව ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති සංශෝධන<br>ශාඛා සංචාර<br>අන්තර්ජාලගත රැස්වීම්<br>ක්‍රමෝපායික සැලසුම්කරණ සැසිය<br>"Peopl's Knowledge Hub"<br>මානව සම්පත් පෝටල්ය<br>සේවක වෘත්තීය සමිතිය<br>දුක්ගැනවිලි යාන්ත්‍රණය<br>"Toastmasters" සංගමය<br>කාර්යසාධන ඇගයුම් |
| පොදු ගැටලු | සාධාරණ ගනුදෙනු | තිරසාර ඉපැයුම් වර්ධනය | වෘත්තීය ප්‍රගතිය සහ සංවර්ධනය |
| හඳුනාගත් ගැටලු | වසංගතයේ බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන්ට පමාසහන<br>සහන<br>සේවය ලබාදීම සහ පහසුව<br>සුරක්ෂිත ගනුදෙනු<br>ණය ගැනීමේ පිරිවැය/ආයෝජනය මත ආදායම<br>සැලසුම් සහ සේවාවන් නව හඳුන්වාදීම්<br>පැහැදිලි පහසුකම් සම්බන්ධ තොරතුරු<br>මූල්‍යමය ස්ථාවරත්වය<br>සේවා කාර්යාක්ෂමතාව<br>සහකම්පිත සහ මිත්‍රශීලී සේවාව<br>ව්‍යාපාර කටයුතු සිදුකිරීමේ පහසුව | සංගත ශුද්ධ ආදායම<br>ව්‍යාපාරික අඛණ්ඩත්වය<br>මූල්‍යමය සවිබලය සහ ස්ථාවරත්වය<br>මිල සංවේදී තොරතුරු සම්බන්ධ කාලෝචිත හෙළිදරව් කිරීම<br>විනිවිදභාවය<br>සන්නාම කීර්තිය<br>ESG අවධානයන්<br>නව සාමාන්‍ය තුළ සැලසුම් | ව්‍යාපාරික අඛණ්ඩත්වය<br>ව්‍යුහගත සහ මෙහෙයුම් වෙනස්වීම්<br>ස්වයංක්‍රීය කාර්ය ප්‍රවාහ වෙත විගමනය<br>සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අවදානම්<br>සෞඛ්‍ය ප්‍රතිලාභ ඇතුලුව පාරිශ්‍රමික, ප්‍රතිලාභ<br>වෘත්තීය ප්‍රගතිය සඳහා අවස්ථාව<br>පරිපූර්ණ සේවා ස්ථානය<br>සේවක නිපුණතා වර්ධනය<br>අඛණ්ඩ සේවක සහභාගීත්වය<br>සාධනීය ප්‍රතිචාර<br>රහස්‍යභාවය<br>තිරසාර වර්ධනය සඳහා සැලසුම් |
| අපගේ ප්‍රතිචාරය | වසංගතය හමුවේ වුවද සුරක්ෂිත සේවා අත්දැකීමක් ලබාදෙන ලදී<br>කෝවිඩ් සුරක්ෂිතතා කාර්ය නියමයන් සහ විමසීම් ස්ථාන<br>ඩිජිටල් මාධ්‍ය වෙත විගමනය දිරිගන්වන ලදී<br>මහජන බැංකු ජාලය ඔස්සේ මුදල් තැන්පතු යන්ත්‍ර ගනුදෙනු හඳුන්වාදෙන ලදී<br>පමාසහන ලබාගැනීමට ගනුදෙනුකරුවන්ට සහාය දක්වන ලදී<br>ප්‍රතිසකසන ලද ණය පහසුකම්<br>කපා හරින ලද දඩ පොලිය<br>පීඑල්සී ඔන්ලයින් ඇතුලු දුරස්ථ සැලසුම් සහ සේවාවන් හඳුන්වාදෙන ලදී<br>දරස්ථ ක්‍රියාවලීන් ඇරඹීම සහ ප්‍රවර්ධනය<br>ඩිජිටල් ගනුදෙනු සහ QR කේතය ප්‍රවර්ධනය කිරීම<br>ගනුදෙනුකාර උපදේශන සේවා<br>සමාජ මාධ්‍යයන්හි ඉහළ නංවන ලද නියෝජනය | ගෙවන ලද අන්තර්මධ්‍ය ලාභාංශ<br>ප්‍රබල මූල්‍ය කාර්යසාධනය<br>සවිමත් ශේෂපත්‍රය<br>සමෝධානික කාර්යසාධනය පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම<br>සදාචාර සම්පන්න ණය ලබාදීම<br>තිරසාර මූල්‍යකරණය<br>විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය<br>සාංගමික පාලනය<br>ස්වාධීන ආයතන/ඒජන්සි වෙතින් සම්මාන/ශ්‍රේණිගත කිරීම්<br>තිරසාර වටිනාකම් ලබාදීම සඳහා ක්‍රමෝපායන්<br>ඊ මෙමෝ ක්‍රමය ඔස්සේ සේවා සැපයුම් කාලය පහත හෙළීම | සවිමත් කරන ලද පාලනය<br>වසංගතය හමුවේ වුවද රැකියා සුරක්ෂිතතාව<br>වකඩිනම් ප්‍රතිචාර සඳහා කෝවිඩ් කාර්ය බලකාය<br>කාර්ය නියමයන් සහිත සුරක්ෂිත සේවා ස්ථානය<br>නිවසේ සිට වැඩ කිරීමේ කටයුතු<br>අනුග්‍රහය දක්වන ලද සේවක ප්‍රවාහනය<br>අවිනිශ්චිතතාවය මධ්‍යයේ වැටුප් ගෙවන ලදී<br>අන්තර්ජාලගත පුහුණුව සහ දැනුම හුවමාරුව<br>වෘත්තීය සමිතිය සමග සාධනීය සහභාගීත්වය<br>ක්‍රමෝපායික සැලසුම්කරණය සඳහා අන්තර්ජාලගත අදහස් උත්පාදන<br>වසංගතයේ බලපෑමට ලක්වූ සේවකයින් හට සහන<br>ප්‍රධාන විධායක නිලධාරී සමග ටවුන්හෝල් සැසි<br>"Coffee with CEO" වැඩසටහන<br>සේවක සුබසාධන ක්‍රියාකාරකම් |

නැවත නැවතත් අධ්‍යයනය කිරීම අවශ්‍ය විය. සේවාතුලනය වරින්වර නැවත කාණ්ඩගත කිරීම අවශ්‍ය විය. උද්ගත වන සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ද්විත්ව ආර්ථික අර්බුදය තුළ අභියෝග සහ අවස්ථාවන් ජයගනිමින් අප කටයුතු කරන අතරතුර අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් සමග සබඳතා සවිමත් කර ගැනීම සඳහා මෙම ක්‍රියාකාරී ප්‍රවේශය ඉවහල් විය. අපගේ පාර්ශවකාර සහ සහභාගිත්ව යාන්ත්‍රණයන්, ඒවායේ අවධානයන් සහ අපගේ ප්‍රතිචාරය පහත සාරාංශගත කොට දැක්වේ.

| රජය සහ නියාමකයින් | සැපයුම්කරුවන් සහ ව්‍යාපාරික සහකරුවන් | දේශීය ප්‍රජාව සහ පරිසරය |
|---|---|---|
| රැස්වීම් → සමාජ මාධ්‍ය → දුරකථන → ලිඛිත සන්නිවේදන → විද්‍යුත් මාධ්‍ය | | |
| ○ චක්‍රලේඛ<br>○ මාර්ගෝපදේශ | ○ ටෙන්ඩර් දැන්වීම්<br>○ වාර්ෂික සැපයුම්කාර ලියාපදිංචිය<br>○ පරිශ්‍ර සංචාර<br>○ සම්මුඛ පරීක්ෂණ විමර්ශන | ○ ප්‍රජාවන් සමග විශේෂිත සහභාගීත්ව ක්‍රියාකාරකම්<br>○ ජංගම අධ්‍යාපන ව්‍යාපෘති<br>○ වීථි සංදර්ශන<br>○ ඉදිරිපත් කරනු ලබන සැලසුම් සහ සේවාවන් සම්බන්ධ කාලීන සහ අදාළ තොරතුරු |
| මූල්‍යමය ස්ථාවරත්වය → කාර්යක්ෂමතාවය → අනුකූලතාවය | | |
| ○ ව්‍යාපාරික අඛණ්ඩත්වය<br>○ ගනුදෙනුකරුවන් වෙත වසංගත සහන<br>○ මුදල් රහිත ගනුදෙනු ප්‍රවර්ධනය<br>○ නීතිරීති සහ රෙගුලාසි කෙරෙහි අනුකූලතාවය<br>○ බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රය යළි නගා සිටුවීම සඳහා නියාමක සමග සහයෝගීතාව | ○ වගකීම් සහගත ප්‍රසම්පාදනය<br>○ විනිවිදභාවය<br>○ නිසි කලට ගෙවීම් සිදුකිරීම<br>○ තරගකාරී මිල<br>○ තරගකාරී ලංසු තැබීම<br>○ සාධාරණ ව්‍යාපාර කටයුතු<br>○ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙත ව්‍යාපාරික අවස්ථා | ○ වගකීම් සහගත ව්‍යාපාරික චර්යාව<br>○ සම්පත් ප්‍රශස්තීකරණය<br>○ අපගේ මෙහෙයුම් වල සෘජු පාරිසරික බලපෑම අවම කිරීම<br>○ සවිබලගන්වන ලද දේශීය ප්‍රජාවන් |
| ○ අනුකූලතා සහ අවදානම් කළමනාකරණ පාලන සවිබලකරණය<br>○ තිරසාරත්ව සමාලෝචනයක් පැවැත්වීම<br>○ QR කේතය ප්‍රවර්ධනයේදී ශ්‍රී ලංකා මහ බැංකුව සමග එක් විය<br>○ නිසි කලට හිඟ මුදල් ගෙවීම<br>○ නිසි කලට ආදායම් ගොනුගත කිරීම<br>○ නියාමන වෙනස්වීම් වලට අනුගත වීම | ○ විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලීන්<br>○ වාර්ෂික සැපයුම්කාර ලියාපදිංචිය<br>○ ස්ලිප් රහිත ගනුදෙනු<br>○ අන්තර්ජාලගත වෙන්දේසිය<br>○ සැපයුම්කාර සංචිතය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඇතුළත් කිරීම | ○ ජාතික ප්‍රතිචාරය වෙත සහාය දක්වීම සඳහා කෝවිඩ් අරමුදල වෙත දායකතත්වය<br>○ පශ්චාත් වසංගත ජාතික ප්‍රතිචාරය වෙත සහාය දක්වීමේ ප්‍රජා සත්කාරක ව්‍යාපෘති<br>○ ස්වයංක්‍රීය කාර්ය ප්‍රවාහ සමගින් සම්පත් ප්‍රශස්තීකරණය<br>○ ව්‍යාපාර යළි නගා සිටුවීම සහ කෝවිඩ් වැළැක්වීම පිළිබඳ අධ්‍යාපනය<br>○ කාබන් පියසටහන මනින ලදී<br>○ ප්‍රජාවන් සවිබලගැන්වීම සඳහා ප්‍රජා සත්කාරයන්<br>○ පරිසරය සුරැකීම සඳහා ප්‍රජා සත්කාරයන් |

# මෙහෙයුම් වටපිටාව

වසංගතය මගින් ජාත්‍යන්තර දේශ සීමාවන් වසා දැමීම, සැපයුම්දාම බාධා සමගින් දේශීය සහ විදේශීය වශයෙන් ගනුදෙනුකාර වියදම් කිරීමේ පුරුදු කෙරෙහි සැලකිය යුතු පීඩනයක් ඇති කරන ලද අතර පහත දැක්වෙන වගුවෙහි ඒ පිළිබද විස්තරයක් ඉදිරිපත් කෙරේ.

බොහෝ දෙනෙකුගේ ආර්ථික අවිනිශ්චිතතාවය පිළිබිඹු කරමින් සෑම රටකම පාහේ සිදු වූ රැකියා අහිමිවීම් නිසාවෙන් ආර්ථිකයන් පීඩාවට පත්වීම අනිවාර්ය කරුණක් විය. වසරේ පලමු කාර්තුව තුළ සංචාරකයන් කිසිවකු නොපැමිණීම හමුවේ සංචාරක, විවේකී සහ සහායක සේවාවන් කෙරෙහි ඇති වූ බලපෑම අතිශය දරුණු විය. එහිදී අදාල සම්පත් අඩු මට්ටමකින් භාවිතා කිරීම සහ අධික ලෙස ක්‍රියාවලි ඇනහිටීම හේතුවෙන් එම ක්ෂේත්‍රයන්හි ජීවනෝපාය සරි කර ගත් පුද්ගලයන් හට දැඩි ආර්ථික අසීරුතාවලට මුහුණ දීමට සිදුවිය. සමාජ දුරස්තකරණ අවශ්‍යතා හේතුවෙන් ගුවන්, ගොඩබිම් හා මුහුදු ප්‍රවාහන සේවාවන් සීමිත වූ අතර ඒවායේ අඩු පහසුකම් භාවිතය අද වන විටත් දක්නට ලැබේ. සෞඛ්‍ය හා සුරක්ෂිතතා කරුණු ජනතාව භාණ්ඩ හා සේවා ඇගයීමට ලක් කරන ආකාරය සහ ඔවුන් කටයුතු කරන ලද ආකාරය දැඩි වෙනසකට ලක් කිරීම කෙරෙහි දායක විය. වසර තුළදී අන්තර්ජාලගත රැස්වීම් සහ අන්තර්ජාලගත සහයෝගීතා පදනම් සමගින් අන්තර්ජාලගත පදනම් වෙත ඒකරාශි වීමේ සහ විගමනය වීමේ තත්ත්වයෙහි කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි.

### ශ්‍රී ලංකාව

ණය සඳහා ඉල්ලුම මත වූ නොවැලක්විය හැකි බලපෑම හේතුවෙන් 2019 දී වාර්තා වූ වර්ධනයට සාපේක්ෂව මෙම වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය සැබෑ වශයෙන්ම 3.6% ක සංකෝචනයක් වාර්තා කරන ලදී. සැලකිය යුතු අයුරින් ඉහළ ගිය ආහාර උද්ධමනය සමනය කරන ලද පහළ ඉන්ධන මිල සමගින් වසර පුරා උද්ධමන අනුපාතය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි. අඛණ්ඩව දෙවන වසරේදීත් වසංගතයේ බලපෑමට ලක්වූ ව්‍යාපාරයන් වෙත සපයන ලද පහල පොලී අනුපාත සහ පමාසහනයන් ඇතුළු සහයෝගී මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන් ඔවුන් වෙත, යළි නැගී සිටීම සඳහා මනා පිටුවහලක් ලබා දෙන ලදී. වසර තුළදී සිදුවූ ප්‍රාග්ධන ඉවතට ගලා යාම් සහ රන් අවශ්‍රේණිගත කිරීම මගින් මුදල් ඒකකය මත පීඩනයක් ඇති කරන ලද අතර මූල්‍ය වර්ෂයේ අවසාන භාගයේ දී එහි වටිනාකම විශාල වශයෙන් පහළ ගියේය.

**පොලී අනුපාත**




*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

**දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතය**




*මූලය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල*

**හුවමාරු අනුපාතය සහ වෙළදාම**




*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

**උද්ධමනය CCPI දර්ශකය**




*මූලය: මිල සහ වේතන අංශය, ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව*
*ඉහත දක්වන ලද සියළුම උද්ධමන අනුපාතයන් මාස 12 සංචලන සාමාන්‍යයන් මත පදනම්ව ගණනය කරන ලදී.*

**මෝටර් රථ වල නව ලියාපදිංචි කිරීම**




*මූලය: ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව*

### බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය

වසර තුළදී බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය වර්ධනය වූ අතර සාධක කිහිපයක් හේතුවෙන් 2021 මාර්තු මාසය වන විට එහි මූල්‍ය තත්ත්වය සවිමත් විය. පළමු කාර්තුව තුළ, අසීරු කාලසමයක් ගතකරමින් සිටි ගනුදෙනුකරුවන් වෙත සහාය වීම කෙරෙහි අවධානය යොමු කරන ලද අතර, දෙවන කාර්තුවේදී වර්ධනය අත්පත් කර ගැනීම සඳහා අයකර ගැනීමේ ක්‍රියාවලිය සවිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. කෝවිඩ් 19 වසංගතය තුළ ඇතිවූ ව්‍යාපාරික සංකෝචනයන් සහ මෝටර් රථ ආනයන සීමාවන් වල ප්‍රතිඵලයක් වශයෙන් ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම් වලින් 57% ක් නියෝජනය කෙරෙන්නා වූ කල්බදු කළඹ වල පහළ යාම හේතුවෙන් ණය සහ අත්තිකාරම් පහළ ගියේය.

**ඉපැයුම්**

රු. මිලියන




*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

**වත්කම්**

රු. මිලියන




*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

**අරමුදල් සම්පාදන**

රු. මිලියන




*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

| | මාර්තු -19 | මාර්තු- -20 | මාර්තු- -21 |
|---|---|---|---|
| සමස්ත අත්තිකාරම් වෙත දළ අක්‍රීය අත්තිකාරම් (%) | 7.71 | 11.37 | 11.30 |
| සමස්ත අත්තිකාරම් වෙත ශුද්ධ අක්‍රීය අත්තිකාරම් (%) | 2.29 | 3.79 | 2.82 |
| මුළු වත්කම් වෙත මුළු ශුද්ධ අත්තිකාරම් | 77.95 | 77.25 | 76.22 |
| වෙන්කිරීම් ආවරණ අනුපාතය (%) | 58.77 | 54.72 | 64.16 |

### ඉදිරි දැක්ම

2021 අප්‍රේල් මස වන විට, සහනදායී මූල්‍ය ප්‍රතිපත්ති, සමාජ දුරස්ථභාවය සම්බන්ධ නව යුගයකට ජනතාව හුරු වීම සහ එන්නත්කරණ ක්‍රියාවලීන් හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් සිය පුරෝකථනයන් ඉහළ අතට සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකාව ද 2021 දී සියයට 4 ක වර්ධනයක් අත්කර ගනු ඇති බවට පුරෝකථනය කරනු ලැබ ඇත. කෙසේ වුවද, දකුණු ආසියානු කලාපය තුළ බොහෝ රටවල් වල ප්‍රභේද පැතිරයාමේ පසුබිමක් තුළ මැයි මාසයේ අවසාන භාගයේ දී සිදුකරන ලද රට වසා දැමීමත් සමගින් අදාල පුරෝකථනයන් වෙනස් වීමට ඉඩ ඇත. පීපල්ස් ලීසිං හි මෙහෙයුම් මත කැපීපෙනෙන බලපෑමක් ඇති කළ හැකි විචල්‍යයන් කිහිපයක සංචලනය උච්චාවචනය වන තත්වයක පවතින අතර ඒවා පහත සාරාංශගත කොට දැක්වේ.

| දර්ශකය | පීපල්ස් ලීසිං වෙත බලපෑම |
|---|---|
| මූල්‍ය ප්‍රතිපත්තිය සහ පොලී අනුපාත | ආනයන සම්බන්ධ තාවකාලික අත්හිටුවීම නොවන්නට, පහත හෙළන ලද ණය ගැනීමේ අනුපාතයන් මෝටර් රථ සඳහා වන ඉල්ලුම ඉහළ දැමීම කෙරෙහි හේතු විය හැකිව තිබිණි. තවද, එය තැන්පතු උපයෝජනය කෙරෙහි ඍජුව බලපායි. |
| ණය වර්ධනය | පෞද්ගලික ණය වර්ධනයෙහි පහළයාම සාමාන්‍යයෙන් වර්ධනය වන වත්කම් පදනම වෙත ඉදිරියේදී සිදුවිය හැකි අභියෝග සම්බන්ධ ප්‍රමුඛ දර්ශකයකි. |
| උද්ධමනය | ඉහළ උද්ධමනය හේතුවෙන් විශේෂයෙන්ම අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සම්බන්ධ පාරිභෝගික වියදම අධෛර්යමත් කිරීමේ හැකියාවක් පවතී. |
| වෙළඳ ශේෂය | මෝටර් රථ ආනයනය සම්බන්ධ තාවකාලික අත්හිටුවීම අනාගත ණය වර්ධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැක. |
| රුපියල අවප්‍රමාණ වීම | ඇමරිකානු ඩොලර් සහ යුරෝ වලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි පහළයාම ණය වර්ධනයෙහි ප්‍රධාන මූලාශ්‍රයක් වන නව ආනයනික රථවාහන සහ භාවිත කළ මෝටර් රථ වෙළෙඳපොළ කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කළ හැක. එය පිරිවැය මත පදනම් වූ උද්ධමනයක් කෙරෙහි හේතු විය හැකි අතර සැබෑ ආර්ථිකය මත බලපෑම සමනය කිරීම සඳහා එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පොලී අඩු අනුපාතික ඉහළ දැමීමේ පීඩනයක් ඇති කළ හැක. |
| ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ආදායම | ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ඉහළ යන ආදායම මගින් නව ඩොලර් මත නම් කරන ලද ණය ලබාදීමේ ඉහළ අවදානමක් සංකේතවත් වන අතර එහිදී ඉදිරියට ගෙවිය යුතු විදේශ ණය ගෙවීම් පිළිබඳ අවදානමක් මතු කෙරේ. මෙමගින් හැඟවෙන පරිදි අරමුදල් සම්පාදන ඌනතායන්හි වැඩි කොටසක් දේශීය සම්පත් ඔස්සේ මූල්‍යකරණය අවශ්‍ය වන අතර එමගින් පොලී අනුපාත වපසරිය කෙරෙහි බලපෑම් ඇති විය හැක. මෙමගින් බොහෝවිට පොලී අනුපාත ඉහළ යාම මත පීඩනයක් ඇති කළ හැක. |

# කෝවිඩ් 19 වෙත අපගේ ප්‍රතිචාරය

GRI 403-1, 403-3, 403-7

අප්‍රේල්-20 | මැයි-20 | ජූනි-20 | ජූලි-20 | අගෝ-20 | සැප්-20

පළමු රැල්ල




- රජය මගින් මාර්තු මාසයේදී දීප ව්‍යාප්ත රට වසා දැමීමක් සිදු කරන ලදී
- රට වසා දැමීම තුළදී ඇතිවූ සමාජ ආර්ථික ගැටලු
- ගනුදෙනුකරුවන්ට පමාසහන ලබාදීම සඳහා රජය මගින් නීති රීති හා රෙගුලාසි පනවන ලදී
- ජනතාව හට සිය සේවා ස්ථානයන්හි සමාජ දුරස්ථ බව පවත්වාගෙන යමින් සේවා ඇරඹීමට අවසර ලබාදෙන ලදී
- මහජන ඒකරාශි වීම තහනම් කරන ලදී
- ජනතාව නව සාමාන්‍ය අනුව ජීවත්වීමට හුරුවිය

**පීපල්ස් ලීසිං වෙත බලපෑම**

- ශාඛා වසා දැමීම
- නව ව්‍යාපාර කටයුතු සැකසීමේ අපහසුතා
- ගනුදෙනුකරුවන් වෙත වසංගතය බලපෑම නිසා අයකරගැනීමේ අසීරුතා
- ඉහළ යන අක්‍රීය ණය අනුපාතය
- සීමිත ව්‍යාපාරික කටයුතු නිසා අතිරික්ත ද්‍රවශීලතාවය
- කාර්ය මණ්ඩලයේ සහ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අවශ්‍යතා

**අපගේ ප්‍රතිචාර**




**ගනුදෙනුකරුවන් සඳහා**

- භෞතිකව මෙහෙයුම් සිදුකළ සීමිත ශාඛාවන් සහ ඩිජිටල් පදනම් ඔස්සේ බාධාවකින් තොරව සේවය සපයන ලදී
- කාලෝචිත පොලී ගෙවීම් මගින් ගනුදෙනුකරුවන් වෙත සේවය සලසන ලදී
- මහජන බැංකුව සමග එක්ව ජංගම ටෙලර් යන්ත්‍ර මුදල් ආපසු ගැනීමේ සේවාවන්

**සේවකයින් සඳහා**

- සේවකයින්ගේ සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව තහවුරු කරන ලදී
- කෝවිඩ් 19 විශේෂ කාර්ය බළකාය පිහිටුවන ලදී
- සේවාමුර සැලසුම්, නිවසේ සිට වැඩ කිරීමේ පහසුකම්, ප්‍රවාහන පහසුකම්
- කිසිදු වැටුප් කප්පාදුවක් හෝ රැකියා කප්පාදුවක් සිදු නොවීය

**සැපයුම්කරුවන් සඳහා**

SLIP ක්‍රියාවලිය සහ ගිණුම්වලට මුදල් මාරුකිරීම් ඔස්සේ නිසි කලට ගෙවීම් සිදුකරන ලදී

**ගනුදෙනුකරුවන් සඳහා සහ රජය වෙත සහයෝගය දැක්වීම**

කෝවිඩ් 19 බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාරයන් වෙත සහන සැලසීමේ රජයේ ව්‍යාපෘතීන් වෙත දායක වීම

- පළමු පමාසහනය සඳහා ගනුදෙනුකරුවන්ගෙන් 50%කට වැඩි පිරිසක් සුදුසුකම් ලැබූහ
  - **පහසුකම් සංඛ්‍යාව** - 57,253
  - **කළඹ වටිනාකම** - රු. බිලියන 67.96
- මාස නවයක් සඳහා දඩ පොලිය කපා හරින ලදී
- බස්රථ 4,362 ක් සඳහා රුපියල් බිලියන 8.13 ක වටිනාකමින් යුත් 4% ක පොලී සහනයක්

**දේශීය ප්‍රජාවන් සඳහා**

- සෞඛ්‍ය සත්කාරය සහ සමාජ සුරක්ෂිතතාව වර්ධනය කිරීම සඳහා ඉටුකම කෝවිඩ් 19 අරමුදල වෙත රුපියල් මිලියන 5 ක් පරිත්‍යාග කරන ලදී- පරිත්‍යාග කරන ලද පළමු සමාගම් කිහිපය අතරට එක් විය.
- ආසන්නතම සමාගම් ශාඛාව ඔස්සේ මාර්ගස්ථ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඉලෙක්ට්‍රොනික් මෙවලම් සපයමින් 'සෙනෙහස' ශිෂ්‍යත්වලාභීන් 53 දෙනෙකු වෙත ප්‍රදානයන් සිදු කරන ලදී
- ත්‍රිකුණාමල දිස්ත්‍රික් මහ රෝහල වෙත අධෝරක්ත උෂ්ණත්වමාන දහයක් පරිත්‍යාග කරන ලදී
- කෝවිඩ් වලින් ආරක්ෂාවීමට පෙර සූදානමක් ලෙස රජයේ පාසල් 21 ක් සඳහා අත් පිරිසිදු කිරීම් සහ අනෙකුත් පහසුකම් ලබාදීම

| ඔක්-20 | නොවැ-20 | දෙසැ-20 | ජන-21 | පෙබ-21 | මාර්තු-21 |
| --- | --- | --- | --- | --- | --- |

## දෙවන රැල්ල




- සැප්තැම්බර් 23 වෙනි දින සිට මිනුවන්ගොඩ සහ දිවුලපිටිය පොකුරු
- අදාළ ප්‍රදේශයේ අවශ්‍යතා මත පදනම්ව නිරෝධායන ඇඳිරි නීතිය පනවන ලදී
- එන්නත්කරණ වැඩසටහන් ඇරඹීම
- තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් පාලනය කෙරුණු අතර 2021 අප්‍රේල් සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද තෙක් දෛනිකව වාර්තා වන මරණ සංඛ්‍යාව අඩු වීමක් දක්නට ලැබුනි

### පීපල්ස් ලීසිං වෙත බලපෑම

- ගම්පහ දිස්ත්‍රික්කයේ ශාඛා කිහිපයක් වසා දමන ලදී
- ගම්පහ දිස්ත්‍රික්කයේ සහ සංචාරක ක්ෂේත්‍රයේ ගනුදෙනුකරුවන් දැඩි ලෙස බලපෑමට ලක්විය
- නව ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ අසීරුතා
- කාර්යමණ්ඩලය වෙත වෛරසය ආසාදනය වීම නිසා දිවයින පුරා ශාඛා කිහිපයක් වසා දැමීමට සිදුවිය
- පසුබිම් සැලසුම් සහ ප්‍රධාන කාර්යාලයේ සහයෝගයෙන් බාධාවකින් තොරව සේවාව තහවුරු කරන ලදී

### අපගේ ප්‍රතිචාරය




#### ගනුදෙනුකරුවන් සඳහා

- ව්‍යාපාරික පරිමාවන් ඉහළ නංවන ලදී
- ගනුදෙනුකරුවන් හට ව්‍යාපාරික සහකරුවන් සමග සිදුකළ වැඩසටහන් කිහිපයකින් ප්‍රතිලාභ අත් විය - ඉන්ද්‍රා ට්‍රේඩර්ස්/පුංචි කාර් නිවස

#### සේවකයින් සඳහා

- සේවක චිත්ත ධෛර්‍යය ඉහළ නැංවීම සඳහා ඩිජිටල් පදනම් ඔස්සේ සේවක සහභාගීත්වය පවත්වා පවත්වාගෙන යන ලදී- අන්තර්ජාලගත ක්‍රමෝපායික කවය/ ප්‍රධාන විධායක නිලධාරී සමග ටවුන්හෝල් රැස්වීම්
- අවදානමට ලක්විය හැකි කාර්යමණ්ඩලය සඳහා අහඹු පීසීආර් පරීක්ෂණ/ ඇන්ටිජන් පරීක්ෂණ සිදු කරන ලදී
- භෞතිකමය අත්සන වෙනුවට ඩිජිටල් අත්සන් තැබීම් සහිත ඉලෙක්ට්‍රොනික ලියකියවිලි හඳුන්වාදීම
- පොලී රහිත ණය පහසුකම් ප්‍රදානය කරන ලදී
- බලපෑමට ලක්වූ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පවුල් වෙත නිවසට අවශ්‍ය භාණ්ඩ සහිත පැකේජයක් පිරිනමන ලදී

#### ගනුදෙනුකරුවන් සඳහා සහ රජය වෙත සහයෝගය දැක්වීම

- රුපියල් බිලියන 25.36 ක වටිනාකමකින් යුතු දෙවන පමාසහනය ණය පහසුකම් 15,722 ක් වෙත ලබා දෙන ලදී
- ප්‍රවාහන/ සංචාරක ක්ෂේත්‍රයන්හි නියැලී ගනුදෙනුකරුවන් සඳහා දිගින් දිගටම සහයෝගය ලබාදීම

#### සැපයුම්කරුවන් සඳහා

- SLIP ක්‍රියාවලිය සහ ගිණුම් වලට මුදල් මාරු කිරීම ඔස්සේ නිසි කලට ගෙවීම් සිදුකරන ලදී

#### දේශීය ප්‍රජාවන් සඳහා

- මහනුවර ජාතික රෝහල වෙත රැහැන් රහිත ස්ටෙතස්කෝප් පහක් පිරිනමන ලදී
- කුඩා එකෝ යන්ත්‍රයක්, ආහාර ලබාදීමේ බෑග් 110 ක් සහ ළදරු ස්ටෙතස්කෝප් එකක් බරපතළ ලෙස රෝගාතුර වූ කෝවිඩ් රෝගීන් සඳහා වන දැඩි සත්කාර ඒකකය වෙත පරිත්‍යාග කරන ලදී

#### කෝවිඩ් අර්බුද මධ්‍යයේ වසර අවසානයේ දී සමාගමෙහි අත්පත්කර ගැනීම්

- 2021 මාර්තු මාසයේදී ඉතිහාසයේ ඉහළම මාසික ව්‍යාපාරික පරිමාව
- 2021 මාර්තු මාසයේදී ඉතිහාසයේ ඉහළම හානිකරණ ප්‍රතිවර්තනය
- අවසන් කාර්තුවේ දී ඉතිහාසයේ ඉහළම කාර්තුමය ලාභය
- ඉතිහාසයේ ඉහළම සමූහ ලාභය

# ප්‍රමාණාත්මක කරුණු නිර්ණය කිරීම

GRI 102-46

වසර තුළදී මෙහෙයුම් වටපිටාව මගින් අවිනිශ්චිත කාල සමයක් තරණය කිරීම සඳහා අපගේ ප්‍රමාණාත්මක කරුණු නිර්ණය කිරීමේ සහ ප්‍රමුඛතාකරණ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී. දිගුකාලීන වටිනාකම් නිර්මාණය සඳහා කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් පවත්වන ලද ඉහළම මට්ටමේ සාකච්ඡා මගින් ක්‍රමෝපාය සහ සම්පත් ගලපා ගැනීම කෙරෙහි දිශානතියක් හිමිවිය. මෙම සාකච්ඡා සඳහා ස්ථාපනය කරන ලද තිරසාරත්ව රාමුව සඳහා අපගේ වටිනාකම් පාදක වූ අතර, ඒවා අදාළ තීරණ සඳහා විමර්ශන ආකෘතියක් වශයෙන් ක්‍රියාත්මක විය.

වසර තුළදී තිරසාරත්ව සමාලෝචනයක් සිදු කිරීම සඳහා අප ස්වාධීන උපදේශන ආයතනයක සේවා ලබාගත් අතර ඒ ඔස්සේ එක්සත් රාජධානියේ වගවීම සම්බන්ධ AA1000 සම්මතය සහ GRI සම්මතය මත පදනම්ව දැනට පවතින ප්‍රමාණාත්මකභාව ඇගයුම සමාලෝචනයට ලක් කරන ලදී. අනාගත ප්‍රමාණාත්මක තත්ත්වයන් දිගු ලැයිස්තුවක් සකසන ලද අතර ඉන් අනතුරුව අපගේ සංශෝධිත ක්‍රමෝපාය සහ පාර්ශවකාර සහභාගිත්ව ක්‍රියාවලියෙහි ආදානයන් මගින් තෝරනු ලැබූ තිරසාර සංවර්ධන ඉලක්ක වෙත සම්බන්ධ කරන ලදී. මෙමගින් තෙවන කාර්තුව අවසානයේදී අනුකූලතාවය සහතික කළ හැකි විය.

වසර අවසානය වන විට, වර්තමාන ප්‍රමුඛතා සමග ගැලපීම සඳහා කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තරව ප්‍රමාණාත්මකභාවය නැවත සමාලෝචනයට ලක් කරන ලද අතර එහිදී ඒ අවස්ථාවේ ව්‍යාපාරික ස්වභාවය සැලකිල්ලට ගැණුනි. අදාල ක්‍රියාවලිය සහ ප්‍රතිඵල පහත දැක්වේ.

**පීපල්ස් ලීසිං ESG ආකෘතිය**

- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක
- තිරසාරත්වය සන්නිවේදනය පිළිබඳ කොළඹ කොටස් වෙළඳපොලේ නිර්දේශ
- GRI සම්මතයන්
- සාංගමික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය






GRI 102-49

සිදුකරන ලද වාර්ෂික සමාලෝචනයේදී, (2018/19) මූල්‍ය වර්ෂයේ දී හඳුනාගන්නා ලද ප්‍රමාණාත්මක තේමා ලැයිස්තුවෙන් පහත දැක්වෙන තේමා (10) බැහැර කරන ලද අතර තේමා 4 ක් එකතු කරන ලදී. අදාල තේමාවන් බැහැර කිරීම සහ එකතු කිරීම සඳහා වන හේතු පාඨය පහත දැක්වේ.

| GRI තේමාව | GRI තේමාව ඉවත් කිරීම/එකතු කිරීම සඳහා හේතුපාඨය |
|---|---|
| **ඉවත් කරන ලද GRI** | |
| **GRI 202:** වෙළඳපොල නියෝජනය | පීපල්ස් ලීසිං මගින් ජ්‍යෙෂ්ඨ කළමනාකාර ධුරයන් සඳහා විදේශ පුද්ගලයින් සේවයේ යොදවා නොමැත. සමාගමෙහි ඇතුලත්වීමේ මට්ටමේ වේතනයන් අවම වේතන වලට වඩා අතිශය ඉහළ මට්ටමක පවතින අතර සමගාමී ඇතුලත්වීමේ මට්ටමේ බැංකුකරණ මූල්‍ය වෘත්තිකයින්ගේ පාරිශ්‍රමික සමග අනුරූප මට්ටමක පවතී. |
| **GRI 203:** වක්‍ර ආර්ථික බලපෑම් | නොමිලේ සිදු කරනු ලබන ප්‍රජා ආයෝජන සම්බන්ධයෙන් සමාගමට කිසිදු ප්‍රතිපත්තියක් නොමැත. යටිතල පහසුකම් ආයෝජන සිදුකිරීම සම්බන්ධයෙන් සමාජයෙන්, දේශපාලන පක්ෂවලින් හෝ දේශීය අධිකාරීන් ගෙන් කිසිදු සැලකිය යුතු අපේක්ෂාවක් නොවීය. කෙසේ වුවද, සමාගමෙහි ප්‍රජා සත්කාරක ප්‍රයත්නයන් හි කොටසක් වශයෙන් ඇතැම් පොදු යටිතල පහසුකම් ව්‍යාපෘතීන් ක්‍රියාවට නංවන ලදී. |
| **GRI 204:** ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් | ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් හා සම්බන්ධ ඍජු මූල්‍ය බලපෑමක් පවතී. කෙසේ වුවද, සැපයුම්කරුවන් අතරට ලිපි ද්‍රව්‍ය, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර සහ ඉලෙක්ට්‍රොනික් සැපයුම්කරුවන් ඇතුළත් වන අතර ප්‍රධාන නොවන කාර්යයන් සඳහා පමණක් පිටතින් ලබාගත් ගත් සේවා සම්පාදකයින් යොදා ගැනේ. මේ සම්බන්ධයෙන් නිශ්චිත නියාමනමය අවශ්‍යතාවක් නොපවතී. |
| **GRI 206:** ප්‍රති තරගකාරී චර්යාව | ඉහළ නියාමනගත ක්ෂේත්‍රයක් වශයෙන්, අභ්‍යන්තර ප්‍රතිපත්ති, රජයේ වක්‍ර කොටස් හිමිකාරීත්වය සහ වෙනත් රෙගුලාසි හේතුවෙන් ප්‍රතිතරගකාරී චර්යාවක් ඇතිවීමට ඉඩක් නොවේ. රටේ නීති, නියාමන උපදෙස් සහ ලැයිස්තුගත වීමේ අවශ්‍යතා ද පවතී. ආශ්‍රිත දඩ මුදල් සහ ගාස්තු සඳහා ඍජු මූල්‍ය බලපෑමක් උද්ගත විය හැක. |
| **GRI 301:** අමුද්‍රව්‍ය | පීපල්ස් ලීසිං සේවා සම්පාදකයකු වන බැවින් අමුද්‍රව්‍ය වල සැලකිය යුතු ඍජු මූල්‍ය බලපෑමක් නැත. කඩදාසි සහ තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගත යුතු ප්‍රධාන අමුද්‍රව්‍ය වේ. සම්පත් භාවිතය උපරිම කිරීම සහ පාරිසරික පියසටහන් අවම කිරීම් සඳහා තිරසාර අයුරින් සම්පත් භාවිතය සමාගමේ ප්‍රමුඛතාවයකි. |
| **GRI 304:** ජෛව විවිධත්වය | ජෛව විවිධත්වය සුරැකීම සඳහා නීති හා රෙගුලාසි ස්ථාපනය කොට ඇත. කෙසේ වුවද, සමාගමෙහි මෙහෙයුම් වලින් ජෛව විවිධත්වය කෙරෙහි ඍජු බලපෑමක් එල්ල නොවේ ජෛව විවිධත්වය සහිත ප්‍රදේශයන්හි සමාගමේ ශාඛාවන් නොපවතින අතර එමගින් වගකීම් සහගත ණය ලබාදීම ප්‍රවර්ධනය කෙරේ. |
| **GRI 402:** කම්කරු සබදතා | සාමූහික කේවල්කරණ/ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග සම්බන්ධ රටේ රෙගුලාසි පවතී. සමාගම ප්‍රධාන වශයෙන් කාර්යාල වේලාවන්හි මෙහෙයුම් සිදුකරන අතර කිසිදු සැලකිය යුතු ඍජු බලපෑමක් නොපවතී. |
| **GRI 408:** ළමා ශ්‍රමය | මූල්‍ය සේවා සම්පාදකයෙකු වශයෙන්, ළමා ශ්‍රමය සම්බන්ධව සිදුවීම් ඇතිවීමේ ඉඩකඩ විරල වේ. සමාගම පවිත්‍රකරණ සහ ආරක්ෂණ වැනි සේවාවන් ශ්‍රම සම්පාදකයින් වෙතින් ලබාගන්නා අතර සියළුම කාර්ය මණ්ඩලය අවුරුදු (18) ට වැඩි බවට තහවුරු කරයි. |
| **GRI 409:** බලහත්කාර, අනිවාර්ය ශ්‍රමය | මූල්‍ය සේවා සම්පාදකයෙකු වශයෙන්, විධායක සේවකයින් අවශ්‍ය විටෙකදී දිගු කාලයක් සේවයෙහි යෙදුනද බලහත්කාරයෙන් සේවා ලබාගැනීම අතිශය විරල අවස්ථාවක් වේ. |
| **GRI 412:** මානව හිමිකම් ඇගයුම | මානව හිමිකම් සම්බන්ධයෙන් රටේ රෙගුලාසි පවතින අතර එය වෙනස් කොට සැලකීමේ තේමාව යටතේ ආවරණය කෙරේ. |
| **එකතු කරන ලද GRI තේමාවන්** | |
| **GRI 207:** බදු | බදුකරණය සම්බන්ධව රටේ නීති පවතී. සමාගම නිසි කලට බදු ගෙවීම සම්බන්ධයෙන් රජයේ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සියළුම බදු ආශ්‍රිත රෙගුලාසි සහ අපේක්ෂාවන් වලට අනුගත විය යුතුවේ. විශාල සමාගම් සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු නිසි කලට ගෙවීම් පිළිබඳ සමාජයීය අපේක්ෂාවක් ද පවතී. |
| **GRI 306:** අපද්‍රව්‍ය | අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ රටේ නීති රීති සහ රෙගුලාසි පවතී. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ නිශ්චිත අපද්‍රව්‍ය කළමනාකරණ නීති යටතේ ආවරණය කෙරෙන අතර ඒවා ඉඩම් වෙත බැහැර කිරීම සඳහා අවසර හිමි නොවේ. මධ්‍යම පරිසර අධිකාරියේ සහතිකලත් අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සම්පාදකයින් ඔස්සේ කඩදාසි සහ ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම මගින් සුළු ඍජු ප්‍රතිලාභයක් ද අත් කරගත හැකි වේ. දේශීය ප්‍රජාවන් සහ පරිසර සංවිධාන වගකීම් සහගත අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවධානයෙන් පසුවේ. බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන මගින් කඩදාසි ප්‍රතිචක්‍රීකරණය සහ වගකීම් සහගත ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම් සම්බන්ධ ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳ වාර්තා කරනු ලැබේ. |
| **GRI 407:** සංවිධානගත වීමේ නිදහස සහ සාමූහික කේවල්කරණය | වෘත්තීය සමිති සඳහා රටේ රෙගුලාසි පවතින අතර සමාගමේ ප්‍රතිපත්ති මගින් කිසිදු සේවකයෙකු වෘත්තීය සමිතියක් වෙත බැඳීම වළකාලීමක් සිදු නොකෙරේ. වෘත්තීය සමිති ක්‍රියාමාර්ග නිසා ඍජු මූල්‍ය බලපෑමක් ඇති විය හැකි අතර එසේ සිදුවන්නේ සේවකයින් ඍජුව ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කරන බැවින් කවර හෝ අර්බුදයක් සේවාව ලබා දීමේදී බාධාවක් විය හැකි බැවිනි. |
| **GRI 416:** ගනුදෙනුකාර සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව | සුරක්ෂිතතාව පිළිබඳ සාමාන්‍ය අපේක්ෂාවන්ට අමතරව, වසංගතය මගින් ගනුදෙනුකාර සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව අතිශය වැදගත් යමක් බවට පත් කරන ලදී. මෙහිදී ඍජු මූල්‍ය බලපෑමක් පවතින අතර කෝවිඩ් වළකාලීම සම්බන්ධ ආරක්ෂණ ක්‍රියාමාර්ග වලට අනුගත වීම සමාගමට අතිශය වැදගත් වේ. |

# ප්‍රමාණාත්මක කරුණු නිර්ණය කිරීම

GRI 102-47,103-1, 207-2

| ප්‍රමුඛතා ශ්‍රේණිගත කිරීම 2020/21 | ප්‍රමාණාත්මක තේමාව | හේතුපාඨය | ප්‍රමාණාත්මක තේමාව සහ දර්ශක අංකය |
|---|---|---|---|
| 1 | සෞඛ්‍ය හා සුරක්ෂිතතාව | නව රැලි සහ ප්‍රභේද මගින් වසංගතයේ කාල සීමාව සහ බලපෑම් පිළිබඳ අර්බුදකාරී තත්වයක් නිර්මාණය වන බැවින් අපගේ සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව තවදුරටත් ප්‍රමුඛතාවක් වශයෙන් පවතී. | GRI 403 - වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව<br>GRI 410 - ආරක්ෂණ ක්‍රියාමාර්ග<br>GRI 416 - ගනුදෙනුකාර සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව |
| 2 | තිරසාර මූල්‍ය ඔස්සේ තිරසාර වර්ධනය | අප අපගේ පාර්ශවකරුවන්වන් වෙත වටිනාකම් නිර්මාණය කරන අතරතුර තිරසාර ව්‍යාපාරික වර්ධනයක් ද තහවුරු කළ යුතු වේ. වෙනස්වන වටපිටාවක් තුළ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ ව්‍යාපාරික අවස්ථාවන් ග්‍රහණය කර ගැනීම සඳහා අහිතකර බලපෑම් අවම කර ගැනීමේදී මූල්‍ය ශක්තිය වැදගත් වේ. | GRI 201 - ආර්ථික කාර්යසාධනය |
| 3 | අන්තර්ග්‍රහණ මූල්‍ය | එය අපගේ පොදු පැවැත්මේ අරමුණ වෙන අතර ජාතියේ සමස්ත වර්ධනය සඳහාද එය ප්‍රබල පියවරක් වේ | |
| 4 | ගනුදෙනුකාර අත්දැකීම | සුබවාදී ගනුදෙනුකාර අත්දැකීම් තුළින් හිතෛෂිත්වය නිර්මාණය වන අතර එය අප හට ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට උපකාරී වන අතර සන්නාම කීර්තිනාමය ද වර්ධනය වේ | GRI 417 - අලෙවිකරණය සහ ලේබල්කරණය |
| 5 | ආචාර ධර්ම, සුපිළිපන් බව සහ අනුකූලතාවය | අරමුණු සහගත ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති වෙත අපගේ ස්වේච්ඡා අනුගත වීම සහ අදාල නීති, රෙගුලාසි හා සම්මතයන්ට අනුකූල වීම මගින් මෙහෙයුම් සිදු කිරීම අප සමාජයීය වශයෙන් පිළිගැන්ම සුරක්ෂිත කෙරේ. | GRI 205 - ප්‍රති දූෂණ<br>GRI 207 - බදු<br>GRI 307 - පාරිසරික අනුකූලතාවය<br>GRI 308 - සැපයුම්කාර පාරිසරික ඇගයුම<br>GRI 414 - සැපයුම්කාර සමාජ ඇගයුම<br>GRI 419 - සමාජ ආර්ථික අනුකූලතාවය<br>GRI 413 - දේශීය ප්‍රජාවන් |
| 6 | මානව කුසලතා වර්ධනය | අපගේ සේවකයින් අපගේ සේවාව සම්බන්ධ තානාපතිවරුන් වන අතර පුහුණුව මගින් සේවක කාර්යසාධනය, සහභාගිත්වය, රඳවා ගැනීම සහ වර්ධනය තහවුරු කෙරේ. | GRI 401 - සේවා නියුක්තිය<br>GRI 404 - පුහුණුව හා අධ්‍යාපනය<br>GRI 405 - විවිධත්වය සහ සමාන අවස්ථා<br>GRI 406 - වෙනස් කොට නොසැලකීම<br>GRI 407 - සංවිධානගතවීමේ නිදහස සහ සාමූහික කේවල්කරණය |
| 7 | සම්පත් ප්‍රශස්තකරණය | එමගින් පිරිවැය පහත හෙළන අතර වඩාත් යහපත් ආදායම් කෙරෙහි හේතු විය හැක. | GRI 302 - බලශක්තිය<br>GRI 306 - අපද්‍රව්‍ය<br>GRI 305 - විමෝචන |
| 8 | ඩිජිටල්කරණය | මනා පිවිසුමක්, පහසු සහ සුබවාදී ගණනුදෙනුකාර අත්දැකීමක් සහිත අනාගතයට ගැලපෙන ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා එය උපකාරී වේ. | |
| 9 | සුරක්ෂිත ගනුදෙනු (සයිබර් ස්ථාවරත්වය සහ ගනුදෙනුකාර ප්‍රතිපත්තිය) | එය ව්‍යාපාරයේ මූල්‍ය ස්ථාවරත්වයත්වය කෙරෙහි උපකාරී වන අතර එමගින් වංචා සහ වෙනත් ආරක්ෂක ගැටළු සම්බන්ධ අපගේ ගනුදෙනුකරුවන් සමග පවතින විශ්වාසය තහවුරු කෙරේ. | GRI 418 - ගනුදෙනුකාර රහස්‍යභාවය |
| 10 | නව හඳුන්වාදීම් | එය අපගේ කාලය සහ වෙනත් සම්පත් ඉතිරි කර ගැනීමට උපකාරී වන අතර එමගින් අප හට තරගකාරී වාසියක් සහ අපගේ ගනුදෙනුකරුවන්ට අප සමග වර්ධනීය අත්දැකීමක් පිරිනැමේ. | |

පාර්ශවකරු:
සේවක | ගනුදෙනුකරු | සැපයුම්කරු | දේශීය ප්‍රජාවන් | පරිසරය | ආර්ථිකය

2019/20 ප්‍රමාණාත්මක තේමාවන් සහ ප්‍රමුඛතා ශ්‍රේණිගත කිරීම් නොවෙනස්ව පැවතිනි. වසංගතය පැතිරීම හේතුවෙන් සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව ඉහළම ප්‍රමුඛතාව බවට පත්විය. තවද, 2020/21 දී ප්‍රමාණාත්මක තේමාවන්ද ප්‍රමාණාත්මක තේමාවන් ලැයිස්තුවකට කණ්ඩායම්ගත කෙරිණි.

| SDGs වෙත ගැලපීම | ක්‍රමෝපායික අරමුණු | ප්‍රාග්ධන යොදාගැනීම | අවදානම් භාණ්ඩ |
|---|---|---|---|
| 3 GOOD HEALTH AND WELL-BEING; 8 DECENT WORK AND ECONOMIC GROWTH; 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS | o තිරසාර වර්ධනය පවත්වා ගෙන යාම<br>o ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම<br>o පාරිසරික සහ සමාජ සාධක ඒකාබද්ධකරණය | o මූල්‍ය ප්‍රාග්ධනය<br>o මානව ප්‍රාග්ධනය<br>o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>o ස්වභාවික ප්‍රාග්ධනය | o මෙහෙයුම් අවදානම<br>o මානව සම්පත් අවදානම<br>o ණය අවදානම |
| 8 DECENT WORK AND ECONOMIC GROWTH; 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | o තිරසාර වර්ධනය පවත්වා ගෙන යාම<br>o ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම<br>o අපගේ වෘත්තිකයින් ඔස්සේ විශේෂීකරණය | o මූල්‍ය ප්‍රාග්ධනය<br>o මානව ප්‍රාග්ධනය<br>o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>o බුද්ධිමය ප්‍රාග්ධනය<br>o ස්වභාවික ප්‍රාග්ධනය | o ණය අවදානම<br>o ක්‍රමෝපායික අවදානම |
| 1 NO POVERTY; 8 DECENT WORK AND ECONOMIC GROWTH; 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | o ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම | o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | o ණය අවදානම<br>o ක්‍රමෝපායික අවදානම |
| 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS | o ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම | o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | o කීර්තිනාම අවදානම |
| 1 NO POVERTY; 5 GENDER EQUALITY; 8 DECENT WORK AND ECONOMIC GROWTH; 10 REDUCED INEQUALITIES; 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS; 17 PARTNERSHIPS FOR THE GOALS | o නායකත්වය<br>o පාරිසරික සහ සමාජ සාධක ඒකාබද්ධකරණය | o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>o ස්වභාවික ප්‍රාග්ධනය | o මෙහෙයුම් අවදානම |
| 4 QUALITY EDUCATION; 5 GENDER EQUALITY; 8 DECENT WORK AND ECONOMIC GROWTH; 10 REDUCED INEQUALITIES | o අපගේ වෘත්තිකයින් ඔස්සේ විශේෂීකරණය | o මානව ප්‍රාග්ධනය | o මෙහෙයුම් අවදානම<br>o මානව සම්පත් අවදානම |
| 3 GOOD HEALTH AND WELL-BEING; 6 CLEAN WATER AND SANITATION; 7 AFFORDABLE AND CLEAN ENERGY; 8 DECENT WORK AND ECONOMIC GROWTH; 11 SUSTAINABLE CITIES AND COMMUNITIES; 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION; 13 CLIMATE ACTION; 14 LIFE BELOW WATER; 15 LIFE ON LAND | o පාරිසරික සහ සමාජ සාධක ඒකාබද්ධකරණය | o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>o ස්වභාවික ප්‍රාග්ධනය | o මෙහෙයුම් අවදානම |
| 1 NO POVERTY; 8 DECENT WORK AND ECONOMIC GROWTH; 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | o තිරසාර වර්ධනය පවත්වා ගෙන යාම<br>o ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම | o බුද්ධිමය ප්‍රාග්ධනය<br>o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | o මෙහෙයුම් අවදානම - තොරතුරු තාක්ෂණ අවදානම |
| 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS | o ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම<br>o නායකත්වය | o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>o නිෂ්පාදිත ප්‍රාග්ධනය<br>o බුද්ධිමය ප්‍රාග්ධනය | o මෙහෙයුම් අවදානම - තොරතුරු තාක්ෂණ අවදානම |
| 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | o තිරසාර වර්ධනය පවත්වා ගෙන යාම<br>o ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම<br>o අපගේ වෘත්තිකයින් ඔස්සේ විශේෂීකරණය | o බුද්ධිමය ප්‍රාග්ධනය<br>o සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>o මූල්‍ය ප්‍රාග්ධනය | o කීර්තිනාම අවදානම |

# අපගේ ක්‍රමෝපාය

GRI 416-1

කෝවිඩ් 19 වසංගතයේ බලපෑම හේතුවෙන් අපගේ ක්‍රමෝපාය සමාලෝචනයට ලක් කරමින්, එක් රැයක් තුළ මෙහෙයුම් වටපිටාවේ සිදුවූ වෙනස්වීම් සමග එය ගළපා ගැනීම අවශ්‍ය විය. මෙහිදී අපගේ මූලික ප්‍රතිචාරය වූයේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි දායක වෙමින් පමාසහන සහ සෙසු සහන සලසමින් මෙහි බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් යළි නගා සිටුවීමයි. ඉන් අනතුරුව මෙම අසාමාන්‍ය තත්ත්වයට ගැලපෙන පරිදි අපගේ ක්‍රමෝපායික ඉලක්ක නැවත සැළකිල්ලට ගනිමින් ඇතැම් දිගු කාලීන ඉලක්ක කඩිනම් කිරීමටත් ඇතැම් ඒවා බැහැර කිරීමටත් සිදුවිය. ඉලක්ක මගහැරුනද, වාර්තාකරණයේ සුපිළිපන්බව සහ විනිවිදභාවය පවත්වා ගෙන යාම උදෙසා අප විසින් කාර්යසාධන ලකුණු සටහනක් සකසන ලදී. පහත දැක්වෙන වගුව මගින් ඒ පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කෙරේ.

**කෝවිඩ් 19 කෙරෙහි ප්‍රතිචාරය**

- ශ්‍රී ලංකා මහ බැංකු සැලසුම් යටතේ පීපල්ස් ලීසිං මගින් පළමු පමාසහනය, ණය පහසුකම් 57,253 ක් වෙත ලබා දෙන ලද අතර එහි වටිනාකම රුපියල් බිලියන 67.96 ක් විය. දෙවන පමාසහනය සඳහා ණය පහසුකම් 15,772 ක් සුදුසුකම් ලැබූ අතර එහි වටිනාකම රුපියල් බිලියන 25.36 ක් විය
- අපගේ ගනුදෙනුකරුවන් හට මූල්‍ය පහසුකම් ලබා දෙමින් රට වසා දැමූ කාලසීමාවේදී අපගේ ශාඛාවන් විවෘතව පැවතිණි
- අවදානම අවම කිරීම සඳහා සේවා මුර පදනමක් මත නිවසේ සිට වැඩ කිරීමට සේවකයින් දිරිගන්වන ලදී
- කාර්යමණ්ඩලයේ සහ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව උදෙසා සියලු ව්‍යාපාර ස්ථානයන්හි දැඩි ආරක්ෂණ පියවර ක්‍රියාවට නංවන ලදී
- ගණුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඩිජිටල් ගෙවීම් විසඳුම් ව්‍යාප්ත කිරීම කඩිනම් කරන ලදී
- ගනුදෙනුකරුවන් වෙත බාධාවකින් තොර සේවා සැපයුමක් සඳහා ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම ක්‍රියාවට නංවන ලදී



**ක්‍රමෝපාය - නැවත ගලපන ලද**

| ක්‍රමෝපායික ප්‍රමුඛතා | තිරසාර වර්ධනය පවත්වාගෙන යාම | ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම |
|---|---|---|
| සැලසුම්ගත සේවාවන් | ○ ගනුදෙනුකාර සේවා ස්ථාන සංඛ්‍යාව ඉහළ නැංවීම<br>○ පහසුකම් කළඹ වැඩිදියුණු කිරීම<br>○ ව්‍යාපාර වර්ධනය දිරිගැන්වීම් | ○ ගණනුදෙනුකාර තෘප්තිය වර්ධනය කිරීම<br>○ ණය පහසුකම් ලබා දීමේදී ගතවන කාලය අඩු කිරීම<br>○ ගණුදෙනුකාර පැමිණිලි අවම කිරීම |
| අභියෝග | ○ අඩු ආයෝජනය කිරීමේ රුචිය<br>○ ඉහළ ගිය ණය අවදානම්<br>○ මෝටර් රථ මත ආනයන සීමා<br>○ ගනුදෙනුකාර හමුවීම් සඳහා සීමා | ○ සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අවදානම් අවම කිරීමේ පියවර<br>○ රට වසා දැමීම් |
| අවස්ථා | ○ රන් ණය වල වර්ධනය<br>○ මූල්‍ය ක්ෂේත්‍රය ඒකාබද්ධකරණය<br>○ හවුල්කාරිත්වයන් සහ අත්පත් කර ගැනීම් | ○ ලියකියවිලි අවශ්‍යතා අවම කිරීම<br>○ ගණුදෙනුවල පහසුව සඳහා ව්‍යුහගත සැලසුම් හඳුන්වාදීම |
| බලපෑම් සමග ගැලපීම | ○ වගකීම් සහගත මූල්‍යකරණය සම්බන්ධ අපගේ ප්‍රතිපත්තියට අනුකූලව ණය ලබාදීමේ සැලසුම්වල ප්‍රවේශම් සහගත වර්ධනය<br>○ සුදුසු මූල්‍යකරණ මිශ්‍රය පවත්වාගෙන යන ලදී<br>○ ශ්‍රී ලංකා මහ බැංකු සැලසුම් යටතේ පමාසහන ලබා දීම | ○ ගනුදෙනු සඳහා ගනුදෙනුකරුවන් ඩිජිටල් පදනම් වෙත කැඳවා ගැනීම<br>○ ක්ෂණික වෙළඳපළ අවශ්‍යතා වලට අදාළ සැලසුම් හඳුන්වාදීම්<br>○ කාර්තුමය ගණුදෙනුකාර සමීක්ෂණ තාවකාලිකව නවතා දැමිණි |
| 2020/21 කාර්යසාධනය | වර්ධනය<br> | වොන්ඩර් ලෝන් - නව සැලසුම හඳුන්වා දෙන ලදී<br>මහජන බැංකු ස්වයං බැංකුකරණ ඒකක ඔස්සේ "Pay Way" කුලී ගෙවීම<br>"LankaQR" ගෙවීමේ පදනම ආරම්භ කිරීම |
| අවදානම වෙත සබඳතාවය | ○ ණය අවදානම<br>○ ද්‍රවශීලතා අවදානම<br>○ වෙළෙඳපොළ අවදානම | ○ මෙහෙයුම් අවදානම<br>○ ණය අවදානම |
| 2021/22 සැලසුම් | ○ විවිධාංගීකරණය කරන ලද ආදායම් වර්ධනය ඔස්සේ මූල්‍ය වර්ධනය අත්පත් කර ගැනීම, ලාභ පවත්වාගෙන යාම<br>○ ලාභ නොලබන සබඳතා අවදානමින් තොර බවට පත් කිරීම<br>○ මූලික නොවන/අඩු ආදායම් ව්‍යාපාර වලින් ඉවත්වීම<br>○ අනාගත වර්ධන අවස්ථා සහිත ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරමින් සැලසුම් නිර්මාණය<br>○ හවුල්කාරිත්වයන් සහ අත්පත් කර ගැනීම් | ○ වැඩිදියුණු කරන ලද ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණ පද්ධතිය<br>○ සබඳතා කළමනාකරණය<br>○ විදුලි සංදේශ කරුවන්, රථවාහන නියෝජිතයන් සහ ඉලෙක්ට්‍රොනික් පදනම් සමග සම්බන්ධ වෙමින් සබඳතා වැඩි දියුණු කිරීම<br>○ තාක්ෂණික වශයෙන් සවිබල ගැන්වුනු ගනුදෙනුකරුවන් හට සේවා සැලසීම සඳහා ඩිජිටල් චත්කම් ලබා ගැනීම සහ ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය |



| අපගේ වෘත්තිකයන් ඔස්සේ විශේෂීකරණය | පාරිසරික හා සමාජ සාධක ඒකාබද්ධකරණය | නායකත්වය |
|---|---|---|
| ○ කාර්යක්ෂම සහ එකමුතු සේවා කණ්ඩායමක්<br>○ පුහුණුව හා සංවර්ධනය<br>○ කාර්යසාධන කළමනාකරණය | ○ අපගේ මෙහෙයුම් වල සියළුම පාර්ශවයන් සඳහා පරිසර සහ සමාජ තිරසාරත්වය ඒකාබද්ධ කිරීම<br>○ කාබන් පියසටහන් අවම කිරීම | ○ සවිමත් සාංගමික පාලන ක්‍රියාවලීන්<br>○ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සවිමත් කිරීම |
| ○ සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අවදානම<br>○ රට වසා දැමීම්<br>○ භූගෝලීය වශයෙන් බෙදී ගිය ශ්‍රම බලකාය<br>○ වසංගතය සම්බන්ධ ගැටලු හේතුවෙන් පුද්ගල ආතතිය ඉහළ යෑම | ○ අපගේ මෙහෙයුම් වල සියළුම පාර්ශවයන් සඳහා තිරසාරත්වය ඒකාබද්ධ කළ හැකි ආකාරය සම්බන්ධ දැනුවත් කිරීම්<br>○ සමාජ සහ පරිසර තිරසාරත්වය සඳහා සුදුසු දර්ශක ස්ථාපනය | ○ වෙනස් වූ ව්‍යාපාරික වටපිටාවක් වෙත ක්‍රමෝපාය සහ<br>○ ප්‍රතිපත්ති ගැලපීම |
| ○ සේවා ස්ථානය ඩිජිටල්කරණය ඔස්සේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම<br>○ පුහුණු කටයුතු සම්බන්ධ ගැඹුරු ඩිජිටල් සේවාව | ○ මූල්‍යමය අන්තර්ග්‍රහනය ඔස්සේ ගැඹුරු ව්‍යාප්තිය<br>○ කාබන් පියසටහන් අවම කිරීම මගින් සම්පත් භාවිතය ප්‍රශස්තීකරණය<br>○ සමාගම පුරා තිරසාරත්ව මනෝභාවය ප්‍රචලිත කිරීම | ○ කඩිනම් ඩිජිටල්කරණය<br>○ අනාගතය සඳහා වූ සූදානම් වීමේදී ඉදිරි පිම්ම |
| ○ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කෝවිඩ් 19 කාර්යසාධන බලකාය පිහිටුවීම<br>○ සියළුම ව්‍යාපාරික ස්ථානයන්හි දැඩි සෞඛ්‍ය සහ ආරක්ෂණ පියවර ක්‍රියාවට නැංවීම<br>○ අන්තර්ජාලගත රැස්වීම් සහ ඩිජිටල් ව්‍යාපෘතීන් ඔස්සේ සේවකයින් සහභාගී කරවා ගැනීම<br>○ කණ්ඩායම් බෙදා වෙන් කොට එක් කණ්ඩායමක් නිවසේ සිට වැඩ කිරීම | ○ පවතින සෞඛ්‍ය හා සුරක්ෂිතතා පියවර සහ පමාසහන සැකසීමේදී අමතර කාර්ය ප්‍රමාණය හේතුවෙන් පුහුණු ව්‍යාපෘතීන් සීමා කිරීමට සිදුවිය | ○ ක්‍රමෝපාය නැවත ගැලපීම සහ ක්‍රියාකාරකම් ප්‍රමුඛතාකරණය<br>○ සම්පත් නැවත වෙන් කිරීම<br>○ අධීක්ෂණ වර්ධනය<br>○ අයකරගැනීම් සහ ණය අවදානම් කළමනාකරණය සවිමත් කිරීම<br>○ සයිබර් සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සවිමත් කිරීම |
| සේවක ඵලදායිතාව<br><br> | 7 වැනි වාර්ෂික කාබන් පියසටහන් ඇගයුම<br>කාබන් පියසටහන් 34.94% කින් පහත හෙලන ලදී<br>ප්‍රජාව සහ පරිසරිසරය සම්බන්ධ ව්‍යාපෘතීන් සඳහා රුපියල් මිලියන 20.38 ක් ආයෝජනය කරන ලදී | 2020/21 නව ප්‍රතිපත්තීන් 14 ක් සකසන ලදී<br>පවතින ප්‍රතිපත්ති 14ක් සමාලෝචනය කොට යාවත්කාලීන කරන ලදී |
| ○ මෙහෙයුම් අවදානම<br>○ මානව සම්පත් ආශ්‍රිත අවදානම | ○ ක්‍රමෝපායක අවදානම | ○ ක්‍රමෝපායික අවදානම<br>○ මෙහෙයුම් අවදානම |
| ○ අපේක්ෂා සහගත සේවා ස්ථානයක් නිර්මාණය<br>○ නිසි දුක්ගැනවිලි සම්බන්ධ ක්‍රියාපටිපාටිය, රැස්වීම් ඔස්සේ සිය අදහස් දැක්විය හැකි වටපිටාවක් නිර්මාණය<br>○ පුනර්ජනනීය බලශක්තිය හඳුන්වාදීමේ හැකියාව තවදුරටත් සොයා බලනු ලැබේ.<br>○ සමස්ත කාර්ය මණ්ඩලය අතර විනිවිදභාවය සහ දැනුවත් භාවය තහවුරු කිරීම් සඳහා නිසි පරිදි සකසන ලද මානව සම්පත් ප්‍රතිපත්තිය | ○ අපේක්ෂා සහගත සේවා ස්ථානයක් නිර්මාණයය<br>○ ක්‍රමෝපායික ප්‍රජා සත්කාර ව්‍යාපෘතීන් අඛණ්ඩව පවත්වාගෙන යාම<br>○ ස්වයංක්‍රීය කාර්ය ප්‍රවාහයන් සමගින් අපගේ කාර්යමණ්ඩලයේ ඩිජිටල් හැකියාවන් ඉහළ නැංවීම<br>○ පුනර්ජනනීය මූලයන් සම්බන්ධ ශක්‍යතා ඇගයුමක් සිදුකිරීම<br>○ වගකීම් සහගත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව කාර්යමණ්ඩලය දැනුවත් කිරීම | ○ අවදානම් වටපිටාවක් නිර්මාණය<br>○ කාර්ය ආචාරධර්ම ප්‍රවර්ධනය<br>○ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ආකෘතිය<br>○ පවතින අභ්‍යන්තර පාලන, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සම්බන්ධයෙන් සේවක දැනුවත්භාවය වර්ධනය |

THANK YOU ස්තූතියි

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

41 සමූහ ව්‍යාපාරික රේඛීය විමර්ශනය
53 මූල්‍ය ප්‍රාග්ධනය
59 නිෂ්පාදිත ප්‍රාග්ධනය
63 බුද්ධිමය ප්‍රාග්ධනය
70 මානව ප්‍රාග්ධනය
79 සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය
91 ස්වභාවික ප්‍රාග්ධනය
97 අපගේ සමාජ ආර්ථික බලපෑම

# සමූහ ව්‍යාපාරික රේඛීය විමර්ශනය

මෙම වසරේදී අප විසින් දළ ආදායම් වර්ධනය අත්පත් කරගන්නා ලද ආකාරය පිළිබඳව ආයෝජකයින් හට අවබෝධ කර ගැනීමට පහසු වනු පිණිස අපගේ වාර්ෂික වාර්තාව වෙත ව්‍යාපාරික රේඛීය විමර්ශනයක් හඳුන්වාදීමට අපි කටයුතු කළෙමු. මෙම විමර්ශනය මගින් එක් එක් ව්‍යාපාරික අංශයෙහි ගතිකයන් සහ අපගේ අනාගත වර්ධන අවස්ථා සම්බන්ධ අවබෝධයක් සපයනු ඇත. අපගේ ව්‍යාපාරික අංශ පහත දැක්වෙන පරිදි වේ;




ඉදිරියෙන් දැක්වෙන කොටස එකී ව්‍යාපාරික රේඛාවන් ආශ්‍රිත තොරතුරු වලින් සමන්විත වන අතර සංඛ්‍යා මගින් එක් එක් අංශයේ ප්‍රතිඵල සමූහයේ දෘෂ්ටි කෝණයෙන් පිළිබිඹු කෙරේ. කෙසේවුවද, තැන්පතු, විදේශ මෙහෙයුම් සහ ක්ෂුද්‍ර මූල්‍ය වැනි ඇතැම් ව්‍යාපාරික රේඛාවන්, මූල්‍ය ප්‍රකාශයන්හි සමූහ අංශ විශ්ලේෂණය යටතේ වෙනමම අනාවරණය කර නැති වුවද එකී අංශ වල ඉහළ යමින් පවතින වැදගත්කම සැලකිල්ලට ගනිමින් ඒවා වෙන වෙනම විස්තරාත්මකව දක්වා ඇත.

# සමූහ ව්‍යාපාරික ක්ෂේත්‍රීය විමර්ශනය

## ණය සහ කල්බදු

**පීපල්ස් ලීසිං සතුව අතිශය පුළුල් කල්බදු සහ ණය පහසුකම් කළඹක් පවතී. එය බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයෙහි විශාලතම වටිනාකමින් යුතු පහසුකම් කළඹ වේ.**




කාර්යසාධන විශේෂතා

| | 2020/21 | 2019/20 | වෙනස % |
|---|---|---|---|
| පොලී ආදායම (රු. මිලියන) | 23,008.63 | 28,802.95 | (20.12) |
| දළ ආදායම (රු. මිලියන) | 25,066.27 | 31,038.87 | (19.24) |
| ආංශික ප්‍රතිඵලය (රු. මිලියන) | 6,565.53 | 6,210.91 | 5.71 |
| කල්බදු සහ ණය කලඹ (රු. මිලියන) | 134,656.13 | 140,166.22 | (3.93) |
| අක්‍රීය වත්කම් (%) (NPA) | 9.22 | 9.04 | 0.18 |

### වටිනාකම් නිර්මාණය

මාස 9 ක් සඳහා දඩ පොලිය කපා හරින ලදී

පමාසහන පිරිනමන ලදී
1 වැන අදියර - රු. බිලියන 65.57
2 වැනි අදියර රු. බිලියන 24.17

රු.බිලියන 10.90 ක මාසික ණය නිකුතුවක් සමගින් කල්බදු සහ ණය ලබාදීම නව සන්ධිස්ථානයක් සළකුණු කරයි

සවිබලගන්වන ලද ඩිජිටල් සේවා පදනම්

**අප විසින් සිදුකරන ලද කාර්යය**

අපගේ ගණනුදෙනුකාර පදනම, බෙහෙවින්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වසර පුරාම කෝවිඩ් වසංගතයේ අහිතකර බලපෑමට ලක්විය. පීපල්ස් ලීසිංහි අවධානය බොහෝ සෙයින් යොමු වූයේ ප්‍රධාන වශයෙන් ආදායම් උත්පාදන වත්කම් මත ණය සහ අත්තිකාරම් ලබාදීම වූ අතර මේ වන විට එය වඩාත් සමතුලිත ණය සහ අත්තිකාරම් කළඹක් වෙත මාරු වී ඇත. අපගේ ගනුදෙනුකරුවන්ගේ ආදායම් උත්පාදන ධාරිතාව පහළයාම වසර සඳහා අපගේ අපේක්ෂාවන් කෙරෙහි අහිතකර අයුරින් බලපෑවේය.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කෝවිඩ් වසංගතයේ බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ ව්‍යාපාරයන් වෙත හඳුන්වාදෙන ලද සහන පියවර වලට සමගාමීව, සමාගමද සැබැවින්ම වසංගතයේ බලපෑමට ලක්වූ ගනුදෙනුකරුවන් වෙත පහත දැක්වෙන සහන පිරිනමන ලදී.

- අප විසින් ගනුදෙනුකරුවන් සඳහා මාස හයක දඩ පොලිය කපා හරින ලදී.
- වසංගතයේ පළමු හා දෙවැනි රැළි දෙකේදීම ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි පමාසහන පහසුකම් පිරිනමන ලදී.
- පෞද්ගලික බස් රථ හිමියන් වෙත සහන පිරිනමන ලදී.

ඉහත දක්වන ලද සහන පියවර වලට අමතරව සමාගම මගින් සිය වියදමෙන්ම මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ගනුදෙනුකරුවන් වෙත තවදුරටත් ප්‍රතිලාභ සලසන ලදී.

- ගනුදෙනුකරුවන් සඳහා තවත් මාස තුනක දඩ පොලිය කපා හරින ලදී.
- ගනුදෙනුකරුවන් පමාසහනයන් සඳහා සුදුසුකම් නොලද අවස්ථාවලදී තනි පුද්ගල ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලික සහ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිසැකසුම් සිදු කරන ලදී.

කෙටි කාලීනව, වසංගතය හේතුවෙන් වාණිජ රථවාහන වල ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව අඩාල වී ඇති බැවින් පෞද්ගලික වාහන වෙත කල්බදු පහසුකම් සැපයීම කෙරෙහි අපගේ අවධානය යොමු විය. වසර තුළදී පනවන ලද ආනයන සීමා හේතුවෙන් නව මෝටර් රථ සඳහා වන වෙළෙඳපොළ අහිතකර බලපෑමට ලක් වූ අතර එහිදී පාවිච්චි කරන ලද වාහන සඳහා ඉල්ලුම ඉහළ ගියේය. මෙකී සීමා කිරීම් හේතුවෙන් වෙළඳපොලේ රථවාහන මිල අසාමාන්‍ය ආකාරයෙන් ඉහළ යාම, ණය ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සහ ණය ඇගයීම් සිදුකිරීම කෙරෙහි අභියෝගාත්මක තත්ත්වයක් නිර්මාණය කළේය.

අප විසින් පීඑල්සී ඔන්ලයින් සමගින් වසර තුළ දී අපගේ ඩිජිටල් පදනම සවිමත් කරන ලදී. එහිදී ක්‍රියාවලි කිහිපයක් ඩිජිටල්කරණය කරමින් ගනුදෙනුකරුවන් හට අන්තර්ජාලය ඔස්සේ පමාසහන/සහන ඉල්ලා සිටීමේ අවස්ථාව උදා කරන ලදී. විශේෂ සැලසුම් ප්‍රවර්ධන ව්‍යාපෘතියක් වන රෝද 3 අතමාරුව සහ නව සැලසුමක් වන වොන්ඩර්ලෝන් වසර තුළ දී හඳුන්වාදෙන ලද අතර එමගින් ණය සහ කල්බදු කළඹ වර්ධනය කිරීම අපේක්ෂා කෙරුණි.

**කාර්යසාධනය**

කෝවිඩ් වසංගතය හේතුවෙන් මෙරට ආර්ථිකය අවගමනයට ලක් වූ පසුබිමක් තුළ, වසරේ මුල් භාගයේදී පැවති මන්දගාමී කාර්යසාධනය, වසරේ අවසන් මාස හතරේදී යථා තත්ත්වයට පත් වනු දක්නට ලැබුණි. අවසන් කාර්තුවේ කාර්යසාධනයෙහි ඇතිවූ උද්ගමනය හේතුවෙන් කල්බදු සහ ණය කළඹ 2021 මාර්තු මස ඉතිහාසයේ ඉහළම මාසික ණය සහ කල්බදු ලබා දීමේ වටිනාකම වන රුපියල් මිලියන 10,903.44 වාර්තා කිරීමට සමත් විය.

අවසාන කාර්තුවේ වර්ධන ගතිකය කල්බදු සහ ණය අංශය ශුද්ධ කළඹ සැලකිය යුතු අයුරින් වර්ධන ය වීම කෙරෙහි හේතුවූ අතර, එහිදී සවිමත් කරන ලද අයකරගැනීමේ ප්‍රයත්නයන් හේතුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා අපහායනයෙහි කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණි. අවසන් කාර්තුවේ දී වැඩි දියුණු කරන ලද අය කර ගැනීමේ ක්‍රියාවලයෙහි ප්‍රතිඵලයක් වශයෙන්,පෙර වසරට සාපේක්ෂව 2020/21 දී අපේක්ෂිත ණය අලාභ සඳහා අපහායනය සැලකිය යුතු අයුරින් පහත වැටුණි.

අපගේ ණය කළඹ වෙත සාපේක්ෂ වශයෙන් නව පහසුකමක් වන, රන් ණය, පෙර වසරට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් රුපියල් මිලියන 1,993.51 කරා 122.56% කින් වර්ධනය විය. වසර තුළදී, මෙම සැලසුම මගින් රුපියල් මිලියන 242.12 ක වටිනාකමකින් යුත් පොලී ආදායමක් ද වාර්තා කරන ලදී.

2020 මැයි මාසයේදී දශකයකට පසු සමස්ත කොටස් මිල දර්ශකය අවම අගයක් වාර්තා කිරීමෙන් අනතුරුව, කොළඹ කොටස් වෙළඳපොළ යථා තත්ත්වයට පත්වීමත් සමඟ, සමාගමෙහි ආන්තික වෙළඳාම් කලඹ 2020 මාර්තු 31 දිනට වාර්තා වූ රුපියල් මිලියන 2,265.92 සිට 2021 මාර්තු 31 දිනට රුපියල් මිලියන 4,832.68 දක්වා ඉහළ නැගුණි. ආන්තික වෙළඳාම් ණය මගින් උත්පාදනය කරන ලද පොලී ආදායම වසර තුළදී රුපියල් මිලියන 381.70ක් විය.

වසර තුළදී 35.58% කින් පහත වැටුනු සාධකකරණය (Factoring) ශුද්ධ කලඹ මගින් කෝවිඩ් වසංගතයේ අහිතකර බලපෑම පිළිබිඹු විය. මෙම සැලසුම මගින් වසර සඳහා උත්පාදිත පොලී ආදායම ද රුපියල් මිලියන 317.89 දක්වා පහත වැටුණි.

**කල්බදු සහ ණය ලබාදීම - කාර්තුමය වශයෙන්**




**කල්බදු සහ ණය කළඹ**




**පොලී ආදායම සහ ආංශික ප්‍රතිඵල**




**ඉදිරි දැක්ම**

ඉදිරිය පිළිබඳව සලකා බලන විට අපි, අපගේ කළඹ නිසි විශාලත්වයෙන් යුතුව, පෞද්ගලික රථවාහන සහ ආදායම් උත්පාදනය කරන වාණිජ රථවාහන වලින් සමන්විත පහසුකම් කලඹක් වන බවට බවට තහවුරු කිරීම කෙරෙහි අවධානය යොමු කරන්නෙමු. අප විසින් අපගේ ප්‍රධාන පහසුකම් කෙරෙහි අවධානය යොමු කරනු ලබන අතර, ලාභ නොලබන සහ අඩු ලාභයක් සහිත පහසුකම් පිළිබඳව සමාලෝචනය කොට කාර්යසාධනය වර්ධනය කළ හැකි ආකාරයන් හඳුනාගැනීම හෝ ක්‍රමෝපායික වශයෙන් අදාළ සැලසුම් බැහැර කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. කල්බදු සහ ණය කළඹෙහි ණය ගුණාත්මකභාවය වර්ධනය කිරීම තවදුරටත් ඉහළම ප්‍රමුඛතාවක් ගනු ඇති අතර සමාගම, පාදක වන වත්කම් වටිනාකම් මත විශ්වාසය තබනු වෙනුවට ගනුදෙනුකරුවන්ගේ මුදල් ප්‍රවාහ පිළිබද අවධානාත්මක ඇගයීමක් සිදු කරනමින් ණය තක්සේරුකරණය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරයි.

## තැන්පතු

**සමාගමෙහි මෙහෙයුම් මූල්‍යකරණයේදී තිරසාර අඩු පිරිවැය අරමුදල් මූලාශ්‍රයන් තහවුරු කිරීම සඳහා තැන්පතු වර්ධනය අතිශය වැදගත් වේ. බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ ඉහළම තැන්පතු පදනම පීපල්ස් ලීසිං සතු වන අතර සමාගමෙහි ව්‍යාපාරික අවශ්‍යතාවයට සමගාමීව අඛණ්ඩව ඉතුරුම් සැලසුම් සම්බන්ධයෙන් දිරිගන්වන සුළු වර්ධනයක් වාර්තා වේ.**

### කාර්යසාධන විශේෂතා

| | 2020/21 | 2019/20 |
|---|---|---|
| ඉතුරුම් (රු. මිලියන) | 8,503.17 | 6,770.64 |
| ස්ථාවර තැන්පතු (රු. මිලියන) | 92,999.77 | 99,930.39 |
| ඉතුරුම් වර්ධනය (%) | 25.59 | 26.91 |
| ස්ථාවර තැන්පතු වර්ධනය/පහළයාම (%) | (6.94) | 20.35 |




### වටිනාකම් නිර්මාණය

| | |
|---|---|
| බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ ඉහළම තැන්පතු පදනම | ඉතුරුම් වල වර්ධනය 25.59% |
| බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ තැන්පතු වෙළඳපොළ කොටස 13.39% | සමාගමෙහි ණය ලබාගැනීමේ මිශ්‍රයෙහි නියෝජනය 83.36% |

**අප විසින් සිදු සිදුකරන ලද කාර්යය**

වසර තුළදී ණය සඳහා වන ඉල්ලුම පහත වැටීම හේතුවෙන්, සමාගමෙහි ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලනු පිණිස තැන්පතු වර්ධන ක්‍රමෝපායන් සියුම් ලෙස යළි සකසන ලදී. සමාගම වෙත තිරසාර අඩු පිරිවැය අරමුදල් පදනමක් සකසමින් වසර තුළදී පහල පොලී අනුපාතික තත්ත්වයක් යටතේ වුවද අප විසින් ඉතුරුම් වර්ධනය අඛණ්ඩවම අත්පත් කර ගැනුණි. එහිදී ස්ථාවර තැන්පතු අනුපාත විචක්ෂණශීලි මට්ටමක පවත්වාගෙන ගිය අතර අපගේ ප්‍රතිපත්තිය වන මිල තරඟකාරීත්වයෙන් ඉවත්ව සිටීම එලෙසින්ම පවත්වාගෙන යන ලදී.

සමාගම මගින් ගනුදෙනුකරුවන් හට මහජන බැංකුවේ මුදල් තැන්පතු යන්ත්‍ර භාවිත කිරීමේ අවස්ථාව සලසන ලද අතර, එමගින් ඔවුන්හට මුදල් තැන්පත් කිරීමට මෙන්ම ආපසු ගැනීමටත් හැකිවීම හේතුවෙන් අපගේ ගනුදෙනුකාර වටිනාකම් සමුදාය තවදුරටත් ශක්තිමත් විය. විශ්වාසය ගොඩනගා ගැනීමේදී මූල්‍ය ආයතනය සතු ස්ථාවරත්වය පිළිබඳව සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ගණුදෙනුකරුවන් දැනුවත් කිරීමේ අපගේ ප්‍රවේශය තවදුරටත් පවත්වාගෙන යන ලදී.

විසිපසපස් වසරක් පුරා ගොඩ නංවා ගන්නා ලද සවිමත් දේශීය අධිකාරීත්වය සමගින්, ෆිච් රේටිංග්ස් හි A+ ණය ශ්‍රේණිගත කිරීම හා අපගේ මව සමාගමේ සවිබලය එක් වූ කල සමාගම පිළිබඳව විශ්වාසය කැපී පෙනෙන අයුරින් ඉහල නැඟුනි. ගණුදෙනුකාර කේන්ද්‍රීය එළඹුම වර්ධනය කෙරෙහි ප්‍රධාන සාධකය වූ අතර වසර තුළදී ව්‍යාපාරික බාධාවන් මධ්‍යයේ වුවද මෙම තත්ත්වය ආරක්ෂා කර ගැනුණි. අප විසින් දිගින් දිගටම අපගේ වටිනාකම්, බැංකු නොවන මූල්‍ය ආයතන වල ශක්තීන් භාවිත කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ගණුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැදගත්කම සහ ගනුදෙනුකාර සේවාව සම්බන්ධයෙන් අපගේ අලෙවි කණ්ඩායම් පුහුණු කිරීම සිදු කෙරුණි.

**කාර්යසාධනය**

ඉතුරුම් වර්ධනය කෙරෙහි දක්වන ලද දැඩි අවධානයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, අපේක්ෂාවන් අභිබවා යමින් රුපියල් මිලියන 8,503.17 දක්වා 25.59% ක වර්ධන ඉහළයාමක් අත්පත් කරගැනීමට හැකි විය.ණය කළඹ අඩුවීම හේතුවෙන් උද්ගත වූ ප්‍රමාණවත් ද්‍රවශීලතාවය නිසා අප විසින් ක්‍රමෝපායික වශයෙන් වර්ධන ප්‍රයත්නයන් ලිහිල් කරන ලද අතර එම නිසා වසර තුළදී ස්ථාවර තැන්පතු පහළ ගියේය. ගනුදෙනුකාර චර්යාව පිළිබඳ අවබෝධයන් අපගේ ක්‍රමෝපාය කෙරෙහි උපකාරී වන අතර, එහිදී ඉලක්කගත අලෙවිකරණය වෙත සමාගමේ අවශ්‍යතාවලට අනුව කල්පිරීමේදී තත්ත්වයන් සහ මිලකරණය ගලපා ගැනීමට හැකි වේ. ප්‍රවේශම් සහගත සහ කාර්යක්ෂම සේවාව වර්ධනය කෙරෙහි ඉවහල් වන දිගුකාලීන සබඳතා පවත්වාගෙන යාම කෙරෙහි උපකාරීවීම අපගේ සුවිශේෂී ලක්ෂණය විය. කෙසේ වුවද, සමාගම තවමත් දිගුකාලීන ණය ලබාදීමේ කළඹ සමග ගැළපෙන පරිදි දිගු කල්පිරීමක් සහ තැන්පතු ලබා ගැනීමේ අපහසුතාවයන්ට මුහුණ පාමින් සිටී. එහි ප්‍රතිඵලයක් වශයෙන් තැන්පතු පදනම මාස 12ට අඩු කල්පිරීම සහිත තැන්පතු වෙත යොමුවීමක් දක්නට ලැබුණි.

**තැන්පතු පදනම**




**කල්පිරීම මත තැන්පතු පදනම**




**ඉදිරි දැක්ම**

සහනදායි මූල්‍ය ප්‍රතිපත්තිමය ස්ථාවරයන් පහල පොලී අනුපාත කෙරෙහි හේතු වූ අතර එය තැන්පතු වර්ධනය කෙරෙහි හිතකර නොවී ය. කෙසේ වුවද, අපගේ මූලික අවධානය යොමු වූයේ අඩු පිරිවැය අරමුදල් පදනම වෙත මාරු වීම සඳහා මග සලසමින් මිශ්‍රය වෙනස් කරන අතරතුර තැන්පතු වර්ධනය ණය වර්ධනය සමග ගලපා ගැනීම කෙරෙහිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එළඹෙන වසරේදී ඉපැයුම් සහ වර්ධනය තුලනය කිරීම සඳහා ස්ථාවර තැන්පතු සම්බන්ධ වර්ධනය මන්දගාමී බවට පත් කරන අතරතුර ඉතුරුම් ගිණුම් වර්ධනය කිරීමේ අපගේ ක්‍රමෝපාය තවදුරටත් පවත්වාගෙන යාමට අපි කටයුතු කරමු.

# ඉස්ලාමීය මූල්‍ය

**අල් සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉස්ලාමීය මූල්‍ය සේවා සම්පාදකයකු බවට පත්ව ඇත. එහි ගනුදෙනුකරුවන් සමාගම්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ඉහළ ශුද්ධ පිරිවැටුමක් සහිත පුද්ගලයින් සහ වෙළඳ, ප්‍රවාහන, කෘෂිකර්ම සහ සේවා ක්ෂේත්‍රයෙන්හි වෘත්තිකයන්ගෙන් සමන්විත වේ.**




## කාර්යසාධන විශේෂතා

| | 2020/21 | 2019/20 | වෙනස % |
|---|---|---|---|
| පොලී ආදායම (රු. මිලියන) | 1,180.18 | 1,477.95 | (20.15) |
| ආංශික ප්‍රතිඵලය (රු. මිලියන) | 338.49 | 315.79 | 7.19 |
| ආංශික වත්කම් (රු. මිලියන) | 5,156.38 | 7,029.13 | (26.64) |
| අක්‍රීය වත්කම් (NPA) (%) | 9.07 | 10.53 | (1.46) |

## වටිනාකම් නිර්මාණය

බදු පෙර ලාභය
රු. මිලියන 338.49

කෝවිඩ් 19 වසංගතය තුළ
බාධාවකින් තොර සේවාව

නිසි පරිදි සකසන ලද
ක්‍රියාවලි

පිරිනමන ලද පමාසහන
1 වැනි රැල්ල: පහසුකම් 2,605
2 වැනි රැල්ල: පහසුකම් 667

### අප විසින් සිදුකරන ලද කාර්යය

අල් සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකය මගින් බෙහෙවින්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ගනුදෙනුකරුවන් හට පොදු ශාඛා ජාලය ඔස්සේ සහ විශේෂිත ශාඛා හතක් මගින් ඉස්ලාමීය මූල්‍ය සේවාවන් සපයනු ලැබේ. සීමිත පරිමාණයකින් ක්‍රියාත්මක වූ අපගේ ශාඛා ජාලය, පීඑල්සී ඔන්ලයින් සහ හෙල්ප් ඩෙස්ක් සහයෝගිතා අංශයේ ක්‍රියාකාරකම් ඔස්සේ කෝවිඩ් වසංගතය මධ්‍යයේ වුවද වසර පුරා අපගේ ගනුදෙනුකරුවන් වෙත බාධාවකින් තොරව සේවා සැපයීමට කටයුතු කරන ලදී.

අපගේ ගනුදෙනුකරුවන් අතුරින් බොහෝ දෙනෙකු වසංගතයෙහි අහිතකර බලපෑමට ලක්විය. අල් සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකය මගින් වසංගතයේ පළමු හා දෙවැනි රැල්ල තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ පමාසහන පහසුකම් සපයන ලද අතර ණය පහසුකම් ප්‍රතිව්‍යුහගතකරණය සහ ප්‍රතිසැකසුම් සිදුකරමින් ආදායම් හඳුනාගැනීමේ කාල සීමාව දිගු කරන ලදී.

අපගේ මව් සමාගම වන මහජන බැංකුවේ ගනුදෙනුකරුවන් හට ද අල් සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකය ඔස්සේ ඉස්ලාමීය බැංකුකරණය වෙත සහභාගි වීමට හැකි විය. ෂරියා නීතිය වෙත අනුකූලතාවය ඉල්ලා සිටි මහජන බැංකු ගනුදෙනුකරුවන්ගේ ජංගම/ඉතුරුම් ගිණුම් වල ශේෂයන්, පීපල්ස් ලීසිං ෂරියා ගිණුම්වල තැන්පත් කරන ලදී.

### කාර්යසාධනය

වසර තුළදී අල් සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකයෙහි ලාභය රුපියල් මිලියන 338.49 දක්වා 7.19% කින් වර්ධනය විය. ණය සහ අත්තිකාරම් කළඹෙහි 10.75% ක පහළයාම සමගින් වසර තුළදී පොලී අනුපාත පහළ ගිය බැවින් පොලී ආදායම 20.15% කින් පහළ ගියේය. අය කරගන්නා ලද වෙනත් ගාස්තු ඉහළ යාම හේතුවෙන් ගාස්තු හා කොමිස් ආදායම 2.69% කින් ඉහළ ගියේය. පොලී අනුපාත පහත වැටී තැන්පතු 3.08% කින් පහළ යාම හේතුවෙන් පොලී වියදම ද 18.21% කින් පහත වැටුණි. කෙසේ වුවද, වසරේ අවසාන කාර්තුවේ වර්ධනය වූ අය කර ගැනීම් හේතුවෙන් රුපියල් මිලියන 67.80 ක අපේක්ෂිත ණය අලාභ සම්බන්ධ අපහායනයේ ප්‍රතිවර්තනයක් සිදුවූ අතර එය ඉස්ලාමීය මූල්‍ය අංශයේ ලාභ වල 7.19% ක ඉහළයාමක් කෙරෙහි දායක විය.

පහල ව්‍යාපාර පරිමාවන් හේතුවෙන් වත්කම් වර්ධනය 26.64% ක සෘණාත්මක අගයක් වාර්තා කළේය. වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රතිපත්ති අනුපාත පහත හෙලන ලද බැවින් පහත වැටුනු පොලී අනුපාත හමුවේ වගකීම්ද 29.45% කින් පහත වැටුණි. අවසාන කාර්තුවේ අතිවිශිෂ්ට අයකර ගැනීමේ ක්‍රියාවලිය හේතුවෙන් අක්‍රීය වත්කම් 9.07% ක් (2019/20: 10.53%) වශයෙන් රඳවා ගැනීමට හැකි විය.

**කළඹ සහ අක්‍රීය වත්කම් අනුපාතය**




**පොලී ආදායම සහ ආංශික ප්‍රතිඵල**




### ඉදිරි දැක්ම

අප විසින් කෙටි හා මධ්‍ය කාලීනව වර්ධනය සඳහා අනාගත සැලසුම් සහ වෙළඳපල කෙරෙහි අවධානය යොමු කර ඇත. අප රන් මූල්‍ය, අනාගත වර්ධන අවස්ථා සහිත අංශයක් වශයෙන් හඳුනාගෙන ඇත. තනි ශාඛාවක ඉස්ලාමීය මූල්‍ය වෙනුවෙන් විශේෂිත ඉඩකඩක් වෙන් කරවා ගනිමින් පීපල්ස් ලීසිං ශාඛා ජාලය ඔස්සේ අපගේ නියෝජනය සවිමත් කර ගැනීමට අපි අපේක්ෂා කරමු. මෙම විශේෂිත මූල්‍යකරණ ක්‍රමවේදය සඳහා දැනට ආකර්ෂණය කර නොගත් වෙළඳපොළක් පවතින බව අපගේ විශ්වාසයයි. විශේෂිත ප්‍රදේශයන්හි ඉස්ලාමීය මූල්‍ය සඳහා වන ඉල්ලුම මත පදනම්ව මේ සඳහා ශාඛාවන් කිහිපයක් හඳුනාගෙන ඇත.

# රක්ෂණ

## සමූහයේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු අපගේ පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී මගින් සිදු කරනු ලැබේ.




### කාර්යසාධන විශේෂතා

| | 2020/21 | 2019/20 | වෙනස % |
|---|---|---|---|
| ශුද්ධ ඉපැයුම් වාරිකය (රු. මිලියන) | 5,198.69 | 5,357.95 | (2.97) |
| ආංශික ප්‍රතිඵල (රු. මිලියන) | 1,570.22 | 1,053.62 | 49.03 |
| ආංශික වත්කම් (රු. මිලියන) | 11,133.86 | 10,099.37 | 10.24 |
| ආංශික වගකීම් (රු. මිලියන) | 6,266.78 | 6,449.06 | (2.83) |
| හිමිකම්පෑම් අනුපාතය (%) | 50.91 | 67.52 | 16.61 |

### අප විසින් සිදුකරන ලද කාර්යය

කෝවිඩ් 19 වසංගතයේ පළමු රැල්ල සමගින් පනවන ලද දීප ව්‍යාප්ත රට වසා දැමීමෙන් අනතුරුව වහාම උද්ගත වූ අභියෝගයන්ට රක්ෂණ අංශය මගින් කඩිනම් ප්‍රතිචාර දක්වන ලදී. සමාජ දුරස්ථභාවය සහ ව්‍යාපාරික අඛණ්ඩත්වය කෙරෙහි පහසුකම් සැලසීම උදෙසා අප විසින් දුරස්ථ සේවා සැපයුම සහ අපගේ සේවා ක්‍රියාවලිය ඩිජිටල්කරණය සිදු කරන ලදී. වසංගතයේ ව්‍යාප්තිය මගින් රක්ෂණ අංශයේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය කඩිනම් කරවන ලදී. එහිදී පීපල්ස් ඉන්ෂුවරන්ස් වෙබ් අඩවිය/පීඑල්සී ඔන්ලයින් ඔස්සේ වාරික ගෙවීම සඳහා ඩිජිටල් වාරික ගෙවීමේ ක්‍රම හඳුන්වාදීම, ඊ රක්ෂණ කාඩ්පත් ආරම්භ කිරීම සහ ගණුදෙනුකරුවන්ගේ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියාවලි ප්‍රතිව්‍යුහගතකරණය සිදු කරන ලදී. බාධාවකින් තොරව සේවා සැපයුම තහවුරු කිරීම පිණිස, අතිශය වැදගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත දුරස්ථ පිවිසුම් පහසුකම් ඇතුළු නිවසේ සිට වැඩ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සලසන ලදී. වසංගත කාලසීමාව පුරා සතියේ දින හතේම පැය 24 පුරා ක්‍රියාත්මක වූ ඇමතුම් මධ්‍යස්ථානය මගින් ගනුදෙනුකරුවන් වෙත ඔවුන්ගේ විමසීම් සහ ගැටලු සම්බන්ධයෙන් සහාය දක්වන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම මගින් නියෝග කළ පරිදි, සේවාලාභීන් වෙත ඔවුන්ගේ හිඟ වාරික ගෙවීම සඳහා මාස තුනක කාල සීමා දිගුවක් පිරිනමන ලදී. ත්‍රිකුණාමලය, ඇඹිලිපිටිය සහ අම්බලන්තොට නව ප්‍රාදේශීය කාර්යාල තුනක් විවෘත කරමින් පීපල්ස් ඉන්ෂුවරන්ස් ශාඛා ජාලය වසර තුළදී තවදුරටත් පුළුල් කරන ලදී.

### කාර්යසාධනය

දළ ලිඛිත වාරිකය 2020දී 0.3% ක සුළු සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කළ අතර, ක්ෂේත්‍රය මගින් 1.3% ක දළ ලිඛිත වාරික පහළ යාමක් වාර්තා කිරීමට සාපේක්ෂව එය ප්‍රශංසනීය තත්ත්වයකි. රජය මගින් මෝටර් රථ ආනයන මත සීමා පැනවීම සහ වසංගතයෙහි අහිතකර බලපෑම් හේතුවෙන්, මෝටර් රක්ෂණ ව්‍යාපාරයෙහි වර්ධනය සීමා සහිත විය. මෙම තත්ත්වය අපේක්ෂිත දළ ලිඛිත වාරික ඉලක්ක වෙත ළඟා වීම කෙරෙහි පීපල්ස් ඉන්ෂුවරන්ස් වෙත බාධා පැමිණුනු අතර එහිදී 94% ක ඉලක්කයක් සපුරා ගන්නා ලදි. එමෙන්ම ආකර්ශිත පීපල්ස් ලීසිං අංශයේ දළ ලිඛිත වාරික වර්ධනය කෙරෙහිද සෘණාත්මක බලපෑමක් ඇතිවිය. කෙසේ වුවද සෙසු සියළුම අංශ මගින් විකිණුම් වර්ධනය අත්පත් කර ගන්නා ලදී. ජාතික විකුණුම් 11% කින්ද බෑන්ක් ඇෂුවරන්ස් 12% කින් ද ආයතනික සහ තැරැව්කාර විකිණුම් 81% කින්ද වර්ධනය විය.

වසංගත කාල සීමාව තුළ රට වසා දැමීම සහ සංචරණ සීමා හේතුවෙන් වසර තුළදී මෝටර් රක්ෂණ හිමිකම්පෑම් සැලකිය යුතු ආකාරයෙන් පහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඓතිහාසික ඉහළ ප්‍රාරක්ෂණ ප්‍රතිඵලයක් සමගින් ලාභදායිත්ව කාණ්ඩය රුපියල් මිලියන 1,570.22 දක්වා 49.03% ක වර්ධනයක් වාර්තා කළේය.

පීපල්ස් ඉන්ෂුවරන්සි හි වත්කම් පදනම ප්‍රධාන වශයෙන් ආයෝජන වලින් සැදුම්ලත් වේ. වසර තුළ පැවති පහළ පොලී අනුපාතය හේතුවෙන්, පොලී ආදායම පහළ ගිය අතර, ආයෝජන කළඹ මත ශුද්ධ උපලබ්ධි ලාභ සහ ශුද්ධ සාධාරණ අගය මත ලාභ මගින් එය හිලව් කරන ලදී. අප විසින් රක්ෂණවර හිමියන් වෙත මාස තුනක ණය කාලසීමාවක් ලබාදීම හේතුවෙන් වසර තුළ දී ලැබිය යුතු දෑ ඉහළ ගිය අතර, ගනුදෙනුකරුවන්ගෙන් වාරික එක්රැස් කරගැනීමේදී අසීරුතාවලට මුහුණ පෑමට සිදුවිය.

### වටිනාකම් නිර්මාණය

**ඓතිහාසික ලාභ වර්ධනය**

**ඩිජිටල්කරණය**
- අන්තර්ජාලගත ගෙවීම්
- ඊ රක්ෂණ කාඩ්පත්
- අන්තර්ජාලය ඔස්සේ රක්ෂණ ඔප්පු ලබාදීම
- අන්තර්ජාලය ඔස්සේ හිමිකම්පෑම් සිදුකිරීම

**අඛණ්ඩ මෙහෙයුම්**

**රක්ෂණවර හිමියන් වෙත මාස තුනක ණය කාලසීමාව දිගු කිරීම**

### ඉදිරි දැක්ම

තක්සේරුකරුවන්, විකිණුම් කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් වෙත යෙදවුම් ලබාදීම ඇතුළුව යෙදවුම් කිහිපයක සිදු කෙරෙමින් පවතින සංවර්ධන කටයුතු සමගින් රක්ෂණ අංශයේ ඩිජිටල්කරණ ව්‍යාප්තිය අඛණ්ඩව සිදු කෙරේ. එමගින් ගනුදෙනුකරුවන් සඳහා වන සමාගමෙහි වටිනාකම් සමුදාය ඉහළ නැංවෙනු ඇත. අප විසින් අතිශය අවිනිශ්චිත බාහිර පරිසරයක් තුළ කටයුතු කරන අතරේදී, අපගේ ආපදා සහන සහ ව්‍යාපාර අඛණ්ඩව සැලසුම් සවිබලගන්වන අතර, එහිදී ක්ෂේත්‍රයේ ඉහළ යමින් පවතින දැඩි තරගකාරිත්වයට මුහුණදීම සඳහා නවතාවයෙන් යුතු සැලසුම් සහ වැඩිදියුණු කරන ලද ක්‍රියාවලි සහ සේවා සැපයුමක් හඳුන්වාදෙනු ලැබේ.

### ශුද්ධ ඉපැයුම් වාරිකය




### ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රරක්ෂණ වියදම්




### ආංශික ප්‍රතිඵල



# විදේශීය මෙහෙයුම්

**ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (LAFL), සමූහයේ බංග්ලාදේශයෙහි පිහිටි පරිපාලිතය වන අතර, එමගින් අභියෝගාත්මක වසරක් තුළදී වසර සඳහා රුපියල් මිලියන 142.07 ක ලාභයක් වාර්තා කළේය. වසර තුනකට පෙර හඳුන්වාදෙන ලද මෙම සමාගම අවිනිශ්චිත වටපිටාවක් තුළ අරමුදල් මත පදනම් වූ සහ ගාස්තු මත පදනම් වූ ක්‍රියාකාරකම් තුලින් වර්ධනය අත්පත් කර ගනිමින් සිටී. මෙය පීපල්ස් ලීසිං සමාගමට ක්‍රමෝපායික අත්දැකීමක් වන අතර එමගින් කලාපය තුළ වර්ධන අභිලාෂයන් සඳහා පදනම සැකසේ.**

කාර්යසාධන විශේෂතා

| | 2020/21 | 2019/20 | වෙනස % |
|---|---|---|---|
| ශුද්ධ පොලී ආදායම (රු. මිලියන) | 366.42 | 305.90 | 19.78 |
| ආංශික ප්‍රතිඵලය (රු. මිලියන) | 222.60 | 155.20 | 43.43 |
| ආංශික වත්කම් (රු. මිලියන) | 6,327.94 | 4,484.08 | 41.12 |
| ආංශික වගකීම් (රු. මිලියන) | 3,420.76 | 1,863.79 | 83.54 |




**වටිනාකම් නිර්මාණය**

ආංශික ප්‍රතිඵල ඉහළයාම 43.43%

ණය සහ ආයෝජන ඉහළයාම 73.31%

තැන්පතු ඉහළයාම 97.92%

ස්කන්ධ මත ආදායම ඉහළයාම




පොලී ආදායම සහ ආංශික ප්‍රතිඵල




ණය සහ අත්තිකාරම් කළඹ




## මෙහෙයුම් වටපිටාව

වසංගතයේ බලපෑම් හේතුවෙන් බංග්ලාදේශ ආර්ථිකය 2019 දී වාර්තා කරන ලද 8.2% සිට 2020 දී 3.8% ක සාමාන්‍ය සුබවාදී වර්ධනයක් වාර්තා කළේය. මෙහිදී රජය මගින් ආදේශ කරන ලද සහයෝගී ප්‍රතිපත්ති අතර ප්‍රතිපත්ති අනුපාතයන් පහත හෙලීම සහ සහන පොලී අනුපාත යටතේ ණය ලබාදීම සිදු කෙරුණු අතර එමගින් ලාභ කෙරෙහි පීඩනයක් ඇති කෙරිණ. පාලන ගැටළු හේතුවෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ප්‍රතිරූපයට හානි සිදු වූ අතර ඉන් අනතුරුව සිදුවූ සහභාගීකරුවෙකුගේ ඇවර කිරීම හේතුවෙන් තැන්පතු උපයෝජන ක්‍රියාකාරකම් අඩාල විය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය වෙත අරමුදල් සම්පාදනය බැංකු නොවන මූල්‍ය ආයතන මගින් සිදුකෙරුණු අතර, එනමුත් ඉහළ ගිය ණය අවදානම සහ ඉහළ අවිනිශ්චිතතා මට්ටම හේතුවෙන් බැංකු නොවන මූල්‍ය ආයතන ණය ලබාදීමේදී ප්‍රවේශම් සහගත විය. ප්‍රතිශක්තීකරණ එන්නත ලබා දෙන තත්වයක් හමුවේ වුවද වසංගතයෙහි කාලසීමාව සහ එහි බලපෑම පිළිබඳ අවිනිශ්චිතතා තවමත් පවතී.

රට තුළ ක්‍රියාකාරී කොටස් වෙළෙඳපොළ දෙකක් සහ හත්සියයකට අධික ලැයිස්තුගත සමාගම් සමගින්, නව තැන්පතු සහ ණය ලබා දීමේ සැලසුම් එළිදැක්වීමට සහ උපදේශන, විශාල ව්‍යාපෘති මූල්‍යකරණ, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ අත්පත් කර ගැනීම් වෙත සේවාවන් ව්‍යාප්ත කිරීමේ පුළුල් ඉඩකඩක් බංග්ලාදේශය තුළ පවතී. 2020 දී පසුබෑමකට ලක්වුවද බංග්ලාදේශ ආර්ථිකය දකුණු ආසියාවේ වඩාත්ම සීඝ්‍රයෙන් වර්ධනය වෙන ආර්ථිකය වේ.

## විදේශීය මෙහෙයුම්

### අප විසින් සිදුකරන ලද කාර්යය

ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් සාපේක්ෂ වශයෙන් නව සමාගමක් වන අතර විශාල සමාගම් සමග බලාත්මක වශයෙන් තරග කිරීම සඳහා එය මගින් සිය ශේෂ පත්‍රය වර්ධනය කරගත යුතු වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගම මගින් වෙළඳපොලේ පවතින ඉහළම මට්ටමේ අක්‍රීය ණය තත්ත්වය හමුවේ වුවද, සිය ණය ලබාදීමේ ක්‍රියාකාරකම් තුළ ප්‍රවේශම් සහගත වර්ධන ක්‍රමෝපායක් අනුගමනය කරයි. සමාගම මගින් නවතාවයෙන් යුතු සැලසුම් ඔස්සේ ගාස්තු මත පදනම් වූ ඉපැයුම් සහ විශාල ගනුදෙනුකරුවන් වෙත දෙමුහුම් මූල්‍ය විසඳුම් ලබාදීම කෙරෙහි අවධානය යොමු කෙරුණි. සිය ණය ලබාදීමේ කටයුතු වර්ධනය කර ගැනීම සඳහා තැන්පතු වෙළඳපොල තුළ වැඩි නියෝජනයක් අත්පත් කර ගැනීමේ අරමුණින් සමාගම් සිය ශාඛා ජාලය ව්‍යාප්ත කරමින් සිටී. තවද, පොලී ආදායම මත රඳා පැවතීම පහත දැමීම සඳහා සමාගම මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළ වලින් අරමුදල් සම්පාදනය ඔස්සේ ගාස්තු මත පදනම් වූ ඉපැයුම් වර්ධනය කිරීම සඳහා ස්වකීය ව්‍යුහගත මූල්‍ය අංශය හඳුන්වා දෙන ලදී. කුසලතා රඳවා ගැනීම මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා වැදගත් සාධකයක් වන අතර අනුකූලතා, තොරතුරු තාක්ෂණ, ව්‍යුහගත මූල්‍ය ආදී අංශ වෙත කුසලතා පූර්ණ පුද්ගලයන් බඳවා ගැනීම සඳහා ව්‍යාපෘතීන් දියත් කරන ලදී.

### තිරසාරත්වය

ජෛව විවිධත්වය සුරකිමින් පරිසරය කෙරෙහි කර්මාන්ත වල බලපෑම් අවම කරමින් පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රම වැඩි වැඩියෙන් ආදේශ කර ගැනීම සඳහා සමාගම් වෙත සහාය දක්වමින් ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් විසින් හරිත මූල්‍යකරණ සේවාවන් සපයනු ලැබේ. මේ අතර විදුලිය, ජලය සහ කඩදාසි භාවිතය අවම කිරීම සඳහා ද ව්‍යාපෘතීන් දියත් කොට ඇත.

### කාර්යසාධනය

රටේ පොලී අනුපාත පහළ ගිය තත්ත්වය හමුවේ වුවද පොලී ආදායම පෙර වසරට ඉහළින් 19.78%ක් වශයෙන් වාර්තා විය. අභියෝගාත්මක වටපිටාවක් හමුවේ ආංශික ප්‍රතිඵලයෙහි 43.43% ක වර්ධනයක් සමගින් සමාගමේ විශිෂ්ට කාර්යසාධනය මැනවින් පිළිබිඹු විය.

**ඉදිරි දැක්ම**

2021 දී 5% ක සහ 2021 දී 7.5% ක පුරෝකථනය කරන ලද වර්ධනයක් සමගින් බංග්ලාදේශ ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීම අපේක්ෂා කළ හැකි වේ. රජය මගින් වර්ධනය සඳහා හිතකර ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘතීන් දියත් කොට ඇත. තවද, බැන්ක් ඔෆ් බංග්ලාදේශ් මගින් බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන කෙරෙහි සහාය ද දක්වනු පිණිස මුදල් සංචිත අනුපාතය සහ ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාතය පහත හෙලන ලද අතර 2020 දෙසැම්බර් දක්වා ගෙවීම් සිදුනොකළ ද අදාල ණය අක්‍රීය ණය වශයෙන් වර්ග කිරීම කල් දැමීමට අදාළ චක්‍රලේඛ නිකුත් කොට ඇත.

ඉහළ අවිනිශ්චිතතා මට්ටම් නිසා සමාගම අඛණ්ඩවම ණය වර්ධනය සම්බන්ධ ප්‍රවේශම් සහගත එළඹුමකින් යුතුව කටයුතු කරන අතර එහි ආයෝජන මත ආදායම වර්ධනය කරගැනීම සඳහා ප්‍රාග්ධන වෙළඳ පොළේ සහ රජයේ බැඳුම්කර වල ආයෝජන සිදු කරමින් අදාළ ඉපැයීම් සිදු කරනු ලැබේ. සමාගම මගින් ව්‍යුහගත මූල්‍යකරණය, හවුල්කාරීත්ව සහ නියෝජිත සේවා සැපයීම දක්වා සිය සේවාවන් පුළුල් කරන ලද අතර ස්වකීය ගාස්තු මත පදනම් වූ ආදායම් මූලයන් සවිමත් කර ගනිමින් කාර්යක්ෂම සේවාවක් සැපයීමට අවශ්‍ය මූල්‍යමය හැකියාව ගොඩ නංවා ගෙන ඇත.

# ක්ෂුද්‍ර මූල්‍ය

## පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගම මගින් ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී පාර්ශවයන් වෙත ක්ෂුද්‍ර මූල්‍ය හා කුලී පිට ගැනුම් පහසුකම් සපයනු ලැබේ.




### කාර්යසාධන විශේෂතා

| | 2020/21 | 2019/20 | වෙනස % |
|---|---|---|---|
| පොලී ආදායම (රු. මිලියන) | 818.52 | 794.80 | 2.98 |
| ආංශික ප්‍රතිඵලය (රු. මිලියන) | 201.31 | 49.89 | 303.48 |
| ආංශික වත්කම් (රු. මිලියන) | 2,684.03 | 2,877.35 | (6.72) |
| ආංශික වගකීම් (රු. මිලියන) | 2,316.59 | 2,641.91 | (12.31) |
| අක්‍රීය වත්කම් (%) | 5.54 | 5.94 | (0.40) |

### වටිනාකම් නිර්මාණය

ඉතිහාසයේ ඉහළම බදු වලට පසු ලාභය අත්පත් කරගැනුනි

කුලී පිට ගැනුම් කළඹෙහි 34.5% ක් නියෝජනය කරන්නා වූ ගනුදෙනුකරුවන් 4,155 ක් වෙත පමාසහන පිරිනැමුනි

පහසුකම් කළඹ ව්‍යාප්ත කිරීම

2 වැනි විශේෂිත ශාඛාව කටුගස්තොටදී විවෘත කරන ලදී

2021 දී රු. මිලියන 11,162 ක ණය ලබා දෙන ලදී. (ඉලක්කයෙන් 87.44%)

### අප විසින් සිදුකරන ලද කාර්යය

වසර තුළදී මෝටර් රථ ආනයනය මත පනවන ලද සීමාවන් හේතුවෙන් ලියාපදිංචි නොකල යතුරු පැදි සහ ත්‍රී රෝද රථ සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සහ කුලී පිට ගැනුම් පහසුකම් ලබාදෙන ප්‍රමුඛතම ආයතනයක් වශයෙන් අපගේ සාම්ප්‍රදායික ව්‍යාපාරික ආකෘතිය අභියෝගයට ලක්විය. අපි එම වෙළඳපොළෙහි ප්‍රමුඛයින් වෙමු. එම නිසා අපගේ අවධානය වෙනත් අතකට යොමු කරමින් සමාගම මගින් ලියාපදිංචි කළ 4 ස්ට්‍රෝක් ත්‍රී රෝද රථ සහ විවිධ මෙවලම් හා උපකරණ සඳහා ණය ලබාදීම ආරම්භ කෙරුණි. ලැප්ටොප් පරිගණක සඳහා වන ඉහළ යන වෙළඳපල අවශ්‍යතාවය සපුරාලීම පිණිස සමාගම, ක්ෂේත්‍රයේ ප්‍රකට ලැප්ටොප් සැපයුම්කරුවන් තිදෙනෙකකු සමඟ එක්ව ලැප්ටොප් පරිගණක ණය සැපයීම නව නිෂ්පාදිතයක් ලෙස හඳුන්වා දෙන ලදී. කුඩා පරිමාණ ව්‍යවසායකයින් වෙත පිරිනමන ලද උපකරණ ණය ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික උපකරණ, ඡායා පිටපත් යන්ත්‍ර සහ අයිස් ක්‍රීම් නිෂ්පාදන යන්ත්‍ර වැනි උපකරණ ණය, කුඩා පරිමාණ ව්‍යවසායකයින් වෙත සපයන ණය අතර ප්‍රධාන තැනක් ගනී.

පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගම කිසිදු අධිකාරීත්ව අවශ්‍යතාවයකින් තොරව වුවද කොවිඩ් 19 වසංගතයෙන් බලපෑමට ලක්වූ ගනුදෙනුකරුවන් වෙත ඔවුන්ගේ ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් ණය සහන පිරිනමන ලදී.

සමස්ත කුලීපිට ගැනුම් කළඹෙහි 34.5% ක් නියෝජනය කරන්නා වූ කුලීපිට ගැනුම් ගනුදෙනුකරුවන් 4,151ක් වෙත පමාසහන පිරිනමන ලදී.

සමාගම ස්වාධීන ශාඛාවන් දෙකක් ද සමගින්, දිවයින පුරා පීපල්ස් ලීසිං ශාඛා තිස් දෙකක් ඔස්සේ සිය මෙහෙයුම් සිදු කරයි. 2020/21 දී සමාගම මගින් සිය දෙවන විශේෂ ශාඛාව මහනුවර කටුගස්තොට දී විවෘත කරන ලද අතර එමගින් ක්ෂේත්‍රය තුළ පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගමෙහි ශක්තිය සහ තිරසාරත්වය මැනවින් පිළිබිඹු වේ.

පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගම මුහුණපාන ප්‍රධාන අභියෝග වන්නේ ගනුදෙනුකරුවන් සම්බන්ධ විශ්වාසනීය ණය ඇගයුම් සිදු කිරීම සඳහා ණය තොරතුරු කාර්යාංශය වැනි ආයතන වෙත පිවිසීමේ නොහැකියාව, මූල්‍ය ආයතන අතර වත්කම් ඇපයට තබා ණය ලබාදීම සඳහා පවතින තරඟය, ණය ලබාගන්නා ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ අපහසුතාව, ගණුදෙනුකරුවන්ගේ අධි වෙළඳාම හෝ ණයගැති බව සහ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පවතින පොදු සෘණාත්මක අවබෝධය වේ.

### කාර්යසාධනය

වසරේදී එල්ලවුණු අභියෝග රැසක් මධ්‍යයේ, සමාගම 2020/21 සඳහා පෙර වසර සමග සැසඳීමේදී ඓතිහාසික ඉහළ ලාභයක් වාර්තා කළේය. සමස්ත ආංශික වත්කම් රුපියල් මිලියන 2,684.03 ක් වූ අතර එයට රුපියල් මිලියන 2,546.22 ක ශුද්ධ කුලීපිට ගැනුම් සහ ණය කළඹ ද ඇතුළත් විය. වසර තුළ පැවති පහල පොලී අනුපාත තත්වය ලාභ තීරු කෙරෙහි සුබවාදී බලපෑමක් ඇති කළේය. පහළ ණය පොලී අනුපාතයන්හි වාසි දායකත්වය පාරිභෝගිකයින් වෙත සම්ප්‍රේෂණය කරමින් පීපල්ස් මයික්‍රෝ කොමර්ස් සමාගම එහි පාරිභෝගිකයින් වෙතින් අයකරන පොලී අනුපාතයන්ද පහත දමන ලදී. සමාගම මගින් සේවක ප්‍රතිලාභ කෙරෙහි බලපෑමක් ඇති නොකරමින්, සිදුකරන ලද දැඩි පිරිවැය පාලන වැඩසටහන් මගින් ද ලාභදායිත්වය ඉහළ නංවන ලදී. ගණුදෙනුකරුවන්ගේ ණය පහසුකම් මත පහත දමන ලද පොලී අනුපාත අයකරමින් සමාගම මගින් පහල පොලී අනුපාතික තත්ත්වයේ ප්‍රතිලාභ ගනුදෙනුකරුවන් වෙත පිරිනමන ලදී.

වසර පුරා අයකරගැනීමේ 90%ක අනුපාතයක් පවත්වා ගෙන යාමට පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගමෙහි අයකර ගැනීම් කෙරෙහි දක්වන ලද අවධානය හේතු විය. වසර අවසානයේ දී අක්‍රීය වත්කම් අනුපාතය 5.54% ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 0.40% ක පහළ යාමකි. කෝවිඩ් වසංගතය මැඩලීම සඳහා පනවන ලද ජාතික රට වසා දැමීම හේතුවෙන් වසරේ මුල් භාගයේ දී ණය ලබාදීම පහළ මට්ටමකට පැවතුණි. කෙසේවුවද, වසර අවසානය වන විට එහි ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරමින්, සමාගමෙහි ඉලක්කයෙන් 87.44% ක් අත්පත් කරගනිමින් රුපියල් මිලියන 1,162 ක වටිනාකමකින් යුතු සමස්ත ණය මුදල් ප්‍රමාණයක් පිරිනමන ලදී.

#### පොලී ආදායම සහ ආංශික ප්‍රතිඵල




#### ණය සහ අත්තිකාරම් කළඹ




#### ඉදිරි දැක්ම

අභියෝගාත්මක බාහිර පරිසරයක් තුළ ඉදිරියට යාම සඳහා, පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගම සිය මෙහෙයුම් ඩිජිටල්කරණය කරමින් අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්වය නගා සිටුවීමේ අරමුණින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබා දීම පුළුල් කිරීමට අරමුණු කරයි.

## සෙසු ව්‍යාපාරික අංශ

**මෙම කොටස පහත දැක්වෙන පරිදි පීපල්ස් ලීසිං සමූහයේ පරිපාලිතයන් තුනක මෙහෙයුම් කටයුතු වලින් සමන්විත වේ. ආදායම් සහ ද්‍රවශීලතාවය ඉහළ නංවා ගනිමින් ශුද්ධ ආදායම් වර්ධනය සඳහා දායක වීමට මෙම ක්‍රියාකාරී සමාගම් තුනෙහි ක්‍රමෝපායන් කඩිනමින් මෙහෙයුම් වටපිටාව වෙත ගැලපෙන පරිදි සකස් කරන ලදී.**

| පරිපාලිතය | පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් |
|---|---|---|---|
| ව්‍යාපාරයේ ස්වභාවය | මෝටර් රථ සමූහ කළමනාකරණය, මෝටර් රථ තක්සේරුකරණය, මෝටර් රථ අලෙවිය, රක්ෂණ තක්සේරුකරණය මෝටර් රථ අලුත්වැඩියාව | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම් | කාර්යාල සංකීර්ණයක් මෙහෙයවීම |

### පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්

**කාර්යසාධනය**

පවතින ව්‍යාපාරික අවස්ථාවන්ට ගැළපෙන පරිදි සහ ද්‍රවශීලතාව සහ ලාභදායිත්වය ඉහළ නැංවීම සඳහා සමාගම සිය මෙහෙයුම් නිසි පරිමාණයකින් යුතුව පවත්වාගෙන යන ලදී. ආනයන සීමාවන් හේතුවෙන් මෝටර් රථ මිල ඉහළ ගිය විට, සමාගම ඓතිහාසික ඉහළ අගයක පැවති රථ වාහන සංඛ්‍යාව බැහැර කරන ලදී. මෙහිදී අනාගත කුලියට ලබා දීමේ ආදායම් මත දිගුකාලීන බලපෑමක් ඇති වන අතර එමගින් වර්ධනය සහ ලාභදායිත්වය සඳහා නව අවස්ථා නිර්මාණය කෙරේ.

සීමිත ආර්ථික කටයුතු හේතුවෙන් ඉල්ලුම පහත වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් පහළ ගියේය. කෙසේ වුවද, වෙනත් ආදායම් 2019/20 පැවති රුපියල් මිලියන 4.80 සිට 2020/21 දී රුපියල් මිලියන 52.72 දක්වා ඉහළ ගියේ මෝටර් රථ විකිණීම හේතුවෙනි. මෙමගින් මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 57.92 දක්වා 74.45% කින් ඉහළ ගිය අතර ඒ සඳහා මෙහෙයුම් වියදම් සම්බන්ධ දැඩි පාලනයද දායක විය. මේ නිසා මූල්‍ය ආදායම පහළ යාම හේතුවෙන් ශුද්ධ මූල්‍ය පිරිවැය රුපියල් මිලියන 2.4 දක්වා 187.19%කින් ඉහළ ගියද බදු වලට පෙර 72.24% ක ලාභ වර්ධනයක් වාර්තා කිරීමට සමාගම සමත් විය. සඵල බදු අනුපාතික පහත වැටීම බදු වලට පසු ලාභය 106.52% කින් ඉහළ යාම කෙරෙහි දායක වූ අතර 2020/21 මූල්‍ය වසර සඳහා එය රුපියල් මිලියන 46.05 ක් වශයෙන් වාර්තා විය.

ප්‍රවර්තන අනුපාත සංචලනය වාර 2.2 සිට වාර 4.66 දක්වා ඉහළයාම මගින් දැක්වෙන පරිදි වසර තුළදී මූල්‍යමය ස්ථාවරත්වය සහ ද්‍රවශීලතාවය ඉහළ නැගුණි. වසර තුළදී වාර 10.82 සිට වාර 6.42 දක්වා ණය ස්කන්ධ අනුපාත සංචලනය පැවතිනි. වසර තුළදී ශුද්ධ වත්කම්ද රුපියල් මිලියන 333.01 දක්වා 16.05% කින් වර්ධනය විය.

| | 2020/21 | 2019/20 | වෙනස % |
|---|---|---|---|
| ආදායම | 192.95 | 231.75 | (16.74%) |
| පොලී සහ බදු වලට පෙර ලාභය | 57.92 | 33.20 | 74.45% |
| බදු වලට පෙර ලාභය | 56.08 | 32.56 | 72.24% |
| බදු වලට පසු ලාභය | 46.05 | 22.30 | 106.52% |
| වත්කම් | 443.77 | 441.05 | 0.62% |
| වගකීම් | 110.75 | 154.09 | (28.12%) |
| ස්කන්ධ මත ආදායම (%) | 13.82 | 7.77 | 6.05 |

**ඉදිරි දැක්ම**

ආනයන සීමාවන් හේතුවෙන් මෝටර් රථ මිල කැපී පෙනෙන අයුරින් ඉහළ ගිය අතර මෙය සමාගම මගින් සපයන ලද තක්සේරුකරණයන් වලදී විශේෂ කොට දැක්විනි. මෝටර් රථ කුලියට ගැනීමේ ඉල්ලුම සීමිත වීම හේතුවෙන්, මෝටර් රථ කුලියට දීමේ මෙහෙයුම් විවිධාංගීකරණයට ලක්කරමින් මෙහෙයුම් යථා තත්ත්වයට පත් කරන අතරතුර, මෝටර් රථ තක්සේරුකරණ ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමට සමාගම සැලසුම් කරයි.

## පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්

ව්‍යාපාරික අවහිරතා සහ පහළ වැය කල හැකි ආදායම හේතුවෙන් ක්ෂේත්‍රයේ අවස්ථාවන් අභියෝගයට ලක් වූ අතර වසර තුළදී පැවති සීමිත ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රය 13.2% කින් සංකෝචනය විය. කෙසේ වුවද, මූල්‍ය පිරිවැය සැලකිය යුතු අයුරින් පහත වැටීම නිසා පහත වැටෙමින් පැවති පොලී අනුපාතයන් ලාභදායීත්වය කෙරෙහි උපකාරී විය.

### කාර්යසාධනය

2020/21 මූල්‍ය වර්ෂය තුල මහජන බැංකුවේ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක නොවූ බැවින් මෙම වර්ෂය සමාගමට අභියෝග සහිත වසරක් වූ අතර ආදායම කෙරෙහි අහිතකර බලපෑම් එල්ල විය. ලාභ වර්ධනය මධ්‍යස්ථ වීම කෙරෙහි 2019/20 මූල්‍ය වර්ෂයේදී රුපියල් මිලියන 144.39 ක් වශයෙන් වාර්තා වූ ආයෝජන දේපළ මත සාධාරණ අගය 2020/21 මූල්‍ය වසරේදී රුපියල් මිලියන 50.00 දක්වා සීමිත වීම ද බලපෑවේය. පහල පොලී අනුපාත හේතුවෙන් සමාගමට රුපියල් මිලියන 5.03 කින් මූල්‍ය පිරිවැය පහත හෙළීමට හැකි වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් මිලියන 218.02 ක බදු පෙර ලාභයක් වාර්තා විය. පහල බදුකරණ අනුපාතයන් සමාගමට රුපියල් මිලියන 182.59 ක බදු වලට පසු ලාභයක් වාර්තා කිරීම සඳහා වූ උපකාරී වූ අතර එනමුදු එය පෙර වසරට සාපේක්ෂව 24.82% කින් පහල අගයක් ගනී.

ණය ආපසු ගෙවීමත් සමග ණය ස්කන්ධ අනුපාතය වාර 0.67 සිට වාර 0.56 දක්වා වර්ධනය වූ අතර, සවිමත් ද්‍රවශීලතා ස්ථාවරය නිරූපණය කරමින් ප්‍රවර්තන අනුපාතය ද වසර තුළදී වාර 1.19 සිට වාර 3.01 දක්වා ඉහළ ගියේය. තවද, ණය ආපසු ගෙවීමෙන් පසුව මුදල් ප්‍රවාහ ප්‍රමාණවත් මෙහෙයුම් ක්‍රියාකාරීත්වයක් සඳහා දායකත්වය සපයන ලදී.

| | 2020/21 | 2019/20 | වෙනස % |
|---|---|---|---|
| ආදායම | 282.26 | 300.47 | (6.06) |
| බදු වලට පෙර ලාභය | 218.02 | 312.87 | (30.32) |
| බදු වලට පසු ලාභය | 182.59 | 242.92 | (24.84) |
| වත්කම් | 2,601.21 | 2,661.62 | (2.27) |
| ස්කන්ධ මත ආදායම (%) | 10.95 | 15.22 | (4.27) |

**ඉදිරි දැක්ම**

මධ්‍ය කාලීනව ආර්ථිකය සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටමට ළඟා වනු ඇතැයි අප සතුව ප්‍රවේශම් සහගත අපේක්ෂාවක් පවතින අතර මෙම අසීරු කාලය කළමනාකරණය කර ගැනීම සඳහා අප විසින් අපගේ ශේෂ පත්‍රය සහ ද්‍රවශීලතාවය සවිමත් කොට ඇත. එයට අමතරව, අප විසින් හඳුනාගත් ව්‍යාපාරික අවශ්‍යතා සඳහා නව ව්‍යාපෘති සම්බන්ධයෙන් මව් සමාගම් වන මහජන බැංකුව සමඟ සාකච්ඡා පවත්වමින් සිටින අතර අපගේ මෙහෙයුම් සමූහයෙන් පිටතට ව්‍යාප්ත කිරීම සඳහා අපේක්ෂාවක් පවතී.

## පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්

### කාර්යසාධනය

වසර තුළදී වසංගතය හේතුවෙන් ඉල්ලුම අඩුවීම නිසා ගොඩනැගිල්ලේ භාවිතයට නොගත් කොටස් පැවති බැවින් එය දළ ආදායම පහල යාම කෙරෙහි බලපෑවේය. කෙසේ වුවද, පහල පොලී අනුපාතික සහ ණය ආපසු ගෙවීමේ හේතුවෙන් මූල්‍ය පිරිවැය රුපියල් මිලියන 108.97 දක්වා 28.22% කින් පහත වැටුණු අතර එය ලාභදායිත්වය කෙරෙහි උපකාරී විය.

| | 2020/21 | 2019/20 | වෙනස % |
|---|---|---|---|
| ආදායම | 205.38 | 221.31 | (7.20) |
| පොලී සහ බදු වලට පෙර ලාභය | 189.92 | 202.12 | (6.04) |
| බදු වලට පෙර ලාභය | 80.95 | 50.32 | 60.87 |
| බදු වලට පසු ලාභය | 80.95 | 50.34 | 60.81 |
| වත්කම් | 2,660.04 | 2,681.68 | (0.81) |
| ස්කන්ධ මත ආදායම (%) | 6.51 | 4.34 | 2.17 |

**ඉදිරි දැක්ම**

වෙළෙඳපොළ ප්‍රමාණවත් ලෙස වැඩිදියුණු වූ පසු පොලී උත්පාදනය සඳහා සමාගම ගොඩනැගිල්ල සඳහා නව කුලී වැසියන් උනන්දු කරවනු ඇත. මේ අතර, මුදල් ප්‍රවාහ සහ ලාභදායිත්වය කළමනාකරණය සඳහා අප විසින් ණයට ගැනීමේ පිරිවැය හැකිතරම් පහත හෙළීමට කටයුතු කරනු ලැබේ.

# ප්‍රාග්ධන වාර්තාව

වසර තුළදී අප විසින් ප්‍රාග්ධනයන් හැසිරවූ ආකාරය






ණය ක්‍රියාවලිය සවිමත් කිරීම, විනයානුකූල වියදම් කළමනාකරණය සහ සියලු ව්‍යාපාර කාණ්ඩයන්හි ඉහළ නංවන ලද කාර්යසාධනය පිළිබිඹු කරමින් වසංගතයක බලපෑමට ලක් වූ වසරක් සාර්ථකව නිම කරමින් පීපල්ස් ලීසිං සමූහය රුපියල් මිලියන 5,596.33 ක ඉහළම ලාභයක් වාර්තා කරන ලදී. මෙම අත්පත් කරගැනීම සිදු කරන ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාස හයක වරප්‍රසාදය ඉක්මවා යමින් මාස නවයක දඩ පොලී ඉවත් කිරීම් සහ ගනුදෙනුකරුවන් වෙත පිරිනමන ලද ණය සහනය සමගින් වීම ප්‍රශංසනීය වේ. කාර්තුමය කාර්යසාධනය මගින් වසංගතයේ පළමු හා දෙවන රැල්ලේ දී සමූහයේ ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු කරමින් සහ වෙනස්වීම් වලට මුහුණ දෙමින් හතරවෙනි කාර්තුවේ දී ශක්තිමත් අයකර ගැනීම් හා ණය ලබාදීමේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵල උකහා ගනිමින් ඉහළම කාර්තුමය ලාභය වන මිලියන 3,225.33 වාර්තා කිරීමට හැකිවිය.

රු. බිලියන 103.74 ක තැන්පතු
NBFI ක්ෂේත්‍රයේ විශාලතම
තැන්පතු පදනම

රු. බිලියන 149.34 ක
ණය සහ අත්තිකාරම්
NBFI ක්ෂේත්‍රයේ විශාලතම ණය
සහ අත්තිකාරම් කළඹ

ප්‍රාග්ධන අනුපාතයන්
>නියාමනමය අවමයන්

කාර්යාසධනය
>NBFI ක්ෂේත්‍රය

| පාර්ශවකරුවන් | ක්‍රමෝපායික අරමුණු | අවදානම් |
|---|---|---|
| ආයෝජකයින්<br>ගනුදෙනුකරුවන්<br>සැපයුම්කරුවන් සහ ව්‍යාපාර සහකරුවන් | තිරසාර වර්ධනය පවත්වාගෙන යාම<br>ගනුදෙනුකාර අත්දැකීම වැඩිදියුණු කිරීම | ණය අවදානම<br>වෙළඳපොල අවදානම<br>ද්‍රවශීලතා අවදානම<br>මෙහෙයුම් අවදානම<br>ක්‍රමෝපායික අවදානම |

# මූල්‍ය ප්‍රාග්ධනය



## 2020/21 මූල්‍ය ප්‍රාග්ධන හැසිරවීම

රු. මිලියන 5,555.33 දක්වා 55.81% ක ලාභ වර්ධනය

කොටස් ලාභාංශයක් වශයෙන් රු. මිලියන 976.62 ක අන්තර්මධ්‍ය ලාභාංශයක් ගෙවන ලදී

ක්ෂේත්‍රයේ අක්‍රිය ණය අනුපාතය වන 11.30% ට පහළින් 9.21% ක අක්‍රිය ණය අනුපාතය

## සාර්ථකත්වය මැනීම

ශුද්ධ පොලී ආදායම - සමාගම




ණය සහ ලැබිය යුතු දේ - සමාගම




ලාභදායීත්වය - සමූහය




### විමර්ශනය

අපගේ ගමන්මගෙහි බාධා සාර්ථකව ජය ගැනීමේ අපගේ හැකියාව තහවුරු කරමින් සැලකිල්ලට ගනු ලබන වසර තුළ ඉහළම සමූහ ලාභය වාර්තා කිරීමට සමත් විය. වසරේ පළමු කාර්තුවේ දී, අප කෝවිඩ් 19 වසංගතයට මුහුණ දුන් අවස්ථාවේදී, ගනුදෙනුකාර සේවය සහ අපගේ සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව අප විසින් විශේෂ අවධානයක් යොමු කරන ලදී. දෙවන කාර්තුවේ දී අපගේ අවධානය යොමු වූයේ සහන පොලී අනුපාත යටතේ ණය ලබා දෙමින්, පමාසහන කාලයක් ලබා දෙමින්, ණය ප්‍රතිව්‍යුහගත කරමින්, දඩ පොලිය කපා හරිමින් අපගේ ගනුදෙනුකරුවන් වෙත සහන සැලසීම කෙරෙහිය. තෙවන කාර්තුවේ දී වසංගතය හේතුවෙන් අප විසින් වැඩ කරන ආකාරය සහ ව්‍යාපාර කටයුතු කරන ආකාරය වැනි වෙනස්වීම් සම්බන්ධයෙන් විස්තරාත්මකව සමාලෝචනය කෙරුණි. ණය ක්‍රියාවලින්, නිවසේ සිට වැඩ කිරීම, ඩිජිටල්කරණය සහ අපගේ මාර්ගස්ථ ක්‍රමය වෙත සහාය දැක්වීම සඳහා අභ්‍යන්තර පාලනය සවිබලගන්වන ලදී. හතරවන කාර්තුවේ දී, ඉහළ නංවන ලද ව්‍යාපාර පරිමාව සහ වැඩිදියුණු කරන ලද අය කරගැනීම් සමගින් සමාගම් ඉතිහාසයෙහි ඉහළම කාර්තුමය ලාභය වන රුපියල් බිලියන 2.76 වාර්තා කෙරුණි. මෙය සැලකිය යුතු දායකත්වයක් වන අතර, අපගේ පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස්හි විශිෂ්ට ප්‍රතිඵල සමගින් රුපියල් බිලියන 5.6 ක ඉතිහාසයේ ඉහළම සමූහ ලාභය වාර්තා කිරීමට අපට හැකි විය.

### මූල්‍ය කාර්යසාධනය - සමූහය

| රු. මිලියන | 2020/21 | | | | 2020/21 | 2019/20 | වෙනස |
|---|---|---|---|---|---|---|---|
| | කාර්තුව 1 30.06.20 | කාර්තුව 2 30.09.20 | කාර්තුව 3 31.12.20 | කාර්තුව 4 31.03.21 | 31.03.21 අවසන් වූ වසර | 31.03.20 අවසන් වූ වසර | % |
| ශුද්ධ පොලී ආදායම | 2,797.06 | 3,042.29 | 3,468.75 | 4,138.54 | 13,446.64 | 17,171.94 | (21.69) |
| ශුද්ධ උපයන ලද පොලිය | 1,291.84 | 1,258.53 | 1,267.56 | 1,210.62 | 5,028.55 | 5,202.03 | (3.33) |
| වෙනත් මෙහෙයුම් ආදායම | 194.18 | 544.34 | 448.22 | 608.14 | 1,794.88 | 1,569.93 | 14.33 |
| මුළු මෙහෙයුම් ආදායම | 4,283.08 | 4,845.16 | 5,184.53 | 5,957.30 | 20,270.07 | 23,943.90 | (15.34) |
| අපහායන ගාස්තු | 1,170.24 | 349.99 | 1,773.08 | (1,841.61) | 1,451.70 | 5,007.02 | (71.01) |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 3,112.84 | 4,495.17 | 3,411.45 | 7,798.91 | 18,818.37 | 18,936.88 | (0.63) |
| මෙහෙයුම් වියදම් | 1,516.02 | 1,667.64 | 1,747.28 | 2,119.44 | 7,050.38 | 7,762.09 | (9.17) |
| ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් | 404.91 | 863.41 | 677.05 | 717.98 | 2,663.35 | 3,441.94 | (22.62) |
| බදු පෙර ලාභය | 1,191.91 | 1,964.12 | 987.12 | 4,961.49 | 9,104.64 | 7,732.85 | 17.74 |
| මූල්‍ය සේවා මත බදු | 165.39 | 306.38 | 182.66 | 619.54 | 1,273.97 | 2,030.53 | (37.26) |
| ආදායම් බදු | 288.75 | 559.05 | 269.94 | 1,116.60 | 2,234.34 | 2,110.57 | 5.86 |
| වසර සඳහා ලාභය | 737.77 | 1,098.69 | 534.52 | 3,225.35 | 5,596.33 | 3,591.75 | 55.81 |

**කාර්තුමය මෙහෙයුම් ආදායම 2020/21 - සමූහය**




**කාර්තුමය මෙහෙයුම් වියදම 2020/21 - සමූහය**




**කාර්තුමය ලාභදායීත්වය 2020/21 - සමූහය**




### ශුද්ධ පොලී ආදායම

**රුපියල් මිලියන 13,446.64**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් විශේෂිත ෆිනෑන්ස් සහ ලීසිං සමාගමක් වන බැවින් ශුද්ධ පොලී ආදායම සමූහය සඳහා ප්‍රධාන ආදායම් මූලය වේ. පහළ පොලී අනුපාත, ණය සහ අත්තිකාරම් කළඹ අඩුවීම, වසරේ මුල් මාස නවය තුළ ගණුදෙනුකරුවන්ගේ දඩ පොලිය ඉවත් කිරීම හේතුවෙන් 2020/21 මූල්‍ය වර්ෂයේදී ශුද්ධ පොලී අදායම රුපියල් මිලියන 13,446.64 දක්වා පහත වැටුණි. දඩ පොලී ආදායම පහළ යාම 2019/20 වාර්තා වූ රුපියල් මිලියන 2,373.03 ට සාපේක්ෂව සැලකිල්ලට ලක් වන වසර තුළ මිලියන 734.19 දක්වා 69.06% කින් පහත වැටුනි.

වසරේ මුල් භාගයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කිහිප වරක් සිය පොලී අනුපාත පහත දැමීම හේතුවෙන් පොලී වියදම ද 16.98% කින් පහළ ගියේය. වසර තුළ දී අපගේ මෙහෙයුම් සිදුකරන විට ශුද්ධ පොලී ආදායම දිගින් දිගටම ඉහළ ගියද 2020/21 සමස්ත ශුද්ධ පොලී ආදායම 21.69% පහළ ගියේය. තැන්පතු අනුපාතයන්ට සාපේක්ෂව ණය දීමේ අනුපාතය ශීඝ්‍රයෙන් පහළ යාමත් සමඟ සමූහයේ ශුද්ධ පොලී ආදායම 2019/20 වාර්තා වූ 10.09% ට සාපේක්ෂව 8.07% දක්වා පහළ ගියේය.

**ශුද්ධ පොලී ආදායම කාණ්ඩ වශයෙන්**







### පොලී නොවන ආදායම

**රුපියල් මිලියන 6,823.43**

පොලී නොවන ආදායම ශුද්ධ ඉපැයුම් වාරිකය, ගාස්තු සහ කොමිස් ආදායම, මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය - FVTPL සහ ශුද්ධ ඉපැයුම් වාරිකයෙන් 73.70% ක් සහ ගාස්තු සහ කොමිස් ආදායමෙන් 17.56% ක් නිර්මාණය වූ වෙනත් ආදායම් වලින් සමන්විත වේ. ශුද්ධ පොලී ආදායමෙහි පහළයාම හමුවේ වුවද, ගාස්තු හා කොමිස් ආදායම 2.78% කින් ඉහළ ගියේය. සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ වාරික වර්ධන ප්‍රවණතාව පිළිබිඹු කරමින් ශුද්ධ ඉපැයුම් වාරිකය රු. මිලියන 5028.55 දක්වා 3.33% කින් පහත වැටුනි.

### අපහායන ගාස්තු

**රුපියල් මිලියන 1,451.70**

අපහායන ගාස්තු යටතේ ණය සහ ලැබිය යුතු දෑ, කීර්තිනාමය සහ භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් සඳහා වන අපහායනය ඇතුලත් වන අතර වසර තුළදී එය 71.01% කින් පහළ ගියේය. ණය සහ ලැබිය යුතු දේ සඳහා අපහායනය මගින් වියදමින් 93.17% නියෝජනය විය. ව්‍යාපාර වර්ධනය සඳහා හතරවන කාර්තුවේ දී ගන්නා ලද කාලීන ක්‍රමෝපායික තීරණ හේතුවෙන් ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායනය රුපියල් මිලියන 1,352.49 දක්වා සියයට 72.41 කින් පහත වැටුනි. වැඩිදියුණු කරන ලද අයකරගැනීමේ පියවර හේතුවෙන්, පීපල්ස් ලීසිං හි අක්‍රීය ණය අනුපාතය 9.21% ලෙස ක්ෂේත්‍රයේ අගයට වඩා අඩු අගයක් වාර්තා විය.

**පොලී නොවන ආදායම කාණ්ඩ වශයෙන්**







**ණය සහ ලැබිය යුතු දෑ කාණ්ඩ වශයෙන් - සමූහය**




| | සමාගම 2020/21 | ක්ෂේත්‍රය 2021* |
|---|---|---|
| NPA% අක්‍රිය ණය අනුපාතය | 9.21% | 11.30% |
| වෙන්කිරීම් ආවරණ අනුපාතය | 63.53% | 64.16% |

**2021 මාර්තු 31 වැනි දිනට ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශයට පත්කරන ලද ක්ෂේත්‍ර දත්ත*

සමූහයේ අස්පෘශ්‍ය වත්කම් කීර්තිනාමය, ව්‍යාපාර සංයෝජනයන් හි දී අත්පත් කරගත් ගනුදෙනුකාර ලැයිස්තුව සහ පරිගණක මෘදුකාංග වල වටිනාකකමින් සමන්විත වෙයි. මෙම වසරේදී මෙකී අස්පෘශ්‍ය වත්කම් වල අපහායනය රුපියල් මිලියන 99.21 විය.

# මූල්‍ය ප්‍රාග්ධනය



### මෙහෙයුම් වියදම්

**රුපියල් මිලියන 9,713.73**

වසර තුළ දී මුළු මෙහෙයුම් වියදම් රුපියල් මිලියන 9,713.73 දක්වා සියයට 13.30 පහළ ගියේය. පසුගිය වසර හා සැසඳීමේ දී පුද්ගල වියදම් සහ වෙනත් මෙහෙයුම් වියදම් පිළිවෙලින් 4.53% සහ 20.16% කින් පහළ ගියේය. වැටුප් අඩු කිරීම් හෝ රැකියාවලින් ඉවත් කිරීම් වලින් තොරව ඵලදායි පිරිවැය කළමනාකරණය සහ බදවාගැනීම් සීමා කිරීම සඳහා කාර්යමණ්ඩල අවශ්‍යතාව පිළිබඳව නැවත ඇගයීම් සහ ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් අඩු කිරීම සමස්තයක් වශයෙන් වියදම් අඩුවීම කෙරෙහි දායක විය. රක්ෂණ අංශයේ ප්‍රධාන වියදම් වන ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් රුපියල් මිලියන 2,663.35 දක්වා 22.62% කින් පහත වැටුණු අතර රට වසා දැමීම සහ සංචාරණ සීමා හේතුවෙන් හිමිකම්පෑම් වල කැපී පෙනෙන අඩුවීම මේ කෙරෙහි හේතු විය.

මෙහෙයුම් වියදම් වල පහළයාම මෙහෙයුම් ආදායම් වල පහළයාමට වඩා අඩු වූ බැවින් සමාගමෙහි ආදායමට පිරිවැය අනුපාතය 41.32% දක්වා ඉහළ නැංවුනි. (2019/20: 36.53%)

**මෙහෙයුම් වියදම් - සමූහය**




GRI 207-1

### ලාභය

**බදු වලට පසු ලාභය රුපියල් මිලියන 5,596.33**

වසර තුළදී සමස්ත මෙහෙයුම් ආදායම පහළ ගිය ද, ණය සහ ලැබිය යුතු දේ වල විශිෂ්ඨ අයකර ගැනීමේ ක්‍රියාවලිය තුළින් කැපී පෙනෙන අයුරින් පහත හෙලන ලද අපහායන අලාභය, පුද්ගල වියදම් සහ වෙනත් වියදම් පහත දැමීම සහ ප්‍රතිලාභ, හිමිකම් පෑම් සහ ප්‍රාරක්ෂන වියදම් පහත හෙළීමේ ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය සේවාවන් මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය රුපියල් මේ මිලියන 9,104.64 දක්වා 17.74% කින් ඉහළ නැංවිණි. 2020/21 මූල්‍ය වර්ෂය සඳහා ජාතිය ගොඩනැගීමේ බද්ද (2019 දෙසැම්බර් 1 සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලද) සහ ණය ආපසු ගෙවීමේ ගාස්තුව (2020 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලද) බල නොපැවැත්වුනු බැවින් මූල්‍ය සේවා මත බදු වූ 37.26% කින් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් බදු වලට පෙර ලාභය රුපියල් මිලියන 7,830.67 දක්වා 37.32% කින් ඉහළ නැගුණි. ඵලදායී බදු අනුපාතය පෙර වසරේ පැවති 37.01% සිට වර්තමාන වසරේ 28.53% දක්වා පහත වැටුනු බැවින් ඉහළ ලාභ මත ආදායම් බදු වියදම රුපියල් මිලියන 2,234.34 දක්වා 5.86% කින් වර්ධනය විය. වසර සඳහා සමූහයේ ලාභය රුපියල් මිලියන 5,596.33 ක ඓතිහාසික ඉහළ අගයක් වාර්තා කල එය පෙර වසරට සාපේක්ෂව 55.81% වර්ධනයකි.

**සමාගම් මත ආදායම් බදු 28% සිට 24% දක්වා පහත හෙලීමට යෝජිත අතර ඒ සඳහා 2017 අංක 24 දරණ ආදායම් බදු පනත සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තු නිල අනුමැතිය තවමත් ලැබී නොමැත. 2021 අප්‍රේල් 23 වැනි දින ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් නිකුත් කරන ලද උපදෙස් පරිදි, වාර්තාකරණ දිනයේ දී එය සැලකිය යුතු වශයෙන් ක්‍රියාත්මක බවට සලකන ලදී. සැලකිය යුතු වශයෙන් ක්‍රියාත්මක බවට යන්නෙන් අදහස් වන්නේ අදාල සංශෝධනය හඳුන්වාදෙන ලද පනත පාර්ලිමේන්තුවේ පළමු වර විවාදයට ගැනීමයි. අදාළ පනත 2021 මාර්තු 26 වැනි දින පාර්ලිමේන්තු න්‍යායපත්‍රයට ඇතුළත් කරන ලදී. ඒ අනුව, 2021 මාර්තු 26 ට පසු අවසන් වන කාලපරිච්ඡේද සහිත මූල්‍ය ප්‍රකාශ වල ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු ගණනය කිරීමේ දී අදාල පනතෙහි ඇතුළත් යෝජිත බදු නීති සහ අනුපාතයන් භාවිත කළ යුතු වේ. එම නිසා, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සහ ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් යන සමාගම් සඳහා හැර ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු ගණනය කිරීමේ දී 24% බදු අනුපාතය ආදේශ කර ගන්නා ලදී.*

**කාණ්ඩ ප්‍රතිඵල**







| 2020/21 තුළ කාණ්ඩය/ පරිපාලිතයන් කිහිපයක් ඒවායේ ඉහළම ලාභ වාර්තා කලේය |
|---|
| ○ ණය, කල්බදු සහ කුලී පිට ගැනුම් |
| ○ ඉස්ලාමීය ෆිනෑන්ස් |
| ○ පීපල්ස් ඉන්ෂුවරන්ස් |
| ○ පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් |

### මූල්‍ය ශක්තිය

#### මුළු වත්කම්

**රුපියල් මිලියන 181,291.47**

සමූහයේ සවිමත් වත්කම් පදනම බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ දෙවන විශාලතම වත්කම් පදනම වේ. ණය සහ ලැබිය යුතු දේ කළඹ රුපියල් මිලයන 149,342.33 දක්වා 3.11% කින් පහත වැටුණු බැවින් මුළු වත්කම් රුපියල් මිලියන 181,291.47 දක්වා 2.53% කින් පහත වැටුණි.ණය සහ ලැබිය යුතුදේ කළඹෙහි පහත වැටීම, වසංගතය හේතුවෙන් සිදු වූ සාමාන්‍ය ආර්ථික මන්දගාමීත්වය හේතුවෙන් වසරේ මුල් මාස නවය තුළ පැවති පහල ව්‍යාපාරික පරිමාවන් සහ මෝටර් රථ මත පනවන ලද ආනයන සීමාවන් හේතු විය. 2021 මාර්තු මස වාර්තා වූ පීපල්ස් ලීසිං හි ඉහළම මාසික ණය ලබාදීම සමගින් අවසාන කාර්තුවේ ව්‍යාපාර වර්ධනය ණය සහ ලැබිය යුතු දෑ වල ප්‍රබල වර්ධනය කෙරෙහි දායක විය. මෙය 2020 දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන ලදී. ණය සහ ලැබිය යුතු දෑ වල ගුණාත්මක බව පවත්වා ගැනීම සමූහයට අතිශය වැදගත් වන අතර ඉදිරියට යාමේදී අවදානම් වලින් මිදීම වැදගත් ක්‍රමෝපායික මාර්ගයක් බවට පත්ව ඇත. සමූහයේ ණය ලැබිය යුතු දේ කළඹ බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ

**මුළු වත්කම් - සමූහය**




**නව පහසුකම් නිකුත්කිරීම් - සමාගම**






**මාසික වියදම් - සමාගම**




විශාලතම කළඹ වේ.

### මුළු වගකීම්

**රුපියල් මිලියන 140,169.51**

**ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු** තැන්පතු පදනමෙහි පහල යන ප්‍රවණතාවය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය අනුපාත පහත හෙළීම නිසා සිදුවිය. තැන්පතු පදනම තුල, ස්ථාවර තැන්පතු වලට එරෙහිව අනුපාතයන් සම්බන්ධයෙන් ඉතුරුම් වලින් සමාගමට ප්‍රතිලාභ සිදුවූ අතර තැන්පතු පදනම් තුල, ස්ථාවර තැන්පතු 5.50% කින් පහළ ගියේය. ඒ අනුව,පහල පිරිවැය ඉතුරුම් තැන්පතු ඉහළ ගියේය. සමාගමෙහි තැන්පතු පදනම බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ විශාලතම පදනම වශයෙන් අඛණ්ඩවම පැවතිණි.

**බැංකු වෙත ගෙවිය යුතු සහ නිකුත් කරන ලද ණය සුරැකුම්**

වසර තුළදී සමූහය මගින් ප්‍රධාන වශයෙන් තැන්පතු ඔස්සේ ව්‍යාපාර කටයුතු වෙත අරමුදල් සම්පාදනය කළ බැවින් බැංකු වෙත ගෙවිය යුතු සහ නිකුත් කරන ලද ණයකර පිළිවෙලින් 17.98% සහ 25.38% කින් පහත වැටුණි. කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් වෙළඳපොල තත්ත්වයන්හි මන්දගාමිත්වය නිසා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ද්‍රවශීල වත්කම් මත නිකුත් කරන ලද නියෝගවල ප්‍රතිඵලයක් වශයෙන්, අතිරික්ත ද්‍රවශීලතාවය, නව ව්‍යාපාර සඳහා අරමුදල් සම්පාදනය කෙරෙහි භාවිත කරන ලදී.

### ස්කන්ධය

**රුපියල් මිලියන 41,121.95**

සමාගම මගින් කොටස් ලාභාංශ නිකුතුවක් වශයෙන් රුපියල් මිලියන 976.62 ක අන්තර් මධ්‍ය ලාභාංශයක් ප්‍රකාශයට පත්කොට ගෙවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රකාශිත ප්‍රාග්ධනය 14,892.04 දක්වා 7.02% කින් ඉහළ ගියේය. වසර තුළදී ලාභ වර්ධනය සහ ලාභාංශ ගෙවීම් වල පහළයාම නිසා රඳවාගත් ඉපැයුම් සියයට 25.21 කින් වර්ධනය විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 අගෝස්තු 5 දින පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව කොටස් ලාභාංශ වශයෙන් ගෙවීම සඳහා 2020/21 මූල්‍ය වර්ෂය සඳහා කොටසකට රු. 0.75 ක අවසන් ලාභාංශයක් ද ප්‍රකාශයට පත් කරන ලදී.

**මුළු වගකීම් - සමූහය**




**ස්කන්ධ - සමූහය**




**මුදල් ප්‍රවාහ 2020/21 - සමූහය**




අයහපත් ව්‍යාපාර වටපිටාව මධ්‍යයේ කුලී එක්රැස් කිරීම් පහත වැටීම මෙන්ම තැන්පතු මුදල් ප්‍රවාහ වල පහත වැටීම හේතුවෙන් 2019/20 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව මෙම මූල්‍ය වර්ෂයේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද මුළු ශුද්ධ මුදල් වල අඩුවීමක් දක්නට ලැබුණි.

2020/21 මූල්‍ය වර්ෂය තුලදී ආයෝජන ක්‍රියාකාරකම් ද සීමාසහිත වූ අතර සමූහය මගින් රථ වාහන වෙළඳපොලේ මිල ඉහළ යාම සැලකිල්ලට ගනිමින් සිය අඩු උපයෝජනයක් සහිත වාහන සමූහය ක්‍රමෝපායික වශයෙන් අලෙවි කරන ලදී. ඒ අනුව, ආයෝජන ක්‍රියාකාරකම් වලින් රුපියල් මිලියන 47.29 ක ශුද්ධ මුදල් ප්‍රවාහ උත්පාදනය කරන ලදී. එයට අමතරව, ණය ලබාගැනීම් පියවීම සඳහා සමාගම තුළ වූ අතිරික්ත ද්‍රවශීලතාවය යොදාගැනීම හේතුවෙන් සමූහය සඳහා මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් රුපියල් මිලියන 10,387.55 මුදල් පිටතට ගලා යෑමක් සිදු විය. සාමූහික වශයෙන් ගන්නා ලද ක්‍රමෝපායික පියවර හේතුවෙන් නියාමන අවශ්‍යතා උල්ලංඝනය නොකරමින් ආරම්භක අතිරික්ත ද්‍රවශීලතාවය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට සමූහයට හැකි විය.

## මූල්‍ය ස්ථාවරත්වය

### සවිමත් ප්‍රාග්ධන පදනම

සමාගමෙහි ප්‍රාග්ධන කළමනාකරණ ප්‍රතිපත්තියෙහි මූලික අරමුණු වන්නේ බාහිර වශයෙන් පනවන ලද ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධයෙන් අනුකූලතාවය තහවුරු කරමින්, සිය ව්‍යාපාර කටයුතු සඳහා සහාය වීම සහ කොටස් හිමිකරුවන්ගේ වටිනාකම් උපරිම කිරීම සඳහා සවිමත් ණය ශ්‍රේණිගත කිරීම් පවත්වාගෙන යාමයි.

පිළිවෙලින් 17.72% සහ 18.58% වන අපගේ ස්ථර 1 සහ සමස්ත ප්‍රාග්ධන අනුපාතය 2018 අංක 3 මූල්‍ය ව්‍යාපාර පනතෙහි නියෝග මගින් පනවන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවන්ට ඉහළින් පවතී.

| රු. මිලයන | 2020/21 | 2019/20 |
|---|---|---|
| ස්ථර 1 ප්‍රාග්ධනය (Tier 1) | 33,109.15 | 29,269.43 |
| මුළු ප්‍රාග්ධනය | 34,712.91 | 30,941.75 |
| මුළු අවදානම් සඳහා බර තබන ලද වත්කම් | 186,811.10 | 193,545.73 |

| | සමාගම | | ක්ෂේත්‍රය 2021* | නියාමන අවමය |
|---|---|---|---|---|
| | 2020/21 | 2019/20 | | |
| ස්ථර 1 (Tier 1) ප්‍රාග්ධන අනුපාතය | 17.72% | 15.12% | 14.27% | 7% |
| මුළු ප්‍රාග්ධන අනුපාතය | 18.58% | 15.99% | 15.55% | 11% |

**ශ්‍රී ලංකා ලංකා මහ බැංකුව මගින් 2021 මාර්තු 31 දිනට ප්‍රකාශයට පත් කරන ලද ක්ෂේත්‍ර අනුපාතයන්*

### කාර්යසාධනය මැනීම

වසර ගණනාවක් තිස්සේ පීපල්ස් ලීසිං මගින් ක්ෂේත්‍රයට වඩා ඉහළ කාර්යසාධනයක් අඛණ්ඩවම අත්කර ගන්නා ලදී. පිළිවෙලින් 3.49% (2019/20: 2.64%) සහ 12.49% (2019/20: 10.00%) දක්වා ඉහළ ගිය අපගේ වත්කම් මත ප්‍රතිලාභ සහ ස්කන්ධ මත ප්‍රතිලාභ ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා ඉහළින් පවතින අතර පීපල්ස් ලීසිං මගින් 2020/21 තුළ සියයට 37.06% ක ලාභ වර්ධනයක් වාර්තා කරන ලදී.

සිය ඉතිහාසය තුළ ඉහළම ලාභය වාර්තා කරන ලද පසුබිමක් තුළ සමූහයේ කාර්යසාධන මිනුම් සවිමත්ව පැවතුණි.

| | 2020/21 | 2019/20 |
|---|---|---|
| ROA % (වත්කම් මත ප්‍රතිලාභ) | 4.26 | 3.07 |
| ROE % (ස්කන්ධ මත ප්‍රතිලාභ) | 14.83 | 10.71 |
| කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු) | 22.56 | 20.25 |

### ද්‍රවශීලතා තත්ත්වය

වසංගතය හේතුවෙන් ආර්ථික මන්දගාමිත්වය නිසා ණය වල සිදු වූ මන්දගාමී වර්ධනයට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය ලිහිල් කිරීමත් සමඟ, අපගේ ද්‍රවශීල තත්ත්වය නියාමන අවම මට්ටමට වඩා ඉතා ඉහළ මට්ටමක පැවතිණි. සමස්ත වෙළඳපොළෙහි නිරීක්ෂණය වූ ලක්ෂණයක් අනුව පීපල්ස් ලීසිංහි අතිරික්ත ද්‍රවශීලතාවය, සෘණාත්මක ධාරණ තත්ත්වයක් කෙරෙහි හේතුවූ අතර එය යම් පමණකට අවසන් කාර්තුවේ දී ව්‍යාපාර පරිමාවන් වර්ධනය වීමත් සමග මගහරවා ගත හැකි විය.

**ක්ෂේත්‍රයට සාපේක්ෂව සමාගමෙහි කාර්යසාධනය**




**ද්‍රවශීලතාවය - සමාගම**




### මූල්‍ය ප්‍රාග්ධනය - ඉදිරි දැක්ම

**කෙටි කාලීන: 2021/22**

- 15% ට ඉහළ වත්කම් වර්ධනයක් අත් කර ගැනීම
- NIM (ශුද්ධ පොලී ආදායම) 6% ට ඉහළින් පවත්වාගැනීම
- ආදායමට පිරිවැය අනුපාතය 40% ට පහළින් පවත්වා ගැනීම

**මධ්‍ය කාලීන වසර 3**

- වත්කම් සම්බන්ධයෙන් වෙළඳපොල කොටස 15% දක්වා ඉහළනැංවීම
- තැන්පතු සඳහා 10% ක වසරින් වසර වර්ධනයක් අත්කර ගැනීම

**දිගු කාලීන**

- ප්‍රමුඛ බැංකු නොවන මූල්‍ය ආයතනය වශයෙන් ඉහළ නංවන ලද වෙළදපොල කොටස සමගින් තිරසාර ස්ථානගතනවීම
- අක්‍රීය වත්කම් අනුපාතය 5% ට පහල මට්ටමක් දක්වා අඩු කිරීම

### මූල්‍ය ප්‍රාග්ධන හුවමාරු කරගැනීම්

මූල්‍ය ප්‍රාග්ධනය සෙසු ප්‍රාග්ධනයන් සමග සම්බන්ධ වේ

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**

- ශාඛා මට්ටමින් භෞතික යටිතල පහසුකම් මෙන්ම ඩිජිටල් සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන මගින් නිෂ්පාදිත ප්‍රාග්ධනය සවිමත් කෙරේ

**බුද්ධිමය ප්‍රාග්ධනය**

- සන්නාම වර්ධන ක්‍රියාකාරකම් සමගින් සමාගමෙහි මූල්‍ය ස්ථාවරත්වය සහ සවිබලය බුද්ධිමය ප්‍රාග්ධනය ඉහළ නංවයි

**මානව ප්‍රාග්ධනය**

- සේවක පුහුණුව හා සංවර්ධනය සඳහා වන ආයෝජන මගින් කුසලතා පූර්ණ සේවක පිරිසක් බිහිකරයි

**සමාජ හා සබඳතා ප්‍රාග්ධනය**

- ඩිජිටල්කරණය සඳහා වන ආයෝජන මගින් මනා ගනුදෙනුකාර සේවාවක් සිදු කල හැකි වේ.
- ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන් සඳහා වන ආයෝජන මගින් සමාගමෙහි ප්‍රජා සහභාගීත්වය සවිමත් වේ.

**ස්වභාවික ප්‍රාග්ධනය**

- බලශක්ති සංරක්ෂණ පියවර, ඩිජිටල් සේවා, හරිත ව්‍යාපෘතීන් සඳහා ආයෝජන හා පහළ කාබන් පියසටහන් ඔස්සේ ස්වභාවික ප්‍රාග්ධනය කෙරෙහි දායක වේ.



කෝවිඩ් වසංගතය මගින් නිර්මාණය කරන ලද අවිනිශ්චිත වටපිටාව හමුවේ වසර තුළදී නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ අපගේ ආයෝජනය සීමාසහිත විය. සේවකයින් හට නිවසේ සිට වැඩ කිරීම සහ අපගේ ඩිජිටල් ප්‍රයත්නය සවිබල ගැන්වීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ දෘඩාංග සම්බන්ධව ආයෝජන සිදු කරන ලදී.

## අප විසින් එකම ප්‍රදේශය තුළ අපගේ ශාඛාවන් කිහිපයක් විශිෂ්ට පරිශ්‍රයන් තුළ නැවත ස්ථාපනය කරන ලදී.

**රුපියල් මිලියන 104.69**
දේපළ, පිරියත සහ උපකරණ වල ආයෝජනය

ශාඛා
**104**

සේවා ස්ථාන
**99**

රන් ණය මධ්‍යස්ථාන
**41**

| ආශ්‍රිත පාර්ශවකරුවන් | ක්‍රමෝපායික අරමුණු | අවදානම් |
|---|---|---|
| ගනුදෙනුකරුවන්<br>සේවකයින්<br>සැපයුම්කරුවන් | ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම<br>මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම | මෙහෙයුම් අවදානම<br>තොරතුරු සුරක්ෂිතතා අවදානම |

### 2020-21 නිෂ්පාදිත ප්‍රාග්ධනය හැසිරවීම




### සාර්ථකත්වය මැනීම

**අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය**




**දේපළ, පිරියත සහ උපකරණ වල සංයුතිය**




**දේපළ, පිරියත සහ උපකරණ වෙත එකතු කිරීම්**




### විමර්ශනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය ආයෝජන දේපළ, භාවිතය සඳහා අයිතිය ඇති වත්කම්, දේපළ, පිරියත සහ උපකරණ වලින් සමන්විත විය.

| **ආයෝජන දේපළ - සමූහය** | | **භාවිත හිමිකම් වත්කම්** | | **දේපළ, පිරියත සහ උපකරණ** | |
|---|---|---|---|---|---|
| කොළඹ 7, හැව්ලොක් පාර, අංක 7 සහ 9 දරන ස්ථානයේ පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි මහජන බැංකුව, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වෙත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් මගින් කුලියට දෙන ලදී. සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් හි, එබඳු දේපල වෙන් කොට ඇති අතර මහජන බැංකුව වෙත කුලියට දෙන ලද කොටස සමූහයේ ආයෝජන දේපළ වශයෙන් වර්ග කොට ඇත. මහජන බැංකුව වෙත කුලියට ලබා දෙන ලද කොටස වර්ග අඩි ප්‍රමාණය මත පදනම්ව සමූහයේ ආයෝජන දේපළ වල වටිනාකම වේ. | | භාවිත හිමිකම් වත්කම් ඉඩම් භාවිත අයිතීන් සහ භාවිත හිමිකම් අයිතීන් සහිත බදු දේපළ වල පෙරදායක වූ කල්බදු කුලී වලින් සමන්විත වේ. | | දේපළ, පිරියත සහ උපකරණ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි, බදු දේපළ වෙත වැඩිදියුණු කිරීම්, මෝටර් රථ. පරිගණක දෘඩාංග, කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ වලින් සමන්විත විය. | |
| | රු. මිලියන | **2021 මාර්තු 31 වන විට** | රු. මිලියන | **2021 මාර්තු 31 වන විට** | රු. මිලියන |
| 2020 අප්‍රේල් 1 දිනට ශේෂය | 1,131.65 | පිරිවැය | 3,349.11 | පිරිවැය | 2,760.53 |
| මාරුකිරීම | (310.99) | සමුච්චිත ක්‍රමක්ෂය | 1,106.67 | සමුච්චිත ක්ෂය | 1,711.28 |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | **820.66** | ශුද්ධ පොත් අගය | **2,242.44** | ශුද්ධ පොත් අගය | **1,049.25** |

GRI 102-6

### අපගේ සේවා සැපයුම

අපගේ භෞතික ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ පළාත් නවයෙහිම පවතී. වසර අවසානයේ දී, දිවයින පුරා අපගේ ගනුදෙනුකරුවන් හට ශාඛා 104, සේවා ස්ථාන 99 ක් සහ රන් ණය මධ්‍යස්ථාන 41 ක් ඔස්සේ සේවා ලබා දෙන ලදී. ශාඛා කිහිපයක් වසර තුළදී එකම ප්‍රදේශය තුළ අධිශ්‍රේණිගත කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සිදුවිය.

කෝවිඩ් 19 වසංගතය පැතිරීමත් සමග, අපගේ ගනුදෙනුකරුවන් වෙත පනවන ලද සංචාරණ සීමා හමුවේ ඩිජිටල්කරණ ප්‍රයත්නය කඩිනම් කරන ලදී. වසංගතය මගින් ඇති කරන ලද අවිනිශ්චිතතා හේතුවෙන්, මෙම වසර තුළ දී අපගේ ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම සීමා කරන ලදී. අපගේ සේවා සැපයුම් ව්‍යාප්ත කිරීමේ ක්‍රමෝපාය වන්නේ දැනට පවතින ශාඛා සහ සේවා මධ්‍යස්ථාන ගනුදෙනුකරුවන්ට ශාඛාවන් වෙත නොපැමිණ සේවා ලබාගත හැකි වන පරිදි වැඩි වැඩියෙන් ඩිජිටල්කරණයට ලක් කිරීමත් ශාඛා පරිපූර්ණ ශාඛා බවට පත්කිරීමත්ය.

අපගේ ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවන්හි ගනුදෙනුකරුවන්ගේ සහ සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව තහවුරු කිරීම මෙම වසරේදී ඉතා වැදගත් විය. අපගේ සියළුම ශාඛා සහ සේවා මධ්‍යස්ථාන වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා රජය විසින් නියම කරන ලද ආරක්ෂණ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළේය.



අපගේ ශාඛා ජාලය පිළිබඳ විස්තර අන්තර්ජාලය ඔස්සේ ලබාගත හැක.

| උතුරු පළාත | |
|---|---|
| ශාඛා | 6 |
| සේවා මධ්‍යස්ථාන | 10 |
| රන් ණය මධ්‍යස්ථාන | 5 |
| ණය කළඹ රු. මිලියන | 4,145 |

| වයඹ පළාත | |
|---|---|
| ශාඛා | 11 |
| සේවා මධ්‍යස්ථාන | 9 |
| රන් ණය මධ්‍යස්ථාන | 4 |
| ණය කළඹ රු. මිලියන | 11,274 |

| බස්නාහිර පළාත | |
|---|---|
| ශාඛා | 32 |
| සේවා මධ්‍යස්ථාන | 16 |
| රන් ණය මධ්‍යස්ථාන | 14 |
| ණය කළඹ රු. මිලියන | 67,570 |

| සබරගමුව පළාත | |
|---|---|
| ශාඛා | 9 |
| සේවා මධ්‍යස්ථාන | 12 |
| රන් ණය මධ්‍යස්ථාන | 1 |
| ණය කළඹ රු. මිලියන | 7,772 |

| දකුණු පළාත | |
|---|---|
| ශාඛා | 15 |
| සේවා මධ්‍යස්ථාන | 17 |
| රන් ණය මධ්‍යස්ථාන | 3 |
| ණය කළඹ රු. මිලියන | 17,306 |

| උතුරු මැද පළාත | |
|---|---|
| ශාඛා | 5 |
| සේවා මධ්‍යස්ථාන | 9 |
| රන් ණය මධ්‍යස්ථාන | 2 |
| ණය කළඹ රු. මිලියන | 6,572 |

| මධ්‍යම පළාත | |
|---|---|
| ශාඛා | 12 |
| සේවා මධ්‍යස්ථාන | 8 |
| රන් ණය මධ්‍යස්ථාන | 8 |
| ණය කළඹ රු. මිලියන | 13,603 |

| නැගෙනහිර පළාත | |
|---|---|
| ශාඛා | 8 |
| සේවා මධ්‍යස්ථාන | 11 |
| රන් ණය මධ්‍යස්ථාන | 3 |
| ණය කළඹ රු. මිලියන | 5,658 |

| ඌව පළාත | |
|---|---|
| ශාඛා | 6 |
| සේවා මධ්‍යස්ථාන | 7 |
| රන් ණය මධ්‍යස්ථාන | 1 |
| ණය කළඹ රු. මිලියන | 7,488 |

**තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්**

අපගේ තොරතුරු තාක්ෂණ දෘඩාංග නිර්මාණය කරන්නා වූ, අපගේ තොරතුරු තාක්ෂණ පද්ධතියෙහි භෞතික සංරචක මගින් තොරතුරු ඇතුලත් කිරීම, සැකසුම, පිට කිරීම, ද්විතික ගබඩාකරණය සහ සන්නිවේදන වැනි ප්‍රධාන පෙළේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සපයනු ලැබේ. අපගේ පද්ධති ක්‍රියාත්මක වන්නා වූ මෘදුකාංග සමගින්, අපගේ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය බුද්ධිමය ප්‍රාග්ධනය යටතේ පිටු අංක 67 සිට 68 දක්වා ඉදිරිපත් කෙරේ.

කෝවිඩ් වසංගතය පැතිරීමත් සමග, රජය විසින් පනවන ලද සෞඛ්‍ය සහ ආරක්ෂණ උපදෙස් වෙත අනුගත වීම සඳහා සහ බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා නිවසේ සිට වැඩ කිරීමට පහසුකම් සලසන ලදී. වසර තුළදී අප විසින් නිවසේ සිට වැඩ කිරීම සඳහා අවශ්‍ය ලැප්ටොප් සහ වෙනත් උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 33.99 ක් ආයෝජනය කරන ලදී. වසර තුළදී ක්‍රියාවලින් කීපයක් සිදුකිරීම සඳහා සහ අපගේ අන්තර්ජාලගත සේවාවන් සවිමත් කිරීම සඳහා මෘදුකාංග වෙත තවත් රුපියල් මිලියන 0.36ක් ආයෝජනය කරන ලදී.

**නිෂ්පාදිත ප්‍රාග්ධනය - ඉදිරි දැක්ම**

**කෙටි කාලීන: 2021/22**

- ශාඛාවන් නිසි ප්‍රමාණයට ගෙන ඒම
- මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම උදෙසා බිම් ප්‍රමාණය වැඩි කිරීම.

**මධ්‍ය කාලීන වසර 3**

- ගනුදෙනුකරුවන් වෙත කඩිනම් සේවාවක් ලබාදීම සඳහා ඇතැම් ක්‍රියාකාරකම් විමධ්‍යගත කරමින් ශාඛාවන් වෙත වැඩි ස්වාධීනත්වයක් ලබාදීම.
- ගනුදෙනුකාර පහසුව තහවුරු කරනු පිණිස සමාගම ලබාදෙන පහසුකම් හි තාක්ෂණික විශේෂාංග සම්බන්ධයෙන් සැලසුම් යාවත්කාලීන කිරීම.

**දිගු කාලීන**

- ශාඛා ජාලය පිහිටුවීමේදී සහ පවත්වාගෙන යාමේදී පරිසර හිතකාමී පියවර අනුගමනය කිරීම.
- හරිත ශාඛාවන් ස්ථාපනය කිරීම

**නිෂ්පාදිත ප්‍රාග්ධනය හුවමාරු කිරීම්**

**මූල්‍ය ප්‍රාග්ධනය**

- නිෂ්පාදිත ප්‍රාග්ධනය වෙත කෙරෙන ආයෝජන මගින් මූල්‍ය ප්‍රාග්ධනය පහත වැටේ. කෙසේවුවද දිගුකාලීනව එමගින් වැඩි ලාභ අත් වේ. මෙම ප්‍රාග්ධන වර්ග දෙකෙහි පවතින සම්බන්ධතාව ඉතා සුපරීක්ෂාකාරීව කළමනාකරණය කළ යුතුයි.

**මානව ප්‍රාග්ධනය**

- ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය මගින් සේවකයින්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ යයි.

**සමාජ හා සබඳතා ප්‍රාග්ධනය**

- ඩිජිටල් සේවාවන් සම්බන්ධ අඛණ්ඩ ව්‍යාප්තිය මගින් ගනුදෙනුකාර අත්දැකීම සහ සේවා පිවිසුම ඉහළ නැංවේ.

**ස්වභාවික ප්‍රාග්ධනය**

- දුරස්ථ ගනුදෙනු සහ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය ඔස්සේ පරිසරය වෙත සෘජු බලපෑම පහත හෙළන ලදී.




# සේවා සමාගමක් වශයෙන්, බුද්ධිමය ප්‍රාග්ධනය පීපල්ස් ලීසිං හට ප්‍රධාන සවිබලයක් සහ තරඟකාරී විශේෂත්වයක් වේ.

## බුද්ධිමය ප්‍රාග්ධනයෙහි ප්‍රධාන සංරචකයන් සමගාමීව පවත්වාගෙන යනු ලබන අතර අප විසින් වටිනාකම් නිර්මාණය සඳහා එය ඵලදායී අයුරින් හසුරුවනු ලැබේ.

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය
නිෂ්පාදන කළඹ
ලාංඡන ස්කන්ධ
සමාගම් සේවා වටපිටාව
ව්‍යංගිත දැනුම
පද්ධති හා ක්‍රියාවලීන්
මෘදුකාංග බලපත්‍ර

**ආශ්‍රිත පාර්ශවකරුවන්**
- ගනුදෙනුකරුවන්
- ආයෝජකයින්
- සේවකයින්
- සැපයුම්කරුවන්

**ක්‍රමෝපායික අරමුණු**
- තිරසාර වර්ධනය පවත්වාගැනීම
- ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම
- අපගේ වෘත්තිකයන් ඔස්සේ විශේෂීකරණය

**අවදානම්**
- කීර්තිනාම අවදානම
- සයිබර් සුරක්ෂිතතා අවදානම
- දුරස්ථ පිවිසුම ආශ්‍රිත අවදානම

## 2020/21 බුද්ධිමය ප්‍රාග්ධනය හැසිරවීම

- නව පහසුකමක් හඳුන්වාදෙන ලදී
- සන්නාම වටිනාකම ලීසිං ක්ෂේත්‍රයේ වඩාත් ප්‍රියකරන ගනුදෙනුකාර සන්නාමය, රු. බිලියන 8.13
- ආයතනික සංස්කෘතික වටාපිටාව සවිමත් කිරීම
- ඉහළ නංවන ලද සවිබලකරණය
- ප්‍රතිඵලගන්වන ලද අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්
- ඩිජිටල්කරණය කඩිනම් කිරීම

### සාර්ථකත්වය මැනීම

මෙම ප්‍රාග්ධනයෙහි බහුවිධ ස්වභාවය හේතුවෙන තනි දර්ශකයකින් මැනිය නොහැකි පීපල්ස් ලීසිංහි බුද්ධිමය ප්‍රාග්ධනය නිර්මාණය, සුරැකීම හෝ අපගමනය වගු ඔස්සේ දක්වා ඇති දර්ශකයන්හි සංචලනය මගින් ඉදිරිපත් කෙරේ.

**සන්නාම හිමිකම් සහ වෙළඳපොල ප්‍රාග්ධනීකරණය**




**කාර්යක්ෂමතාව (ආදායමට පිරිවැය)**




**ව්‍යංගිත දැනුම (රඳවාගැනීමේ අනුපාතය)**




GRI 102-2

### පහසුකම් කළඹ

ගණුදෙනුකරුවන්ගේ විවිධ වූ අවශ්‍යතා සපුරාලන පුළුල් පරාසයක පැතිරුණු පහසුකම් කළඹ අපගේ බුද්ධිමය දේපල වල ප්‍රධාන සංරචකයක් වන අතර ක්ෂේත්‍රයේ වසර ගණනාවක පළපුරුද්ද සහිත වෘත්තිකයන් විසින් අපගේ වෙළඳපොළ සම්බන්ධයෙන් පවතින ගැඹුරු අවබෝධයන් එහි ඇතුලත් වේ. අපගේ පහසුකම් කළඹ පිළිබඳව වැඩිදුර විස්තර www.plc.lk අපගේ වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**Access to Finance Products**

| | | | |
|---|---|---|---|
| "පීපල්ස් ෆ්‍රෙන්ඩ්ලි ලීස්" | "ඔටෝ ලෝන්" | "ශක්ති" ව්‍යාපාරික ණය | 'ශාස්ත්‍ර' අධ්‍යාපන ණය |
| "සැනසුම් පියස" නිවාස ණය | රන් ණය | ආන්තික වෙළඳාම<br>Margin Trading | ණය සාධකකරණය<br>Factoring |
| 'සෙල්ෆි' කෑෂ් | "ක්වික් කෑෂ්" පුද්ගලික ණය | "වොන්ඩර් ලෝන්"<br>Wonder Loan | "ෆාස්ට් ට්‍රැක්" |
| ඉස්ලාමීය ෆිනෑන්ස් සැලසුම් | | | |
| "ඉජාරා" | "මුරාබහා" | "මුෂාරකා" | "වකාලා" |

**Deposits and Savings Products**

| ඉතුරුම් ගිණුම් | ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතුරුම් ගිණුම | 'සෙනෙහස' ළමා ඉතුරුම් ගිණුම | පීපල්ස් ලීසිං ස්ථාවර තැන්පතු |
|---|---|---|---|
| "ප්‍රිමියර් රිවෝඩ් ප්ලෑන්" | | | |

**ඉස්ලාමීය බැංකුකරණ සැලසුම්**

| "මුධාරබා" ඉතුරුම් ගිණුම | "උස්ෆූර්" ළමා ඉතුරුම් ගිණුම | කෙටිකාලීන "මුධාරබා" ආයෝජන ගිණුම | දිගු කාලීන "මුධාරබා" ආයෝජන ගිණුම |
|---|---|---|---|

සන්නාම හිමිකම් දර්ශක

සන්නාම වටිනාකම

වෙළඳපොල ප්‍රාග්ධනීකරණය

මව් සමාගම් අධිකාරය

ඇගයීම සහ ශ්‍රේණිගත කිරීම

සම්මාන සහ ඇගයුම්

ජාතික ශ්‍රේණිගත කිරීම
**A+ (lka)**
**ස්ථාවර ඉදිරිදැක්ම**
ෆිච් රේටින්ග්ස් ලංකා

**ලද පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය**




## සන්නාම හිමිකම

සන්නාම හිමිකම හැසිරවීම ප්‍රධාන ප්‍රමුඛතාවක් සහ සන්නාම හිමිකම විවර්ධනය සඳහා සාධක ගණනාවක් සහාය වන අතර තක්සේරුකරණය සමාගමෙහි සන්නාම හිමිකම මැනීමේ ප්‍රායෝගික මිනුමක් වේ.

2021 මාර්තු 31 දිනට අපගේ සන්නාම හිමිකම රුපියල් බිලියන 8.13 වශයෙන් දැක්වුණි. දශක දෙකක් පුරා, සමාගම මගින් බහුවිධ පාර්ශවකාර කණ්ඩායම් සමඟ ප්‍රබල සබඳතා ගොඩ නංවා ගෙන අත. අපගේ සන්නාම වටිනාකම වෙළෙඳපොළ අදහස් වලින් උකහා ගනු ලබන අතර අප ස්ථාවර, ගනුදෙනුකරුවන්ට හිතවත්, විශ්වාසනීය සමාගමක් වශයෙන් නමක් දිනා ගෙන ඇත. ආරම්භයේදී අපගේ මව් සමාගම වන මහජන බැංකුවේ ශක්තිමත් සන්නාම ප්‍රතිරූපය සෙවනෙහි වැඩුණු අප ඉතා ඉක්මනින් අපගේම අනන්‍යතාවක් ගොඩනගා ගැනීමට සමත්විය.

සමාගමෙහි සමස්ත කීර්තිනාමය සහ ඔරොත්තු දීමේ ශක්තිය විදහා දක්වමින් වසංගතයෙන් අනතුරුව කඩා වැටුණු වෙළදපොල යථා තත්ත්වයට පත් කරගනිමින් වෙළදපොල ප්‍රාග්ධනීකරණය ඉහළින් වර්ධනය කරගැනුනි. සමාගම 2021 මාර්තු 31 දිනට වෙළඳපල ප්‍රාග්ධනීකරණය අතින් විශිෂ්ටතම බැංකු නොවන මූල්‍ය ආයතන පහ අතරට එක් විය.

රට වසා දැමීමෙන් පසු ක්ෂණිකව ඇතිවූ ආර්ථික අපගමනය පිළිබිඹු කරමින් අපගේ ශ්‍රේණිගත කිරීම් පහළ අතට සංශෝධනය කෙරිණි. එතැන් පටන් අපගේ කාර්යසාධනය සැලකිල්ලට ගනිමින් අදාල ශ්‍රේණිගත කිරීම සමාලෝචනය කොට ඉහළ අතට සංශෝධනය කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. තරගකාරී අනුපාත යටතේ දේශීය වෙළෙඳපොළේ පවතින අරමුදල් සම්පාදන සැලකිල්ලට ගනිමින් නුදුරු අනාගතයේදී විදේශ අරමුදල් සම්පාදන මූලයන් වල අවශ්‍යතාවයක් නොවන බැවින් වසර තුළදී අප විසින් ෆිච් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ඉවත් කර ගැනුණි.

අර්බුදයෙන් මිදීම සඳහා ගනුදෙනුකරුවන් වෙත ණය සහන ලබාදීම තහවුරු කිරීම සමස්ත මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාව වූ බැවින් වසංගතය පැතිරීමත් සමඟ ගනුදෙනුකරුවන් සහ සේවකයින් වෙත ඇති වූ පීඩනය හේතුකොටගෙන පාරිභෝගික සමීක්ෂණ තාවකාලිකව අත්හිටුවන ලදී. කෙසේ වුවද, අප විසින් ගනුදෙනුකාර පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අවධානය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර ඒ සඳහා සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| සාරාංශය | පීපල්ස් ලීසිං | ශ්‍රී ලංකා මහ බැංකුව ඔම්බුඩ්ස්මන් |
|---|---|---|
| මුළු පැමිණිලි | 28 | 91 |
| කටයුතු කල මුළු ගණන | 28 | 91 |
| සම්පූර්ණ කරන ලද මුළු ගණන | 26 | 44 |
| අසම්පූර්ණ මුළු ගණන | 2 | 47 |

සම්මාන සහ ඇගයුම් මගින්ද සන්නාමය ශක්තිමත් වන අතර මෙමඟින් විවිධ අංශයන්හි අපගේ මෙහෙයුම් ආශ්‍රිතව සෙසු සමාගම් අතර අපගේ විශිෂ්ටත්වය පිළිබිඹු කෙරේ. වසංගතය හමුවේ සම්මාන උළෙල රැසක් අවලංගු කෙරුනු අතර අපගේ ප්‍රමුඛතාව වූයේ මෙම අතිශය අසීරු වසර පසු කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන් වෙත සහාය වීමයි.

## ඇගයුම්

**Business Today විශිෂ්ටතම 30**

- ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම කාර්යසාධනය සහිත සමාගම් අතර 18 වැනි ස්ථානයට නම් කෙරිණි

**Brand Finance Lanka මගින් වසරේ විශිෂ්ඨතම සන්නාම අතුරින්**

- 21 වැනි ස්ථානයට නම් කෙරිණි
- මූල්‍ය සේවා ක්ෂේත්‍රයෙහි වඩාත්ම වටිනා ගනුදෙනුකාර සන්නාමය
- ලීසිං ක්ෂේත්‍රයේ වඩාත් ප්‍රිය කරන ගනුදෙනුකාර සන්නාමය




**LMD ඇගයුම්**

- LMD 100 අතර 30 වැනි ස්ථානයට නම් කෙරිණි
- ශ්‍රී ලංකාවේ වඩාත් සම්මානනීය සමාගම් අතර 5 වැනි ස්ථානයට නම් කෙරිණි
- දිවයිනේ වඩාත් ගෞරවනීය සමාගම් අතර 51 වැනි ස්ථානයට නම් කෙරිණි

## සම්මාන




**ලංකා වාණිජ මණ්ඩලය මගින් විශිෂ්ටතම ආයතනික පුරවැසි සම්මාන**

- ප්‍රජා සම්බන්ධතා සම්බන්ධ සංගත කැපවීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධව සහතිකය

**CMA ඒකාබද්ධ වාර්තාකරණයේ විශිෂ්ඨත්වය සඳහා වන සම්මාන උළෙල 2020**

- ජයග්‍රාහක, ලීසිං සහ ෆිනෑන්ස් ක්ෂේත්‍රය
- විශිෂ්ටතම ඒකාබද්ධ වාර්තා (10) අතරට නම් කෙරුණි

**ඉස්ලාමීය මූල්‍ය**

- 2019 වසරේ ඉස්ලාමීය කල්බදු සමාගම (ඉජාරා කළඹ මත), රිදී සම්මානය; ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකුකරණ සහ මූල්‍ය ආයතනය මගින් ප්‍රදානය කෙරුණි
- වසරේ ඉස්ලාමීය කල්බදු සමාගම ලෝකඩ සම්මානය දකුණු ආසියාවේ ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකුකරණ සංසදය

### අපගේ සංස්කෘතික පරිසරය

අපගේ සංස්කෘතික වටපිටාව දැක්ම, මෙහෙවර හා අපගේ ප්‍රධාන වටිනාකම් මත පදනම් වේ. තමන් වටින්නේ යයි සහ තමාට නිසි ස්ථානය ලැබෙන්නේ යැයි හැඟෙන සේවා වටපිටාවක ප්‍රතිලාභ පිළිබඳ අප හොඳින් දන්නා බැවින් අප විසින් සමාගමෙහි සේවා වටපිටාව විවෘත, සහයෝගී සහ සාමූහික බවට පත්කොට ඇත. අපි නිරන්තරයෙන්ම අදහස් ඉදිරිපත් කිරීම සහ වෙනස්කම් යෝජනා කිරීම සඳහා සේවකයින් දිරි ගන්වන්නමු. විමර්ශනයට ලක්වන වසරේ සේවක යෝජනා ඔස්සේ නිර්මාණය වූ ක්‍රමෝපායික සැලසුම ඊට නිදසුනක් ලෙස දැක්විය හැක. වැදගත් ක්‍රියාවලීන් සඳහා ඔවුන්ගේ අදහස් ලබා ගැනීම උදෙසා සේවකයින් හට අන්තර්ජාලගත පදනමක් සකසනු ලැබ ඇත. තවද අභ්‍යන්තර ජාලය මගින් ඔවුන් විසින් ලද දැනුම භාවිත කිරීම සඳහා සියලු පහසුකම් සලසා ඇත. මෙය ඉහළ සහභාගීත්වය සහිත කාර්යසාධනය මත පදනම් වූ සේවා වටපිටාවක් වන අතර එහිදී උපාය මාර්ගික අරමුණු
අනුගමනය කිරීම, ඉලක්ක සපුරා ගැනීම, ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම සහ අනාගත අවස්ථා වර්ධනය කරමින් වෙළඳපොල තුළ සමාගමෙහි අද්විතීය ස්ථානය තවදුරටත් පවත්වා ගැනීමට සේවකයින් උනන්දු කරනු ලැබේ.

### ව්‍යංගිත දැනුම, නිපුණතා සහ පළපුරුද්ද

වෙළඳපොලේ දශක දෙකකට අධික අත්දැකීම් සහ අපගේ කාර්ය මණ්ඩලය පුහුණු හා සංවර්ධනය කිරීම සඳහා වන අඛණ්ඩ අවධානය මගින් අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය හසුරුවනු ලැබේ. සැලසුම් හඳුන්වාදීමේ සිට ගනුදෙනුකාර සේවාව දක්වා සහ සබඳතා පවත්වා ගැනීමේ සිට සමාගමෙහි මූල්‍ය තත්ත්වය කළමනාකරණය දක්වා ව්‍යාපාර කටයුතුවල සෑම පාර්ශවයක්ම ව්‍යංගිත දැනුම මත පදනම් වෙයි. අපගේ සේවකයින් තුළ දැනුම වර්ධනය කිරීම සඳහා කාර්යසාධන කළමනාකරණ සහ පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කොට ඇති අතර සේවක රඳවා ගැනීම සඳහා තරඟකාරී වැටුප් සහ පාරිශ්‍රමික ගෙවනු ලැබේ. වසංගතය හේතුවෙන් වසර තුළදී පුහුණු කටයුතු වලට බාධා පැමිණියද, වාර්තාකරන වසරේදී ඇති වූ අවහිරතාවන් ජයගැනීමේ දී ලද කුසලතා සහ අවශ්‍ය විනිශ්චයන්







සම්බන්ධ දැනුම ප්‍රකාශයට පත් කිරීම හෝ අන් අය වෙත ලබා දීම අසීරු වේ. සමාගමේ ව්‍යංගිත දැනුම, නිපුණතා සහ පළපුරුද්ද කෙරෙහි පාදක වන වටිනාකම් පහත දර්ශකයන් වෙතින් ඉදිරිපත් කෙරේ.

### පද්ධති සහ ක්‍රියාවලි

**සේවා වසර ගණන මත පදනම්ව මුළු සේවකයින්**




**සාමාන්‍යය පුහුණු පැය**




නූතන මූල්‍ය සේවා සමාගමක් වශයෙන්, අපගේ පද්ධති සහ ක්‍රියාවලි තොරතුරු තාක්ෂණය මත පදනම් වේ. තොරතුරු තාක්ෂණ උපාය මාර්ග සැකසීම සහ ක්‍රියාවට නැංවීම තොරතුරු තාක්ෂණ අංශයේ වගකීම වේ. තොරතුරු තාක්ෂණ දෘඩාංග මගින් සමාගමෙහි නිෂ්පාදිත ප්‍රාග්ධනයේ කොටසක් නිර්මාණය වන අතර, අපගේ පද්ධති ක්‍රියාත්මක වන මෘදුකාංග මගින් බුද්ධිමය ප්‍රාග්ධනයේ කොටසක් නිර්මාණය වේ. මෙම මෘදුකාංග සම්බන්ධ බලපත්‍ර අස්පෘශ්‍ය වත්කම් මෙන්ම වාර්ෂික බලපත්‍ර පිරිවැය මෙහෙයුම් වියදමෙහි කොටසක් වශයෙන් ඇතුළත් කෙරේ.

තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය පහත දැක්වේ.

**මෘදුකාංග බලපත්‍ර**






තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති රාමුව මගින් තොරතුරු තාක්ෂණ පාලනය සඳහා පහසුකම් සපයන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීමකි. අස්පෘශ්‍ය වත්කම් ද ඇතුළුව සියලු ප්‍රධාන වියදම් ඔවුන් විසින් අනුමත කෙරේ. තොරතුරු තාක්ෂණ අංශය එහි ක්‍රමෝපායන් ක්‍රියාවේ යොදවන්නා වූ තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් 50 දෙනෙකුගෙන් සමන්විත වේ.

තොරතුරු සුරක්ෂිතතාව මෙම ක්‍රමෝපායෙහි වැදගත් අංගයක් වේ. සමාගමෙහි තොරතුරු, වත්කම් සහ පද්ධති වල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරියකු (ISO) පත් කොට ඇත. මෙම ප්‍රධාන කරුණ සඳහා තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතා ප්‍රතිපත්තියෙහි සහයෝගය හිමිවන අතර එහි විශේෂතා දකුණු පසින් දක්වා ඇත. තොරතුරු තාක්ෂණ නිලධාරියාගේ වගකීම් අතරට ලේඛනගත කිරීම, අවදානම් කළමනාකරණය, පුහුණුව හා දැනුවත් කිරීම, වත්කම් හා තොරතුරු කළමනාකරණය, සුරක්ෂිතතා සිදුවීම් කළමනාකරණය සහ ආපදා නිරාකරණය ඇතුලත් වේ. එයට අමතරව, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් සවිමත් කිරීම් සඳහා තොරතුරු තාක්ෂණ විගණකවරයෙකු ද යොදවාගෙන ඇත. අපගේ පද්ධති ISO 27001:2013 තොරතුරු සුරක්ෂිතතා කළමනාකරණ සහතිකත්වය ලබා ඇත. මෙය ජාත්‍යන්තර තත්ත්ව මූලධර්ම වලට අනුකූලතාව සහතික කරයි.

මෙකී ව්‍යාපෘති මගින් ඩිජිටල් ගනුදෙනු පරිමාව සහ වටිනාකම වර්ධනය වීම සඳහා විශාල සහයෝගයක් හිමිවුණු අතර දුරස්ථකරණ පියවර හමුවේ බොහෝ ගනුදෙනුකරුවන් ඩිජිටල් පදනම් වෙත මාරු කර ගැනීමට මෙමගින් හැකි විය.

### 2020/21 විශේෂතා

**කෝවිඩ් 19 ප්‍රතිචාර**

- සමූහ හවුල්කාරිත්වය සමගින් මහජන බැංකු මුදල් තැන්පත් යන්ත්‍ර ඔස්සේ මුදල් තැන්පතු සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම
- සේවකයන් හට නිවසේ සිට වැඩ කිරීමේ පහසුකම් සැලසීම (WFH)
- නිවසේ සිට වැඩ කිරීමේ වටපිටාව සඳහා තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතාව සවිමත් කිරීම
- සියලු මට්ටම් වල සහ සියලු ස්ථානයන්හි අන්තර්ජාලගත රැස්වීම් වෙත සහයෝගය දැක්වීම

**සැලසුම්ගත ඩිජිටල්කරණය**

- නව ලේඛණ ස්කෑන් කිරීම් - පද්ධතිය තුළ (Inbank)
- මෝටර් රථ වාහන දෙපාර්තමේන්තු ක්‍රියාවලිය ස්වයංක්‍රියකරණය
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ලියකියවිලි සැකසුම ස්වයංක්‍රියකරණය
- කඩදාසි භාවිතය අවම කිරීම සඳහා නව (E-memo) ආකෘතිය සැකසීම
- අපහායනය ගණනය කිරීමේ ක්‍රියාවලි සැකසීම
- ණය සාධනකරණ කටයුතු වේගවත් කිරීම (CEFT) ක්‍රියාවලියට අනුගත කිරීම්
- ආන්තික වෙළදාම් කඩදාසි රහිත පද්ධතිය වැඩි දියුණු කිරීම
- සාමාන්‍ය සේවා බිල්පත් ගෙවීම් සැපයුම්කරුගේ පීඑල්සී ගිණුමට සෘජුව මාරු කිරීමේ පද්ධති නවීකරණය
- කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම



### තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතා ප්‍රතිපත්තියෙහි විශේෂතා

- කවර හෝ අනවසර පිවිසුමකට එරෙහිව තොරතුරු සුරක්ෂිත කිරීම
- තොරතුරු වල රහස්‍යභාවය සඳහා පහසුකම් සැලසීම
- තොරතුරු වල සුපිලිපන් බව පවත්වා ගැනේ:
- ව්‍යාපාර ක්‍රියාවලීන් සඳහා තොරතුරු ලබාදීම
- ව්‍යවස්ථාපිත සහ නියාමනමය අවශ්‍යතාවන්ට සහයෝගය දැක්වීම
- සේවකයින් සඳහා තොරතුරු සුරක්ෂිතතා පුහුණුව
- භෞතිකමය පිවිසුම් පාලන
- සියළුම සැබෑ හෝ සැකකටයුතු තොරතුරු සුරක්ෂිතතා උල්ලංඝණය කිරීම් වාර්තා කිරීම

**ඩිජිටල් ගනුදෙනු පරිමාවන්**




**ඩිජිටල් ගනුදෙනු වටිනාකම්**




ඵලදායී තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් භාවිතය

450 කට වැඩි අන්තර්ජාලය හරහා රැස්වීම් පවත්වන ලදී (2021 ජනවාරි සිට 2021 මර්තු 31 දක්වා)

සේවකයින් හට නිවසේ සිට වැඩකිරීමේ පහසුකම්

ඊ මෙමෝ 75000 කට වඩා සංසරනය

රු. 960,000 ක වටිනාකමින් යුතු කඩදාසි 200,000 ක ඉතිරිය

## බුද්ධිමය ප්‍රාග්ධනය - ඉදිරි දැක්ම

### කෙටි කාලීනː 2021/22

- සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන් නැවත සැකසීම
- කඩදාසි රහිත කාර්යාලය

### මධ්‍ය කාලීන වසර 3

- මෙහෙයුම් ගැටළු හඳුනා ගැනීම සහ විසඳීම සඳහා මෙහෙයුම් සහයෝගීතා පද්ධතිය ක්‍රියාවට නැංවීම
- අරමුණු සහගත දත්ත පදනම් තීරණ ගැනීමට සහාය දැක්වීම සඳහා ව්‍යාපාරික බුද්ධිමය මෙවලම් හඳුන්වාදීම සහ MIS ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය
- අයකර ගැනීම් වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා කළමණනාකරණ විසඳුම සවිමත් කිරීම සහ ණය අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීම
- අන්තර්ජාලගත සහ ඉල්ලුම මත අධ්‍යාපනය වෙත සහය දැක්වීම සඳහා අධ්‍යයන කළමණාකරණ පද්ධතියක් ක්‍රියාවට නැංවීම

### දිගු කාලීන

- භාවිත කරන ණයගැතියන් හට ගනුදෙනුකාර ණය ශ්‍රේණිගත කිරීම් අනුමත කිරීම සඳහා කෘතිම බුද්ධියෙන් (AI) බලගන්වන ලද යාන්ත්‍රික අධ්‍යයන පද්ධතිය

## බුද්ධිමය ප්‍රාග්ධනය - හුවමාරු කිරීම්

### මූල්‍ය ප්‍රාග්ධනය

- සන්නාම වටිනාකම සහ ගණුදෙනුකාර ආකල්ප මගින් මූල්‍ය ප්‍රතිලාභ වර්ධනය කෙරේ
- මූල්‍ය ප්‍රාග්ධනය වර්ධනය වීම හේතුවෙන් පද්ධති හා ක්‍රියාවලි සංවර්ධනය සහ සන්නාම වර්ධනය සඳහා තවදුරටත් ආයෝජනය කිරීමට සමාගමට හැකිවේ.

### මානව ප්‍රාග්ධනය

- රඳවා ගැනීමේ අනුපාතය ඉහළ නැංවීම සඳහා යහපත් කාර්ය වටපිටාව හේතු විය
- පුහුණු හා සංවර්ධන සඳහා වන ඉහළ නංවන ලද ආයෝජන මගින් සේවකයින්ගේ ව්‍යංගිත දැනුම ඉහළ නැංවෙන අතර එමඟින් සමාගමෙහි බුද්ධිමය ප්‍රාග්ධනය ඉහළ නැංවේ.

### සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

- වැඩිදියුණු කරන ලද සන්නාම කීර්තිනාමය සහ මූලික වටිනාකම් මගින් ගණුදෙනුදෙනුකාර විශ්වාසය වර්ධනය වන අතර ඔවුන් සමග සබඳතා ශක්තිමත් වේ
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ ඩිජිටල්කරණය වෙත ඉහළ නංවන ලද ආයෝජන මගින් ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය වේ
- සමාජ වගකීම් සහ පාරිසරික තිරසාරත්වය කෙරෙහි වන අපගේ කැපවීම මගින් සමාගමට සිය ආයතනික පුරවැසිභාවය පවත්වාගැනීමට සහයෝගය හිමි වේ

### ස්වභාවික ප්‍රාග්ධනය

- දුරස්ථ ගනුදෙනු සහ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය මගින් පරිසරය වෙත සෘජු බලපෑම පහත වැටේ



**පාර්ශවකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කෙරෙහි පූර්ණ අවධානය යොමුකළ ජීව ගුණයෙන් පිරුණු සේවා කණ්ඩායමක් මුළු දිවයිනම ආවරණය කරමින් සේවා ස්ථාන දෙසිය හතරක් ඔස්සේ**

**අපගේ වර්ධනය තහවුරු කරයි. අපගේ සේවකයින් ආකර්ෂණය කර ගැනීම, සහභාගී කර ගැනීම, ප්‍රතිලාභ පිරිනැමීම, රඳවා ගැනීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධව ව්‍යුහගත ක්‍රියාවලියක් පීපල්ස් ලීසිං සතු වේ. රට තුළ සංචරණ වාරණ පැනවූ අවස්ථාවේ අපගේ කාර්යාල විවෘතව තබා ගනිමින් 2020/21 දී ඔවුන් විසින් දක්වන ලද දායකත්වය ප්‍රශංසනීය වන අතර එහිදී ආර්ථික අවගමනය හේතුවෙන් බලපෑමට ලක්ව සිටි සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් හට ජීවනාලිය බඳු වූ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා රටපුරා ජනතාවට අප සමාගම වෙත යොමුවිය හැකි විය.**

| ආශ්‍රිත පාර්ශවකරුවන් | ක්‍රමෝපායික අරමුණු | අවදානම් |
|---|---|---|
| සේවකයින් | තිරසාර වර්ධනය පවත්වා ගැනීම<br>අපගේ වෘත්තිකයින් ඔස්සේ විශේෂීකරණය<br>නායකත්වය | මෙහෙයුම් අවදානම<br>මානව සම්පත් ආශ්‍රිත අවදානම<br>සේවකයින්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව |

GRI 102-8

## අපගේ කණ්ඩායම පිළිබඳ විස්තර

පළාත සහ ස්ත්‍රී පුරුෂභාව විශ්ලේෂණය




වයස සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව සංඛ්‍යාව




සේවාකාලය සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව




ස්ත්‍රී පුරුෂභාවය අනුව ස්ථිර සහ තාවකාලික සේවක සංඛ්‍යාව

| පළාත | ශාඛා/ඒකක සංඛ්‍යාව | ස්ථිර | | තාවකාලික | |
|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| බස්නාහිර පළාත | 75 | 660 | 292 | 8 | 2 |
| මධ්‍යම පළාත | 10 | 175 | 50 | 5 | - |
| නැගෙනහිර පළාත | 5 | 103 | 16 | 1 | - |
| උතුරු පළාත | 9 | 70 | 13 | 2 | - |
| දකුණු පළාත | 14 | 271 | 56 | 2 | 1 |
| සබරගමුව පළාත | 7 | 136 | 35 | 1 | - |
| උතරු මැද පළාත | 8 | 91 | 24 | 1 | - |
| වයඹ පළාත | 6 | 145 | 42 | 2 | 1 |
| ඌව පළාත | 7 | 113 | 24 | 1 | - |
| **එකතුව** | 141 | 1,764 | 552 | 23 | 4 |

## 2020/21 මානව ප්‍රාග්ධනය හැසිරවීම




### සාර්ථකත්වය මැනීම

සේවකයන් වෙත පහසුකම් සැලසීමේදී සහ පීපල්ස් ලීසිං වෙත වටිනාකම් එක් කිරීමේදී යොදාගනු ලබන බහුවිධ ක්‍රමෝපායෙහි බලාත්මකභාවය මැනීමේදී පහත දැක්වෙන ප්‍රමුඛ කාර්යසාධන දර්ශක උපකාරී වේ.

අප විසින් අපගේ කාර්යමණ්ඩල අවශ්‍යතා ප්‍රතිඇගයුමට ලක්කරමින් ඒ අනුව බඳවා ගැනීම් සීමා කළ බැවින් සේවකයින් වෙත වටිනාකම් පහත වැටුණි. වසර තුළ මුහුණ දෙන ලද අභියෝග මධ්‍යයේ වුවද, කාර්යසාධනයෙහි සැලකිය යුතු වර්ධනය හේතුවෙන් විශේෂ වසර අවසාන දිරි දීමනාවක් ද සමගින් සේවක වැටුප් සම්පූර්ණයෙන් ගෙවන ලදී. ලාභදායිත්වය ඉහළ නැගුණු බැවින් පෙර වසරට

# මානව ප්‍රාග්ධනය



**මුළු සේවකයින්**




**සේවක ඵලදායීතාවය**




සාපේක්ෂව සේවකයකු හට ලාභය වශයෙන් මනිනු ලබන සේවක ඵලදායිත්වය ඉහළ නැගුණි. සේවකයින් යනු ආයතනික ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරමින් සමාගම නගා සිටුවීම සදහා වන නිර්මාණාත්මක අදහස් සපිරි ක්‍රියාකාරී වෘත්තිකයන් වන බැවින් සමාගම මගින් සේවකයන්ගේ වැටුප් හෝ දීමනා අඩු කිරීම් සිදු නොකෙරිණි.

| GRI | 403-1, 403-2 403-3, 403-4, 403-5, 403-6, 403-7, 403-9 |
|---|---|

## සේවකයින්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව

අපගේ ව්‍යාපාරයේ ස්වභාවය හේතුවෙන් අප සතුව විධිමත් සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කමිටුවක් නොමැති වුවද වසර තුළදී අප විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගන්නා ලදී. ප්‍රමුඛ කාර්යසාධන දර්ශක වල ඇතුලත් නොවුවද, මෙම වසරේ සාර්ථකත්වය මැනීමේ විකල්ප ක්‍රමය අපගේ සේවකයින්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව විය. සේවකයින් සඳහා සුරක්ෂිත කාර්ය වටපිටාවක්, කෝවිඩ් ආශ්‍රිත අවදානම් අවම කර ගැනීම සඳහා හදිසි ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා විශේෂ කෝවිඩ් 19 කාර්යසාධන බලකායක් ස්ථාපනය කරන ලදී. අපගේ සියළුම ව්‍යාපාරික ස්ථානයන්හි නිර්දේශිත පරිදි සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ක්‍රියාමාර්ග අනුගමනය කරමින් අපගේ ව්‍යාපාරික ස්ථානයන්හි සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අපි පළාත් පාලන සෞඛ්‍ය බලධාරීන් සමඟ එක්ව කටයුතු කළෙමු. හැකි අවස්ථාවන්හිදී සේවකයින් කණ්ඩායම් වලට වෙන් කොට නිවසේ සිට වැඩ කිරීමට දිරි ගන්වන ලදී. ගර්භනී සේවිකාවන් වැනි තර්ජනයට ලක්විය හැකි සේවකයින් වෙත ලිහිල් කාර්යයන් පවරමින් අවදානම කළමනාකරණය කෙරුණි. විවිධ ස්ථානයන්හි නවාතැන්ගෙන සිටි පිටපලාත් කාර්යමණ්ඩලය වෙත ඔවුන්ගේ නිවසට ආසන්නතම ශාඛා වෙත වාර්තා කිරීමට ඉඩ සැලසිණි. ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය වරින් වර ඇන්ටිජන් පරීක්ෂාවන්ට භාජනය කෙරුණි. සිය ආසන්නතම පවුලේ සාමාජිකයන් හට කෝවිඩ් ආසාදනය වී ඇත්නම් අනුමත පුද්ගලික සෞඛ්‍ය සේවාවක සේවය ලබාගැනීමට සේවකයින් වෙත පොලී රහිත ණයක් පිරිනමන ලදී. කිසියම් සේවකයෙකු ආසාදනය වී ඇත්නම්, වෛද්‍යමය සත්කාර ආශ්‍රිත වියදම් සඳහා විශේෂ දීමනාවක් ප්‍රදානය කරන ලදී. නිරෝධායනයේදී හෝ ඔවුන් ආසාදනය වූ විට සිය පවුල් වෙත සහාය වීම සඳහා අත්‍යාවශ්‍ය ආහාර වර්ග පිරිනමන ලදී. විමර්ශනයට ලක් වන වසර තුළදී සමාගම මගින් රුපියල් මිලියන 1.99 ක් වැයකරමින් නිවසට අවශ්‍ය අයිතම වලින් සමන්විත පාර්සල් 286 ක් පිරිනමන ලදී. මෙම කටයුතු මගින් සමාගමේ ආපදාවක් කෙරෙහි සූදානම සවිමත් කෙරුණු අතර එහිදී අනාගතයේදී ඇතිවිය හැකි බාධාවන් ඔස්සේ සිය මෙහෙයුම් අඛණ්ඩව සිදු කිරීමට සමාගමට හැකි වනු ඇත.

2020/21 වසර තුළදී කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සේවා කාලය ඇතුළත මාර්ග අනතුරුවලට ලක් වූ අතර කාර්යමණ්ඩල සාමාජිකයිනන් 58 දෙනෙකු කෝවිඩ් ආසාදිත බවට වාර්තා විය.

## කණ්ඩායම පිළිබඳ විස්තරය

ගත වූ වසර ආයතනික ඉතිහාසයේ අතිශය අභියෝගාත්මක කාල සමයක් වූ බැවින් සේවක සංඛ්‍යාව 2,343 දක්වා 51 දෙනෙකුගෙන් පහත වැටුණි. සමාගමෙහි කණ්ඩායමේ විවිධත්වය නිරූපණය කරමින් ස්ත්‍රී පුරුෂභාවය, පළාත, වයස, සේවා කාලය සහ ජාතිකත්වය දැක්වෙන විශ්ලේෂණයක් පසෙක දැක්වේ. තිරසාර ඉහළ රඳවාගැනීමේ අනුපාතය මගින් අපගේ කණ්ඩායම දිරිගැන්වීම සඳහා වන ප්‍රධාන සාධකය වන වෘත්තීය අපේක්ෂා ඉටුකරගත හැකි ආකාරයේ සේවා වටපිටාවක් බිහි කිරීමේ අවස්ථාව උදා වී තිබේ. අපගේ සියළුම සේවකයින් පූර්ණ කාලීන සේවකයින් වන අතර ඔවුන් පරිවාස කාලයෙන් පසු ස්ථාවර සේවක පිරිස වෙත ඇතුළත් කරගෙන ඇත.

## මානව ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා ආකෘතික රාමුවක්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මානව ප්‍රාග්ධනය කළමනාකරණයට අදාළ චර්යාධර්ම පද්ධතිය, සේවක පිරිස් සහ සේවකයන් ආශ්‍රිත පිරිවැය සඳහා අයවැය සම්බන්ධ ප්‍රතිපත්ති අනුමත කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව මගින් සමාලෝචන මත පදනම්ව නිර්දේශ ඉදිරිපත් කරමින් මෙකී කාර්යන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය දක්වේ. සමස්ත ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරිවරයා වගකීමෙන් බැඳෙන අතර මානව සම්පත් අංශයේ ප්‍රධානත්වය දරන මානව සම්පත් සහකාර සාමාන්‍යාධිකාරීවරිය වෙත පූර්ව නිශ්චිත ප්‍රමුඛ කාර්යසාධන දර්ශක සම්බන්ධ දිශානතීන් හා වාර්තා ලැබීමට සැලැස්වේ. පාරිශ්‍රමික කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව මානව සම්පත් අංශය සමග එක්ව කටයුතු කරයි.

මානව සම්පත් අංශය මගින් ද, මානව ප්‍රාග්ධනය කළමනාකරණය සහ සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති, ක්‍රමවේදයන් සහ ක්‍රියාවලි සකසනු ලබයි. වසර තුළදී, මානව සම්පත් අංශය මගින් ප්‍රතිපත්ති රැසක් ඒකාබද්ධ කරමින් සහ පහත දැක්වෙන පාර්ශවයන් ආවරණය කෙරෙන නව ප්‍රතිපත්ති හඳුන්වාදෙමින් ප්‍රතිපත්ති සංග්‍රහය වැඩි දියුණු කරන ලදී.

**පවතින ප්‍රතිපත්ති**

- බඳවාගැනීම
- ස්ථාන මාරුකිරීම්
- පුහුණු සහ සංවර්ධන
- සන්නිවේදන
- වන්දි සහ ප්‍රතිලාභ
- විශ්‍රාම
- විදේශ සංචාර
- රක්ෂණ ප්‍රතිලාභ
- කාර්යසාධන කළමනාකරණ
- උසස්වීම්
- දීමනා සහ ඇගයුම්
- චර්යාධර්ම පද්ධතියට අදාළ කරුණු
- සහායක ණය
- විනය කළමනාකකරණය
- සේවයෙන් වෙන්කිරීම
- මානව හිමිකම්
- රහස්‍යභාව
- දුරස්ථ පිවිසුම් ප්‍රතිපත්තිය

**නව ප්‍රතිපත්ති**

- නිවසේ සිට වැඩකිරීමේ ප්‍රතිපත්තිය
- සමාජ මාධ්‍ය ප්‍රතිපත්තිය
- ජංගම දුරකථන භාවිත කිරීමේ ප්‍රතිපත්තිය
- විනය සංග්‍රහය




| ජාතිකත්වය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| සිංහල | 1,580 | 518 | 2,098 |
| දෙමළ | 135 | 26 | 161 |
| මුස්ලිම් | 72 | 12 | 84 |
| **එකතුව** | **1,787** | **556** | **2,343** |

GRI 401-1

### සවිමත් කුසලතා වාහිනියක් නිර්මාණය කිරීම

අප වර්ධනය සඳහා විශ්වසනීය සබඳතා කෙරෙහි විශ්වාසය තබන සේවා සමාගමක් වන බැවින්, ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කුසලතා වාහිනියක් නැතහොත් සංචිතයක් අවශ්‍ය වේ. සමාගම මගින් 2020/21 මූල්‍ය වර්ෂයේදී වසර තුළදී විශ්‍රාම ලද හෝ ඉල්ලා අස් වූ සේවකයින් එකසිය හතළිස් හත වෙනුවට නව සේවකයින් අසූ එක් දෙනෙකු බඳවාගන්නා ලදී. වසර තුළ දී සිදු වූ ව්‍යාපාරික අවහිරතා බඳවාගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි අහිතකර ලෙස බලපෑ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සේවා කණ්ඩායමේ සංඛ්‍යාව පහත වැටුණි.

පීපල්ස් ලීසිං සමාන අවස්ථා ලබාදෙන සේවායෝජකයකු වන අතර එහි සවිමත් දේශීය අධිකාරිය සහ කීර්තිනාමය හේතුවෙන් දිවයිනේ විශිෂ්ටතම කුසලතාවන් ආකර්ෂණය කරගැනීමට සමාගමට හැකි වේ. සේවයට එක්කර ගත හැකි අයදුම්කරුවන් සඳහා කෙරෙන පරීක්ෂාව ව්‍යුහගත ක්‍රියාවලියකි. එයට ලිඛිත පරීක්ෂණ ඇතුලත් වන අතර එහිදී ඇබෑර්තු සඳහා වන හැකියාවන් පවතීද යන්න නිර්ණය කෙරෙන අතර සමාගමෙහි සේවා වටපිටාව සහ වටිනාකම් කෙරෙහි ඔවුන් ගැලපෙන්නේද ද යන්න ද තීරණය කෙරේ. ඇතුලත්වීමේ මට්ටමින් බඳවාගනිමින් වෘත්තීය ප්‍රගතිය සඳහා අත හිත දෙන සමාගමක් වීම හේතුවෙන් පීපල්ස් ලීසිං හි ආයතනික වටිනාකම් කෙරෙහි ගැලපෙන ආයතනික වටපිටාවක් බිහිකිරීමට සමාගමට හැකිව ඇත.

#### නව බඳවාගැනීම්

පළාත සහ ස්ත්‍රී පුරුෂභාව විශ්ලේෂණය




වයස සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව සංඛ්‍යාව




#### සේවක පිරිවැටුම

පළාත සහ ස්ත්‍රී පුරුෂභාව විශ්ලේෂණය




වයස සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව සංඛ්‍යාව




GRI 102-16, 102-41, 407-1, 410-1

### දිරිගන්වන සුළු සේවා ස්ථානයේ නිර්මාණය කිරීම

මනා සේවා ස්ථානයක පදනම වනුයේ සේවකයන් හට ගෞරවනීය ලෙස සේවයේ යෙදිය හැකි පරිපූර්ණ සේවක වටිනාකම් සමුදායකි. සේවා නියුක්තිය ඇරඹීමේදී සියළුම සේවකයින් හට ලබාදෙන ලිඛිත සේවා ගිවිසුමට අමතරව මානව සම්පත් ප්‍රතිපත්ති සංග්‍රහය සහ චර්යාධර්ම සංග්‍රහය මගින් සේවායෝජකයාගේ අපේක්ෂාවන් පිළිබඳව පැහැදිලිව නිර්වචනය කෙරේ. සේවකයන්ගේ යහපැවැත්ම සඳහා පිරිනමනු ලබන ප්‍රතිලාභ අතර වෛද්‍ය රක්ෂණය මගින් ආවරණය නොවන රෝග ආබාධ සඳහා වෛද්‍ය, හදිසි අනතුරු, ජීවිත රක්ෂණ සහ බරපතල රෝගාබාධ අරමුදල, ප්‍රධාන කාර්යාලයේ අංගසම්පූර්ණ ව්‍යායාම මධ්‍යස්ථානය, සෞඛ්‍ය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණුව, පෝෂණය, බරපතළ රෝග වලින් වැළකීමේ සත්කාරය ආදිය ඇතුළත් වේ.

වයස අවුරුදු 18 ට වැඩි පුද්ගලයින් පමණක් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය මගින් සමාගම තුළ කිසිදු ළමා මෙහෙකාර සේවයක් සිදු නොවන බවට තහවුරු කෙරේ. ආරක්ෂක ක්‍රියාමාර්ග වලින් සේවකයන්ගේ සහ සෙසු පාර්ශවකරුවන්ගේ ගෞරවය සුරකෙන බවට තහවුරු කරමින් ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවන්හි ආරක්ෂක සේවා කීර්තිමත් ආරක්ෂක සේවා සැපයුම්කරුවන් වෙතින් පිටතින් ලබාගෙන ඇත. වැඩසටහනක් විශේෂිතව නොපැවැත්වුවද, අපගේ ප්‍රධාන කාර්යාලය සහ ශාඛාවන්හි වගකීම් සහගත අමුත්තන්/ ගනුදෙනුකරුවන් කළමණාකරනය ඇතුළුව පොදුවේ මූලික මානව අයිතීන් සුරැකීම පිළිබඳ අධ්‍යාපනයක් ආරක්ෂක කාර්යමණ්ඩලය වෙත ලබා දෙනු ලැබේ.

සමාගමෙහි සමාන අවස්ථා ප්‍රතිපත්තිය මගින් පාරිශ්‍රමික, ඇගයීම් සහ ප්‍රතිලාභ සැලසුම් හුදෙක් අදාල පුද්ගලයාගේ කාර්යසාධනය, නිපුණතා සහ වටිනාකම් මත පදනම් වන බවට සහ ස්ත්‍රී පුරුෂ, ජාතිකත්වය හෝ වෙනත් ආකාරයක වෙනස්කොට සැලකීමක් සිදු නොවන බවට තහවුරු කෙරේ. 2016 අංක 3 දරන ජාතික අවම සේවක වේතන පනත මගින් දක්වා ඇති අවම වේතන සම්මතයන් සහ 2016 අංක (4) දරණ අයවැය සහන දීමනා පනත මගින් දක්වා ඇති අවම අයවැය දීමනා හා සමගාමීව සමාගම මගින් ගෙවීමේ පරිමාණ ආදේශ කරගෙන ඇත.

අපේක්ෂිත චර්යාවන් පිළිබඳව සේවකයන් දැනුවත් වන පරිදි සහ ඔවුන්ගේ ගැටලු ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලීන් පිළිබඳව ඔවුන් දැනුවත් වන පරිදි ස්ථාපනය කොට ඇති දුක්ගැනවිලි යාන්ත්‍රනය මගින් ප්‍රතිපත්ති ආකෘතික රාමුවට සහාය සපයනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන ගැටළුවෙහි සංවේදීතාවය අනුව සේවකයින් හට ඔවුන්ගේ රේඛීය කලමනාකරු, මානව සම්පත් අංශය හෝ නිර්නාමිකව අන්තර්ජාලය ඔස්සේ අදාල ගැටළු ඉදිරිපත් කළ හැක.

වෙනස් කොට නොසැලකීම, මානව හිමිකම් සුරැකීම සහ සංවිධාන ගතවීමේ නිදහස පිළිබඳ අයිතිය වැනි අනිවාර්ය සාධක වලින් ඔබ්බට යමින් සේවකයන් හට සිය වෘත්තීය අභිලාෂයන් ඉටුකරගත හැකි දිරිගන්වන සුළු සේවා වටපිටාවක් නිර්මාණය කිරීමට සමාගම කටයුතු කරයි. විමර්ශනයට ලක් වන වසර තුළදී, සේවකයින්ගෙන් 64.04% ක් අපගේ සේවක වෘත්තීය සමිතිය හා එක්විය. 2020/21 දී මෙහෙයුම් සහ සැපයුම්කරුවන්වන් සම්බන්ධයෙන් සංවිධාන ගතවීමේ නිදහස පිළිබඳ අයිතිය සහ සාමූහික කේවල් කිරීමේ අයිතිය අවදානමට ලක්වෙන ආකාරයේ කිසිදු සිදුවීමක් වාර්තා නොවීය. එමෙන්ම වසර තුළදී වෙනස් කොට සැලකීම පිළිබඳ කිසිදු සැලකිය යුතු සිදුවීමක් වාර්තා නොවීය. වසංගතය බලපෑමත් සමඟ, සේවක සහභාගීත්ව සහ පුහුණු හා සංවර්ධන වැඩසටහන් බොහොමයක් සමාජ දුරස්ථකරණය/සීමාසහිත රැස්වීමේ අවශ්‍යතා හේතුකොටගෙන සීමා වූ නමුත්, අන්තර්ජාලගත සහභාගීත්ව හා පුහුණු කටයුතුවලින් ඒවා ප්‍රතිස්ථාපනය කෙරිණි.

සමාගම මගින් දැඩි සෞඛ්‍ය නීති රීති යටතේ පවත්වන ලද උපහාර දැක්වීමේ උත්සවයකදී, වසංගතය මධ්‍යයේ අභියෝගාත්මක කාලයක් තුළ සුවිශේෂී කාර්යසාධනයක් අත්පත් කරගත් සේවකයින් ඇගයුමට ලක් කරන ලදී.



විශිෂ්ට කාර්යසාධනය ඇගයුමට ලක් කිරීම

GRI 401-2

**සේවක සහභාගීත්වය**

සේවක සහභාගීත්වය යනු එක්ව කටයුතු කරන ශක්තිමත් කණ්ඩායමක් නිර්මාණය කර ගැනීමේ ප්‍රධාන සාධකය වේ. සාමාන්‍ය වසරවලදී, සේවකයින් සහ ඔවුන්ගේ පවුල් අතර සුහදත්වය ගොඩනැංවීම සඳහා බොහොමයක් සේවක සහභාගීත්ව වැඩසටහන් සංවිධානය කරන ලදී. වසංගතය මගින් මෙම තත්වය වෙනස් කරන ලද අතර වසර තුළදී එවැනි කටයුතු අවම මට්ටමක පැවතිණි.

2020 නොවැම්බර් මස නව ප්‍රධාන විධායක නිලධාරීවරයා පත්කිරීමෙන් අනතුරුව කාර්ය මණ්ඩලය සමඟ අන්තර් ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා ටවුන් හෝල් රැස්වීම් සහ ස්කිප් මට්ටමේ රැස්වීම් හඳුන්වා දෙන ලද අතර එහිදී සේවකයින් හට ඔවුන්ගේ ගැටලු සහ මෙහෙයුම් තත්ත්වයන් සෘජුවම ප්‍රධාන විධායක නිලධාරියා සමග සාකච්ඡා කළ හැකි විය. සේවකයින් සමඟ සම්බන්ධවීම සඳහා ආයතනික කළමනාකාරීත්වය නිරන්තරයෙන්ම ශාඛා සංචාරයන් සිදු කරන ලදී. සමාගමේ උපායමාර්ගික සැලසුම්කරන ක්‍රියාවලිය වෙත සිය වටිනා අදහස් ලබා දීම සඳහා අන්තර්ජාලගත උපායමාර්ගික කවය වෙත සහභාගිවීම සඳහා සියළුම සේවකයින් දිරිගන්වන ලදී. කෙසේ වුවද, සෞඛ්‍ය හා සුරක්ෂිතතා ගැටළු හේතුවෙන් සේවකයන් එක්රැස්වීම සීමිත විය.

**සේවක ප්‍රතිලාභ**

- වෛද්‍ය, හදිසි අනතුරු සහ ජීවිත රක්ෂණය
- සෞඛ්‍ය රක්ෂණය මගින් ආවරණය නොවන රෝගාබාධ සඳහා බරපතල රෝගාබාධ අරමුදල
- අදාළ කාණ්ඩයන් හට මෝටර් රථ මිලදී ගැනීම සඳහා සහන ණය යෝජනාක්‍රමය
- නිවාස ණය පොලී ප්‍රතිපූර්ණ සැලසුම
- නම් කරන ලද කාර්ය මණ්ඩලය සඳහා ජංගම දුරකථන පිරිවැය මත ප්‍රතිපූර්ණය
- ආසන්නතම පවුලේ සාමාජිකයකුගේ වියෝවකදී කාර්ය මණ්ඩලය වෙත මෘත්‍යතා ප්‍රදානයක්
- පිළිගත් ආයතන වල වෘත්තීය විභාග සඳහා විභාග ගාස්තු ප්‍රතිපූර්ණය
- සංචාරය කරන පිටපළාත් සේවකයින් සඳහා සහන ගාස්තු යටතේ බණ්ඩාරවෙල නිවාඩු නිකේතනය සහ මරදාන සහ මහරගම නේවාසික පහසුකම්
- ප්‍රධාන කාර්යාලයේ අංග සම්පූර්ණ ව්‍යායාම මධ්‍යස්ථානය
- සෞඛ්‍ය, පෝෂණය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ බරපතල රෝගාබාධ සඳහා වැළකීමේ සත්කාරය

| ප්‍රධාන ප්‍රතිලාභ | 2020/21<br>රු. මිලියන | 2019/20<br>රු. මිලියන |
|---|---|---|
| වැටුප් සහ දිරිදීමනා | 2,190.18 | 2,443.61 |
| EPF | 188.76 | 182.75 |
| ETF | 47.46 | 45.67 |
| අතිකාල | 29.02 | 50.38 |
| නිවාඩු මුදල් බවට හරවාගැනීම | 1.80 | 60.67 |
| දීමනා සහ වර්ධකයන් | 731.06 | 652.58 |
| තාවකාලික වේතන | 1.17 | 5.11 |
| සෞඛ්‍ය රක්ෂණය | 164.18 | 149.33 |
| පාරිතෝෂිකය | 111.74 | 111.28 |
| **එකතුව** | **3,465.37** | **3,701.38** |

GRI 405-1

## ස්ත්‍රී පුරුෂභාව වාර්තාව

මෙම කොටස මගින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි ස්ත්‍රී පුරුෂභාව වාර්තාකරණ ආකෘතිය වෙත අනුකූලවය පළ කිරීම සිදු කෙරේ. පීපල්ස් ලීසිං මගින් ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධයෙන් GRI දර්ශක ආශ්‍රිතව වාර්තා කළද, මේ සම්බන්ධව ඒකාබද්ධ සමාලෝචනයක් සැපයීම සඳහා තොරතුරු ඒකාබද්ධකරණය කිරීමේ පළමු ප්‍රයත්නය මෙය වේ. අප විසින් ආකෘතියෙහි පළමු ස්ථම්භ තුන භාවිත කොට ඇති අතර අනාගතයේදී සියළුම ස්ථම්භ (හතර) වෙත ව්‍යාප්ත කිරීමට සැලසුම් කොට ඇත. සේවා ස්ථානය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම සඳහා වැඩි වශයෙන් කටයුතු කිරීම සඳහා මෙම පදනම අනාගතයේදී සවිමත් ගොඩනැංවීමක් සඳහා ප්‍රමාණවත් බව අපගේ විශ්වාසයි.

**ගාමකයන්**

- සමාන අවස්ථා සේවායෝජක
- ගෙවීමේ දී කිසිදු වෙනස්කොට සැලකීමක් නොමැත
- ලිංගික අපයෝජනය සම්බන්ධ කිසිදු අවසරයක් ලබා නොදීම/ ලිංගික අපයෝජනයට එරෙහි ප්‍රතිපත්තිය
- කඩ සාප්පු සහ කාර්යාල පනතට අනුව ප්‍රසූත නිවාඩු
- වසංගත කාලය තුළදී ගැබිනි කාන්තාවන් හට ලිහිල් කාර්යභාරයන් පවරන ලදී

**සංයුතිය**

- කාණ්ඩය, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවකයින්ගේ විශ්ලේෂණය
- බඳවා ගැනීම් සම්බන්ධ ස්ත්‍රී පුරුෂභාව විශ්ලේෂණය (පිටුව 73 බලන්න) - ඉවත්වීම් (පිටුව 73 බලන්න)
- බස්නාහිර පළාත තුල කාන්තා කොටස
- පුහුණුව හිමිවූ කාන්තා කොටස (පිටුව 77 බලන්න)

**ස්ත්‍රී පුරුෂ පරතර දර්ශක**

- ස්ත්‍රී පුරුෂභාවය සහ කාණ්ඩය අනුව මූලික වැටුප් අනුපාතය

## ස්ත්‍රී පුරුෂභාව නියෝජනය

ඉහත සඳහන් කළ පරිදි, කාන්තා සේවිකාවන් ආකර්ශනය, සංවර්ධනය සහ රඳවා ගැනීම සඳහා සවිමත් ප්‍රතිපත්තිමය ආකෘතියක් ස්ථාපනය කොට ඇත. කෙසේ වුවද, අපගේ මෙහෙයුම් වල භූගෝලීය බෙදීයාම සහ පිටපළාත් වෙත මාරු කිරීම හේතුවෙන් කාන්තාවන් සේවයට බැඳීම කෙරෙහි අධෛර්‍යයට පත්වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රම බළකාය තුළ කාන්තා නියෝජනය 23.70% ක් වශයෙන් වාර්තා වන අතර දිවයිනේ ශ්‍රම බලකාය අනුව මෙම ප්‍රතිශතය 32.87% ක් වේ. කෙසේ වුවද, වසර තුළදී නව බඳවාගැනීම් වලින් 32.10%ක් කාන්තාවන් වීම හේතුවෙන් මෙම අනුපාතය වෙත වර්ධනයක් දැකගත හැකි විය.

| සේවක කාණ්ඩය | ස්ත්‍රී පුරුෂභාවය | 60 | 50-59 | 40-49 | 30-39 | < 29 |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ නායකත්වය | පුරුෂ | - | 17 | 18 | - | - |
| | ස්ත්‍රී | 1 | 2 | - | 1 | - |
| මධ්‍යම කළමනාකරුවන් | පුරුෂ | - | 7 | 31 | 3 | - |
| | ස්ත්‍රී | - | - | 3 | - | - |
| රේඛීය කළමනාකරුවන් | පුරුෂ | - | 6 | 73 | 37 | - |
| | ස්ත්‍රී | - | 1 | 12 | 11 | - |
| විධායක නිළධාරීන් | පුරුෂ | 1 | 10 | 83 | 283 | 7 |
| | ස්ත්‍රී | - | 5 | 46 | 47 | 3 |
| විධායක නොවන නිළධාරීන් | පුරුෂ | 18 | 2 | 37 | 486 | 575 |
| | ස්ත්‍රී | 4 | - | 8 | 191 | 220 |
| කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | පුරුෂ | - | 9 | 20 | 31 | 33 |
| | ස්ත්‍රී | - | 1 | - | - | - |
| **එකතුව** | පුරුෂ | **19** | **51** | **262** | **840** | **615** |
| | ස්ත්‍රී | **5** | **9** | **69** | **250** | **223** |

[1] *ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය, 2020 4 වැනි කාර්තුව ආශ්‍රයෙන් ගණනය කරන ලදී.*

බස්නාහිර පළාතේ සේවය කිරීමට කාන්තා සේවිකාවන් දක්වන කැමැත්ත හේතුවෙන් එම පළාතේ කාන්තා නියෝජනය ඉහළ අගයක පවතී. සමාගම මගින් වෙනස් කොට සැලකීමකින් තොරව ස්ත්‍රී පාර්ශවයට පුහුණු අවස්ථා ලබා දෙනු ලැබේ.

## ප්‍රසූත නිවාඩු

බොහෝ සේවිකාවන් ප්‍රසූත නිවාඩුවෙන් පසුව සහ ඉන් අනතුරුව එළඹෙන මාස දොළහ ඇතුළත ළමා රැකවරණ හේතු මත සේවයෙන් ඉවත් වේ. ඒ පිළිබඳ තත්ත්වයන් පහත් දැක්වේ.

| | 2020/21 | 2019/20 |
|---|---|---|
| ප්‍රසූත නිවාඩු සඳහා සුදුසුකම් ලද අය | 557 | 572 |
| නිවාඩු ලද සේවිකාවන් | 50 | 48 |
| ප්‍රසූත නිවාඩු වලින් පසු සේවයට පැමිණි සේවිකාවන් | 44 | 41 |
| ප්‍රසූත නිවාඩු වලින් පසු සේවයට පැමිණීමෙන් අනතුරුව පසුගිය මාස 12 සඳහා සේවය කළ අය | 41 | 31 |
| ප්‍රසූත නිවාඩු ලද සේවිකාවන්ගෙන් නැවත සේවයට පැමිණීමේ අනුපාතය | 88.00% | 85.42% |
| ප්‍රසූත නිවාඩු ලද සේවිකාවන් රඳවා ගැනීමේ අනුපාතය | 85.42% | 65.96% |

**ස්ත්‍රී පුරුෂභාව ගෙවීමේ පරතර දර්ශක**

| සේවක කාණ්ඩය | ස්ත්‍රී පුරුෂභාවය | 20/21 | 19/20 |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ නායකත්වය | පුරුෂ | 1.00 | 1.00 |
| | ස්ත්‍රී | 0.79 | 0.72 |
| මධ්‍යම කළමනාකරුවන් | පුරුෂ | 1.00 | 1.00 |
| | ස්ත්‍රී | 0.89 | 0.89 |
| රේඛීය කළමනාකරුවන් | පුරුෂ | 1.00 | 1.00 |
| | ස්ත්‍රී | 1.08 | 1.08 |
| විධායක නිළධාරීන් | පුරුෂ | 1.00 | 1.00 |
| | ස්ත්‍රී | 1.13 | 1.13 |
| විධායක නොවන නිළධාරීන් | පුරුෂ | 1.00 | 1.00 |
| | ස්ත්‍රී | 1.04 | 1.02 |
| කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | පුරුෂ | 1.00 | 1.00 |
| | ස්ත්‍රී | 1.08 | 1.13 |
| **එකතුව** | පුරුෂ | **1.00** | **1.00** |
| | ස්ත්‍රී | **0.85** | **0.82** |

ස්ත්‍රී පුරුෂ භාවය අනුව මූලික වැටුප් අනුපාතය පහත දැක්වෙන අතර එය සමස්තයක් වශයෙන් පුරුෂයන්ට ස්ත්‍රීන් සංසන්දනය කිරීමේදී ඉතා සුළු වෙනසක් දක්වයි. සුළු සේවකයින් සිට රේඛීය කළමනාකරුවන් දක්වා පහල කාණ්ඩයන්හි එය එකට වැඩි අගයක් ගන්නා අතර ඉහළ සේවා තත්ත්වයන්හිදී ප්‍රතිවර්තනය වේ. වසර තුළදී මෙම පරතරය පියවීම සඳහා කටයුතු කොට ඇත.

**පුහුණුවේ දී ස්ත්‍රී පුරුෂ පරතරය**

සියළුම සේවා කාණ්ඩයන්හි සේවිකාවන් සඳහා වන පුහුණු පැය සේවකයින්ට වඩා පහළ මට්ටමක පවතී. එය වර්ධනය විය යුතු ක්ෂේත්‍රයකි. ඒ පිළිබඳ තොරතුරු පිටු අංක 77හි දැක්වේ.

**නිගමනය**

සමාගම මගින් ස්ත්‍රී පුරුෂභාව සමානාත්මතාවය සඳහා පියවර රැසක් ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් ජාතික, සමාගම් සහ පුද්ගල මට්ටම් වල අවධානය යොමු විය යුතු කරුණු රැසක් පවතී. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට සහයෝගය දැක්වීමට අපි කැපවී සිටින අතර අපගේ ව්‍යාපාරික අවශ්‍යතාවන්ට අනුකූලව පීපල්ස් ලීසිං හිදී මෙය සාක්ෂාත් කරගත හැකි ක්‍රම පිළිබඳ අපි දිගටම ගවේෂණය කරන්නෙමු.

GRI 404-1

### අපගේ මානව සම්පත් සංවර්ධනය

අපගේ මානව සම්පත් සංවර්ධනය සමාගමෙහි ප්‍රමුඛතාවක් වන අතර අප විසින් කුසලතා සපිරි තරුණ තරුණියන් බඳවාගනිමින් ඔවුන් හට මුල්‍ය හා කල්බදු ව්‍යාපාරය පිළිබඳව මනා පුහුණුවක් දෙනු ලැබේ. ඔවුන් අතරින් බොහෝ දෙනෙක් සමාගම වෙනුවෙන් අවදානම් භාරගන්නා අතර අප නියාමනයට ලක් වන ක්ෂේත්‍රයක කටයුතු කරන බැවින් අදාල නියාමන අවශ්‍යතා පිළිබඳ දැනුවත් වීමේ දී මෙකී පුහුණුව අතිශය වැදගත්ය.

සමාගම මගින් පසු පසුගිය වසර කිහිපය තුළ ව්‍යාපාරික අවශ්‍යතාවන්ට සරිලන අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කෙරුණි. එහිදී නව අවබෝධයන්, සංකල්ප සහ අදහස් අපගේ කණ්ඩායම වෙත ලබාදීම සඳහා බාහිර පුහුණුව ලබා දෙන ලදී. පහත දැක්වෙන වගුව මගින් සේවකයෙකු හට ලබා දෙන ලද පුහුණු ආවරණය සහ පුහුණු පැය සාමාන්‍යය දැක්වේ.

| සේවක කාණ්ඩය | ස්ත්‍රී පුරුෂභාවය පුරුෂ | පුහුණු මාදිලිය | | | | පුහුණු කල මුළු සේවකයින් | පුහුණු පැය | පැය සාමාන්‍යය |
|---|---|---|---|---|---|---|---|---|
| | | අභ්‍යන්තර | බාහිර | අන්තර්ජාලගත | එකතුව | | | |
| ජ්‍යෙෂ්ඨ නායකත්වය | පුරුෂ | - | 2 | 7 | 9 | 54 | 211.5 | 6.04 |
| | ස්ත්‍රී | - | - | 5 | 5 | 7 | 14.5 | 3.63 |
| මධ්‍යම කළමනාකරුවන් | පුරුෂ | 1 | 1 | 2 | 4 | 6 | 59 | 1.44 |
| | ස්ත්‍රී | - | 2 | 1 | 3 | 3 | 35 | 11.67 |
| රේඛීය කළමනාකරුවන් | පුරුෂ | 1 | 1 | 2 | 4 | 20 | 202 | 1.74 |
| | ස්ත්‍රී | 1 | 2 | 4 | 7 | 10 | 58.5 | 2.44 |
| විධායක නිළධාරීන් | පුරුෂ | 2 | 1 | 3 | 6 | 78 | 481 | 1.25 |
| | ස්ත්‍රී | 1 | 2 | 2 | 5 | 10 | 61.5 | 0.61 |
| විධායක නොවන නිළධාරීන් | පුරුෂ | 4 | - | 4 | 8 | 101 | 657.5 | 0.59 |
| | ස්ත්‍රී | 2 | - | 3 | 5 | 27 | 134.5 | 0.32 |
| කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | පුරුෂ | - | - | - | - | - | - | - |
| | ස්ත්‍රී | - | - | - | - | - | - | - |
| එකතුව | පුරුෂ | 8 | 5 | 18 | 31 | 259 | 1,611 | 0.90 |
| | ස්ත්‍රී | 4 | 6 | 15 | 25 | 57 | 304 | 0.55 |
| **සමස්ත එකතුව** | | **12** | **11** | **33** | **56** | **316** | **1,915** | **0.82** |

විශේෂිත පුහුණු පහසුකම් පැවතියද වාර්තාකරන වසරේදී වසංගතය හේතුවෙන් පුහුණු පැය සාමාන්‍යය සහ පුහුණු කිරීම් සඳහා සිදුකරන ලද ආයෝජන යන කරුණු දෙකෙහිම පහළයාමක් දක්නට ලැබේ. එසේ වුවද සේවකයින් හට සිය පුහුණු කටයුතු තමන් හටම කළමනාකරණය කරගත හැකි පරිදි අධ්‍යයන කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමට සැලසුම් කොට ඇත.

ප්‍රධාන වශයෙන් කාර්යසාධන ඇගයුම් ක්‍රියාවලියේ දී පුහුණු අවශ්‍යතා හඳුනාගනු ලබන අතර පුහුණු කටයුතු සැලසුම් කෙරෙනුයේ සේවා දැනුම මත පදනම්ව එනම් තාක්ෂණික කුසලතා සහ මෘදු කුසලතා වර්ධනය වන අයුරිනි. තනි පුද්ගල හෝ දෙපාර්තමේන්තුමය අවශ්‍යතා මත විශේෂිත වැඩසටහන් සහ නාමකරණයන් සිදු කෙරේ. ප්‍රතිඵලය ඇගයීම සඳහා පශ්චාත් පුහුණු ඇගයුම් සිදු කෙරේ.

**පුහුණු විෂය පරාසයන්**

- පහසුකම්
- පද්ධති සහ ක්‍රියාවලි
- මෙහෙයුම්
- මූල්‍ය
- තොරතුරු තාක්ෂණ සහ ලේඛනගත නිපුනණතා
- අලෙවිකරණ විමර්ශන සහ විශ්ලේෂණ
- ගැටළු විසඳීම සහ තීරණ ගැනීම
- ණය සහ ගනුදෙනුකාර ඇගයුම්
- යෝජනා පත්‍ර (සැකසීම
- කාර්යාල කළමනාකරණය සහ කාර්යමණ්ඩල හැසිරවීම
- නායකත්ව කුසලතා සහ තීරණ ගැනීම
- ඉදිරිපත් කිරීමේ සහ සන්නිවේදන කුසලතා
- ගනුදෙනුකාර සේවය

පුහුණුව සඳහා ආයෝජනය



## මානව ප්‍රාග්ධනය - ඉදිරිදැක්ම

### කෙටි කාලීනː 2021/22

- නව මානව සම්පත් තොරතුරු පද්ධතිය ක්‍රියාවට නැංවීම ඔස්සේ මානව සම්පත් අංශය ඩිජිටල්කරණය ඇරඹේ.
- කාර්ය මණ්ඩලයේ පුහුණුව සහ සංවර්ධනය අඛණ්ඩව සිදු කෙරේ.
- කාර්ය මණ්ඩලය සඳහා සේවා විස්තර සැකසීම්, සම්පූර්ණ කිරීම සහ ප්‍රධාන කාර්යාලයේ සේවකයින් සඳහා ප්‍රමුඛ කාර්යසාධන දර්ශක සැකසීම
- සේවකයින් හට ස්වයං අධ්‍යයන සඳහා සහ අන්තර්ජාල පදනම මත අධ්‍යයනය සඳහා අධ්‍යයන කළමනාකරණ පද්ධතියේ අන්තර්ගතය වැඩි දියුණු කෙරේ.
- වර්තමාන ව්‍යාපාරික සංකීර්ණතා වලට ගැලපෙන පරිදි කාර්යමණ්ඩලය වෙත ව්‍යුහාත්මක සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ වෙනස්කම්

### මධ්‍ය කාලීන වසර 3

- මානව සම්පත් අංශයේ ඩිජිටල්කරණ කටයුතු අඛණ්ඩව සිදු කිරීම
- වෙනස්වන ව්‍යාපාරික සන්දර්භය තුළ කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය සංශෝධනය කිරීම
- ප්‍රතිලාභ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම
- කුසලතා සංචිතයක් නිර්මාණය කිරීම

### දිගු කාලීන

- බඳවාගැනීම, මාරුකිරීම් සහ සේවා දිගු කිරීම ඇතුළුව සියළුම මානව සම්පත් ක්‍රියාවලියන් නැවත සකස් කිරීම
- විනිවිදභාවයෙන් යුතු ඇගයුම් සහ ප්‍රතිලාභ යෝජනාක්‍රම
- අනුප්‍රාප්තික සැලසුම්කරණය
- අවශ්‍යතා මත පදනම්ව පුහුණුව හා සංවර්ධනය

## මානව ප්‍රාග්ධනය හුවමාරු කිරීම්

### බුද්ධිමය ප්‍රාග්ධනය

- සේවක දැනුම වර්ධනය කිරීම සඳහා පුහුණුව හා සංවර්ධනය කෙරෙහි ආයෝජනය

### මූල්‍ය ප්‍රාග්ධනය

- පුහුණුව කෙරෙහි වන ආයෝජන මගින් මූල්‍ය ප්‍රාග්ධනය අඩුවන නමුත් දිගුකාලීනව වර්ධනය වූ සේවක ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාවය හේතුවෙන් ප්‍රතිලාභ වර්ධනය වේ

### සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

- නව බඳවා ගැනීම් සහ නව රැකියාවන් මගින් සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය වර්ධනය වේ
- ජීවන තත්ත්වය උසස් කරවීමෙහිලා වන සේවක කැපවීම මගින් සමාගමෙහි ප්‍රජා සහභාගීත්වය වර්ධනය වේ
- ස්වයංක්‍රීයකරණය මගින් ඉහළ නංවන ලද ගනුදෙනුකාර සේවාව සහ විශ්වසනීය සේවක අන්තර් ක්‍රියාකාරකම්

### ස්වභාවික ප්‍රාග්ධනය

- පරිසරය සුරැකීම සඳහා වන සේවක කැපවීම මගින් සමාගමෙහි ප්‍රජා සහභාගිත්වය සහ ස්වභාවික ප්‍රාග්ධනය වර්ධනය වේ



කෝවිඩ් 19 වසංගතය අපගේ සියළුම පාර්ශවකරුවන් කෙරෙහි බලපෑවේය. මෙම අසීරු අවස්ථාවේදී අපගේ ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික සහකරුවන්, රජය සහ ප්‍රජාව වෙත සහාය දැක්වීම සඳහා වූ අපගේ කැපවීම ප්‍රශංසනීය විය. මෙම වසරේ එල්ල වූ අභියෝග රැසක් මධ්‍යයේ රජය විසින් නියම කරන ලද සහ අපගේ යෝජනා ක්‍රම ඔස්සේ ගනුදෙනුකරුවන් වෙත සහන සැලසීම, වසංගත කාලය පුරා අඛණ්ඩව සේවා සැපයීම, ආර්ථික පුනර්ජීවනය සඳහා වන රජයේ වැඩපිළිවෙළට දායක වීම, අපගේ සැපයුම්කරුවන් වෙත කලට වේලාවට ගෙවීම් සිදු කිරීම හා ප්‍රජාව සමඟ දිගින් දිගටම කටයුතු කිරීම සිදු කරන ලදී.

350,000 කට අධික ගනුදෙනුකරුවන්

35,000 කට අධික ව්‍යාපාරික සහකරුවන්

රජය සහ නියාමකයින්

දේශීය ප්‍රජාවන්

**ආශ්‍රිත පාර්ශවකරුවන්**
- ගනුදෙනුකරුවන්
- ආයෝජකයින්
- සැපයුම්කරුවන්/ ව්‍යාපාරික සහකරුවන්
- දේශීය ප්‍රජාවන්
- නියාමකයින්

**ක්‍රමෝපායික අරමුණු**
- තිරසාරවර්ධනය පවත්වාගෙන යෑම
- ගණුදනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම
- පාරිසරික සහ සමාජයීය සාධක ඒකාබද්ධකරණය

**අවදානම්**
- කීර්තිනාම අවදානම
- මෙහෙයුම් අවදානම

### 2020/21 සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය හැසිරවීම

- කෝවිඩ් 19 පළමු අදියරේ දී 57,253 ක් (රු. බිලියන 67.96) වෙත පමාසහන පහසුකම් පිරිනමන ලදී
- කෝවිඩ් 19 දෙවන අදියරේ දී 15,722 ක් (රු. බිලියන 25.36) වෙත පමාසහන පහසුකම් පිරිනමන ලදී
- 2020 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා ණණුදෙනුකරුවන්ගේ දඩ පොලිය කපා හරින ලදී
- නිසි කලට ණය පියවීම මගින් වසංගත කාලය පුරා අපගේ සැපයුම්කරුවන්ට සහාය දක්වන ලදී
- සෞඛ්‍ය සහ සමාජ රැකවරණය ඉහළ නැංවීම සඳහා කොවිඩ් 19 අරමුදල වෙත රුපියල් මිලියන 5ක් පරිත්‍යාග කරන ලදී

### සාර්ථකත්වය මැනීම

**වසර 5 තුළ ණය මුදල් ප්‍රදානය**

රු. මිලියන




**තැන්පත්කරුවන් වෙත පොලිය**

රු. මිලියන




**ප්‍රජා සත්කාර ආයෝජනය**

රු. මිලියන




**රජය වෙත ගෙවන ලද බදු**

රු. මිලියන




## ගනුදෙනුකරුවන්

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි විශාලතම ණය සහ ලැබිය යුතු දේ කළඹ වන රුපියල් මිලියන 141,387.91 සහ එම අංශයේ විශාලතම තැන්පතු පදනම වන රුපියල් මිලියන 101,502.93 සමාගම සතු වන අතර ඒ සඳහා 353,414 ක් වන අපගේ ගනුදෙනුකරුවන් දායක විය. අපගේ මව් සමාගම වන මහජන බැංකුවේ සවිබලයෙන් සහ අපගේ ගනුදෙනුකාර වටිනාකම් යෝජනාවලිය ඔස්සේ වසර තුළදී අප විසින් නව ගනුදෙනුකාර සබඳතා විසිපන්දාහකට වැඩි ප්‍රමාණයක් ඇති කරගන්නා ලදී. උත්පාදිත නව ව්‍යාපාරවලින් 30% ක් පමණ නැවත නැවත පැමිණෙන ගනුදෙනුකරුවන් වීම මගින් අපගේ ඉහළ ගනුදෙනුකාර තෘප්තිය විදහා දැක්වේ.

### අපගේ ගනුදෙනුකාර වටිනාකම් යෝජනාවලිය

**මූල්‍ය සේවා වෙත පිවිසුම්**
- දීප ව්‍යාප්ත සේවා සැපයුම් සහ ශාඛා ජාලය
- ශාඛා 104
- සේවා මධ්‍යස්ථාන 99
- මහජන බැංකුවේ ටෙලර් යන්ත්‍ර සහ මුදල් තැන්පතු යන්ත්‍ර පහසුකම්
- පීඑල්සී ඔන්ලයින්

**විවිධ ප්‍රයෝජන සහිත පහසුකම්**
- කල්බදු සහ ණය ඇතුළු ණය ලබා දීමේ පහසුකම්
- තැන්පතු සැලසුම්
- ආන්තික වෙළඳාම
- සාධකකරණය
- ඉස්ලාමීය මූල්‍ය සැලසුම්
- සුරක්ෂිත ඩිජිටල් අත්දැකීම්

**සේවා තත්වයන්**
- සැලසුම් සහ සේවාවන් ලබා ගැනීමේ හැකියාව
- කඩිනම් සේවා සැපයුම
- සුරක්ෂිත හා වෘත්තීයමය වටපිටාවක ගනුදෙනු සිදු කිරීම
- සේවා තත්වය සහ විශිෂ්ටත්වය
- මිත්‍රශීලී සේවය
- ඩිජිටල්කරණය සහ නවතාවය කෙරෙහි ආයෝජන
- දැඩි අනුකූලතා ක්‍රියාදාමයන්
- ඊ මෙමෝ ක්‍රමය ඔස්සේ වඩාත් කඩිනම් සහ ඵලදායි සේවාවක්

**විශ්වාසනීය සබඳතා**
- වටිනා අරමුණු කෙරෙහි යොමු වූ සංස්කෘතික වෙනස්වීම්
- දෙපාර්ශවයටම ප්‍රයෝජන අත් වන දිගුකාලීන සබඳතා නිර්වචන නිර්මාණය වන ආකාරයෙන් ගනුදෙනුකරුවන් හට විශේෂිත වූ මූල්‍ය සේවාවන් ලබාදීම සඳහා අප ඔවුන් වෙත සවන් දී ඔවුන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගන්නෙමු
- වගකීම් සහගත ණය එක්රැස් කිරීම්
- 353,414 ගනුදෙනුකරුවන්
- 30% නැවත පැමිණෙන ගනුදෙනුකරුවන්

**අන්‍යෝන්‍ය වර්ධනය**
- ඔවුන්ගේ මූල්‍යකරණ අවශ්‍යතා වල දී ගනුදෙනුකරුවන් හට සහාය වීම සහ ඔවුන්හට ණය කළමනාකරණ/ආර්ථික කටයුතු නැවත ඇරඹීම සඳහා උපකාර කිරීම
- සිය බැඳීම් ඉටු කිරීමේදී සැබැවින්ම අසීරුතාවලට මුහුණ දෙන ගනුදෙනුකරුවන් සඳහා පොලී ගෙවීම් ප්‍රතිව්‍යුහගත කිරීම
- කලට වෙලාවට ගෙවීම් සිදුකිරීම සඳහා වන ගනුදෙනුකාර කැපවීම මත සමාගමෙහි මූල්‍ය කාර්යසාධනය වර්ධනය වේ

GRI 416-1

මෙම වසර කෝවිඩ් වසංගතයේ බලපෑමට නතුවිය. එහි බලපෑම් හේතුවෙන් අපගේ බොහෝ ගනුදෙනුකරුවන් වෙත අභියෝග එල්ල විය. දීප ව්‍යාප්ත සහ ප්‍රාදේශීය රට වසා දැමීම මධ්‍යයේ අප සමාගම අඛණ්ඩව සේවා සපයන ලද අතර එහිදී අන්තර්ජාලගත සේවා සැපයීම, පමාසහන ලබා දීම, සහන පොලී අනුපාත යටතේ ණය ලබා දීම සහ පැහැරහරින ලද පොලිය කපා හැරීම සහ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සිදු විය.




**කෝවිඩ් 19 වසංගත කාලය තුළ අඛණ්ඩ සේවා සැපයුම සහ ගණුදෙනුකාර සත්කාරය**

කොවිඩ් වසංගත කාලය පුරා සීමිත මට්ටමකින් වුවද අප විසින් අත්‍යාවශ්‍ය සේවාවක් වශයෙන් අඛණ්ඩවම සේවය සපයන ලදී. මෙම කාලසීමාව තුළ දී විශේෂිත කණ්ඩායමක් විසින් ගනුදෙනුරුවන් වෙත කඩිනම් ප්‍රතිචාර දක්වමින් ඔවුන් නිවසේ සිට වැඩ කරන සේවකයින් හා සම්බන්ධ කරන ලදී. ගනුදෙනුකරුවන් සමග සන්නිවේදනය සඳහා සමාගමේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල බෙහෙවින් යොදා ගැනුනි. ගනුදෙනුකරුවන් සඳහා විවෘත කරන ලද ශාඛාවන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද උපදේශ වලට අනුකූලව මෙහෙයවන ලදී.

**අංග සම්පූර්ණසේවා සැපයුම**

අපගේ ශාඛා ජාලය, මව් සමාගම වන මහජන බැංකුවේ ටෙලර් යන්ත්‍ර සහ තැන්පතු යන්ත්‍ර ජාලය සහ පීඑල්සී ඔන්ලයින් ඔස්සේ අංග සම්පූර්ණ මූල්‍ය සේවාවන් සැපයීමට හැකිවිය.

| මූල්‍ය වර්ෂය | ශාඛා ජාලය ඔස්සේ ණය මුදල් ප්‍රදානය | ඩිජිටල් පදනම ඔස්සේ ගනුදෙනු පරිමාව | මහජන බැංකු තැන්පතු යන්ත්‍ර ඔස්සේ ගනුදෙනු පරිමාව |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2019/20 | 70,696.89 | 4,947.90 | - |
| 2020/21 | 50,881.00 | 19,788.04 | 598.51 |

**ගනුදෙනුකරුවන් භූගෝලීය ලෙස වෙන්කිරීම**

| පළාත | තැන්පතුකරුවන් | ණය ගනුදෙනුකරුවන් | ශාඛා | සේවා මධ්‍යස්ථාන |
|---|---|---|---|---|
| මධ්‍යම | 29,222 | 15,306 | 12 | 8 |
| නැගෙනහිර | 14,579 | 5,678 | 8 | 11 |
| උතුරු මැද | 16,126 | 6,637 | 5 | 9 |
| වයඹ | 21,864 | 10,973 | 11 | 9 |
| උතුර | 7,289 | 4,143 | 6 | 10 |
| සබරගමුව | 19,783 | 7,782 | 9 | 12 |
| දකුණ | 34,244 | 17,316 | 15 | 17 |
| ඌව | 23,802 | 8,495 | 6 | 7 |
| බස්නාහිර | 124,410 | 41,443 | 32 | 16 |
| **එකතුව** | **291,319** | **117,773** | **104** | **99** |

*හරස් අලෙවිය පැවතිනි*

තැන්පත්කාර/ණයගැතියන් තොරතුරු




*හරස් අලෙවිය හේතුවෙන් එක් එක් සැලසුම සඳහා මුලු ගනුදෙනුකරුවන් සංඛ්‍යාව සාරාංශගත සංඛ්‍යාවට වඩා පහළ වේ.*

### අපගේ ඩිජිටල් පදනම සවිබලගැන්වීම

සමාජ දුරස්ථකරණය අපගේ එදිනෙදා ජීවිතයේ කොටසක් බවට පත් වූ විට ඉහළ ගිය අන්තර්ජාලගත ගෙවීම් අවශ්‍යතාවය සපුරාලීම සඳහා වසර තුළදී 'PLC Online' වැඩි දියුණු කරන ලදී. රට වසා දැමීම, සංචරණ සීමා සහ වසංගතය බෝවීමේ අවදානම හේතුවෙන් ගනුදෙනුකරුවන් ශාඛාවට පැමිණීමට අකමැත්තක් දක්වන ලද අතර ඔවුනට එසේ කිරීමට ද අසීරු විය. මහජන බැංකු තැන්පතු යන්ත්‍ර සහ SLIP ක්‍රියාවලිය ඔස්සේ ද ගෙවීම් සඳහා පහසුකම් සලසන ලදී. පමාසහන ඉල්ලුම් කිරීමද අන්තර්ජාලය ඔස්සේ සිදු කළ හැකි විය. වසර තුළදී මහජන බැංකු ස්වයං බැංකුකරණ සේවාවන් ඔස්සේ PAY WAY කුලී ගෙවීම් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහයෝගීතාවයෙන් QR කේත ගෙවීමේ පදනම අරඹන ලදී.

| | |
|---|---|
| ඩිජිටල් පහසුකම් සහිත ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 5,336 |
| පෙර වසර සමග සැසඳීමේදී ගනුදෙනුවල වර්ධනය | 62.39 |
| ඩිජිටල් වශයෙන් ක්‍රියාකාරී ගනුදෙනුකරුවන් | 3,486 |
| ඩිජිටල් ගනුදෙනු සංඛ්‍යාව | 238,891 |
| පෙර වසරට සාපේක්ෂව ඩිජිටල් ගනුදෙනුවල වර්ධනය (%) | 54.44 |
| ඩිජිටල් ගනුදෙනු පරිමාව (රු. මිලියන) | 19,788.04 |
| මහජන බැංකු තැන්පතු යන්ත්‍ර ආශ්‍රිත ගනුදෙනු සංඛ්‍යාව | 22,910 |
| තැන්පතු යන්ත්‍ර ආශ්‍රිත ගනුදෙනු පරිමාව (රු. මිලියන) | 598.51 |



ව්‍යවසායක ගණුදෙනුකරුවන් දැනුවත් කිරීම සඳහා ද දකුණු කලාප දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්ව රට පුරාම ලංකා QR ව්‍යාපෘතිය ඔස්සේ කඩිනම් ප්‍රතිචාර QR ගෙවීම් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම.

### අභියෝගාත්මක කාලසීමාවක ගනුදෙනුකරුවන් වෙත පිරිනමන ලද සහන

කෝවිඩ් 19 වසංගතයේ බලපෑමට ලක්වූ වූ පුද්ගලයින් සහ ව්‍යාපාරයන් වෙත රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියම කරන ලද සහන අප විසින් ගනුදෙනුකරුවන් වෙත ලබා දෙන ලදී. එයට අමතරව සමාගම මගින් රජය විසින් නියම කරන ලද පමාසහනය සඳහා සුදුසුකම් නොලද ගනුදෙනුකරුවන් හට ඔවුන්ටම විශේෂිත වූ සහන පැකේජ ලබා දෙන ලදී. 2020 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා අපගේ සියළුම ගනුදෙනුකරුවන්ගේ ණය පහසුකම් මත දඩ පොලී ගෙවීම් කපා හරින ලදී. වසංගතයේ අහිතකර බලපෑමට ලක්වූ තනිපුද්ගල ගනුදෙනුකරුවන්ගේ මුදල් ප්‍රවාහ යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා අප විසින් කල්බදු සහ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කරන ලදී. මගී ප්‍රවාහන සේවාවන් සඳහා, සියළුම ණය/කල්බදු කාණ්ඩයන් සම්බන්ධයෙන් 4% ක සහන පොලී අනුපාතයක් පිරිනමන ලදී.

| | | | |
|---|---|---|---|
| පළමු අදියරේදී පමාසහන 57,253 ක් සහ දෙවන අදියරයේ දී පමාසහන 15,722 ක් | ගණුදෙනුකරුවන්ගේ මුදල් ප්‍රවාහයන්ට ගැලපෙන පරිදි ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම් | මාස නවයක් සඳහා දඩ පොලී කපා හැරීම | මගී ප්‍රවාහන බස් රථ 4,362 ක් සඳහා පොලී සහන ලබාදීම |

### ගණනුදෙනුකාර තෘප්තිය

වසර තුළ දී විධිමත් ගනුදෙනුකාර තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණයක් සිදු නොකරන ලදී. වෙළෙඳපොළ තත්ත්වයන් අවබෝධ කර කරගැනීම සඳහා අප විසින් ශාඛා, ජංගම අධ්‍යාපන ඒකක සහ අන්තර්ජාලය ඔස්සේ පොදු ජනතාව සහ අපගේ ගනුදෙනුකරුවන් සමඟ නිරන්තරයෙන්ම සම්බන්ධතා පවත්වා ගෙන යන ලදී. සැලසුම් සහ සේවාවන් පරාසය, ඵලදායිතාවය සහ තත්ත්වය සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් දක්වන ලද ප්‍රතිචාර ඔස්සේ ඔවුන්ගේ තෘප්තිමත්බව පිළිබඳව අප හට දැනුවත් වන්නට හැකි විය. ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි/දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අංගසම්පූර්ණ මෘදුකාංග පද්ධතියක් සකසන ලද අතර මෙමගින් අප හට සැලසුම්/සේවාවන්, ක්‍රියාවලීන්, ක්‍රියාපටිපාටීන් වැඩිදියුණු කිරීම් සහ අවශ්‍ය අමතර සේවක පුහුණුව පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි විය. ගණුදෙනුකාර පැමිණිලි/ දුක්ගැනවිලි පිළිබඳව තොරතුරු බුද්ධිමය ප්‍රාග්ධනය යටතේ පිටු අංක 65 දැක්වේ.

### අපගේ සැලසුම් සහ සේවා කළඹ

ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ වෙළඳපොලේ පවතින නිරීක්ෂණය කළ හැකි ප්‍රවණතා සහ වර්ධනයන් සැලකිල්ලට ගනිමින් අපගේ සැලසුම් පෙළ සකසනු ලැබ ඇත. අපගේ ණය ලබාදීමේ සැලසුම් කළඹ මෙම වසරේදී ව්‍යාප්ත කරන ලදී. වසංගතයෙන් පසු වහාම ගනුදෙනුකරුවන් මුහුණදුන් මූල්‍ය අසීරුතා සඳහා කඩිනමින් මුදල් ලබා දීමේ අරමුණින් අප විසින් රන් ණය පහසුකම් ද පිරිනමන ලදී. අපගේ සැලසුම් කළඹ පිළිබඳ අංග සම්පූර්ණ ලැයිස්තුවක් පිටු අංක (64) සහ (65) දැක්වේ.

**පීපල්ස් ලීසිං මගින් රජය විසින් නියම කරන ලද පමාසහනය සඳහා සුදුසුකම් නොලද ගනුදෙනුකරුවන් වෙත සුවිශේෂී සහන පැකේජ පිරිනමන ලදී. 2020 අප්‍රියෙල් සිට සැප්තැම්බර් දක්වා අපගේ සියළුම ගනුදෙනුකරුවන්ගේ පැහැර හරින ලද පොලී සඳහා ගෙවීම් කපා හරින ලදී.**

### රෝද තුනේ අතමාරුව

- මෙය ත්‍රිරෝද රථ වෙළෙඳපොළ සඳහා විශේෂයෙන් සකසන ලද ප්‍රවර්ධන සැලසුමකි. එහිදී පීපල්ස් ලීසිං වෙතින් ඔවුන්ගේ ත්‍රිරෝද රථ කල්බදු පහසුකම් ලබා ගන්නා පුද්ගලයින් හට ආරම්භක කල්බදු මුදලින් 10% දක්වා ක්ෂණික පූර්ව අනුමත ණය මුදලක් පිරිනැමේ.

### Wonder Loan "වොන්ඩර් ලෝන්"

- මෙය සම්ප්‍රදායික ණය මුදලක ෆාස්ට් ට්‍රැක් පහසුකමක විශේෂාංග ද්විත්වම ඇතුළත් දෙමුහුම් ණය ක්‍රමයකි. මෙහි අරමුණ වූයේ සම්මත පොලී ගණනයට වඩා පහළ කුලී වාරිකයක් ගනුදෙනුකරුවන් වෙත ලබා දීමයි.

### E-vehicle Auctions (අන්තර්ජාලගත රථ වාහන වෙන්දේසි කිරීම)

ශ්‍රී ලංකාවේ අන්තර්ජාලගත වෙන්දේසි කිරීම් වල පුරෝගාමියෙකු වශයෙන් පීපල්ස් ලීසිං මෙම වසරේදී සාර්ථකව අන්තර්ජාලගත වෙන්දේසි දෙකක් සිදු කරන ලදී. මෙහිදී අප ප්‍රධාන පෙළේ වෙන්දේසිකරුවකු සමග එක්ව පළාත් නවයම කොළඹ ප්‍රධාන වෙන්දේසිය සමග සම්බන්ධ කරන ලදී. ලැයිස්තුගත රථවාහන යහපත් තත්වයෙන් පවතින බවට සහ සුරක්ෂිත සහ විශ්වාසනීය වටපිටාවක් තුල ගනුදෙනු සිදු කෙරෙන බවට තහවුරු කිරීම සඳහා තක්සේරුකරණය සහ සුපිළිපන් බව පරීක්ෂාවන් ස්වාධීන තෙවන පාර්ශවීය සමාගමක් මගින් සිදු කරන ලදී.






අපගේ ගනුදෙනුකරුවන් වෙත ඉන්ද්‍රා ට්‍රේඩර්ස් සමග ඇති කරගත් සහයෝගීතාවය සහ මාලබේ පුංචි කාර් නිවස සහ ෆැමිලි කාර් නිවසෙහි විවෘත කරන ලද අලෙවි කවුලු මගින්ද ප්‍රතිලාභ අත් විය.




කොළඹ මහනුවර සහ අනුරාධපුර "Lease Street" ප්‍රවර්ධන ව්‍යාපෘතිය



දීප ව්‍යාප්ත "Auto-Ex" ප්‍රවර්ධන ව්‍යාපෘතිය




දෙපාර්ශවයටම ප්‍රතිලාභ අත්වන මෝටර් රථ අලෙවිකරන ආයතන සමග උපායමාර්ගික සන්ධානය

මහජන බැංකුව සමග එක්ව පීපල්ස් ලීසිං සහ එහි සහායක සමාගම වන පීපල්ස් ඉන්ෂුවරන්ස් මගින් සියළුම ගනුදෙනුකාර ගෙවීම් සඳහා බහු සේවා මුදල් තැන්පතු යන්ත්‍ර ජාලයක් හඳුන්වා දෙන ලදී.



තැන්පතු යන්ත්‍ර පහසුකම් පිරිනැමීම් සඳහා PAY WAY ව්‍යාපෘතිය දියත් කරන ලදී




ඉන්ද්‍රා ට්‍රේඩර්ස් පුද්ගලික සමාගම සමග උපාය මාර්ගික සන්ධානය

GRI 417-2, 417-3, 419-1

**වගකීම් සහගත, සදාචාර සම්පන්න සහ විනිවිදභාවයෙන් යුතු ව්‍යාපාරයක්**

පීපල්ස් ලීසිං හි අපි අපගේ සැලසුම් සහ සේවාවන් වගකීම් සහගත අයුරින් සැකසීමට කටයුතු කරන්නෙමු. අප විසින් අපගේ පාර්ශවකරුවන් සමග කටයුතු කිරීම ප්‍රමුඛතාවක් සේ සලකමින් සැලසුම් පිළිබඳව ඔවුන්ගේ අදහස් අවබෝධ කර කරගනිමින් අපගේ සැලසුම් සහ සේවාවන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ පොදු කොන්දේසි වලට අනුකූලව සකසනු ලැබේ.

ශ්‍රී ලංකාවේ වෙසෙන බහු සංස්කෘතික ප්‍රජාවන් පිළිබඳව සැලකිල්ලට ගනිමින් අපගේ සැලසුම් තොරතුරු ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන භාෂා තුනෙන් ම ප්‍රකාශයට පත් කෙරේ. ප්‍රජාව සමග මනා අන්තර් ක්‍රියාකාරීත්වයක් සහ සන්නිවේදන ගැටලු අවම කිරීමට සඳහා අප විසින් අදාල ප්‍රදේශයන්ගෙන් බහු භාෂිත සේවකයින් බඳවා ගනු ලැබේ.

වසර තුළදී අනුකූලතාවය පිළිබඳ කිසිදු සැලකිය යුතු සිද්ධියක් වාර්තා නොවූ අතර අපගේ අලෙවි සන්නිවේදන හෝ සැලසුම් හෝ සේවාවන්, ලේබල්කරණය සම්බන්ධයෙන් කිසිදු දඩ මුදලක් හෝ නඩු කටයුත්තක් නොවීය. එමෙන්ම වසර තුළදී ගනුදෙනුකාර රහස්‍යභාවය උල්ලංඝනය කිරීම් හෝ ගනුදෙනුකාර දත්ත අහිමිවීම පිළිබඳ කිසිදු සැලකිය යුතු පැමිණිල්ලක් නොලැබිණි.

ගනුදෙනුකරුවන්ට අවශ්‍ය භාෂාවෙන් නිවැරදි තොරතුරු පැහැදිලිව ඉදිරිපත් කිරීම් අපගේ විනිවිදභාවයෙන් යුතු සැලසුම් කෙරෙහි පාදක වේ.

පීපල්ස් ලීසිං විසින් ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිකුත් කරන ලද සාංගමික පාලනයට අදාල නියෝගයන්හි විධිවිධානයන්ට සහ සැලසුම් හා සේවාවන් සම්බන්ධ අලෙවි සන්නිවේදන පිළිබඳ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරමින් අපගේ සියළු අලෙවි සන්නිවේදනයන් නියාමක ගේ සීමාව තුළ පවතින බවට තහවුරු කරන ලදී. සමාජ ආර්ථික ක්ෂේත්‍රයේ නීතිරීති රෙගුලාසි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කිසිදු සැලකිය යුතු දඩ මුදල්ක්/ මූල්‍ය නොවන සම්බාධක නොවූ අතර රටේ නීති රීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කිසිදු නඩු පැවරීමක් සිදු නොවීය

**පරිසර හිතකාමීත්වය වෙත ගනුදෙනුකරුවන් දිරිගන්වමින්**

ගෝලීය උණුසුම කෙරෙහි රථවාහන විමෝචනයන්හි බලපෑම ගැන අප අපි අවබෝධ කොට ගෙන සිටින්නෙමු. ප්‍රධාන වශයෙන් මෝටර් රථ සඳහා කල්බදු ලබාදීමේ මූල්‍ය සමාගමක් වශයෙන් එවැනි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අප විසින් පහත දැක්වෙන පියවර ගන්නා ලදී. ගනුදෙනුකරුවන් වෙත හරිත සැලසුම් ඉදිරිපත් කිරීම සහ අපගේ ගනුදෙනුකරුවන් කඩදාසි භාවිතයෙන් තොර ඩිජිටල් ගනුදෙනු කෙරෙහි යොමු කිරීම.

GRI 102-9

## ව්‍යාපාරික සහකරුවන්

අපගේ ක්‍රියාකාරකම් නිසි පරිදි පවත්වා ගැනීම සඳහා අපගේ ව්‍යාපාරික සහකරුවන්ගේ දායකත්වය අතිශය වැදගත් වේ. අප සමග කටයුතු කරන බැංකු, දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය ආයතන අපගේ ව්‍යාපාරයෙහි වැදගත් කොටසක් වේ. වැඩි වශයෙන් දක්නට නොලැබෙන සෙසු සේවා සම්පාදකයින් ද මෙහෙයුම්වල අඛණ්ඩත්වය කෙරෙහි එලෙසින්ම වැදගත් වේ.




| | 2020/21 | 2019/20 | Change (%) |
|---|---|---|---|
| ක්‍රියාකාරී ව්‍යාපාරික සහකරුවන් (සංඛ්‍යාව) | 38,890 | 40,910 | (4.94) |
| රථවාහන සැපයුම්කරුවන් (සංඛ්‍යාව) | 31,665 | 32,406 | (2.29) |
| ප්‍රසම්පාදන වියදම - රුපියල් මිලියන | 82,880.45 | 88,788.44 | (6.65) |

### සබඳතා ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යාම

පීපල්ස් ලීසිං සංස්කෘතිය තුළ අපගේ ව්‍යාපාරික සහකරුවන් සමග සබඳතා ගොඩනගා ගැනීම සහ පවත්වා ගැනීම අත්‍යන්තයෙන්ම අන්තර්ගත වේ. දිගු කලක් තිස්සේ සිය ව්‍යාපාරික සහකරුවන් සමඟ සමාගම ගොඩනඟාගත් මනා සබඳතාවයන් කෙරෙහි ක්ෂේත්‍රයේ රෙගුලාසි වෙත අනුකූල වීම සහ නිසි කලට ණය වගකීම් ඉටුකිරීම හේතුවිය. කෝවිඩ් 19 වසංගත සමයේදී පවා, බොහෝ ව්‍යාපාරයන් අහිතකර බලපෑමට ලක් වෙද්දී සමාගම විසින් සැපයුම්කරුවන් වෙත ගෙවීම් නිසි කලට සිදු කරන ලදී. දෙපාර්ශවයටම ප්‍රතිලාභ අත්වන සබඳතා වල පදනම වශයෙන් අදාල සබඳතා වල පවතින විශ්වාසය අප සලකන අතර, එහිදී අභ්‍යන්තර සහ බාහිර ගනුදෙනුකරුවන් වෙත ඵලදායී සහ අඛණ්ඩ සේවාවක් සැපයීමට අප හට හැකි වේ.

අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් උසස් තත්ත්වයේ නිෂ්පාදන අරපිරිමැසුම් ලෙස සහ සදාචාර සම්පන්න ලෙස ලබා ගැනීම සිදු කෙරේ. අප විසින් දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සැපයුම්කරුවන් වෙත අවස්ථා ලබා දුන්නද, අපගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීමේදී සියළුම සැපයුම්කරුවන් සමාන කොට සැලකේ. විවිධ සංගම් සහ ව්‍යාපාර සංවිධාන වල සාමාජිකත්වය ලබා ගනිමින් ක්‍රියාකාරී ලෙස කටයුතු කරමින් අප ව්‍යාපාරික ප්‍රජාව සමග සම්බන්ධ වෙයි.

GRI 102-13

### සංගම් වල සාමාජිකත්වයන්

ක්ෂේත්‍රය තුළ සහ වෙනත් සංවිධානයන්හි අපගේ සාමාජිකත්වයන් මගින් ව්‍යාපාරික ප්‍රජාව තුළ අපගේ නියෝජනය පැහැදිලි වේ. වසර තුළදී, අප විසින් පහත දැක්වෙන සංගම්වල සාමාජිකත්වය දරන ලදී.

- ශ්‍රී ලංකා කල්බදු සංගමය
- ශ්‍රී ලංකා ෆිනෑන්ස් හවුස් සංගමය
- මූල්‍ය ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා
- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයය
- ආන්තික සපයන්නන්ගේ සංගමය
- ජෛව විවිධත්ව ශ්‍රී ලංකා

**සංගම්වල සාමාජිකත්වය පහත දැක්වෙන කරුණු කෙරෙහි දායක විය:**

- සෙසු සාමාජික සමාගම් සමඟ සබඳතා ගොඩනගා ගැනීම සහ සවිමත් කර ගැනීම
- ක්ෂේත්‍රය තුළ එකමුතුව සහ ජාලයන් ගොඩනඟා ගැනීම
- ක්ෂේත්‍රයේ සම්මතයන් ඉහළ නැංවීම සඳහා යහ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය
- සංගම්වල ක්‍රියාකාරකම් වලින් සේවකයින්ට ප්‍රතිලාභ අත්වීම

### ව්‍යාපාරික සහකරුවන් සමග සාධාරණව කටයුතු කිරීම

පීපල්ස් ලීසිං මගින් වාර්ෂික/ද්වි වාර්ෂික පදනමක් මත සිය සැපයුම්කරුවන් ලියාපදිංචි කරනු ලබන අතර සැපයුම්කාර ආචාරධර්ම සංග්‍රහයෙහි සියළුම බැඳීම් තහවුරු කිරීම සඳහා ව්‍යාපාරික සහකරුවන් සමඟ වන සියළුම ගිවිසුම් අධීක්ෂණය කෙරේ. මෙය දිගු කාලීනව දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය සේවා සම්පාදකයින් ඇතුළු ව්‍යාපාරික සහකරුවන් සමඟ සවිමත් සහ සදාචාර සම්පන්න සබඳතා පවත්වාගෙන යාම සඳහා මූලික වේ. අප විසින් ගෙවීම් නිසි පරිදි සිදුකරන බවට තහවුරු කෙරෙන අතර, නිරන්තර සබඳතාවයක් පවත්වාගෙන යමින් වගකීම් සහගත භාණ්ඩ හා සේවා ලබා ගැනීම පිළිබඳ ගැටලු නිරාකරණය කෙරේ.

**පීපල්ස් ලීසිං සංස්කෘතිය තුළ අපගේ ව්‍යාපාරික සහකරුවන් සමග සබඳතා ගොඩනගා ගැනීම සහ පවත්වා ගැනීම අත්‍යන්තයෙන්ම අන්තර්ගත වේ.**

**සැපයුම්කරුවන් තෝරාගැනීම ගැනීම සහ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන ප්‍රතිපත්තියෙහි අරමුණ වනුයේ මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවාවන් අවශ්‍ය තත්වයෙන්, නිසි කලට ලැබෙන බවට තහවුරු කිරීම සහ අදාළ නීති රීති හා කොන්දේසි වලට අනුකූල බවට තහවුරු කිරීමයි. සැපයුම්කරුවන් තෝරාගැනීම විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියකි.

පීපල්ස් ලීසිං මගින් සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පහත දැක්වෙන ක්‍රියාපටිපාටිය අනුගමනය කෙරේ;

- දේශීය වශයෙන් පවතින අමුද්‍රව්‍ය
- තත්ත්ව විශේෂතා
- පිරිවැය තරගකාරීත්වය
- නිසි කලට සැපයීම
- විශ්වාසනීය බව
- අනුගත වීමේ හැකියාව
- විශේෂඥ භාවය සහ පළපුරුද්ද
- ධාරිතාව
- අදාළ නීති රීති හා කොන්දේසි සමග අනුකූල වීම
- බලපත්‍රකරණ අවශ්‍යතා, සහතිකත්වයන් සහ සම්මතයන්
- අමුද්‍රව්‍ය ලබා ගැනීමේදී තිරසාර ක්‍රියාකාරකම්
- පාරිසරික සහ සාමාජීය තත්වයන්ට අනුකූල වීම
- සාධාරණ ශ්‍රමික කළමනාකරණ ක්‍රියාකාරකම්

රථ වාහන, උපකරණ, තොරතුරු තාක්ෂණ දෘඩාංග සහ මෘදුකාංග වැනි ප්‍රධාන පෙළේ ප්‍රසම්පාදනයන් ප්‍රධාන කාර්යාලයේ පිහිටි සැපයුම් අංශය මගින් සිදු කෙරේ. සුළු ප්‍රසම්පාදනයන් ශාඛාව/දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ. ස්වාධීන තාක්ෂණික ඇගයුම් කමිටුවක් මගින් ඉහත ක්‍රියාපටිපාටිය මත පදනම්ව සැපයුම්කරුවන් තෝරා ගැනෙන අතර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මෙහෙයුම් විසින් සභාපතිත්වය දරන සහ කළමනාකාරීත්ව කමිටුවේ සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ටෙන්ඩර් මණ්ඩලයක් මගින් අදාල තෝරාගැනීම් වලංගු කෙරේ.

**සැපයුම්කාර පරීක්ෂාව සහ තෝරාගැනීම**

ප්‍රධාන කාර්යාලය

ශාඛා මට්ටමින්
ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණය යටතේ සහ අනුමත සීමා ඇතුළත

මිලකැඳවුම් සඳහා ඉල්ලීම
දැනට සිටින සහ ඇතුළත් වන සැපයුම්කරුවන්

ඇගයුම
ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය මත පදනම්ව

සැපයුම්කරුවන් ලියාපදිංචිය
නිරන්තර මිලදී ගැනීම් සඳහා ද්වි වාර්ෂික
නිරන්තර නොවන මිලදී ගැනීම් සඳහා වාර්ෂික

**ප්‍රසම්පාදනය**

ප්‍රධාන ප්‍රසම්පාදන

ශාඛා මට්ටමේ
පරිභෝජන භාණ්ඩ

**තොග පවත්වා ගැනීම සහ නිකුත් කිරීම**

e rims* ඔස්සේ

**අඛණ්ඩ අධීක්ෂනය සහ පද්ධති වැඩිදියුණු කිරීම**

පීපල්ස් ලීසිං සිය බොහෝ සැපයුම් දේශීය සැපයුම්කරුවන්ගෙන් ලබා ගනියි. එහිදී මෙරට ස්ථාපිත දේශීය සැපයුම්කරුවන් වෙත ප්‍රමුඛත්වය හිමි වේ. විදේශීය සැපයුම්කරුවන් යොදා ගනු ලබන්නේ දේශීය සැපයුම්කරුවන් අදාල ප්‍රසම්පාදන විශේෂතා සඳහා අසමත් වන අවස්ථාවලදීය.

GRI 414-1

**සැපයුම්කරුවන් සම්බන්ධ පාරිසරික සහ සාමාජයීය ඇගයුම්**

අපගේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය මගින් ප්‍රසම්පාදනයන්හි පවතින පාරිසරික සහ සමාජයීය අවදානම් සැලකිල්ලට ගැනේ. ලියාපදිංචිය සිදුකරනු ලබන අවස්ථාවේදී, සැපයුම්කරුවන් බැහැර කිරීමේ ලැයිස්තුවක් යටතේ ඇගයීමට ලක් කෙරේ. සම්මුඛ පරීක්ෂණ සහ ක්ෂේත්‍ර චාරිකාවන් ඔස්සේ සැපයුම්කරුවන් නිශ්චය කිරීම සිදු කෙරේ. පාරිසරික හා සමාජයීය තත්ත්වයන් ඇතුළුව අවශ්‍ය සම්මතයන්ට අනනුකූල වීම, අදාල සැපයුම්කරුවා සමාගමෙහි සැපයුම්කාර ලැයිස්තුවෙන් ඉවත් කිරීම කෙරෙහි හේතු වේ. 2020/21 සැපයුම් දාමය තුල පාරිසරික සහ සාමාජීය ගැටලු පිළිබඳ අනනුකූලතාවයන් කිසිවක් නොවීය.

## රජය

කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් ආර්ථිකය කෙරෙහි ඇතිවූ අහිතකර බලපෑම සමගින්, පීපල්ස් ලීසිං, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව සිය ගනුදෙනුකරුවන් වෙත ණය සහ කල්බදු මත පමාසහනයන් ලබාදෙමින් සහ දිගු කරමින්, සහන පොලී අනුපාත යටතේ ණය ලබා දෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව වසර පුරා අඛණ්ඩව මෙහෙයුම් සිදු කරමින් රජයේ ආර්ථිකය යළි නගා සිටුවීමේ වැඩ පිළිවෙළට දායක විය. වසර තුළදී අප විසින් බදු වශයෙන් රජයට රුපියල් මිලියන 4,203.03 ක් ගෙවන ලද අතර එය පිටු අංක 202 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 7.8 හි ඉදිරිපත් කෙරේ.

| රජය වෙත නිර්මාණය කරන ලද වටිනාකම් | |
|---|---|
| 2021 මාර්තු (31) දිනට භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වැනි රජයේ සුරැකුම් වල රුපියල් මිලියන 6,994.21 ක් ආයෝජනය<br>කෝවිඩ් 19 බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාරයන් වෙත සහන ලබාදෙමින් රජයේ ව්‍යාපෘතීන් වෙත සහාය දැක්වීම.<br>කෝවිඩ් 19 සෞඛ්‍ය සත්කාරක සහ සමාජ සුරක්ෂිතතා අරමුදල වෙත රුපියල් මිලියන 5ක් පරිත්‍යාග කිරීම | අධ්‍යාපනය සහ සෞඛ්‍ය ආශ්‍රිත යටිතල පහසුකම් සහ පහසුකම් ලබාදීමේදී රජයේ ආයතන සමග එක්ව කටයුතු කිරීම (වැඩි විස්තර පිටු අංක 87 සිට 89 දක්වා ඉදිරිපත් කෙරේ.)<br>වසර තුළදී රුපියල් මිලියන 4,203.03 ක් බදු වශයෙන් ගෙවා ඇත. |
| **රජය විසින් නිර්මාණය කරන ලද වටිනාකම** | |
| රජයේ කොටස් හිමි හිමිකාරීත්වය | ණය රේඛාවන් සහ ණය ප්‍රාරක්ෂණය වැනි රජය විසින් පිරිනමන ලද මූල්‍ය සහාය |

**e-rims යනු සැපයුම් අංශයෙන් සැපයුම් ඉල්ලා සිටීම සඳහා භාවිත කෙරෙන අන්තර්ජාලගත පද්ධතිය වේ.*

GRI 413-1

## ප්‍රජාව

ප්‍රජාව වෙත අපගේ වටිනාකම් සමුදාය දෙයාකාර වෙයි. මූල්‍ය සමාගමක් වශයෙන්, අප විසින් මූල්‍ය සේවා සැපයීම, මූල්‍යමය අන්තර්ග්‍රහණය, ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම සහ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම මගින් ප්‍රජාවෙහි සහ රටේ ප්‍රගතිය කෙරෙහි දායක වනු ලැබේ. උපායමාර්ගික පරාර්ථකාමීත්වය කෙරෙහි වන අපගේ කැපවීම තුළ ව්‍යවසාය ගොඩනැගීම්, අධ්‍යාපනය සංවර්ධනය සහ පොදු සෞඛ්‍ය සත්කාරක සේවාවන් වැඩි දියුණු කිරීම ඇතුළත් වේ. කෝවිඩ්19 වසංගත තත්ත්වය හේතුවෙන් උද්ගත වූ සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු නිසා අපගේ කාර්යමණ්ඩලය විසින් සිදුකරන ලද ස්වේච්ඡා සේවාවන්හි පහළ යාමක් සිදු වුව ද, ප්‍රජාව වෙත පමණක් රුපියල් මිලියන 17.60 ක පිරිවැයක් දරමින් අඛණ්ඩවම අපගේ ප්‍රජා සත්කාරක සේවාවන් සිදු කිරීමට අපට හැකිවිය.

| ප්‍රජාව වෙත නිර්මාණය කරන ලද වටිනාකම් | |
|---|---|
| **වර්ධනය කෙරෙහි සහාය වීම:**<br>○ මූල්‍ය සේවා ලබාදීම - ශාඛා ජාලය, සේවා මධ්‍යස්ථාන සහ පීඑල්සී මාර්ගගත ක්‍රමය ඔස්සේ<br>○ මූල්‍යමය අන්තර්ග්‍රහණය - විශේෂිත, මිත්‍රශීලී සහ පහසු මූල්‍ය විසඳුම් සමගින් විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ පුද්ගලයින් සහ ව්‍යාපාරයන් සවිබලගැන්වීම<br>○ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම- විශේෂයෙන්ම වසංගතයේ බලපෑමට ලක්වූ, සැබෑ මූල්‍ය අසීරුතා සහිත ගනුදෙනුකරුවන් හට නම්‍යශීලී සහ විකල්ප ගෙවීමේ ක්‍රම හඳුන්වාදීම<br>○ මූල්‍ය සාක්ෂරතාව - දිවයින පුරා ජංගම අධ්‍යාපන ඒකක ඔස්සේ ප්‍රජා සත්කාරයන් වශයෙන් වැඩසටහන් පවත්වන ලදී. කෝවිඩ්19 වසංගතය හේතුවෙන් ශාඛා කාර්යාලවල තිරයන් සහ සමාජ මාධ්‍ය උපයෝගී කර ගනිමින් ඒවා පැවැත්විණි | **උපාය මාර්ගික පරාර්ථකාමීත්වය**<br>○ ව්‍යවසාය නිපුණතා සංවර්ධනය සහ මූල්‍ය සාක්ෂරතා ප්‍රවර්ධනය - රුපියල් මිලියන 0.3<br>- අඩු ආදායම්ලාභී තරුණයින් හට හරිත මෝටර්රථ තාක්ෂණ ආයතනයේ ඩිප්ලෝමාවක් ලබා ගැනීම සඳහා වෘත්තීය පුහුණු ශිෂ්‍යත්ව ලබාදීම<br>○ අධ්‍යාපනය ඉහළ නැංවීම - රුපියල් මිලියන 10.24<br>- සෙනෙහස අධ්‍යාපනික ශිෂ්‍යත්ව ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම<br>- පශ්චාත් කොවිඩ් 19 පාසල් යටිතල පහසුකම් ඉදිකිරීම සඳහා ලබාදීම<br>○ ඉටුකම කොවිඩ් 19 සෞඛ්‍ය හා ආරක්ෂණ අරමුදල වෙත රුපියල් මිලියන 5 ක් පරිත්‍යාග කිරීම<br>○ රජයේ රෝහල්වල කෝවිඩ් 19 ප්‍රතිකාර ඉහළ නැංවීම කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම<br>- මහනුවර ජාතික රෝහල වෙත රැහැන් රහිත වෙදනලා පිරිනැමීම<br>- ත්‍රිකුණාමලය රෝහල වෙත අධූරක්ත උෂ්ණත්වමාන පිරිනැමීම<br>- නැගෙනහිර කොළඹ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය සඳහා අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ පිරිනැමීම |

### ප්‍රජා මූලික වැඩසටහන්

**හරිත මෝටර්රථ තාක්ෂණ පාඨමාලාව සඳහා අඛණ්ඩව වෘත්තීය පුහුණු ශිෂ්‍යත්ව**

සමාගම මගින් කණ්ඩායම් හයකින් ආර්ථික අසීරුතා සහිත තරුණයින් විසිඑක් දෙනෙකු වෙත වෘත්තීය අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාම සඳහා වයඹ තාක්ෂණ විද්‍යාලය සමග එක්ව හරිත මෝටර් රථ පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යත්ව පිරිනමන ලදී. මෙහි සමස්ත පිරිවැය රුපියල් මිලියන 1.9ක් වන අතර 2020/21 සඳහා පිරිවැය රුපියල් මිලියන 0.11කි.






**ප්‍රණාමය**

ආර්ථික අපහසුතා සහිත පවුල්වල තරුණයින්ට අප හා එක්ව සහායවීමට පීපල්ස් ලීසිං ඉදිරිපත් වීම ගැන මා ඉතා සතුටට පත්වෙනවා. මෙහිදී තරුණයින් දහසය දෙනෙක් සාර්ථකව පාඨමාලාව නිම කළ අතර දහතුන් දෙනෙක් මේ වන විට කීර්තිමත් සේවා ස්ථානයන්හි ප්‍රායෝගික පුහුණුව ලබනවා. මෙම විද්‍යාලය මගින් ඔවුන්ට සිය වෘත්තීය ජීවිතය ඇරඹීම සඳහා අධ්‍යාපනයක් ලබා දෙනවා. මෙම ශිෂ්‍යත්වය නොවන්නට මේ තරුණයන් අතරින් බොහෝ දෙනෙක් රැකියා විරහිත පුද්ගලයින් වන්නට ඉඩ තිබුණා. අපගේ විශ්වාසය වන්නේ මෙහිදී සමාගම මගින් තරුණ පෙළට රැකියා දීම සඳහා සහාය වීම මෙන්ම ශ්‍රී ලංකාවේ හරිත මෝටර් රථ ක්ෂේත්‍රයක් බිහි කිරීම සඳහා අවශ්‍ය පුහුණු කාර්මිකයන් බිහි කිරීමද සිදුවන බවයි. මෙම දායකත්වය සම්බන්ධයෙන් අප පීපල්ස් ලීසිං වෙත ප්‍රණාමය පුද කරනවා.

**ආර් ඒ ආර් ආර් රන්වැල්ල මහත්මිය**
*රෙජිස්ට්‍රාර්, වයඹ තාක්ෂණ විද්‍යාලය*

**ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මූල්‍යාධාර සහය සපයන ලදී**

පීපල්ස් ලීසිං මගින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමග එක්ව ව්‍යාපාර ඇරඹීම සඳහා මූල්‍ය සහය සපයන ලදී. මෙහිදී මූල්‍ය පරිත්‍යාග සඳහා ව්‍යාපාර සැලසුම් විසි එකක් තෝරා ගැනුනි. විමර්ශනයට ලක් වන වසර තුළදී සමාගම මගින් රුපියල් මිලියනයක ආයෝජනයක් සිදුකරන ලද අතර සමස්ත ආයෝජනය රුපියල් මිලියන 1.6 කි.



**ප්‍රණාමය**

පාසල් අධ්‍යාපනයෙන් පසු මා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවසාය සහ ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව සඳහා ඇතුළත් වුණා. පීපල්ස් ලීසිං සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය එක්ව සංවිධානය කළ ව්‍යාපාර ආරම්භ කිරීම පිළිබඳ කෙටි පාඨමාලාවේ ප්‍රතිලාභියෙකු වුනෙමි. මෙහිදී පාඨමාලාවේ අවශ්‍යතාවලින් කොටසක් වශයෙන් මා විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, ගොවීන් සහ ස්වයං රැකියාවල නියුතු වූවන් හට ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා වෙළෙඳපොළ සොයා ගැනීමේ ක්‍රමවේදයක් මාගේ ව්‍යාපාර සැලසුම තුළ නිර්මාණය කළා. මාගේ පියා ද ගොවියකු වන අතර ඔවුන්ගේ නිෂ්පාදන විකුණා ගැනීමේ දී ගොවීන් අත්විඳින ගැටලු මා දැක තිබෙනවා. පීපල්ස් ලීසිං සිදුකරන ලද ප්‍රදානයට ස්තූති වන්නට ගොවීන් සහ සැපයුම්කරුවන් සම්බන්ධ කරන අන්තර්ජාලගත පදනමක් හඳුන්වාදීමට හැකි වුණා. වසංගත කාලය තුළ එළවළු සඳහා ඉල්ලුම ඉහළ ගිය අතර මෙහිදී මා හට ගොවිපළේ සිට පාරිභෝගිකයාගේ නිවසට භාණ්ඩ ලැබෙන පරිදි ක්‍රමයක් සැකසීමට හැකිවුණා. මෙම පදනම සමග සම්බන්ධ වූ ප්‍රකට ආයතනයක් සමග එක්ව කුළුබඩු අපනයනයට ද මා යොමු වුණා. අද වනවිට මා තනි පුද්ගල ව්‍යාපාරයක හිමිකරුවෙක් මෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් ආරම්භ කරන ලද 'අවර්ස්' සුපිරි වෙළඳසලට ද පහසුකම් සලසන අතර එය ශ්‍රී ලංකික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට හා දේශීය ව්‍යවසායකත්වය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යවසායක දෙපාර්තමේන්තුවේ ව්‍යවසායකත්ව සහ නවෝත්පාදන මධ්‍යස්ථානය මගින් පිහිටුවන ලද්දකි. මා හට සාර්ථක ව්‍යවසායකයකු වීම සඳහා මගපෑදීම සම්බන්ධයෙන් මා සරසවියට සහ පීපල්ස් ලීසිං සමාගමට ස්තූතිවන්ත වෙනවා.

**සුමේධ ලක්මාල් බණ්ඩාරනායක මහතා**
*ව්‍යවසායක, ගල්ගමුව*

**සෙනෙහස අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම**

සමාගම මගින් සිය විසි වෙනි සංවත්සරය සමරමින් 2017 දී හඳුන්වාදෙන ලද සෙනෙහස අධ්‍යාපන වැඩසටහන වෙත අඛණ්ඩව දායකත්වය දක්වන ලදී. අවශ්‍යතා ඇගයුමක් මත පදනම්ව, මාර්ගස්ථ අධ්‍යාපනය හැදෑරීම සඳහා සුදුසු විද්‍යුත් උපකරණයක් නොමැති සෙනෙහස ශිෂ්‍යත්වලාභී සිසුන් පනස් තුන්දෙනෙකු වෙත රුපියල් මිලියන 1.19 ක පිරිවැයක් දරා ටැබ් උපාංග පිරිනමන ලදී.




**ප්‍රණාමය**

මා හට සාමාන්‍ය පෙළ අධ්‍යාපනය නිම කිරීමට හැකි වූයේ මෙම ශිෂ්‍යත්වය නිසයි. එහිදී මම විශිෂ්ට සාමාර්ථ නවයක් ලබාගත්තා. මේ වන විට මම කොළඹ උසස් පාසැලක ගණිත අංශයෙන් උසස් පෙළ හදාරනවා. වසංගත තත්ත්වය නිසා මාගේ පන්ති පැවැත්වෙන්නේ මාර්ගගත ක්‍රමය ඔස්සේ. මා මෙතෙක් අධ්‍යාපනය ලැබුවේ මාගේ පියාගේ දුරකථනය යොදා ගෙනයි. මෙම පරිත්‍යාගයත් සමග මට දැන් බාධාවකින් තොරව මගේ අධ්‍යාපන කටයුතු කරගත හැකියි.

හංවැල්ල ප්‍රදේශයේ අවුරුදු 18 හැවිරිදි ශිෂ්‍යත්වලාභි ශිෂ්‍යයෙක්

සමාගම මගින් කොවිඩ් වසංගත කාලසීමාව තුළ සෞඛ්‍ය සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා සහය පිරිනමන ලදී



**ප්‍රණාමය**

අපගේ රෝහල, සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කෝවිඩ් 19 රෝගීන් සඳහා නේවාසික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් වශයෙන් නම්කොට තිබෙනවා. මේ වන විට ළමා සහ ගර්භනී සැත්කම් සමගින් කෝවිඩ් ආසාදිත බරපතළ රෝගීන් භාරගන්නා ප්‍රධාන මධ්‍යස්ථානය වන්නේ අපගේ රෝහලයි. අදාළ වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීම සඳහා දැඩි සත්කාර ඒකකය වෙත එකෝ යන්ත්‍රයක් පිරිනමමින් සිදුකරන ලද සත්කාරය පිළිබඳව අප සමාගම වෙත ස්තූතිය පල කරනවා.

**වෛද්‍ය ප්‍රියන්ත කරුණාරත්න මහතා**
*(MBBS. MSc. MD)*
*වෛද්‍ය අධ්‍යක්ෂක පරිපාලනය පිළිබඳ උපදේශක*
*අධ්‍යක්ෂක - නැගෙනහිර කොළඹ මූලික රෝහල*

**පශ්චාත් කෝවිඩ් පාසැල් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහාය වීම**

අධ්‍යාපන අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ, පීපල්ස් ලීසිං සමාගම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කොවිඩ් වළකාගැනීමේ උපදෙස් අනුව පාසැල් 21ක කොවිඩ් සූදානම ඉහළ නැංවීම සඳහා දායක විය. පාසැල් පැවැත්වෙන අතරතුර කොවිඩ් ආසාධිත බවට හඳුනාගන්නා සිසුන් තාවකාලිකව හුදෙකලා කිරීම සඳහා අවශ්‍ය ගිලන් පහසුකම් සහිත කාමරයක් සකස් කරගැනීම සඳහා සහ අත්සේදීමේ පහසුකම් සකස් කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍යාධාර අදියර දෙකක් යටතේ පාසල් විසි එකක් වෙත සපයන ලද අතර එහිදී අපගේ ආසන්නතම ශාඛා කාර්යාලයන්ගේ සහය ඇතිව සංවර්ධන කටයුතු සිදුකරන ලදී.





**ප්‍රණාමය**

කෝවිඩ් 19 වසංගතය තත්ත්වය හමුවේ සාමාන්‍ය පරිදි පාසල් යළි විවෘත කිරීම සඳහා රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව කෝවිඩ් සූදානම අවශ්‍ය වේ. එහිදී අප වෙත සෞඛ්‍ය කාමරය නවීකරණය කොට පාදයෙන් ක්‍රියාත්මක වන අත් සේදීමේ යන්ත්‍ර ලබාදීම පිළිබඳව පීපල්ස් ලීසිං සමාගම වෙත අපගේ ස්තුතිය හිමි වෙනවා. ඔබගේ ප්‍රජා සත්කාරක කටයුතු සාර්ථක වේවා යැයි ප්‍රාර්ථනය කරනවා.

**එම් එල් ඩී ජයදේව මහතා**
*විදුහල්පති*
*දෙබරවැව ජාතික පාසල*

**මහරගම අපේක්ෂා රෝහලේ වාට්ටු ප්‍රතිසංස්කරණය**

අප සමාගමේ මගපෙන්වීම සහ මූල්‍ය දායකත්වය යටතේ අපේක්ෂා රෝහලේ මින් මැදුර නඩත්තු කිරීම් අඛණ්ඩව සිදුකරන ලද අතර ඊට අමතරව පිරිමි වාට්ටු 3 සහ 4, 15-B, 16 ළමා වාට්ටුව රුපියල් මිලියන 1.49 ක වියදමින් ප්‍රතිසංස්කරණය කරන ලදී.





**ප්‍රණාමය**

අපගේ රෝහලේ 3 සහ 4 පිරිමි වාට්ටුව ප්‍රතිසංස්කරණය වෙනුවෙන් අප පීපල්ස් ලීසිං සමාගමට ස්තුතිය පුද කරනවා. අප වෙත මුළු දිවයිනෙන්ම රෝගීන් පැමිණෙන අතර ඉහළම ඇඳන් සංඛ්‍යාව වන හැටක් අප සතුව පවතිනවා. අපගේ රෝගීන් සති තුනේ සිට මාස තුනක කාලයක් දක්වා රේඩියෝතෙරපි සහ කීමොතෙරපි ප්‍රතිකාර ලබනවා. පසුගිය වසර පහක් පුරා මෙම වාට්ටුව ප්‍රතිසංස්කරණය හෝ තීන්ත ආලේපනය සිදුකොට නැහැ. නමුත් වර්තමානය වනවිට පරිත්‍යාග කරන ලද ගෘහ භාණ්ඩ සමගින් රෝගී කළමනාකරණ ක්‍රියාවලිය කඩිනම් වෙනවා. නව ශීතකරණය සමගින් පිළිකා රෝගීන් සඳහා වන කිරි සහ පළතුරු වර්ග නිසි පරිදි ගබඩා කළ හැකි වෙනවා.

**බන්දුල හේරත් මහතා**
*වාට්ටු භාර නිලධාරී - වාට්ටු 3 සහ 4*
අපේක්ෂා රෝහල මහරගම



**ප්‍රණාමය**

ළමා වාට්ටුව 15-B බෙහෙවින්ම ලියුකේමියා රෝගයෙන් පීඩා විඳින ළමුන් තිස් දෙනෙකුට පමණ නේවාසික ප්‍රතිකාර සපයනවා. රෝගය නිසා ඇතිවන පීඩනය සහ ඔවුන්ගේ කෙළිලොල් බව හේතුවෙන් තුන්වැනි මහලේ පිහිටි මෙම 15-B වාට්ටුවෙන් දරුවන් ඇද වැටීමේ අවදානමක් පවතිනවා. ඒ සඳහා නිසි ආරක්ෂණ පියවර බොහෝ කලක සිට අවශ්‍යව පැවතියා. අපගේ ඉල්ලීම අනුව පීපල්ස් ලීසිං මගින් මෙම දරුවන් වෙත මනා වාතාශ්‍රය සහ ආරක්ෂාව ලබාදෙමින් අත් වැටවල් සහ ජනෙල් රාමු ස්ථාපනය කරන ලදී.

**ඩබ්ලිව් ඒ ඒ ඩී එස් කුමුදුනි මහත්මිය**
*හෙද නිලධාරිනි, ළමා වාට්ටුව 15-B*
*අපේක්ෂා රෝහල*

## සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය - ඉදිරිදැක්ම

### කෙටි කාලීන: 2021/22

- අපගේ සැලසුම් සහ සේවාවන් ඩිජිටල්කරණය කරමින් සහ අපගේ ඩිජිටල් මූල්‍ය විසඳුම් භාවිත කිරීම සඳහා ගනුදෙනුකරුවන් දිරිගන්වමින් අප විසින් අඛණ්ඩවම ව්‍යාපාරයන් සහ ජීවනෝපායන් සවිබල ගන්වන ලදී
- ලියාපදිංචියේ දී අභ්‍යන්තරව සකසන ලද පරික්ෂා ලැයිස්තුවක් ඔස්සේ අඛණ්ඩව අපගේ සැපයුම්කරුවන් ඇගයුමට ලක් කරන ලදී
- පොදු යටිතල පහසුකම් සහ සේවාවන් සංවර්ධනය සම්බන්ධයෙන් වසංගතය වෙත ජාතික සූදානම සහ ප්‍රතිචාරය කෙරෙහි දායක විය

### මධ්‍ය කාලීන: වසර 3

- අප සමග සතුටුදායක ගනුදෙනුකාර අත්දැකීමක් උදෙසා ගනුදෙනුකාර කේන්ද්‍රීය නව හඳුන්වාදීම් සිදු කිරීම
- වගකීම් සහගත භාණ්ඩ හා සේවා ලබා ගැනීම තහවුරු කිරීම උදෙසා සැපයුම්කාර ආචාර ධර්ම සංග්‍රහයක් සමගින් පරිපූර්ණ සැපයුම්කාර කළමණාකරන ආකෘතියක් හඳුන්වාදීම
- ජාතික ප්‍රමුඛතා හඳුනාගනිමින් වඩාත් තිරසාර විසඳුම් ලබාදීම සඳහා රජය, අධ්‍යයන ආයතන, ප්‍රජා මූල සංවිධාන සමඟ වැඩි වැඩියෙන් සහයෝගීතාවයන් ඇති කරගැනීම

### දිගු කාලීන

- නිවැරදි මානව සහ ස්වයං සේවා මිශ්‍රය ඔස්සේ විශ්වාසනීය ගනුදෙනුකාර අන්තර් ක්‍රියාකාරකම් තහවුරු කිරීම
- තිරසාර ක්‍රියාපටිපාටියක් මත සැලකිය යුතු සැපයුම්කරුවන් වෙත පිවිසෙමින් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ ක්‍රියාවලිය වෙත සහය දැක්වීම
- දේශීය ප්‍රජාවන් සමග සබඳතා සවිමත් කරමින් සදාචාර සම්පන්න සහ වගකීම් සහගත ව්‍යාපාරික වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා වටිනාකම් මත පදනම් වූ සංස්කෘතියක් සහ වැඩ කිරීමේ නව ක්‍රම හඳුන්වාදීම

## සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය - වෙළඳ කටයුතු

### මූල්‍ය ප්‍රාග්ධනය

- ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික සහකරුවන් මෙන්ම දේශීය ප්‍රජාවන් සමග සබඳතා වර්ධනය කරගැනීමේදී සම්පත් භාවිත කරන බැවින් මූල්‍ය ප්‍රාග්ධනය පහළ යයි

### නිෂ්පාදිත ප්‍රාග්ධනය

- වර්ධනය කරන ලද ඩිජිටල් සේවාවන් සමගින් භෞතික ශාඛාවන්හි අවශ්‍යතාවය පහත හෙලීම

### මානව ප්‍රාග්ධනය

- විශ්වාසනීය, සුරක්ෂිත සහ වගකීම් සහගත ගනුදෙනුකාර සේවාවක් ලබාදීම සඳහා ඉහළ කුසලතාවයෙන් යුතු කාර්යමණ්ඩලය

### බුද්ධිමය ප්‍රාග්ධනය

- ව්‍යාපාරික තිරසාරත්වය උදෙසා වඩාත් යහපත් වටිනාකම් නිර්මාණය සහ පාර්ශවකරුවන්ගේ සබඳතා

### ස්වභාවික ප්‍රාග්ධනය

- දුරස්ථ සේවාවන් මගින් පරිසරය වෙත අඩු මෙහෙයුම් බලපෑම



සංචරණ සීමා, සෞඛ්‍ය හා සුරක්ෂිතතා ගැටලු සහ ආර්ථික පසුබෑස්මක් මධ්‍යයේ වුවද, අප විසින් පාරිසරික වශයෙන් වගකීම් සහගත සමාගමක් ලෙස අපගේ පරිසර හිතකාමී ව්‍යාපෘතීන් අඛණ්ඩවම දියත් කරන ලදී. මෙම වසරේදී සීමිත මෙහෙයුම්, කඩදාසි රහිත ක්‍රියාවලි සහ අවම ඉන්ධන භාවිතය හේතුවෙන් අපගේ පාරිසරික පතුල් සටහන පහළ ගියේය. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශකත්වයෙන් සහ ආයතනික කළමනාකාරීත්වයේ නායකත්වයෙන් යුතුව, සියළුම කාර්යමණ්ඩල මට්ටම් තුළ පාරිසරික තිරසාරත්වය ප්‍රචලිත කෙරුණු අතර, වගකීම් සහගත මූල්‍යකරණය ඔස්සේ ස්වභාවික පරිසරය සුරැකීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක විය.



හරිත දැනුවත් කිරීම්

හරිත මෙහෙයුම්

වගකීම් සහගත මූල්‍ය

හරිත ප්‍රජා සත්කාරයන්

| අදාල පාර්ශවකරුවන් | උපායමාර්ගික අවශ්‍යතා | අවදානම් |
|---|---|---|
| සේවකයින්<br>ගනුදෙනුකරුවන්<br>සැපයුම්කරුවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන්<br>දේශීය ප්‍රජාවන් සහ පරිසරය | පාරිසරික හා සමාජයීය සාධක ඒකාබද්ධකරණය | කීර්තිනාම අවදානම<br>කාලගුණ වෙනස්වීමේ අවදානම<br>විභව නියාමක අවදානම<br>අනුකූලතා අවදානම |

### 2020/21 ස්වභාවික ප්‍රාග්ධනය හැසිරවීම




කාබන් පතුල කෙරෙහි සවිඥානක ක්‍රියාකාරීත්වය හා මෙහෙයුම්වල ප්‍රතිඵලයක් වශයෙන් කාබන් පතුල් සටහන 34.94% කින් අඩුකිරීමට හැකිවූ අතර එය 2,365.04t$CO_2$e කට සමාන වේ.

අපගේ කැපවීම මධ්‍යයේ වුවද, වසංගත තත්ත්වය හේතුවෙන් හරිත මූල්‍යකරණය 37.43% කින් පහත වැටුනි.

ඉහළ නංවන ලද කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රියකරණය හේතුවෙන් A4 කඩදාසි කට්ටල 32% කින් ඉතිරි කරගත හැකි විය.

**22,910ක මුදල් තැන්පතු යන්ත්‍ර ආශ්‍රිත කඩදාසි රහිත ගනුදෙනු භාවිතය නිසා 2020 ඔක්තෝබර් සිට රු. මිලියන 598.51ක ගනුදෙනු සිදුවිය.**

### සාර්ථකත්වය මැනීම

**සමාගමෙහි කාබන් පතුල් සටහන**




**හරිත මූල්‍ය බෙදාහැරීම**




**පරිසර සංරක්ෂණය කෙරෙහි ආයෝජනය**




GRI 306-1, 306-2

### කළමනාකරණ ප්‍රවේශය

පීපල්ස් ලීසිං හි පාරිසරික තිරසාරත්වය මගින් අවධානය යොමුකරන්නේ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීම සඳහා සහය දක්වන වගකීම් සහගත සහ පරිසර හිතකාමී ව්‍යාපාරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිළිබඳව.




තිරසාර සංවර්ධන ක්‍රියාදාමයන් වෙත ඔරොත්තුදෙන සමාජයන් ගොඩනැංවීම සහ පාරිසරික සහ සංවර්ධන ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ජනතාවගේ හැකියාව වැඩි දියුණු කිරීමට මෙන්ම හරිතභාවය පදනම් කරගත් රැකියා නිර්මාණය සහ හරිතභාවය මුල්කරගත් කර්මාන්ත ක්ෂේත්‍රයක් බිහිකිරීම සඳහා අධ්‍යාපනය අතිශය වැදගත් වේ.




සම්පත් කාර්යක්ෂමව භාවිත කරන නගර මගින්, ගනුදෙනුකාර තේරීම සහ තිරසාර ජීවන රටාවන් සඳහා වැඩි අවස්ථාවන් සපයනු ලබන අතර, ඒවා මගින් අඩු පිරිවැය සහ පහත හෙළන ලද පාරිසරික බලපෑම් සමගින් වැඩි ඵලදායිත්වයක් සහ නව්‍යතාවයක් සංයෝජනය කෙරේ.




පාරිසරික තිරසාරත්වය සමග ආර්ථික වර්ධනය ඒකාබද්ධකරණය මගින් වඩාත් හරිත සහ සමාජීය වශයෙන් පරිපූර්ණ ගෝලීය ආර්ථිකයක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටා ප්‍රවර්ධනය කෙරේ.




කාලගුණික වෙනස්වීම් මගින් කෘෂිකාර්මික නිෂ්පාදන පහත වැටෙන, වැදගත් යටිතල පහසුකම් වෙත හානි පමුණුවන, සහ අත්‍යාවශ්‍ය සේවා සැපයීම කෙරෙහි බාධා ඇති කරවන ආකාරයේ සිදුවීම් වලට හේතුවන අන්තගාමී කාලගුණ තත්ත්වයන් නිර්මාණය කෙරෙන බැවින් ආයතනික ක්‍රමෝපාය වෙත කාලගුණ විපර්යාස පියවර ඒකාබද්ධකරණය අතිශය වැදගත් වේ.




ඒකාබද්ධ පරිසර දිශානතියක් සමගින් මූල්‍ය පද්ධතිය වඩාත් තිරසාර බවට පත් කිරීම සඳහා හැකියාවන් ගොඩනැගීම් සහ සම්පත් බලමුළු ගැන්වීම, දැනුම හුවමාරුව මගින් පරිසර සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය කෙරෙහි සවිමත් සබඳතා දායක වේ

GRI 102-11, 307-1

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමෙහි පාරිසරික ක්‍රමෝපාය කෙරෙහි නායකත්වය සපයනු ලබන අතර තිරසාර ව්‍යාපෘතීන් සම්බන්ධීකරණය සහ නිරීක්ෂණය තිරසාරත්ව පාලන නියමු කමිටුව වෙත පවරා ඇත. එම කමිටුව මගින් පීපල්ස් ලීසිං හි පාරිසරික ක්‍රමෝපායන් සම්බන්ධ දිශානතිය සකසනු ලබයි. ආයතනික කළමනාකාරීත්වයේ නායකත්වයෙන් යුතුව, ප්‍රධාන කාර්යාලයේ අංශ සහ ශාඛා ජාලය මගින් හරිත කාර්යසාධනය පවත්වාගෙන යනු ලැබේ. හරිත ව්‍යාපාරික ක්‍රියාවලියක් පවත්වාගෙන යාම සඳහා තාක්ෂණය අන්තර්ග්‍රහණය කිරීම මගින් ප්‍රශංසනීය ප්‍රතිඵල රැසක් අත්පත් කරගෙන ඇත. පාරිසරික කාර්යසාධනය කෙරෙහි, පාරිසරික නීති රීති සහ රෙගුලාසි වෙත අනුගත වීම, වගකීම් සහගත භාණ්ඩ හා සේවා ලබා ගැනීම, සංවර්ධනයේදී සහ නව භාණ්ඩ හා සේවා හඳුන්වාදීමේදී ප්‍රවේශම් සහගත ප්‍රවේශය සහ පරිසරය සුරැකීම සඳහා වන ප්‍රජා සත්කාරකයන් දායක විය. වාර්තාකරණ වර්ෂය තුළ පාරිසරික නීති රීති සහ රෙගුලාසි වෙත අනනුකූල නොවීම පිළිබඳ කිසිදු සිදුවීමක් වාර්තා නොවිය.

අපගේ පාරිසරික ක්‍රමෝපායන් කාර්යමණ්ඩලය අතර හරිත දැනුවත්භාවය ඇති කිරීමෙන් ඇරඹී ඉන් අනතුරුව සැපයුම් දාමය වෙත ව්‍යාප්ත කරන්නා වූ පාරිසරික උපායමාර්ග හතරක් ඔස්සේ ක්‍රියාවට නැංවෙයි. අප විසින් සවිඥානිකව අපගේ මෙහෙයුම් වල පාරිසරික සටහන පහත හෙළීම සහ අප විසින් ගනුදෙනුකරුවන් වෙත පිරිනමනු ලබන භාණ්ඩ සහ සේවා මගින් ඇති විය හැකි වක්‍ර පාරිසරික බලපෑම් අවම කර ගැනීම සඳහා කැපවී ක්‍රියා කරනු ලැබේ. පරිසරය සුරැකීම පිළිබඳ ප්‍රජාවන් දැනුවත් කෙරෙන ප්‍රජා සත්කාරයන් සහ ස්වභාවික සම්පත් නැවත උත්පාදනය කිරීමට අවශ්‍ය වන ක්‍රියාකාරකම් අපගේ පාරිසරික සංරක්ෂණ ප්‍රයත්නයන් හි වැදගත් කොටසක් වේ.

අභ්‍යන්තර පාරිසරික කළමනාකරණ (EMS) පද්ධතිය මගින් ප්‍රධාන පාරිසරික දත්ත ඒ අවස්ථාවේදීම නිරීක්ෂණය සඳහා සහාය දක්වයි. අදාළ දත්ත ISO 14064: 2018 වෙත අනුකූලව හරිතාගාර වායු විමෝචන ප්‍රමාණිකරණය සඳහා උපකාරී වේ.

GRI 305-1, 305-2, 305-3

### කාබන් පතුල් සටහන ඇගයීම් විෂය පථය

**සෘජු විමෝචන;**
සමාගමට අයත් මෝටර් රථ, ස්ථාවර දහනය (විදුලි ජනක යන්ත්‍ර), ගිනි නිවීමේ උපකරණ නැවත පිරවීම/ ප්‍රතිස්ථාපනය, ශීතකාරක ද්‍රව්‍ය කාන්දුවීම්, සේවක ප්‍රවාහනය - (සමාගම මගින් ගෙවන ලද) ව්‍යාපාරික සංචාර, කුලියට ලබාගත් මෝටර් රථ - (සමාගම මගින් ගෙවන ලද).

**වක්‍ර විමෝචන;**
ජාලක විදුලිය, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අලාභ, සේවක ප්‍රවාහනය - (සමාගම විසින් නොගෙවන ලද), අපද්‍රව්‍ය බැහැර කිරීම්, නාගරික ජල පරිභෝජනය, ව්‍යාපාරික ගුවන් ගමන්, කුලියට ලබාගත් මෝටර් රථ (සමාගම විසින් නොගෙවන ලද), කුලී රථ වාහන, අපද්‍රව්‍ය ප්‍රවාහනය, දේශීය වශයෙන් මිලට ගත් අයිතම ප්‍රවාහනය.

2020/21 මූල්‍ය වර්ෂය සඳහා සමූහයේ සහ සමාගමෙහි කාබන් පතුල් සටහන පිළිවෙලින් 4,404.28t$CO_2$e සහ 3,833.50t$CO_2$e විය.

### සිව් ස්ථර පාරිසරික ක්‍රමෝපාය

**හරිත මෙහෙයුම්**
පරිසරයට අපගේ සෘජු ධනාත්මක බලපෑම කළමනාකරණය සහ ප්‍රශස්තීකරණය

කැපවීම

පහත සඳහන් ක්‍රියාකාරකම් ඔස්සේ කාබන් පතුල් සටහන අඩුකිරීම –
- හරිත ක්‍රියාකාරකම්
- කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ වගකීම් සහගත අපද්‍රව්‍ය බැහැර කිරීම
- හරිත තාක්ෂණය කෙරෙහි ආයෝජන
- පද්ධති වැඩිදියුණු කිරීම්

**වගකීම් සහගත මූල්‍ය**
අපගේ භාණ්ඩ සහ සේවාවල හරිත බලපෑම ප්‍රශස්තීකරණය සහ වක්‍ර සෘණාත්මක බලපෑම් අඩුකිරීම

කැපවීම

අපගේ ව්‍යාපාරයෙහි මූලික හරය වශයෙන් වගකීම් සහගත මූල්‍ය අන්තර්ග්‍රහණය කිරීම –
- වගවීම් සහගත, සදාචාර සම්පන්න සහ විනිවිදභාවයෙන් යුතු මූල්‍යකරණය
- වගකීම් සහගත ප්‍රතිසම්පාදනය
- ණය පරීක්ෂා කිරීම් වලදී ESG සලකා බැලීම්

**හරිත දැනුවත් කිරීම්**
වටිනාකම් දාමය පුරා හරිත දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම

කැපවීම

පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔස්සේ පාරිසරික වශයෙන් ශ්‍රම බලකායක් සහ සැපයුම් දාමයක් නිර්මාණය කිරීම
- නිතිපතා හරිත පුහුණුව/ දැනුවත් කිරීම්

**හරිත ව්‍යාපෘති ප්‍රජා සත්කාරයන්**
පරිසරය සංරක්ෂණය

කැපවීම

පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔස්සේ අපගේ සංරක්ෂණ ප්‍රයත්නයන් වැඩිදියුණු කිරීම –
- නැවත වන වගාව/දිගු කාලීන රුක් රෝපණය
- හරිත ප්‍රජා සත්කාරයන් සඳහා සේවකයින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම
- පාර්ශවකරුවන් දැනුවත් කිරීම
- පාරිසරික පර්යේෂණ සඳහා සහාය දැක්වීම



### හරිත දැනුවත්භාවය

පීපල්ස් ලීසිං හි පාරිසරික ප්‍රමුඛතාවයන් පිළිබඳව අපගේ සේවකයින් සහ සෙසු ප්‍රධාන පාර්ශවකරුවන් දැනුවත් කිරීම අපගේ පාරිසරික වශයෙන් ඇති ක්‍රමෝපායෙහි පදනම විය. පරිසරය කෙරෙහි තනි පුද්ගල සහ කණ්ඩායම් වශයෙන් ඇති වගකීම පිළිබඳව කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

සමාගමෙහි කාර්යසාධන දර්ශක වෙත පාරිසරික ප්‍රමුඛ කාර්යසාධන දර්ශක අන්තර්ග්‍රහණය කිරීම තුළින් පාරිසරික ඉලක්ක වෙත සමාගමේ කැපවීම පිළිබඳව සේවකයින් අතර සැලකිය යුතු දැනුවත්භාවයක් ඇති කරන ලද අතර එය පාරිසරික ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීම කෙරෙහි සුභවාදී බලපෑමක් ඇති කොට ඇත. ආයතනික කළමනාකාරිත්වය සහ ශාඛා කළමණාකරුවන්ගේ උපදේශකත්වයෙන් යුතුව, තිරසාරභාවය පිළිබඳ ශූරයින් සම්පත් වගකීම් සහගතව භාවිතය ක්‍රියාවට නැංවීම, පාරිසරික කාර්යසාධන දර්ශක වල ප්‍රමාණාත්මක නිරීක්ෂණය සිදුකරන ලද අතර එය සමාගමෙහි දෛනික තීරණ ගැනීමේ දී අනිවාර්ය අංගයක් විය.

අපගේ සේවකයින් හරිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තවදුරටත් යොමු කිරීම සඳහා වසර තුළදී පියවර කිහිපයක් ගන්නා ලදී.

- සමාගමෙහි තිරසාරත්ව ශූරයින් සමග තිරසාරභාවය පිළිබඳ තේමාවන් ඔස්සේ සන්නිවේදන තවදුරටත් සිදු කරන ලදී.
- ප්‍රමුඛ කාර්යසාධන දර්ශක නිරීක්ෂණය සඳහා උපකාරී වූ පාරිසරික කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කරන ලදී.
- තොරතුරු තාක්ෂණ කණ්ඩායම විසින් කඩදාසි රහිත ව්‍යාපෘතීන් සම්බන්ධ දැනුවත් කිරීම් සිදු කරන ලද අතර කඩදාසි රහිත සේවා ස්ථානයක් බවට පත් කිරීම සඳහා සමාගම පුරා ස්වයංක්‍රීය කාර්ය ප්‍රවාහයන් ක්‍රියාත්මක කරන ලදී.
- ඉන්ටර්බැලන්ස් ආයතනය මගින් ස්වාධීන තිරසාරත්ව සමාලෝචනයක් සිදු කරන ලද අතර එහිදී ප්‍රමාණාත්මක තේමාවන්, ප්‍රමාණාත්මක තේමාවන් සම්බන්ධ ප්‍රතිපත්ති සහ දැනට පවතින ප්‍රමුඛ කාර්යසාධන දර්ශක ඇගයුමට ලක් කරමින් සමාගමෙහි ආයතනික ක්‍රමෝපාය වෙත තවදුරටත් තිරසාරත්වය අන්තර්ග්‍රහණය කිරීම සඳහා පරතර ඇගයීමක් ද සිදු කරන ලදී.

### හරිත මෙහෙයුම්

සමාගමෙහි පාරිසරික පතුල් සටහන පහත හෙළීම සඳහා ගන්නා ලද පියවර අතරට, ස්වයංක්‍රීය කාර්ය ප්‍රවාහයන් තවදුරටත් අභ්‍යන්තරීකරණය කිරීම, උපාය මාර්ගික වශයෙන් හඳුනාගත් මෙහෙයුම් සඳහා නිවසේ සිට වැඩ කිරීම දිරිගැන්වීම, කාර්යක්ෂමතාවය සහ පද්ධති වැඩිදියුණු කිරීම, වගකීම් සහගත භාණ්ඩ හා සේවා ලබා ගැනීම, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ හරිත තාක්ෂණය වෙත තව තවත් ආයෝජන සිදු කිරීම ඇතුළත් වේ. අපගේ වාර්ෂික සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දී සැලකිය යුතු පාරිසරික බලපෑමක් සිදුකරන සැපයුම්කරුවන් බැහැර කරන ලදී. එසේ වුවද, 2020/21 මූල්‍ය වර්ෂය තුළ පරීක්ෂා කරන ලද නව සැපයුම්කරුවන් ප්‍රමාණය වාර්තා වී නොමැත.

| | පරිසර දත්ත | මිනුම් ඒකකය | 2020/21 වටිනාකම (සමූහය) |
|---|---|---|---|
| | අපද්‍රව්‍ය | ටොන් | 91.08 |
| | බලශක්තිය (ඉන්ධන සහ විදුලිය) | ජූල් | $2.03x10^{13}$ |
| | හරිතාගාර වායු විමෝචන (කාබන් පතුල් සටහන) | $tCO_2e$ | 4,404.28 |

#### තිරසාරත්ව විශිෂ්ටයන් විසින් පීපල්ස් ලීසිං හි පාරිසරික පරිවර්තනය සිදු කිරීම



තිරසාරත්ව විශිෂ්ටයෙක් වශයෙන් මාගේ එදිනෙදා කටයුතුවලදී ක්‍රියා කරන ආකාරය මා විසින් වෙනසකට ලක් කළා. මාගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් තිරසාරත්වය කාර්යයන් වෙත ආදේශ කිරීමට කටයුතු කළා. බිඳ වැටීමක් හෝ කාන්දුවන ජල කරාමයක් කඩිනමින් යථා තත්ත්වයට පත් කළා. විදුලි බිල අපගේ ශාඛා රැස්වීම් වල ප්‍රධාන මාතෘකාවක් වුනා. සේවා සම්පාදකයින් නිසි කලට වරින් වර සේවා කිරීම් සඳහා එකඟ වුණා. අප විසින් අපගේ ශාඛාව තුළ ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම් සාර්ථකව සිදු කළා. වඩාත් වැදගත් කරුණක් වන්නේ, වසංගත තත්ත්වය මගින් අපගේ කඩදාසි රහිත වැඩසටහන් දිරිමත් කිරීමයි. අපගේ ශාඛා කළමනාකරුගේ උපදෙස් මත, උපරිම බලපෑමක් ඇති කිරීම සඳහා අපගේ කණ්ඩායමේ සියලු දෙනා සහභාගී කර ගැනීමට මා කටයුතු කරනවා. පාරිසරික කළමනාකරණ පද්ධතිය මගින් අප විසින් ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී අපව පරිසරය සමග බරපතළ ලෙස නැවත සම්බන්ධ කරනවා. මා වෙත ලැබෙන සෑම දැනුම් හුවමාරු කරගැනීමේ අන්තර්ජාල දැනුම්දීමක් සමගින්, මාගේ සමාගම, දැනුවත්භාවය සම්බන්ධයෙන් මා හට සහය දක්වන බව මට හැඟී යනවා. අපගේ ශාඛාව වෙත ලැබුණු කාබන් සවිඥානක සහතිකය සමගින් කාබන් පතුල් සටහන පහත හෙළීම සඳහා සාමූහික වශයෙන් කටයුතු කිරීමේ වැදගත්කම අප අවබෝධ කරගත්තා. තිරසාරත්ව විශිෂ්ටයකු වශයෙන් ප්‍රමාණාත්මක වෙනසක් සිදු කිරීමට හැකිවීම දිරිගන්වන සුළු කරුණක් වන අතර අපගේ පොළෝතලය සුරැකීම සඳහා දායක වන බව හැඟීයාම මට සැබැවින්ම සතුටට කරුණක්.

**ස්ටැන්ලි තිසේරා**
*මුදල් නිලධාරී*
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
කුලියාපිටිය ශාඛාව

#### වඩාත් හරිතවත් පාලනයක් සඳහා ගතික කඩදාසි රහිත පදනමක්



යහපත් බලපෑමක් ඇති කරන ලද රැස්වීම් කළමනාකරණයක් උදෙසා අප විසින් කඩදාසි රහිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අරඹන ලදී. කඩදාසි සඳහා යන පිරිවැය ඉතිරි කරමින් දෘඪ පිටපත් භාවිතය ඉවත් කිරීම නිසා තවදුරටත් A4 කඩදාසි කට්ටල අවශ්‍ය නොවේ. අතැඟිලි අසලම ඉලෙක්ට්‍රොනික පත්‍රිකා පවතින බැවින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඔවුනට යැවීම තවදුරටත් අවශ්‍ය නොවේ. මෙහිදී අවශ්‍ය අවස්ථාවන්හිදී භාවිත කිරීම සඳහා ඔවුන්ගේ උපාංග වල අදාල පත්‍රිකා ගබඩා කරගැනීමේ හැකියාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත හිමිවෙනවා. කඩදාසි රහිත පදනම වාර්ෂිකව A4 55,440 ප්‍රමාණයක් ඉතිරි කර ගැනීම සඳහා දායක වූ අතර එහිදී කඩදාසි සහ ඉන්ධන භාවිතය හේතුවෙන් ඇති වූ අපගේ ආයතනික කාබන් පතුල් සටහන පහත හෙළීමට හැකි වුණා. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අන්තර්ජාලය ඔස්සේ පැවැත්වීමට සහ ඇතැම් සාමාජිකයන් හට දුරස්ථව ඒවාට සම්බන්ධ වීමට සිදු වූ අවිනිශ්චිත කාලය තුළ මෙම විසඳුම් අතිශය වැදගත් වුණා. ඉලෙක්ට්‍රොනික අත්සන් කිරීමේ සහ අනුමත කිරීමේ පහසුකම් අතිවිශිෂ්ට විසඳුමක් ලෙස මා දකිනවා. 2021 මාර්තු සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සිදුවූ අතර එහිදී අදාල අංශය වෙත ස්වාධීනව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අන්තර්ජාලගත කිරීමේ හැකියාව සහ කාලෝචිත සහ සංවිධානාත්මක ආකාරයකින්ම අදාල පත්‍රිකා භාර දීමට හැකි වීම හේතුවෙන් අප හට කාර්ය ප්‍රවාහ කළමනාකරණයේදී මනා පිටුවහලක් ලැබුණා. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම මෙයට පෙර මෙතරම් සුන්දර අත්දැකීමක් නොවූ බව මාගේ පැහැදිලි අත්දැකීමයි.

**ලක්මිණි කෝට්ටෙගොඩ**
*සමාගම් ලේකම්*

GRI 302-1, 305-1, 305-2, 305-3, 306-3




| විමෝචන | සමූහය |
|---|---|
| සෘජු (විෂයපථය 1) හරිතාගාර වායු විමෝචන ($tCO_2e$) | 791.93 |
| වක්‍ර (විෂයපථය 2) හරිතාගාර වායු විමෝචන ($tCO_2e$) | 2,325.99 |
| වෙනත් වක්‍ර (විෂයපථය 3) හරිතාගාර වායු විමෝචන ($tCO_2e$) | 1,286.36 |
| මුළු විමෝචන ($tCO_2e$) | 4,404.28 |
| හරිතාගාර වායු විමෝචන අඩුකිරීම | 2,365.04 |
| හරිතාගාර වායු විමෝචන තීව්‍රතාවය (සේවකයෙකුට) | 0.16 |

2020/21 කාලය තුළ පීපල්ස් ලීසිං හි මුළු කාබන් පතුල් සටහන 3,833.50 $tCO_2e$ වශයෙන් ගණනය වූ අතර එය 2002.96 $tCO_2e$ක අඩුවීමකි. සමාගමේ එක් සේවකයකුට හරිතාගාර වායු විමෝචනය තීව්‍රතාවය 0.14 වශයෙන් වාර්තා විය.

පීපල්ස් ලීසිං මගින් සමූහය පුරා ක්‍රමවත් අපද්‍රව්‍ය කළමනාකරණය අනුගමනය කරන ලද අතර, 2020/21 කාලය තුළ සමාගමේ ප්‍රධාන කාර්යාලයෙහි බැහැර කිරීමේ ක්‍රමවේදය මත අපද්‍රව්‍ය වර්ගය පහත පරිදි වාර්තා විය.

| අපද්‍රව්‍ය වර්ගය | ප්‍රමාණය (කි.ග්‍රෑ) |
|---|---|
| ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි | 9,116 |
| ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය | 56 |
| සත්ව ආහාර සඳහා නැවත භාවිත කරන ලද ආහාර අපද්‍රව්‍ය | 4,924 |

**වගකීම් සහගත මූල්‍ය**

අප විසින් දිගින් දිගටම අපගේ ණය ලබාදීමේ තීරණ තුළ පාරිසරික සමාජයීය පාලන විධානයන් ප්‍රවර්ධනය කරන අතර එයට ඔවුන්ගේ ව්‍යාපාරික මෙහෙයුම් හේතුවෙන් පරිසරයට සිදුවන සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා ගණුදෙනුකරුවන් දැනුවත් කරමින් ඔවුන් සමග එක්ව කටයුතු කිරීම ඇතුළත් වේ. අරමුණු සහගත ව්‍යාපාරයක් වශයෙන් අපගේ ආයතනික මාර්ගෝපදේශ ප්‍රතිපත්ති මගින් ආර්ථික ශක්‍යතාවය, පාරිසරික වගකීම සහ සමාජ වගවීම අපගේ සියළුම ව්‍යාපාරික මෙහෙයුම් වලදී ආවේණික මූලික හරයන් ලෙස සැලකෙන අතර එහිදී වගකීම් සහගත ණය ලබාදීම තුළින් අප පරිසරයට ඉන් සිදුවන බලපෑම අවම කිරීමට කටයුතු කරනු ලැබේ.

| | 2020/21 | 2019/20 |
|---|---|---|
| හරිත ව්‍යාපෘති ප්‍රජා සත්කාරයන් (ගණන) | 6 | 12 |
| හරිත ව්‍යාපෘති ආයෝජනය (රු.මිලියන) | 2.77 | 3.32 |

### හරිත ව්‍යාපෘති ප්‍රජා සත්කාරයන්

අවිනිශ්චිතතාව හේතුවෙන්, වසර තුළ බලපාන ලද සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ගැටළු හේතුවෙන් අපගේ ව්‍යාපෘති සහ සේවක සහභාගීත්වය සීමාසහිත විය. ප්‍රධාන ව්‍යාපෘතීන් අතරට පහත දැක්වෙන ව්‍යාපෘතීන් අයත් විය.

**"Life"**

**ඔපාත කන්නෙලිය රක්ෂිතයට යාබදව පිරිහී ගිය පර්ණාංග ඉඩමක් යථා තත්ත්වයට පත්කිරීමෙහිලා වූ අපගේ කැපවීම**

අඛණ්ඩව තෙවන වසරේදීත් සිය කැපවීම් විදහා දක්වමින් පීපල්ස් ලීසිං සමාගම, ඔපාත, හල්ගහවල, කන්නෙලිය රක්ෂිත වනාන්තරයට යාබදව පිහිටි හෙක්ටයාර එකක පිරිහී ගිය පර්ණාංග ඉඩම යථා තත්ත්වයට පත් කිරීම සඳහා දායක විය. මෙම ස්වභාවික පහත් බිම්, වැසි වනාන්තර යථා තත්ත්වයට පත් කිරීම මගින්, ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට ජෛව විවිධත්ව උපචිත පද්ධතිය එළිදැක්වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදේශකත්වයෙන් යුතුව ශ්‍රී ලංකා ජෛව විවිධත්ව සංගමය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවේ. එහිදී ස්වභාවික සංරක්ෂණය සඳහා වන ජාත්‍යන්තර එකමුතුව (IUCN) මගින් තාක්ෂණික දායකත්වය සපයන අතර ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පිරිහී ගිය වනාන්තර භූමි යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන ආකෘතියක් නිර්මාණයය කිරීම උදෙසා ආයතන 10 ක් සහභාගී කර ගැනේ. 2020/21 වසර තුළදී වනාන්තර සඳහා වන නැවත වන වගා කිරීමේ සැලසුම සම්පූර්ණ කරන ලදී. සෙවන ලබාදෙන පැළ සහ වනාන්තර රුක් විශේෂයන් රෝපණය කිරීම, පාංශු සංරක්ෂණය, ලැව්ගිනි වළකාලීම සඳහා මීටර් 3 ක ගිනි ආරක්ෂණ කලාපයක් ස්ථාපනය කිරීම ද මෙහිදී සිදු විය. තවද වසර තුළදී ග්ලිරිසීඩියා කෝටු 300 ක් ඇතුළුව පැල 4,905ක් රෝපණය කරන ලද අතර ප්‍රතිස්ථාපන පරිශ්‍රය තුළ තනි පැළ 8000 කට වැඩි පැළ ඝනත්වයක් ඇති කරන ලදී.

**රුක් රෝපණය**

නාවලපිටිය ශාඛාව මගින් කල්බදු සහ ණය පහසුකම් ලබා ගත් ගනුදෙනුකරුවන් සඳහා රුක් රෝපණ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා කලාප අධ්‍යාපන කාර්යාලය, මධ්‍යම පළාතේ හරංගල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහයෝගය ලබා දෙන ලදී.

**බාහිරින් බඳවාගත් කාර්ය මණ්ඩලය ඇගයීම**

අඛණ්ඩව හත්වන වසරේදීත් වගකීම් සහගත ගෘහපාලන කටයුතු සහ පවිත්‍ර කරන කටයුතු කාර්යමණ්ඩල ඇගයුමට ලක් කරන ලදී. මෙහිදී බාහිරින් බඳවාගන්නා ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් 41ක් වෙත ආයතනික කළමනාකාරිත්ව සහභාගීත්වයෙන් උත්සවයකදී දිරි දීමනා සහ ප්‍රතිලාභ පිරිනමන ලදී.

**පීඑල්සී හරිත සිතුවම්**

දීප ව්‍යාප්ත පීඑල්සී හරිත සිතුවම් පෝස්ටර් තරගාවලියේ ප්‍රාදේශීය ජයග්‍රාහකයින් වෙත පරිසර සංරක්ෂණය සම්බන්ධ තේමාවන් හයක් යටතේ ආකර්ෂණීය ත්‍යාග පිරිනමන ලදී. සමාගම වසර තුළදී මේ සඳහා රුපියල් මිලියන 1.17 ක් ආයෝජනය කරන ලද අතර, එය පෙර වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ළමා නිර්මාණශීලීත්වය සහ ඔවුන්ගේ පාරිසරික විඥානක ඇගයීම වෙනුවෙන් රුපියල් මිලියන 2.38 ක සමස්ත මුදලක් වැය කරන ලදී.

### ඉදිරි දැක්ම

**කෙටි කාලීන: 2021/22**

- ස්වයංක්‍රීය කාර්ය ප්‍රවාහ සමගින් අපගේ සේවකයින්ගේ ඩිජිටල් නිපුණත්වය ඉහළ නංවන ලදී.
- අපගේ ඩිජිටල් මූල්‍ය විසඳුම් වැඩි වැඩියෙන් භාවිත කිරීම සඳහා ගනුදෙනුකරුවන් සක්‍රිය කරන ලදී.
- අරමුණු සහගත ව්‍යාපාරික සංරචකයන් ඇතුලත් කිරීම සඳහා පාලන සහ කළමනාකරණ ව්‍යුහය ශක්තිමත් කරන ලදී.
- පුනර්ජනනීය ප්‍රභවයන් සඳහා ශක්‍යතා තක්සේරුවක් සිදුකරන ලදී.

**මධ්‍ය කාලීන: වසර 3**

- වැඩි කාර්යක්ෂමතාවයක් උදෙසා ක්‍රියාවලි ප්‍රතිව්‍යුහගත කරමින් තවදුරටත් ස්වයංක්‍රීය කිරීම.
- ගනුදෙනුකාර කේන්ද්‍රීය ඩිජිටල් සේවා වර්ධනයන් සඳහා වැඩි වැඩියෙන් ආයෝජන සිදුකිරීම.
- විදුලි උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්තිය හඳුන්වාදීම.
- ප්‍රධාන පරිසර සංවේදී අංශයන් ආවරණය කරමින් පාරිසරික අවදානම පිළිබඳ දැනුවත් වටපිටාවක් ආයතනගත කිරීම.

**දිගු කාලීන**

- සරල සහ ක්‍රියාකාරී මෙහෙයුම් ආකෘතියක් ස්ථාපනය කිරීම.
- ඩිජිටල් වශයෙන් සවිබල ගන්වන ලද දත්ත සහිත බුද්ධිමය ව්‍යාපාරයක් වශයෙන් ඉදිරියට ගෙනයාම.
- අවශ්‍ය විදුලි ධාරිතාවෙන් සියයට 75%ක් පුනර්ජනනීය බලශක්තිය ඔස්සේ ලබා ගන්නා බවට තහවුරු කරගැනීම.
- පාරිසරික චර්යා ධර්ම සංග්‍රහය සම්බන්ධයෙන් සැපයුම්කරුවන් දැනුවත් කරමින් සහ සැපයුම්කරුවන් සඳහා පරික්ෂා ලැයිස්තුවක් යොදාගනිමින් වගකීම් සහගත භාණ්ඩ හා සේවා ලබාගන්නා බවට තහවුරු කරගැනීම.

### ස්වභාවික ප්‍රාග්ධනය වෙළඳ ගනුදෙනු

**මූල්‍ය ප්‍රාග්ධනය**

- නව සාමාන්‍ය තුළ ව්‍යාපාර අඛණ්ඩත්වය සහ දුරස්ථ සේවා සැපයුම සම්බන්ධ මිලදීගැනීම් සහ ආශ්‍රිත සංවර්ධනයන් සඳහා මූල්‍ය ආයෝජනය

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**

- නව සාමාන්‍ය තුළ ව්‍යාපාර අඛණ්ඩත්වය සහ දුරස්ථ සේවා සැපයුම් සම්බන්ධයෙන් වත්කම් සහ ආශ්‍රිත සංවර්ධනය සම්බන්ධ මිලට ගැනීම්

**බුද්ධිමය ප්‍රාග්ධනය**

- වගකීවයුතු ව්‍යාපාරයක් වශයෙන් නව සාමාන්‍ය තුළ අඛණ්ඩව ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා කීර්තිනාමය වැඩිදියුණු කරගැනීම

**මානව ප්‍රාග්ධනය**

- දුරස්ථ සේවා සැපයුමේදී අපගේ කාර්ය මණ්ඩලයේ තාක්ෂණික කුසලතා වර්ධනය කරන ලදී
- වසංගත තත්ත්වය හේතුවෙන් පනවල ලද සීමාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් සේවා ස්ථානයන්හි ශ්‍රම බලකාය පහළ ගියේය

**සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය**

- දුරස්ථ සේවා සැපයුම ඔස්සේ සිදුකරන ලද කෝවිඩ් සහන, උපදේශන සහ අඛණ්ඩ මෙහෙයුම් සම්බන්ධ ගනුදෙනුකාර තෘප්තිමත්භාවය

# අපගේ සමාජ ආර්ථික බලපෑම

GRI 307-4

## මෙරට ප්‍රමුඛ බැංකු නොවන මූල්‍ය ආයතනයක් වශයෙන්, අපගේ මෙහෙයුම් මගින් දේශය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් සිදුකෙරේ.

### බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය කෙරෙහි වන බලපෑම

**13%**
බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි සමස්ත අත්තිකාරම් වලින් 13.33%

**13%**
බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි සමස්ත තැන්පතු වලින් 13.39%

**12%**
බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි සමස්ත වත්කම් වලින් 11.82%

**14%**
බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි සමස්ත ලාභයෙන් 13.59%

GRI 201-1

## නිර්මාණය කරන ලද ආර්ථික වටිනාකම

දින 365 භාණ්ඩාගාර බිල්පත් සාමාන්‍යය අනුපාතයට සමාන ආර්ථික ගාස්තුවක් සහ 2% අවදානම් වාරිකයක් සැලකිල්ලට ගත් කල, 2020/21 මූල්‍ය වර්ෂය සඳහා පීපල්ස් ලීසිං මගින් එකතු කරන ලද ආර්ථික වටිනාකම රු.මිලියන 1,492.32 ක් වේ. මෙමගින් අප විසින් කොටස් හිමිකරුවන් වෙත ආර්ථික අනුපාතය ඉක්මවා වටිනාකම් නිර්මාණය කරමින් ඔවුන් වෙත ආර්ථික පිරිවැය ප්‍රාග්ධනයට අතිරික්තව ඉහළ ආදායමක් පිරිනමනු ලැබ ඇත.

### එකතු කරන ලද ආර්ථිකමය අගය

| | 2020/21 රු. මිලියන | 2019/20 රු. මිලියන |
|---|---|---|
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල් | 34,341.43 | 30,246.63 |
| එකතු කිරීම: අපහායන ගාස්තු සඳහා සමුච්චිත වෙන් කිරීම | 9,267.94 | 8,750.24 |
| එකතු කිරීම: සමුච්චිත වෙළඳපොල ගොඩනැංවීමේ වියදම් | 560.43 | 696.75 |
| අඩු කිරීම: විලම්බිත බදු වත්කම් | (415.84) | (376.29) |
| | 43,753.96 | 39,317.33 |
| කොටස් හිමිකරුවන් වෙත ආරෝපණය කල යුතු පොලිය | 4,033.02 | 2,942.51 |
| එකතු කිරීම: වසර සඳහා වෙළඳපොල ගොඩනැංවීමේ වියදම් | 39.06 | 196.56 |
| එකතු කිරීම: අපහායන වෙන්කිරීම | 517.70 | 3,805.90 |
| එකතු කිරීම: වසර සඳහා විලම්බිත බදු ගාස්තු | (69.51) | (1,213.52) |
| | 4,520.27 | 5,731.45 |
| ආර්ථිකමය පිරිවැය % (භාණ්ඩාගාර බිල්පත් අනුපාතයෙහි සාමාන්‍යය + 2% අවදානම් වාරිකය) | 7.29% | 10.22% |
| ආර්ථිකමය පිරිවැය | 3,027.95 | 3,768.68 |
| **ආර්ථිකමය අගය එකතු කිරීම** | **1,492.32** | **1,962.77** |

### එකතු කරන ලද වෙළඳපොල වටිනාකම

වෙළඳපොල ප්‍රාග්ධනිතය ශුද්ධ වත්කම් වල වටිනාකමට පහළ බැවින් සමාගම මගින් එකතු කරන ලද වෙළඳපොල වටිනාකම සෘනාත්මක තත්ත්වයක පවතී.

| | 2020/21 රු. මිලියන | 2019/20 රු. මිලියන |
|---|---|---|
| වෙළඳපොල ප්‍රාග්ධනිතය/ස්කන්ධ වල වෙළඳපොල වටිනාකම | 20,114.31 | 19,857.98 |
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල් | 34,341.43 | 30,246.63 |
| **වෙළඳපොල වටිනාකම එකතු කරන ලද/(පහළ ගිය)** | **(14,227.12)** | **(10,388.65)** |

### එකතු කරන ලද වෙළඳපොල වටිනාකම බෙදීයාම

පොලී ආදායමෙහි පහළයාම හේතුවෙන් වසර තුළදී උත්පාදනය කරන ලද ආර්ථක වටිනාකම පහළ මට්ටමක පැවතිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2020/21 මූල්‍ය වර්ෂය තුළ සමස්ත පාර්ශවකරුවන් වෙත බෙදාදෙන ලද වටිනාකම පහළ ගියේය. කෙසේවුවද, පහත වගු වලින් දැක්වෙන පරිදි පාර්ශවකරුවන් අතර බෙදාහරින ලද වටිනාකම සහ රඳවාගත් වටිනාකම වෙනස්කම් වලට භාජනය විය:

ආර්ථිකමය වටිනාකම බෙදී යාම



# අපගේ සමාජ ආර්ථික බලපෑම



පසුගිය වසරේදී බෙදාහරින ලද ආර්ථික වටිනාකම උත්පාදිත ආර්ථික වටිනාකම ඉක්මවා ගිය ද වසර තුළදී උත්පාදිත ආර්ථික වටිනාකමෙන් 10.95% ක් රඳවා ගැනීමට සමාගම සමත් විය. 2019/20 සමග සැසඳීමේදී තැන්පත්කරුවන් වෙත බෙදාහරින ලද වටිනාකම් කොටස 2020/21 දී 37.74% කින් ඉහළ ගිය අතර පොලී අනුපාත සහ ණය ගැනීමේ අනුපාතයන් පහළයාම හේතුවෙන් වසර තුළදී ණය හිමියන් වෙත බෙදා හරින ලද වටිනාකම පහල ගියේය. පහත හෙළන ලද බදු අනුපාත හේතුවෙන් ශ්‍රී ලංකා රජය වෙත බෙදා හරින ලද වටිනාකම පහළ ගියේය. ඉහළ ගිය අවිනිශ්චිතතාව හේතුවෙන් ශේෂ පත්‍රය සවිමත් කිරීම අවශ්‍ය වූ නිසා කොටස් හිමිකරුවන් වෙත ලාභාංශ ද පහළ ගියේය. කෙසේ වුවද, මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව කොටස් ලාභාංශයක් වශයෙන් ගෙවීමට නියමිත වූ යෝජිත කොටසකට රුපියල් 0.75 ක අවසාන ලාභාංශය මෙම අගය එකතු කරන ලද ප්‍රකාශයෙහි ඇතුළත් නොවේ. වසංගතය හේතුවෙන් ප්‍රජාව ආශ්‍රිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සීමාවන් නිසාවෙන් 2020/21 දී ප්‍රජාව වෙත බෙදාහරින ලද වටිනාකමෙහි අඩුවීමක් පිළිබිඹු කෙරිණි.

| | 2020/21<br>රු. මිලියන | 2019/20<br>රු. මිලියන |
|---|---|---|
| **උත්පාදිත සෘජු ආර්ථික වටිනාකම** | | |
| පොලී ආදායම | 24,983.45 | 31,459.11 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 1,818.68 | 1,694.01 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 301.68 | 446.20 |
| **උත්පාදිත ආර්ථික වටිනාකම** | **27,103.81** | **33,599.32** |
| **බෙදාහරින ලද ආර්ථික වටිනාකම** | | |
| **ප්‍රාග්ධන සම්පාදකයින් වෙත** | | |
| කොටස් හිමිකරුවන් වෙත ලාභාංශ | 976.62 | 1,929.32 |
| ණය ලබාගැනීම් සඳහා පොලිය | 2,835.85 | 4,255.98 |
| තැන්පතු හිමිකරුවන් වෙත පොලිය | 10,228.46 | 11,530.60 |
| | **14,040.93** | **17,715.90** |
| **සේවකයින් වෙත** | | |
| වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ | 3,465.37 | 3,701.39 |
| | **3,465.37** | **3,701.39** |
| **රජය වෙත** | | |
| ආදායම් බදු වියදම් | 1,909.08 | 2,822.84 |
| මූල්‍ය සේවා මත බදු | 1,222.63 | 2,002.46 |
| ගෙවන ලද වෙනත් බදු | 18.37 | 266.54 |
| | **3,150.08** | **5,091.84** |
| **ප්‍රජාව වෙත** | | |
| සමාජ වගකීම් ප්‍රජා සත්කාරයන් සහ ප්‍රදානයන් පිළිබඳව | 23.15 | 58.85 |
| | **23.15** | **58.85** |
| **මෙහෙයුම් පිරිවැය** | | |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 722.99 | 717.02 |
| ණය සහ ලැබිය යුතු දේ සහ වෙනත් අලාභ සඳහා අපහායන ගාස්තු | 1143.05 | 4751.8 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 1,590.08 | 1808.64 |
| | **3,456.12** | **7,277.46** |
| **බෙදාහරින ලද ආර්ථිකමය වටිනාකම** | **24,135.65** | **33,845.44** |
| **රඳවා ගන්නා ලද ආර්ථිකමය වටිනාකම** | **2,968.16** | **(246.12)** |

## මූල්‍ය පහසුකම් ලබාගැනීමේ හැකියාව

අපගේ ප්‍රධාන අරමුණ වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ක්ෂුද්‍ර ව්‍යවසායකයින්, ආයතන සහ විවිධ ක්ෂේත්‍රයන් හා සම්බන්ධිත පුද්ගලයන් වෙත ඔවුන්ගේ අභිලාෂයන් සපුරා ගැනීම කෙරෙහි සහාය වෙමින් ඔවුන්හට මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව ලබාදීමයි. මෙහිදී අප විසින් අරමුණු කරනු ලබන්නේ දැනටමත් අපගේ ගනුදෙනුකරුවන් විසින් අවබෝධ කොට ගෙන ඇති ව්‍යුහගත සැලසුම් සමගින් ඔවුන්ගේ ජීවන චක්‍රය පුරා මූල්‍යමය සහය ලබා දීමයි. වසර තුළදී, අප විසින් රුපියල් මිලියන 50,881.01 ක වටිනාකමකින් යුතු ණය ලබාදීම් 36,780 ක් සිදු කරන ලදී.

**ක්ෂේත්‍රයන් අතර කළඹ බෙදාහැරීම**




### භාරකාරීත්ව වටිනාකමක්

මූල්‍ය සමාගමක් වශයෙන්, අප විසින් විශ්වාසනීය භාරකරුවකු සහ පෙරළා ආදායමක් අවශ්‍ය වන පොදු ජනතාව වෙත ආයෝජන අවස්ථාවන් සලසනු ලැබේ. පීපල්ස් ලීසිං බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය තුළ විශ්වාසනීය සමාගමක් වන අතර ආසන්න වශයෙන් ගනුදෙනුකරුවන් 300,000 ක් සඳහා රුපියල් මිලියන 101,502.93 ක භාරකරුවකු වශයෙන් කටයුතු කරයි.

### සෘජු හා වක්‍ර සේවා නියුක්තිය

සමාගම මගින් පුද්ගලයින් 2,343 දෙනෙකු වෙත සෘජු රැකියා අවස්ථා සපයනු ලබන අතර, මෙහෙයුම් කටයුතු ක්‍රමවත් කිරීමේ අවධානය හේතුවෙන් වසර තුළදී එය පහළ මට්ටමකට පැමිණුනි. වසර තුළදී, අප විසින් වෙනත් පුද්ගලයින් සඳහා රැකියා සපයනු ලබන ව්‍යාපාරික සහකරුවන් 35,000 කට අධික සංඛ්‍යාවක් වෙත අඛණ්ඩවම සහාය දක්වන ලදී. රුපියල් බිලියන 71.42 ක කලඹ වටිනාකමකින් යුතු පමාසහනයන් සමගින් අසීරුතාවයට පත් ගනුදෙනුකරුවන් වෙත සහාය දක්වමින් මගී ප්‍රවාහනයෙහි නිරත බස්රථ 4,362 ක් වෙත 4% ක පොලී අනුපාත සහනයක් ලබා දෙන ලද අතර එහිදී ඔවුන්ගේ ජීවනෝපාය සහ රටේ වක්‍ර රැකියාවන්හි නිරත වූවන් වෙත සහාය වීම කෙරෙහි අපගේ කැපවීම විදහා දක්වමින් දළ පොලී ආදායම රුපියල් මිලියන 678.89 දක්වා පහත වැටුණි.

THANK YOU

ස්තූතියි

# නායකත්වය

100 අධ්‍යක්ෂ මණ්ඩලය
104 ආයතනික කළමනාකරණය
108 අනුකූලතා අවදානම් කළමනාකරණය
111 ආයතනික පාලනය
139 සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
144 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව
146 මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව
148 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව
150 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
153 අවදානම් කළමනාකරන විමර්ශනය

# අධ්‍යක්ෂ මණ්ඩලය





1



2



3



4



5



6

**1. සුජීව රාජපක්ෂ මහතා**

*සභාපති/ විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19 වැනි දින සුජීව රාජපක්ෂ මහතා සමාගමෙහි සභාපතිවරයා වශයෙන් පත් කෙරිණි.

**සුදුසුකම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි සහ ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙහි අධි සාමාජිකයකු වන රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමණාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

දශක හතරකට අධික කාලයක් පුරා දිවෙන සිය වෘත්තීය ජීවිතයේදී ඒ මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සභාපති, උප සභාපති, මණ්ඩල සභික, එම ආයතනයෙහි විගණන ප්‍රමිති කමිටුවේ හිටපු සභාපති, කාර්යයෙහි නියුතු ගණකාධිකාරීවරුන්ගේ සභාවේ සභාපති, ශ්‍රී ලංකා ක්‍රිකට් භාණ්ඩාගාරික, 2011 ක්‍රිකට් ලෝක කුසලාන භාණ්ඩාගාරික, දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ තාක්ෂණික උපදේශක, ආසියා-ශාන්තිකර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ තාක්ෂණික උපදේශක ආදී ගෞරවනීය තනතුරු රැසක් හෙබවීය. තවද හෙතෙම නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී, එන්බී කැපිටල් ලිමිටඩ් - බංග්ලාදේශය, ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී, යුනිඩිල් පැකේජින් ලිමිටඩ්, යුනිඩිල් පැකේජින් ඇන්ඩ් සොලියුෂන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ ධූරයන් දැරීය.

**වර්තමාන තනතුරු**

ලොව පස්වැනි විශාලතම ගිණුම්කරණ ජාලය වන BDO හි දේශීය නියෝජිතයා වන BDO පාර්ට්නර්ස් හි කළමනාකරණ හවුල්කරුවකු වශයෙන් රාජපක්ෂ මහතා කටයුතු කරයි. මේ වන විට ඒ මහතා මහජන බැංකුවේ සභාපති, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුරන්ස් පීඑල්සී හි නියෝජ්‍ය සභාපති වශයෙන් තනතුරු හොබවයි. ඒ මහතා හේකාර්බ් පීඑල්සී, ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් පීඑල්සී, හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩින්ග්ස් හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරයකු වශයෙන් සහ බංග්ලාදේශයේ ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරයි.
රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකි.

ඔහුගේ විශේෂඥ භාවය සියළුම ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සහ ක්‍රියාකාරකම්, මූල්‍ය ක්ෂේත්‍රයන් සහ ආචාරධර්ම, රජයේ රෙගුලාසි, රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකේම සමස්ත කළමණාකරණ ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්ති වලින් සමන්විත වේ.


7


8


9


10

**2. කොරලි පීටර්ස් මහත්මිය**
විධායක නොවන ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂිකා

2020 පෙබරවාරි 19 වැනි දින කොරලි පීටර්ස් මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කෙරිණි. අදාළ පත්වීමේ බලාත්මක දිනය 2020 මාර්තු 1 වැනි දින විය.

**සුදුසුකම්**

එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකාවක වන පීටර්ස් මහත්මිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි අධි සාමාජිකාවකි. සසෙක්ස් විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිධාරිනියක වන ඇය එඩින්බර්ග්හි Heriot-Watt විශ්ව විද්‍යාලයේ MBA උපාධිය ද ඇය සතුවේ.

**දරන ලද තනතුරු/ පළපුරුද්ද**

වසර (2010) දී පීටර්ස් මහත්මිය මූල්‍ය අධ්‍යක්ෂිකාවක් වශයෙන් ෆින්ලේ ආයතනය සමඟ එක්වූ අතර 2016 දී ඒ මහත්මිය හපුගස්තැන්න ප්ලාන්ටේෂන්ස් පීඑල්සී සහ උඩුපුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් පීඑල්සී හි මූල්‍ය අධ්‍යක්ෂිකාව වශයෙන් පත් කරන ලදුව 2020 දක්වා අදාල තනතුරු දරන ලදී. ඒ මහත්මිය රිචඩ් පීරිස් සමාගමේ සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය වශයෙන් ද කටයුතු කළාය.

**වර්තමාන තනතුරු**

පීටර්ස් මහත්මිය සෙලාන් බැන්ක් පීඑල්සී, බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී, R I L ප්‍රොපර්ටි පීඑල්සී, යුනයිටඩ් මෝටර්ස් ලංකා පීඑල්සී සහ හේමාස් ෆාමසූටිකල් ලිමිටඩ් හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂිකාවක වන අතර කොම්පස් ඇඩ්වයිසරි සර්විසස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරියකි. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි කවුන්සිල සාමාජිකාවකි.

**3. රොහාන් පතිරගේ මහතා**
*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 ජූලි 07 වැනි දින රොහාන් පතිරගේ මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

වෘත්තියෙන් නීතිඥයකු වන පතිරගේ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධිධරයකු සහ නවසීලන්තයේ මැසේ විශ්ව විද්‍යාලයේ බැංකු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධරයෙකි. ඒ මහතා බැංකුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාභියෙකි.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

පතිරගේ මහතා මහජන බැංකුවේ මානව සම්පත්, නීති සහ පරිපාලන අංශ සම්බන්ධ 26 වසරක පළපුරුද්දක් සහිත වෘත්තිකයෙකි. මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරී - මානව සම්පත් සහ නීති, වශයෙන් ඒ මහතා දහසකට අධික බැංකුවේ දැවැන්ත සේවක මණ්ඩලය කළමනාකරණය කරමින් මානව සම්පත් අවශ්‍යතා අනුව ජ්‍යෙෂ්ඨ විධායක බඳවාගැනීම් සම්බන්ධයෙන් ද කටයුතු කළේය.එයට අමතරව, ඔහු බැංකුවේ සාමාජිකයින් 70 කින් සමන්විත නීති අංශය මෙහෙයවයි. හෙතෙම 2010 අගෝස්තු සිට 2019 මාර්තු දක්වා මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වශයෙන් කටයුතු කළේය. ඒ මහතා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ විවිධ අනුකමිටු වෙත පරිපාලන සහාය ද ලබා දෙන ලදී. මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වශයෙන් සිය ධූර කාලය තුළ හෙතෙම පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් ප්‍රචලිත කිරීම සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කළේය.

**වර්තමාන තනතුරු**

පතිරගේ මහතා මහජන බැංකුවේ විදේශ ගනුදෙනුකාර සේවාවන් සම්බන්ධ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වේ. හෙතෙම බැංකුවේ විදේශ ප්‍රේෂණ ව්‍යාපාරය සහ විදේශ මුදල් ගිණුම් අධීක්ෂණය කරයි. ඒ මහතා පීපල්ස් ලිසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සභාපති, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමිටඩ්, ලන්කන් එලයන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් - බංග්ලාදේශය, පීපල්ස් ට්‍රැවල්ස් ලිමිටඩ් යන සමාගම් වල අධ්‍යක්ෂවරයකු වශයෙන් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි විකල්ප අධ්‍යක්ෂ වරයකු වශයෙන් කටයුතු කරයි.

**4. සුදර්ශන් අහංගම මහතා**
*විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19 වැනි දින සුදර්ශන් මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

සුදර්ශන් අහංගම මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

ඒ මහතා පසුගිය වසර 15 පුරා MAS හෝල්ඩින්ග්ස් හි මූල්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් සේවය කළේය. හෙතෙම විවිධ කලාපයන්හි රටවල් දාහතක් පුරා මූල්‍ය අංශයේ වගකීම් දරන ලදී. ඒ මහතා ඒකාබද්ධකිරීම් සහ අත්පත් කරගැනීම්, වෙන්චර් කැපිටල් ආයෝජන සහ ප්‍රතිව්‍යුහගතකරණ කාර්යයන්හි විශේෂඥයෙකි. එයට පෙර අහංගම මහතා වසර දාහතරක් ජෝන් කීල්ස් සමූහය සමඟ කටයුතු කළේය. හෙතෙම ජෝන් කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස්හි කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් සහ ජෝන් කීල්ස් සමූහයේ මූල්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩල රැසක සේවය කළේය. එමෙන්ම ඔහු ජෝන් කීල්ස් ආයතනයේ මෘදුකාංග පද්ධතීන් බාහිරකරණය සම්බන්ධ කටයුතු වල වගකීම් දැරිය.

**වර්තමාන තනතුරු**

මහජන බැංකුව, ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්, බංග්ලාදේශය, ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් සහ MAS සමූහ සමාගමෙහි අධ්‍යක්ෂ ධූරයන් හොබවයි.

**5. රංජිත් කොඩිතුවක්කු මහතා**
*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 අගෝස්තු 18 වැනි දින කොඩිතුවක්කු මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

කොඩිතුවක්කු මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය විශේෂ ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති උපාධිධාරියෙකු, එක්සත් රාජධානියේ නිව් බකිංහැම්ෂයර් විශ්වවිද්‍යාලයේ නීති ගෞරව උපාධිධාරියෙකු, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතිකලත් සාමාජිකයෙකු ද වේ.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

1982 දී මහජන බැංකුවෙන් වෘත්තීය ජීවිතය ඇරඹි කොඩිතුවක්කු මහතා දේශීය හා විදේශීය වශයෙන් විවිධ ධූරයන් දරමින් බැංකුකරණය සම්බන්ධ විවිධ වූ මානයන් ඔස්සේ දැනුම සහ අත්දැකීම් රැසක් ලබා ගත්තේය. හෙතෙම ශාඛා බැංකුකරණය, ගණුදෙනුකාර බැංකුකරණය, ආයතනික බැංකුකරණය, විදේශ බැංකුකරණය, ජාත්‍යන්තර බැංකුකරණය, ව්‍යාපෘති මූල්‍යකරණය අයකර ගැනීම් සහ ඩිජිටල්කරණ ආදී ක්ෂේත්‍රයන්හි විශේෂඥයෙකි.

ඒ මහතා බැංකුවේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය තුළ දැවැන්ත කාර්යභාරයක් ඉටුකරන ලද අතර එහිදී ඩිජිටල් පදනම වෙත යහ ක්‍රියාකාරකම් ආදේශ කිරීම වෙනුවෙන් බැංකුව දෙස් විදෙස් සම්මාන හා ඇගයුම් රැසකින් පුද ලද අතර එහි ගෞරවය කොඩිතුවක්කු මහතා වෙත හිමිවේ.

**වර්තමාන තනතුරු**

2020 ජූනි 19 වැනි දින සිට හෙතෙම මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් සේවය කරයි. මූල්‍ය ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා ලිමිටඩ් සභාපතිවරයා වන ඒ මහතා පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී, පීපිල්ස් ට්‍රැවල්ස් ලිමිටඩ්, ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්, බංග්ලාදේශය, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය, ලංකා ක්ලියර් සමාගම, ජාතික ගෙවීම් කවුන්සිලය, සීමාසහිත ශ්‍රී ලංකා බැංකු සංගමය, ලංකා මූල්‍ය සේවා කාර්යාංශය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධ්‍යක්ෂ ධූරයන් හොබවයි.

**6. චනුර විජේතිලක මහතා**
*විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19 වැනි දින චනුර විජයතිලක මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

විජේතිලක මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් සහ එක්සත් රාජධානියේ ජාත්‍යන්තර වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකයෙකි. එමෙන්ම ඒ මහතා ඉන්දියාවේ ICFAI විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ලබා ගත්තේය.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

බැංකුකරණ ක්ෂේත්‍රයේ වසර තිස් පහකට අධික පළපුරුද්දක් සහිත විජේතිලක මහතා ඉන් වසර දාහතරක් කොමර්ෂල් බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ ආයතනික කළමනාකාරීත්වය තුළ ධූරයන් හෙබවීය. එහිදී ඒ මහතා ණය ලබාදීම, අනුකූලතාව සහ ශාඛා පරිපාලනය යන විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කළේය. හෙතෙම බැංකුවේ අවදානම් මත පදනම් වූ අනුකූලතා ආකෘතිය සහ අවදානම් මත පදනම් වූ අනුකූලතා විගණන පද්ධතිය ස්ථාපනය කිරීම කෙරෙහි පුරෝගාමීව ක්‍රියා කළේය.

ඔහු විසින් වසර පහක කාලයක් පුරා බැංකුවේ විශාල කලාප දෙකක විකිණුම් සහ ලාභ වර්ධනය උපරිම තත්වයකට ගෙන ඒම සඳහා ක්‍රමෝපාය සැකසීම සහ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් කටයුතු කළේය. ඒ මහතා බැංකුවේ ශාඛා කළමනාකරුවන් සහ ණය නිලධාරීන් වෙත ණය ලබාදීම පිළිබඳ පුහුණු සිදුකරන බැංකු අභ්‍යන්තර සම්පත් පිඨයේ සාමාජිකයෙකුද විය.

කොමර්ෂල් බැංකුවේ දිගු සේවා කාලය තුළ ඒ මහතා බැංකුව නියෝජනය කරමින් සිංගප්පූරුව, බංග්ලාදේශය, චීනය සහ ජර්මනිය යන රටවල් හිදී පුහුණු වැඩසටහන් කිහිපයකට සහභාගි විය. හෙතෙම කොමර්ෂල් බැංකුවෙන් විශ්‍රාම ලැබීමෙන් පසු කෙටි කලක් සොෆ්ට්ලොජික් ෆිනෑන්ස්

පීඑල්සී හි අනුකූලතා සහකාර සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් සේවය කළේය.

**වර්තමාන තනතුරු/සහභාගීත්වයන්**

විජේතිලක මහතා මේ වනවිට ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකුකරණ අධ්‍යයන මධ්‍යස්ථානයේ පවත්වන පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයකු වශයෙන් සහභාගී වේ.

### 7. අශෝක බණ්ඩාර මහතා

*විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19 වැනි දින අශෝක බණ්ඩාර මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

එක්සත් රාජධානියේ අලෙවිකරුවන්ගේ ආයතනයේ අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති උපාධිය ඒ මහතා සතු වේ.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

අශෝක බණ්ඩාර මහතා සතුව බහුජාතික සමාගම් සහ ප්‍රකට දේශීය සමාගම් වල ඉල්ලුම් උත්පාදන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර ප්‍රවර්ධනය සම්බන්ධ වසර තිහකට අධික අත්දැකීම් පවතී. මේ මහතා නෙස්ලේ ලංකා සමාගමේ MANCOM සාමාජිකයෙකු සහ ඩෙල්මේජ් ෆෝසයිත් සමූහ සමාගමේ සමූහ කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් සේවය කළේය. ඒ මහතාගේ මූලික හැකියාවන් අතරට සන්නාම ගත ව්‍යාපාරයන් ගොඩ නැංවීම සහ ව්‍යාපාර කණ්ඩායම් නිර්මාණය කිරීම ඇතුළත් වේ.

**වර්තමාන තනතුරු**

ඒ මහතා ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම, ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම සහ බිල්ඩ්මාර්ට් ලංක හි අධ්‍යක්ෂක ධූරයන් හොබවයි. මේ වන විට බණ්ඩාර මහතා ප්‍රධාන පෙළේ දේශීය සමූහ සමාගම් වෙත කළමනාකරණ උපදේශන සේවා සපයයි. පුහුණුකරුවෙකු වශයෙන් ඒ මහතා විදේශීය පුහුණු කටයුතු ද ඇතුළුව කණ්ඩායම් නායකත්වය ගොඩනැංවීම සහ පෞරුෂ ගොඩනැංවීම සම්බන්ධව විශේෂඥභාවයක් උසුලන අතර ව්‍යාපාර පරිපාලනවේදී ඉගැන්වීම්වලදී නායකත්වය, ක්‍රමෝපායික කළමනාකරණය සහ විකිණුම් කළමනාකරණය වැනි විෂයයන් පිළිබඳ පුළුල් දැනුමක් ඒ මහතා සතු වේ. ඔහුගේ ගැටළු කළමනාකරණ නිපුණතාවයන් උපයෝගී කරගනිමින් ඒ මහතා ක්ෂේත්‍රයේ නියාමන ආයතනයන් සහ ප්‍රධාන පෙළේ පාර්ශවකරුවන් අතර මැදිහත්කරුවෙකු වශයෙන්ද කටයුතු කරයි. ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේගේ සංගමයෙහි උප සභාපතිවරයා වන හෙතෙම ලංකා රසකැවිලි නිෂ්පාදකයින්ගේ සංගමය සහ ලංකා වාණිජ මණ්ඩලයේ කමිටු සාමාජිකයකු වශයෙන් කටයුතු කරයි.

### 8. ක්ලයිව් ෆොන්සේකා මහතා

*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19වැනි දින ෆොන්සේකා මහතා සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු වන ෆොන්සේකා මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි. ඒසීඅයි ගනුදෙනු සහතිකය වෙනුවෙන් ඒ මහතා වෙත විශිෂ්ට සාමාර්ථයක් හිමිවුණු අතර භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳ 27 වසරකට අධික අඳත්දැකීම් ඒ මහතා සතු වේ. හෙතෙම ඕස්ට්‍රේලියාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි සහතිකලත් සාමාජිකයෙකුද වේ.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

ෆොන්සේකා මහතා ඇමරිකන් එක්ස්ප්‍රස් බැංකුවේ සහ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ සේවය කළේය. ඒ මහතා 2018 සිට 2020 දක්වා ප්‍රාථමික නියෝජිතයින්ගේ සංගමයෙහි සභාපතිවරයා වශයෙන් කටයුතු කළේය. හෙතෙම ජාතික ගෙවීමේ කවුන්සිලය, මූල්‍ය පද්ධති ස්ථාවරත්ව උපදේශන කමිටුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විකල්ප කඩඉම් පොලී අනුපාත අධ්‍යයන හා නිර්මාණ කාර්යසාධන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය. තවද ඒ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි IABF/DABF විභාග වල ප්‍රධාන විභාග පරීක්ෂක වශයෙන් කටයුතු කළේය.

**වර්තමාන තනතුරු**

2002 දී මහජන බැංකුවේ සේවයට එක් වූ ෆොන්සේකා මහතා 2011 නොවැම්බර් මස සිට බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායමෙහි කටයුතු කළේය. මේ වන විට ඒ මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මූල්‍ය වෙළඳපල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ වෙළඳපල කාර්ය කණ්ඩායම් සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි. පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂකවරයෙකු වන ඒ මහතා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සම්බන්ධයෙන් මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරයා වෙත විකල්ප අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් කටයුතු කරයි.

### 9. අසාම් ඒ අහමත් මහතා

*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

අසාම් ඒ අහමත් මහතා 2019 දෙසැම්බර් 30 වැනි දින සමාග මෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

ඒ මහතා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ, එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි. හෙතෙම එක්සත් රාජධානියේ අවදානම් කළමනාකරණ ආයතනයේ තාක්ෂණික විශේෂඥයෙකු, ඕස්ට්‍රේලියාවේ සහතිකලත් කාර්යයේ නියුතු ගණකාධිකාරිවරයෙකු සහ එක්සත් රාජධානියේ වරලත් සුරැකුම් සහ ආයෝජන ආයතනයේ සාමාජිකයෙකු වේ.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

අහමත් මහතා සතුව ක්‍රමෝපායික කළමනාකරණය, විකල්ප ආයෝජන සහ අවදානම් සම්බන්ධයෙන් දේශීය හා විදේශීය වශයෙන් වසර දහඅටකට වැඩි අත්දැකීම් පවතී. ඔහුගේ පෙර සේවායන් අතරට අදාල වෙළඳපල වල දැවැන්ත බහුජාතික වෘත්තීය සේවා ආයතන ඇතුළත් වේ.

**වර්තමාන තනතුරු**

අහමත් මහතා 2017 ජනවාරි 3 වෙනි දින සිට මහජන බැංකුවේ මූල්‍ය ප්‍රධානි වශයෙන් කටයුතු කරයි. ඒ මහතා ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් බංග්ලාදේශ සමාගමෙහි අධ්‍යක්ෂවරයකු වේ.

### 10. ලක්මිණී කෝට්ටෙගොඩ මහත්මිය

*සමාගම් ලේකම්*

ලක්මිණී කෝට්ටේගොඩ මහත්මිය 2018 ජූලි 30 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සමාගම් ලේකම් වශයෙන් පත් කරන ලදී.

**සුදුසුකම්**

නීතිවේදී වූ උපාධිධාරි නීතිඥවරියකි.

**දරන ලද තනතුරු**

කෝට්ටෙගොඩ මහත්මිය පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සහ පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගමෙහි සමාගම් ලේකම්වරිය වශයෙන් කටයුතු කළාය.



1



2



3



4



5



6

**1. ෂමින්ද්‍ර මර්සලින් මහතා**
*(ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී)*

2020 නොවැම්බර් මාසයේ දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමග සම්බන්ධ විය.

**සුදුසුකම්**

B.Sc. (ගෞරව) සිටි විශ්ව විද්‍යාලය, ලන්ඩන්, එක්සත් රාජධානිය මූල්‍ය උපදේශකයන්ගේ ජාත්‍යන්තර සුදුසුකම (FAIQ), වරලත් රක්ෂණ ආයතනය, එක්සත් රාජධානිය, 2008.

**දරනලද තනතුරු**

DFCC බැංකුවේ ජ්‍යෙෂ්ඨ උප සභාපති/ ආයතනික බැංකු කටයුතු ප්‍රධානී. DFCC බැංකුවේ විධායක කළමනාකරණ කමිටුවේ (EXCO) සාමාජික.

මාලදිවයිනේ HSBC නේවාසික කළමනාකරු, HSBC ශ්‍රී ලංකාහි සමූහ මූල්‍ය ආයතන සහ රාජ්‍ය අංශයේ ප්‍රධානී සහ HSBC ශ්‍රී ලංකා වෙල්ත් මැනේජ්මන්ට් ඇන්ඩ් ඉන්ෂුවරන්ස් කළමනාකරු යනාදී තනතුරු හොබවා ඇත.

**අත්දැකීම්**

ආයතනික හා ගෝලීය බැංකුකරණය, ආයෝජන බැංකුකරණය, රිටේල් බැංකුකරණය, ණය පරිපාලනය සහ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ වසර 23 ක පළපුරුද්ද.

HSBC සමූහය තුළ ශාඛා හා විදෙස් ව්‍යාපාරවලට අදාළ නිෂ්පාදන සංවර්ධනය, උපදේශනය, ව්‍යුහගතකරණය හා මූල්‍යකරණය, ණය පරිපාලනය සහ මෙහෙයුම් පිළිබඳ පළපුරුද්ද.

ආයතනික ව්‍යාපාරික අරමුණු වලට අනුකූලව සංවිධානයේ සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නව ව්‍යාපාරික වැඩසටහන්, පද්ධති/ ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂඥ දැනුම.

**වත්මන් තනතුරු**

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ්, පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමිටඩ් සහ ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් - බංග්ලාදේශයහි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි.


7


8


9


10

**2. සංජීව බණ්ඩාරනායක මහතා**
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී*

2007 ජූලි මාසයේදී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ සම්බන්ධ විය.

**සුදුසුකම්**

FCA, FCMA (ශ්‍රී ලංකාව), FCMA (ඕස්ට්‍රේලියාව), CIMA (එක්සත් රාජධානිය) - අවසන් අදියර

**දරන ලද තනතුරු**

ශ්‍රී ලංකා කල්බදු සංගමයේ සභාපති, ආසියානු මූල්‍ය සේවා සංගමයේ (AFSA) උප සභාපති, ලංකා වාණිජ මණ්ඩලයේ කාරක සභික සහ ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ (SLICM) කවුන්සිල සාමාජික, ප්‍රධාන විධායක නිලධාරී පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කාරක සභාවේ සාමාජික.

**අත්දැකීම්**

මූල්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ ඉහළම මට්ටමේ වසර 27 කට වැඩි පළපුරුද්ද

**වත්මන් තනතුරු**

ශ්‍රී ලංකා කල්බදු සංගමයේ සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂක, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සංගමයේ කවුන්සිල සාමාජික සහ සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගමේ අධ්‍යක්ෂ.

**3. ලයනල් ප්‍රනාන්දු මහතා**
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ 1995 වසරේ දී සම්බන්ධ විය.

**සුදුසුකම්**

ACA, IBSL හි සම සාමාජික, ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකාව). ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ (ACMA) සම සාමාජික.

**අත්දැකීම්**

මහජන බැංකුව ඇතුළුව බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රවල වසර 32 කට වැඩි පළපුරුද්ද.

**වත්මන් තොරතුරු**

පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී, අල්-සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකයේ ප්‍රධානී සහ රන් ණය මෙහෙයුම් භාර නිලධාරී. ජාතික දුම්රිය කෞතුකාගාර (ඇප) සමාගමෙහි අධ්‍යක්ෂ.

**4. රොහාන් තෙන්නකෝන් මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ 1998 වසරේ දී සම්බන්ධ විය.

**සුදුසුකම්**

MBA (කොළඹ), MSc (කළමනාකරණ) - (ශ්‍රී ජයවර්ධනපුර), BSc - ව්‍යාපාර පරිපාලන (දෙවන පන්තියේ ඉහළ/ශ්‍රී ජයවර්ධනපුර), AIB (ශ්‍රී ලංකාව) සහ APBSL සාමාජික ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික සහතිකපත්ධාරියෙකු වේ.

**දරන ලද තනතුරු**

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සංගමයේ (FHA) උප සභාපති සහ 2015 සහ 2017 වර්ෂ සඳහා ක්‍රීඩා උප කමිටුවේ ව්‍යාපෘති ප්‍රධානී. වාණිජ මණ්ඩලය තුළ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සංගමයේ නියෝජිත. අල්-සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය

**අත්දැකීම්**

ලීසිං ක්ෂේත්‍රයට බැඳීමට පෙර ගිණුම්කරණය, නිෂ්පාදනය, අපනයනය සහ බැංකුකරණය වැනි විවිධ ක්ෂේත්‍රයන්හි වසර 31 ක පළපුරුද්දක් ඇති අතර අලෙවිකරණය සහ ව්‍යාපාර සංවර්ධනය, ශාඛා මෙහෙයුම්, ණය සම්බන්ධයෙන් අත්දැකීම් බහුල වේ. වර්තමානයේ දී අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුවට සම්බන්ධ ව කටයුතු කරන අතර නීති, ලියකියවිලි සහ DMT සම්බන්ධීකරණ ඒකකය අධීක්ෂණය කරයි.

**වත්මන් තනතුරු**

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අනුකූලතා නිලධාරී. පසුගිය වසර හය පුරාම SLIM - NASCO හි ජූරි මණ්ඩල සභික.

**5. දමිත් මලවිතන්තිල මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ප්‍රතිසාධන සහ පරිපාලන*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ 1996 වසරේ දී සම්බන්ධ විය.

**සුදුසුකම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් අදියර සහ IBSL අන්තර් මාධ්‍ය අදියර සපුරා ඇත.

**අත්දැකීම්**

බැංකු හා මූල්‍ය පිළිබඳ වසර 36 කට වැඩි පළපුරුද්ද මෙන් ම විගණනය සහ ගිණුම්කරණය පිළිබඳ වසර ගණනාවක පළපුරුද්ද. වසර නවයකට වැඩි කාලයක් පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරීවරයා ලෙස සේවය කර ඇත. තවද, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි වසර 10 ක පමණ කාලයක් ප්‍රතිසාධන අංශයේ ප්‍රධානී ලෙස කටයුතු කළ අතර පසුව 2007 වසරේ දී ශාඛා මෙහෙයුම් වලට සම්බන්ධ වී මුළු දිවයිනම ආවරණය වන පරිදි ශාඛා මෙහෙයවීය. දැනට ප්‍රතිසාධන හා පරිපාලන ප්‍රධානී ලෙස කටයුතු කරයි.

**වත්මන් තනතුරු**

පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පීඑල්සී හි පූර්ණ අනුබද්ධ ආයතනයක් වන පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ.

**6. ලක්සඳ ගුණවර්ධන මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි*

2002 වසරේ දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ සම්බන්ධ විය.

**සුදුසුකම්**

MBA, MSc උපායමාර්ගික අලෙවිකරණය, AICM – SL, ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා - SLICM, CMA (ඕස්ට්‍රේලියාව), CPM (ආසියාව), SLIMහි සහතිකලත් සාමාජික, SLID සාමාජික, CPM ශ්‍රී ලංකා සාමාජික.

**දරන ලද තනතුරු**

වසර 10 ක කාලයක් ආයතනික කල්බදු අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

**අත්දැකීම්**

ණය, අලෙවිකරණය, අයකර ගැනීම්, ශාඛා සංවර්ධන හා මෙහෙයුම් යන අංශයන්හි ආයතනික හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍යකරණයේ වසර 26 කට වැඩි පළපුරුද්දක් ඇත.

**වත්මන් තනතුරු**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන පීපල්ස් මයික්‍රෝ-කොමර්ස් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ.

**7. ප්‍රභාත් ගුණසේන මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (සමූහ)

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ 1999 වසරේ දී සම්බන්ධ විය.

MBA (බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලය), පරිගණක පද්ධති සැලසුම් කිරීම පිළිබඳ ඩිප්ලෝමාව - NIBM (ශ්‍රී ලංකාව). ව්‍යාපෘති කළමනාකරණය තොරතුරු පද්ධති, තොරතුරු විද්‍යාව පිළිබඳ ආයතනය, සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලය

**අත්දැකීම්**

පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පීඑල්සී හි වසර 22 ක පළපුරුද්ද.

**වත්මන් තනතුරු**

බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සාමාජික, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ප්‍රධානී.

**8. උදේෂ් ගුණවර්ධන මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණනය*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ 1999 වසරේ දී සම්බන්ධ විය.

**සුදුසුකම්**
ACA, ACMA (ශ්‍රී ලංකාව), භාණ්ඩාගාර කටයුතු, ආයෝජන හා අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (IBSL), ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ ලෝක ත්‍යාගලාභී.

**දරන ලද තනතුරු**
බංග්ලාදේශයේ ලංකා එලයන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හි ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ සමාගම් ලේකම් ලෙස අනුයුක්ත පදනමින් සේවය කර ඇත.

**අත්දැකීම්**
ගිණුම්කරණය, විගණනය, මූල්‍ය කළමනාකරණය සහ භාණ්ඩාගාර කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මූල්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 21 ක පළපුරුද්ද.

**වත්මන් තනතුරු**
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (BAC) ලේකම්.

**9. රනිල් පෙරේරා මහතා**
*සහකාර සාමාන්‍යාධිකාරී - ප්‍රතිසාධනය*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ 1999 වසරේ දී සම්බන්ධ විය.

**සුදුසුකම්**
කලාපීය සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (කොළඹ), MBA (මනිපාල්), ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ), වාණිජවේදී (විශේෂ) ජාත්‍යන්තර වෙළඳාම (ශ්‍රී ජයවර්ධනපුර), CIM (එක්සත් රාජධානිය) සහ වරලත් ගණකාධිකාරී ආයතනය හි අර්ධ සුදුසුකම්.

**අත්දැකීම්**
පීපල්ස් ලීසිං සමූහයේ වසර 21 කට වැඩි පළපුරුද්ද.

**10. සුජීවා රණසිංහ මහත්මිය**
*සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ 2021 පෙබරවාරි මාසයේදී සම්බන්ධ විය.

**සුදුසුකම්**
LLB - කොළඹ විශ්ව විද්‍යාලය.

**දරන ලද තනතුරු**
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි මානව සම්පත් අංශයේ ප්‍රධානී ලෙසින් කටයුතු කිරීම.

**අත්දැකීම්**
පෞද්ගලික වාණිජ බැංකුවක වසර 26 කට වැඩි පළපුරුද්දක් ඇති අතර වසර 22 කට වැඩි කාලයක් මානව සම්පත් කළමනාකරණයේ යෙදී සිටී.

**2021 මාර්තු 31 දිනට ආයතනික කළමනාකරණය*

# අනුකූලතා අවදානම් කළමනාකරණය

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පීපල්ස් ලීසිං) පුළුල් පරාසයක මූල්‍ය සේවා සපයන අතර එහි ප්‍රතිඵලයක් ලෙස තදින් නියාමනය කළ පරිසරයක් තුළ සිය වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මේ අනුව, සමාගමට අදාළ වන නීති, රීති, රෙගුලාසි, ප්‍රමිති, අභ්‍යන්තර ප්‍රතිපත්ති / ක්‍රියා පටිපාටි සහ චර්යාධර්ම පද්ධතියට අනුකූල වීම කෙරෙහි පීපල්ස් ලීසිං ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙයි. අපගේ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය පවත්වා ගැනීම සහ අපගේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම මෙහි දී අතිශයින්ම වැදගත්ය.

පීපල්ස් ලීසිං ආයතනය තුළ අනුකූලතා අවදානම් කළමනාකරණය සඳහා වන මූලධර්ම හා ප්‍රමිතීන් සකස් කිරීම සඳහා ශක්තිමත් අනුකූලතා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. එහි පරමාර්ථය වන්නේ පීපල්ස් ලීසිං ආයතනික සංස්කෘතියේ කොටසක් ලෙස ඵලදායී ආකාරයකින් ආයතනයේ සෑම දෙපාර්තමේන්තුවක ම අවංකභාවය සහ සත්‍යවාදී බව සුරක්ෂිත කරන ප්‍රමිතීන් පවත්වා ගෙන යෑමයි. මෙම ප්‍රතිපත්තිය කෙරෙහි දක්වනු ලබන සමස්ත අනුකූලතාවය පීපල්ස් ලීසිං මූල්‍ය ආයතනයේ සෑම සාමාජිකයෙකුගෙන් ම අපේක්ෂා කෙරෙන අතර එය ව්‍යාපාරයේ අනිවාර්ය අංගයක් ලෙස සලකනු ලැබේ.

මූලික නීතිය, ව්‍යවස්ථාපිත බලධාරීන් සහ නියාමකයින්/ අධීක්ෂකවරුන් විසින් නිකුත් කරන ලද නීති රීති සහ ප්‍රමිති, වෙළඳපළ සම්මුතීන්, කර්මාන්ත සංගම් විසින් ප්‍රවර්ධනය කරන ලද යහපුරුදු පිළිබඳ ආචාර ධර්ම මාලාවන්, අභ්‍යන්තර ප්‍රතිපත්ති/ ක්‍රියා පටිපාටි, සමාගම අභ්‍යන්තරයේ කාර්ය මණ්ඩලය වෙත පනවන ලද ආචාර ධර්ම පද්ධති ඇතුළු විවිධ ප්‍රභවයන් ඇති නීති, රීති සහ ප්‍රමිතිවල අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම ප්‍රතිපත්තිය සැලසුම් කර ඇත.

### අපගේ අනුකූලතා දර්ශනය

ව්‍යාපාරය පවත්වා ගෙන යෑමේ දී එය උසස් ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර, සෑම විටම, ප්‍රමිතීන්හි ඉහළ ම සාරය මෙන්ම නීතියේ විධි විධාන සුරැකීම සඳහා කටයුතු කළ යුතුය. සමාගමේ අනුකූලතා දර්ශනයේ ප්‍රධාන කොටස් පහත පරිදි වේ;

- **අනුකූලතාවයේ හිමිකාරීත්වය;** අනුකූලතාව සම්බන්ධයෙන් ඉහළ ම අවධානයක් යොමු කිරීම සඳහා බැඳී සිටී. අනුකූලතා අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ මූල්‍ය ආයතනය හරහා අනුකූලතා අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා පීපල්ස් ලීසිං අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.
- **සාමූහික අනුකූලතා වගකීම;** අනුකූල වීම සංවිධානයේ සෑම පුද්ගලයෙකුගේම වගකීමක් වන අතර සියළුම කාර්ය මණ්ඩලය දැනුවත්ව සිටීම හා අදාළ නීති හා රෙගුලාසි පිළිපැදීම අවශ්‍ය වේ.
- **අනුකූලතා සංස්කෘතිය;** පීපල්ස් ලීසිං සිය ව්‍යාපාර පුරා සුදුසු අනුකූලතා සංස්කෘතියක් පවත්වා ගැනීම සඳහා අනුකූලතා බැඳීම් සහ ආචාර ධාර්මික වටිනාකම් පිළිබඳ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කරයි. අනුකූලතාවය අනුකූලතා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකමක් ලෙස පමණක් නොව මූල්‍ය ආයතනය පුරා පැතිරෙන සංස්කෘතියක් ලෙස ද සැලකේ.
- **ස්වාධීනත්වය;** අනුකූලතා දෙපාර්තමේන්තුව යනු ස්වාධීන අංශයක් වන අතර එමගින් අනුකූලතාවයට අදාළ කාර්යයන් / ව්‍යාපාරවල ප්‍රතිපත්ති සහ භාවිතයන් පිළිබඳ තක්සේරු කිරීම සහ ප්‍රකාශ කිරීම සිදු කරයි.
- **සන්නිවේදනය;** පීපල්ස් ලීසිං හි ධූරාවලි පිළිබඳ සැලකිලිමත් වීමකින් තොරව සැබෑ/ විභව අනුකූලතා උල්ලංඝනය කිරීම් පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට හැකි වන පරිදි ඉහළ මෙන් ම පහළ ස්ථරයන් තුළ විවෘත සන්නිවේදන මාර්ගයක් නිර්මාණය කර තිබේ.
- **අනෙකුත් දෙපාර්තමේන්තු හා ශාඛා සමඟ සම්බන්ධීකරණය;** අනුකූලතා අවදානම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අනුකූලතා දෙපාර්තමේන්තුව වෙනත් දෙපාර්තමේන්තු හා ශාඛා සමඟ සමීප සම්බන්ධීකරණයකින් කටයුතු කරයි.
- **අනුකූලතා කාර්ය සාධනය තක්සේරු කිරීම;** පීපල්ස් ලීසිං විසින් සේවකයින්ගේ සමස්ත කාර්ය සාධන කළමනාකරණ ලකුණු පුවරුව තුළ අනුකූලතා අවදානම් කළමනාකරණයට අදාළ ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඒකාබද්ධ කර ඇති අතර එමඟින් සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් අනුකූලතාවයට ප්‍රමුඛතාවය ලබා දේ.

### අනුකූලතා සංස්කෘතියේ ප්‍රධාන අංග

පීපල්ස් ලීසිංහි , අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සෑම විටම අනුකූලතාවයේ සහ ආචාරධාර්මික ව්‍යාපාරික භාවිතයන්ගේ වැදගත්කම සන්නිවේදනය කරමින් අනුකූලතාවයේ ස්වරය සකස් කරනු ඇත. වෙනස් වන අනුකූලතා අවශ්‍යතා සපුරාලීම සඳහා නෛතික හා නියාමන රාමුවට අනුකූලව අභ්‍යන්තර ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි නිරන්තරයෙන් සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අපගේ අනුකූලතා ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි කිහිපයක් සමාලෝචනය කර යාවත්කාලීන කරන ලද අතර පිළිවෙලින් නව අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ කිහිපයක් සම්මත කර නිකුත් කරන ලදී. වර්ෂය තුළ හඳුන්වා දුන් නව ප්‍රතිපත්ති සඳහා කරුණාකර 112 පිටුව බලන්න.




අදාළ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුකූලතා ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් සමඟ අනුකූලතා සංස්කෘතිය ශක්තිමත් විය. තවද, සමාගමේ අනුකූලතා උපායමාර්ගයේ කොටසක් ලෙස, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සෑම කාර්තුවකටම අනුකූලතා සැලැස්මක් / වැඩසටහනක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආරම්භ කරන ලදී. විගණන හා අනුකූලතා පරීක්ෂණ වලදී හඳුනාගත් සෑම ගිඩැසක් සඳහා ම අනුකූලතා පරීක්ෂණ, පුහුණුව, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම යනාදිය මෙයට ඇතුළත් ය.

පීපල්ස් ලීසිං හි අනුකූලතා අවශ්‍යතා පිළිපැදීම සංවිධානයේ ප්‍රතිලාභ ව්‍යුහය කෙරෙහි අත්‍යවශ්‍ය වන අතර සියළුම සේවකයින් සඳහා අනුකූලතා සම්බන්ධ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) මෑතකදී හඳුන්වා දීමෙන් ඔවුන්ගේ කාර්යයන්හි සවිඥානිකත්වය සහ හිමිකාරිත්වය වර්ධනය තුළින් අනුකූලතා ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සඳහා ' කැපවීමේ මට්ටම තවදුරටත් ඉහළ නැංවීමට හැකි විය.

ආචාර ධාර්මික හැසිරීම සහ අවංකභාවය සමාගමේ සියළුම කාර්ය මණ්ඩලයෙන් අපේක්ෂා කෙරේ. ව්‍යාපාර සංග්‍රහය සහ ආචාර ධර්ම පද්ධතිය සහ පීපල්ස් ලීසිංහි අභ්‍යන්තර තොරතුරු ප්‍රතිපත්තිය, සමාගමේ ව්‍යාපාරික ගනුදෙනුවලදී ආචාර ධර්ම භාවිතයන් ප්‍රවර්ධනය කරයි.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව සඳහා නියාමකයින් විසින් කිසිදු දඩයක් හෝ ක්‍රියාවක් සිදු නොකොට පීපල්ස් ලීසිං පිරිසිදු වාර්තාවක් පවත්වාගෙන යයි.

GRI 205-1

### අනුකූලතා කාර්යය සහ එහි උපායමාර්ගය

අනුකූලතා කාර්යය මෙහෙයවනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (BIRMC) සෘජුවම වාර්තා කරන ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු (අනුකූලතා නිලධාරියෙකු) විසිනි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අනුකූලතා දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සමාලෝචනය කරන ලද අතර අනුකූලතාවයේ ප්‍රමිතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් අතිරේක කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු (කාර්ය මණ්ඩල සාමාජිකයන් පහක දෙපාර්තමේන්තුවක් කරමින්) ව්‍යුහයට එක් කරන ලදී.

පීපල්ස් ලීසිං හි අනුකූලතා උපාය පහත පරිදි සාරාංශ කළ හැකිය;




අනුකූලතා වැඩසටහන - අනුකූලතා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුකූලතා වැඩසටහනක් මත ය.

නායකත්වය - ආයතනික ක්‍රියා පටිපාටිය සහ ද්‍රව්‍යමය අනුකූලතා ආශ්‍රිත වියදම් සමාලෝචනය ඔස්සේ ලබා දෙන නිර්දේශ සහ අනුමැතිය මගින් ආයතනික කළමනාකාරීත්වය, මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ සමාග මේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය සහාය සහ නායකත්වය සපයනු ලැබේ.

පරීක්ෂා කිරීම - මෙහෙයුම් පරිචයන්හි ඇති හිඩැස් හඳුනා ගැනීම සඳහා අනුකූලතා දෙපාර්තමේන්තුව අනුකූලතා පරීක්ෂණ සිදු කරයි.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වාර්ෂිකව අනුකූලතා විගණනයක් සිදු කරන අතර අවශ්‍ය විමර්ශන කටයුතු නිතිපතා සිදු කර අනුකූලතාවය අධීක්ෂණය කරයි. මාර්ගගත සහ අහඹු පරීක්ෂා කිරීම ද සිදු වේ. මෙම ක්‍රියාකාරකම් වලට අදාළ නිර්දේශ අදාළ අංශ ප්‍රධානීන් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. විනය ක්‍රියාමාර්ගවලට තුඩු දෙන නිර්දේශ මානව සම්පත් දෙපාර්තමේන්තුව සහ කළමනාකාරීත්වය විසින් විසඳනු ලැබේ.

අභ්‍යන්තර පාලනයන් - නියාමන රාමුව තුළ ඒවායේ ක්‍රියාකාරිත්වයට අදාළව අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ අත්පොත් සංවර්ධනය කිරීම සඳහා එක් එක් දෙපාර්තමේන්තුව වගකිව යුතු ය. අභ්‍යන්තර ප්‍රතිපත්ති, චක්‍රලේඛ, මාර්ගෝපදේශ, නියාමන නියෝග සහ මාර්ගෝපදේශ මෙන්ම ඒවායේ ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් අදාළ දේශීය නීති පද්ධතියට අදාළ වන බවට සහතික කිරීම පීපල්ස් ලීසිං සමාගමේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම වේ. සෑම කාර්තුවක් අවසානයේම අනුකූලතාවය තහවුරු කිරීමක් ඔවුන් විසින් සැපයිය යුතු අතර ප්‍රතිපත්ති වලින් බැහැරවීම සහ නීති/ රෙගුලාසි උල්ලංඝනය කිරීම් BIRMC වෙත වාර්තා කරනු ලැබේ.

පද්ධති පාලනයන් - අනුකූලතා උල්ලංඝනය වීම වැළැක්වීම සඳහා පද්ධති පාලනයන් යොදා ගන්නා අතර පද්ධති විගණනයන් සමග සාමාන්‍ය විගණනයන් සමග පද්ධති විගණනයන් සිදු කිරීම ඔස්සේ අනුකූලතා උල්ලංඝනය වීම් සිදුව ඇත්දැයි සොයා බැලේ.

අධීක්ෂණය - හඳුනාගත් ගැටළු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික කිරීම සඳහා පසු විපරම් විගණන පවත්වනු ලැබේ.

අඩුපාඩු/ හිඩැස් ඇති ප්‍රවණතා හඳුනාගෙන ඒවා විසඳීම සඳහා විශ්ලේෂණය කෙරේ.

සමාගමේ එක් එක් රැස්වීමේදී සමාගමේ අනුකූලතාවයේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරනු ලැබේ. අනුකූලතා නිලධාරී විසින් මාසික රැස්වීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කරනු ලබයි.

# අනුකූලතා අවදානම් කළමනාකරණය



**අනුකූලතාවය අධීක්ෂණය කිරීමේ පද්ධති**

ක්ෂේත්‍රයේ ඇති වර්තමාන භාවිතයන්ට අනුකූලව තොරතුරු රැස් කිරීම, අධීක්ෂණය, පාරිභෝගික පරීක්ෂාව සහ අනුකූලතා පාලනය සඳහා තාක්ෂණය භාවිතා කෙරේ. සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළදී, පීපල්ස් ලීසිං සිය පාරිභෝගික පරීක්ෂණ පද්ධතිය තත්‍ය කාලීන පරීක්ෂණ විසඳුමක් දක්වා ඉහළ නංවා ඇති අතර මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය මැඩපැවැත්වීම සඳහා සැක සහිත ගනුදෙනු හඳුනාගෙන වාර්තා කිරීමට වඩා හොඳින් සන්නද්ධ වීමට ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීමට ද පියවර ගෙන තිබේ.

**අනුකූලතා පුහුණුව**

සමාජ රැස්වීම් සීමා කර ඇති වසංගත සමයේ දී සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා මාර්ගගත තාක්ෂණය පුළුල් ලෙස භාවිතා කිරීමත් සමඟම, කළමනාකාරීත්වය සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සිය කාර්ය මණ්ඩලය යාවත්කාලීනව තබා ගැනීමට වෙබ් යෙදුම් භාවිත කරමින් අනුකූලතා තත්ත්වයන් හොඳින් පවත්වා ගෙන යෑමට පීපල්ස් ලීසිං සමත් වී තිබේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ තෝරාගත් සේවකයින්/කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අන්තර්ජාලය හරහා පවත්වන ලද බාහිර වැඩසටහන් වලට සහභාගී වූ අතර එමඟින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණයට එරෙහිව සටන් කිරීම, නව රෙගුලාසි පිළිබඳ විශේෂ පුහුණුවක් සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා නියාමන වාර්තාකරණ අවශ්‍යතා ආදිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. මීට අමතරව, සියළුම නව සේවකයින් සමාගමේ ක්‍රියාදාමයන් පිළිබඳව දැන හඳුනා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සඳහා ප්‍රේරණ වැඩසටහනක් ද හඳුන්වා දෙනු ලැබිණ.

## පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පීපල්ස් ලීසිං) පාලනය තුළ ඉහළ ප්‍රමිතීන්, අවංකභාවය සහ වෘත්තීයභාවය කෙරෙහි කැපවී සිටී. ගෝලීය වශයෙන් පිළිගත් හොඳම භාවිතයන් වැලඳ ගනිමින්, යහපාලන පුරුදු සිය වර්ධනයේ අඩිතාලම වශයෙන් සමාගම පිළිගන්නා අතර ඒ ඔස්සේ පාර්ශවකරුවන්ගේ විශ්වාසය හා පැහැදීම ශක්තිමත් කර ඇති බව සමාගම විශ්වාස කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය ආදර්ශයෙන් මෙහෙයවන අතර ආයතනික ව්‍යුහයේ ඉහළ සිට උසස්ම ආදර්ශය සපයයි.

### 1.1 අපගේ පාලනය ක්‍රියාවලිය සඳහා ඇති ප්‍රවේශය

ආයතනික පාලනයේ පෙරගමන්කරුවන් වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය සිය ආයතනික උපායමාර්ගික අරමුණු ශක්තිමත් ආයතනික පාලන මූලධර්මයන්ට අනුකූලව, එහි කීර්තිනාමය, සාරධර්ම සහ වත්කම් ආරක්ෂා කරමින් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සමතුලිත කර ගැනීමට හැකි වන පරිදි පවත්වා ගෙන යයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූලික සාරධර්මවලට ගැලපෙන ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කර ඇති අතර පුළුල් වගවීම, ශක්තිමත් අවදානම් සහ කාර්යසාධනය කළමනාකරණය, විනිවිදභාවය සහ ඵලදායී හා ආචාර ධාර්මික නායකත්වය යන ගුණාංග තුළින් එය මෙහෙයවයි. අභ්‍යන්තර හා බාහිර වර්ධනයන්ට අනුවර්තනය වීමට හා හොඳම භාවිතයට පරිණාමය වීමට සුදුසු වන පරිදි මෙම පාලන රාමුව නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

### 1.2 පාර්ශවකරුවන්ගේ වටිනාකම සහතික කිරීම

පීපල්ස් ලීසිං සමාගම හවුල් වටිනාකම ලබා දීමේදී සියලු පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් සහ අපේක්ෂාවන් අවබෝධ කර ගැනීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට කැපවී සිටී. වසංගත තත්ත්වයට අප දැක්වූ ප්‍රතිචාරයෙන් මෙය පැහැදිලි වන අතර 32 වන පිටුවේ දක්වා ඇති පරිදි වසංගතය තත්ත්වය යටතේ පාලනය ගෙන යෑමේ දී, COVID-19 වසංගතය ආරම්භයේ දී ම අපගේ ප්‍රමුඛතාවය වූයේ අපගේ සේවකයින්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීම සහ ඔවුන්ගේ ආදරණීයයන්ගේ මෙන් ම අපගේ සේවාදයකයන්ගේ ද ආරක්ෂාව තහවුරු කිරීමයි.

පාරිසරික, සමාජීය සහ පාලන (ESG) සාධක උපාය මාර්ග සම්පාදනය සඳහා ඇතුළත් කිරීම සහ සංවිධානයේ වර්ධනය වගකීම් සහගත සහ තිරසාර බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරයි. පාර්ශවකරුවන්ගේ මැදිහත්වීමේ යාන්ත්‍රණයන්ගෙන් ලැබෙන ප්‍රතිපෝෂණ උපාය මාර්ග සැකසීමේ ප්‍රධාන ආදානයකි.

#### ආයතනික පාලන අනුකූලතා සාරාංශය

| නියාමනය/කේතය | අනුවර්තනය | බැඳීම | හෙළිදරව් වගුව |
|---|---|---|---|
| කොළඹ කොටස් වෙළඳපොලේ (CSE) ලැයිස්තුගත කිරීමේ රීති | අනිවාර්ය ප්‍රතිපාදන | පූර්ණ වශයෙන් අනුකූල | 123-143 පිටු |
| 2008 අංක 04, 2013 අංක 06 සහ 2020 අංක 05 යන නියෝග මගින් සංශෝධනය කරන ලද 2008 අංක 03 දරණ, මූල්‍ය සමාගම් (ආයතනික පාලන) මග පෙන්වීම. ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL)* | අනිවාර්ය ප්‍රතිපාදන | පූර්ණ වශයෙන් අනුකූල | 127-138 පිටු |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (වරලත් ගණකාධිකාරී ආයතනය) විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය සම්බන්ධ විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහය (2017) | ස්වේච්ඡා ප්‍රතිපාදන | පූර්ණ වශයෙන් අනුකූල | 125 සිට 127 පිටු |

** ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ආශ්‍රිත සේවා පරිචය ප්‍රකාශයේ 4752 (SLRSPS 4752) හි දක්වා ඇති පරිදි විගණකාධිපති විසින් පත් කරන ලද අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය විසින් අදාළ ක්‍රියා පටිපාටීන් සිදු කර ඇත.*

**ප්‍රධාන අවස්ථා - 2020/21**

- COVID-19 වසංගතයෙන් සංවිධානයට ඇතිවිය හැකි බලපෑම සහ අවදානම් නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.
- වසංගතයේ බලපෑම සැලකිල්ලට ගනිමින් සමූහයේ දිගුකාලීන දැක්ම හා අරමුණට අනුකූලව නැවත සකස් කළ උපාය. ආයතනික පරිසරය, සමාජ හා පාලන අංශ.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැඩි කරන ලද ඒඑම්එල්/සීඑෆ්ටී අධීක්ෂණයෙන් අනුව සියලු රෙගුලාසි සහ වාර්තාකරණ අවශ්‍යතාවයන්ට අනුකූල ව පවතී.
- කල් ඉකුත් වූ ණය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ අයකර ගැනීම පිළිබඳ අධීක්ෂණය දිගටම සිදු කිරීම.
- 2020 නොවැම්බර් 25 වන දින නව ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී ලෙස ෂමින්ද්‍ර මර්සලින් මහතා පත් කිරීම.
- 2020 අගෝස්තු 13 දින සිට විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස රංජිත් කොඩිතුවක්කු මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම.
- 2020 ජූනි 25 දින සිට බලපැවැත්වෙන පරිදි රසිත ගුණවර්ධන මහතාගේ ඉල්ලා අස්වීම.
- කොටස්කර ලාභාංශයක ස්වරූපයෙන් අතුරු ලාභාංශයක් අවසර ලබා දී අනුමත කර ඇත.

## 1.3 පාලන රාමුව

**උපායමාර්ගික වැඩසටහන් මෙහෙයවීම සහ නිර්ණය කිරීම.**
උපාය මාර්ගය අනුමත කිරීම. ඉහළ පාරිසරික, සමාජීය සහ පාලන ප්‍රමිතීන් කෙරෙහි අවධානය යොමු කෙරේ.

**ප්‍රතිපත්ති සහ ප්‍රාග්ධන සැලසුම් අනුමත කරයි**
උපාය මාර්ගයට සක්‍රියත්වයක් ලබා දෙයි. දිශානතිය සකස් කිරීම, සම්පත් වෙන් කිරීම සහ අවදානම් නැඹුරුව තීරණය කරයි.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රාථමික පාලන කාර්යභාරයන් සහ වගකීම්**

**අධීක්ෂණය සහ නිරීක්ෂණය**
කළමනාකරීත්වය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන්

වාර්තා කිරීම සහ අනාවරණය කිරීම මෙන් ම නිරත වීම තුළින් ආයතනික කාර්ය සාධනය සඳහා වගවීම සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පීපල්ස් ලීසිං සඳහා මග පෙන්වීම සහ නායකත්වය සපයන අතර සමාගමේ සමස්ත පාලනය, කාර්ය සාධනය, උපායමාර්ගය සහ කටයුතු සඳහා සාමූහික වගකීම දරයි. ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට එහි තීරණය ගැනීම සඳහා විශේෂයෙන් දැක්වූ කරුණු මාලාවක් අඩංගු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පීපල්ස් ලීසිං සඳහා මග පෙන්වීම සහ නායකත්වය සපයන අතර සමාගමේ සමස්ත පාලනය, කාර්ය සාධනය, උපායමාර්ගය සහ කටයුතු සඳහා සාමූහික වගකීම දරයි. ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට එහි තීරණය ගැනීම සඳහා විශේෂයෙන් දැක්වූ කරුණු මාලාවක් අඩංගු වේ.

පාලන රාමුව බාහිර හා අභ්‍යන්තර මෙහෙයුම් සාධක කිහිපයකින් බැඳී ඇත.

**අභ්‍යන්තර**

- ආයතනික වගන්ති
- ආයතනික පාලන ප්‍රඥප්තිය
- ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතිය.
- මෙහෙයුම් ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ අත්පොත්
- අභ්‍යන්තර තොරතුරු හෙළිදරව් වීම පිළිබඳ ආරක්ෂණ ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි
- අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලි
- මුදල් විශුද්ධිකරණ විරෝධී KYC ප්‍රතිපත්තිය

**ප්‍රධාන පාලන මෙහෙයුම් උපකරණ**

**බාහිර**

- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත
- සමාගම් පනත 2007 අංක 07
- 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත)
- කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති
- වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද විශිෂ්ට ආයතනික පාලනය පිළිබඳ පිළිවෙත් සංග්‍රහය
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පිළිබඳ උපදෙස්.
- තිරසාරභාවය පිළිබඳ GRI මාර්ගෝපදේශ

### විස්තීර්ණ ප්‍රතිපත්ති රාමුව

සමාගමේ විස්තීර්ණ ප්‍රතිපත්ති රාමුව සංවිධානයේ සියලු මට්ටම්වල හැසිරීම සහ තීරණ ගැනීමේ මාර්ගෝපදේශයක් ලෙස කටයුතු කරයි. එය පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සහ අවදානම කළමනාකරණය කරන අතරම නීති හා රෙගුලාසි වලට අනුකූල වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්ති රාමුව නිරන්තරයෙන් සමාලෝචනය කරයි. වර්ෂය තුළ, ව්‍යාපාරයේ නම්‍යශීලීත්වය සහ වත්කම් ආරක්ෂා කිරීමේ අරමුණින් නිවසේ සිට සේවය කිරීමේ ප්‍රතිපත්තිය සහ තොරතුරු ආරක්ෂණ ක්‍රියා පටිපාටිය ඇතුළු නව ප්‍රතිපත්ති 12 ක් හඳුන්වා දෙන ලදී. සමාගමේ නව අවශ්‍යතා සපුරාලීම සඳහා අභ්‍යන්තර තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය සහ ව්‍යාපාර අඛණ්ඩතා ප්‍රතිපත්තිය ඇතුළු තවත් ප්‍රතිපත්ති 12 ක් සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදී.

### 2020/21 කාලයේ දී සකස් කරන ලද නව ප්‍රතිපත්ති

- පශ්චාත් බෙදාහැරීම් සමාලෝචනය පිළිබඳ ප්‍රතිපත්තිය
- මිලකරණ ප්‍රතිපත්තිය
- ආන්තික වෙළඳාම සඳහා වන ප්‍රතිපාදන ප්‍රතිපත්තිය
- ගුණක ප්‍රතිපාදන ප්‍රතිපත්තිය
- ස්ථාවර වත්කම් පරිපාලන අත්පොත
- කොටස් අලෙවි ප්‍රතිපත්තිය
- නිවසේ සිට සේවය කිරීමේ ප්‍රතිපත්තිය
- ජංගම දුරකථන භාවිත කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය
- සේවකයින් සමාජ මාධ්‍ය භාවිත කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය
- දුරස්ථ ප්‍රවේශ ප්‍රතිපත්තිය
- තොරතුරු ආරක්ෂණ ක්‍රියා පටිපාටිය පිළිබඳ ප්‍රතිපත්තිය
- තෑගි සහ විනෝදාස්වාද ප්‍රතිපත්ති අත්පොත පිළිගැනීම
- අනුකූලතා ප්‍රතිපත්ති අත්පොත
- තොරතුරු වල රහස්‍යභාවය

### 2020/21 කාලයේ දී සමාලෝචනය කරන ලද ප්‍රතිපත්ති සහ යාවත්කාලීන කිරීම්

- අභ්‍යන්තර තොරතුරු පිළිබඳ ප්‍රතිපත්තිය
- විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකවරුන් සම්බන්ධ කර ගැනීමේ ප්‍රතිපත්තිය
- මුදල් විශුද්ධිකරණය (AML) සහ 'ඔබේ ගනුදෙනුකරු දැන ගන්න' (KYC) ප්‍රතිපත්තිය
- ආන්තික වෙළඳ ණය ප්‍රතිපත්තිය සහ මාර්ගෝපදේශ
- අවදානම් දරාගැනීම පිළිබඳ ප්‍රකාශය
- ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ගුණක ණය ප්‍රතිපත්තිය
- ව්‍යාපාර අඛණ්ඩතා ප්‍රතිපත්තිය
- උදාසීන ස්ථාවර තැන්පතු සහ ඉතිරිකිරීම් සඳහා ප්‍රතිපත්තිය (A/C)
- ණය ප්‍රතිපත්තිය
- නිශ්චල දේපල පරීක්ෂා කිරීම පිළිබඳ තක්සේරු කිරීමේ ප්‍රතිපත්තිය
- බාහිර අංශවල සේවා පැවරීම පිළිබඳ ප්‍රතිපත්තිය
- පාරිභෝගික පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය

### වසංගතය තත්ත්වයන් යටතේ පාලනය

- COVID-19 වසංගතය පෙර නොවූ විරූ වෙනසක් ඇති කර තිබෙන අතර, සේවකයින්ට සහ ව්‍යාපාරයට එල්ල වී ඇති අභියෝගයන්ට මුහුණදීම සඳහා සමාගම පුරා කාර්යක්ෂ ක්‍රියාත්මක වීම හා අනුවර්තනය වීම අවශ්‍ය වේ.
- 2020 මාර්තු මාසයේ දී වසංගතය ආරම්භයේ සිටම, ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරිවරයා විසින් නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සන්නිවේදනයේ යෙදුනු අතර එහි දී සේවකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙන අතරම, අවිනිශ්චිතතාවයෙන් හා බියකින් යුත් කාල පරිච්ඡේදයක් තුළ සේවාදායකයින්ට සහාය වීම, මූල්‍ය ප්‍රතිරෝධය සහතික කිරීම සහ උපකාර කිරීම ප්‍රාදේශීය ප්‍රජාවන් වෙත සහාය දැක්වීම ද අරමුණු විය.
- වසංගතය තත්ත්වය හමුවේ ව්‍යාපාරය ඵලදායී හා කාලෝචිත ආකාරයකින් ප්‍රතිචාර දක්වන බව සහතික කිරීම සහ සියලු පාර්ශවකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සමාගමේ ශාඛා හා දෙපාර්තමේන්තු හරහා වසංගතය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු COVID-19 මෙහෙයුම් කාර්ය සාධක බලකායක් පිහිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකාරීත්වයට සහාය විය. අදාළ මෙහෙයුම් ප්‍රමිති පුවරුව මාසිකව මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.



දිගුකාලීන දැක්මට හා අරමුණුවලට අනුකූලව සමාගමේ උපායමාර්ගික ප්‍රමුඛතා නැවත ගණනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නායකත්වය සැපයීම නිසා එහි සුපරීක්ෂාකාරීත්වය සහ අධීක්ෂණය සැලකිය යුතු ලෙස වැඩි විය. අවදානම් කළමනාකරණය විශේෂයෙන් සයිබර් ආරක්ෂණය, වංචා, සොරකම් සහ ණය අයකර ගැනීම් මෙන්ම අභ්‍යන්තර තත්ත්වයන් පාලනය ආදිය සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රමුඛතාව යොමු විය.

වසංගත තත්වය නිසා මතුවන අනපේක්ෂිත අවස්ථාවන් ප්‍රයෝජනයට ගනිමින් ව්‍යාපාරයේ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සහ ශක්තිය සහතික කිරීම හා ව්‍යාපාරය ස්ථානගත කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැඩි අවධානයකින් කටයුතු කළේය.

- මෙම අභියෝගයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය කාලය යෙදවීම වෙනුවෙන් සහ අඛණ්ඩ ඵලදායී අධීක්ෂණයක් සහතික කිරීම සඳහා මණ්ඩලය නිතර හමු වීමට කටයුතු කළේය.
- ව්‍යාපාරය සාර්ථක ලෙස පවත්වා ගෙන යාම සඳහා සමාගම විසින් ක්‍රියාවට නංවා ඇති ක්‍රියාමාර්ගයන් ලබා ඇති ප්‍රගතිය සහ වෙනස් වී ඇති ව්‍යාපාර පරිසරය පිළිබඳ ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩව අධීක්ෂණය හා සමාලෝචනය කරයි.

GRI 102-18

### 1.4 පාලන ව්‍යුහය

ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි තමන් වෙත ලැබී ඇති බලතල වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැඩි අවධානයක් යොමු කළ යුතු කාර්යයන් මණ්ඩල අනු කමිටු හතරකට පවරා ඇත. සමාගමේ දෛනික කළමනාකරණය සහ සමාගමේ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී විසින් නායකත්වය දෙනු ලබන ආයතනික කළමනාකාරීත්වය වෙත පවරා ඇත. ඵලදායී පාලනයක් රඳවා ගැනීමට මණ්ඩලයට හැකි වන ආකාරයෙන් නියෝජිත බලතල පැවරීම මෙම ව්‍යුහයන් යටතේ සිදු වෙයි. බලය පැවරීම මගින් අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ ව්‍යවස්ථාපිත හා පොදු නීතිමය විශ්වාසවන්ත රාජකාරි ඉටු කිරීමේ වගකීම අඩු නොවන බව මණ්ඩලය පිළිගනී. ප්‍රධාන කරුණු පිළිබඳව නිතිපතා වාර්තා කිරීම ඔස්සේ ඵලදායී අධීක්ෂණයට අවකාශ සැලසේ.

ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය කුසලතා දැනුම හා පළපුරුද්දෙන් සන්නද්ධ වේ. උපායමාර්ගිකව පෙලගස්වා ඇති ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) කාර්ය සාධනය සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉවහල් වේ.

#### වාර්තා පිරික්සුම

සමාගම විසින් අනුගමනය කරන ලද භාවිතයන් ඉස්මතු කරමින් ආයතනික පාලනය පහත සඳහන් මූලධර්ම යටතේ සකස් කර ඇත.

| | | පිටුව/පිටු |
|---|---|---|
| 1.1 | පරිපාලනය කෙරෙහි වන අපගේ ප්‍රවේශය | 111 |
| 1.2 | පාර්ශවකරුවන්ට වටිනාකම ලබා දීම | 111 |
| 1.3 | පරිපාලන රාමුව | 112 |
| 1.4 | පරිපාලන ව්‍යුහය | 113 |
| 1.5 | ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩලයක් | 114 |
| 1.6 | වගකීම සහ සාධාරණ වැටුප | 120 |
| 1.7 | ස්ත්‍රී පුරුෂ සමානතාවය | 120 සිට 121 දක්වා |
| 1.8 | නවෝත්පාදන පරිපාලනය | 121 |
| 1.9 | තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂණ පරිපාලනය | 121 |
| 1.10 | තිරසාරභාවය පාලනය | 121 |
| 1.11 | මණ්ඩල මගවීම | 121 සිට 122 දක්වා |
| 1.12 | කොටස් හිමියන් සමඟ සබඳතා | 122 සිට 123 දක්වා |




### 1.5 ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩලයක්

ශක්තිමත් හා ඵලදායී පාලන රාමුවක් තුළ පාර්ශවකරුවන්ගේ වටිනාකම් නිර්මාණය කිරීම ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සදාචාරාත්මක හා ඵලදායී නායකත්වයක් සැපයීම අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා කැප වී සිටී.

1.5.1 මණ්ඩල සංයුතියේ සිට 1.5.13 අනුප්‍රාප්තික සැලසුම් දක්වා වූ කොටස මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය ඵලදායී හා සදාචාරාත්මක බව සහතික කිරීම සඳහා අනුගමනය කරන ලද නිවැරදි භාවිතයන් ඉස්මතු කරයි.

#### අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූලික වගකීම්

- උපායමාර්ගික දිශානතිය සකස් කිරීම.
- උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
- ආයතනික වටිනාකම් සැකසීම හා ආචාර ධාර්මික හැසිරීම් ප්‍රවර්ධනය කිරීම.
- අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ අනුකූලතා පද්ධති ස්ථාපිත කිරීම.
- සමාජයේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම.
- කොටස් හිමියන්, සේවකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ වගකීම් සපුරාලීම, ඔවුන්ගේ අවශ්‍යතා සාධාරණ ලෙස සමබර කිරීම.
- සමාගමේ තත්ත්වය සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර හා තේරුම්ගත හැකි තක්සේරුවක් ඉදිරිපත් කිරීම.
- වත්කම් ආරක්ෂා කිරීම සහ නීත්‍යානුකූල භාවිතය සහතික කිරීම.
- අනුප්‍රාප්තික සැලසුම් සකස් කිරීම සහ සමාගමට කිසිදු බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමට ඇති හැකියාව සහතික කිරීම.

**1.5.1 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය**
සමබර හා විවිධත්වයෙන් යුතු වූ මණ්ඩලයක්.

මණ්ඩලයේ සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු වන අතර ඔවුන් සියල්ලෝම විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.

විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් හැරුණු විට අනෙකුත් අධ්‍යක්ෂවරුන්, මව් ආයතනය වන මහජන බැංකුව විසින් නිර්දේශ කරනු ලබන අතර ආයතනික විධි විධාන අනුව සමාගමේ කොටස් හිමියන් විසින් වාර්ෂික මහා සභාවේ දී පත් කරනු ලැබේ. ස්වාධීන අධ්‍යක්ෂවරුන් ඔවුනොවුන්ගේ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමූහික පසුබිම මගින් මණ්ඩලයේ කාර්යභාරයන් සහ වගකීම් වෛෂයිකව හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි කුසලතා හා අත්දැකීම් අතර සමබර සම්මිශ්‍රණයක් සපයයි. සියළුම අධ්‍යක්ෂවරුන් ඵලදායී ලෙස රාජකාරි ඉටු කිරීම, ඵලදායී ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවල නිරත වීම සහ ඔවුන් ඉදිරියේ තබා ඇති කරුණු වෛෂයික වශයෙන් ඇගයීම සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත.

ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු පත් කිරීම මගින් මණ්ඩලයේ ස්වාධීනත්වය තවදුරටත් ශක්තිමත් කෙරේ. මහජන බැංකුවේ (මව් සමාගම) සභාපතිවරයා වශයෙන් කටයුතු කරන නව ස්වාධීන නොවන සභාපතිවරයා වන සුජීව රාජපක්ෂ මහතා පත් වීමෙන් පසුව 2020 මාර්තු 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි කෝරලී පීටර්ස් මහත්මිය ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරිය ලෙස පත් කරන ලදී.

නාමයෝජනා කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩ ව සංයුතිය සමාලෝචනය කරයි.

සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙකු මණ්ඩලය තුළ ප්‍රමාණවත් මූල්‍ය බුද්ධියක් සහතික කරන මූල්‍ය වෘත්තිකයන් විය යුතුය.

| අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | |
|---|---|
| විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් | 3 |
| විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් (සභාපති ඇතුළු) | 6 |

**ස්ත්‍රී/පුරුෂ විවිධත්වය**




**සාමාජික සංඛ්‍යාව**




ප්‍රමාණවත් අධ්‍යක්ෂ මණ්ඩලය සංයුතිය මගින් නියාමන අවශ්‍යතා සපුරාලන අතරම වගවීම ප්‍රවර්ධනය කිරීම සහ නිරෝගී, ඵලදායී විවාදයක් සහ තීරණ ගැනීමක් දිරිමත් කරයි.

**අත්දැකීම්වල විවිධත්වය**




**ස්වාධීනත්වය**




අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන වේ

**වයස් විවිධත්වය**




**COVID-19 ආශ්‍රිත අභියෝග සහ අවස්ථාවන් ඔස්සේ ගමන් කිරීමේ දී අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කුසලතා හා විශේෂඥතාවයේ පරාසය හා ගැඹුර මිල කළ නොහැකි වටිනාකමක් විය.**

1.5.2 අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

අධීක්ෂණ වගකීම් සහිත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු හතරක් වෙත යම් යම් වගකීම් පවරා ඇත. මණ්ඩලය වෙත තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඉතිරි කර ගැනීමට මෙමගින් හැකියාව ලැබෙන අතර එහි දී විශේෂයෙන් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ ඉදිරි දැක්ම න්‍යාය පත්‍ර අයිතම ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට වැඩි අවස්ථාවක් හිමි වේ. අනුමණ්ඩල වෙත පවරන ලද කරුණු කෙරෙහි ගැඹුරු අවධානයක් යොමු කිරීම සහතික කිරීම ද මෙහි දී සිදු වේ. කමිටුවල ඵලදායී ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් කමිටු සභාපතිවරු වගකිව යුතු අතර කමිටු ක්‍රියාකාරකම් පිළිබඳ මණ්ඩලයට නිතිපතා වාර්තා කළ යුතු වේ. කමිටු බලතල නිතිපතා සමාලෝචනය කරනු ලැබේ.

| අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව | අධීක්ෂණ අංශ | සංයුතිය | වැඩි විස්තර |
|---|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) | ○ මූල්‍ය වාර්තාකරණයේ සහ අනාවරණය කිරීමේ අවංකභාවය<br>○ අභ්‍යන්තර පාලනයන් සහ අභ්‍යන්තර විගණනය<br>○ බාහිර විගණනය<br>○ අනුකූලතාව | ○ කමිටුවේ සභාපති ඇතුළු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>○ එක් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් | 144 සිට 145 දක්වා පිටුවල දැක්වෙන BAC වාර්තාව |
| අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) | ○ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුව<br>○ අවදානම් මැනීම, අධීක්ෂණය සහ කළමනාකරණය<br>○ නියාමන හා අභ්‍යන්තර දූරදර්ශී අවශ්‍යතාවයන්ට අනුකූල වීම | ○ කමිටුවේ සභාපති ඇතුළු එක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක්<br>○ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>○ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී<br>○ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් දෙදෙනෙක් - මෙහෙයුම්<br>○ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන | 150 සිට 152 දක්වා පිටුවල දැක්වෙන BIRMC වාර්තාව |
| මානව සම්පත්, පාරිතෝෂික සහ නාමයෝජනා කමිටුව (HRRNC) | ○ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම හා පත් කිරීම<br>○ විශේෂඥයන්ගේ හිඟය පියැවීම, අනුප්‍රාප්තිය සහ නැවත තෝරා පත් කර ගැනීම<br>○ අධ්‍යක්ෂ මණ්ඩල ආයතනික පාලනය<br>○ පාරිතෝෂික ඇතුළු මානව සම්පත් ප්‍රතිපත්ති.<br>○ සංවිධාන වටිනාකම් සහ චර්යාධර්ම පද්ධතිය<br>○ කම්කරු නීතිවලට අනුකූල වීම<br>○ කාර්ය සාධනය ඇගයීම, කුසලතා කළමනාකරණය, අනුප්‍රාප්තිය ඇතුළු මානව සම්පත් පද්ධති | ○ විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>○ එක් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් | 146 සිට 147 දක්වා පිටුවල ඇති HRRNC වාර්තාව |
| අදාළ පාර්ශවයන්හි ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC) | අදාළ පාර්ශවයන්හි ගනුදෙනු සමාලෝචනය | ○ කමිටුවේ සභාපති ඇතුළු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>○ එක් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් | 148 සිට 149 දක්වා පිටුවල RPTRC වාර්තාව |

1.5.3 පැහැදිලි කාර්යභාරයන් සහ වගකීම්

කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලිවම බලතලවලට අනුකූලව අර්ථ දක්වා ඇති අතර අධිකාරිය පැවරීම සහ වගවීම ස්ථාපිත කිරීම ඉන් අදහස් කෙරේ. සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ ප්‍රධාන කාර්යභාරයන් වන්නේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ, සභාපතිවරයාගේ, ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ සහ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂකවරයාගේ මූලධර්ම රාජකාරි සහ වගකීම්, සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ ලේඛනගත කර ඇත.

| සභාපති | ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී |
|---|---|
| **භූමිකාව** | **භූමිකාව** |
| අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම, නිවැරදි ආයතනික පාලනය ආරක්ෂා කිරීම සහ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම. | උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ ආයතනය ඉදිරියට රැගෙන යෑම සම්බන්ධයෙන් වගකිව යුතුය. |
| **වගකීම්** | **වගකීම්** |
| ○ සමාගමේ වාර්ෂික වැඩ සැලැස්ම සහ න්‍යායපත්‍රයන් සමාගම් ලේකම් සමඟ සාකච්ඡා කර සකස් කිරීම<br>○ පාර්ශවකරුවන්ගේ විශ්වාසය හා විශ්වාසය ගොඩනැගීම හා පවත්වාගෙන යාම.<br>○ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සියළුම මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය සහතික කිරීම.<br>○ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීතාවය අධීක්ෂණය කිරීම. | ආයතනික කළමනාකරණ කණ්ඩායමේ නිසි අනුප්‍රාප්තිකත්වයන් සැලසුම් කිරීම සහ ඔවුන්ගේ කාර්යසාධනය තක්සේරු කිරීම.<br>○ අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සහ අනුමත කිරීම සඳහා සමාගමේ උපාය මාර්ග සංවර්ධනය කිරීම.<br>○ සමාගමේ දිගුකාලීන උපාය මාර්ගයට වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අයවැය සකස් කිරීම සහ නිර්දේශ කිරීම.<br>○ සමාගමේ කාර්යසාධනය සහ අදාළ නීති මෙන් ම ආයතනික පාලන මූලධර්මවලට අනුකූල වීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරීක්ෂණයන් දැනුම් දීම සහ වාර්තා කිරීම.<br>○ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කිරීම.<br>○ සමාගමේ වටිනාකම් මත පදනම් වූ සංස්කෘතියක් සහතික කිරීම.<br>○ අනුමත කරන ලද අවදානම් කලාපයන් තුළ සමාගම ක්‍රියාත්මක වන බවට සහතික වීම. |

### *1.5.3.1 ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ (SID)*

ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ විසින් මණ්ඩලයේ ස්වාධීනත්වය තවදුරටත් ශක්තිමත් කරන අතර අනෙකුත් අධ්‍යක්ෂවරුන් සඳහා විශ්වාසදායක අතරමැදියෙකු ලෙස කටයුතු කරනු ඇත. ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ විසින් සභාපතිවරයාට අවශ්‍ය සහාය ලබා දෙන අතර කොටස් හිමියන්ට ඕනෑම ගැටළුවක් මතු කිරීම සඳහා අතිරේක ප්‍රවේශ මාර්ගයක් ලෙස ද කටයුතු කරනු ඇත.

### 1.5.4 අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය

සමාගමේ සියළුම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් පහත දක්වා ඇති පරිදි ස්වාධීනත්වය සඳහා වන නිර්ණායක සපුරාලනු ඇත.

| අර්ථ දැක්වීම | තක්සේරුව | ප්‍රතිඵලය |
|---|---|---|
| 2008 අංක 03 දරණ ශ්‍රී ලංකා මූල්‍ය සමාගම් (ආයතනික පාලන) උපදෙස්හි දක්වා ඇති නිර්ණායක සහ එහි කිසියම් සංශෝධනයක් ඇතුළුව දක්වා ඇති නියාමනයට අනුකූල ව ස්වාධීනත්වය තීරණය වේ. | විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ප්‍රකාශනය සහ වෙනත් තොරතුරු මත පදනම්ව අධ්‍යක්ෂවරුන් සම්බන්ධ ස්වාධීන තක්සේරුව මණ්ඩලය විසින් වාර්ෂිකව සිදු කරනු ලැබේ. | සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයට බලපාන හෝ බලපාන බවක් පෙනෙන්නට ඇති සම්බන්ධතා හෝ තත්වයන් නොමැති බව මණ්ඩලය සෑහීමකට පත් වී ඇත. |

### 1.5.5 රැස්වීම් සහ පැමිණීම

රැස්වීම් මාසිකව පවත්වනු ලබන්නේ අවශ්‍ය විටෙක ඒවාට අතිරේකව තාවකාලික රැස්වීම් සංවිධානය කිරීමේ නම්‍යතාවක් සහිතවයි. වර්ෂය තුළ රැස්වීම් 14 ක් පවත්වන ලදී. වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් භාවිතා කරමින් දෙමුහුන් ආකෘතියක් අනුගමනය කරන ලදී.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සැලසුම් කිරීම**

1. මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දිනය පෙර පැවති මණ්ඩල රැස්වීමේදී පැමිණ සිටි සාමාජිකයින් විසින් සාමූහිකව එකඟ වී පසුව සියළුම සාමාජිකයින්ට සන්නිවේදනය කරනු ලැබේ.
2. රැස්වීම් න්‍යායපත්‍ර හා ලිපි ලේඛන අධ්‍යක්ෂවරුන්ට අවම වශයෙන් දින හතකට පෙර ලබා ගත හැකිය. මෙමඟින් සාමාජිකයින්ට ලිපි ලේඛන සමාලෝචනය කිරීමට, නිරීක්ෂණ කිරීමට සහ ඉදිරි රැස්වීමට සූදානම් වීමට ප්‍රමාණවත් කාලයක් ලබා දේ.
3. සමාගමේ ලේකම්ගේ සහාය ඇතිව සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩල න්‍යාය පත්‍රය සකස් කරයි.
4. සමාගමේ සාර්ථකත්වයට තීරණාත්මක කරුණු මෙන්ම අනුකූලතාව, අවදානම් සහ පරිපාලනමය කරුණු සලකා බැලීමට මණ්ඩලය ප්‍රමාණවත් කාලයක් වැය කිරීමට වගබලා ගනී.




අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පැමිණීම සමග ක්‍රියාකාරි ලෙසින් කටයුතු කිරීමක් පෙන්නුම් කරයි.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු වන ප්‍රධාන ක්ෂේත්‍ර - 2020/21**

**උපාය මාර්ග සහ ව්‍යාපාර**
- ආයතනික උපායමාර්ගික සැලැස්ම අනුමත කිරීම
- කෝවිඩ් වසංගතයේ බලපෑම සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර මෙහෙයුම් සඳහා සැලැසුම් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සමාලෝචනය කිරීම

**අවදානම සහ අධීක්ෂණය**
- මෙහෙයුම් පරිසරයෙන් සිදුවන බලපෑම් සමාලෝචනය
- සමූහයේ කාර්ය සාධන සමාලෝචනය
- අවදානම් සමාලෝචනය

**පාලනය**
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇගයීම් 2020/21 සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම
- ප්‍රතිපත්ති රාමු සමාලෝචනය
- අනුප්‍රාප්තිය සැලසුම් කිරීම

**පාර්ශවකරුවන්ගේ දායකත්වය**
- උපාය මාර්ග සැකසීමේදී සහ වෙළඳ නාමය ගොඩනැගීමේදී පාර්ශවකරුවන්ගේ දායකත්වය සහ නියැලීමේ වැඩසටහන් සමාලෝචනය කිරීම
- ලාභාංශ ගෙවීම අනුමත කිරීම

**මූල්‍ය ක්‍රියාකාරිත්වය**
- අහිතකර මෙහෙයුම් තත්වයන්ගෙන් සිදු වන මූල්‍යමය බලපෑම
- 2019/20 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම සහ වාර්ෂික වාර්තාව
- 2021/22 අයවැය අනුමත කිරීම

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ ධුරයේ ස්වභාවය | රැස්වීම් සඳහා සහභාගීවීම - සහභාගීවීම/සුදුසුකම | | | | |
|---|---|---|---|---|---|---|
| | | අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව | මානව සම්පත් පාරිතෝෂික සහ නාමයෝජනා කමිටුව | අදාළ පාර්ශවවල ගනුදෙනු සමාලෝචන කමිටුව |
| සුජීව රාජපක්ෂ (සභාපති) | NINED | 14/14 | | | | |
| කෝර්ලි පීටර්ස් (ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ) | INED | 14/14 | ■-14/14 | | 5/5 | |
| රොහාන් පතිරගේ | NINED | 12/14 | | | 5/5 | |
| අසාම් අලි අහමත් | NINED | 13/14 | 12/14 | 4/4 | | |
| සුදර්ශන් අහංගම | NINED | 12/14 | | | | 2/4 |
| ක්ලයිව් ෆොන්සේකා | NINED | 14/14 | | 4/4 | | |
| චතුර විජේතිලක | INED | 14/14 | | ■-4/4 | | ■-4/4 |
| අශෝක බණ්ඩාර | INED | 14/14 | 13/14 | | ■-5/5 | 4/4 |
| රංජිත් කොඩිතුවක්කු ( 2020 අගෝස්තු 13 දින සිට පත් කරනු ලැබීය) | NINED | 9/9 | | | | |
| NINED - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ | INED - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ | | | ■ - සභාපති | | |

## සංසරණය අනුව විසඳුම්

- රෙගුලාසි තුළ ක්‍රියාත්මක වෙමින් ව්‍යාපාර කටයුතු පිළිබඳ යෝජනා සංසරණය මගින් සම්මත කළ හැකිය.
- කෙසේ වෙතත්, එවැනි යෝජනාවක් සංසරණයෙන් නොව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී තීරණය කළ යුතු යැයි යම් අධ්‍යක්ෂවරයකු සිතන්නේ නම්, රැස්වීමකදී තීරණය කිරීම සඳහා සභාපතිවරයා විසින් අදාළ යෝජනාව ඉදිරිපත් කළ යුතුය.

## තොරතුරු සැපයීම

- ඵලදායී ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා, අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ තීරණ පදනම් කරගත් නිවැරදි, අදාළ සහ කාලෝචිත තොරතුරු සපයනු ලැබේ.
- ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී විසින් ව්‍යාපාර මෙහෙයුම්, මූල්‍ය කාර්ය සාධනය, කර්මාන්ත ප්‍රවණතා සහ වර්ධනයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරයි. අදාළ ව්‍යාපාර අංශ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට / ණඑජ වෙත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඇරයුම් කෙරේ. කළමනාකාරීත්වය අධ්‍යක්ෂ මණ්ඩලය සමගින් විවෘත හා විනිවිදභාවයෙන් යුක්ත ව කටයුතු කරන අතර, සැලකිලිමත් විය යුතු කරුණු කාලෝචිත ආකාරයකින් එහි අවධානයට යොමු කිරීම සඳහා බැඳී සිටී.

## අධ්‍යක්ෂ මණ්ඩල විශේෂිත කරුණු වාර්තා කිරීම

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වී සති දෙකක් ඇතුළත සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල විශේෂ කරුණු අනුමත කරනු ලබන අතර ඊළඟ මස රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන පැකේජය සමග අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ඒවා බෙදා හරිනු ලැබේ.
- ඒකමතිකව විසඳා ගැනීමට නොහැකි වූ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ අදහස් විශේෂ කරුණු යටතේ සටහන් කෙරේ.
- අධ්‍යක්ෂවරුන්ට පැරණි අධක්ෂ මණ්ඩල පත්‍රිකා සහ විශේෂිත කරුණු සඳහා විද්‍යුත් මාර්ගයෙන් ප්‍රවේශ විය හැකිය.

## පසු විපරම් ක්‍රියා විමසා බැලීම

- සියළුම පසු විපරම් ක්‍රියාමාර්ග සමාගම් ලේකම් විසින් ලැයිස්තුගත කෙරුණු අතර නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඒවා අදාළ දෙපාර්තමේන්තු / කමිටු වෙත යොමු කෙරිණ.
- අදාළ ක්‍රියා මාර්ග නිරීක්ෂණය කර විධිමත් යාවත්කාලීන කිරීමක් සම්පාදනය කර ඊළඟ රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන පැකේජය වෙත ඇතුළත් කෙරිණ.

## ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂගේ සභාපතිත්වයෙන් යුත් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම

මණ්ඩලයේ ස්වාධීනත්වය හා ඵලදායීතාවය ශක්තිමත් කිරීම සඳහා සමාගම විසින් අනුගමනය කරන ලද යහපාලන භාවිතයන් තවදුරටත් ඉදිරියට ගෙන යාමේ දී, ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ විසින් ස්වාධීන අධ්‍යක්ෂවරුන් හමුවී 2021 මාර්තු මාසයේදී පාලනය හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරන ලදී. මණ්ඩලය දැනුවත් කිරීම සඳහා සභාපතිවරයා කැඳ වූ රැස්වීමේ දී අදාළ ප්‍රතිපෝෂණය ලබා දෙන ලදී.

**1.5.6 සමාගම් ලේකම්**

සමාගමේ ලේකම්ගේ කාර්යාලය අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය වේ. ආයතනික පාලනයේ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා සමාගමේ ලේකම් විසින් එහි රාජකාරි සහ වගකීම් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහයෝගය දෙනු ලැබේ. සමාගම් ලේකම්වෙත පැවරෙන වගකීම් පහත පරිදි වේ.

- ආයතනික විධි විධානයන්ට හා නීතිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල හා මහා සභා රැස්වීම් පැවැත්වීම සහතික කිරීම.
- ව්‍යවස්ථාපිත ලේඛන පවත්වා ගැනීම සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල විශේෂිත කරුණු සටහන් කිරීම.
- නියාමකයින්ට සහ කොටස් හිමියන්ට අවශ්‍ය තොරතුරු කඩිනමින් සන්නිවේදනය කිරීම.
- ව්‍යවස්ථාපිත කරුණු ගොනු කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී මණ්ඩලය සමඟ සාකච්ඡා කර නීති උපදෙස් ලබා ගැනීමට පහසුකම් සැලසීම.

සියළුම අධ්‍යක්ෂවරුන්ට සමාග මේ ලේකම් නීතිඥ ලක්මිණි කෝට්ටෙගොඩ මහත්මියගේ උපදෙස් හා සේවාවන් ලබා ගත හැකිය. සමාගම් ලේකම් පත් කිරීම සහ ඉවත් කිරීම මණ්ඩලය වෙත බලය පවතී.

**1.5.7 අධ්‍යක්ෂ මණ්ඩලය අලුත් වීම**

නව පත්වීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම් සහ නැවත තේරී පත්වීම් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර අලුත් වේ. ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුම රඳවා තබා ගනිමින් අඛණ්ඩතාව පවත්වා ගෙන යන අතරම නව නිපුණතා, තීක්ෂණ බුද්ධිය සහ ඉදිරිදර්ශනය සහිත සාමාජිකයින් හඳුන්වා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අලුත් කිරීමේ දී අවස්ථාව ලැබේ.

**පත්වීම**

- 2020 අගෝස්තු 13 දින සිට බලපැවැත්වෙන පරිදි රංජිත් කොඩිතුවක්කු මහතා පත් කරන ලදී.

**ඉල්ලා අස්වීම**

- ජී බී ආර් පී ගුණවර්ධන මහතා 2020 ජූනි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.

**නැවත තේරී පත්වීම/නැවත පත් කිරීම**

- රංජිත් කොඩිතුවක්කු මහතා 2021 අගෝස්තු 05 දින පැවැත්වීමට නියමිත මහා සම්මේලනයේදී නැවත තේරී පත්වීමට ඉදිරිපත් වනු ඇත.

**පත්වීම්**

- සමාගමේ උපායමාර්ගික සැලසුම් හා එහි ඇති අඩු පාඩු සලකා බැලීමෙන් මෙන් ම අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකාබද්ධ දැනුම, පළපුරුද්ද සහ විවිධත්වය සලකා බලා අධ්‍යක්ෂවරුන් ලෙස පත් කළ හැකි අපේක්ෂකයින්ගේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ා්සෘසෘභස නිර්දේශ කරයි. මණ්ඩලයේ අනුමැතිය මත " සුදුසු සහ ගැළපෙන" පුද්ගලයෙකු වශයෙන් ඉදිරි අනුමැතිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරනු ලැබේ. ඉන්පසු වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් පත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබේ.
- පත්වීම් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සහ කොටස් හිමියන් වෙත පුවත්පත් නිවේදන මගින් දැනුම් දෙන අතර අධ්‍යක්ෂවරයාගේ තොරතුරු පිළිබඳ කෙටි සාරාංශයක් ඇතුළත් වේ.

**නැවත තේරී පත්වීම/නැවත පත් කිරීම**

- සමාගමේ ව්‍යවස්ථාවන්ට අනුකූලව පත් කරන ලද අධ්‍යක්ෂවරයකු මතු දැක්වෙන ඊළඟ මහා සභා රැස්වීම තෙක් ධූරය හෙබවිය යුතු අතර වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් නැවත තේරී පත් කිරීමට ඉදිරිපත් විය යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරුන් ඊළඟ මහා සභා රැස්වීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොටස් හිමියන්ගේ අනුමැතියට යටත්ව නැවත තේරී පත්වීම සඳහා නිර්දේශ කෙරේ.

**විශ්‍රාම ගැනීම/ඉල්ලා අස්වීම් සහ අධ්‍යක්ෂ ධූර කාලය**

- අධ්‍යක්ෂක ධූර කාලය උපරිම අවුරුදු නවය (9)කට සහ වයස් සීමාව අවුරුදු හැත්තෑ (70) දක්වා සීමා වේ. 2008 අංක 3 දරණ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනතෙහි හා එහි සංශෝධනවල දැක්වෙන උපදෙස්වලට අනුකූලව පළමුවෙන්ම පැමිණෙන කොන්දේසිය අනුව ධූර කාලය දැරීමේ හැකියාව සීමා වේ. වර්තමාන වසංගත තත්ත්වය යටතේ සුවිශේෂී පදනමක් මත, ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතිය මත වයස් සීමාව දීර්ඝ කළ හැකිය.
- අධ්‍යක්ෂකවරුන්ගේ පත්වීම්, ඉල්ලා අස්වීම් හෝ ඉවත් කිරීම් තිබේ නම්, කොළඹ කොටස් වෙළඳපොලේ (CSE) අනාවරණය කිරීමෙන් වහා මහජනයාට දැනුම් දීම සිදු කළ යුතු වේ.

**1.5.8 අධ්‍යක්ෂවරුන්ගේ රුචිකත්වයන් හා අදාළ පාර්ශවයන්හි ගනුදෙනු**

අධ්‍යක්ෂවරු තම ව්‍යාපාරික රුචිකත්වයන් පත්වීම්වලදී සහ ඉන් පසුව කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතුය. අදාළ විස්තර ලේඛනයක ඇතුළත් කර පවත්වා ගෙන යෑම සිදු වන අතර කාර්තුමය පදනමින් අදාළ පාර්ශවයෙන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව ඉදිරියේ ඒවා විමසීමට ලක් වේ. එසේම අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ද ඉදිරිපත් කරනු ලැබේ. සමාගම් පනත ප්‍රකාරව ලේඛනය පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය. 275 සිට 276 දක්වා පිටුවල අනාවරණය කර ඇති කරුණු හැරුණු විට අධ්‍යක්ෂවරුන්ට සමාගම සමඟ කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් පිළිබඳව සෘජු හෝ වක්‍ර සම්බන්ධයක් ගොඩනගා ගැනීමට නොහැකිය.

අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු ප්‍රතිපත්තියට අනුකූලව සහ රෙගුලාසිවලට අනුකූලව, අනුමැතිය අවශ්‍ය සියළුම ගනුදෙනු, සාධාරණ සහ පීපල්ස් ලීසිං හි යහපත සඳහා සිදු වන්නේ ද යන්න සලකා බැලීම අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව විසින් සිදු කෙරේ. අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු 275 සිට 279 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවල සටහන 58 හි දක්වා ඇත.

සියළුම අධ්‍යක්ෂවරුන් තම රාජකාරි හා වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් වෙන් කර ගන්නේ යැයි මණ්ඩලය සෑහීමකට පත්වේ.

**1.5.9 රුචිකත්වයන් පිළිබඳ ගැටුම**
අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් ඔහුගේ හෝ ඇයගේ තනතුර හෝ රහස්‍ය තොරතුරු හෝ සංවේදී තොරතුරු මූල්‍යමය වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ප්‍රයෝජනයක් සඳහා තමන්ගේ ප්‍රයෝජනයට හෝ ඕනෑම තෙවන පාර්ශවයක ප්‍රයෝජනය සඳහා හෝ කිසිදු ආකාරයකින් භාවිතා කිරීම ව්‍යාපාර ආචාර ධර්ම පිළිබඳ පීපල්ස් ලීසිං සමාගම විසින් සකස් කර ඇති සංග්‍රහය මගින් තහනම් කර තිබේ. ව්‍යාපාරික අයිතම හෝ වෙනත් අධ්‍යක්ෂක තනතුරු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට ඇතිවිය හැකි යම් රුචිකත්වයන් පිළිබඳ ගැටුම් පිළිබඳව වහාම අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දිය යුතු වේ. ගැටුමක් ඇතිවිය හැකි කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන විට අධ්‍යක්ෂවරු අදාළ රැස්වීමට සහභාගී නොවෙති.

**1.5.10 සවිඥානික තීරණ ගැනීම**
නිවැරදි තීරණ ගැනීම සඳහා නිවැරදි දැනුම තිබිය යුතුය. පීපල්ස් ලීසිං වාර්තාකරණය සහ තොරතුරු පද්ධතිය මගින් අදාළ හා විෂය මූලික තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට නිසි කලට ලැබීම සහතික කරයි.

***1.5.10.1 තොරතුරු සැපයීම***
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට දින හතකට (7) පෙර සංසරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන පැකේජය තුළින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු කළ යුතු කරුණු පිළිබඳ පුළුල් ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සැපයේ. තවද, සමාගමේ ව්‍යාපාරික පරිසරය, උපායමාර්ග සහ මෙහෙයුම් පිළිබඳව නිරන්තරයෙන් ඉදිරිපත් කිරීමටත්, සමාගමට බලපාන වර්ධනයන් පිළිබඳව මණ්ඩලය දැනගත් බවට සහතික කිරීමටත් ආයතනික කළමනාකරණයට සහ බාහිර විශේෂඥයින්ට ආරාධනා කරනු ලැබේ.

***1.5.10.2 තොරතුරු සඳහා ප්‍රවේශය***
අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රාජකාරි ඉටුකිරීම සඳහා අවශ්‍ය අවකාශය සලසා ගැනීම සඳහා කළමනාකාරීත්වය, සංවිධානය පිළිබඳ තොරතුරු සහ සම්පත් වෙත අසීමිත ප්‍රවේශයක් ඇත. සමාගමේ වියදමින්, සමාගම් ලේකම් හරහා සම්බන්ධීකරණයෙන්, ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට අයිතිය තිබේ. ලබාගත් එවැනි උපදෙස්වල පිටපත් එය ඉල්ලා සිටින අධ්‍යක්ෂවරුන් වෙත බෙදා හරිනු ලැබේ.

***1.5.10.3 දැනුම සංවර්ධනය***
අදාළ වන නීති සම්පාදනය සහ නියාමනය, අදාළ අංශවල වර්ධනයන් සහ අවදානම් සහ සාමාන්‍ය ව්‍යාපාරික පරිසරයෙහි වෙනස්වීම් අධ්‍යක්ෂවරුන් විසින් අඛණ්ඩව සොයා බැලීම සිදු කරනු ඇත. සමාගම් ලේකම් හරහා සම්බන්ධීකරණය කිරීමෙන් අනතුරුව අවශ්‍යතා ඇති අධ්‍යක්ෂවරුන් වෙත පුහුණු හා වෘත්තීය සංවර්ධනය ලබා දීම සිදු වේ.

**2020/21 කාලයේ දී සිදු කරන ලද ප්‍රධාන පුහුණු වැඩසටහන්**
- මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදය සඳහා මූල්‍යකරණය වැළැක්වීම යන ප්‍රධාන කරුණු පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ සත්කාරකත්වය යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලවලට ඉහළ මට්ටමේ වෙබ් සමුළුවක් පැවැත්විණ.
- විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා මාස්ටර් ක්ලාස් වැඩසටහනක් ලන්ඩන් කොටස් හුවමාරු සමූහය සමඟ සහයෝගයෙන් පැවැත්විණ.

**1.5.11 අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනු කමිටු ඇගයීම**

| ආවරණය කෙරෙන ක්ෂේත්‍රයන් |
|---|
| ○ උපාය මාර්ග සංවර්ධනය, අධීක්ෂණය සහ එම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය: |
| ○ ශක්තිමත් හා ඵලදායී අවදානම් කළමනාකරණ වැඩපිළිවෙළක් සහතික කිරීම සඳහා දායකත්වය. |
| ○ කළමනාකරණය, සේවකයින් සහ කොටස් හිමියන් සමඟ ඇති සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය |
| ○ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා දායක වීම. |

සමස්තයක් ලෙස මණ්ඩලයේ සහ එහි අනු කමිටුවල ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා වාර්ෂික ඇගයීමක් සිදු කරනු ලබන අතර, එම ක්‍රියා පටිපාටිය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. මණ්ඩලයේ සභාපතිගේ නායකත්වයෙන් සහ සමාගම් ලේකම් විසින් පරිපාලනය කරනු ලබන වැඩපිළිවෙළක් යටතේ අධ්‍යක්ෂවරුවන් විසින් මෙහි දී ඵලදායිතාවයේ ප්‍රධාන සාධකවලට අනුකූල ව ඔවුන්ගේ සාමූහික ක්‍රියාකාරිත්වය තක්සේරු කෙරේ. වැඩිදියුණු කළ යුතු අංශ පිළිබඳව NRHRC වෙත ඒකාබද්ධ ප්‍රතිඵලය ලබා දීම සිදු කෙරෙන අතර එම කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශයන් ඉදිරිපත් කෙරේ.

2020/21 ඇගයීම් 2021 මාර්තු මාසයේදී සිදු කරන ලද අතර එහි දී ලබා ගත් ප්‍රතිඵල 2021 මැයි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. ඇගයීමේ ප්‍රතිඵලයෙන් පෙන්නුම් කළේ සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු ඔවුන්ගේ කාර්යභාරය ඉටුකිරීම ඵලදායී ආකාරයෙන් සිදු කර ඇති බවයි.

**1.5.12 ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී ඇගයීම**
පීපීඑස් ලීසිං හි කෙටිකාලීන, මධ්‍යම හා දිගු කාලීන අරමුණු වලට අනුකූලව සකස් කර ගත් නිර්ණායක භාවිතා කරමින් වාර්ෂිකව ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කරනු ලැබේ. මෙහෙයුම් පරිසරය හා කාර්ය සාධනය මත පදනම්ව සංශෝධනය කරන ලද පාරිතෝෂිකයන්ට අනුකූල ව සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේ කාර්ය සාධනය සමාලෝචනය කෙරේ.

ඇගයීම් ක්‍රියාවලිය සඳහා RNHRC වෙතින් සහාය හිමි වන අතර, කාර්ය සාධනය මත පදනම්ව සංශෝධිත පාරිතෝෂික නිර්දේශ කෙරේ.

**1.5.13 අනුප්‍රාප්තික සැලැස්ම**
නායකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම මෙන් ම සමාගමේ උපායමාර්ගික සැලැස්ම ඉදිරියට ගෙන යෑමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය තුළ නිපුණතා පූර්ණ සහ අත්දැකීම් බහුල පුද්ගලයන් ඇතුලත් වීම සහතික කිරීම සඳහා සුදුසු අපේක්ෂකයින් හඳුනා ගැනීම සහ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී සඳහා අනුප්‍රාප්තිකයන් පත් කිරීම සැලසුම් සකස් කිරීම සඳහා මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටුව (HRRNC) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය වේ. ප්‍රධාන තනතුරු වල වර්තමාන හා අනාගත වගකීම් භාර ගැනීම සඳහා කුසලතා සංචිතයක් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පවත්නා අනුප්‍රාප්තික සැලැස්ම මත පදනම්ව ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පුළුල් අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කිරීමට කමිටුව කටයුතු කරමින් සිටී. මෙම වෘත්තීය සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව වගකීමෙන් බැඳී සිටී.

## 1.6 වගකීම් සහගත සහ සාධාරණ පාරිතෝෂික

පාරිතෝෂික සාධාරණ, වගකිවයුතු සහ විනිවිද පෙනෙන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සිය පූර්ණ අවධානය යොමු කර ඇත. එකඟ වූ යොමු කොන්දේසි යටතේ සහ පීපල්ස් ලීසිං පාරිතෝෂික ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රධාන කළමනාකරණ පිරිස්වල වේතනය පිළිබඳව මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම මානව හිමිකම් කවුන්සිලයේ වගකීම වේ. ඔවුන් සඳහා පාරිතෝෂික පැකේජ සැලසුම් කර ඇත්තේ අවශ්‍ය නිපුණතා සහ පළපුරුද්ද ඇති ප්‍රවීණ වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ය. පාරිතෝෂික ව්‍යුහයන් සකස් කෙරෙන්නේ ඉටු කරන කාර්යයේ කාර්ය සාධනය සහ අවදානම් සාධක සැලකිල්ලට ගනිමින් වන අතර ආයතනික හා පුද්ගල කාර්ය සාධනය සමඟ එය පෙළ ගැස්වීමෙනි. HRRNC වාර්තාවේ පිටු 146 සිට 147 දක්වා බලන්න.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම්වලට සහභාගී වීම සඳහා මාසික දීමනාවක් ලබා ගන්නා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා වන පාරිතෝෂික සකස් කිරීමේ දී වෙළඳපල භාවිතයන් සැලකිල්ලට ගැනීම හා ඔවුන්ගේ කාර්යභාරය සඳහා කරන කාලය කැප කිරීම සහ වගකීම් කෙරෙහි අවධානය යොමු කෙරේ. කාර්ය සාධනය හා සම්බන්ධ දිරි දීමනා ඔවුන්ට නොලැබේ.

2020/21 මුදල් වර්ෂයේදී අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද සමස්ත පාරිතෝෂිකය රුපියල් මිලියන 3.86 කි.

## 1.7 ස්ත්‍රී පුරුෂ සමානතාවය

| | කාන්තා නියෝජනය |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය | 1 |
| ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය | 4 |
| ශ්‍රම බලකාය | 552 |

ස්ත්‍රී පුරුෂ භාවය අනුව විවිධත්වයක් ශ්‍රම බලකාය තුළ තහවුරු කිරීම තුළින් ඵලදායිතාව සහ තරඟකාරිත්වයට ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි බව අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා කරයි. පීපල්ස් ලීසිං හි සේවය කරන කාන්තාවන් සඳහා සමාන අවස්ථා, ආරක්ෂිත සේවා ස්ථානයක් සහ නම්‍යශීලී වැඩ කිරීමේ විධිවිධාන ඇති කර තිබෙන අතර ඔවුන්ගේ වෘත්තීය අභිලාෂයන් ඉටු කර ගැනීමට අවශ්‍ය සහාය හිමි වේ.

## 1.8 නවෝත්පාදන සඳහා පහසුකම් සැපයීම

ගනුදෙනුකරුවන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා අඛණ්ඩව නව්‍යකරණය කිරීම අත්‍යවශ්‍ය බව පීපල්ස් ලීසිං සමාගම හඳුනා ගනී. නවෝත්පාදන සඳහා පහසුකම් සැපයීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වයට පැවරෙන වගකීම පිළිබඳ ඔවුන් දැනුවත් ව සිටිය යුතු වන අතර මේ සඳහා නවෝත්පාදන චින්තනය ප්‍රවර්ධනය කරන නිර්මාණශීලිත්වය සහ නම්‍යශීලිත්වය දිරිගන්වන අතරම එකඟ වූ තත්ත්වයන් යටතේ අවදානම් කළමනාකරණය සිදු කරයි. වසංගත තත්ත්වය නිසා පැන නගින අභියෝගයන්ට අනුව ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සහාය ලබා දීම සහ සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා පීපල්ස් ලීසිං විසින් නව්‍ය ඩිජිටල් විසඳුම් වර්ෂය තුළ ක්‍රියාත්මක කළේය.

## 1.9 තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂණ පරිපාලනය

ඵලදායී හා නිසි ලෙස සම්පත් හසුරුවනු ලබන තාක්ෂණික උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම සහතික කරන ඩිජිටල් වේදිකාවන් මගින් ලබා දෙන ක්‍රියාශීලී බව, පරිමාණය සහ නව්‍යකරණයේ ප්‍රතිලාභ පිළිබඳ මෙන් ම ඒ ඔස්සේ උසස් පාරිභෝගික හා සේවක තෘප්තියක් ඇති වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය මනා අවබෝධයකින් පසු වෙයි. සමාගමේ තොරතුරු වත්කම් සහ මෙහෙයුම් පද්ධති ආරක්ෂා කිරීමට අධයක්ෂ මණ්ඩලය කැපවී සිටින අතර සයිබර් අවදානම් කළමනාකරණ පද්ධති සඳහා පුළුල් ලෙස ආයෝජනය කිරීමට යොමු වී ඇත.

තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති අනුගමනය කිරීම සහ සයිබර් තර්ජන වලින් ආරක්ෂා වීම ඇතුළු ඩිජිටල් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම පීපල්ස් ලීසිංහි තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීම වේ. තොරතුරු ආරක්ෂණ නිලධාරි (ISO) ලෙස ඒ සඳහා ම නිලධාරියෙකු පත් කර ඇත. අදාළ වර්ෂය තුළදී, සමාගමේ පද්ධති, පීපල්ස් ලීසිං දුරස්ථ ප්‍රවේශ උපාය මාර්ගයට සම්බන්ධ තාක්ෂණය සහ තොරතුරු ආශ්‍රිත අවදානම්වල තත්ත්වය කණ්ඩායම විසින් තක්සේරු කරන ලදී.

තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂණ පාලනය BIRMC හි පුනරාවර්තන අයිතමයක් වේ. අවදානම, බලපෑම සහ වෙනත් දූරදර්ශී පියවරයන් සැලකිල්ලට ගනිමින් අවශ්‍ය යැයි සලකනු ලබන කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

## 1.10 තිරසාර පාලනය

පීපල්ස් ලීසිං ආයතනයට සහ එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට වටිනාකමක් ඇති කිරීම සහතික කරමින් තිරසාර සංවර්ධනය කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිය යුතු අවධානයක් යොමු කරයි. පාරිසරික, සමාජ හා පාලන (ESG) ප්‍රමිති ව්‍යාපාර ආකෘතියට ඇතුළත් කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වන අතර, වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන කොටස් වලින් හෙළි වන පරිදි වටිනාකම නිර්මාණය කිරීම පිළිබඳව ද මණ්ඩලය සෑහීමකට පත්වේ.

| | | |
|---|---|---|
| ආර්ථික තිරසාර බව | මූල්‍ය ප්‍රාග්ධනය | පිටු අංක 53 සිට 58 දක්වා |
| පරිසරය | ස්වාභාවික ප්‍රාග්ධනය | පිටු අංක 91 සිට 98 දක්වා |
| කම්කරු පිළිවෙත් | මානව ප්‍රාග්ධනය | පිටු අංක 70 සිට 78 දක්වා |
| සමාජය | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | පිටු 79 සිට 90 දක්වා |
| පාරිභෝගික තෘප්තිය | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | පිටු 79 සිට 90 දක්වා |
| කොටස් හිමියන් හඳුනා ගැනීම, නියැලීම සහ ඵලදායී සන්නිවේදනය | ආයෝජක සබඳතා | පිටු 309 සිට 316 දක්වා |

## 1.11 අධ්‍යක්ෂ මණ්ඩල වගවීම

### 1.11.1 අනුකූලතාවය

වර්ෂය තුළ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම (AML/CFT) මෙන්ම සම්බාධක පැනවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද සෝදිසි කිරීම් දැඩි කිරීමෙන් පසුව ඉහළ වාර්තාකරණ අවශ්‍යතා ඇතුළුව අදාළ සියළුම නීති හා රෙගුලාසිවලට පීපල්ස් ලීසිං අනුකූල වී තිබේ. . අනුකූලතා සැලැස්මක් ස්ථාපිත කිරීම ඇතුළුව අනුකූලතාව පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා වැඩපිළිවෙළක් නිර්මාණය කර ඇත. සැලැස්ම මෙහෙයවනු ලබන්නේ BIRMC වෙත සෘජුවම වාර්තා කිරීම සඳහා යොදවනු ලැබූ අනුකූලතා නිලධාරියෙකු විසිනි. අදාළ අනුකූලතා නිලධාරියා විසින් කාරක සභාවේ කාර්තුමය රැස්වීම් වලදී අනුකූලතාවය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන අතර ඉස්මතු වන විශේෂ අවස්ථාවල දී අවශ්‍ය පියවර ගැනීම සඳහා මණ්ඩලය වෙත කරුණු වාර්තා කිරීම ද සිදු කරයි.

පීපල්ස් ලීසිංහි ප්‍රතිපත්ති, වටිනාකම්, ප්‍රමිති සහ චර්යාධර්ම මෙන් ම ආචාර ධර්ම මගින් ද ව්‍යාපාර කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවනු ලැබේ.

### 1.11.2 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා අවදානම් කළමනාකරණ රාමුවේ (RMF) ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය නිරන්තරයෙන් සමාලෝචනය කර තක්සේරු කරයි. අවදානම් හඳුනා ගැනීම, අවදානම් උපාය මාර්ග සංවර්ධනය කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියා පටිපාටි සැකසීම, සීමාවන් ස්ථාපිත කිරීම සහ නිරාවරණ කළමනාකරණය කිරීම අවදානම් කළමනාකරණ රාමුවට ඇතුළත් ය.

වත්මන් තත්ත්වයන් අඛණ්ඩව අවිනිශ්චිත හා අභියෝගාත්මක වූ බැවින් මණ්ඩලය සහ BIRMC විසින් අවදානම් කළමනාකරණය කිරීමේ අධීක්ෂණ කාර්යයන්හි දැඩි බව වැඩි කළේය. COVID-19 වසංගතය සමගම සයිබර් ආරක්ෂණ, වංචා, සොරකම් සහ ණය ඇතුළු අවදානම්වල මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළේය. අපගේ අවදානම් කළමනාකරණ රාමුව අවදානම් කළමනාකරණයට ඔරොත්තු දෙන සහ ශක්තිමත් බව ඔප්පු කළේය. සමාගමට සිදුවන බලපෑම සීමා කිරීම සඳහා අවදානම් දැඩි ලෙස අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම ඵලදායී වීම පිළිබඳව මණ්ඩලය සෑහීමකට පත්වේ.

### 1.11.3 අභ්‍යන්තර පාලනයන්

අවදානම් කළමනාකරණය සමඟ ඒකාබද්ධව, අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික අරමුණු සපුරාලීමේදී කොටස් හිමියන්ගේ අවශ්‍යතා සහ සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධති සකස් කර ක්‍රියාත්මක කරයි. මෙම පද්ධති මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ඇතුළුව සියලු පාලනයන් ආවරණය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඵලදායීතාවය සඳහා අධීක්ෂණය හා නිතිපතා සමාලෝචනය කරනු ලැබේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් සිය රාජකාරි ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහාය වේ. 144 සිට 145 දක්වා පිටුවල දක්වා ඇති BAC වාර්තාවේ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වය සහ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ විස්තර කෙරේ.

අභ්‍යන්තර විගණනයේ අවදානම් තක්සේරු කිරීම සහ විගණන ප්‍රමුඛතා සැසිය පිළිබඳ සිදු කළ ගැඹුරු සමාලෝචනයේ කොටසක් ලෙස 2020/21 අභ්‍යන්තර විගණන සැලැස්මේ වෙනස්කම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරන ලදී. මූල්‍ය තොරතුරු වල අඛණ්ඩතාව සහ පීපල්ස් ලීසිං හි අභ්‍යන්තර පාලනයන් සහ පද්ධතිවල ශක්තිමත් බව පිළිබඳව මණ්ඩලය සෑහීමකට පත්වේ.

**1.11.4 වගවීම සහ විගණනය**

ගෝලීය මූල්‍යකරණ වැඩසටහන සහ අන්තර්ජාතික ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ රාමුව මගින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති හා තිරසාර වාර්තාකරණය පිළිබඳ ජී 4 ප්‍රමිතියට අදාළ වන විවිධ නීතිමය නීතිවලට අනුකූලව සමාගමේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර හා අවබෝධාත්මක තක්සේරුවක් ඉදිරිපත් කිරීමට සෑම උත්සාහයක්ම ගෙන තිබේ. වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන කොටස් වලින් සමාගමේ ස්ථාවරය සහ අපේක්ෂාවන් විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

- 17 සිට 19 දක්වා පිටුවල සභාපතිගේ පණිවිඩය.
- 20 සිට 24 දක්වා පිටුවල ප්‍රධාන විධායක නිලධාරියාගේ පණිවිඩය.
- 40 සිට 98 දක්වා පිටුවල කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය.
- 153 සිට 161 දක්වා පිටුවල අවදානම කළමනාකරණය කිරීම.

සමාගම කොළඹ කොටස් වෙළඳපොලේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කර ඇති අතර පළමු කාර්තු තුනේ දී පළමු දින 45 ඇතුළත සහ අවසාන කාර්තුවේ මාස දෙකක කාලයක් ඇතුළත සමාගමේ වෙබ් අඩවියේ අතුරු වාර්තා ප්‍රකාශයට පත් කර ඇත. සමාගමේ කොටස් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි මිල සංවේදී තොරතුරු නිසි කලට කොළඹ කොටස් වෙළඳපොළට සවිස්තරාත්මක එහෙත්, සංක්ෂිප්ත ආකාරයකින් අනාවරණය කර තිබේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය සහ කොළඹ කොටස් හුවමාරුව ඇතුළු නියාමකයින්ට අවශ්‍ය වාර්තා නියමිත අවශ්‍යතාවයන්ට අනුකූලව නිසි කලට ගොනු කර ඇත. අවශ්‍යතා මාලාව ඉල්ලා සිටින තොරතුරු පහත සඳහන් වාර්තා මගින් ලබා දී ඇත:

- 139 සිට 143 දක්වා පිටුවල අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව (සමාගම අවධානයට ලක් කරන කරුණු ඇතුළුව)
- 164 වන පිටුවේ දැක්වෙන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය
- 168 සිට 171 දක්වා පිටුවල විගණකවරුන්ගේ වාර්තාව

**1.11.5 බාහිර විගණක**

සමාගමේ බාහිර විගණක යනු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 55 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාය. විගණකාධිපති විසින් නියෝජිතයන් පත් කර ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) (අ) වගන්තිය යටතේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ විගණනය සිදුකිරීමට සහාය වීම සඳහා වරලත් ගණකාධිකාරීවරුන් වන අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය පත් කර තිබේ.

GRI 102-16

**1.11.6 චර්යාධර්ම හා ආචාර ධර්ම**




පීපල්ස් ලීසිං සිය ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩතාව, චාත්තියභාවය සහ සියලු පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා ආරක්ෂා කිරීම වෙනුවෙන් කැපවී සිටී. ආයතනික පාලන ප්‍රඥප්තියේ ලේඛනගත කර ඇති ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතියෙන් සමාගම බැඳී සිටී. ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අධ්‍යක්ෂවරුන් ඇතුළු සියළුම සේවකයින්ට එය අදාළ වේ. සියළුම සේවකයින්ට අදාළ ආචාර ධර්ම මාලාව සමාගමේ අභ්‍යන්තර පරිගණක පද්ධතිය ඔස්සේ ලබා ගත හැකි අතර ව්‍යුහාත්මක සන්නිවේදනය තුළින් සෑම මට්ටමකින්ම එය අඩංගු කරුණු ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේ.

පීපල්ස් ලීසිං හි කිසිදු අධ්‍යක්ෂවරයකු හෝ සේවකයෙකු විසින් මෙම ආචාර ධර්ම මාලාවේ කිසිදු වගන්තියක් උල්ලංඝනය කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු වාර්තා වී නොමැත.

GRI 102-17

**1.11.7 අභ්‍යන්තර තොරතුරු හෙළිදරව් කිරීම/ සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණය**

අසාධාරණ, ආචාර ධර්ම විරෝධී හෝ නීති විරෝධී හැසිරීම් පිළිබඳ සේවකයින්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට උපදෙස් ලබා ගැනීමට හෝ වාර්තා කිරීමට යාන්ත්‍රණයන් ක්‍රියාත්මක වේ.

නුසුදුසු මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන් හෝ අභ්‍යන්තර විමර්ශනයක් අවශ්‍ය විය හැකි වෙනත් කාරණා සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ නිර්නාමිකව වාර්තා කිරීමට පීපල්ස් ලීසිං අභ්‍යන්තර තොරතුරු ප්‍රතිපත්තිය විවෘත වේ. මෙම වාර්තා කිරීමේ දී සේවකයින්ට ප්‍රධාන පුද්ගලයින් සිව් දෙනාගෙන් එක් අයෙකු තෝරා ගත හැකි වන අතර BAC හි සභාපති, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, අභ්‍යන්තර විගණන අංශ ප්‍රධානී සහ මානව සම්පත් ප්‍රධානී වෙත එම තොරතුරු ලබා දීම සිදු කළ හැකිය. ප්‍රවේශවීමේ හැකියාව, නිර්නාමිකභාවය, ක්‍රියාවලි සහ අභ්‍යන්තර තොරතුරු හෙළි කිරීමට අදාළ ප්‍රතිපත්තිය සමාගමේ අභ්‍යන්තර පරිගණක ජාලයෙන් ලබා ගත හැකි අතර සියලු සේවකයින්ට ලැබීමට කටයුතු කෙරේ.

GRI 207-3

**1.12 කොටස් හිමියන් සමඟ සබඳතා**

අදාළ මණ්ඩලය, පාර්ශවකරුවන් කෙරෙහි ඇති තමන්ගේ වගකීම පිළිබඳව දැනුවත්ව සිටින අතර සපයන ලද තොරතුරුවල අඛණ්ඩතාව, කාලානුරූපතාවය සහ අදාළත්වය අවධාරණය කරමින් සාධාරණ අනාවරණය කිරීමකට කැපවී සිටී. ව්‍යාජ වෙළඳපලක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා තොරතුරු නිවැරදිව සන්නිවේදනය කරනු ලැබේ.

**1.12.1 කොටස් හිමියන් සමඟ සන්නිවේදනය**

වාර්ෂික මහා සභා රැස්වීම (AGM), වාර්ෂික වාර්තාව, අතුරු මූල්‍ය ප්‍රකාශන, සමාගමේ වෙබ් අඩවියේ වෙන් කර ඇති ආයෝජක සබඳතා පිටුව සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ නිවේදන මගින් ප්‍රධාන සිදුවීම් දැනුම් දීම ඇතුළු විවිධ සන්නිවේදන මාර්ග ඔස්සේ කොටස් හිමියන් සමඟ සන්නිවේදනය සිදු කෙරේ. කොටස් හිමියන් සමඟ සන්නිවේදනය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇති සන්නිවේදන ප්‍රතිපත්තිය මගින් පාලනය වේ.

වාර්ෂික වාර්තාව මගින් පීපල්ස් ලීසිං හි මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය සහ අනාගත වැඩපිළිවෙළ පහසුවෙන් කියවීමට හැකි සහ අවබෝධ කර ගැනීමට හැකි වන ආකාරයෙන් ආඛ්‍යානාත්මක හා දෘශ්‍ය අංග ඒකාබද්ධ කර සාධාරණ හා සමබර සමාලෝචනයක් ලෙසින් ඉදිරිපත් කෙරේ. වාර්ෂික වාර්තාව සහ අතුරු මූල්‍ය කටයුතු ප්‍රකාශයට පත් කිරීමට පෙර BAC විසින් සමාලෝචනය කර නිර්දේශ කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

වාර්ෂික වාර්තා, අතුරු වාර්තා සහ කොටස් තොරතුරු කොටස් හුවමාරුවට මුද්‍රා හැරීමෙන් පසු ඒවායේ පිටපත් පීපල්ස් ලීසිං වෙබ් අඩවිය (www.plc.lk) වෙත ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූල ව හැකි ඉක්මනින් යොමු කෙරේ.

සමාගම් ලේකම් විසින් කොටස් හිමියන්ගෙන් ලැබුණු සියළුම ලිපි ලේඛන හුවමාරු වාර්තා පවත්වා ගෙන යන අතර ඒවා විසඳීම සඳහා සුදුසු නාලිකා වෙත යොමු කරයි. කොටස් හිමියන්ගේ සියලු ප්‍රධාන ගැටළු සහ අවශ්‍යතාවන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

ඉහත සඳහන් කර ඇති ගැටළු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වෙනත් සුදුසු අංශයක් මගින් උපදෙස් ලැබීමෙන් පසු, සමාගම් ලේකම් විසින් යෝග්‍ය ප්‍රතිචාරයක් සහිතව අදාළ කොටස් හිමියා වෙත ආපසු පිළිතුරු යැවීම සිදු කරයි.

සාමාන්‍ය ක්‍රමවේදය හරහා විසඳිය නොහැකි ප්‍රධාන ගැටළු සම්බන්ධයෙන් කොටස් හිමියන් සමඟ සාකච්ඡා කිරීමට ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයා කටයුතු කරයි.

**1.12.2 වාර්ෂික මහා සභා රැස්වීමේ (AGM) ඵලදායී ලෙසින් භාවිතය**

සමාගමෙහි වාර්ෂික මහා සභා රැස්වීම්වලට සහභාගී වීම ඇතුළුව කොටස් හිමියන්ගේ ක්‍රියාශීලී දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය අගය කරයි. කොටස් හිමියන් විසින් මතු කරනු ලබන ඕනෑම ගැටලුවකට පිළිතුරු දීම සඳහා මණ්ඩලයේ අනු කමිටු සභාපතිවරුන්, අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වන අතර මතු විය හැකි ගැටලු සඳහා පිළිතුරු දීමට බාහිර විගණකයන් ද සහභාගී වනු ඇත.

ලේඛන අධ්‍යයනය කර මහා සභා රැස්වීම සඳහා සහභාවීම සඳහා මහා සභා රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් දින 15 කට පෙර මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම, වාර්ෂික වාර්තාව මෙන් ම ගිණුම් සහ වෙනත් ඕනෑම යෝජනාවක් සහ සම්මේලනයේ කොටස් හිමියන් ඉදිරියේ ඉදිරිපත් කෙරෙන අනුරූප තොරතුරු, කොටස් හිමියන් වෙත බෙදා හරිනු ලැබේ. පීපල්ස් ලීසිං විසින් ව්‍යාපාරයේ සෑම අයිතමයක් සඳහාම වෙන වෙනම යෝජනා ඉදිරිපත් කරන අතර කොටස් හිමියන්ට එවැනි එක් එක් කාරණය සම්බන්ධයෙන් වෙන වෙනම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දේ. මහා සභා රැස්වීමේදී ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියා පටිපාටිය කොටස්කරුවන්ට කල්තියා බෙදා හරිනු ලැබේ.

සියළුම කොටස් හිමියන්ට ඔවුන්ගේ ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමට දිරිගන්වනු ලැබේ. එක් එක් යෝජනාව සඳහා ඉදිරිපත් කර ඇති සියළුම ප්‍රොක්සි ඡන්ද වාර්තා කිරීමට සහ ගණන් කිරීමට සමාග මට ඵලදායී යාන්ත්‍රණයක් තිබේ. යෝජනාවකට එරෙහිව සැලකිය යුතු ඡන්ද ප්‍රතිශතයක් තිබේ නම්, ඡන්ද ප්‍රතිඵල පිටුපස ඇති හේතු තේරුම් ගැනීමට සහ යම් ක්‍රියාමාර්ගයක් අවශ්‍ය දැයි තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගනු ඇත. එක් එක් යෝජනාවේ ඡන්ද ප්‍රතිඵල මහා සභා රැස්වීම අවසන් වූ විගස කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට දැනුම් දෙනු ලැබේ.

අපගේ මීළඟ වාර්ෂික මහා සභා රැස්වීම 2021 අගෝස්තු 05 වන දින විද්‍යුත් ක්‍රමවේදයක් මගින් පවත්වනු ලැබේ.

## 1.13 ඇමුණුම 1- කොළඹ කොටස් වෙළඳපොල විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත සමාගම් සඳහා ආයතනික පාලන රීති පිළිබඳ අඛණ්ඩ ලැයිස්තුගත අවශ්‍යතා පිළිබඳ 7.10 වගන්තියට අනුකූල වීම.

| රීති අංකය | විෂය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමුව | පිටුව/පිටු |
|---|---|---|---|---|---|
| 7.10.1 (අ) | විධායක නොවන අධ්‍යක්ෂවරුන් (NED) | මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් අවම වශයෙන් 2ක් හෝ සමස්ත සංඛ්‍යාවෙන් 1/3 ක් හෝ වන පරිදි වැඩි සංඛ්‍යාවට අනුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 115 |
| 7.10.2 (අ) | ස්වාධීන අධ්‍යක්ෂවරුන් (ID) | විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් 1/3 ක් හෝ 2ක්, යන සංඛ්‍යාවෙන් වැඩි සංඛ්‍යාව අනුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් සිටිය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 115 |
| 7.10.2 (ආ) | ස්වාධීන අධ්‍යක්ෂවරුන් (ID) | සෑම විධායක නොවන අධ්‍යක්ෂවරුයෙකු ම ඔහුගේ / ඇයගේ ස්වාධීනත්වය හෝ ස්වාධීන නොවන බවට දින වකවානු යොදා අත්සන් කළ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 117 |
| 7.10.3 (අ) | අධ්‍යක්ෂවරුන් සම්බන්ධය අනාවරණය | ○ මණ්ඩලය වාර්ෂිකව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය හෝ එසේ නොවීම තීරණය කළ යුතුය<br>○ එක් එක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නම් වාර්ෂික වාර්තාවේ (AR) හෙළි කළ යුතුය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය<br>අධ්‍යක්ෂ මණ්ඩල විස්තර | 117<br>100 සිට 103 |
| 7.10.3 (ආ) | අධ්‍යක්ෂවරුන් සම්බන්ධය අනාවරණය | ස්වාධීනත්වය සඳහා නිශ්චිතව දක්වා ඇති නිර්ණායක සපුරා නොමැති නම් මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කිරීමේ පදනම | ✓ | අදාළ නොවේ | |
| 7.10.3 (ඇ) | අධ්‍යක්ෂවරුන් සම්බන්ධය අනාවරණය | එක් එක් අධ්‍යක්ෂවරයාගේ කෙටි සාරාංශයක් අධ්‍යක්ෂකවරයාගේ විශේෂඥතාව ඇති ක්ෂේත්‍ර ඇතුළුව ්‍යඍ හි ඇතුළත් කළ යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විස්තර | 100 සිට 103 |
| 7.10.3 (ඈ) | අධ්‍යක්ෂවරුන් සම්බන්ධ අනාවරණය | 7.10.3 (අ), (ආ) සහ (ඇ) හි දක්වා ඇති විස්තර සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලද නව අධ්‍යක්ෂවරුන්ගේ කෙටි සාරාංශයක් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට ලබා දිය යුතුය. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල අලුත් කිරීම | 119 |
| 7.10.4 (අ-ඌ) | ස්වාධීනත්වය නිර්වචනය කිරීමේ නිර්ණායක | ස්වාධීන අධ්‍යක්ෂවරයකු වීමට අවශ්‍ය නිර්ණායක සපුරාලීම | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 117 |
| 7.10.5 | පාරිතෝෂික කමිටුව (RC) | ලැයිස්තුගත සමාගමක් සඳහා පාරිතෝෂික කමිටුවක් අවශ්‍ය වේ | ✓ | මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටු වාර්තාව | 146 සිට 147 |

| රීති අංකය | විෂය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමුව | පිටුව/පිටු |
|---|---|---|---|---|---|
| 7.10.5 (අ) | පාරිතෝෂික කමිටුවේ සංයුතිය | පාරිතෝෂික කමිටුව තුළ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළත් විය යුතු වන අතර අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන වනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවේ සභාපතිවරයා ලෙස එක් විධායක නොවන අධ්‍යක්ෂවරුයෙකු පත් කරනු ලැබේ | ✓ | මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටු වාර්තාව | 146 සිට 147 |
| 7.10.5 (ආ) | පාරිතෝෂික කමිටුවේ කාර්යයන් | විධායක අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික නිර්දේශ කරනු ලැබේ | අදාළ නොවේ | මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටු වාර්තාව | 146 සිට 147 |
| 7.10.5 (ඇ) | පාරිතෝෂික කමිටුවට අදාළ කරුණු වාර්ෂික වාර්තාවේ අනාවරණය කිරීම | ○ පාරිතෝෂික කමිටු සිටින අධ්‍යක්ෂවරුන්ගේ නම්<br>○ පාරිතෝෂික ප්‍රතිපත්තියේ ප්‍රකාශය<br>○ විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන සමස්ත වැටුප වාර්ෂික වාර්තාවට ඇතුළත් කළ යුතුය | ✓ | මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටු වාර්තාව<br><br>වගකිවයුතු සහ සාධාරණ පාරිතෝෂික | 146 සිට 147<br><br>120 |
| 7.10.6 | විගණන කමිටුව (AC) | සමාගමට විගණන කමිටුවක් තිබිය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 144 සිට 145 |
| 7.10.6 (අ) | විගණන කමිටුවේ සංයුතිය | විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන ය<br><br>විගණන කමිටු රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරියා සහභාගී විය යුතුය<br><br>විගණන කමිටුවේ සභාපති හෝ එක් සාමාජිකයෙකු වෘත්තීය ගිණුම්කරණ ආයතනයක සාමාජිකයෙකු විය යුතුය | ✓<br><br>✓<br><br>✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 144 සිට 145 |
| 7.10.6 (ආ) | විගණන කමිටු කාර්යයන් | ○ ලැයිස්තුගත කිරීමේ රීතිවල 7.10 වගන්තියේ දක්වා ඇති පරිදි විය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 144 සිට 145 |
| 7.10.6 (ඇ) | විගණන කමිටුවට අදාළ වාර්ෂික වාර්තාවේ අනාවරණය කිරීම | අ) විගණන කමිටුවට ඇතුළත් අධ්‍යක්ෂවරුන්ගේ නම්<br>ආ) විගණන කමිටුව විගණකවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කොට ඒ සඳහා පදනම හෙළි කළ යුතුය<br>ඇ) වාර්ෂික වාර්තාව තුළ විගණන කමිටුවේ වාර්තාවක් නියමිත ආකාරයට අඩංගු විය යුතුය. | ✓<br>✓<br><br>✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 144 සිට 145 |

### 1.14 ඇමුණුම 2: ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් 2017 දී නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට අනුකූල වේ

ආයතනික පාලන වාර්තාව තුළ සංග්‍රහයේ අවශ්‍යතා සාකච්ඡා කර ඇත. වාර්තාවට අදාළ යොමු අපි මෙහි සපයා ඇත්තෙමු.

| යොමු කේතය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමු කිරීම | පිටුව/පිටු |
|---|---|---|---|---|
| අ) | අධ්‍යක්ෂවරු | | | |
| අ.1 | ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් සමාගම මෙහෙයවීම, නායකත්වය ලබා දීම සහ පාලනය කළ යුතුය | | | |
| අ.1.1 | නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වන අතර, ව්‍යුහාත්මක ලෙසින් හා නිතිපතා මණ්ඩලයට තොරතුරු සැපයීම සිදු කළ යුතුය. | ✓ | රැස්වීම් සහ විශේෂිත සටහන් | 117 සිට 118 |
| අ.1.2 | අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් | ✓ | ඵලදායී මණ්ඩලයක් | 114 සිට 120 |
| අ.1.3 | රටේ නීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගත යුතුය | ✓ | අනුකූලතාව<br>දැනුම්වත් තීරණ ගැනීම | 120 සිට 121 |
| අ.1.4 | සමාගම් ලේකම් වෙත උපදෙස් හා සේවාවන් සඳහා ප්‍රවේශය | ✓ | සමාගම් ලේකම් | 119 |
| අ.1.5 | ස්වාධීන විනිශ්චය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 115 |
| අ.1.6 | මණ්ඩලයේ සහ සමාගමේ කාරණා සඳහා ප්‍රමාණවත් කාලයක් හා ශ්‍රමයක් කැප කළ යුතුය | ✓ | රැස්වීම් සහ පැමිණීම | 117 සිට 118 |
| අ.1.7 | අඩුම තරමින් අධ්‍යක්ෂවරුන් 1/3ක් මගින් යෝජනා සඳහා යොමු විය යුතුය. | ✓ | රැස්වීම් සහ විශේෂිත කරුණු | 117 සිට 118 |
| අ.1.8 | අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය හා පුහුණුව | ✓ | දැනුම්වත් තීරණ ගැනීම | 120 |
| අ.2 | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී | ✓ | කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලි කිරීම | 116 |
| අ.3 | විශිෂ්ට ආයතනික පාලනයක් පවත්වා ගෙන යෑම සඳහා සභාපතිගේ කාර්යභාරය | ✓ | කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලි කිරීම | 116 |
| අ.4 | මූල්‍ය ඥානය ලබා ගැනීමේ හැකියාව | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 115 |
| අ. 5 | අධ්‍යක්ෂ මණ්ඩල සමබරතාව | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 115 |
| අ.5.1 | මණ්ඩලයට ප්‍රමාණවත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණයක් ඇතුළත් විය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 115 |
| අ.5.2 | අධ්‍යක්ෂ මණ්ඩලයට විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකු පමණක් නම් ඔවුන් ස්වාධීන විය යුතුය | අදාළ නොවේ | | |
| අ.5.3 | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 117 |
| අ.5.4 | අධ්‍යක්ෂවරුන් විසින් වාර්ෂිකව සිය ස්වාධීනත්වයේ මට්ටම ප්‍රකාශ කිරීම | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 117 |
| අ.5.5 | විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් ස්වාධීනත්වය පිළිබඳ සිදු කෙරෙන වාර්ෂික නිර්ණය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 117 |
| අ.5.6 | විකල්ප අධ්‍යක්ෂවරු | අදාළ නොවේ | | |
| අ.5.7 සහ අ.5.8 | ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරු | ✓ | කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලි කිරීම | 117 |
| අ.5.9 | විධායක නොවන අධ්‍යක්ෂවරුන් සමඟ වාර්ෂික රැස්වීම් | ✓ | රැස්වීම් සහ පැමිණීම | 118 |
| අ. 5.10 | විශේෂ කරුණු කිහිපයකින් විසම්මුතිය සටහන් කිරීම | ✓ | රැස්වීම් සහ පැමිණීම | 118 |
| අ. 6 | තොරතුරු සැපයීම | ✓ | දැනුවත් තීරණ ගැනීම | 120 |
| අ.7 | අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම් හා නැවත තේරී පත්වීම | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය අලුත් කිරීම | 119 |
| අ.7.1 | නාමයෝජනා කමිටුවක්, සභාපති සහ විමර්ශන කොන්දේසි පිහිටුවීම | ✓ | මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටු වාර්තාව | 146 සිට 147 |
| අ.7.2 | මණ්ඩල සංයුතිය පිළිබඳ වාර්ෂික තක්සේරුව | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය අලුත් කිරීම | 119 |
| අ.7.3 | නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ අනාවරණය කිරීම් | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය අලුත් කිරීම | 119 |
| අ.8 | නැවත තේරී පත්වීම සඳහා ඉදිරිපත් විය යුතු අධ්‍යක්ෂවරු | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය අලුත් කිරීම | 119 |
| අ.9 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනු කමිටු කාර්ය සාධනය ඇගයීම | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනු කමිටු ඇගයීම | 120 |

| යොමු කේතය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමු කිරීම | පිටුව/පිටු |
|---|---|---|---|---|
| අ.10 | අධ්‍යක්ෂවරුන් පිළිබඳ නිශ්චිත තොරතුරු අනාවරණය කිරීම සඳහා වාර්ෂික වාර්තාව | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු<br>රැස්වීම් සහ පැමිණීම්<br>වෙනත් සමාගම්වල අධ්‍යක්ෂක තනතුරු<br>අනු කමිටුවල සාමාජිකත්වය | 100 සිට 103<br>117 සිට 118<br>100 සිට 103<br>118 |
| අ.11 | ප්‍රධාන විධායක නිලධාරී ඇගයීම | ✓ | ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ඇගයීම | 120 |
| ආ | **අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික** | | | |
| ආ.1 | විධායක සහ අධ්‍යක්ෂක පාරිතෝෂික පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීම. | | වගකිවයුතු සහ සාධාරණ පාරිතෝෂික<br><br>*2020/21 වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොසිටි අතර, එබැවින් ඔවුන්ගේ පාරිතෝෂික පිළිබඳව සභාපතිවරයා සහ / හෝ ප්‍රධාන විධායක නිලධාරියාගෙන් උපදෙස් ලබා ගැනීමේ අවශ්‍යතාවය මතු නොවීය.* | 120 |
| ආ. 2 | පාරිතෝෂිකයේ මට්ටම සහ එය සකස් කරන ආකාරය | ✓ | වගකිවයුතු සහ සාධාරණ වේතනයක් | 120 |
| ආ.3 | වාර්ෂික වාර්තාවේ පාරිතෝෂිකයට අදාළ අනාවරණය කිරීම.<br>- පාරිතෝෂික ප්‍රතිපත්ති ප්‍රකාශය<br>- ගෙවූ සමස්ථ මණ්ඩල පාරිතෝෂික<br>- HRRNC වාර්තාව | ✓ | ○ මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටු වාර්තාව<br>○ වගකිවයුතු සහ සාධාරණ පාරිතෝෂිකයක්<br>○ සටහන 58.2.1 සිට මූල්‍ය ප්‍රකාශන සඳහා | 146 සිට 147<br><br>120<br>275 සිට 279 |
| ඇ | **කොටස් හිමියන් සමග සබඳතා** | | | |
| ඇ.1 | මහා සභා රැස්වීම සහ වෙනත් පොදු රැස්වීම්වල ඵලදායී භාවිතය | ✓ | වාර්ෂික මහා සභා රැස්වීමේ (AGM) ඵලදායී භාවිතය | 123 |
| ඇ.2 | කොටස් හිමියන් සමග සන්නිවේදනය | ✓ | කොටස් හිමියන් සමග සන්නිවේදනය | 122 |
| ඇ.3 | ප්‍රධාන හා ද්‍රව්‍යමය ගනුදෙනු අනාවරණය කිරීම | ✓ | වර්ෂය තුළ, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 185 වන වගන්තිය මගින් අර්ථ දක්වා ඇති පරිදි ප්‍රධාන හෝ ද්‍රව්‍යමය ගනුදෙනු සිදු නොවූ අතර එය සමාගමේ ශුද්ධ වත්කම් පදනමට ද්‍රව්‍යමය වශයෙන් බලපායි. | 119 |
| ඈ | **වගවීම සහ විගණනය** | | | |
| ඈ.1 | සමාගමේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර හා තේරුම්ගත හැකි තක්සේරුවක් ඉදිරිපත් කිරීම | ✓ | කොටස් හිමියන් සමග සන්නිවේදනය | 122 සිට 123 |
| ඈ.1.1 | සමබර වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීම | ✓ | කොටස් හිමියන් සමග සන්නිවේදනය | 122 සිට 123 |
| ඈ.1.2 | සමබර හා තේරුම්ගත හැකි සන්නිවේදනය | ✓ | කොටස් හිමියන් සමග සබඳතා | 122 |
| ඈ.1.3 | ප්‍රධාන විධායක නිලධාරී/ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ ප්‍රකාශය | ✓ | ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය | 167 |
| ඈ.1.4 | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා ප්‍රකාශයට පත් කිරීම | ✓ | සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 139 සිට 143 |
| ඈ.1.5 | මූල්‍ය වාර්තාකරණය - අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් පිළිබඳ ප්‍රකාශනය<br><br>අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය | ✓ | මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම<br><br>අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය | 164<br><br>166 |
| ඈ.1.6 | කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය | ✓ | ප්‍රාග්ධන වාර්තා | 52 සිට 98 |
| ඈ.1.7 | ශුද්ධ වත්කම් < 50% | ✓ | සමාගමේ ශුද්ධ වත්කම් කොටස් හිමියන්ගේ අරමුදල්වලින් 50% ට වඩා පහත වැටීමට ඉඩක් නොමැති අවස්ථාවක දී, මණ්ඩලය විසින් එම තනතුරේ කොටස් හිමියන්ට දැනුම් දීම සහ ගනු ලබන පියවර පිළිබඳව පැහැදිලි කිරීම සඳහා අතිවිශේෂ මහා සභා රැස්වීමක් (EGM) කැඳවනු ඇත. | |
| ඈ.1.8 | අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු වාර්තාව | ✓ | සමාගම සමග ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව | 119 |

| යොමු කේතය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමු කිරීම | පිටුව/පිටු |
|---|---|---|---|---|
| ඈ.2 | කොටස් හිමියන්ගේ ආයෝජන සහ සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ අභ්‍යන්තර පාලන ක්‍රමයක් | ✅ | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ අවදානම් කළමනාකරණ වාර්තාව<br>අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශය<br>අවදානම් සමාලෝචනය | 150 සිට 152<br><br>166 |
| ඈ.3 | විගණන කමිටුව | ✅ | විගණන කමිටු වාර්තාව | 144 සිට 145 |
| ඈ.4 | අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව | ✅ | අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව | 148 සිට 149 |
| ඈ.5 | ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතිය | ✅ | චර්යාධර්ම හා ආචාර ධර්ම | 122 |
| ඈ .6 | ආයතනික පාලන අනාවරණය කිරීම් | ✅ | ආයතනික පාලන වාර්තාව | 111 සිට 123 |
| ඉ/ඊ | **ආයතනික සහ වෙනත් ආයෝජකයින්** | | | |
| | ආයතනික සහ වෙනත් ආයෝජකයින් | ✅ | කොටස් හිමියන් සමඟ සබඳතා | 122 |
| උ. | ඉන්ටර්නෙට් ඔෆ් තින්ග්ස් සහ සයිබර් ආරක්ෂණ | ✅ | තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව | 121 |
| ඌ | තිරසාර වාර්තාකරණයේ මූලධර්ම | ✅ | තිරසාර පාලනය | 121 |

**සමාගමෙහි ප්‍රතිපත්ති පිළිබඳ මූල්‍ය ව්‍යාපාර පනත සමග අනුකූල වීම**

ශ්‍රී ලංකාවේ මහ බැංකුව නිකුත් කර ඇති 2008 අංක 3 දරණ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනතෙහි කරුණු සමගින් සහ මූල්‍ය සමාගම් (ආයතනික පාලනය - සංශෝධන) 2008 අංක 4, 2013 අංක 06 සහ 2020 අංක 5 දරණ පනතෙහි සංශෝධන සමගින් අනුකූල වීම.

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| අ | **අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්** | |
| 2 (1) | **සමාගමේ ආරක්ෂාව සහ ස්ථාවරත්වය ශක්තිමත් කිරීම** | |
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. කටයුතු කළමනාකරණය කිරීම සහ සමාගමේ ආරක්ෂාව සහ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් මණ්ඩලය වගකිව යුතුය. | |
| අ) | උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම | ✅ |
| | සමාගමේ උපායමාර්ගික අරමුණු සමාගමේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශයන් මත පුරෝකථනය කර ඇති අතර ආයතනික වටිනාකම් ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතියට ඇතුළත් කර ඇත. ඒවා සියලු මට්ටම්වල සේවකයින්ට සන්නිවේදනය කර තිබේ.<br><br>සමාගමේ උපායමාර්ගික අරමුණු සැකසීමේදී මණ්ඩලය ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන අතර සමාගමේ මෙහෙවර සහ දැක්ම ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන බව සහතික කරයි.<br><br>කළමණාකාරීත්වය වෙත නියමිත අරමුණු/අභිලාෂයන් ක්‍රියාවට නැංවීමේ කාර්යය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති අතර, මණ්ඩලය විසින් සමාගමේ ක්‍රියාකාරීත්වය, ඉලක්ක වලට ළංවීම තරයෙන් අධීක්ෂණය හා සමාලෝචනය කරනු ලැබේ. | |
| ආ) | අවදානම් ප්‍රතිපත්ති සහ කළමනාකරණ ක්‍රියා පටිපාටි ඇතුළු සමස්ත ව්‍යාපාර උපාය මාර්ග අනුමත කිරීම | ✅ |
| | 2021-2026, පස් අවුරුදු ව්‍යාපාර උපායමාර්ගය (ආයතනික උපායමාර්ගික සැලැස්ම) 2021 මාර්තු මාසයේදී මණ්ඩලය විසින් අනුමත කරන ලදී. එහි උපායමාර්ගය සහ ක්‍රියාත්මක කිරීම මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ. ව්‍යාපාර උපාය මාර්ගයෙන් ලබාගත් වාර්ෂික අයවැය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර මාසිකව අධීක්ෂණය කරනු ලැබේ.<br><br>අවදානම් රුචිය, ප්‍රතිපත්ති සහ අවදානම් කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණයන් තීරණය කරමින් සමාගමේ සමස්ත අවදානම් උපාය මාර්ගය ද මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ආයතනික උපායමාර්ගික සැලැස්ම සමාගමේ සමස්ත අවදානම් උපාය මාර්ගයට අනුකූල වන අතර එහිදී ප්‍රාග්ධනය වෙන් කිරීම වැනි අවදානම් සහ අවදානම් මට්ටම් මැනීම සඳහා අවදානම් අනුකෘතිය භාවිතා කිරීමේදී අවදානම් රුචිය සැලකේ. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති පාලනය සහ අනුකූලතාවය ද උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇත. තවද, කාලානුරූපීව ක්‍රියාත්මක කළ යුතු අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණයන් අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම සහ අනුමැතියට යටත් කිරීම සිදු වේ. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| ඇ) | අවදානම් කළමනාකරණය | ✓ |
| | සමාගමේ සමස්ත අවදානම් රාමුව කෙරෙහි සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වශයෙන් වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවදානම් හඳුනාගෙන දූරදර්ශීව කළමනාකරණය කිරීම සඳහා සුදුසු පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කරන අතර ත්‍රෛමාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.<br><br>සමාගමේ අවදානම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත වගකීම දරයි.<br><br>පහත සඳහන් වාර්තා මගින් මේ සම්බන්ධයෙන් වැඩිදුර අවබෝධයක් ලබා ගැනීමට හැකිය:<br><br>○ 153 සිට 161 දක්වා පිටුවල අවදානම් කළමනාකරණය.<br>○ 150 සිට 152 දක්වා වූ පිටුවල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව ඇතුළත් වේ. | |
| ඈ) | පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය | ✓ |
| | පාර්ශවකරුවන් සමඟ ද්වි-මාර්ග සන්නිවේදනයක් සිදු කිරීමේ වැදගත්කම වටහා ගත් මණ්ඩලය, කොටස් හිමියන් සහ තැන්පත්කරුවන්, ණය හිමියන්, ණය ගැතියන්, සැපයුම්කරුවන් සහ වෙනත් අදාළ පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය සඳහා පුළුල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. | |
| ඉ) | අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධති සමාලෝචනය කිරීම (MIS) | ✓ |
| | සමාගම ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගෙන යන බවට සහතික වීම සහ එහි කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේ වගකීම මණ්ඩලය සතුය.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් සවිස්තරාත්මකව අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීම සිදු කරන අතර කාර්තුමය පදනමක් මත සිය සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරයි.<br><br>කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) සම්බන්ධයෙන් සමාලෝචනය කෙරෙන්නේ සමාගමේ MIS ක්‍රියාපටිපාටියේ අත්පොත ලුහු සටහන්/ මාර්ගෝපදේශවල නිරවද්‍යතාවය සහ අඛණ්ඩතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනය කිරීමෙනි. | |
| ඊ) | ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) | ✓ |
| | සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන්, මූල්‍ය ප්‍රධානියා සහ අනුකූලතා නිලධාරියා හඳුනා ගැනේ. | |
| උ) | මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ඇති අධිකාරිත්වය සහ වගකීම | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රතිපත්ති, රාජකාරි සහ වගකීම් සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ විස්තරාත්මකව දක්වා ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ගේ (KMPs) ප්‍රධාන කාර්යයන්/ වගකීම් මණ්ඩලය විසින් නිර්වචනය කර අනුමත කර ඇති අතර ඔවුන්ගේ රැකියා විස්තර වලට ඒවා ඇතුළත් කර ඇත.<br><br>ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ගේ බලතල ක්‍රියාත්මක වන සීමාවන් මණ්ඩලය විසින් අර්ථ දක්වා ඇත. | |
| ඌ) | ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් සමාගමේ කටයුතු අධීක්ෂණය | ✓ |
| | සමාගමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය රැස්වීම්වලදී මාසිකව සමාලෝචනය කර සාකච්ඡා කරනු ලැබේ.<br>මෙම රැස්වීම් වලදී, ප්‍රධාන කළමනාකරණ පිරිස් නියෝජනය කිරීම ප්‍රධාන විධායක නිලධාරියා සිදු කරන අතර ඇති කර ගෙන තිබෙන ඉලක්ක වලට සාපේක්ෂව සමාගමේ මෙහෙයුම් හා ක්‍රියාකාරිත්වය පිළිබඳව ඔහු/ඇය විසින් මණ්ඩලය දැනුවත් කෙරේ.<br><br>කළමනාකරණ මට්ටමේ දී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සමාගමේ කටයුතු සමාලෝචනය කර සාකච්ඡා කරනු ලැබේ. | |
| එ) | පාලන පරිචයන්හි ඵලදායීතාවය තක්සේරු කිරීම. | ✓ |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| | සමාගමේ අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම හා පත් කිරීම සඳහා අදාළ වන පොදු ක්‍රියා පටිපාටිය කෙරෙහි සමාගමේ විධි විධාන සහ ආයතනික පාලන ප්‍රඥප්තිය පාදක වෙයි. වර්තමානයේදී, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් හැරුණු විට සමාගමේ අධ්‍යක්ෂවරුන් මව් සමාගම වන මහජන බැංකුව විසින් නිර්දේශ කරනු ලබන අතර සමාගමේ විධි විධාන අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබේ. ප්‍රධාන විධායක නිලධාරියාගේ නිර්දේශය මත ප්‍රධාන කළමනාකරණ පිරිස් පත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරනු ලැබේ.<br><br>ලැදියාවන් සම්බන්ධයෙන් ඇති වන ගැටුම් කළමනාකරණය කිරීම කාලෝචිත ආකාරයකින් විසඳනු ලැබේ. සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම සංග්‍රහය සහ ආචාර ධර්ම ප්‍රකාරව, පුද්ගලික සම්බන්ධතා, බාහිර ආයතන සහ ද්‍රව්‍යමය කාරණා කෙරෙහි ඇති උනන්දුව නිසා පැන නගින විය හැකි හෝ සැබෑ ලැදියාවන් පිළිබඳ ගැටුමක් ඔහුට / ඇයට තිබේද යන්න තීරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු වෙත ම ඇත. සාකච්ඡාවට භාජනය වී ඇති කාරණයක් පිළිබඳව ලැදියාවක් දක්වන අධ්‍යක්ෂවරුන් සවින් ඔහුගේ/ ඇයගේ ලැදියාව හෙළි කළ යුතු අතර එම කාරණය පිළිබඳ දායකත්වයක් දැක්වීම හා ඒ සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටියි.<br><br>ලැදියාවක් දැක්විය හැකි තත්ත්වයන් පිළිබඳ ස්වයං ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් සිදු කෙරෙන අවස්ථාවේ දී සහ පසුව අවශ්‍ය වූ විටදී ලබා ගනී. මෙම ප්‍රකාශයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අනාවරණය කරන ලද අභිලාෂයන්, ලැදියාවන් පිළිබඳ ගැටුම් (අදාළ වන්නේ නම්) ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සමාගමට උපකාරී වේ.<br><br>2021 මාර්තු මාසයේදී මණ්ඩලය විසින් කරන ලද ස්වයං ඇගයීමක් මගින් මණ්ඩලය විසින් එහි දුර්වලතා තීරණය කිරීම ඇතුළු පාලන ක්‍රමවේදයන්හි ඵලදායීතාවය තක්සේරු කරන ලදී. | |
| i) contd... | අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම, පත් කිරීම සහ තෝරා පත් කර ගැනීමේ ක්‍රියාවලිය (4 වන රීතිය යටතේ විස්තරාත්මකව දක්වා ඇති අතර, ලැදියාවන්හි ගැටුම් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය ද ඇතුළුව මණ්ඩලයේ ම පාලන ක්‍රමවේදයන්හි ඵලදායීතාවය (එය 2 (4) වන රීතිය යටතේ විස්තරාත්මකව සඳහන් කෙරේ.) වරින් වර මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ. වාර්ෂික ස්වයං ඇගයීම්වල සාරාංශය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි දුර්වලතා තීරණය කිරීම සහ අවශ්‍ය වෙනස්කම් ක්‍රියාත්මක කිරීම මණ්ඩලය විසින් වසර අවසානයේදී සාකච්ඡා කොට තීරණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලව විසින් 2021 මාර්තු මාසයේ දී 2020/21 මුදල් වර්ෂය සඳහා ස්වයං ඇගයීම සිදු කරන ලදී. | |
| ඒ) | ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්රාප්තික සැලැස්ම | ✓ |
| | ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පුළුල් අනුප්‍රාප්තික සැලැස්මක් ප්‍රතිනිර්මාණය කිරීමට සහ පවත්නා අනුප්‍රාප්තික සැලැස්ම මත පදනම්ව කුසලතා සංචිතයක් හඳුනා ගැනීමට මණ්ඩලය කටයුතු කරමින් සිටී. | |
| ඔ) | ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ පැවැත්වෙන නිතිපතා රැස්වීම් | ✓ |
| | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති, උපායමාර්ග, ක්‍රියාවලීන් සහ භාවිතයන් සකස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක ආයතනික කළමනාකරණ කණ්ඩායම/ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ මණ්ඩලය හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. කළමනාකාරීත්වය මණ්ඩලය සමඟ විවෘත හා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන අතර සියලු වැදගත් කරුණු එහි අවධානයට යොමු කරයි.<br><br>තවද, අදාළ අවස්ථාවන්හිදී, ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු කරා යන ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා මණ්ඩල හා මණ්ඩල අනුකමිටු රැස්වීම්වලට සහභාගී වන ලෙස ප්‍රධාන කළමනාකරණ පිරිස්වලට ආරාධනා කරනු ලැබේ. | |
| ඕ) | නියාමන පරිසරය අවබෝධ කර ගැනීම | ✓ |
| | සමූහයේ වටිනාකම්, ව්‍යාපාරික කටයුතු, මෙහෙයුම්, මූල්‍ය කටයුතු, පාලන රාමුව සහ සමාගමේ උපායමාර්ගික තත්ත්වය පිළිබඳව මණ්ඩලය සතුව මනා දැනුමක් ඇත.<br><br>අදාළ නීති, රෙගුලාසි සහ ආයතනික පාලනයන්හි වෙනස්වීම් පිළිබඳ නිරන්තර යාවත්කාලීන කිරීම් මෙන්ම ආර්ථික, සමාජීය හා පාරිසරික අංශ ඇතුළු පුළුල් පරාසයක මාතෘකා ආවරණය වන පරිදි සමූහයට සහ එහි මෙහෙයුම් වලට බලපෑම් කළ හැකි අංශවල වර්ධනයන් සම්බන්ධයෙන් සෑම රැස්වීමකදීම මණ්ඩල කමිටුවලට හා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම් සිදු කෙරේ.<br><br>නියාමන පරිසරය සම්බන්ධයෙන් සමාගමේ ස්ථාවරය පිළිබඳ දැනුවත් කිරීම සඳහා නියාමන අවශ්‍යතා සහ අදාළ අනුපාතවල සාරාංශයක් නිරන්තරයෙන් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | |
| ඖ) | බාහිර විගණකවරුන් බඳවා ගැනීම සහ අධීක්ෂණය කිරීම | ✓ |
| | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 55 වන වගන්තිය ප්‍රකාරව සමාගමේ බාහිර විගණකවරයා විගණකාධිපතිවරයා වේ. අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ විගණනය සිදුකිරීමට සහාය වීම සඳහා විගණකාධිපති විසින් 2021 මාර්තු 31, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) (අ) වගන්තිය යටතේ වරලත් ගණකාධිකාරීවරුන් වන අර්නස්ට් සහ යන්ග් ආයතනය පත් කර ඇත. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 2(2) | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම සහ ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් නිර්වචනය කිරීම හා අනුමත කිරීම** | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා පත් කර ඇති අතර ඔවුන්ගේ කාර්යභාරයන් වෙන් ව පවතී. එය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ අර්ථ දක්වා ඇත. | |
| 2 (3) | **අධ්‍යක්ෂවරුන් විසින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම** | ✓ |
| | අධ්‍යක්ෂවරුන්ට සමාගමේ වියදමින් ඔවුන්ගේ රාජකාරි හා වගකීම් ඉටුකිරීමට අදාළ කරුණු පිළිබඳව සමාගම් ලේකම්ගේ උපදෙස් සහ වෙනත් වෘත්තීය ස්වාධීන උපදෙස් ලබා ගැනීමට ආයතනික පාලන ප්‍රඥප්තිය මඟින් අවකාශ සලසා තිබේ. කෙසේ වෙතත්, 2020/21 මුදල් වර්ෂය තුළ කිසිදු අධ්‍යක්ෂවරයකු විසින් එවැනි උපදෙස් ලබාගෙන නොමැත. | |
| 2 (4) | **ලැදියාවන් පිළිබඳ ගැටුම් කළමනාකරණය කිරීම** | ✓ |
| | සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම සංග්‍රහය සහ ආචාර ධර්ම ප්‍රකාරව, මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම පුද්ගලික සම්බන්ධතා, බාහිර ආයතන සහ ද්‍රව්‍යමය කාරණා කෙරෙහි ඇති ලැදියාව නිසා ඔහුගේ/ ඇයගේ ස්වාධීන විනිශ්චය කෙරෙහි බලපෑමක් ඇති කරන අභිලාෂයන් නිසා විය හැකි හෝ සත්‍ය වශයෙන් ම පවතින ගැටුමක් තිබේද යන්න තීරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම ඇත. සාකච්ඡාවට භාජනය වී ඇති කාරණයක් පිළිබඳවව ලැදියාවක් දක්වන අධ්‍යක්ෂවරුන් ඔහුගේ/ ඇයගේ උනන්දුව හෙළි කළ යුතු වන අතර එම කාරණය පිළිබඳ සාකච්ඡාවට සම්බන්ධ වීම හා ඒ සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටීම කළ යුතුය. තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් එලෙස වැළකී සිටින අවස්ථාවක දී සමාගම් ලේකම් විසින් විශේෂ කරුණු යටතේ සටහන් කරනු ලැබේ. | |
| 2 (5) | **අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විශේෂයෙන් වෙන් කර ඇති කරුණු ඇතුළත් විධිමත් සටහනක් ලබා දීම.** | ✓ |
| | සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය ගන්නා තීරණය සම්බන්ධ විශේෂයෙන් වෙන් කර ඇති කරුණු පිළිබඳ විධිමත් තොරතුරු අඩංගු වේ. | |
| 2 (6) | **නුබුන් වත්කම් පිළිබඳ ගැටළු අනාවරණය කිරීම** | ✓ |
| | 2020/21 වර්ෂය තුළ එවැනි තත්වයක් මතු වී නොමැත. තවද, සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සතිපතා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කරනු ලැබේ. | |
| 2 (7) | **වාර්ෂික වාර්තාවේ උපදෙස්වලට අනුකූල වීම පිළිබඳ ආයතනික පාලන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.** | ✓ |
| | සමාගමේ වාර්ෂික වාර්තාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ ඇතුළත් වන අතර එය වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් වේ. | |
| 2 (8) | **අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං තක්සේරුව** | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම අධ්‍යක්ෂවරයකු විසින්ම වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං තක්සේරුකරණ ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර, එම ක්‍රියා පටිපාටිය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. ඊට අනුකූලව මණ්ඩලය විසින් එහි ක්‍රියාකාරිත්වය සහ කමිටු පිළිබඳ පුළුල් ඇගයීමක් 2021 මාර්තු මාසයේදී සිදු කරන ලදී.<br><br>මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම ඔහුගේ/ ඇයගේ කාර්යක්ෂමතාව පිළිබඳ ස්වයං තක්සේරුවක් සිදු කළ අතර එමෙන්ම මණ්ඩල කමිටු ද තක්සේරුවක් සිදු කරන ලදී.<br><br>මණ්ඩලයේ ඇගයීම්වල සම්පූර්ණ ප්‍රතිඵල සමාගම් ලේකම් විසින් විශ්ලේෂණය කරන ලද අතර එහිදී කළ සොයා ගැනීම් 2021 මැයි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. | |
| ආ) | **මණ්ඩලයේ රැස්වීම්** | |
| 3 (1) | **නිතිපතා පැවැත්වෙන මණ්ඩල රැස්වීම්** | ✓ |
| | ව්‍යාපාරික රැස්වීම් සාමාන්‍යයෙන් මාසික පදනමින් පවත්වනු ලැබේ.<br><br>2020/21 මුදල් වර්ෂය සඳහා මණ්ඩලය 15 වතාවක් රැස්වූ අතර සංසරණය හරහා මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම අවම වශයෙන් අවස්ථා හතක දී සිදු කරන ලදී. | |
| 3 (2) | **අධ්‍යක්ෂවරුන් විසින් කරුණු සහ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම** | ✓ |
| | නිතිපතා රැස්වීම්වල දී ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සියළුම අධ්‍යක්ෂවරුන්ට සමාන අවස්ථාවක් ලබා දී ඇත. මේ සඳහා අදාළ වන ක්‍රියා පටිපාටිය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. | |
| 3 (3) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැන්වීම** | ✓ |
| | මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දිනය පෙර පැවති මණ්ඩල රැස්වීමේදී පැමිණ සිටි සාමාජිකයින් විසින් සාමූහිකව එකඟ වී පසුව සියළුම සාමාජිකයින්ට සන්නිවේදනය කරනු ලැබේ.<br><br>රැස්වීම් සඳහා විධිමත් දැන්වීම, න්‍යාය පත්‍රය සහ රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සාමාන්‍යයෙන් රැස්වීමට දින හතකට (7) පෙර යවනු ලබන අතර, සාමාජිකයින්ට රැස්වීම් සඳහා සහභාගී වීමට හා ලේඛන අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දේ. සභාපතිගේ කැමැත්ත ඇතිව හදිසි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සුවිශේෂී පදනමක් මත ඇතුළත් කර ඇත.<br><br>වෙනත් විශේෂ මණ්ඩල රැස්වීමක් පිළිබඳව සාධාරණ දැනුම් දීමක් සිදු කිරීමට පියවර ගනු ලැබේ. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 3 (4) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය** | ✓ |
| | 2020/21 වර්ෂය තුළ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15 සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය සියයට 95ක් වූ අතර කිසිදු අධ්‍යක්ෂවරයෙකු අඛණ්ඩව රැස්වීම් තුනක් මග හැර නොමැත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳ 117 සිට 118 දක්වා පිටුවල දක්වා ඇත. | |
| 3 (5) | **සමාගම් ලේකම්වරයෙකු පත් කිරීම** | ✓ |
| | ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති නීතිඥවරියක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ලේකම් ලෙස පත් කර ඇත.<br><br>සමාගම් ලේකම් විසින් මණ්ඩලයට උපදෙස් දෙන අතර සමාගම් පනත, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි සහ අදාළ වෙනත් නීති රීති අනුගමනය කරන බවට සහතික වේ. | |
| 3 (6) | **න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සඳහා සමාගම් ලේකම් වෙත වගකීම පැවරීම** | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සභාපති විසින් සමාගම් ලේකම් වෙත පවරා ඇති අතර ඒ අනුව සමාගම් ලේකම් ද ඒ සම්බන්ධයෙන් වගකීමෙන් බැඳේ. | |
| 3 (7) | **සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවය ලබා ගැනීම සඳහා ප්‍රවේශය වීම** | ✓ |
| | සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය මගින් ප්‍රතිපාදන සපයා ඇති පරිදි, සියළුම අධ්‍යක්ෂවරුන්ට වෘත්තියෙන් නීතිඥයෙකු වන සමාගම් ලේකම් වෙත උපදෙස් ලබා ගැනීම සඳහා ප්‍රවේශය ඇත. | |
| 3 (8) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ විශේෂ කරුණු සටහන් කිරීම නඩත්තු කිරීම** | ✓ |
| | සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල විශේෂ කරුණු ප්‍රමාණවත් තොරතුරු සහිතව පවත්වා ගෙන යන අතර සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව ඕනෑම අධ්‍යක්ෂවරයකුට පරීක්ෂා කිරීම සඳහා එය ලබා ගත හැකිය. | |
| 3 (9) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල විශේෂිත කරුණු ප්‍රමාණවත් හා විස්තරාත්මකව පටිගත කිරීම** | ✓ |
| | මෙම රීතියේ නිශ්චිතව දක්වා ඇති සියළුම අවශ්‍යතා සපුරාලන ආකාරයෙන් සමාගම් ලේකම් විසින් රැස්වීම්වල කටයුතු සහ ගනු ලැබූ තීරණ ප්‍රමාණවත් ලෙස සටහන් කරයි. | |
| (ඇ) | **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය** | |
| 4 (1) | **අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව** | ✓ |
| | 2020/21 අවසානයේ දී අධ්‍යක්ෂවරුන් 9 දෙනෙකු මණ්ඩලයේ සිටි අතර එය අවශ්‍ය මට්ටමට අනුකූල විය | |
| 4 (2) | **අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය** | ✓ |
| | 2020/21 කාලය තුළ සියළුම අධ්‍යක්ෂවරුන්ගේ සේවා කාලය වසර නවයකට වඩා අඩු විය. | |
| 4 (3) | **කිසියම් සේවකයෙකු අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම** | ✓ |
| | සමාගම සඳහා විධායක අධ්‍යක්ෂවරුන් නොමැත. | |
| 4 (4) | **අධ්‍යක්ෂ මණ්ඩල සමබර බව සහ ස්වාධීනත්වය සඳහා වන නිර්ණායක** | ✓ |
| | මෙම රීතියේ දක්වා ඇති පරිදි ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා තුනෙන් එකෙහි නිර්ණායක සපුරාලන පරිදි 2020/21 මූල්‍ය වර්ෂය තුළ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත විය.<br><br>අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ස්වයං ප්‍රකාශන ආකෘති පත්‍ර මත පදනම්ව මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන ස්වාධීනත්වය තීරණය කිරීමේ නිර්ණායකයන් අධ්‍යක්ෂවරුන් විසින් සපුරා තිබිණ. | |
| 4 (5) | **විකල්ප අධ්‍යක්ෂ** | ✓ |
| | මෙම වර්ෂය තුළ විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කර නොමැත. | |
| 4 (6) | **වෛෂයික විනිශ්චයක් ගෙන ඒම සඳහා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ කුසලතා සහ පළපුරුද්ද** | ✓ |
| | විවිධ ක්ෂේත්‍රයන්හි අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් ඇති මුළුමනින් ම විධායක නොවන අධ්‍යක්ෂවරුන් මෙම මණ්ඩලයට ඇතුළත් විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ කුසලතා සහ ව්‍යාපාරික අත්දැකීම් සම්මිශ්‍රණය කිරීම මණ්ඩලයේ සහ එහි කමිටුවල නිසි ක්‍රියාකාරිත්වයට විශාල දායකත්වයක් සපයයි. | |
| 4 (7) | **මණ්ඩල රැස්වීම්වල ගණපූරණය** | ✓ |
| | 2020/21 වර්ෂය තුළ සමාගමේ සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වූ බැවින්, වර්ෂය සඳහා රැස්වූ මණ්ඩලයේ සියළුම රැස්වීම්වලදී අවශ්‍ය ගණපූරණය (අධ්‍යක්ෂවරුන්ගෙන් අඩක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම) සපුරා ගන්නා ලදී. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 4 (8) | **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් අනාවරණය කිරීම, ආයතනික පාලන සන්නිවේදනයන් හා වාර්ෂික වාර්තාව තුළ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය.** | ✓ |
| | සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් අඩංගු සියළුම ආයතනික සන්නිවේදනයන්හි දැක්වෙන ආකාරයෙන්ම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් ද හඳුන්වනු ලැබේ. | |
| 4 (9) | **නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා ඇති විධිමත් හා විනිවිද පෙනෙන ක්‍රියා පටිපාටිය** | ✓ |
| | සමාගමේ අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම හා පත් කිරීම සඳහා අදාළ වන පොදු ක්‍රියා පටිපාටිය සඳහා සමාගමේ ව්‍යවස්ථාව සහ ආයතනික පාලන ප්‍රඥප්තිය බල පැවැත්වේ. සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස පත් කිරීම සඳහා නම් කරන ලද පුද්ගලයන් යෝග්‍ය සහ සුදුසු යැයි පෙනී ගිය පසු, ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතනවල අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතියට යොමු කෙරේ.<br><br>2020/21 වර්ෂය තුළ මණ්ඩලය සඳහා කරන ලද සියළුම පත්වීම් ඉහත ක්‍රියා පටිපාටියට අනුකූල ව සිදු කෙරිණ. | |
| 4 (10) | **අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද අධ්‍යක්ෂවරුන් නැවත තේරී පත්වීම** | ✓ |
| | සමාගමේ විධි විධානවල 27 (2) වගන්තියට අනුව අනියම් පුරප්පාඩු පිරවීම සඳහා පත්කරන ලද අධ්‍යක්ෂවරුන් ඇතුළු සියළුම අධ්‍යක්ෂවරුන් කොටස්කරුවන් විසින් පත් කිරීමෙන් පසු ඊළග වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත තේරී පත්වීමට යටත් වේ. | |
| 4 (11) | **අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම්/ඉවත් කිරීම් අනාවරණය කිරීම** | ✓ |
| | අදාළ රෙගුලාසි වලට අනුව ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතනවල අධීක්ෂණ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු සියළුම ඉල්ලා අස්වීම්/ ඉවත් කිරීම් සහ අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් ප්‍රමාණවත් තොරතුරු සහිතව කොළඹ කොටස් වෙළඳපොලට වහාම දැනුම් දීම ඔස්සේ කොටස්කරුවන්ට දැනුම් දෙනු ලැබේ. | |
| ඇ) | **අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ අනුකූලතාව** | |
| 5 (1) | **මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව හැර අධ්‍යක්ෂවරුන්ගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය (2023/06/18 දිනෙන් අවසන් වන වසර තුනක කාලයක් සඳහා අදාළ වේ)** | ✓ |
| | වයස අවුරුදු 70 ට වැඩි අධ්‍යක්ෂවරුන් නොමැත. | |
| 5 (2) | **සමාගම් 20 කට වැඩි ගණනක නිලතල දැරීම** | ✓ |
| | සමාගම් 20 කට වැඩි ගණනක අධ්‍යක්ෂක ධූරය දරන අධ්‍යක්ෂවරුන් නොමැත. | |
| ඉ) | **කාර්යයන් පැවරීම** | |
| 6 (1) | **අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු පැවරීම** | ✓ |
| | අදාල වන නීතිරීතිවලට අනුකූල ව සමාගමේ විධි විධානවල 29 (2) වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂක කමිටුවකට හෝ සුදුසු යැයි හැගෙන ඕනෑම පුද්ගලයෙකුට පැවරීමට මණ්ඩලයට බලය ඇත.<br><br>ඒ අනුව, මණ්ඩලය විසින් සිය වගවීම ආරක්ෂා කරමින්, පැහැදිලිව අර්ථ දක්වා ඇති බලතල හා බලධාරීන් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටු සහ කළමනාකාරීත්වයට බලය පවරා ඇත. | |
| 6 (2) | **අධ්‍යක්ෂ මණ්ඩල කාර්යයන් පැවරීම වරින් වර සමාලෝචනය කිරීම** | ✓ |
| | වගකීම පැවරීමේ පරාසය සහ එහි නිශ්චිත මෙහෙයුම් සන්දර්භය සැලකිල්ලට ගනිමින් සීමාවන් සුදුසු පරිදි පවතින්නේ ද යන්න සහතික කිරීම සඳහා අධිකාරී රාමුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර සමාලෝචනය කරනු ලැබේ. | |
| ඊ) | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී** | |
| 7 (1) | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකාවන් වෙන් වශයෙන් දැක්වීම** | ✓ |
| | සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු සඳහා වෙන් වෙන් වශයෙන් බලය සහ අධිකාරීත්වය බෙදී යාම සමතුලිතතාවය සහතික කරයි. | |
| 7 (2) | **සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු නොවන විට ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු නම් කිරීම** | ✓ |
| | සභාපතිවරයා මව් සමාගමේ මහජන බැංකුවේ සභාපති ධූරය ද දරන බැවින් නියත ආකාරයෙන් ම ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයකු ලෙස සලකනු ලබයි.<br><br>එබැවින් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරියක වන කෝරලි පීටර්ස් මහත්මිය සමාගමේ වර්තමාන ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරයි. | |
| 7 (3) | **මණ්ඩලයේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ සාමාජිකයන් අතර සම්බන්ධතාවය අනාවරණය කිරීම** | ✓ |
| | ඔවුන් විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි, සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී සහ/ හෝ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් අතර මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් ද්‍රව්‍යමය ඇතුළුව කිසිදු සම්බන්ධතාවයක් නොමැත. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 7 (4) | **සභාපතිගේ කාර්යභාරය** | ✓ |
| | සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය මගින් සභාපතිවරයාගේ වගකීම් දක්වා ඇති අතර එය අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම සහ එහි ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීම සහභාපතිවරයා වෙතින් අපේක්ෂා කෙරේ. | |
| 7 (5) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීමේදී සභාපතිවරයාගේ කාර්යභාරය** | ✓ |
| | න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සභාපති විසින් සමාගම් ලේකම් වෙත පවරා ඇත. | |
| 7 (6) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පැන නගින ගැටළු පිළිබඳව සියළුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් හා කාලෝචිත ලෙස දැනුම් දීම් සිදු වී ඇති බවට සහතික වීම** | ✓ |
| | රැස්වීමකට පෙර පැනනැඟී ඇති ගැටළු පිළිබඳව සියළුම අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කිරීම සහතික කිරීම සභාපතිවරයාගේ වගකීම වේ. න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සෑම රැස්වීමකට ම පෙර ඔවුන්ගේ විමර්ශනය සඳහා ප්‍රමාණවත් කාලයක් සහිතව ඉදිරිපත් කෙරේ. | |
| 7 (7) | **මණ්ඩලයේ කටයුතු සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීම සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කිරීම** | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු කරන සාකච්ඡාවල න්‍යාය පත්‍රය, ශෛලිය හා ස්වරය සකසා තීරණ ගැනීමේදී සියළුම අධ්‍යක්ෂවරුන්ගේ අදහස් නිසි ලෙස සලකා බැලීමට සභාපතිවරයා වගබලා ගනී. එමගින් මණ්ඩලයේ කටයුතු සඳහා තනි අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ප්‍රවර්ධනය කෙරේ. | |
| 7 (8) | **විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සහ විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර සම්බන්ධතාවය දිරිමත් කිරීම** | ✓ |
| | සමාගමට විධායක අධ්‍යක්ෂවරුන් නොමැත.<br><br>එසේ වුවද, මණ්ඩලයේ කටයුතුවල සභා සක්‍රියව සහභාගී වීමට සියළුම අධ්‍යක්ෂවරුන්ට සමාන අවස්ථාවක් ලබා දීමෙන් සමස්තයක් ලෙස මණ්ඩලයේ සාමාජිකයන් අතර ඵලදායී සම්බන්ධතාවයක් පවතින බව සභාපතිවරයා සහතික කරයි.<br><br>මණ්ඩලයේ සමස්ත හා එහි කමිටුවල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සියළුම අධ්‍යක්ෂවරුන්ගේ අදහස් විමසා බැලෙන අධයක්ෂ මණ්ඩලයේ වාර්ෂික ස්වයං ඇගයීම් තුළින් මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් වේ. | |
| 7 (9) | **සභාපතිවරයා විසින් ප්‍රධාන කළමනාකරණ පිරිස් සෘජුවම අධීක්ෂණය කිරීම හෝ විධායක රාජකාරි සම්බන්ධ කටයුතුවල නිරත වීමෙන් වැළැක්වීම** | ✓ |
| | සභාපතිවරයා යනු විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර ඔහු සමාගමේ කිසිදු විධායක රාජකාරියකට හෝ ප්‍රධාන කළමනාකරණ පිරිස්වල සෘජු අධීක්ෂණයට සම්බන්ධ නොවේ. | |
| 7 (10) | **කොටස් හිමියන් සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම** | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමියන් සමග ඵලදායී සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දෙන අතර සමාගම සහ කොටස් හිමියන් අතර සන්නිවේදනය සඳහා යොදා ගත හැකි විධිමත් අවස්ථාවන් ලෙස වාර්ෂික මහා සභා රැස්වීම සහ අනෙකුත් මහා සභා රැස්වීම් සලකයි. ඒ අනුව, මෙම රැස්වීම් මගින් මණ්ඩලයට කොටස් හිමියන් හමුවීමට සහ සභාපතිවරයාට සමාගමේ ප්‍රගතිය පැහැදිලි කිරීමට මෙන් ම කොටස්කරුවන් මණ්ඩලය සහ කළමනාකරණය වෙත යොමු කරන කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීමට අවස්ථාවක් හිමි වේ. | |
| 7 (11) | **ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කාර්යභාරය** | ✓ |
| | සමාගමේ ඉහළම නිලධාරියා ලෙස ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී සැලකෙන අතර සමාගමේ උපායමාර්ගික අරමුණු හා ප්‍රතිපත්ති සවිස්තරාත්මකව සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙන් ම සුදුසු අවදානම් පරාමිතීන්ට අනුකූලව සමාගමේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහු/ඇය වෙත පවරනු ලැබේ. සමාග මේ ආයතනික පාලන ප්‍රඥප්තියේ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරිගේ කාර්යභාරය සවිස්තරව දක්වා ඇත. | |
| උ) | **අධ්‍යක්ෂ මණ්ඩලය පත් කළ කමිටු** | |
| 8 (1) | **අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පිහිටුවීම, එහි කාර්යයන් සහ වාර්තාකරණය** | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු හතරක් ඇති අතර ඒවා නම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC), අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC), පාරිතෝෂික හා නාමයෝජනා කමිටුව (R&NC) සහ අදාළ පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC) වේ. එම කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරයි. මෙම අනිවාර්ය අනු කමිටු අදාළ නීති රීතිවලට අනුකූලව පිහිටුවා ඇත.<br><br>සෑම කමිටුවකටම රැස්වීම් සංවිධානය, විශේෂ සටහන් තැබීම, වාර්තා පවත්වා ගෙන යෑම අදාළ කමිටුවල සභාපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ ඒවාට වෙන් වූ ලේකම්වරුන් යටතේ සිදු වෙයි. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 8 (2) | **විගණන කමිටුව** | |
| අ) | විගණන කමිටු සභාපති | ✓ |
| | විගණන කමිටුවේ සභාපති කෝරලි පීටර්ස් මහත්මිය විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරියක් ලෙස 2020 මාර්තු 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඇය එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහකාර සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකාවක් ද වේ.<br><br>පෞද්ගලික හා රාජ්‍ය යන අංශවල කර්මාන්ත කිහිපයක විගණනය, මූල්‍ය හා ගිණුම්කරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇය සතුය. | |
| ආ) | විගණන කමිටුවේ සංයුතිය | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයින් තිදෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර ඔවුන්ගෙන් දෙදෙනෙක් ස්වාධීන ය. | |
| ඇ) | බාහිර විගණකවරුන් පත් කිරීම | ✓ |
| | විගණකාධිපතිවරයා සමාගම වෙත දැනුම් දී ඇති පරිදි 2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුව විගණනය සිදු කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ ඕනෑම පාර්ශවයක් විසිනි. සමාගමේ විගණන කටයුතු සිදු කිරීම සඳහා විගණකාධිපති විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරීවරුන් පත් කර ඇති අතර 2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා විගණන ගාස්තුව තීරණය කර ඇත.<br><br>එබැවින් බාහිර විගණකවරයා සම්බන්ධ කර ගැනීමේ දී කමිටුවට කිසිදු කාර්යභාරයක් නොමැත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සිය රැස්වීම්වලදී අදාළ ගිණුම්කරණ මූලධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කරයි. | |
| ඈ) | බාහිර විගණකගේ ස්වාධීනත්වය සහ වාස්තවිකතාව සහ විගණන ක්‍රියාවලීන්ගේ ඵලදායීතාවය සමාලෝචනය කර අධීක්ෂණය කිරීම | ✓ |
| | සමාගමේ විගණක යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද විගණකාධිපතිවරයා වන බැවින් එවැනි අවශ්‍යතාවයක් පැන නගින්නේ නැත. | |
| ඉ) | බාහිර විගණක විසින් විගණන නොවන සේවා සැපයීම | ✓ |
| | සමාගමේ විගණකාධිපති වන බැවින් මෙය අදාළ නොවේ. කෙසේ වෙතත්, විගණන නොවන සේවාවක් විගණන සමාගමක් (සමාගමේ විගණනයට සහාය වීම සඳහා විගණකාධිපති විසින් පත් කරන ලද) විසින් සපයනු ලබන අවස්ථාවන් සම්බන්ධයෙන් කමිටුව විසින් ප්‍රතිපත්තියක් සකස් කර ඇති අතර එවැනි සේවාවක් සැපයීමෙන් එම සමාගමේ ස්වාධීනත්වය හෝ වාස්තවිකතාව කෙරෙහි හානියක් නොවන බව එයින් පිළිගැනේ. | |
| ඊ) | බාහිර විගණනයේ විෂය පථය තීරණය කිරීම | ✓ |
| | විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ විගණකාධිපති විසිනි. කෙසේ වෙතත්, කමිටුව මේ සඳහා බාහිර විගණකවරුන් හමුවිය. | |
| උ) | විගණන කමිටුව විසින් සමාගමේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම | ✓ |
| | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ වෙනත් මූල්‍ය අනාවරණයන් නිරීක්ෂණය කිරීම සඳහා මණ්ඩලයේ විගණන කමිටුව සමාගමේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරයි.<br><br>අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර, කමිටුව විසින් අනාවරණය සම්බන්ධයෙන් සකස් කරන ලද සමාගමේ වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඇත. | |
| ඌ) | බාහිර විගණක සමඟ අන්තර් හා අවසාන විගණනයන්ගෙන් පැන නගින ගැටළු, නොඑකගතාවන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම | ✓ |
| | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකවරුන් හමු වූ අතර ප්‍රධාන කළමනාකරණ පිරිස් නොමැතිව විගණනයෙන් පැන නගින ද්‍රව්‍යමය ගැටළු හෝ වෙන් කිරීම් සාකච්ඡා කිරීමට ඔවුන් වෙත අවස්ථාව ලබා දුන්නේය. | |
| එ) | බාහිර විගණකගේ කළමනාකරණ ලිපිය සහ කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය | ✓ |
| | වර්ෂය තුළදී, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකගේ කළමනාකරණ ලිපිය සහ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළේය. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| ඒ) | අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය | ✓ |
| | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් වල ප්‍රමාණවත් බව කමිටුව සමාලෝචනය කළ අතර දෙපාර්තමේන්තුවට එහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය බලතල ඇති බවට සෑහීමකට පත් විය.<br><br>අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කළ කමිටුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික විය.<br><br>අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ක්‍රියාකාරිත්වය කමිටුව විසින් තක්සේරු කරන ලදී.<br><br>අදාළ වාර්ෂය තුළ දී විගණන කමිටුවේ නිර්දේශය ඇතිව ජ්‍යෙෂ්ඨ කළමනාකරු තොරතුරු පද්ධති විගණන තනතුර සඳහා පත් කිරීමක් සිදු කර ඇත.<br><br>සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ හෝ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සේවය අවසන් කිරීමක් සිදු ව නොමැති අතර බාහිර සේවා සපයන්නන්ගේ සේවා ලබා ගැනීමක් සිදු වී නොමැත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සෘජුවම වාර්තා කිරීමක් සිදු වන බැවින් අභ්‍යන්තර විගණන කාර්යය ස්වාධීන වේ. වර්ෂය තුළ අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සමාලෝචනය කිරීමේ දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය පිළිබඳව ද අවධානය යොමු කෙරිණ. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය තුළින් අපක්ෂපාතීත්වය, ප්‍රවීණතාවය සහ නිසි වෘත්තීය සැලකිල්ලෙන් සිදු කෙරෙන විගණන කාර්යයක් සහතික කෙරෙයි. | |
| ඔ) | අභ්‍යන්තර විමර්ශනයේ සහ කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය තුළ අඩංගු මූලික කරුණු | ✓ |
| | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා මත පදනම්ව, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මූලික විගණන කරුණු සහ කළමනාකරණයේ ප්‍රතිචාර සමාලෝචනය කර සලකා බලයි. | |
| ඕ) | විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වූවන් | ✓ |
| | කමිටු රැස්වීම්වලට ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී සහභාගී වේ. කමිටුවේ ආරාධනය මත ප්‍රධාන විධායක නිලධාරී, අනුකූලතා නිලධාරී සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයින් සහ අනෙකුත් පිරිස් ද රැස්වීම්වලට සහභාගී වේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට කිසිදු විධායක අධ්‍යක්ෂවරයකු ඇතුළත් නොවේ. | |
| ඖ) | විගණන කමිටුවේ අධිකාරිය සහ සම්පත් | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විමර්ශන කොන්දේසි යටතේ අදාළ කොන්දේසි යටතේ ඕනෑම කාරණයක් විමර්ශනය කිරීමට පැහැදිලි බලයක්, එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත්, තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය සහ බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමේ බලය හිමි වේ. | |
| අං) | විගණන කමිටු රැස්වීම් | ✓ |
| | සමාලෝචනයට භාජනය වූ මූල්‍ය වර්ෂය තුළ මණ්ඩල විගණන කමිටුව 14 වතාවක් රැස්විය. | |
| ක) | වාර්ෂික වාර්තාවේ අනාවරණය කෙරෙන කරුණු | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු තොරතුරු<br>○ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ක්‍රියාකාරකම්<br>○ වර්ෂය තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් ගණන<br>○ කාරක සභා රැස්වීම්වලට සාමාජිකයින්ගේ පැමිණීම<br><br>කමිටුව පිළිබඳ වැඩිදුර තොරතුරු සහ කාර්යයන් සඳහා 144 සිට 145 දක්වා පිටුවල ඇති "අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව" බලන්න. | |
| ග) | රැස්වීම්වල විශේෂිත කරුණු සටහන් කිරීම හා පවත්වා ගෙන යෑම | ✓ |
| | විමර්ශන නියමයන්ට අනුකූලව, අභ්‍යන්තර විගණන ප්‍රධානියා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර සියළුම කමිටු රැස්වීම්වල විශේෂිත කරුණු ප්‍රමාණවත් විස්තරාත්මකව සටහන් කර ගෙන පවත්වාගෙන යයි. | |
| ච) | අභ්‍යන්තර තොරතුරු ප්‍රතිපත්තිය සහ බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධතාවය | ✓ |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| | සමාගම අභ්‍යන්තර සිදු විය හැකි වැරදි සහගත ක්‍රියා සම්බන්ධයෙන් විශ්වාසයෙන් යුතුව සේවකයන්ට දැනුම් දිය හැකි යන්ත්‍රණයක් සම්බන්ධයෙන් කමිටුව සැලකිලිමත් විය.<br><br>නීති, රීති, රෙගුලාසි හෝ සදාචාර විරෝධී හැසිරීම් විශ්වාසයෙන් යුතුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කිරීමට සේවකයින්ට හැකි අභ්‍යන්තර තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය හඳුන්වා දී ඇත. මෙලෙස වාර්තා කරන අයගේ රහස්‍යභාවය සහතික කෙරෙන අතර එවැනි හෙළිදරව්වක් නිසා ඔවුන් කිසිදු වෙනස් කොට සැලකීමකට යටත් නොවේ. සියළුම සේවකයින්ගේ දැන ගැනීම සඳහා මෙම ප්‍රතිපත්තිය සමාගමේ අභ්‍යන්තර පරිගණක ජාලයෙහි ප්‍රකාශයට පත් කර ඇත.<br><br>විගණන කමිටුව බාහිර විගණක සමඟ සමාගමේ සබඳතා අධීක්ෂණය කිරීමේ ප්‍රධාන නියෝජිත ආයතනය ලෙස කටයුතු කරන අතර මෙම කාර්යය ඉටු කිරීම සඳහා බාහිර විගණකවරුන් හමුවිය. | |
| 8 (3) | **ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව** | |
| අ) | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය | ✅ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම් තනතුරු දෙකක් සහ ණය, වෙළඳපල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කරන සාමාන්‍යාධිකාරිවරයෙකුගෙන් සමන්විත විය.<br><br>ආරාධනය මත අභ්‍යන්තර විගණන ප්‍රධානී, අනුබද්ධ සමාගම්වල ප්‍රධාන අවදානම් දරන්නන් සහ අනුකූලතා නිලධාරියා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වූහ.<br><br>කමිටුවේ වැඩිදුර තොරතුරු සහ කාර්යයන් සඳහා 150 සිට 152 දක්වා පිටුවල ඇති "අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව" බලන්න. | |
| ආ) | අවදානම් තක්සේරුව | ✅ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සියළුම අවදානම් තක්සේරු කරන අතර එහි දී සමාගම සහ අනුබද්ධ සමාගම් සඳහා නිර්මාණය කර ඇති යෝග්‍ය අවදානම් දර්ශක හරහා ණය, වෙළඳපල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් ආදිය සම්බන්ධයෙන් තක්සේරු කෙරේ. අවදානම් තක්සේරු කිරීම සමාගම් පදනමක් මත සහ හැකි සෑම අවස්ථාවකදීම කණ්ඩායම් පදනම මත සිදු කරනු ලැබේ.<br><br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමාගමේ සහ එහි සියළුම අනුබද්ධ සමාගම්වල අවදානම් උපකරණ වාර්තා / අවදානම් දර්ශක වාර්තා සමාලෝචනය කරන අතර නිශ්චිත අවදානම් වල ඍණාත්මක බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |
| ඇ) | සියළුම විධායක මට්ටමේ කමිටුවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීම | ✅ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් පිහිටුවන ලද අවදානම් දරා ගැනීමේ මට්ටම් (අවදානම් සීමාවන්) මත පදනම්ව ද්‍රවශීලතා අවදානම සහ වෙළඳපල අවදානම සමාගමේ වත්කම් හා වගකීම් කමිටුව (ALCO) සමාලෝචනය කර අධීක්ෂණය කරයි. විමර්ශන කොන්දේසි වල දක්වා ඇති විෂය පථයට සාපේක්ෂව ALCO හි කාර්ය සාධනයේ ඵලදායීතාවය පිළිබඳව කමිටුව වාර්ෂික තක්සේරුවක් කරයි.<br><br>අවදානම සහ පහසුකම් ප්‍රමාණය මත පදනම්ව පාරිභෝගික අයදුම්පත් ඇගයීම සඳහා සමාගම විසින් නියමිත ණය අනුමත සීමාවන් සහිත ණය අධිකාරී මට්ටම් ස්ථාපිත කර ඇත. ණය කමිටුවක් වෙනුවට ණය අනුමත කිරීම් සඳහා සමාගම දැනට මෙම ණය අධිකාරී මට්ටම් අනුගමනය කර ඇත. | |
| ඈ) | කාරක සභාව විසින් තීරණය කරනු ලබන පූරෝකථන මට්ටම් ඉක්මවා යන අවදානම් අවම කිරීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම | ✅ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවදානම් දරා ගැනීමේ මට්ටම් තීරණය කර ඇති අතර සමාගමේ අවදානම් විග්‍රහයේ ඇති එක් එක් අවදානම් කාණ්ඩය එම රැස්වීම්වලදී කමිටුව විසින් අවදානම් දරා ගැනීමේ මට්ටම්වලට සාපේක්ෂව සමාලෝචනය කර ඇත. අවදානම් මට්ටම් ස්ථාපිත අවදානම් සීමාවන් ඉක්මවා ගොස් ඇති බව තහවුරු කර ගැනීම සඳහා කමිටුව අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | |
| ඉ) | රැස්වීම් වාර ගණන | ✅ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව 2020/21 මූල්‍ය වර්ෂය තුළ සිව් වරක් රැස්විය.<br><br>COVID තත්ත්වය හේතුවෙන් සියලු දෙනාගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ අවදානම කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී කමිටු රැස්වීම් වීඩියෝ සම්මන්ත්‍රණ මගින් විද්‍යුත් වශයෙන් පවත්වන ලදී. | |
| ඊ) | නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සහ වහාම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම | ✅ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව (ALCO) විසින් සාමූහිකව අවදානම් හඳුනා ගැනීම සිදු කරන අතර එවැනි තීරණ සාමූහිකව ගනු ලැබේ. | |
| උ) | අවදානම් තක්සේරු වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම | ✅ |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීමෙන් සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබේ. | |
| ඒ) | **අනුකූලතා කාර්යයන් ස්ථාපිත කිරීම** | ✓ |
| | සමාගම නීති, රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා කමිටුව අනුකූලතා කාර්යයන් ස්ථාපිත කර ඇත.<br><br>අනුකූලතා කාර්යය මෙහෙයවනු ලබන්නේ පළපුරුදු ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු විසිනි. ඔහු නීති, රෙගුලාසි, උපදෙස්, රීති, නියාමන මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර පාලනයන් සමග අනුකූල වීම පිළිබඳව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සෘජුවම වාර්තා කළේය. | |
| උ) | **අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු** | |
| 9 (2) | **ලැදියාවන් පිළිබඳ ගැටුමෙන් වැළකීම** | ✓ |
| | සමාගම විසින් අදාළ පාර්ශවීය ගනුදෙනු (RPT) ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇති අතර එමඟින් "අදාළ පාර්ශවයන්" ලෙස සලකනු ලබන පුද්ගලයින්ගේ කාණ්ඩ හඳුනාගෙන ඇත. RPT ප්‍රතිපත්තියට අනුකූලව එක් එක් අධ්‍යක්ෂක සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් ස්වයං ප්‍රකාශ ලබා ගන්නේ ඔවුන් වෙත අදාළ වන පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා ය. මෙම ප්‍රකාශයන්හි දක්වා ඇති තොරතුරු මත පදනම්ව, සමාගම විසින් ජාලය පුරා අදාළ පාර්ශවීය ගනුදෙනු පිළිබඳ දත්ත ලබා ගැනීමට හැකි වන පරිදි පද්ධතියක් සකස් කර ඇත.<br><br>සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය තුළින් අපේක්ෂා කෙරෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුගේම පුද්ගලික සම්බන්ධතා, බාහිර සමාගම් සහ ද්‍රව්‍යමය කාරණා කෙරෙහි ඇති ලැදියාව නිසා පැන නගින අභිලාෂයන්ගේ විභව හෝ සැබෑ වශයෙන් ගැටුමක් තිබේද යන්න තීරණය කිරීම හා ඔහුගේ/ ඇයගේ ස්වාධීන විනිශ්චය කෙරෙහි ඉන් බලපෑමක් ඇති කරන්නේ ද යන්න සොයා බැලීමටයි. එවැනි විභවයක් හෝ සැබෑ ලැදියාවන් ගැටුමක් ඇති අධ්‍යක්ෂවරුන් ඔහු/ ඇය ඒ පිළිබඳව දැනගත් විගසම එය අධ්‍යක්ෂ මණ්ඩලයට හෙළි කළ යුතුය.<br><br>අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව අදාළ පාර්ශවීය ගනුදෙනු වල ඵලදායී කළමනාකරණය සහ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරයි.<br><br>කමිටුව පිළිබඳ වැඩිදුර තොරතුරු සහ කාර්යයන් සඳහා 148 සිට 149 දක්වා පිටුවල අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව බලන්න. | |
| 9 (3) | **අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු සම්බන්ධයෙන් උපදෙස් තුළ කරුණු දැක්වෙයි** | ✓ |
| | සමාගමේ අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් අදාළ පාර්ශවයන් කෙරෙහි ඇති සියළුම ගනුදෙනු ඔවුන්ගේ ස්වභාවය සහ වටිනාකම නොසලකා ආවරණය කෙරෙයි. | |
| 9 (4) | **කිසියම් අදාළ පාර්ශවයකට "වඩාත් හිතකර ප්‍රතිඵල" ලබා දෙන අයුරින් සිදු කෙරෙන ගනුදෙනු තහනම් වේ.** | ✓ |
| | මෙම රීතියෙහි අර්ථ දක්වා ඇති පරිදි අදාළ පාර්ශවයන්ට "වඩාත් හිතකර ප්‍රතිඵල" ලබා දෙන අයුරින් සමාගම අදාළ පාර්ශවයන් සමග ගනුදෙනු නොකරන බවට වග බලා ගැනීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද පක්ෂ ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් ක්‍රියා පටිපාටිය සපයයි.<br><br>දැනටමත් ක්‍රියාත්මක අන්තර් ජාලය පාදක වැළැක්වීමේ පද්ධතිය මගින් මෙය තවදුරටත් ශක්තිමත් වන අතර එමඟින් අදාළ පාර්ශවීය ගනුදෙනු අධීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට සහ සමාගමේ ජාලය පුරා පවතින දත්ත ලබා ගැනීමට හැකි වේ. | |
| ඌ) | **අනාවරණය කිරීම්** | |
| 10 (1) | **මූල්‍ය ප්‍රකාශන අනාවරණය කිරීම** | ✓ |
| | නියාමන හා අධීක්ෂණ බලධාරීන් විසින් නියම කරන ලද ආකෘතීන් හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2020/21 වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වරින් වර සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීමට මණ්ඩලය සහතික විය.<br><br>ඉහත 10 (1) (අ) රීතියේ සඳහන් මූල්‍ය ප්‍රකාශන සංක්ෂිප්ත ස්වරූපයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශයට පත් කිරීමට මණ්ඩලය සහතික විය. | |
| 10 (2) | **වාර්ෂික වාර්තාව තුළ සුදුසු හෙළිදරව්වක් සහතික කිරීම සඳහා මණ්ඩලයේ වගකීම** | ✓ |
| අ) | නිශ්චිත අනාවරණය කිරීම් ඇතුළුව අදාළ විගණන මූල්‍ය ප්‍රකාශන අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇති බවට ප්‍රකාශයක් | ✓ |
| | නිශ්චිත අනාවරණය කිරීම් ද ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මණ්ඩලය විසින් සනාථ කරයි.<br><br>යොමු ව- මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂකගේ වගකීම<br>වැඩි විස්තර සඳහා 168 සිට 171 දක්වා පිටුවල ස්වාධීන විගණක වාර්තාව | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| ආ) | සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ වාර්තාව | ✅ |
| | මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳව සාධාරණ විශ්වසනීයත්වයක් ලබා දීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සනාථ කරන අතර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතා අනුව සිදු කර ඇත.<br><br>යොමුව- වැඩි විස්තර සඳහා 166 වන පිටුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය බලන්න. | |
| ඇ) | අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායීතාවය පිළිබඳ බාහිර විගණකගේ සහතිකය | ✅ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ බාහිර විගණකවරයාගෙන් සනාථ කිරීමේ වාර්තාව ලබාගෙන ඇත. | |
| ඈ) | සමාගම සමග සිදු කරන ගනුදෙනු හා නම් ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ විස්තර | ✅ |
| | සමාගම සමග සිදු කරන ගනුදෙනු හා නම් ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ විස්තර ප්‍රමාණවත් ලෙස අනාවරණය වී ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පිළිබඳ තොරතුරු 100 සිට 103 දක්වා පිටුවල දක්වා ඇත.<br><br>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 58.2 බලන්න - ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සමඟ සිදු කළ ගනුදෙනු සම්බන්ධයෙන්. | |
| ඉ) | සමස්තයක් ලෙස සමාගම විසින් අධ්‍යක්ෂවරුන්ට ගෙවන ගාස්තු/ වේතනය | ✅ |
| | අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන පාරිතෝෂික පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස අනාවරණය කර තිබේ.<br><br>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 58.2.1 බලන්න - ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත පාරිතෝෂික. | |
| ඊ) | සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස අදාළ එක් එක් කාණ්ඩයට අනුව අදාළ පාර්ශවයන් වෙත පාරිතෝෂිකයක් ගෙවනු ලැබේ. | ✅ |
| | සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස අදාළ එක් එක් කාණ්ඩයට අනුව අදාළ පාර්ශවයන් වෙත පාරිතෝෂික ගෙවීම පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස අනාවරණය වේ.<br><br>මූල්‍ය ප්‍රකාශනවල සටහන 58.3 බලන්න - ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පාරිතෝෂික ගෙවීම | |
| උ) | ගෙවන ලද පාරිතෝෂිකයන්ගේ සමස්ත වටිනාකම සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු කිරීම. | ✅ |
| | 2020/21 මූල්‍ය වර්ෂය තුළ සමාගම විසින් එහි ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ගෙවන ලද සමස්ත පාරිතෝෂිකවල වටිනාකම සහ සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු වල සමස්ත වටිනාකම් පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස අනාවරණය කර ඇත. | |
| ඌ) | අනුකූලතාවය සහතික කිරීම | ✅ |
| | 2020/21 වර්ෂය තුළ සමාගම පුරෝකථන අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූල වීම පිළිබඳ විස්තර වාර්තාවේ දක්වා ඇත.<br><br>මෙම වාර්තාවේ අනාවරණය වී ඇති ප්‍රමාණයට අමතරව සහ ඉහත සඳහන් කළ සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවට අමතරව 2020/21 කාලය තුළ සමාගමට බලපාන පුරෝකථන අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සඳහා ද්‍රව්‍යමය අනුකූලතාවයන් නොමැත.<br><br>වැඩිදුර තොරතුරු සඳහා 139 සිට 143 දක්වා පිටුවල සමාගම්-ආයතනික පාලන වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව බලන්න. | |
| එ) | අනුකූල නොවන වාර්තා | ✅ |
| | සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධතියේ අඩුපාඩුකම් හෝ මූල්‍ය ව්‍යාපාර පනතට අනුකූල නොවීම සහ ඒ පිළිබඳ නීති රීති හා මඟ පෙන්වීම් යටතේ මුදල් මණ්ඩලය විසින් මහජනතාවට හෙළිදරව් කිරීම කළ යුතු බවට වන කරුණු සම්බන්ධයෙක් කිසිදු ගැටලුවක් හෝ නොතිබුණි. | |
| ඒ) | බාහිර විගණකගේ අනුකූලතාවය සහතික කිරීම | ✅ |
| | මෙම රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට අනුකූල වන මට්ටම පිළිබඳව බාහිර විගණකවරුන් විසින් කරුණු විමර්ශන වාර්තාව නිකුත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලද ඔවුන්ගේ වාර්තාවේ ඉදිරිපත් කර ඇති සොයාගැනීම් මගින් ඉහත වාර්තා කළ කරුණු සම්බන්ධයෙන් කිසිදු නොගැලපීමක් හඳුනාගෙන නොමැත. | |
| ඔ) | **සංක්‍රාන්ති ප්‍රතිපාදන** | |
| 11 | **සංක්‍රාන්ති සහ වෙනත් විධිවිධාන** | ✅ |

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 වන වගන්තියට අනුව ඉදිරිපත් කර ඇත. 2011 අංක 42 දරණ මුල්‍ය ව්‍යාපාර පනත හා ඒ අනුව නිකුත් කරන ලද උපදෙස්, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය සහ කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ රීති මගින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ද එමගින් සැපයේ.

### 1. පොදු කරුණු

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධව වාර්ෂික වාර්තාව කොටස් හිමියන්ට ඉදිරිපත් කිරීමට ලැබීම පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සතුටට කරුණක් වන අතර සියළුම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව සකස් වී ඇත. මෙම වාර්තාව 2021 ජූලි 7 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 2. ව්‍යාපාරයේ ස්වභාවය

*(168 (1) (අ) වගන්තිය) - 2007 අංක 07 දරණ සමාගම් පනත*

> **ගිණුම්කරණ කාල සීමාව තුළ සමාගමේ සහ එහි උප සමාගම්වල ව්‍යාපාර ස්වභාවය සහ එහි යම් වෙනසක් සිදු වීම.**

#### 2.1 දැක්ම, මෙහෙවර සහ ආයතනික චර්යාව

සමාගමේ දැක්ම සහ මෙහෙවර මෙම වාර්ෂික වාර්තාවේ 11 වන පිටුවේ දක්වා ඇත. දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී, සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති පරිදි සියළුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් ඉහළම මට්ටමේ ආචාර ධර්ම ප්‍රමිතීන් හා අඛණ්ඩතාවක් ඇති ව ඉටු කළ යුතු වේ.

#### 2.2 ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම්

මූල්‍ය කල්බදු, කාලීන ණය, ඉස්ලාමීය මූල්‍ය, ආන්තික වෙළඳාම, සාධකකරණය, රන් ණය හා ණය උපකරණ නිකුත් කිරීම සහ රාජ්‍ය තැන්පතු බලමුලු ගැන්වීම ආදිය සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු අතරට ඇතුළත් වේ. 2021 මාර්තු 31 දින වන විට සමාගම සතුව උප සමාගම් හයක් තිබූ අතර මෙම උප සමාගම්වල ව්‍යාපාර කටයුතුවල ස්වභාවය 11 සිට 17 දක්වා පිටුවල 'අප පිළිබඳව' කොටසේ සහ 179 වන පිටුවේ 'ගිණුම්කරණ ප්‍රතිපත්ති' කොටසේ විස්තරාත්මක වශයෙන් දක්වා ඇත. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කිසියම් නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කිරීමේ ක්‍රියාවක සමාගම සහ එහි පරිපාලිත සමාගම් නිරත වී නොමැත.

#### 2.3 කණ්ඩායම් ව්‍යුහයේ වෙනස්කම්

සලකා බලන මූල්‍ය වර්ෂය තුළ සමූහ ව්‍යුහයේ කිසිදු වෙනසක් සිදුවී නොමැත.

#### 2.4 ශාඛා ජාලය

2021 මාර්තු 31 වන විට සමාගමේ සමස්ත ශාඛා ජාලය අංගසම්පූර්ණ ශාඛා 104 කින් සහ සේවා මධ්‍යස්ථාන 99 කින් සමන්විත විය.

#### 2.5 මෙහෙයුම් සමාලෝචනය

2020/21 වර්ෂය තුළ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ සමස්ත තක්සේරුවක්, මූල්‍ය ප්‍රතිඵල සහ විශේෂ සිදුවීම් පිළිබඳ අදහස් දැක්වීම් 17 සිට 19 දක්වා පිටුවල සභාපතිවරයාගේ පණිවිඩය හා ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ පණිවිඩය (20 සිට 24 දක්වා) පිටු වල සහ මෙම වාර්ෂික වාර්තාවේ 40 සිට 98 දක්වා පිටුවල කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය තුළ අඩංගු වේ. මෙම වාර්තා සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයකි. සමූහයේ ආදායම, ප්‍රතිඵල, වත්කම් සහ වගකීම් සඳහා අංශ අනුව දායකත්වය මෙම වාර්ෂික වාර්තාවේ 273 සිට 274 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 56 හි දක්වා ඇත.

#### 2.6 අනාගත දැක්ම

ගෝලීය හා ශ්‍රී ලංකා වෙළෙඳපොළෙහි ඇති අභියෝග, අවස්ථාවන් සහ වර්ධනයන් මත පදනම් වූ සමාගමේ දැක්ම 31 වන පිටුවේ 'උපාය මාර්ග' කොටසේ සහ මෙම වාර්ෂික වාර්තාවේ එක් එක් ප්‍රාග්ධන වාර්තාව අවසානයේ දක්වා ඇත.

### 3. මූල්‍ය ප්‍රකාශන

*(168 (1) (ආ) සහ (2) වගන්තිය)*

> **ගිණුම්කරණ කාල සීමාව සඳහා සමාගම සහ සමූහය වෙනුවෙන් සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද මූල්‍ය ප්‍රකාශන.**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම වාර්ෂික වාර්තාවේ 162 සිට 307 දක්වා පිටුවල සඳහන් වන සභාපති සහ අධ්‍යක්ෂවරයෙකුගේ අනුමැතිය ඇතිව ප්‍රධාන මූල්‍ය කළමනාකරු සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් නිසි පරිදි සහතික කිරීම මත සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

#### 3.1 මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1), 151, 152 සහ 153 (1) සහ (2) වගන්ති ප්‍රකාරව, සමූහයේ සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු කරන සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමූහය වගකිව යුතුය. මේ අනුව, ලාභ හෝ අලාභ ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආදිය 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත මගින් අනිවාර්ය කර ඇති පිරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වල අවශ්‍යතාවන්ට අනුව හා 2007 අංක 07 දරණ සමාගම් පනත, 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත සහ ඒ අනුව නිකුත් කරන ලද උපදෙස් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයට අනුව සකස් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි.

'අධ්‍යක්ෂවරුන්ගේ මූල්‍ය වාර්තාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය' 164 වන පිටුවේ දක්වා ඇති අතර එය මෙම වාර්තාවේ අනිවාර්ය අංගයකි.

#### 3.2 මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජනය

**පොලී ආදායම**

2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ සමස්ත පොලී ආදායම පිළිවෙළින් රුපියල් මිලියන 24,983.45 ක් (2019/20 දී රුපියල් මිලියන 31,459.11) සහ රුපියල් මිලියන 26,821.84 ක් (2019/20 දී රුපියල් මිලියන 33,282.88 ක්) විය. පොලී ආදායම පිළිබඳ වඩාත් විස්තරාත්මක විශ්ලේෂණයක් 189 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන 6.1 සහ 6.1.1 හි දක්වා ඇත.

**කාර්ය සාධනය සහ විසර්ජනය**

2020/21 මූල්‍ය වර්ෂය සඳහා සමාගම සහ සමූහය පිළිවෙළින් රුපියල් මිලියන 4,033.02 ක් සහ රුපියල් මිලියන 5,596.33 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත (2019/20 දී රුපියල් මිලියන 2,942.51 සහ රුපියල් මිලියන 3,591.75). මෙය පෙර වසරට සාපේක්ෂව සමාගමේ සහ සමූහයේ ශුද්ධ ලාභය පිළිවෙළින් 37.06% සහ 55.81% කින් ඉහළ යාමකි.

සමාගමේ කාර්යසාධනය සහ ලාභය අත්පත් කර ගැනීම පිළිබඳ විස්තර පහත පරිදි ලැයිස්තුගත කර ඇත.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

| සමාගම | 2020/21<br>රු. මිලියන | 2019/20<br>රු. මිලියන |
|---|---|---|
| ආදායම් බද්දට පෙර ලාභය | 5,872.59 | 4,551.83 |
| ආදායම් බදු වියදම | (1,839.57) | (1,609.32) |
| වර්ෂය සඳහා ලාභය | 4,033.02 | 2,942.51 |
| පෙර වර්ෂය තුළින් ලාභය ඉදිරියට ගෙන එන ඒම | 14,227.99 | 13,361.81 |
| විසර්ජනය සඳහා ඇති ලාභය | 18,261.01 | 16,304.31 |
| | | |
| විසර්ජනය | | |
| පෙර/ මෙම වසර සඳහා ගෙවන ලද ලාභාංශ | (976.62) | (1,929.32) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | 77.04 | 0.12 |
| සංචිත වලට මාරු කිරීම | (201.65) | (147.12) |
| සම්පූර්ණ විසර්ජනය | (1,101.23) | (2,076.32) |
| අවිසර්ජන ලාභය ඉදිරියට ගෙන යෑම | 17,159.78 | 14,227.99 |

GRI 207-1

**බදුකරණ ප්‍රතිපාදන**

2020 ජනවාරි 20 වන දින නිකුත් කරන ලද නිවේදනයට අනුව (PN/ඩීආර්එල්/2020-01) 2020 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය සේවා සැපයීමට හේතු වන අගය එකතු කිරීම මත 7% ක ණය ආපසු ගෙවීමේ බද්ද රජය විසින් අහෝසි කර ඇත. මෙය බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි ආන්තිකයන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ අතර 2019/20 මුදල් වර්ෂයට සාපේක්ෂව අර්ධ වශයෙන් බලපෑමක් ඇති කළද පීපල්ස් ලීසිං හි ලාභදායිතාවයට එය බලපා ඇත.

වර්ෂය තුළ උපයා ඇති ලාභ මත අදාළ වන ආදායම් බදු අනුපාතය 24% කි. සලකා බලන කාල සීමාව සඳහා මූල්‍ය සේවා සඳහා වැට් බද්ද 15% ක් විය (2019/20 දී 15%). ඒ අනුව, සමාගමේ වර්තමාන ආදායම් බදු වියදම රුපියල් මිලියන 1,839.57 ක් වන අතර ආදායම් බදු වියදම සහ සමාගමේ සහ සමූහයේ විලම්භිත බදු වත්කම්/වගකීම් පිළිබඳ සවිස්තරාත්මක සටහනක් පිළිවෙලින් 17 සහ 44 යන සටහන් මගින් මූල්‍ය ප්‍රකාශනයන්හි  අනාවරණය වේ.

**දේපළ, පිරියත සහ උපකරණ, භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම්**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ සඳහා දැරූ මුළු ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රුපියල් මිලියන 104.69 ක් සහ රුපියල් මිලියන 152.32 ක් වේ. (2019/20 දී රුපියල් මිලියන 213.93 සහ රුපියල් මිලියන 284.22).

2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් සඳහා වූ මුළු එකතු කිරීම් පිළිවෙලින් රුපියල් මිලියන 858.51 ක් සහ රුපියල් මිලියන 292.31 ක් විය (2019/20 දී සමාගම සහ සමූහය සඳහා රුපියල් මිලියන 206.94).

2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය තුළ සමාගම සහ සමූහය අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 0.36 ක් සහ රුපියල් මිලියන 11.66 ක් ආයෝජනය කළහ. (2019/20 දී සමාගම සහ සමූහය විසින් අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 15.12 ක් ආයෝජනය කරන ලදී).

244 වන පිටුවේ 32.4 හි අනාවරණය කරන පරිදි පොත් වටිනාකමින් සැලකියයුතු ලෙස වෙනස්වන සමාගමේ හෝ එහි පරිපාලිත සමාගම්වල ස්ථාවර වත්කම් සහ ඉඩම්වල වෙළඳපොල වටිනාකම තුළ සැලකියයුතු වෙනසක් නොමැති බවට අධ්‍යක්ෂවරු තහවුරු කර සිටී.

දේපල, පිරියත සහ උපකරණ, භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර 32, 33 සහ 34 යන සටහන් ඔස්සේ මූල්‍ය ප්‍රකාශනයන්හි 241 සිට 244, 245 සහ 246 සිට 247 දක්වා පිටුවල දක්වා ඇත.

**සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි**

2021  මාර්තු 31 වන විට සමාගම සහ සමූහයට අයත් සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල විශාලත්වයන්, ස්ථාන, වටිනාකම් තක්සේරු කිරීම් සහ ඇති ගොඩනැගි සංඛ්‍යාව වාර්ෂික වාර්තාවේ 244 වන පිටුවේ සටහන 32.4 හි දක්වා ඇති අතර, ඒවායේ ශුද්ධ පොත් වටිනාකම් ද විස්තර කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති පරිදි මෙම අගයයන් පිළිවෙලින් රුපියල් මිලියන 570.61 ක් සහ රුපියල් මිලියන 3,155.67 ක් විය.

'නිශ්චල දේපල තක්සේරු කිරීම' සහ අනුශාංගික සංශෝධන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව  විසින් නිකුත් කරන ලද 2018 අංක 04 දරණ උපදෙස් මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි සමාගම සිය සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි නැවත ඇගයීම සඳහා ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් යොදා ගනී.

'නිශ්චල දේපල තක්සේරු කිරීම' සහ අනුශාංගික සංශෝධන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව  විසින් නිකුත් කරන ලද 2018 අංක 04 දරණ උපදෙස් මගින් ලබා දී ඇති ප්‍රතිපාදන අනුව සුරැකුමක්/ඇපයක් ලෙස ඇති ඕනෑම දේපොළක් සම්බන්ධයෙන් නැවත ඇගයීම ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් විසින් තක්සේරු කරනු ලැබේ.

නිශ්චල දේපලවල තක්සේරු කළ සාධාරණ වටිනාකම ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කරන ලද 2006 අංක 03 දරණ නියෝගයට හා ඊට අනුශාංගික සංශෝධන අනුව දෝෂ සහිත හා සැක සහිත ණය මත පදනම් ව පවතින්නේ නම් නියාමන ප්‍රතිපාදන මැනීම සඳහා සලකා බලනු නොලැබේ.

**ආයෝජන**

සමාගම සතු ආයෝජන පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 212 සිට 216 දක්වා සහ 234 සිට 238 දක්වා පිටුවල දක්වා ඇති 22, 23, 24, 27, 28 සහ 29 යන සටහන් මගින් අනාවරණ කෙරේ.

**සම කොටස්**

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

සමාගමේ සහ සමූහයේ ස්ථාවර ප්‍රාග්ධනය 2021 මාර්තු 31 වන විට රුපියල් මිලියන 14,892.04 ක් වූ අතර 2020 මාර්තු 31 වන විට එය රුපියල් මිලියන 13,915.41 ක් විය.  2020/21 මූල්‍ය වර්ෂය සඳහා කොටස් ලාභාංශ මගින් ගෙවන අතුරු ලාභාංශයේ ප්‍රතිලයක් ලෙස ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 976.63 කින් වැඩි විය.

**සංචිත**

2021 මාර්තු 31 දිනට සමාගමේ සහ සමූහයේ මුළු සංචිත ප්‍රමාණය පිළිවෙලින් රුපියල් මිලියන 19,449,40 ක් සහ රුපියල් මිලියන 23,568.38 ක් විය. සමාලෝචනයට භාජනය වූ මූල්‍ය වර්ෂය තුළ රුපියල් මිලියන 201.65 ක් රඳවා ගත් ඉපැයීම් වලින් ව්‍යවස්ථාපිත සංචිත වෙත මාරු කරන ලදී. සංචිත වෙනස්වීම් පිළිබඳ තොරතුරු 176 සිට 177 දක්වා පිටුවල ඇති 'ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනයේ' සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් 46 සිට 48 දක්වා සඳහන් ඇත.

**නිකුත් කරන ලද ණය සුරැකුම්පත්**

නිකුත් කරන ලද ණය සුරැකුම්පත් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන 37 හි දක්වා ඇති අතර සමාගමේ ණයකර පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විශ්ලේෂණයක් සටහන 37.2 හි දක්වා ඇත.

**ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවය**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්තාවය පිළිබඳ 2018 අංක 03 දරණ මූල්‍ය ව්‍යාපාර පනතේ උපදෙස් අනුව සිදු කළ ගණනය අනුව ස්ථර 1 (Tier 1) ප්‍රාග්ධන අනුපාතය සහ සමාගමේ මුළු ප්‍රාග්ධන අනුපාතය 2021 මාර්තු 31 වන විට පිළිවෙලින් 17.72% සහ 18.58% ක් විය. අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවන් පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 57 වන පිටුවේ දක්වා ඇත.

## 4. බාහිර විගණකවරුන්

*(168 (1) (ඇ) (ස) සහ (ව) වගන්තිය)*

ඉහත අංශ මගින් සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණක වාර්තාව නිර්වචනය කෙරෙන අතර සමාගම සහ එහි උප සමාගම් විසින් විගණන නිලධාරීන්ට ගෙවිය යුතු ගණන ගාස්තු සහ ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ සිදුකරන ලද වෙනත් සේවාවන් සඳහා වූ ගාස්තු මෙන් ම සමාගම සහ එහි උප සමාගම් සමග විගණකවරුන්ගේ සම්බන්ධතාවය හෝ වෙනත් ලැදියාවන් පිළිබඳ දැක්වේ.

### 4.1 විගණකවරුන් සහ ඔවුන්ගේ ස්වාධීනත්වය

2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුකූලව, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී 'විගණනය ලබන ආයතනය' යන අර්ථ දැක්වීම යටතට ගැනෙන අතර විගණකාධිපති හෝ විගණකාධිපති විසින් බලය පවරන ලද ඕනෑම අයෙකු සමාගමේ විගණනය සිදුකරන ආකාරය සහ ඔවුන්ගේ වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට 168 සිට 171 දක්වා පිටුවල දක්වා ඇති ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ දක්වා ඇති ආකාරයට සිදු වේ.

### 4.2 විගණක වාර්තාව

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව 168 සිට 171 දක්වා පිටුවල දක්වා ඇත.

### 4.3 විගණකවරුන්ගේ පාරිතෝෂික

විගණන හා අදාළ සේවාවන් සඳහා මෙන්ම බදු සම්බන්ධ සේවා ඇතුළු විගණන නොවන සේවාවන් සඳහා සමාගම සහ සමූහය විසින් විගණකවරුන්ට පහත සඳහන් ආකාරයට මුදල් ගෙවන ලදී:

| ගාස්තු | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020/21 රු. මිලියන | 2019/20 රු. මිලියන | 2020/21 රු. මිලියන | 2019/20 රු. මිලියන |
| විගණන සහ අදාළ සේවා | 7.38 | 7.38 | 13.32 | 13.49 |
| විගණන නොවන සේවා | 1.89 | 1.64 | 2.22 | 4.91 |

### 4.4 විගණකවරුන් පත් කිරීම

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 55 වන වගන්තියට අනුව, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී 'විගණන ලබන ආයතනය' ලෙසින් අර්ථ දැක්වීම යටතට ගැනෙන අතර විගණකාධිපති හෝ විගණකාධිපති විසින් බලය පවරන ලද ඕනෑම අයෙකු ඊළඟ මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ විගණනය සිදු කළ යුතුය.

### 5. වර්ෂයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම්

*(168 (1) (ඇ) වගන්තිය*

ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් පමණ ඉක්මවා යෑම සහ අවුල් සහගත වීම අවම කිරීම සඳහා විකල්ප ආකෘතියක් භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 1 හි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 (1) (ඇ) වගන්තියට අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 179 සිට 307 දක්වා පිටුවල දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සැලකිය යුතු වෙනස්කම් 183 සිට 184 දක්වා පිටුවල සටහන 3.4 හි දක්වා ඇත.

### 6. අධ්‍යක්ෂ මණ්ඩලය

*(168 වගන්තිය (1) (ඉ), (ඊ), (ඌ))*

ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ හා එහි අවසානය වන විට සමාගමේ සහ එහි උප සමාග ම්වලට අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද පාරිතෝෂික සහ වෙනත් ප්‍රතිලාභ සමඟ ගිණුම්කරණ කාල සීමාව තුළ සමාගමේ සහ එහි උප සමාගම්වල බැඳියාවන් පිළිබඳ ලේඛනයේ ඇතුළත් කිරීම් ඉහත වගන්තිය මගින් අර්ථ නිරූපණය වේ. සමාගමේ සහ උප සමාගම්වල අධ්‍යක්ෂ කාර්යාලයේ තොරතුරු ද ඇතුළත් වේ.

### 6.1 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් සහ කුසලතා සහ පළපුරුද්ද ඇතුළු ඔවුන් පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 100 සිට 103 දක්වා පිටුවල දක්වා ඇත.

### 6.2 අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සාධනය ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය තක්සේරු කිරීමට භාවිතා කරන ක්‍රමවේදය 120 වන පිටුවේ 'ආයතනික පාලනය' කොටසේ ඉදිරිපත් කෙරේ.

### 6.3 වෙනත් අධ්‍යක්ෂකවරුන්/ අධ්‍යක්ෂවරුන් පිළිබඳ විශේෂිත තනතුරු

අධ්‍යක්ෂවරුන්ගේ වෙනත් අධ්‍යක්ෂ තනතුරු/ වැදගත් තනතුරු පිළිබඳ තොරතුරු 68 සිට 71 දක්වා පිටුවල දක්වේ.

### 6.4 ඉල්ලා අස්වීම් සහ පත්වීම්

ජී බී ආර් පී ගුණවර්ධන මහතා 2020 ජූනි 25 දින සිට බලපැවැත්වෙන පරිදි විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස් වූ අතර 2020 අගෝස්තු 13 දින සිට බලපැවැත්වෙන පරිදි විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ තනතුරට රංජිත් කොඩිතුවක්කු මහතා පත් කරන ලදී.

### 6.5 අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම සහ සමූහය විසින් ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු හා දීමනා පිළිවෙලින් රුපියල් මිලියන 3.86 ක් සහ රුපියල් මිලියන 7.92 ක් විය. මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 58.2.1 හි සංසන්දනාත්මක තොරතුරු දක්වා ඇත.

### 6.6 බැඳියාවන් ලේඛනය/ අධ්‍යක්ෂවරුන්ගේ ගනුදෙනු පිළිබඳ බැඳියාවන්

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සමාගම විසින් බැඳියාවන් පිළිබඳ ලේඛනයන් පවත්වාගෙන යනු ලබන අතර එය පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 192 (2) වගන්තිය ප්‍රකාරව සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ ගනුදෙනු පිළිබඳ ඔවුන්ගේ පොදු ප්‍රකාශයන් කර ඇත. එහි අනාවරණය වූ ගනුදෙනු පිළිබඳ විස්තර අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු යටතේ 275 සිට 276 දක්වා පිටුවල දක්වා ඇත. තවද, මූල්‍ය සමාගම් (ආයතනික පාලනය) උපදෙස් 2008 අංක 03 දරණ නියෝග අනුව සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් තමන් මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් ද්‍රව්‍යමය සම්බන්ධතාවක් හෝ සම්බන්ධතා ව්‍යාපාරය සමගින් පවත්වා ගෙන නොයන බවට පොදු ප්‍රකාශනයක් සිදු කර තිබේ.

### 6.7 කොටස් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

2007 අංක 07 දරණ සමාගම් පනතේ 200 වන වගන්තියට අනුකූලව අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ කොටස් හිමිකාරිත්වය සහ ඒවා අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් පිළිබඳව අනාවරණය කර ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගල කොටස් හිමිකම සහ ප්‍රධාන විධායක නිලධාරීතුමන්ගේ පුද්ගල කොටස් හිමිකම මෙම වාර්ෂික වාර්තාවේ 314 සිට 315 දක්වා පිටුවල 'ආයෝජක සබඳතා' යන කොටසේ අනාවරණය කර ඇත.

### 6.8 රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 117 සිට 118 දක්වා පිටුවල ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.

### 7. තොරතුරු බෙදා හැරීම

මෙම වාර්ෂික වාර්තාවේ 309 සිට 316 දක්වා පිටුවල 'ආයෝජක සබඳතා' යන මාතෘකාව යටතේ කොටස් හිමියන් සම්බන්ධයෙන් සැලකිය යුතු තොරතුරු ප්‍රමාණයක් සහ අනෙකුත් කොටස් ආශ්‍රිත තොරතුරු සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

### 7.1 කොටස් හිමියන්ට සාධාරණ ලෙස සැලකීම

සියළුම කොටස් හිමියන්ට සාධාරණ ලෙස සලකන බවට සමාගම සෑම විටම සහතික කර ඇත.

### 7.2 සාමාන්‍ය කොටස්වල ලාභාංශ

2020/21 මූල්‍ය වර්ෂය සඳහා සමාගම විසින් අතුරු ලාභාංශයක් ලෙස 2020 දෙසැම්බර් 04 දින කොටස්කර ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන ලදී. ඊට අදාළව, සමාගමේ සාමාන්‍ය කොටස් ඡන්ද හිමි 76,899,372 ක් කොටස්කර ලාභාංශ 1:21.1666668487 අනුපාතයට 2020 දෙසැම්බර් 24 දින සිට බලපැවැත්වෙන පරිදි ලැයිස්තුගත කර ඇත.

2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා එක් කොටසකට රුපියල් 0.75 ක අවසාන ලාභාංශයක් අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශ කරන ලදී. මෙය ගෙවනු ලබන්නේ කොටස්කර ලාභාංශයක් ලෙස යි. තවද, සමාගමේ සංස්ථාපන ප්‍රකාශයට අනුකූලව, මෙම ලාභාංශ 2021 අගෝස්තු 5 වන දින පැවැත්වීමට නියමිත වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් අනුමත කළ යුතුය.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 56 (3) වගන්තිය සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති ප්‍රකාරව එම අතුරු ලාභාංශය මෙන්ම 56 (2) වගන්තියට අනුව යෝජිත අවසාන ලාභාංශයෙන් සහ ඉහත කී අතුරු ලාභාංශයෙන් පසු නුබුන්වත්කම පරීක්ෂාවේ අවශ්‍ය කොන්දේසි සපුරා ගැනීමට සමාගම කටයුතු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතු අතර ඉහත ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූලව ලාභාංශ ගෙවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විගණකාධිපතිවරයාගෙ න් නුබුන්වත්කම් පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් සහතිකයක් ලබා ගෙන ඇත.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව



### 8. පරිත්‍යාග

*(168 (1) (උ) වගන්තිය)*

ගිණුම්කරණ කාලය තුළ සමාගම විසින් කරන ලද මුළු පරිත්‍යාග ප්‍රමාණය.

පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත වූ යෝජනාවට අනුව 2020/21 මූල්‍ය වර්ෂය තුළදී සමාගම විසින් රුපියල් මිලියන 23.15 ක් (2019/20 දී රුපියල් මිලියන 58.85 ක්) පරිත්‍යාග වශයෙන් ලබා දෙන ලදී. සමාග මේ ආයතනික සමාජ වගකීම් දෙපාර්තමේන්තුව ආයතනික සමාජ වගකීම් (CSR) මුලපිරීම් සහ ක්‍රියාකාරකම් හසුරුවයි. සමාගමේ ආයතනික සමාජ වගකීම් මූලාරම්භයන් පිළිවෙලින් 'සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය' අංශයේ 79 සිට 90 දක්වා පිටුවල සහ 'ස්වාභාවික ප්‍රාග්ධනය' යන අංශයේ පිටු 91 සිට 96 දක්වා දක්වා ඇත.

### 9. ආයතනික පාලනය

*(හොඳම පුහුණුවීම් කේතය ඇ.6, ඇ.6.1, ඇ.2, ඇ.1.4)*

සමාගමේ ආයතනික පාලන මූලධර්ම දියුණු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී කටයුතු කරන අතර සමාගම, කළමනාකරුවන්, කොටස් හිමියන් සහ අනෙකුත් පාර්ශවකරුවන් වැනි සමාගමේ විවිධ සහභාගිවන්නන් පාලනය කරන ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් ඇතුළුව ආයතනික පාලන ප්‍රඥප්තියක් සම්මත කරගෙන ඇත. ආයතනික පාලනයේ ඉහළම මූලධර්ම සංවිධානය පුරා පවත්වාගෙන යනු ලැබේ.

ඉහත ආයතනික පාලන ප්‍රඥප්තිය සම්මත කර ගැනීමේදී, වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ නිර්දේශයන්, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ රීති සහ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) උපදෙස් 2008 අංක 03, 2008 අංක 4 සහ 2013 අංක 6 යන කරුණු වලට අනුකූලව කටයුතු කරන බව මණ්ඩලය සහතික කර තිබේ.

**ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පිළිබඳ සභාපතිවරයාගේ සහතික කිරීම**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී විසින් ව්‍යාපාරික චර්යා ධර්ම හා ආචාරධර්ම සමාගම පුරා පුළුල්ව හඳුන්වා දී ඇති බවත් ව්‍යාපාරික චර්යා ධර්ම බෙදා හැරීම, අධීක්ෂණය කිරීම හා අනුකූල වීම සඳහා ක්‍රියා පටිපාටියක් සකස් කර ඇති බවට ද සභාපතිවරයා තහවුරු කරයි.

**අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනයන්:**

1. නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරන කිසිදු ක්‍රියාකාරකමක සමාගම නිරත වී නොමැත.
2. කොටස් හිමියන්ට සාධාරණ ලෙස සැලකීම සහතික කිරීම සඳහා සමාගම සියලු උත්සාහයන් ගෙන ඇත.
3. ව්‍යාපාරය අඛණ්ඩව පවතින බව.
4. අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය කාර්යක්ෂමව හා සාර්ථකව පිළිපැදීම සඳහා සමාගම ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ 111 සිට 138 දක්වා පිටුවල ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.
5. අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුමට අනුව, සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය වී නොමැත.

**ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතියට අනුකූල වීම පිළිබඳ ප්‍රධාන කළමනාකාරීත්වයේ ප්‍රකාශය**

ඔවුන්ගේ උපරිම දැනුමට අනුව, සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය වී නොමැත.

#### 9.1 අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටුව සහ අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව යන කමිටු අවශ්‍ය අනුරූප සුදුසුකම් හා පළපුරුද්ද ඇති අධ්‍යක්ෂවරුන් ඇතුළත් ව අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වශයෙන් කටයුතු කරයි. මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇති අදාළ කමිටු වාර්තාවල එකී කමිටුවල සංයුතිය දක්වා ඇත.

#### 9.2 නීති හා රෙගුලාසි වලට අනුකූල වීම

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුමට සහ විශ්වාසයට අනුව, සමාගම සහ සමූහය කිසිදු ආකාරයකින් නීති හා රෙගුලාසිවලට පටහැනිව කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැත.

#### 9.3 ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය, අනෙකුත් නියාමන ආයතන සහ සේවකයින් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදු කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසයේ උපරිමයෙන් තහවුරු කර ඇත.

#### 9.4 පාරිසරික ආරක්ෂාව

අධ්‍යක්ෂවරුන් තහවුරු කරන්නේ තම උපරිම දැනුමේ ප්‍රකාරයන්ට සමාගම සහ සමූහය පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නැති බවයි.

#### 9.5 ESG වාර්තා කිරීම

පාරිසරික, සමාජීය සහ පාලන ප්‍රතිශ්ඨාවන්ට සමාගම එහි ව්‍යාපාර ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සහ වටිනාකම එකතු කිරීම කෙරෙහි බලපෑම් කළ හැක. සමාගමේ වාර්ෂික වාර්තාව තුළ ESG අවදානම් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් වන අතර අවස්ථාවන් හඳුනාගෙන කළමනාකරණය කර තක්සේරු කරන අතර 95 පිටුවේ දක්වා ඇති පරිදි වාර්තා කරනු ලැබේ.

### 10. පිළිගැනීම

*(168 (1) (ඔ) වගන්තිය)*

මෙම වාර්තාවේ අඩංගු කරුණු/ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු සහ සමාගමේ ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පිළිගැනීම සිදු කරයි.

143 වන පිටුවේ සඳහන් කර ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය පිළිගැනීම සිදු කර ඇත.

### 11. පාර්ශවකරුවන් කළමනාකරණය සහ ඒකාබද්ධ වාර්තාකරණය

පාරිභෝගිකයින්, සේවකයින්, ආයෝජකයින්, සැපයුම්කරුවන් සහ ප්‍රජාව ඇතුළු සිය වටිනා පාර්ශවකරුවන් කළමනාකරණය කිරීම සඳහා සමාගම සිය වටිනාකම් උත්පාදන ක්‍රියාවලිය තුළ පියවර ගෙන ඇත. වාර්තාකරණ ක්‍රියාවලියේදී ආර්ථික, පරිසර සහ සමාජ බලපෑම් පිළිබඳ ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර ඇත. මෙම ප්‍රාග්ධන කළමනාකරණ වාර්තා වාර්ෂික වාර්තාවේ 40 සිට 98 දක්වා පිටුවල කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය යටතේ ඉදිරිපත් කෙරේ.

### 12. අවසන් වී නොමැති අධිකරණ කටයුතු

සමාගමේ නීතිඥවරුන් සමඟ සාකච්ඡා කර අධ්‍යක්ෂවරුන් විසින් එළැඹී ඇති මතයට අනුව, සමාගමට එරෙහිව දැනට පවතින අධිකරණ කටයුතු මඟින් සැලකියයුතු ලෙස මූල්‍ය හෝ මෙහෙයුම් කටයුතු කෙරෙහි අනාගතයේ බලපෑමක් සිදු නොවේ. සමාගමට එරෙහිව පවතින නඩු පිළිබඳ විස්තර 531.1 සටහනෙහි 270 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

### 13. මානව සම්පත්

සමාගම විසින් ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය හෝ ආගම කුමක් වුවත් පුද්ගලයින්ට ගෞරව කරන සහ රැකියා අවස්ථා සුරක්ෂිත කරන පරම වශයෙන් වෙනස් කොට සැලකීමකින් තොර වූ රැකියා ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත.

2021 මාර්තු 31 වන විට සමාගම සමඟ පුද්ගලයින් 2,343 ක් (2020 මාර්තු 31 වන විට පුද්ගලයින් 2,401 ක්) රැකියා වල නියුක්ත වූහ.

### 14. අන්තර්ජාලය භාවිතය සම්බන්ධ කටයුතු සහ සයිබර් ආරක්ෂණය

*(මනා පරිචය පිළිබඳ සංග්‍රහය උ.1, උ.2, උ.3)*

සයිබර් අවදානම් කළමනාකරණය පිළිබඳ කටයුතු සඳහා සමාගම ප්‍රමාණවත් පළපුරුද්දක් සහ බලයක් සහිතව තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (ISO) පත් කර ඇති අතර ඒ සඳහා මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයේ නිතිපතා හා ප්‍රමාණවත් කාලයක් වෙන් කර ඇති බව මණ්ඩලය තහවුරු කරයි. අදාළ තොරතුරු 121 වන පිටුවේ ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.

### 15. වාර්තා කිරීමේ කාලයෙන් පසු සිදුවීම්

වාර්තා කිරීමේ කාලයෙන් පසු සිදුවීම් පිළිබඳ විස්තර සටහන 60, 307 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට හෙළිදරව් කර ඇත.

**16. ලැයිස්තුගත කිරීමේ නීති වල 7.6 සහ 9.3.2 වගන්තිවල දැක්වෙන වාර්ෂික වාර්තාවේ අඩංගු කරුණු වලට අනුකූල වීම**

| රීති යොමුව | හෙළිදරව් කිරීමට අවශ්‍ය තොරතුරු | අනුකූලතාවයේ තත්වය | යොමු පිටුව |
|---|---|---|---|
| 7.6 (i) | මූල්‍ය වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂවරුන් වූ අයගේ නම් | ✅ | 100-103 |
| 7.6 (ii) | වර්ෂය තුළ සමාගමේ සහ එහි උප සමාගම්වල ප්‍රධාන කටයුතු | ✅ | 11-12 |
| 7.6 (iii) | වර්ෂය අවසානයේ විශාලතම කොටස් හිමියන් 20 දෙනා පිළිබඳ තොරතුරු | ✅ | 314 |
| 7.6 (iv) | මහජන රඳවා ගැනීමේ ප්‍රතිශතය | ✅ | 313 |
| 7.6 (v) | අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් දරන කොටස් ගණන | ✅ | 314-315 |
| 7.6 (vi) | අපේක්ෂිත ප්‍රමාණාත්මක අවදානම් සාධක වලට අදාළ තොරතුරු | ✅ | 153-161 |
| 7.6 (vii) | සේවකයින්ට හා කාර්මික සබඳතාවලට අදාළ ප්‍රමාණාත්මක ගැටළු පිළිබඳ විස්තර | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සේවකයින් හා කාර්මික සම්බන්ධතාවලට අදාළ ප්‍රමාණාත්මක ගැටළු නොමැත | |
| 7.6 (viii) | වර්ෂය අවසානයේදී ගොඩනැගිලි / ඉඩම් සහ ආයෝජන දේපල පිළිබඳ තොරතුරු | ✅ | 244 |
| 7.6 (ix) | වර්ෂය අවසානයේදී ප්‍රකාශිත ප්‍රාග්ධනය නියෝජනය කරන කොටස් ගණන | ✅ | 311 |
| 7.6 (x) | එක් එක් පන්තියේ කොටස් සුරැකුම්පත් වල හිමියන්ගේ සංඛ්‍යාව හා අදාළ තොරතුරු බෙදා හැරීමේ සටහන | ✅ | 312 |
| 7.6 (xi) | කොටස්, ණය, ණය ශ්‍රේණිගත කිරීම්වල වෙනස්වීම් පිළිබඳ අනුපාත සහ වෙළඳපල මිල තොරතුරු | ✅ | 309, 310, 313, 315, 316 |
| 7.6 (xii) | සමාගමේ හෝ උප සමාගම්වල ස්ථාවර වත්කම්වල සැලකිය යුතු වෙනස්කම්. | ✅ | 242-243 |
| 7.6 (xiii) | වර්ෂය තුළ මහජන නිකුතුව, හිමිකම් නිකුතුව සහ පෞද්ගලික ස්ථාපනයන් තුළින් රැස් කරන ලද අරමුදල් පිළිබඳ විස්තර | වර්ෂය තුළ මහජන නිකුතුවක්, හිමිකම් නිකුතුවක් හෝ පෞද්ගලික ස්ථාපනය කිරීමක් තුළින් අපි අරමුදල් රැස් කළේ නැත. | |
| 7.6 (xiv) | සේවක කොටස් හිමිකාරිත්වය හෝ කොටස් විකල්ප යෝජනා ක්‍රම සම්බන්ධව තොරතුරු | මේ වන විට සමාගමට කිසිදු සේවක කොටස් හිමිකමක් හෝ කොටස් විකල්ප යෝජනා ක්‍රමයක් නොමැත | |
| 7.6 (xv) | රීති 7.10.0, 7.10.5 ඇ සහ ලැයිස්තුගත කිරීමේ රීති වල 7 වන වගන්තියේ 7.10.6 ඇ ප්‍රකාරව ආයතනික පාලන භාවිතයන්ට අදාළ අනාවරණය. | ✅ | 123-124 |
| 7.6 (xvi) | සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනුව කොටස් වලින් 10% හෝ ආයතනයේ මුළු වත්කම් වලින් 5% ඉක්මවීම. | 2016 ජනවාරි 01 දින අවලංගු කරන ලදී | |
| 9.3.2 (a) | පුනරාවර්තන නොවන සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු කොටස් වලින් 10% ක් හෝ මුළු වත්කම් වලින් 5% ඉක්මවීම | 2020/21 මූල්‍ය වර්ෂය තුළ සීමාව ඉක්මවා ගිය පුනරාවර්තන නොවන ගනුදෙනු නොමැත | |
| 9.3.2 (b) | දළ ආදායමෙන් 10% ඉක්මවන පුනරාවර්තන සම්බන්ධ සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු | 2020/21 මුදල් වර්ෂය තුළ සීමාව ඉක්මවා ගිය පුනරාවර්තන ගනුදෙනු පිළිබඳ තොරතුරු සටහන 58.5 යටතේ මූල්‍ය ප්‍රකාශන තුළින් අනාවරණය වේ. | 279 |

**17. සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු** *(කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති 9 වන කොටස)*
කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියේ සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු පිළිබඳ නීති රීතිවලට අනුකූල බවට අධ්‍යක්ෂවරුන් තහවුරු කරයි.

**18. අඛණ්ඩ පැවැත්ම** *(මනා පරිචයන් පිළිබඳ කේතය ඈ1.4)*
සමූහයේ කළමනාකරණය අඛණ්ඩව පැවැත්මේ හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අනාගතයේ දී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සෑහීමකට පත් වේ. තවද, අඛණ්ඩව පවත්වාගෙන යාමට සමූහයට ඇති හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ගැන කළමනාකරණය හඳුනාගෙන නොමැත. එම නිසා, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යෑම පිළිබඳ කරුණු සැලකිල්ලට ගනිමින් කටයුතු කෙරී ඇත.

2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම නිර්ණය කිරීමේ දී, ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව, සමාගම් සමූහය සඳහා කොවිඩ් -19 මගින් ඇති විය හැකි අපේක්ෂිත බලපෑම් සහ අඛණ්ඩ ව පවත්වා ගෙන යෑමේ පදනම භාවිතයේ යෝග්‍යතාවය කළමනාකරණය විසින් තක්සේරු කර ඇත.

අපේක්ෂිත ආදායම, පිරිවැය කළමනාකරණය, ලාභදායිතාවය, අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් කල් දැමීමට ඇති හැකියාව, භාවිතයට නොගත් ණය සහ අඛණ්ඩව සැපයීමේ හැකියාව ආදිය ඔස්සේ බහුවිධ ආතති පරීක්ෂා යටතේ පුළුල් පරාසයක සාධක සැලකිල්ලට ගනිමින් සමූහය සිය ව්‍යාපාරවල ප්‍රත්‍යස්ථභාවය ඇගයීමට ලක් කළ අතර අවම බලපෑමක් ඇතිව ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව ඒ ඔස්සේ සමාලෝචනය කෙරිණ. සමූහයේ එක් එක් ක්ෂේත්‍රය පිළිබඳ සවිස්තර වාර්තාවක් සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම සහ කළමනාකාරිත්වය විසින් ඉහත කරුණු ඇගයීමෙන් පසු, ප්‍රතිඵලවල පරාසය හා සම්භාවිතාව පිළිබඳව නිසි ලෙස සලකා බැලීමෙන් අනතුරුව, සමාගමට ඉදිරියට යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බව කළමනාකාරිත්වය සෑහීමකට පත් වූ අතර අපේක්ෂිත අනාගත මෙහෙයුම් අඛණ්ඩ පවත්වා ගෙන යාමේ පදනම මත ක්‍රියාත්මක කළ හැකි බව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී තහවුරු කෙරිණ.

**19. වාර්ෂික මහා සභා රැස්වීම**
25 වන වාර්ෂික මහා සභා රැස්වීම 2021 අගෝස්තු 05 දින ප.ව. 2.30 ට කොළඹ මරදාන පාරේ අංක 1161 දරණ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ප්‍රධාන කාර්යාලයේ 10 වන මහලේ, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. 25 වන වාර්ෂික මහා සභා රැස්වීමට අදාළ රැස්වීම පිළිබඳ දැන්වීම මෙම වාර්ෂික වාර්තාවේ 330 වන පිටුවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගයෙන්

**සෝර්ලි පීටර්ස්**
*අධ්‍යක්ෂ*

**සුජීව රාජපක්ෂ**
*සභාපති*

**ලක්මිණි කෝට්ටේගොඩ**
*සමාගම් ලේකම්*

2021 ජූලි 07
කොළඹ

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව



සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව "විගණන කමිටුව" හෝ "කමිටුව" 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සිය වාර්තාව මෙසේ ඉදිරිපත් කරයි. මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### කමිටුවේ සංයුතිය සහ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබේ. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

| සාමාජිකයාගේ නම | රැස්වීම් සඳහා සහභාගී වීම |
|---|---|
| **කොරලි පීටර්ස් මිය - කමිටු සභාපතිනී**<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ | 14/14 |
| **යූ එල් ආශෝක ඩබ්ලිව් බණ්ඩාර මයා**<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ | 13/14 |
| **අසාම් ඒ අහමත් මයා**<br>ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ | 12/14 |

උදේශ් ගුණවර්ධන මහතා, අභ්‍යන්තර විගණන ප්‍රධානී, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

### කමිටුවෙහි ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩල අනුමත විගණන කමිටු ප්‍රඥප්තිය මගින් කමිටුවෙහි යොමු නිර්දේශ පැහැදිලිව නිර්වචනය කෙරේ. කමිටුවෙහි ක්‍රියාකාරකම් සහ ගැටලු සම්බන්ධ කවර හෝ වෙනස්වීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රඥප්තිය වාර්ෂිකව සමාලෝචනයට ලක් කෙරේ. 2021 පෙබරවාරි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟත්වය සහිතව ප්‍රඥප්තිය අවසන් වරට සමාලෝචනය කෙරුණි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අරමුණ වනුයේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධතිය, බාහිර සහ අභ්‍යන්තර විගණන සම්බන්ධ ක්‍රියාකාරකම් ආශ්‍රිත පොදු අධීක්ෂණයේ දී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දැක්වීම සහ නීතිමය සහ නියාමන අවශ්‍යතා සමග සමාගමෙහි අනුකූලතාව ඇගයීමට ලක් කිරීමයි. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකිව යුතු අතර සිය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරන්තරයෙන් වාර්තා කරනු ලබයි.

කමිටු රැස්වීමකදී ඕනෑම සේවකයෙකුගෙන් ප්‍රශ්න කිරීම, තොරතුරු වෙත සම්පූර්ණ පිවිසුම, සමාගමේ වියදමින් බාහිර වෘත්තීය වූ උපදෙස් ලබා ගැනීම, සහ අනුකමිටු වෙත බලය පැවරීම ඇතුළු ඕනෑම කරුණක් සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීමේ පූර්ණ අධිකාරීත්වය කමිටුව සතු වේ.

### 2020/21 මූල්‍ය වර්ෂය තුළ කමිටුවෙහි ක්‍රියාකාරකම්

2021 මාර්තු 31වැනි දින අවසන් වූ මූල්‍ය වර්ෂය තුළදී කමිටුව රැස්වීම් දාහතරක් (14) පවත්වන ලදී. සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සමගින් මෙකී රැස්වීම් වල කටයුතු පිළිබඳව නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. වසර තුළදී බාහිර විගණකවරුන් වන, විගණකාධිපතිවරයාගේ සහ අර්නස්ට් ඇන්ඩ් යංග් හි නියෝජිතයින් රැස්වීම් තුනක් සඳහා සහභාගි වූහ. අවශ්‍යතාවය පරිදි වරින්වර ප්‍රධාන විධායක නිලධාරීවරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සාමාජිකයින් ආරාධනා මත රැස්වීම් වලට සහභාගි වේ.

### මූල්‍ය වාර්තාකරණය

සමාගමේ ගිණුම්කරණ වාර්තා අනුව, සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති නිරීක්ෂණ මණ්ඩල පනත, කොළඹ කොටස් හුවමාරුවේ සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නියමයන් සහ රෙගුලාසිවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගයන්ට අනුකූලව සමාගමේ කටයුතු පිළිබඳව සාධාරණ සහ පැහැදිලි අදහසක් පිළිබිඹුවීමට කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් මුදාහැරීමේදී මෙම කමිටුව සහය වේ.

කමිටුව සමාගමේ අතුරු සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර සමාලෝචනය කරයි. එමෙන්ම විගණන කමිටුව ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්, සහ LKAS/ SLFRS මත පදනම් වූ ලාභ සැසඳීම සහ ලාභාංශ ප්‍රකාශ කිරීමෙන් විචක්ෂණ අනුපාතවලට වන බලපෑමට අදාළ රෙගුලාසිවලට අනුකූලව සමාලෝචනය කරයි.

එමෙන්ම, කමිටුව මගින් වාර්ෂික වාර්තාවේ ඇතුලත් කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය, සමාගමෙහි කටයුතු සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව, මූල්‍ය වාර්තකරණය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සහ විගණන කමිටු වාර්තාව සමාලෝචනය කර අනුමත කරන ලදී.

### SLFRS ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම

කමිටුව මගින් අපහායන ප්‍රතිපත්ති අත්පොත සමාලෝචනය කොට SLFRS 9 මූල්‍ය සාධනපත්‍ර යටතේ අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම ඇතුළුව සමාගම මගින් ආදේශ කර ගනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් පරීක්ෂා කරන ලදී. මෙහිදී අපහායන ඇගයුම් ක්‍රමවේදය විස්තරාත්මකව සමාලෝචනය කරන ලද අතර කමිටුව මගින් වැඩිදුර වර්ධනයන් සඳහා උපදෙස් ලබා දෙන ලදී. සමාගමෙහි අපහායන ගණනය කිරීම් සහ ණය පමාසහනයන් මත ආදායම් හඳුනාගැනීම සම්බන්ධ අවබෝධයන් සපයන ලදී.

### බාහිර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතට අනුව, විගණකාධිපති විසින් හෝ විගණකාධිපති විසින් පත්කරනු ලබන යම් පුද්ගලයෙක් විසින් විගණනය සිදුකරනු ලබන බව විගණකාධිපති විසින් දන්වා ඇත. 2020/21 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ බාහිර විගණනය ඉටුකිරීම සඳහා විගණකාධිපති වෙත සහාය වීම සඳහා අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් විගණකවරුන් පත් කර ඇත. ව්‍යවස්ථාව මගින් පත්කරනු ලැබ ඇති පරිදි විගණකාධිපතිවරයා සමාගමෙහි බාහිර විගණකවරයා වන බැවින්, කමිටුව මගින් බාහිර විගණකගේ සහභාගීත්වය සම්බන්ධයෙන් කිසිදු කාර්යභාරයක් ඉටු කිරීම අවශ්‍ය නොවේ.

මූල්‍ය වර්ෂය තුළදී කමිටුව තුන්වරක් බාහිර විගණකවරුන් හමුවූ අතර එහිදී වාර්ෂික විගණනය ඇරඹීමට පෙර විගණන සැලසුම, විගණනය සිදු කිරීමේදී ආදේශ කර ගැනීමට යෝජිත ක්‍රමවේදය සහ විෂයපථය පිළිබඳව විගණකවරුන් සමග සාකච්ඡා කරන ලදී. මෙහිදී ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයන්ගේ සහභාගිත්වයකින් තොරව විගණන කමිටුව සමග තවදුරටත් සාකච්ඡා කළ යුතු ප්‍රමාණාත්මක කරුණු, ගැටලු හෝ සීමාවන් සම්බන්ධයෙන් විමසීම් සිදු කිරීමට බාහිර විගණකවරුන් හට අවස්ථාව ලබා දෙන ලදී.

කමිටුව මගින් විගණකවරුන් විසින් සපයනු ලබන විගණන නොවන සේවාවන් පිළිබඳ සමාලෝචනය කරමින් අදාල සේවාවන් අත්හිටුවන ලද සේවාවන් ගණයට අයත් නොවන බවට සහ එවැනි සේවාවන් මගින් විගණකාධිපතිවරයා වෙත සහාය ලබාදීම සඳහා පත්කරන ලද බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ වාස්තවිකත්වය හානියට පත් නොවන බවට තහවුරු කරන ලදී. ඒ අනුව, බාහිර විගණකවරුන් වෙත ගෙවීම් සිදු කිරීමේදී අදාල වන නිර්ණායකය සහ සහභාගීත්වයට පෙර විගණකාධිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය සංශෝධනය කරන ලදී.

කමිටුව මගින් ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපිය සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ එයට අදාළ කළමානාරීත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කරන ලදී. කළමනාකරණ ලිපිය තුළ ඇති නිර්දේශ කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරන ලද බවට සහතික කිරීමට කමිටුව පියවර ගනු ලැබිය.

### අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යය සිදුකිරීම සඳහා සහ විගණන කමිටුව වෙත වාර්තා කිරීම සඳහා විශේෂිත අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් පවතී. කමිටුව මගින් අභ්‍යන්තර විගණන අංශය එහි විගණනයට ලක් වන ක්‍රියාකාරකම්වලින් ස්වාධීන බවට තහවුරු කරන ලද අතර සිය කාර්යයන් ස්වාධීනව සිදු කිරීමට අවශ්‍ය අධිකාරිත්වය මෙම අංශය සතු බවට තහවුරු කරන ලදී.

වසර තුළ, විගණන කමිටුව අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ඵලදායිත්වය සහ විෂයමූලිකබව වර්ධනය කිරීම පිණිස අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සහ අත්පොත සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදී. අමතර අවධානාත්මක ක්ෂේත්‍රයන්, ක්‍රියාවලි වර්ධනයන් සහ සමාගමේ සහ ක්ෂේත්‍රයේ ප්‍රවණතා පිලිබිඹු වන පරිදි විගණන ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය සහ අභ්‍යන්තර විගණන වැඩසටහන සමාලෝචනය කොට යාවත්කාලීන කරන ලදී.

සමාගමෙහි තොරතුරු පද්ධති විගණනයන් සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මෙම වසරේදී දී පළපුරුදු තොරතුරු පද්ධති විගණකවරයකු බඳවා ගනිමින් තොරතුරු පද්ධති විගණන ඒකකය ස්ථාපනය කරන ලදී. අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරන ලද පරිපාලිත සමාලෝචනයන් වල විෂයපථය ඇගයීමට ලක් කරමින් පාරිපාලිත සමාලෝචන ප්‍රතිපත්තියක් හඳුන්වාදෙන ලදී.

තවද, කමිටුව අභ්‍යන්තර විගණන සැලැස්ම සහ මූල්‍ය වසර සඳහා ක්‍රමෝපාය සමාලෝචනය කර අනුමත කරන ලදී. සමාගමෙහි අභ්‍යන්තර විගණන අංශය මගින් පරිපාලිතයන් ඇතුළුව ව්‍යාපාරික ඒකකයන්හි අන්තර්ජාලගත සහ ස්ථානීය පරීක්ෂාවන් සිදුකරන ලදී. මෙහිදී සැලකිය යුතු සොයාගැනීම් සහ සාමාන්‍ය සොයා සොයාගැනීම් කමිටුවේ අවධානයට ලක් වූ අතර ඒවායේ හේතු හඳුනාගනිමින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු යොදන ලදී. කමිටුව මගින් ණය සමාලෝචනය, තොරතුරු පද්ධති විගණනයන් සහ අභ්‍යන්තර විමර්ශන සම්බන්ධ වාර්තා ඇගයීමට ලක් කරමින් ඒවා මත පදනම්ව කළමනාකාරීත්වය වෙත සුදුසු නිර්දේශ සහ උපදෙස් නිකුත් කරමින් අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාවට නැංවෙන බවට තහවුරු කෙරිණි. කමිටුව මගින් විධායක කළමනාකාරිත්වයෙහි සහභාගිත්වයකින් තොරව අභ්‍යන්තර විගණකවරුන්ද හමුවිය.

## නියාමන අනුකූලතාවය

කමිටුව මගින් සමාගම් පනත, මූල්‍ය ව්‍යාපාර පනත සහ වෙනත් අදාළ මූල්‍ය වාර්තාකරණය ආශ්‍රිත රෙගුලාසි සහ අවශ්‍යතා කෙරෙහි සමාගමෙහි අනුකූලතාවය ඇගයීමට ලක් කරන ලදී. එබඳු නීතිමය සහ නියාමනමය අවශ්‍යතා සමඟ අනුකූලතාවය නිරීක්ෂණය කිරීම සඳහා කමිටුව මගින් අනුකූලතා නිලධාරිවරයා විසින් භාරදෙන ලද වාර්තා පරීක්ෂාවට ලක් කෙරුණි. කමිටුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂා වාර්තා වල නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ඒ කෙරෙහි කළමණාකාරිත්වයෙහි ප්‍රතිචාරය නිරීක්ෂණය කෙරුණි.

## අභ්‍යන්තර පාලනයන්

මෙම අවශ්‍යතාවය කෙරෙහි අනුකූල වන බවට සාධාරණ අයුරින් සහතිකයක් සැපයීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් පවත්වාගෙන යාමට සකසා ඇති ක්‍රියාපටිපාටීන් නිරීක්ෂණය කිරීම සඳහා කමිටුව වෙත අභ්‍යන්තර සහ බාහිර විගණකවරුන් ගේ සහාය හිමි වේ. කමිටුව මගින් විවිධ ප්‍රතිපත්ති සමාලෝචනය කොට නිර්දේශ කරන ලද අතර සංසන්දනය නොකරන ලද ගිණුම් වල සංසන්දනය නිරීක්ෂණය කරන ලදී.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පිළිබඳ වාර්තාව කමිටුව මගින් සමාලෝචනය කොට අනුමත කිරීමෙන් අනතුරුව වාර්ෂික වාර්තාවේ ඇතුළත් කරන ලදී.

## තොරතුරු දැනුම්දීම සහ වංචාව

සමාගමේ තොරතුරු දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය මගින් ආයතනික වංචා අවදානම් කළමනාකරණය සඳහා පුළුල්ව පැතිරුණු අවිධිමත් මාර්ග යක් ලෙස සේවය කිරීම අපේක්ෂා කරයි. මෙම ප්‍රතිපත්තිය සමාග මේ අභ්‍යන්තර ජාලයේ ප්‍රකාශයට පත්කර ඇති අතර තොරතුරු දැනුම් දෙන්නන්ගේ දැඩි රහස්‍යතාව පවත්වා ගැනීම සහතික කරයි.

සමාගම තුළ යම් අවිධිමත් හෝ නීති විරෝධී ක්‍රියාවක් හෝ සදාචාර විරෝධී ව්‍යවහාරයක් දකින හෝ එවැනි දෙයක් පිළිබඳ විශ්වාසී තොරතුරු ලැබෙන යම් සේවකයෙක් තොරතුරු දැනුම්දීම ක්‍රියාවේ යෙදවීම සඳහා දිරිගන්වනු ලබයි. මෙය භාවිතා කිරීම දිරි ගැන්වීමට සහ යම් අවංක ගැටලු මතු කිරීමට සේවකයින් අතර දැනුවත්කම ඉහළ නැංවීමට කටයුතු කරයි.

කමිටුව මගින් සේවකයන් හට මූල්‍ය වාර්තාකරණයේ, අභ්‍යන්තර පාලන වල හෝ වෙනත් කරුණු ආශ්‍රිතව අක්‍රමිකතා පිළිබඳව සිය අදහස් රහස්‍යභාවයෙන් යුතුව පළ කිරීමට හැකිවන පරිදි අදාළ විධිවිධාන තව තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

මේ ඔස්සේ වාර්තා කෙරෙන සහ වෙනත් ක්‍රම වලින් හඳුනාගැනෙන සිදුවීම් සම්බන්ධ ස්වාධීන විමර්ශන සිදුකිරීම සඳහා අදාළ ක්‍රියා පටිපාටීන් ස්ථාපනය කොට ඇත.

## කමිටුවෙහි ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් යොමු නිර්දේශ වලින් ප්‍රකාශ කෙරෙන සිය අධිකාරිත්ව විෂයපථය තුළ ස්වකීය වගකීම් මුදාහරින ලදී. කමිටුව මගින් මෙකී වගකීම් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ඇගයුමක් සිදුකරන ලද අතර මූල්‍ය වර්ෂය තුල කමිටුව මගින් සිය වගකීම් සැහීමකට පත්විය හැකි පරිදි ඉටු කරන ලද බවට නිගමනය කෙරුණි.



**කොරලි පීටර්ස්**
*ස්වාධීන අධ්‍යක්ෂ/සභාපති*
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2021 ජූලි 07

# මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව

### යොමු නිර්දේශ

මූල්‍ය වර්ෂයේ දී සමාගමෙහි මානව සම්පත් අංශයෙහි කටයුතු සම්බන්ධ අධීක්ෂණය සවිමත් කිරීමේ අරමුණින් කමිටුවේ විෂයපථය තුළට මානව සම්පත් පාර්ශවය ඇතුලත් කිරීම උදෙසා පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුවේ යොමු නිර්දේශ සංශෝධනය කරන ලදී. දීර්ඝ කරන ලද යොමු නිර්දේශ සහිතව කමිටුව වඩාත් ක්‍රියාකාරී ලෙස සමාගමේ සේවකයන්ගේ ප්‍රතිලාභ උදෙසා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා දායක වී ඇත.

### සංයුතිය සහ කමිටු රැස්වීම්

කමිටුව අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් සියළුදෙනාම විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වේ. කමිටු සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් දෙදෙනෙකු ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ.

වසර තුළදී කමිටුව පස් වරක් රැස්වුණු අතර මානව සම්පත් සම්බන්ධ කරුණු පිළිබඳ දීර්ඝ විවාදයන් ඔස්සේ සමාගමෙහි මානව සම්පත් කළමනාකරණය විධිමත් කිරීමට සහ සේවක තෘප්තිය ඉහළ නැංවීමට කමිටුව සමත් විය.

මෙම අතිශය වැදගත් කමිටුව හමුවට පැමිණෙන කරුණු වෙත වටිනාකම් එක් කිරීම සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි දැනුම සහ පළපුරුද්ද සහිත කමිටු සාමාජිකයින් නිරන්තරයෙන් කටයුතු කරන ලදී.

#### සාමාජික පැමිණීම

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩල තත්ත්වය | සාමාජිකත්වය | පැමිණීම |
|---|---|---|---|
| අශෝක බණ්ඩාර මයා | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සභාපති | 5/5 |
| කොරලි පීටර්ස් මිය | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සාමාජික | 5/5 |
| රොහාන් පතිරගේ මයා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික | 5/5 |

2021 මාර්තු 31 වන විට පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුවේ සාමාජිකයන්ගේ කෙටි විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 100 සිට 103 දක්වා ඉදිරිපත් කෙරේ.

**2020/21 විශේෂතා**

- සමාගමේ මානව සම්පත් සම්බන්ධ කරුණු අධීක්ෂණය කිරීම සඳහා කමිටුවේ යොමු නිර්දේශ වෙත සංශෝධන නිර්දේශ කරන ලදී
- සේවකයින් දිරිගැන්වීම් සඳහා ඉලක්කගත ලාභයක් අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිලාභ සැලසුමක් ප්‍රවර්ධනය කරමින් 2020 දෙසැම්බර් මස ලාභ කඩිනම් කිරීමේ සැලසුමක් නිර්දේශ කරන ලදී.
- ලාභ කඩිනම් කිරීමේ සැලසුම අත්පත් කරගත් විශිෂ්ට සේවකයින් ඇගයුමට ලක් කර ලදී.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා සංශෝධිත විනය සංග්‍රහය සහ චර්යාධර්ම සංග්‍රහය නිර්දේශ කරන ලදී.

### කමිටුවේ විෂයපථය

#### විධි නියෝගය - මානව සම්පත් සම්බන්ධ කරුණු

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කමිටුවේ යොමු (TOR) නිර්දේශ මගින් කළමනාකාරීත්වය වෙත කළමණාකරණ මට්ටමට ඉහළින් විවාදයට ගත යුතු මානව හිමිකම් පිළිබඳ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා පදනමක් සැකසෙයි. එහිදී පහත දැක්වෙන කරුණු සමාලෝචනය කොට නිර්දේශ කරන ලදී;

- කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, සංවර්ධනය සහ දිරි ගැන්වීම පිළිබඳ පුද්ගල ප්‍රතිපත්ති/ක්‍රියාපටිපාටීන්
- ප්‍රධාන කළමණාකරණ පුද්ගලයින් සම්බන්ධ බඳවා ගැනීමේ අවශ්‍යතා සහ ආශ්‍රිත පත්කිරීම්
- ප්‍රධාන කළමනාකාර පුද්ගලයින්ට අදාළ වැටුප්, දීමනා ප්‍රතිලාභ සහ අනෙකුත් සේවක පාරිශ්‍රමික
- ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සම්බන්ධ අනුප්‍රාප්තික ක්‍රමෝපාය
- ව්‍යාපාරික හේතූන් මත සේවකයින්ගේ පෙර හඳුනාගත් නිලය/තත්ත්වය/කාර්යභාරය සම්බන්ධ වෙනස් වීම්
- ආයතනික කළමනාකාරිත්වය සම්බන්ධ වැටුප් සහ ප්‍රතිලාභ ව්‍යුහගතකරණය සහ නිර්ණය කිරීම
- පෙර හඳුනාගත් විවිධ ශ්‍රේණි වල සේවකයින් සම්බන්ධ විනය ක්‍රියාමාර්ග
- ආයතනික කළමනාකාරිත්වය සඳහා සේවා දිගු කිරීම්
- පෙර හඳුනාගත් ශ්‍රේණි වලට අයත් සේවකයින්ගේ වාර්ෂික උසස්වීම්
- මූල්‍ය නොවන ප්‍රතිලාභ ඇතුළු පාරිශ්‍රමික වෙත වාර්ෂික වැටුප් වර්ධක සහ ප්‍රතිලාභ
- දිරිදීමනා සහ වැටුප් හා සංශෝධන

කාර්යමණ්ඩල ණය හා කාර්යමණ්ඩල ප්‍රතිලාභ සැලසුම් අනුමත කිරීමේ සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් ඉලක්ක සැකසීමේ අධිකාරිත්වය ද කමිටුව සතුවේ.

#### විධි නියෝගය - නාමයෝජනා සම්බන්ධ කරුණු

කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ව්‍යුහය, විශාලත්වය සහ සංයුතිය සමාලෝචනයට ලක් කරන අතර අවශ්‍ය වෙනස්කම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තෝරාගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් ලබා දෙනු ලැබේ.

ඔහුගේ/ ඇයගේ තමන්ගේම පත්වීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී සාමාජිකයින් සහභාගී වීමෙන් වැළකී සිටී.

#### විධි නියෝගය - අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සම්බන්ධ කරුණු

පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් හට ස්ථාවර දීමනාවක් ගෙවනු ලැබේ. විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන ගාස්තුව කාර්යසාධනය ආශ්‍රිත හෝ විශ්‍රාම වැටුප් සහිත නොවේ.

අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද ගාස්තු පිළිබඳව මෙම වාර්ෂිකව වාර්තාවේ පිටු අංක 275 හි දැක්වේ.

#### අධිකාරිත්වය

අවසන් තීරණයක් ගැනීම සඳහා කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. අවශ්‍ය අවස්ථාවන් වලදී සමාගමෙහි වියදමින් වෘත්තීය උපදෙස් ලබා ගැනීමට කමිටුවට හැකි වන අතර මෙය සමාගම් ලේකම්වරයා විසින් සම්බන්ධීකරණය කෙරේ.

### පාරිශ්‍රමික ප්‍රතිපත්ති

#### ප්‍රතිලාභ ක්‍රමෝපාය

සමාගමට සිය ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීම සඳහා නිවැරදි පුද්ගලයින් රඳවා ගැනීමට හැකිවන පරිදි කමිටුව මගින් සේවකයින් ඔවුන්ගේ කාර්යසාධනය, නිපුණතා, පළපුරුද්ද සහ වගකීම් මට්ටම අනුව ප්‍රතිලාභ ලබන්නේ යැයි තහවුරු කිරීම සඳහා ප්‍රතිලාභ ක්‍රමෝපාය සමාලෝචනයට ලක් කෙරේ.

යහපාලනය සම්බන්ධ මූලධර්ම වලට සමගාමීව අපගේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මගින් අප අපේක්ෂා කරන වටපිටාව නිර්මාණය කරමින් අපගේ වටිනාකම් ඉදිරියට ගෙන යන අතර ඉහළ කාර්යසාධනයක් ඔස්සේ අපගේ ක්‍රමෝපායට අනුව කටයුතු කිරීම සඳහා සේවකයින් දිරි දිරිගන්වනු ලැබේ.

#### පාරිශ්‍රමික පැකේජ සහ වෙනත් ප්‍රතිලාභ

කමිටුව මගින්, සකසන ලද ප්‍රමුඛ කාර්යසාධන දර්ශක වලට සාපේක්ෂව කාර්යසාධනය, කළමනාකරණ මට්ටමේ පුද්ගලයින්, සමූහයේ සෙසු සමාගම්වලට සාපේක්ෂව පාරිශ්‍රමික, ආයතනික මාර්ගෝපදේශ සහ ක්ෂේත්‍ර මට්ටමින් විශේෂඥ උපදේශකවරුන්ගේ වාර්තා සැලකිල්ලට ගනිමින් සේවකයින්ගේ පාරිශ්‍රමික පැකේජ සමාලෝචනයට ලක් කෙරේ.

කාර්යමණ්ඩල ණය යෝජනා ක්‍රම, කාර්ය මණ්ඩල සෞඛ්‍ය රක්ෂණාවරණය, බරපතළ රෝගාබාධ අවරණය සහ පුද්ගල හදිසි අනතුරු ආවරණය ඇතුළු සේවකයින් වෙත ලබාදෙන ප්‍රතිලාභ ඔස්සේ සේවක යහපැවැත්ම පිළිබඳ සොයා බලනු ලැබේ.

**කමිටුවේ කාර්යසාධනය ඇගයුම**

අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ස්වයං ඇගයීමෙහි කොටසක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමස්තයක් වශයෙන් කමිටුවෙහි කාර්යසාධනය සහ බලාත්මකභාවය ඇගයීමට ලක් කරන ලදී. ඒ පිළිබඳ විස්තර මෙම වාර්ෂිකව වාර්තාවේ පිටු අංක 120 හි දැක්වේ.

**සේවක කොටස් වරණ සැලසුම්**

මේ වන විට කිසිදු කොටස් වරණ සැලසුමක් ක්‍රියාත්මක නොවේ.



**අශෝක බණ්ඩාර**
*සභාපති*
පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුව

2021 ජූලි 07

# සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත යොමු නිර්දේශ ඇතුළත කටයුතු කරන අතර එමගින් ලැයිස්තුගත සමාගම් සඳහා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පාලනය කෙරෙන නීති රීති හා කොන්දේසි කෙරෙහි අනුකූලතාවය තහවුරු කෙරේ.

### සංයුතිය සහ කමිටු රැස්වීම්

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර සභාපතිවරයාද ඇතුළුව ඉන් දෙදෙනෙකු ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ.

සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී, අනුකූලතා නිලධාරී සහ ප්‍රධාන කළමනාකරු - මූල්‍ය ආරාධනා මත රැස්වීම් වලට සහභාගි වේ. කමිටුව එහි කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල විවාදයට ගතයුතු සැලකිය යුතු කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරයි.

වසර තුළදී කමිටුව සිව් වරක් රැස්වූ අතර එහිදී අදාල කාලසීමාව තුළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳව සමාලෝචනය කරන ලදී. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පාලනය කෙරෙන නීති රීති හාර රෙගුලාසි කෙරෙහි අනුකූලතාවය තහවුරු කරනු පිණිස සාමාජිකයන් විසින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳව දීර්ඝ වූ විවාදයන් පවත්වන ලදී.

අදහස් සහ නිරීක්ෂණ සමගින් කමිටු රැස්වීම් පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.

### වර්ෂය තුළ සාමාජික පැමිණීම

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩල තත්ත්වය | පැමිණීම |
|---|---|---|
| චතුර විජේතිලක මහතා (සභාපති) | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | 4/4 |
| අශෝක බණ්ඩාර මහතා | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | 4/4 |
| සුදර්ශන් අහංගම මහතා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 2/4 |

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 100 සිට 103 දක්වා ඉදිරිපත් කෙරේ.

### 2020/21 විශේෂතා

- සමාගමෙහි සුරැකුම් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සහ සියළුම සේවකයින් වෙත උපදෙස් ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා කොටස් විකුණුම් ප්‍රතිපත්තිය නිර්දේශ කරන ලදී.
- සමාගමෙහි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ වඩාත් විනිවිදභාවයෙන් යුතු වාර්තාකරණ ආකෘතියක් හඳුන්වාදෙන ලදී.
- විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ සමාගමෙහි සියළුම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචනය කරන ලදී.

### කමිටුවේ විෂයපථය

#### විධි නියෝගය

කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත වීමේ නීති රීති වලට අනුකූලව යොමු නිර්දේශ වලින් පැහැදිලිව නිදහස් කරන ගනුදෙනු හැර කමිටුව මගින් සියළුම යෝජිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කල්තබා සමාලෝචනය කෙරේ.

**කමිටුවෙහි ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ;**

- කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත වීමේ නීති රීති වලට අනුකූලව යොමු නිර්දේශ වලින් පැහැදිලිව නිදහස් කරන ගනුදෙනු හැර කමිටුව මගින් සියළුම යෝජිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කල්තබා සමාලෝචනය කිරීම.
- සමාගමෙහි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ආදේශ කර ගැනීම සහ දැනට පවතින ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අධීක්ෂණය කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්හිදී ලැයිස්තුගත වීමේ නීති රීති වගන්ති 9.1 සහ 9.4 හි විශේෂිතව දක්වා ඇති පරිදි අදාල ගනුදෙනුවට එළඹීමට පෙර විශේෂ යෝජනාවක් මාර්ග යෙන් සමාගමෙහි කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය ලබාගැනීම සඳහා සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම්.
- දැනට සිදුකෙරමින් පවතින සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ආශ්‍රිතව සමාගමේ සේවකයින් අනුගමනය කළයුතු මාර්ගෝපදේශ ස්ථාපනය කිරීම.
- අදාළ කරුණු පිළිබඳ බලපෑම් කිරීමක් හෝ ඡන්දය ප්‍රකාශ කිරීමකින් තොරව තොරතුරු ලබාදීමේ අරමුණින් පමණක් කිසියම් සම්බන්ධිත පාර්ශවයක් වන අධ්‍යක්ෂවරයකු හට සහභාගි වන මෙන් කමිටුව මගින් ඉල්ලා සිටින්නේ නම් හැර, ඔහු හෝ ඇය යෝජිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවක් පිළිබඳ කවර හෝ සාකච්ඡාවකට සහභාගී නොවන බවට තහවුරු කිරීම.
- අදාල නීතිරීති හා කොන්දේසි මගින් ඉල්ලා සිටින පරිදි ආසන්නතම වෙළෙඳපොළ හෙළිදරව් කිරීම් සහ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම් කාලීන සහ ප්‍රමාණවත් ලෙස විස්තරාත්මක ආකාරයකින් ඉදිරිපත් කෙරෙන බවට තහවුරු කිරීම.
- සමාගම සහ එහි සම්බන්ධිත පාර්ශවයන් අතර බැඳියා පිළිගැටුමක් ඇති විය හැකි ආකාරයේ බලපෑම් වළකාලන හෝ අවම කරන ආකාරයෙන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ඇත්නම්, ඒවා සිදුවන බවට ද තහවුරු කිරීම සඳහා ඒවා නිරීක්ෂණය කිරීම.
- ක්ෂේත්‍රයේ ප්‍රශස්ත ක්‍රියාකාරකම් සමඟ අනුගතව කටයුතු කරන බව තහවුරු කිරීම සඳහා කමිටුවේ යොමු නිර්දේශ කලින් කලට සමාලෝචනය කිරීම.
- සිය කාර්යභාරය ඉටුකිරීම සඳහා සුදුසු හා අවශ්‍ය යැයි හැඟෙන වෙනත් ක්‍රියාකාරකම් සිදු කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කලට පවරනු ලබන වෙනත් වගකීම් භාර ගැනීම.

#### අධිකාරිත්වය

අවශ්‍ය අවස්ථාවන්හිදී අදාළ කරුණු සම්බන්ධයෙන්යෙන් අවසන් තීරණ ගැනීම සඳහා කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ. අවශ්‍ය අවස්ථාවන් වලදී සමාගමෙහි වියදමින් වෘත්තීය උපදෙස් ලබා ගැනීමට කමිටුවට හැකි වන අතර මෙය සමාගම් ලේකම්වරයා විසින් සම්බන්ධීකරණය කෙරේ.

### සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි

#### ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 සහ ලැයිස්තුගතවීමේ නීතිරීති වලට අනුකූලව සම්බන්ධිත පාර්ශවයක් වශයෙන් කිසියම් පුද්ගලයෙකු සැලකීම සඳහා වන කාණ්ඩයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තියෙහි නිර්වචනය කෙරේ.

ඔවුන් වෙත සම්බන්ධිත පාර්ශවයන් හඳුනාගැනීම සඳහා සමාගමෙහි එක් එක් අධ්‍යක්ෂවරයා සහ ප්‍රධාන කළමණාකරණ පුද්ගලයා වෙතින් ස්වයං ප්‍රකාශ ලබාගත යුතු බවට සම්බන්ධිත පාර්ශව ප්‍රතිපත්තිය මගින් නියම කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින්, ඔහුගේ/ ඇයගේ ස්වාධීන විනිශ්චයට බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ පුද්ගලික සබඳතා, බාහිර සබඳතා සහ ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධ අභිමතයන් තුළින් අනාගතයේ සිදුවිය හැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුමක් ඔහු/ ඇය සතුව පවතින්නේ දැයි නිර්ණය කිරීම සමාගමෙහි ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහය අනුව අවශ්‍ය වේ. එබඳු අනාගතයේ සිදුවිය හැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් සහිත අධ්‍යක්ෂවරුන් ඒ පිළිබඳව ඔහු/ ඇය දැනුවත්භාවයට පැමිණි වහාම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අදාල බැඳියා පිළිගැටුම පිළිබඳ හෙළිදරව් කළයුතු වේ.

### ක්‍රියාපටිපාටි

සම්බන්ධිත පාර්ශවයන් වෙත කිසිදු හිතවාදී සැලකිල්ලක් නොදක්වන බවට තහවුරු කිරීම සඳහා සමාගම මගින් අන්තර්ජාලගත වළකාලීමේ පද්ධතියක් ක්‍රියාවට නංවා ඇත. මෙම පද්ධතිය මගින් සමාගමට සම්බන්ධිත පාර්ශව ගනුදෙනු නිරීක්ෂණය සහ වාර්තා කිරීමට මෙන්ම සමාගමෙහි ජාලය පුරා ඒ සම්බන්ධ දත්ත උකහා ගැනීමට හැකි වේ.

### 2020/21 සිදුවුනු සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

කමිටුව මගින් 2020 අප්‍රේල් 1 සිට 2021 මාර්තු 31 දක්වා සමාගමෙහි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳව සමාලෝචනයට කරන ලද අතර, ඒ අනුව කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගතවීමේ නීතිරීති වගන්ති 9 හි දැක්වෙන පරිදි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු වලට අදාළ නීති රීති වලට අනුකූල බවට තහවුරු කරන ලදී. කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත වීමේ නීතිරීති වගන්ති 9.1.1., 9.1.2. සහ 9.3.2. (අ) මගින් අරමුණු කෙරෙන පරිදි සමාගම කිසිදු ගණුදෙනුවකට එළඹ නැත. ලැයිස්තුගතවීමේ නීති රීති වගන්ති 9.3.2. (ආ) යටතට ගැනෙන සමාගම විසින් එළඹෙන ලද සියළුම ගණුදෙනු පිටු අංක 279 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 58 හි ඉදිරිපත් කෙරේ.

### ප්‍රකාශය

2020/21 දී සමාගම මගින් ලැයිස්තුගතවීමේ නීතිරීති වල පරාසය තුළට අයත් වන කිසිදු සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවකට නොඑළඹුණ බවට වන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශය, පිටු අංක 143 හි සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ දැක්වේ.



**චනුර විජේතිලක**
*සභාපති*
සම්බන්ධිත පාර්ශව ගනුදෙනු
සමාලෝචන කමිටුව

2021 ජූලි 07

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

2008 අංක 3 දරණ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) මාර්ගෝපදේශ 8 (3) වගන්තිය ප්‍රකාරව සමාගමේ සහ සමූහයේ අවදානම් වාර්තාවේ ප්‍රමාණාත්මක බව සහ කාර්ය සාධනය සම්බන්ධයෙන් සමාලෝචනය කිරීමේ සහ තක්සේරු කිරීමේ වගකීම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මූලපිරීම සම්බන්ධයෙන් මූලික වශයෙන් වගකිව යුතු පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට ("BIRMC" හෝ "කමිටුව") පවරා ඇත.

### යොමු කොන්දේසි (TOR)

ඉහත සඳහන් මාර්ගෝපදේශ වලට අනුකූලව, කමිටුව, සංයුතිය, වගකීම්, රැස්වීම් වාර ගණන සහ ගණපූරණය, වාර්තා කිරීම සහ කමිටුවේ අනෙකුත් ක්‍රියා පටිපාටිවලට අධිකාරිය/ නියෝජිතත්වය පවරා ඇති ආකාරය යොමු කොන්දේසිවල පැහැදිලිවම දක්වා ඇත.

### සංයුතිය

2020/21 මුදල් වර්ෂය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර ඔවුන් පිළිබඳ තොරතුරු 102 සිට 106 දක්වා වූ පිටුවල දක්වා ඇත:

| ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයාගේ නම | අධ්‍යක්ෂ තනතුරෙහි ස්වභාවය |
|---|---|
| චතුර විජේතිලක මහතා | කමිටු සභාපති (විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ) |
| අසාම් අහමත් මහතා | කමිටු සාමාජික (විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ) |
| ක්ලයිව් ෆොන්සේකා මහතා | කමිටු සාමාජික (විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ) |
| ෂමින්ද්‍ර මර්සලින් මහතා (ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී) | අධ්‍යක්ෂ නොවන පත් කරන ලද දිනය 25.11.2020 |
| ඒ එස් ඉබ්‍රාහිම් මහතා (ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී) | අධ්‍යක්ෂ නොවන විශ්‍රාම ලද දිනය 25.11.2020 |
| සංජීව බණ්ඩාරනායක මහතා (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්) | අධ්‍යක්ෂ නොවන |
| ලයනල් ප්‍රනාන්දු මහතා (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්) | අධ්‍යක්ෂ නොවන |
| රොහාන් තෙන්නකෝන් මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලනය) | අධ්‍යක්ෂ නොවන |

### ආරාධනයෙන් නිතිපතා සහභාගී වන්නන්

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකර ගැනීම් සහ පරිපාලන
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන
- අනුකූලතා නිලධාරී
- පීපල්ස් ලීසිං උප සමාගම්වල ප්‍රධාන කළමනාකරණ පිරිස්
  - ප්‍රධාන විධායක නිලධාරී - පීපල්ස් ලීසිං පීඑල්සී (පීඅයි)
  - තාක්ෂණික උපදේශක - පීඅයි (2020 දෙසැම්බර් දක්වා)
  - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - පීඅයි (2021 පෙබරවාරි සිට)
  - ජ්‍යෙෂ්ඨ කළමනාකරු - පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගමේ ප්‍රධානී
  - පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් භාර නිලධාරී
  - ප්‍රධාන විධායක නිලධාරී - ලංකා එලයන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්

### කමිටුවේ ලේකම්

අකිලා සමරසිංහ මෙනෙවිය - අවදානම් සහ පාලන නියෝජ්‍ය කළමනාකරු

### රැස්වීම්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කාරක සභාව කාර්තුමය රැස්වීම් හතරක් (04) පවත්වා ඇත. කමිටුවේ සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි විය.

| නම | සහභාගී විය/සහභාගී වීමට සුදුසු විය. |
|---|---|
| චතුර විජේතිලක මහතා (සභාපති) | 4/4 |
| අසාම් අහමත් මහතා | 4/4 |
| ක්ලයිව් ෆොන්සේකා මහතා | 4/4 |
| ෂමින්ද්‍ර මර්සලින් මහතා | 2/2 |
| ඒ එස් ඉබ්‍රාහිම් මහතා | 2/2 |
| සංජීව බණ්ඩාරනායක මහතා | 4/4 |
| ලයනල් ප්‍රනාන්දු මහතා | 4/4 |
| රොහාන් තෙන්නකෝන් මහතා | 4/4 |

### අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

පසුගිය කමිටුවේ විශේෂිත තීරණයන් හා නිගමනයන් ඇතුළත් ප්‍රධාන කරුණු තහවුරු කිරීම හා සම්මත කිරීම සඳහා ඊළඟ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලදී. ඉදිරිපත් කරන ලද සියළුම ප්‍රධාන කරුණු කමිටු සභාපති විසින් විධිමත් ලෙස අනුමත කරන ලදී. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීමෙන් සතියක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, අනුමිතීන් සහ / හෝ නිශ්චිත උපදෙස් ලබා ගැනීම සඳහා අදාළ අනුමත කිරීම් යොමු කරන ලදී.

### ක්‍රියාකාරකම්

ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී සමාගම මුහුණ දෙන අභ්‍යන්තර / බාහිර අවදානම් සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදුකිරීමට ඒකාබද්ධ හා අවදානම් කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඵලදායී ලෙස සහාය විය. කමිටුව විසින් ප්‍රධාන අවදානම් දර්ශක (KRIS) පදනම් කර ගනිමින් මාසිකව සියළුම ප්‍රධාන අවදානම් තත්ත්වයන් රැස්වීම්වලදී සමාලෝචනය කරනු ලැබේ.

**සාකච්ඡා කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර සහ වෙන් කර ඇති කාලය**




- විස්තීර්ණ අවදානම් සමාලෝචනය - පීපල්ස් ලීසිං සහ උප සමාගම්
- වත්කම් හා වගකීම් කමිටුවේ ආශ්‍රිත
- විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ආශ්‍රිත
- අනුකූලතා
- ප්‍රතිපත්ති සමාලෝචනය
- විශේෂිත අවදානම්

### ඒකාබද්ධ අවදානම් කළමනාකරණය

- වාර්ෂික සමාලෝචන ක්‍රියාවලියේ කොටසක් ලෙස කමිටුව 2020 ජූනි මාසයේදී අවදානම් දරා ගැනීමේ ප්‍රකාශය සමාලෝචනය කළේය. පීපල්ස් ලීසිං හි අවදානම් වාර්තාව නියමිත දරා ගැනීමේ සීමාවන්ට අනුකූලව කාර්තුමය වශයෙන් සමාලෝචනය කරන ලදී.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවදානම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කෙරුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.
- පීපල්ස් ලීසිං සහ එහි අනුබද්ධ සමාගම්වල කාර්තුමය අවදානම් වාර්තා (අවදානම් පුවරු/ අවදානම් දර්ශක වාර්තා) සමාලෝචනය කෙරිණ.

### කළමනාකරණ මට්ටමේ කමිටු තක්සේරු කිරීම

- රැස්වීම්වල විශේෂිත කරුණු රැගත් වාර්තා සහ වත්කම් හා වගකීම් කමිටුවෙහි (ALCO) යොමු කොන්දේසි අනුව සිදුකරන ලද වාර්ෂික තක්සේරුව සමාලෝචනය කිරීමෙන් වත්කම් හා වගකීම් කමිටුව (ALCO) විසින් ඉටු කරනු ලබන කාර්යයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සමාලෝචනය කරන ලදී.

- විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (EIRMC) ඵලදායී ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීමේ දී එහි රැස්වීම්වල විශේෂිත කරුණු දැක්වීම/ ප්‍රධාන කරුණු සටහන් කිරීම සමාලෝචනය කෙරුණු අතර ණය අවදානම් සහ මෙහෙයුම් අවදානම් පිළිබඳව ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය.

### ණය අවදානම

- COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් රට මුහුණ දී සිටින සමාජ-ආර්ථික අභියෝග මධ්‍යයේ කර්මාන්තයේ ණය ගුණාත්මකභාවය පිරිහීම පිළිබඳව කමිටුව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේය.
- වත්කම් හා නිෂ්පාදන මත පදනම් වූ අක්‍රීය ණය විශ්ලේෂණයන් සහ අනෙකුත් ණය අවදානම් දර්ශක වන අංශ අනුව ණය සාන්ද්‍රණය සහ තනි ණය ගැනුම් සීමාවන්ට අනුකූල වීම වැනි ණය කළඹේ ගුණාත්මකභාවය පිළිබඳ සමාලෝචනය කෙරිණ.
- සමාගමේ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුව සවිස්තරාත්මකව සාකච්ඡා කළේය.
- සමාගමේ ආන්තික වෙළඳ නිෂ්පාදන පිළිබඳ ණය ප්‍රතිපත්තිය සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කෙරිණ.
- ණය අවදානම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ දී සිදු කරන ලද සාකච්ඡා සමාලෝචනය කරන ලදී.

### ද්‍රවශීලතාවය සහ වෙළඳපල අවදානම

- පවත්වා ගෙන යන ලද ද්‍රවශීල වත්කම්වල ප්‍රමාණවත් බව සහ පරිණතභාවය නොගැලපීම, සංවේදීතා විශ්ලේෂණය සහ පොලී අනුපාත නැවත මිල නියම කිරීම පරතරය සමාලෝචනය කෙරිණ.
- ද්‍රවශීලතා ආතති පරීක්ෂණ ප්‍රතිඵල සහ අනිශ්චිත අරමුදල් මට්ටම්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කෙරිණ.
- ද්‍රවශීලතාවයේ හා වෙළඳපල අවදානම් කළමනාකරණයේ ඵලදායීතාවය තක්සේරු කිරීමේදී කමිටුවට ඉදිරිපත් කරන ලද වත්කම් හා වගකීම් කමිටුව (ALCO) රැස්වීම්වලින් ලබා ගත් ප්‍රධාන වාර්තා සමාලෝචනය කෙරිණ.

### මෙහෙයුම් අවදානම

- මානව සම්පත් හා වංචා ආදිය සම්බන්ධයෙන් පිහිටුවා ඇති ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක සමාලෝචනය කරන ලදි.
- අභ්‍යන්තර පාලන පද්ධතියේ ශක්තිය මත පදනම්ව තීරණය කරනු ලබන අසතුටුදායක ලෙසින් ශ්‍රේණිගත කරන ලද විගණනයන්හි තත්ත්වය සමාලෝචනය කරන ලදි.
- වසංගත තත්ත්වය හා සයිබර් ආරක්ෂණ අවශ්‍යතා හේතුවෙන් මෙහෙයුම් අවදානම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරිණ.

### තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවදානම

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධයෙන් පිහිටුවා ඇති ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක සමාලෝචනය කරන ලදි.
- ක්ෂණිකව ගෙදර සිට රාජකාරී ඉටු කිරීම සඳහා යොමු වීම සහ හඳුනාගත් සයිබර් ආරක්ෂණ අවදානම් විසඳීම සඳහා සකස් කළ ප්‍රතිචාර සැලැස්මේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය පිළිබඳ සමාලෝචනය කෙරිණ.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙහෙයුම්වලට අදාළ වත්කම් කාණ්ඩ ගණනාවක් මත පදනම්ව සිදු කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවදානම් තක්සේරුව සමාලෝචනය කරන ලදී.

### ව්‍යාපාර අඛණ්ඩතාව

- ව්‍යාපාරයේ අඛණ්ඩ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය සහ ආපදා ප්‍රතිසාධන සැලසුම්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කෙරිණ.
- සමාගමේ කාලානුරූපී ව්‍යාපාරික ක්‍රියාවලීන් ආවරණය වන පරිදි පවත්වන ලද BCP වැඩසටහනේ ප්‍රගතිය නිරීක්ෂණය කෙරිණ.

### නියාමන හා අනුකූලතා අවදානම

- නියාමන අවශ්‍යතා සමඟ සමාගමේ අනුකූලතාවය තක්සේරු කිරීම සහ අනුකූලතා කාර්යයේ ඵලදායීතාවය සමාලෝචනය කිරීම මෙන්ම අවදානම් දරා ගැනීමේ මට්ටම්වලට එරෙහිව අනුකූලතා තත්ත්වයන් නිරීක්ෂණය කිරීම
- සමාගමේ මෙහෙයුම් වල සෑම අංශයකම නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති වලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා අනුකූලතා නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද අනුකූලතා වාර්තා සමාලෝචනය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නව උපදෙස්, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ සමාලෝචනය කෙරිණ.
- සමාගමේ නිෂ්පාදනවලට අදාළ ව මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණ අවදානම් තක්සේරු හා සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.
- වාර්ෂික ආයතනික අනුකූලතා සැලැස්ම සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

### උපායමාර්ගික අවදානම

- ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම් වලට ප්‍රතිචාර වශයෙන් ක්‍රියාත්මක කරන ලද උපායමාර්ගවල ඵලදායීතාවය සමාලෝචනය කරන ලදි.
- නිර්මාණය කර ගෙන ඇති අවදානම් දරා ගැනීමේ මට්ටම්වලට සාපේක්ෂව උපායමාර්ගික අවදානම් දර්ශක සමාලෝචනය කරන ලදි.

### උප සමාගම්වල අවදානම් වාර්තාව තක්සේරු කිරීම

එක් එක් උප සමාගමෙහි අවදානම් වාර්තාව සහ පීපල්ස් ලීසිං සමූහයේ සමස්ත අවදානම් වාර්තාව සමාලෝචනය කිරීමට හැකි වීම පිණිස සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, 2008 අංක 3, 8 (3) (ආ) වගන්තියේ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) මඟ පෙන්වීම අනුව පහත සඳහන් උප සමාග ම්වල අවදානම් පුවරුව / ප්‍රධාන අවදානම් දර්ශක වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. උප සමාගම් සමාලෝචනයේ ප්‍රධාන අවස්ථා පහත දැක්වේ.

**පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී (පීඅයි)**

- කමිටුව විසින් ප්‍රතිරක්ෂණයේ ගුණාත්මකභාවය, ආයෝජන සාන්ද්‍රණයන් සහ ප්‍රධාන අවදානම් දර්ශක (KRI) සමඟ පෙරනිමි අවදානම, මෙහෙයුම් අවදානම, උපායමාර්ගික අවදානම, අනුකූලතා අවදානම කාර්තුමය පදනම මත සමාලෝචනය කළේය.
- ශ්‍රී ලංකාවේ රක්ෂණ නියාමන කොමිෂන් සභාව (කලින් රක්ෂණ මණ්ඩලය ලෙස හඳුන්වන ලද) විසින් නියාමනය කරන ලද අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන ආකෘතියට පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී අනුකූල වීම පිළිබඳ කමිටුව සමාලෝචනය කළේය.
- කමිටුව සමාගමේ අනාගත උපාය මාර්ග සාකච්ඡා කොට සමාලෝචනය කළේය.

**පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් සමාගම (PML)**

- වරප්‍රසාද නොලත්, ග්‍රාමීය හා නාගරික ජනගහනයේ මූල්‍යමය සම්බන්ධතාවය සහතික කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීමේ ව්‍යාපාරයට පීඑම්එල් සම්බන්ධ වන අතර වෙනස් අවදානම් පැතිකඩක් සමඟ ක්‍රියාත්මක වේ.
- සමාගමේ අවදානම් පැතිකඩ කමිටුව විසින් කාර්තුමය වශයෙන් සමාලෝචනය කරන ලද්දේ අවදානම් ඉවසීමේ සීමාවන්ට එරෙහිව ය.
- කාරක සභාව සමාගමේ අනාගත උපාය මාර්ග සාකච්ඡා කොට සමාලෝචනය කළේය.

**පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් (PLFML)**

- පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්හි මෙහෙයුම් අතරට වාහන මෙහෙයුම් කල්බදු සැපයීම, තක්සේරු කිරීමේ සේවාව සහ වාහන කුලියට ලබාදීමේ සේවාව ඇතුළත් වේ.
- පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් විසින් ඉදිරිපත් කරන ලද අවදානම් උපකරණ වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය වශයෙන් සමාලෝචනය කළේය.
- කාරක සභාව සමාගමේ අනාගත උපාය මාර්ග සාකච්ඡා කොට සමාලෝචනය කළේය.

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

**ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (LFL) - (පීපල්ස් ලීසිං බංග්ලාදේශ උප සමාගම)**

- ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් විසින් ඉදිරිපත් කරන ලද අවදානම් උපකරණ පුවරු වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය වශයෙන් සමාලෝචනය කළේය.
- සමාගමේ මෙහෙයුම් සහ අවදානම් අවම කිරීමේ උපාය මාර්ග පැහැදිලි කිරීම සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ මගින් ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්හි ප්‍රධාන විධායක නිලධාරී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීම්වලට සහභාගී විය.

**දේපල සංවර්ධන උප සමාගම්**

- පීපල්ස් ලීසිං දේපල සංවර්ධන සමාගම සහ පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ් විසින් ඉදිරිපත් කරන ලද අවදානම් දර්ශක වාර්තා කමිටුව සමාලෝචනය කළේය.
- පදිංචිය පිළිබඳ විස්තර ඇතුළුව මෙම සමාගම්වල මෙහෙයුම් කමිටුව සමාලෝචනය කළේය.

අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුව ඉහත සඳහන් කළ පීපල්ස් ලීසිං අනුබද්ධ සමාගම් සමඟ සම්බන්ධීකරණය කර විවිධ අවදානම් දර්ශක සහ අතිරේක තොරතුරු මගින් අදාළ තොරතුරු කමිටුවට දැනුම් දුන්නේය.

**වෙනත්**

- පුළුල් අවදානම් කාණ්ඩ (ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් හා මූලෝපායික අවදානම්) අධීක්ෂණය කරන ආයතනික කළමනාකරණය, ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සමීපව කටයුතු කළ අතර කමිටුව වෙත පැවරී ඇති අධිකාරී රාමුව හා වගකීම අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගන්නා ලදී.
- අවදානම් කළමනාකරණ උපාය මාර්ග, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්ට අදාළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වගකීම් වල ක්‍රියා පටිපාටි අධීක්ෂණය කරන ලදී.
- සමාගමේ ප්‍රතිපත්ති, නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව, මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් දරාගැනීමේ මට්ටම ඉක්මවා යන නිශ්චිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියා නිර්දේශ කෙරිණි.

සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී, සමාගමට සහ සමූහයට බලපෑමක් ඇති කළ හැකි උඩු යටි යොමු සහිත අවදානම් අවධාරණය කරමින් සමස්ත ව්‍යාපාර උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේදී අවදානම් රුචිය සහ දරා ගැනීමේ රාමුවට අනුකූලව කමිටුව සහයෝගය ලබා දුන්නේය.

**ඇගයීම**

වසර ගණනාවක සිට කමිටුව සඳහා ලබා දුන් අගනා දායකත්වය වෙනුවෙන් සබ්‍රි ඊබ්‍රාහිම් මහතාටත් තාක්ෂණික උපදේශක නිමල් පෙරේරා මහතාටත් (2020 දෙසැම්බරයේදී විශ්‍රාම ගිය) කමිටුව සිය හෘදයාංගම ස්තුතිය පිරිනමයි.

**චනුර විජේතිලක**
*සභාපති*
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2021 ජූලි 07

# අවදානම් කළමනාකරන විමර්ශනය



GRI 102-15

**විශ්ලේෂණය**

පීපල්ස් ලීසිං මගින් අනාගත තර්ජන හඳුනාගැනීම, අවදානම අවම කිරීමේ ක්‍රමෝපායන් නිර්වචනය සහ මෙකී ක්‍රමෝපායන් ගේ ඵලදායිතාවය අධීක්ෂණය කිරීම සඳහා අවදානම් කළමනාකරණ ආකෘතික රාමුවක් ස්ථාපනය කොට ඇත. උද්ගත විය හැකි අවදානම් උපකල්පනය, සැලසුම් නිවැරදි ලෙස මිලකරණය සහ විචක්ෂණශීලී ලෙස අවදානම් කලඹ කළමනාකරණය සඳහා සමාගමේ කළමනාකාරීත්වයට බලාත්මක අවදානම් කළමනාකරණය අතිශය වැදගත් වේ. මූල්‍ය ආයතනයක් වශයෙන්, සමාගම මූලිකවම අභ්‍යන්තර සහ බාහිර පරිසරයන්ගෙන් පැනනගින ණය, ද්‍රවශීලතා සහ මෙහෙයුම් අවදානම් වලට නිරාවරණය වේ.




මෙම වසර අතිශය අර්බුදකාරී වූවක් වූ අතර, ලෝක ව්‍යාප්ත වසංගතයක් මධ්‍යයේ අපගේ සේවාවන් ගනුදෙනුකරුවන්ට ලබාදීම සඳහා සියලු කටයුතු නැවත ගලපා ගැනීමට අප හට සිදුවිය. ශ්‍රී ලංකාව තුළ, රජය මගින් 2020 මාර්තු මස ජාතික මට්ටමේ රට වසා දැමීමක් ප්‍රකාශයට පත් කෙරුණි. මෙය 2020 මැයි මස ඉවත් කෙරුණු අතර එමගින් ආර්ථික කටයුතු සාමාන්‍ය වශයෙන් යථා තත්ත්වයට පත් විය. කෙසේ වුවද, 2020 නොවැම්බර් මස ශ්‍රී ලංකාව කොවිඩ් 19 වසංගතයේ දෙවන රැල්ලට මුහුණ දුන් අතර එහිදී බස්නාහිර පළාත වසා දැමීම හමුවේ නැවතත් ආර්ථිකය බිඳ වැටීම ඇරඹුණි. (2021) ජනවාරි සිට ව්‍යාපාරයන් නැවත හිස එසවීමට පටන් ගත්තේය. රට වසා දැමීම, සෞඛ්‍ය සහ සුරක්ෂිතතා රෙගුලාසි සහ සංචරණ සීමාවන් අපගේ ගනුදෙනුකරුවන්ට මෙන්ම අපටත් බලපෑම් එල්ල කළේය. මෙහිදී අප විසින් අපගේ සේවාවන් පරිවර්තනයකට ලක් කරමින් අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය ඔස්සේ ගනුදෙනුකරුවන් වෙත සමීප වූ අතර එහිදී අන්තර්ජාලගත ගනුදෙනු සඳහා පහසුකම් සැලසුණි. අපගේ කාර්ය මණ්ඩලය නිවසේ සිට වැඩ කිරීම අරඹන ලදී. මෙම අභියෝගාත්මක අවස්ථාවේදී අප විසින් ගනුදෙනුකරුවන් වෙත සහාය දක්වමින් පමාසහන මෙන්ම සෙසු සහන පිරිනැමීම හේතුවෙන් ණය ක්‍රියාවලිය වෙනසකට ලක්විය. අපගේ ක්‍රියාවලීන් පරිවර්තනය කරන ලද මෙම අවස්ථාවේදී නව අවදානම් හඳුනාගැනුණු අතර දැනට පවතින අවදානම් ප්‍රමුඛතාකරණය සම්බන්ධයෙන් සමාලෝචනය කෙරුණි.




### මූලික අවදානම් සමාලෝචනය

| අවදානම් කාණ්ඩය | අවදානම් දර්ශකය | ඒකකය | උපරිම අවදානම් දරාගැනීමේ සීමාව | 31.03.2021 දිනට තත්ත්වය | 31.03.2020 දිනට තත්ත්වය |
|---|---|---|---|---|---|
| ණය අවදානම | අක්‍රීය අත්තිකාරම් අනුපාතය (දළ)* | % | <5 | 8.62 | 7.62 |
| | මාස තුන කල් ඉක්මවූ අනුපාතය (දළ) | % | <10 | 11.13 | 20.34 |
| | ලාභ සහ අලාභ ගාස්තු අනුපාතය | % | <20 | 20.56 | 58.61 |
| ණය සංකේන්ද්‍රණ අවදානම | කේවල/සමූහ ණයගැති සීමාව | රු. බිලියන | CBSL අනුව | අනුකූල විය | අනුකූල විය |
| | HHI ලකුණු තත්වය | ලකුණු | <0.40 | 0.22 | 0.22 |
| ද්‍රවශීලතා අවදානම | ද්‍රවශීල වත්කම් අනුපාතය | % | >100 | 194.90 | 110.59 |
| | කල්පිරීමේ නොගැලපුම් අනුපාතය (වසරක් දක්වා) | % | >-45 | -31.93 | -21.94 |
| | ස්ථාවර මූලයන් වෙතින් පිරිනමන ලද පහසුකම් | % | <150 | 106.71 | 105.29 |
| | කෙටිකාලීන වගකීමට ද්‍රවශීල වත්කම් අනුපාතය | % | >30 | 155.40 | 203.57 |
| | උපරිම කේවල තැන්පත්කාර සංකේන්ද්‍රණය | % | <5 | 4.11 | 4.20 |
| | සම්භාර තැන්පතු වෙත නිරාවරනය (මිලයන 50 ට වැඩි) | % | <20 | 21.61 | 24.17 |
| වෙළඳපොල අවදානම | පොලී අනුපාත සංවේදීතාවය | % | <6 | -0.43 | 0.29 |
| | ප්‍රති මිළ පරතර අනුපාතය (මාස 3 ක් දක්වා) | % | >-20 | 1.72 | 4.13 |
| මෙහෙයුම් අවදානම | හදුනාගත් වංචා (මෙහෙයුම් වියදම් වල ප්‍රතිශතයක් වශයෙන්) | % | <0.5 | 0.18 | Nil |
| | සෑහීමකට පත්විය නොහැකි විගණන | % | <15 | Nil | 8.70 |
| | ආදායමට පිරිවැය අනුපාතය | % | <50 | 41.32 | 36.53 |
| | සේවක පිරිවැටුම් අනුපාතය (වාර්ෂික) | % | <15 | 6.52 | 9.18 |
| නියාමන අවදානම | ප්‍රාග්ධන ප්‍රමාණවත්තාත අනුපාතය | | | | |
| | ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය | % | >6 | 17.72 | 15.12 |
| | සමස්ත ප්‍රාග්ධන අනුපාතය | % | >12.5 | 18.58 | 15.99 |
| | ප්‍රාග්ධන අරමුදල් අනුපාතය | % | >12.5 | 33.83 | 28.35 |
| ක්‍රමෝපායික අවදානම | ස්කන්ධ මත ආදායම අනුපාතය | % | >15 | 12.49 | 10.00 |
| | වත්කම් මත ආදායම අනුපාතය | % | >3.5 | 3.49 | 2.64 |
| | ශුද්ධ පොලී ආන්තිකය | % | >7.5 | 7.58 | 9.68 |
| | තෝලන අනුපාතය | වාර ගණන | <7 | 3.55 | 4.38 |

*අනාගත පොලී සංරචකය ඇතුළත් වේ.*

**අවදානම් වපසරිය**

වසර තුළදී බාහිර පරිසරය කෝවිඩ් 19 වසංගතය මගින් උද්ගත වූ අවිනිශ්චිතතා සහ අනේකවිධ වූ අභියෝගයන්ට නතු විය. දේශීය වශයෙන් කෝවිඩ් 19 වසංගතය පැතිරයාම, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ රට වසා දැමීම් සහ ලෝක ආර්ථිකයේ මන්දගාමීත්වය මෙරට ආර්ථික අවගමනය සහ අප විසින් ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන ආකාරය කෙරෙහි බලපෑ අතර, එහිදී නියාමන ක්‍රියාකාරකම් සහ සේවකයින්ගේ හා ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරිණි. මෙම වටපිටාව තුළ පැන නැගුනු අවදානම්, ඒවායේ බලපෑම සහ ඒවා අවම කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පහත දක්වේ.

**බාහිර වශයෙන් ඇතිවන අවදානම්**

| අවදානම | බලපෑම | අවම කිරීමේ ක්‍රියාකාරකම් |
|---|---|---|
| කෝවිඩ් 19 පැතිරීම් වැළක්වීම සඳහා පනවන ලද දීප ව්‍යාප්ත රට වසා දැමීම සහ සංචාරණ සීමා ඵලදායිතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය | O ආයතනික ක්ෂේත්‍රයෙහි පහල ලාභදායිත්වය ගෘහස්ථ ආදායම කෙරෙහි බලපෑවේය<br>O තනි පුද්ගලයින්ගේ හා ආයතනයන්හි ණය ආපසු ගෙවීමේ ධාරිතාව පහළ ගියේය | O ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි බලපෑමට ලක්වූ පුද්ගලයින්, ව්‍යාපාරයන් සහ ආයතනය වෙත ණය පමාසහන සහ සහන පොලී යටතේ ණය ලබාදීම සිදුකෙරිණි<br>O ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියම කරන ලද පමාසහනයන් ට සුදුසුකම් නොලබන පුද්ගලයින් හට සමාගම විසින් සහන ලබා දෙන ලදී |
| කෝවිඩ් පැතිරීම හේතුවෙන් අපගේ සේවකයන්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව අනතුරට පත්විය හැක | O ගනුදෙනුකරුවන් සමග අවම අන්තර්ක්‍රියාකාරීත්වය හේතුවෙන් මුහුණට මුහුණ සිදුකරන සේවාවන් කෙරෙහි බලපෑම් ඇති විය<br>O අඩු සේවක පිරිසක් සමග කාර්යයන් සිදු කිරීමට සමාගමට සිදු විය | O අඛණ්ඩ සේවාවක් තහවුරු කිරීම සඳහා ගණුනුදෙනුකාර සේවා අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරිණි<br>O සමාගමෙහි නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තියට අනුව නිවසේ සිට වැඩ කිරීම සඳහා සේවකයින් යොමුකොට සේවාමුර ක්‍රමයක් හඳුන්වා දෙන ලදී |
| මූල්‍ය සේවා ක්ෂේත්‍රය දැඩි පීඩනයක් යටතේ පැවතුණි | O ණය කළඹෙහි වර්ධනය පහළ ගියේය<br>O අක්‍රීය ණය සහ හානිකරන ගාස්තු ඉහල නැගුනි | O ව්‍යාපාරික පරිමාවන් වර්ධනය කර ගැනීම සඳහා ක්‍රමෝපායන් අරඹන ලද අතර අයකර ගැනීමේ ක්‍රියාදාමයන් ශක්තිමත් කරන ලදී<br>O දැඩි පූර්ව ණය සීමා කිරීම් සහ පශ්චාත් ණය නිරීක්ෂණයන් අනුගමනය කෙරෙනි |
| ප්‍රතිපත්ති අනුපාතයන්හි සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි බහුවිධ පහත හෙලීම ඔස්සේ ශ්‍රී ලංකා මහා බැංකුව විසින් අනුගමනය කරන ලද සහනශීලී මූල්‍ය ප්‍රතිපත්තිය තැන්පතු අනුපාතයන් සැලකිය යුතු ලෙස පහත වැටීම කෙරෙහි හේතුවිය | O ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තැන්පත්කරුවන් අනවසර තැන්පතු භාර ගැනීමේ ආයතන සහ කොටස් වෙළෙඳපොළ වැනි ස්ථාන කරා යොමු විය<br>O පහල පොලී අනුපාත මධ්‍යයේ වුවද ආන්තික සම්පීඩනය | O වෙළඳපල අනුපාත සංචලනයන් සමීපව නිරීක්ෂණය කරමින් ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා අපගේ නිෂ්පාදන සැලසුම් ප්‍රතිමිලකරණයට ලක් කෙරිණි |
| ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා අවම ද්‍රවශීලතා අවශ්‍යතාවය පහත හෙළීමත් සමග අතිරික්ත වෙළඳපොළ ද්‍රවශීලතාව | O සෘණාත්මක උදාරණයක් නිර්මාණය කළ පීපල්ස් ලීසිංහි අතිරික්ත ද්‍රවශීලතාවය | O තැන්පතු පිටතට ගලායාම දිරිගැන්වුනි<br>O ව්‍යාපාරික පරිමාවන් ඉහළ නැංවීමේ අරමුණිනින් ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමේ ආයෝජන සඳහා ක්‍රමෝපායික තීරණයක් ගන්නා ලදී |
| ආර්ථික වර්ධනයේ මන්දගාමීත්වයක් | O අහිතකර ණය වටපිටාව<br>O ණය සඳහා ඉල්ලුම පහත වැටීම | O ආර්ථික අපගමනයන්ගේ බලපෑමට ලක්විය හැකි ක්ෂේත්‍රයන් වෙත ණය දීමේදී ප්‍රවේශම් සහගත විය |
| මෝටර් රථ ආනයනය මත රජයේ සීමා | O දේශීය වෙලඳ පොලේ රථවාහන වල අසාමාන්‍ය ලෙස මිල ඉහළ යාම | O සේවකයින් අතර මෝටර් රථ වල සැබෑ වටිනාකම් පිළිබඳ දැනුවත් බවක් ඇති කරන ලදී<br>O බැහැර කිරීම් මත අලාභ අඩු කර ගැනීම සඳහා අවස්ථාව උපයෝගී කර ගැනිණි |
| පූර්ව වසංගත චර්යාවට සාපේක්ෂව ගනුදෙනුකාර ඉල්ලුම් රටාවන්හි කැපී පෙනෙන වෙනසක් | O ගණුදෙනුකරුවන්ගේ වැඩි කැමැත්ත යොමුවූයේ සමාජ දුරස්ථකරණය සඳහා පහසුකම් සපයන ලද අන්තර්ජාලගත සහ ජංගම බැංකුකරණ සේවාවන් කෙරෙහිය | O පීඑල්සී ඔන්ලයින් ප්‍රවර්ධනය කෙරුණි |

## අවදානම් කළමනාකරණය සඳහා ආයතනික රාමුවක්

### අවදානම් පාලනය

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු | **අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව - BIRMC**<br>*කාර්යභාරය: සමාගමෙහි/සමූහයෙහි සමස්ත අවදානම් ස්වරූපය සමාලෝචනය* | **අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)**<br>*කාර්යභාරය: මූල්‍ය වාර්තාකරණ සහ අභ්‍යන්තර පාලන අධීක්ෂණය. එමෙන්ම විගණකගේ ස්වාධීනත්වයද නිරීක්ෂණය කරයි* |
| කළමනාකාරීත්ව මට්ටමේ කමිටු | **වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)**<br>*කාර්යභාරය: සමාගමෙහි භාණ්ඩාගාර, වත්කම් හා වගකීම් ක්‍රියාකාරකම් සමාලෝචනය* | **විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC)**<br>*කාර්යභාරය: ණය සම්බන්ධ සහ මෙහෙයුම් අවදානම් සමාලෝචනය* |

### කාර්යභාරයන් සහ වගකීම්




### අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය




| ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් | අවදානම් රුචිය | අවදානම් සංස්කෘතිය |
|---|---|---|
| සමාගම තුළ ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපිත කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. වසර තුළ, සමාගමේ ප්‍රතිපත්ති මෙහෙයුම් පරිසරයට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සංශෝධනය කරන ලද අතර එයට අවශ්‍ය සංශෝධන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝජනා කරන ලදී. | අවදානම් රුචිය සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳෙයි. එය ක්‍රියාවට නැංවීම කළමනාකාරීත්වයේ වගකීම වේ. සිය ව්‍යාපාරික අරමුණු අත්පත් කර ගැනීම සඳහා සමාගම විසින් භාර ගනු ලබන අවදානම් මට්ටම අනුව අවදානම් රුචිය තීරණය වන අතර එය අවදානම් දරාගැනීමේ සීමාවන් අනුව ප්‍රමාණීකරණය කෙරේ. ක්‍රමෝපායික අරමුණු, මෙහෙයුම් වටපිටාව, නියාමන අවශ්‍යතා සහ ප්‍රාග්ධන සැලසුම් වල වෙනස්වීම් හා සමගාමීව BIRMC මගින් අවම වශයෙන් වාර්ෂික පදනමක් මත අවදානම් දරාග ැනීමේ සීමාවන් සමාලෝචනය කෙරේ. | අවදානම් පිළිබඳව සේවකයින්ගේ දැනුවත්භාවය සහ අවදානම් ආශ්‍රිතව දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීම සවිමත් අවදානම් සංස්කෘතියක ලක්ෂණ වේ.පීපල්ස් ලීසිංහි අවදානම් සංස්කෘතියට අවදානම් පාලන ව්‍යුහය, අවදානම් රුචිය, ප්‍රතිපත්ති රාමුව, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන රාමුව ඇතුළත් වේ. අවදානම් පාලන දෙපාර්තමේන්තුව සියළුම සේවකයින්ට පුහුණුව/දැනුවත් කිරීම් ලබා දෙනු ලැබේ. |

# අවදානම් කළමනාකරන විමර්ශනය

### කමිටු වල කාර්යභාරය

| අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ | |
|---|---|
| **අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)** | **අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)** |
| **සභාපති:** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ | **සභාපති:** ජ්‍යෙෂ්ඨ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ |
| **සාමාජිකයින්:**<br>ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙක්, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් දෙදෙනෙක් - මෙහෙයුම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන<br>නිරන්තර ආරාධිතයින්: නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකිරීම් සහ පරිපාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන, පීපල්ස් ලීසිං පරිපාලිත සමාගම්වල නිලධාරී නියෝජිතයන් | **සාමාජිකයින්:**<br>විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්<br>ආරාධිතයින්: ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය. බාහිර විගණකවරු |
| **ප්‍රධාන කාර්යභාරය:**<br>සමාගමෙහි/සමූහයෙහි සමස්ත අවදානම් ඉදිරි දැක්ම සමාලෝචනය | **ප්‍රධාන කාර්යභාරය:**<br>මූල්‍ය වාර්තාකරණ සහ අභ්‍යන්තර පාලන අධීක්ෂණය සහ විගණකගේ ස්වාධීනත්වය නිරීක්ෂණය. |
| **රැස්වීම් වාර ගණන:** කාර්තුමය | **රැස්වීම් වාර ගණන:** කාර්තුමය |
| **වාර්තාකරණය:**<br>BIRMC රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ | **වාර්තාකරණය:**<br>BAC රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ |
| *(BIRMC පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිටු අංක 150 සිට 152 දක්වා ඉදිරිපත් කෙරේ)* | *(BAC පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිටු අංක 144 සිට 145 දක්වා ඉදිරිපත් කෙරේ)* |
| **කළමනාකාරිත්ව මට්ටමේ** | |
| **වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)** | **විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC)** |
| **සභාපති:** ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී | **සභාපති:** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන |
| **සාමාජිකයන්:**<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී දෙදෙනෙක් - මෙහෙයුම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකිරීම් සහ පරිපාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ, ප්‍රධාන කළමනාකරු ස්ථාවර තැන්පතු සහ ඉතුරුම්, ප්‍රධාන කළමනාකරු - මූල්‍ය, භාණ්ඩාගාර ප්‍රධානී | **සාමාජිකයන්:**<br>ආයතනික කළමනාකරණයේ සාමාජිකයින්, ප්‍රධාන කළමනාකරුවන් - මෙහෙයුම්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් - මෙහෙයුම්, ක්‍රියාත්මක ක්ෂේත්‍රවල අවදානම් හිමිකරුවන් |
| **කාර්යභාරය:**<br>සමාගමෙහි භාණ්ඩාගාර, වත්කම් හා වගකීම් ක්‍රියාකාරකම් සමාලෝචනය | **කාර්යභාරය:**<br>ණය සම්බන්ධ සහ මෙහෙයුම් අවදානම් සමාලෝචනය |
| **රැස්වීම් වාර ගණන:**<br>මාසික. හදිසි අවශ්‍යතා මත විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ. | **රැස්වීම් වාර ගණන:**<br>කාර්තුමය |
| **වාර්තාකරණය:**<br>රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහ රැස්වීම් වැදගත් සිදුවීම් පිළිබඳ වාර්තාවක් කාර්තුමය පදනමක් මත BIRMC වෙත | **වාර්තාකරණය:**<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත නිර්දේශ කිරීම රැස්වීමේ වාර්තා BIRMC වෙත |

### ණය අවදානම

කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් පුද්ගලයින් සහ ව්‍යාපාරයන්ට සිදුවූ අවහිරතා ණය අවදානම කෙරෙහි බෙහෙවින් බලපෑවේය. මෙම කාලසීමාව තුළ ආර්ථික ක්‍රියාකාරකම් සීමා වීම සහ ප්‍රවේශම් සහගත වියදම් කිරීම හේතුවෙන් ණය වගකීම් ඉටු කිරීමට ගනුදෙනුකරුවන් අසමත් වීම ණය වර්ධනය පහළ යාම සහ අක්‍රීය ණය/හානිකරන ගාස්තු ඉහළයාම කෙරෙහි හේතු විය. ණය/කල්බදු මත පමාසහන ලබාදෙමින් සහ සහන පොලී අනුපාත යටතේ කාරක ප්‍රාග්ධන ණය ලබා දෙමින් අප රජයේ ආර්ථිකය නැවත නගා සිටුවීමේ ක්‍රියාදාමයට දායක වන අතරතුර අපගේ අය කිරීමේ ක්‍රියාකාරකම් සවිමත් කරමින් දැඩි පූර්ව ණය සීමා කිරීම සහ පශ්චාත් ණය නිරීක්ෂණයන් සිදුකරන ලදී.

**විශ්ලේෂණය**

| නිර්වචනය | ණය අවදානම් සංරචක |
|---|---|
| මූල්‍ය සාධනපත්‍රයක් වෙත ගනුදෙනුකරුවකු හෝ ප්‍රතිපාර්ශවයක් එහි ගිවිසුම්ගත වගකීම් සපුරාලීමට අපොහොසත් වුවහොත් සමාගම වෙත මූල්‍ය අලාභයෙහි අවදානම වේ. | ○ පැහැරහැරීමේ අවදානම<br>○ සංකේන්ද්‍රණ අවදානම<br>○ අයකරගැනීමේ අවදානම |

| විගණනය කරන ලද<br>රුපියල් මිලියන | 2020/21 | 2019/20 |
|---|---:|---:|
| **උපරිම ණය නිරාවරණය** | | |
| දළ ණය සහ ලැබිය යුතු දෑ | 150,656 | 156,498 |
| **හානි කරණය සඳහා වෙන් කිරීම** | | |
| තේවල හානිකරණය | 1,168 | 1,316 |
| සාමූහික හානිකරණය | 8,100 | 7,434 |
| **ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ** | 141,388 | 147,748 |
| ණය සහ ලැබිය යුතු දෑවල සාධාරණ අගය | 163,635 | 155,825 |

### දළ අක්‍රීය ණය අනුපාතය*




*අනාගත පොලී සංරචකය ඇතුළත් වේ*

### අක්‍රීය අත්තිකාරම් වලට සාපේක්ෂව හානිකරණ ආවරනය




### නිෂ්පාදන වශයෙන් අක්‍රීය අත්තිකාරම් අනුපාතය සැසඳුම




**සටහන:**
*අත්හිටුවන ලද නිෂ්පාදනයක් බැවින් කුලී පිට ගැනුම් සඳහා අක්‍රීය අත්තිකාරම් අනුපාතය මෙහි දක්වා නැත. 2021 මාර්තු 31 දිනට ශුද්ධ කළඹ රු. මිලියන 30.71 ක් පමණි.*

### 2020/21 ප්‍රමුඛ වර්ධනයන්

**ක්‍රියාවලිය සවිමත් කිරීම**

- අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුව මගින් ඉහළ වටිනාකම සහිත ණය පහසුකම් සමාලෝචනය ඇතුළුව යෝජනා පත්‍ර සහ සක්‍රීය හා බැහැර කිරීමේ අලාභ පහසුකම්වල පශ්චාත් ණය ලබාදීමේ විමර්ශනයන් ඇගයීමට ලක් කරන ලදී. එහිදී හඳුනාගත් අඩුපාඩු අදාල අධිකාරීත්ව මට්ටම් වෙත දන්වන ලදී. (ශාඛා කළමනාකරුවන්, ප්‍රධාන කළමනාකරුවන්, කලාප ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - අලෙවි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන).
- විධායක අවදානම් කළමනාකරණ කමිටුව මගින් වත්කම් ගුණාත්මක අනුපාත වල ඍණාත්මක ප්‍රවණතා නිරීක්ෂණය කරමින් මෑතකාලීන එක් අවුරුදු ණය ලබාදීම් වල හිඟ මුදල් වල ගණනය කිරීමක් වන ආසාදිත අනුපාතයන් ඇගයුමට ලක් කරන ලද අතර ණය මෙහෙයුම් ගැටලු පිළිබඳව සාකච්ඡා කොට ක්‍රියාමාර්ග ගනිමින් අදාළ නිරීක්ෂණයන් සිදු කරන ලදී.
- ගණනුදෙනුකාර ශ්‍රේණිගත කිරීම සඳහා CRIB ලකුණු තත්වය හඳුන්වා දෙන ලදී.
- දැනට පවතින ණය අවදානම් ප්‍රතිපත්ති පිළිබඳව සමාලෝචනය කරමින් වසර තුළදී නව අවදානම් ප්‍රතිපත්ති සකසමින්, සමාලෝචනය කරමින් අනුමත කරන ලදී.
- ණය ශක්‍යතා ලකුණු තත්ත්වය මත පදනම්ව ණය අනුමැති සීමාවන් සමාලෝචනය කිරීම. අප විසින් ණය පරීක්ෂාව සහ ණය ගුණාත්මකභාවය වර්ධනය කිරීමට කැප වී ක්‍රියාකරන පසුබිමක් තුළ, වසර තුළදී ශාඛා මට්ටමේ ණය අනුමැති අධිකාරිත්වය ඉවත් කොට මධ්‍යගතව ප්‍රධාන ශාඛාව වෙත ලබා දෙන ලදී.
- දේපල සඳහා ඇප තක්සේරු කිරීමට දේපල තක්සේරුකරුවන්ගේ මණ්ඩලයක් පවත්වා ගෙන යන ලද අතර අපගේ පද්ධතිය තුල අනුමත මෝටර් රථ තක්සේරුකරුවන්ගේ සංචිතයක් නිර්මාණය කරන ලදී.

**සමාලෝචනය කරන ලද ණය අවදානම් ප්‍රතිපත්ති**

- ණය ප්‍රතිපත්තිය
- ආන්තික වෙළදාම් ණය ප්‍රතිපත්තිය සහ උපදෙස්
- ෆැක්ටරින් ණය ප්‍රතිපත්තිය
- නිශ්චල දේපළ තක්සේරුකරණය සහ පරීක්ෂාව සම්බන්ධ ප්‍රතිපත්තිය

**නව ණය අවදානම් ප්‍රතිපත්ති**

- පශ්චාත් ණය ලබාදීමේ සමාලෝචනය සම්බන්ධ ප්‍රතිපත්තිය
- ආන්තික වෙළදාම සඳහා වෙන්කිරීමේ ප්‍රතිපත්තිය
- ෆැක්ටරින් සඳහා වෙන්කිරීමේ ප්‍රතිපත්තිය

### ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය

**ණය ඇගයුම**
ණය අවදානම් සහ පාලන ප්‍රතිපත්තිය සහ මෙහෙයුම් උපදෙස් වලට සමගාමීව ණය යෝජනාපත්‍ර ඇගයුමට ලක් කෙරේ.

**අවදානම් ප්‍රතිකාරය සහ මිලකරණය**
මුදල් ප්‍රවාහ සහ ඇප පරීක්ෂා කෙරේ. ඇප සම්බන්ධ වෘත්තීයමය තක්සේරු ලබාගැනේ. වත්කම් හා වගකීම් මිලකරණය වෙනුවෙන් වත්කම් සහ වගකීම් කමිටුව වගකිව යුතු වේ.

**ණය අනුමැතිය**
නම් කරන ලද අධිකාරීත්ව මට්ටම් අනුව ණය අනුමැතිය

**ණය මුදල් ලබාදීම**
නිශ්කාශනය පිරිනැමූ පසු ප්‍රධාන කාර්යාලයේ ගෙවීමේ ඒකකය මගින් අනුමත ණය පහසුකම් වල මුදල් ලබාදෙනු ලැබේ.

**ණය අවදානම නිරීක්ෂනය සහ සමාලෝචනය**
අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුව මගින් ණය අවදානම නිරීක්ෂණය කොට ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ විධායක අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි

**ණය අවදානම පහත හෙළීම**
- ණය අවදානම් ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටීන්
- ණය අවදානම් සීමා
- ණය අධිකාරීත්ව සීමා

### ද්‍රවශීලතා අවදානම

ණය වර්ධනය මන්දගාමී වීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා අවම ද්‍රවශීල අවශ්‍යතාවය පහත හෙළන ලද බැවින් වසර තුළ දී වෙළඳපොලේ අතිරික්ත ද්‍රවශීලතාවයක් පැවතුණි. 2020 දෙසැම්බර් අවසානය වන විට ක්ෂේත්‍රය මගින් පවත්වා ගෙන යන ලද ද්‍රවශීලතාව නියාමන අවම මට්ටමට වඩා ඉතා ඉහළ අගයක පැවතුණි. නියාමන අවමය වන රුපියල් මිලියන 50.7 ට සාපේක්ෂව ක්ෂේත්‍රය තුළ පැවති සමස්ත ද්‍රවශීල වත්කම් මගින් රුපියල් බිලියන 89 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. 2020 දෙසැම්බර් අවසානය වන විට ද්‍රවශීලතා අනුපාතය 13% දක්වා ඉහළ ගියේය. (2019: 11.3%) පීපල්ස් ලීසිං ද අතිරික්ත ද්‍රවශීලතාවය අත්විඳි අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සෘණාත්මක ධාරණ තත්ත්වයක් ඇතිවිය. වසර අවසාන භාගයේ දී ව්‍යාපාරික පරිමාවන් ඉහළයාම සහ තැන්පතු පිටතට ගලායාම දිරිමත් කිරීම මගින් එම තත්ත්වය යම් පමණකින් මඟහරවා ගත හැකි විය.

#### විශ්ලේෂණය

| නිර්වචනය | ද්‍රවශීලතා අවදානම් සංරචක | ණය ශ්‍රේණිගත කිරීම |
|---|---|---|
| ගෙවිය යුතු අවස්ථාවේදී සමාගමෙහි වගකීම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් නොමැති වීමේ අවදානම හෝ එවැනි වගකීම් අතිරික්ත පිරිවැයක් දරමින් සපුරාලීමේ අවදානම වේ. මුදල් ප්‍රවාහ ආශ්‍රිත කාල ගණනය සම්බන්ධ නොගැලපීම් හේතුවෙන් ද්‍රවශීලතා අවදානම උද්ගත වෙයි. | ○ මහ බැංකු ද්‍රවශීලතා අවදානම<br>○ අරමුදල් සම්පාදන ද්‍රවශීලතා අවදානම<br>○ වෙළඳපොල ද්‍රවශීලතා අවදානම | ෆිච් රේටින්ග් ලංකා වෙතින් |

#### ද්‍රවශීල වත්කම් සහ ද්‍රවශීල වත්කම් අනුපාතය




*ද්‍රවශීල වත්කම් අනුපාතය: පවතින ද්‍රවශීල වත්කම්/ශ්‍රීලංමබැ නියෝගය අනුව අවශ්‍ය ද්‍රවශීල වත්කම්*

#### අරමුදල් සම්පාදක විවිධාංගීකරණය




#### මූල්‍ය වත්කම් සහ වගකීම් වල කල්පිරීමේ ස්වරූපය - 2021 මාර්තු 31 දිනට




#### ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය




#### ද්‍රවශීල වත්කම් සඳහා ආතති පරීක්ෂාව (තැන්පතු වල එක්ෂණ ආපසු ගැනීම)

| අවස්ථාව | 1 (%) | 2 (%) | 3 (%) |
|---|---|---|---|
| කම්පනයේ විශාලත්වය | 10 | 15 | 20 |
| ද්‍රවශීල වත්කම් අනුපාතය* | 58.20 | (20.86) | (108.64) |
| අසම්භාව්‍ය අරමුදල් වලට ගැලපීමෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය* | 389.12 | 327.34 | 258.76 |

*ද්‍රවශීල වත්කම් අනුපාතය: පවතින ද්‍රවශීල වත්කම්/ශ්‍රීලංමබැ නියෝගය අනුව අවශ්‍ය ද්‍රවශීල වත්කම්*

### ඵලදායී ක්‍රියාවලීන්

| භාණ්ඩාගාරය | ALCO | BIRMC | අධ්‍යක්ෂ මණ්ඩලය |
|---|---|---|---|
| ○ ALCO මගින් සකසන ලද පරාමිතීන් ඇතුළත දෛනික ද්‍රවශීලතා කළමනාකරණය<br>○ නියාමන අවශ්‍යතාවයට ඉහළින් ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යන ලදී<br>○ සියළුම මුදල් පිටතට ගලා යාමේ බැඳීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් භාවිතයට නොගත් පහසුකම් පවත්වාගෙන යන ලදී<br>○ ආතති පරීක්ෂා ප්‍රතිඵල අවදානම් පාලන දෙපාර්තමේන්තුව විසින් (BIRMC) අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණ කමිටුව වෙත කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී<br>○ ALCO/BIRMC වෙත වාර්තා කරන ලදී | ○ කල්පිරීමේ නොගැලපීම් විශ්ලේෂණය, ද්‍රවශීල වත්කම් අනුපාතය, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය වැනි ද්‍රවශීල අවදානම් දර්ශක පිළිබඳ මාසික සමාලෝචනය<br>○ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කොට ද්‍රවශීලතා අවදානම සීමා කිරීම/පහත හෙළීම සහ කළමනාකරණය සඳහා සුදුසු පියවර නිර්දේශ කරන ලදී<br>○ නියාමන අවමයන් සමග අනුකූලතාවය තහවුරු කරනු පිණිස එළඹෙන වසර කිහිපය සඳහා ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතයන් පුරෝකතනය කොට ඇත | ○ කාර්තුමය පදනමක් මත සිදුකෙරෙන ආතති පරීක්ෂාවන් සමාලෝචනය කරන ලදී<br>○ ද්‍රවශීලතා ප්‍රමුඛ අවදානම් දර්ශක සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතයන් කාර්තුමය පදනමකින් සමාලෝචනය කරන ලදී | සමාලෝචනය කරන ලද ALCO වාර්තා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාර දෙන ලදී |

### වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානමෙහි විවිධ සංරචකයන් අතරින්, සමාගම පොලී අවදානම කෙරෙහි ඉහළ නිරාවරණයක් දක්වන අතර අනෙකුත් අවදානම් පහළ හෝ දරාගත හැකි මට්ටමේ පවතී. මෙම වසරේ දී ප්‍රධාන ලක්ෂණය වූයේ ආර්ථිකය යළි නගාසිටුවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද සහනශීලී මූල්‍ය ප්‍රතිපත්තිය සහ පවත්වාගෙන යන ලද පහළ පොලී අනුපාතිකයන්ය. අප විසින් අපගේ ලාභ ආන්තිකය පවත්වාගෙන යන අතරතුර, වෙළෙඳපොළ පොලී අනුපාතිකයන් සංචලනයන් සමීපව අධ්‍යයනය කරමින් නව ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් අපගේ තැන්පතු සහ ණය ලබාදු දීමේ අනුපාතිකයන් ප්‍රතිමිලගත කෙරිණි.

### විශ්ලේෂණය

<table>
<tr><th rowspan="2">නිර්වචනය</th><th colspan="2">වෙළඳපොල අවදානමෙහි සංරචක</th></tr>
<tr><th>අවදානම් කාණ්ඩය</th><th>අවදානම් නිරාවරනය</th></tr>
<tr><td rowspan="4">විදේශ විනිමය අනුපාත, පොලී අනුපාත, කොටස් මිල සහ භාණ්ඩ මිල වැනි වෙළඳපල සාධකයන්හි සංචලනය හේතුවෙන් අපගේ වෙළඳපොල වටිනාකම හෝ ඉපැයුම් පහත වැටීමෙන් අවදානමයි.</td><td>පොලී අනුපාත අවදානම</td><td>ඉහළ</td></tr>
<tr><td>භාණ්ඩ මිල අවදානම</td><td>පහළ</td></tr>
<tr><td>ස්කන්ධ ආයෝජන අවදානම</td><td>නොසළකා හල හැකි</td></tr>
<tr><td>විදේශ විනිමය අවදානම</td><td>නොසළකා හල හැකි</td></tr>
</table>

### පොලී අනුපාත කම්පන සම්බන්ධ NII මත ආතති පරීක්ෂාව

| NII මත බලපෑම රු. '000 | 2021 | | 2020 | |
|---|---|---|---|---|
| | ඉහළයාම | පහළයාම | ඉහළයාම | පහළයාම |
| 1% | (76,837) | 76,837 | (52,577) | 52,577 |
| 3% | (153,675) | 153,675 | (105,154) | 105,154 |
| 5% | (230,512) | 230,512 | (157,732) | 157,732 |

### TB අනුපාතයන් (සාමාන්‍යය)




### AWPLR සංචලන (සාමාන්‍යය)




### රන් මිල සංචලනය



# අවදානම් කළමනාකරන විමර්ශනය

බලාත්මක ක්‍රියාවලීන්

| භාණ්ඩාගාරය | ALCO | BIRMC | අධ්‍යක්ෂ මණ්ඩලය |
|---|---|---|---|
| **පොලී අනුපාත අවදානම** | | | |
| ○ භාණ්ඩාගාරය මගින් නිරන්තරයෙන් පොලී අනුපාත වටපිටාව සහ ප්‍රමුඛ පොලී අනුපාත දර්ශක වල සංචලනය නිරීක්ෂණය කළේය උදාහරණ; AWLPR සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර අනුපාත<br>○ අපේක්ෂිත ලාභ ආන්තික පවත්වා ගැනීම සඳහා තැන්පතු සහ ණය ලබාදීමේ අනුපාත සම්බන්ධයෙන් තීරණ ගැනීමට වත්කම් සහ වගකීම් කමිටුව වෙත වාර්තාවක් සපයන ලදී | ○ පොලී ප්‍රතිමිලකරණ පරතර විශ්ලේෂණය සම්බන්ධ මාසික සමාලෝචනය<br>○ පොලී අනුපාතයෙහි 1% වෙනසක් සඳහා NII මත බලපෑම තීර්ණය කිරීමට සංවේදීතා විශ්ලේෂණයක් සිදු කිරීම<br>○ පොලී අනුපාත වටපිටාව සමාලෝචනය කරමින් අපේක්ෂිත ලාභ ආන්තික පවත්වාගෙනයෑම තහවුරු කිරීම සඳහා තැන්පතු හා ණය ලබා දීමේ අනුපාතිකයන් නිර්ණය කරන ලදී | ○ පොලී අනුපාත සංවේදීතාවය පිළිබඳ කාර්තුමය සමාලෝචනය සහ පූර්ව නිර්වචනිත අවදානම් දරාගැනීමේ මට්ටම් වලට සාපේක්ෂව ප්‍රතිමිලකරණය සමාලෝචනය<br>○ ශුද්ධ පොලී ආන්තිකය පොලී අනුපාත කෙරෙහි බලපෑම සම්බන්ධයෙන් වන ආතති පරීක්ෂාව පිළිබඳ කාර්තුමය සමාලෝචනය සහ ලාභදායිතා සමාලෝචනය | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව භාරදෙන වත්කම් හා වගකීම් කමිටුවේ වාර්තා සමාලෝචනය |
| **භාණ්ඩ මිල අවදානම** | | | |
| ○ මධ්‍යගතව ස්ථාපිත රන් ණය ඒකකය මගින් ශාඛා ජාලය තුල පවතින රන් ණය ඒකක නිරීක්ෂණය කෙරේ<br>○ අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුව මගින් එදිනෙදා රන් මිල සංචලනයන් නිරීක්ෂණය කරමින් රන් මිල උච්චාවචනයන් ඇගයීමට ලක් කෙරේ | ○ රන් මිල සංචලනය, මිල උච්චාවචනය සහ සැලසුම් කාර්යසාධනය පිළිබඳ මාසික සමාලෝචනය<br>○ රන් මිල සෘණාත්මක මිල සංචලනයන් වල කඩිනම් ඉහළ යාම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලදී | | පීපල්ස් ලීසිං හි ඒකාබද්ධ අවදානම් කළමනාකරනය සම්බන්ධ මූලික වගකීම් දරන ලදී |
| **ස්කන්ධ ආයෝජන අවදානම** | | | |
| ○ ආන්තික වෙළඳාම් දෙපාර්තමේන්තුව නිරන්තරයෙන්ම කොටස් වෙලදපොල මිල, සහ අනාගතයේ දී කොටස් මිල කෙරෙහි බලපෑමක් ඇති විය හැකි වඩාත් පුළුල් ආර්ථික තත්ත්වයන් සහ දේශපාලන වාතාවරණය පිළිබඳව නිරීක්ෂණය කරයි | ○ විස්තරාත්මක ස්කන්ධ ආයෝජන වාර්තාව පිළිබඳ මාසික සමාලෝචනය<br>○ අලාභ සීමාව නවතා ගැනීම ඉක්මවා යන ස්කන්ධ සම්බන්ධව ගත යුතු සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ තීරණය කරන ලදී | | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්කන්ධ ආයෝජන ප්‍රතිපත්තිය සහ කොටස් වෙළෙඳ ප්‍රතිපත්තිය අනුමත කරන ලදී |
| **විදේශ විනිමය අවදානම** | | | |
| ○ වසර තුළදී විදේශ මුදල් විවෘත තත්ත්වයන්හි නොතබන ලදී | | | |

**මෙහෙයුම් අවදානම**

වසංගතයේ බලපෑම හේතුවෙන් පනවන ලද සෞඛ්‍ය සහ සුරක්ෂිතතා රෙගුලාසි කරණ කොට ගෙන අප විසින් ව්‍යාපාර කටයුතු සිදු කරන ලද ආකාරය වෙනසකට භාජනය විය. නිවසේ සිට වැඩ කිරීම, අන්තර්ජාල මාධ්‍ය ඔස්සේ ගනුදෙනු කිරීමට ගනුදෙනුකරුවන් දැක්වූ කැමැත්ත ආදිය හේතුවෙන් තොරතුරු තාක්ෂණ අවදානම ඉහළ ගියේය. එහිදී ව්‍යාපාර අඛණ්ඩව සැලසුම්කරණය අතිශය වැදගත් වූ අතර වසර තුළදී සිදු කරන ලද ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම්කරණ පරීක්ෂාව වසංගතය මගින් එල්ල කරන ලද අභියෝග ජය ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

**විශ්ලේෂණය**

**නිර්වචනය:** ප්‍රමාණවත් නොවන සහ නොගැලපෙන අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති සහ පුද්ගලයින් හෝ බාහිර සිදුවීම් හේතුවෙන් මෙහෙයුම් අවදානම උද්ගත වේ.

**මෙහෙයුම් අවදානම අවම කිරීම**

**තොරතුරු පද්ධති සුරක්ෂිතතාව**

- පීපල්ස් ලීසිං ISO 27001:2013 සහතිකලත් සමාගමක් වන අතර, අප විසින් අපගේ තොරතුරු සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය ස්ථාපනය, ක්‍රියාවට නැංවීම, නඩත්තුව සහ අඛණ්ඩව වැඩි දියුණු කිරීම මෙන්ම තොරතුරු සුරක්ෂිතතා අවදානම් ඇගයීමට ලක් කිරීම සහ ඒවාට ප්‍රතිකර්ම යෙදීම පිළිබඳ තහවුරු කෙරේ.
- තාක්ෂණික අවදානම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමත අවදානම් ඇගයුම් ක්‍රමවේදයක් පවතින අතර එය වාර්ෂිකව දෘඩාංග, මෘදුකාංග, තොරතුරු සහ මානව වත්කම් සම්බන්ධයෙන් සමාලෝචනයට ලක් කෙරේ.
- තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයේ වගකීම වේ.




- 2020/21 දී, අවදානම් පාලන දෙපාර්තමේන්තුව මගින්, දෙවන ආරක්ෂණ රේඛාව වශයෙන්, තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදු කරනු ලබන තොරතුරු තාක්ෂණ අවදානම් ඇගයීම ස්වාධීනව සමාලෝචනය කිරීම ආරම්භ කරන ලදී. අවදානම් පාලන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන මෙම සමාලෝචන පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය වශයෙන් යාවත්කාලීන කෙරේ.

**ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම්කරණය**

- සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම්කරණය සකසනු ලබන්නේ අවදානම් ඇගයුමක් සහ ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණයක් මත පදනම්වය.
- වසර තුළදී ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම්කරණ පරීක්ෂාවක් සිදු කෙරුණු අතර එයට කෝල් ට්‍රී සහ ආපදා ප්‍රතිසාධන කණ්ඩායම් යාවත්කාලීන කිරීම මෙන්ම කාලීන වශයෙන් වැදගත් ක්‍රියාවලින් සම්බන්ධ පුහුණුව ද ඇතුලත් විය.
- මෙම පරීක්ෂාවේ ප්‍රතිඵල සහ නිරීක්ෂණයන් මත පදනම්ව, අප හට ඕනෑම දෙන ලද හදිසි අවස්ථාවකට සූදානම් විය හැකි පරිදි, අපගේ ව්‍යාපාර අඛණ්ඩත්ව යටිතල පහසුකම් සවිබලගැන්වීම සඳහා පියවර ගන්නා ලදී. කෝවිඩ් 19 වසංගතය මගින් උද්ගත කරන ලද අභියෝගාත්මක ව්‍යාපාරික බාධාවන් කෙරෙහි අප විසින් ප්‍රතිචාර සකස් කරමින් සිටින අවස්ථාවක මෙම අත්දැකීම අතිශය වැදගත් විය.
- ප්‍රාදේශීය වශයෙන් හදිසි ප්‍රතිචාර කණ්ඩායම් නිර්මාණය කොට වසංගතයේ බලපෑමට ලක්වූ ශාඛාවන් වෙත යොදවන ලදී. උදාහරණ. කෝවිඩ් ආසාදිත සේවකයින් හේතුවෙන් වසා දැමීමට සිදු වූ ශාඛාවන්.

**සේවකයින්ගේ සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව**

- කොවිඩ් 19 වසංගතය සඳහා රජය විසින් නිර්දේශිත සියළුම සෞඛ්‍ය සහ සුරක්ෂිතතා රෙගුලාසි වලට අනුගත විය.
- හැකි සෑම අවස්ථාවකදීම නිවසේ සිට වැඩ කිරීමේ පහසුකම් සලසන ලදී.
- ඊමේල් පණිවිඩ සහ සමාගමෙහි අභ්‍යන්තර ජාලය ඔස්සේ ආරක්ෂිත පියවර වලට අනුගතවීමේ වැදගත්කම පිළිබඳව කාර්යමණ්ඩලය දැනුවත් කරන ලදී.

**නිවසේ සිට වැඩ කිරීම**

- නිවසේ සිට වැඩ කිරීමේ කටයුතු හේතු කොටගෙන සයිබර් සුරක්ෂිතතා අවදානම් සහ සොරකම් සහ වංචා වැනි අවදානම් හඳුනාගන්නා ලදී. නිවසේ සිට වැඩ කිරීම සහ දුරස්ථ පිවිසුම් සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රතිපත්ති වසර තුළදී ක්‍රියාවට නංවන ලදී.
- සේවකයින් වෙත සපයන ලද ලැප්ටොප් පරිගණක මගින් සොරකම් සහ වංචා අවදානම ඉහළ ගියේය. එක් එක් සේවකයෙකු විසින් සිය ලැප්ටොප් පරිගණකය පිළිබඳ වගකීම භාරගනිමින් ගිවිසුමක් අත්සන් කිරීම තුළින් මෙම අවදානම අවම කෙරුණි.
- නිවසේ සිට වැඩ කිරීම සඳහා සලසන ලද දුරස්ථ පිවිසුම හේතුවෙන් උද්ගත වන සයිබර් සුරක්ෂිතතා අවදානම වීපීඑන් ප්‍රතිපත්තිය, රහස් අංක ප්‍රතිපත්තිය සහ පිවිසුම් පාලන යාන්ත්‍රණයන්, වීපීඑන් පිවිසුම් ලොග් වාර්තාකරණය සහ ලැප්ටොප් වල පුද්ගලික පරිගණක දෘඩකරණ ප්‍රතිපත්ති ආශ්‍රයෙන් අවම කර ගන්නා ලදී.

**රක්ෂණ කටයුතු**

- අවදානම් පාලන දෙපාර්තමේන්තුව මගින් සමාගමෙහි රක්ෂණවර ලැයිස්තුව පවත්වාගෙන යනු ලැබේ.
- කාලෝචිත නැවත අලුත් කිරීම් සහ සක්‍රීය තත්ත්වය තහවුරු කිරීම උදෙසා සියළුම රක්ෂණවර වසර තුළදී අවදානම් පාලන දෙපාර්තමේන්තුව මගින් සමාලෝචනය කරන ලදී.

**පිටස්තර සේවා ලබාගැනීම**

- වසර තුළදී සමාගමෙහි පිටස්තර සේවා ලබා ගැනීමේ ප්‍රතිපත්තිය සමාලෝචනයට ලක් කෙරුණු අතර 2021 මාර්තු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ සංශෝධන අනුමත කරන ලදී.
- පිටස්තර සේවා ලබා ලබාගැනීම මගින් උද්ගතවන සැලකිය යුතු අවදානම් හඳුනාගැනෙන බවට සහ අඛණ්ඩවම බලාත්මක අයුරින් කළමනාකරණය කෙරෙන බවට තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ස්ථාපනය කොට ඇත.

**මෙහෙයුම් අවදානම සමාලෝචනය**

- අවදානම් පාලන දෙපාර්තමේන්තුව මගින් ශාඛා මට්ටමින් අවදානම් සිදුවීම් පිළිබඳ සොයා බැලීම මෙම වසරේදී ආරම්භ වූ අතර එය අවදානම් ආකෘතියක් ආකාරයෙන් කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කරන ලදී.
- මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා සුදුසු අවදානම් පහත හෙළීමේ ක්‍රියාමාර්ග සිදු කරන ලදී.
- මෙහෙයුම් අවදානම පහත දැමීම සඳහා ක්‍රියාවලීන් වෙත ප්‍රධාන පාලනයන් හඳුන්වා දෙන ලදී.

**වෙනත් අවදානම්**

පීපල්ස් ලීසිං අනුකූලතා සහ නියාමන අවදානම, නෛතික අවදානම, ක්‍රමෝපායක අවදානම, කීර්තිනාම අවදානම සහ සමූහ අවදානම වැනි අවදානම් වලට මුහුණපායි. අනුකූලතා ක්‍රියාවලිය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිටු අංක 108 සිට 110 දක්වා ඉදිරිපත් කෙරේ. පළපුරුදු වෘත්තිකයන් යොදා ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩල මට්ටම දක්වා අදාළ කළමනාකාරීත්ව මට්ටම්වලදී නිරීක්ෂණ සහ සමාලෝචනයන් සිදු කිරීම සහ සදාචාර සම්පන්න ව්‍යාපාරික කටයුතු සඳහා අපගේ වන කැපවීම ඔස්සේ අවදානම් අවම කරගැනේ.

THANK YOU

ස්තූතියි

# මූල්‍ය වාර්තා

163 මූල්‍ය දින දර්ශනය
164 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම
165 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකත්ව වාර්තාව
166 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
167 ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය
168 ස්වාධීන විගණකවරයාගේ වාර්තාව
172 මූල්‍ය ප්‍රකාශනයන් - පටුන
173 ආදායම් ප්‍රකාශය
174 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
175 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
176 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය
178 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
179 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

# මූල්‍ය දින දර්ශනය

| | | 2020/21 | 2021/22 |
|---|---|---|---|
| අන්තර්මධ්‍ය මූල්‍ය ප්‍රකාශයන් ප්‍රකාශනය | කාර්තුව 1 ජූනි 30 අවසන් වූ | 2020 සැප්තැම්බර් 14 | 2021 අගෝස්තු 15 ට පෙර |
| | කාර්තුව 2 සැප්තම්බර් 30 අවසන් වූ/ සැප්තැම්බර් 30 අවසන් වන | 2020 නොවැම්බර් 03 | 2021 නොවැම්බර් 15 ට පෙර |
| | කාර්තුව 3 දෙසැම්බර් 31 අවසන් වූ/ දෙසැම්බර් 31 අවසන් වන | 2021 පෙබරවාරි 12 | 2022 පෙබරවාරි 15 ට පෙර |
| | කාර්තුව 4 මාර්තු 31 අවසන් වූ/මාර්තු 31 අවසන් වන | 2021 මැයි 25 | 2022 මැයි 30 ට පෙර |
| මූල්‍ය ප්‍රකාශයන් ප්‍රකාශනය | 2020 සැප්තැම්බර් 30 අවසන් වූ මාස 6 | 2020 නොවැම්බර් 24 | |
| | 2021 මාර්තු 31 අවසන් වූ වසර | 2021 ජූනි 29 | |
| | 2021 සැප්තැම්බර් 30 අවසන් වන මාස 6 | | 2021 දෙසැම්බර් 31 ට පෙර |
| | 2021 මාර්තු 31 අවසන් වන වසර | | 2022 ජූනි 30 ට පෙර |
| වාර්ෂික වාර්තා ප්‍රකාශනය | වාර්ෂික වාර්තාව ප්‍රකාශනය | 2021 අගෝස්තු | 2022 ජූනි |
| වාර්ෂික මහා සභා රැස්වීම | වාර්ෂික මහා සභා රැස්වීම | 25 වැනි වාර්ෂික මහා සභා රැස්වීම 2021 අගෝස්තු 5 | 26 වැනි වාර්ෂික මහා සභා රැස්වීම 2022 ජූනි මසට පෙර |
| ලාභාංශ ගෙවීම | **අන්තර්මධ්‍ය ලාභාංශ - කොටස්කර** 2021 මාර්තු 31 අවසන් වූ වසර සඳහා කොටස්කර ලාභාංශ | 2020 දෙසැම්බර් 15 | |

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 7 දරණ සමාගම් පනත ප්‍රකාරව, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (සමාගම) හි මූල්‍ය ප්‍රකාශයන් සහ සමාගම සහ එහි පරිපාලිතයන්ගේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම, මෙම ප්‍රකාශයෙන් ඉදිරිපත් කෙරේ.

මූල්‍ය ප්‍රකාශයන් මගින් 2021 මාර්තු 31 දිනට මූල්‍යමය තත්ත්වය සහ එදින අවසන් වූ වසරෙහි මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කරන බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන අතර ඒවා වාර්ෂික මහා සභා රැස්වීමට පෙරාතුව ඉදිරිපත් කෙරේ. මෙකී මූල්‍ය ප්‍රකාශයන් පහත දැක්වෙන ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ:

- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
- ආදායම් ප්‍රකාශය
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කරනු ලැබ ඇති මූල්‍ය ප්‍රකාශයන්හි සුපිළිපන් බව සහ වාස්තවිකත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම භාරගනී. මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී පහත දැක්වෙන කරුණු ඉටු කරන ලද බව අධ්‍යක්ෂවරුන් තහවුරු කරයි;

- යෝග්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් තෝරාගෙන සංස්ථිතිකව භාවිත කරන ලද අතර, ප්‍රමාණාත්මක වෙනස්වීම්, ඇත්නම්, හෙළිදරව් කොට පැහැදිලි කරනු ලැබ ඇත:
- සියළුම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ පරිදි අනුගමනය කරන ලදී: සහ
- සාධාරණ හා විචක්ෂණශීලී විනිසුම් සහ ඇස්තමේන්තු උපයෝගී කරගන්නා ලදී.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි වගන්ති 150 (1), 151, 152 සහ 153 (1) සහ (2) ප්‍රකාරව සමාගම සහ සමූහය මගින් සියළුම ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යනු ලබන බවට තහවුරු කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

අධ්‍යක්ෂවරුන් විසින් මෙහෙයුම් සිදුකිරීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් පවතින බවට තහවුරු කරමින් මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගැනීම සාධාරණීකරණය කරන ලදී. තවද, සමාගමෙහි මූල්‍ය තත්ත්වය, සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව, හෙළිදරව් කිරීම සඳහා සමාගම මගින් ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කිරීමේ වගකීමද අධ්‍යක්ෂවරුන් සතු වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි වගන්ති 150 (1) (ආ) සහ 152 (1) (ආ) හි අවශ්‍යතාවය අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ වගකීම සහිත නිලධාරියා වශයෙන් ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා විසින් සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් සහතික කරන ලදී. එයට අමතරව, සමාගම් පනතෙහි 151 (1) (ඇ) වගන්තියෙහි සහ සෙසු නියාමන අවශ්‍යතා ප්‍රකාරව 2021 ජූනි 4 වැනි දින සමාගමෙහි අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් වෙත අත්සන් තබන ලදී.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි 148 (1) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ සමාගම් පනතට අනුකූලව සැකසීමට හැකි වන පරිදි සහ අදාළ මූල්‍ය ප්‍රකාශ පහසුවෙන් සහ නිසි පරිදි විගණනය කළ හැකි වන පරිදි, කවර හෝ අවස්ථාවකදී සමාගමෙහි ගනුදෙනු පැහැදිලි කෙරෙන සහ සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව සමාග මෙහි මූල්‍ය තත්ත්වය නිර්ණය කළ හැකි වන ආකාරයේ නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන යනු ලබන බවට තහවුරු කිරීමේ වගකීම ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. මෙම වාර්ෂික වාර්තාවෙහි සකසා ඉදිරිපත් කරනු ලබන වසර 2020/2021 සඳහා වන මූල්‍ය ප්‍රකාශයන්, පාදක වන ගිණුම් පොත් සමග එකඟත්වයෙන් යුතුවන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනත, 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත හා ඒ යටතේ නිකුත් කරන ලද නියෝග, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගතවීමේ නීතිරීති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සාංගමික පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහයෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

සමාගම සහ සමූහය මගින් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කිරීම උදෙසා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය නිල රැස්වීම් වලදී සහ විගණන කමිටුව ඔස්සේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිරන්තර විමර්ශනයට ලක් කරනු ලබන අතර, එහි වාර්තාව පිටු අංක 144 සිට 145 දක්වා ඉදිරිපත් කොට ඇත. සමාගම සහ සමූහය මගින් ප්‍රකාශිත අන්තර්මධ්‍ය මූල්‍ය ප්‍රකාශයන්ද විගණන කමිටුවෙහි සමාලෝචනයෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කෙරේ.

සමාගම සහ සමූහයට අයත් වත්කම් සුරැකීම සඳහා සාධාරණ පියවර ගැනීම සම්බන්ධයෙන්ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳෙන අතර, මෙහිදී සමාගම සහ සමූහයෙහි සැළකිය යුතු අවදානම් කළමනාකරණය සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කිරීම කෙරෙහි නිසි අවධානය යොමු කිරීමද ඔවුන්ගේ වගකීම වේ. 'මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය' පිටු අංක 166 හි දැක්වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි 56 (2) වගන්තිය ප්‍රකාරව, කොටස්කරයක ආකාරයෙන් අන්තර්මධ්‍ය ලාභාංශයක් ලබාදීම සඳහා අනුමැතිය පළ කරන ලද බව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම්දෙයි. මෙයට අදාළව, 1:21.1666668487 ක කොටස්කර ලාභාංශය ප්‍රකාරව, සමාගමෙහි ඡන්ද බලය සහිත සාමාන්‍ය කොටස් 2020 දෙසැම්බර් 24 දින දිට බලපැවැත්වෙන පරිදි ලැයිස්තුගත කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත අන්තර්මධ්‍ය ලාභාංශය සහ යෝජිත අවසන් ලාභාංශය අනුමත කරනු ලැබ ඇත්තේ, 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි 57 වගන්තිය ප්‍රකාරව එවැනි බෙදාහැරීම් වලින් අනතුරුව සමාගම මගින් වහාම ද්‍රවශීලතා පරීක්ෂාව සපුරාලනු ලබන බවට සෑහීමකට පත් වෙමින් වන අතර, ගෙවන ලද ලාභාංශ සම්බන්ධයෙන්, බාහිර විගණකවරයාගෙන් ද්‍රවශීලතා සහතික ලබාගෙන ඇත.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි 166 (1) සහ 167 (1) වගන්ති ප්‍රකාරව, මෙම වාර්ෂික වාර්තාව කල්තබා පිළියෙල කරන ලද බවටත් එහි පිටපත් කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති අංක 7.5 (අ) සහ (ආ) ප්‍රකාරව නිර්දේශිත කාලසීමාව ඇතුළත කොටස් හිමිකරුවන් වෙත යවනු ලබන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කොට ස්වකීය විගණන මතය ලබාදීම සඳහා යෝග්‍ය වේ යැයි හැඟීයන කවර හෝ පරීක්ෂාවන් සිදුකිරීම සහ කවර හෝ පියවරක් ගැනීම සඳහා විගණකවරයා වෙත සියළු අවස්ථාවන් සැලසිය යුතු වේ. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී 'විගණනලාභී සමාගමක්'' යන නිර්වචනය යටතට අයත් වන අතර විගණකාධිපතිවයා හෝ විගණකාධිපතිවරයා විසින් අනුමැති ලබාදෙන කවර හෝ පුද්ගලයකු හට සමාගමෙහි විගණනය සිදු කල හැකි වන අතර මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම් පිටු අංක 168 සිට 171 දක්වා 'ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවෙහි' දැක්වේ.

සිය පරම දැනුම අනව සමාගම සහ සමූහය විසින් ගෙවිය යුතු සියළුම බදු, තීරුබදු සහ ගාස්තු, සමාගම සහ සමූහය විසින් සමාග මෙහි සේවකයින්, සමූහය සහ රජය සහ සෙසු ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම දායකත්වයන්, ගාස්තු සහ බදු වාර්තාකරණ දිනට ගෙවනු ලැබ හෝ, අදාළ අවස්ථාවන්හිදී වෙන්කිරීම් සිදුකරනු ලැබ ඇති බවට අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කරනු ලැබේ. ඒ අනුව, මෙම ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි ඔවුන් විසින් සිය වගකීම් ඉටු කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



**ලක්මිණි කෝට්ටෙගොඩ**
*අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්*

2021 ජූලි 07
කොළඹ

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකත්ව වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. BAF/D/PLF/2021/03
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 29 June 2021

සභාපති
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස්
පීඑල්සී

**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව සම්බන්ධ විගණකාධිපතිවරයාගේ සහතිකත්ව වාර්තාව**

## හැඳින්වීම

මෙම වාර්තාව මගින් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (සමාගම) හි මූල්‍ය වාර්තාකරණය පිළිබඳ පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය (ප්‍රකාශය) සම්බන්ධ සම්බන්ධයෙන් සහතිකත්වයක් සැපයෙන අතර එය 2021දෙසැම්බර් 31 දිනට අවසන් වූ වසර සඳහා වන වාර්ෂික වාර්තාවේ ඇතුළත් වේ.

## කළමනාකාරීත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද, මූල්‍ය සමාගම් (සාංගමික පාලනය) 2008 නියෝග අංක 3 වගන්ති (10) 2 (ආ)/ 2009 මූල්‍ය කල්බදු (සාංගමික පාලනය) නියෝග අංක 4 වගන්ති (10) (2) ට අනුකූලව පිළිවෙළ කොට ඉදිරිපත් කරන ලද මෙම ප්‍රකාශය පිළිබඳව - මූල්‍ය සමාගම් මූල්‍ය කල්බදු සමාගම් වල අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධ මාර්ගෝපදේශ මාලාවට- අනුව කළමනාකාරීත්වය වගකීමෙන් බැඳෙයි.

## මාගේ වග වගකීම සහ SLSAE 3051 සමග අනුකූලතාවය

මාගේ වගකීම වනුයේ සමාගමෙහි අභ්‍යන්තර පාලනයේ නිර්මිතිය සහ බලාත්මක භාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂකවරුන් විසින් භාවිත කරන ලද ක්‍රියාවලිය අධ්‍යක්ෂකවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙල කරන ලද ලේඛනවලින් තහවුරු වන්නේ ද යන්න ඇගයුමට ලක් කිරිමයි.

මා විසින් මාගේ සහභාගිත්වය ශ්‍රී ලංකා සහතිකත්ව සහභාගිත්වයන් සම්බන්ධ SLSAE 3051 සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද බලපත්‍රලාභී මූල්‍ය සමාගම් මූල්‍ය කල්බදු සමාගම් වල අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිළිබඳ සහතිකත්ව වාර්තාව අනුව සිදුකරන ලදී.

මෙම ප්‍රමිතිය මගින් අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශයෙහි සියලු ප්‍රමාණාත්මක සම්බන්ධව කළමනාකාරීත්වය විසින් පිළියෙල කිරීමේදී සීමිත සහතිකත්වයක් ලබා ගනිමින් මා විසින් අදාළ ක්‍රියපටිපාටිය සැලසුම්කොට ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

මෙම සහභාගිත්වයේ අරමුණු සඳහා කවර හෝ වාර්තාවක් යාවත්කාලීන කිරීම් හෝ සහතික කිරීම සම්බන්ධයෙන් මා වගකීමෙන් නොබැඳෙන එහිදී මූල්‍ය තොරතුරු සම්බන්ධව විගණනයක් හෝ සමාලෝචනයක් සිදු නොකරන ලදී.

## සිදුකරන ලද කාර්යය පිළිබඳ සාරාංශය

මාගේ සහභාගිත්වයේදී සමාගමෙහි අභ්‍යන්තර පාලනයේ නිර්මිතිය සහ බලාත්මකභාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂකවරුන් විසින් භාවිත කරන ලද ක්‍රියාවලිය අධ්‍යක්ෂකවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙල කරන ලද ලේඛනවලින් තහවුරු වන්නේ ද යන්න ඇගයුමට ලක් කරන ලදී.

මා විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටීන් අධ්‍යක්ෂවරුන් විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය සම්බන්ධයෙන් පුද්ගලයන් ගෙන් කරන ලද විමසීම් සහ නියැදි පදනමක් මත පැවැති ලේඛන වලට සීමා වේ.

SLSAE 3051 මගින් මා විසින් අදාල ප්‍රකාශය මගින් සියලු අවදානම් සහ පාලනයන් ආවරණය වන්නේ ද යන්න හෝ සමාගමෙහි අවදානම් සහ පාලන ක්‍රියාපටිපාටීන් වල බලාත්මක භාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවේ. එමෙන්ම SLSAE 3051 මගින් මා විසින් වාර්ෂිකව වාර්තාවේ අනාවරණය කරන ලද කවර හෝ සැලකිය යුතු අර්බුදයන් සම්බන්ධ ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලනයන් මගින් ඒවා නිරාකරණය කෙරෙන බවට සලකා බැලීම ද අවශ්‍ය නොවේ.

මෙහිදී තෝරා ගන්නා ලද ක්‍රියාපටිපාටිය මාගේ විනිශ්චය මත රඳා පැවති අතර එහිදී සමාගමෙහි ස්වභාවය සහ ප්‍රකාශය පිළියෙල කිරීම සම්බන්ධ සිදුවීම් හෝ ගනුදෙනු පිළිබඳ මාගේ අවබෝධය යොදා ගැනිණි.

මාගේ නිගමනය කෙරෙහි මතයක් සැපයීම සඳහා මා විසින් ලබා ගන්නා ලද සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

## නිගමනය

ක්‍රියාවේ යොදවන ලද ක්‍රියාපටිපාටීන් මත පදනම්ව සමාගමෙහි මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයෙහි නිර්මිතිය සහ බලාත්මකභාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය මාගේ අවබෝධය අනුව මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය සමඟ පටහැනි වන කිසිදු කරුණක් කෙරෙහි මාගේ අවධානය යොමු නොවීය.

**ඩබ් පී සී වික්‍රමරත්න**
*විගණකාධිපති*

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

## වගකීම

මූල්‍ය සමාගම් (සාංගමික පාලනය -සංශෝධන) 2013 නියෝග අංක 06 මගින් සංශෝධිත, 2008 අංක 03 දරණ මූල්‍ය සමාගම් නියෝග අංක 03 හි 10 (2) (ආ) වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය (''මණ්ඩලය'') පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (''සමාගම'') හි ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණවත්භාවය සහ බලාත්මකභාවය සම්බන්ධයෙන් වගකීමෙන් බැඳේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම මුහුණපාන ලද අවදානම් හඳුනාගැනීම, වාර්තා කිරීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය සම්බන්ධ ඵලදායක වූද පරිපූර්ණ වූද අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීමට කටයුතු කරන ලද අතර, එහිදී මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියක්ද ඇතුළත් වූ අතර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තර විමර්ශනයන් සිදු කරන ලදී.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය සවිමත් හා ප්‍රමාණවත් බව ද බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා නියාමන අවශ්‍යතා අනුව සිදු කරන ලද බව ද අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

මුහුණදෙන අවදානම්, නිර්මිතිය, මෙහෙයුම් හඳුනාගනිමින්ද ඇගයුමට ලක් කරමින්ද මෙම අවදානම් අවම කිරීමට සහ පාලනය කිරීමට අවශ්‍ය සුදුසු අභ්‍යන්තර පාලනයන් නිරීක්ෂණය කරමින්ද කළමනාකාරීත්වය, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය ආශ්‍රිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් ක්‍රියාවට නැංවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වයි.

## මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනයෙහි නිර්මිතිය සහ බලාත්මකභාවය සමාලෝචනය කිරීමේදී යොදාගනු ලබන ක්‍රියාවලියෙහි ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණවත්බව සහ සුපිළිපන් බව සමාලෝචනය කිරීම සඳහා ස්ථාපනය කොට ඇති ප්‍රධාන යාන්ත්‍රණයන් පහත දක්වේ:

- සමාගමෙහි දෛනික මෙහෙයුම් කටයුතු වල ඵලදායීතාවය සහ මෙහෙයුම්වල සංස්ථාපිත අරමුණු, ක්‍රමෝපායන් සහ වාර්ෂික අයවැය කෙරෙහි මෙන්ම අනුමත ප්‍රතිපත්ති හා ව්‍යාපාරික නියෝගයන් කෙරෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වීම උදෙසා මණ්ඩලය විසින් විවිධ කමිටු ස්ථාපනය කෙරිණි.
- සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලත් ප්‍රතිපත්ති/ප්‍රඥප්ති මගින් පාලනය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පැතීමට පෙර එබඳු ප්‍රතිපත්ති/ප්‍රඥප්ති සමාලෝචනය කොට නිර්දේශ කරනු ලබයි. එබඳු ප්‍රතිපත්ති/ප්‍රඥප්ති නිරන්තරයෙන් සමාලෝචනය කොට, යාවත්කාලීන කොට අධ්‍යක්ෂ මන්ඩලය විසින් අනුමත කරනු ලබයි.
- සමාගමෙහි අභ්‍යන්තර විගණන අංශය මගින්, නියැදි හා ආවර්තිත ක්‍රියාපටිපාටීන් භාවිත කරමින් අඛණ්ඩවම අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් කෙරෙහි අනුකූලතාව සහ ඵලදායීත්වය පරීක්ෂා කරනු ලැබේ. මෙමගින් අනනුකූලතාවය සම්බන්ධ කවර හෝ සැළකිය යුතු සොයාගැනීමක් විශේෂ කොට දක්වනු ලැබේ. වාර්ෂික විගණන සැලසුම අනුව විගණනයන් සිදුකෙරෙන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සමාලෝචනය කොට අනුමත කෙරේ. ස්වාධීන හා විෂයමූලික වාර්තාවක් ලබාදීමේ අරමුණින් යුතුව, ඇගයීමට ලක්වන අවදානමෙහි මට්ටම අනුව වාර ගණන තීරණය කරමින්, සියළුම ඒකකයන් සහ ශාඛාවන් ආශ්‍රිතව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකෙරේ. අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත භාරදෙනු ලැබේ.
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්, අභ්‍යන්තර විගනන අංශය, නියාමන අධිකාරීන් සහ කළමනාකාරීත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කරනු ලබයි. ඔවුන් විසින් විගණනයන්හි විෂයපථය හා තත්ත්වය සම්බන්ධ නිශ්චිත අවධානයකින් යුතුව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් සමාලෝචනයද සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වාර්තා ආවර්තිත පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ ඉදිරිපත් කෙරේ.
- මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයුමට ලක් කිරීමේදී, සමාගමෙහි හඳුනාගත් නිලධාරීන් විසින් අඛණ්ඩවම, සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් ගිණුම් සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සියළුම ක්‍රියාපටිපාටීන් සහ පාලනයන් විශ්ලේෂණය හා යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. සමාගමෙහි අභ්‍යන්තර විගණන අංශය මගින් අඛණ්ඩ පදනමක් මත මෙම ක්‍රියාපටිපාටීන් හා පාලනයන්ගේ සැකසුම හා ඵලදායීතාවය සම්බන්ධ යෝග්‍යතාවය නිර්ණය කරන ලදී.

හඳුනාගැනීම, මිනුම්කරණය, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීම සම්බන්ධ අවශ්‍යතා වෙත අනුගත වීම සම්බන්ධයෙන් සමාගම මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS සහ SLFRS යොදාගනු ලබන අතර, අදාළ ක්‍රියාවලීන් වෙත ප්‍රගතිගාමී වැඩිදියුණු කිරීම් සිදුරකමින් මූල්‍ය වාර්තාකරණය සහ කළමනාකාරීත්ව තොරතුරු සම්බන්ධ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම සිදුකෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, SLFRS 9 ''මූල්‍යමය උපකරණ'' අනුගමනය කිරීම කෙරෙහි නිසි අවධානය යොමු කරන ලදී. එහිදී අවශ්‍ය මොඩියුලයන් ක්‍රියාවට නංවන ලද අතර කළමනාකාරීත්ව තොරතුරු පද්ධතීන් සහ ආකෘතික වලංගු කිරීම් සහ SLFRS 9 වෙත අනුගත වීම සඳහා අවශ්‍ය වාර්තා සම්බන්ධයෙන් වන ක්‍රියාවලීන් සහ පාලනයන් කෙරෙහි ප්‍රගතිගාමී වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

## තහවුරු කිරීම

ඉහත දක්වන ලද ක්‍රියාවලීන් මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණහි විශ්වසනීයබව පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීමට තරම් ප්‍රබල හා ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ කොළඹ කොටස් වෙළඳපොලෙහි අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

## බාහිර විගණකවරයා විසින් සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධ සමාලෝචනය

බාහිර විගණකවරයා විසින් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන ඉහත දැක්වෙන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනයට ලක් කොට, සමාගමෙහි අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සැකසුම සහ ඵලදායීත්වය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිත කරන ලද ක්‍රියාවලිය සම්බන්ධයෙන්, ඔවුන්ගේ අවබෝධය අනුව ප්‍රකාශය අනුකූල නොවන බවට විශ්වාස කිරීමට හේතු වන අකාරයේ කිසිදු කරුණක් ඔවුන්ගේ අවධානයට ලක් නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**කොරලී පීටර්ස්**
*සභාපති*
*අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව*

**සුජීව රාජපක්ෂ**
*සභාපති*

**රොහාන් පතිරගේ**
*අධ්‍යක්ෂ*

2021 ජූනි 29
කොළඹ

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය

2021 මාර්තු 31 වැනි දිනට පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (සමාගම) හි මූල්‍ය ප්‍රකාශයන් සහ සමාගම හා එහි පරිපාලිතයන් (සමූහය) හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පහත සඳහන් සම්මතයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත් කෙරේඃ

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිඃ
- 2007 අංක 07 දරණ සමාගම් පනතඃ
- 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනතඃ
- 2011 අංක 41 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලත් මූල්‍ය සමාගම් වෙත නිකුත් කරන ලද නියෝගඃ
- කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති, සහ
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද සංස්ථාපිත පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහය.

සමූහය මගින් කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති අනුව සිය කොටස් හිමිකරුවන් වෙත කාර්තුමය පදනමක් මත අන්තර්මධ්‍ය මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කෙරේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් උචිත වන අතර සමූහය මගින් සංස්ථිතිකව භාවිත කොට ඇත. ඒවායේ ආදේශනයේදී පූර්ව නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ කිසිදු වෙනසක් සිදු නොකෙරිනි. වර්තමාන ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණාත්මක වෙනස්වීම් වෙත, ඇත්නම්, අනුගත වීම සඳහා අවශ්‍ය ස්ථානයන්හිදී සන්සන්දනාත්මක තොරතුරු ප්‍රතිවර්ගීකරණය කොට ඇති අතර ඒවා හෙළිදරව් කොට පැහැදිලි කරන ලදී. ඉහළ මට්ටමේ විනිසුමක් සහ සංකීර්ණත්වයක් සහිත සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ඇස්තමේන්තු සම්බන්ධයෙන් සමාගමෙහි බාහිර විගණකවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමග සාකච්ඡා කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සුපිළිපන්බව සහ වාස්තවිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් භාරගැනේ. සමාගමෙහි ගනුදෙනු වල ස්වභාවය සහ යථා ස්වරූපය, සමාගමෙහි කටයුතු වල තත්ත්වය මූල්‍ය ප්‍රකාශයන් ඔස්සේ සත්‍ය හා සාධාරණ අයුරින් පිළිබිඹු වන අයුරින්, මෙම මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ ඇස්තමේන්තු හා විනිශ්චයන් විචක්ෂණශීලී වූද සාධාරණ වූද ආකාරයෙන් සිදුකරනු ලැබ ඇත. අඛණ්ඩව මෙහෙයුම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් සමූහය සතු වන බවට අප විසින් තහවුරු කරනු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගැණිනි.

මේ බව තහවුරු කිරීම සඳහා, සමාගම සහ සමූහය මගින් වත්කම් සුරැකීම සඳහා ද වංචා මෙන්ම අක්‍රමිකතා හඳුනාගැනීම හා වළකාලීම සඳහාද අභ්‍යන්තර පාලන හා ගිණුම්කරණ වාර්තා පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන අතර එය නිරන්තර පදනමක් මත විමර්ශනය, තක්සේරුව සහ යාවත්කාලීන කිරීම සිදුවේ.

සමාගම සහ සමූහය මගින් ස්ථාපිත ප්‍රතිපත්තීන් හා ක්‍රියාපටිපාටීන් අනුගමනය කරනු ලබන බවට තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් ආවර්තිත විමර්ශනයන් සිදු කරනු ලැබේ. කෙසේවුවද, කවර හෝ අභ්‍යන්තර පාලන හෝ ගිණුම්කරණ පද්ධතියක් මගින් සපයනු ලබන සහතිකය තුලනය කිරීමේදී හඳුනාගත යුතු නෛසර්ගික සීමාවන් පවතී.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සියළුම අභ්‍යන්තර හා බාහිර විගණන පරීක්ෂා වැඩසටහන්, අභ්‍යන්තර පාලන පද්ධතීන් හා ක්‍රියාපටිපාටීන්හි කාර්යක්ෂමතාවය, ගිණුම්කරණ ප්‍රමිතීන්හි තත්ත්වය සහ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා කෙරෙහි ඒවායේ අනුගතවීම සහ කළමනාකාරීත්ව ලිපිය සමාලෝචනයට ලක් කරන ලද අතර ව්‍යවස්ථාපිත විගණනයේදී ඉස්මතු කරන ලද කවර හෝ කරුණක් සම්බන්ධයෙන් පසුවිපරම් ද සිදු කරන ලදී. ඒ පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 144 සහ 145 හි ''අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ'' දැක්වේ.

සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් සහ සමූහයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර ඔහුගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 168 සිට 171 දක්වා ඉදිරිපත් කෙරේ.

අප විසින් පහත සඳහන් කරුණු තහවුරු කරනු ලැබේ;

- සමූහය සියළුම නීති, රෙගුලාසි සහ විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කොට ඇති අතර කිසිදු ප්‍රමාණාත්මක අනනුකූලතාවයක් සිදු නොවීය.
- මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 270 හි සටහන 53.1.1. හි දක්වනු ලැබ ඇති කරුණු වලට අමතරව සමාගමට එරෙහිව කිසිදු මූර්ත නඩු මාර්ගයට එළඹීමක් සිදු නොවීය.

2021 මාර්තු 31 දින වන විට සමූහයෙහි සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම දායකත්වයන්, ගාස්තු හා බදු මුදල් ගෙවනු ලැබ ඇති අතර අදාළ කවර හෝ අවස්ථාවන්හිදී අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත.



**ෂමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී*



**ඔමාල් සුමනසිරි**
*ප්‍රධාන කළමනාකරු - මූල්‍ය*

2021 ජූලි 07
කොළඹ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BAF/D/PLF/2021/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 07 June 2021 |

සභාපති
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස්
පී.එල්.සී.

## 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 මතය

2021 මාර්තු මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය, විස්තරාත්මක ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයන් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්, 2021 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම) සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි පරිපාලිත සමාගම්වල (සමූහය) මූල්‍ය ප්‍රකාශන විගණනය, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව මාගේ මෙහෙයවීම යටතේ සිදුකරන ලදී. මෙම විගණනය කරගෙන යාම සඳහා, පොදු ව්‍යවහාරය තුළ ක්‍රියාත්මක වන වරලත් ගණකාධිකාරී ආයතනයක් මා වෙත සහය විය.

මගේ මතය අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2021 මාර්තු මස 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වසර සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය සාධාරණ දැක්මක් ලබා දේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූලික විගණන කරුණු

මූලික විගණන කරුණු වන්නේ පවත්නා කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය තුළ වඩාත් සැලකිල්ලට ගනු ලැබූ කරුණු වේ. මෙම කරුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමස්තයක් ලෙස සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයේ අන්තර්ගතය තුළ ආමන්ත්‍රණය කරන ලද අතර ඒ සම්බන්ධව මගේ විගණන මතය සකස් කිරීම තුළ මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් මම ලබා නොදෙමි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| ප්‍රධාන විගණන කරුණු | මූලික විගණන කරුණු මාගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය |
|---|---|
| **ණය සහ ලැබිය යුතු දේ සඳහා අපහායන වෙන්කිරීම්**<br><br>2021 මාර්තු මස 31 වන දිනට, සමූහයේ මුළු වත්කම් වලින් 82% වූ රු. මිලියන 149,342 ක් ණය සහ ලැබීම් වලින් සමන්විත විය. (සටහන 25) රු. මිලියන 9,882ක් වූ අපහායන වෙන්කිරීම් (සටහන 25).<br><br>සටහන 25.7 හි විස්තර කර ඇති පරිදි, මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ ඇති අපහායන වෙන්කිරීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 අනුකූල වේ.<br><br>ප්‍රධාන විගණන කාර්‍යයන් වූයේ:<br>○ අපහායන වෙන්කිරීම් ප්‍රමාණාත්මකතාවය පැතුරුම් පත් (Spread Sheet) භාවිතයෙන් ගණනය කිරීම<br>○ ගණනය කිරීම් හා සම්බන්ධ උපකල්පන, අවිනිශ්චතා සහ තක්සේරු කිරීම<br><br>අපහායන වෙන්කිරීම් තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරනු ලබන සැලකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවල ප්‍රධාන අංශ පහත දැක්වේ:<br><br>○ COVID-19 සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි ඇතිවිය හැකි බලපෑම් (උදා: රජයේ දිරි දීමනා සහ සමූහය විසින් ලබාදී ඇති ණය තාවකාලික සහන පියවර);<br>○ පුළුල් පරාසයක විභව ආර්ථික ප්‍රතිඵල සහ අනාගත අපේක්ෂිත ණය පාඩු කෙරෙහි COVID-19 වෙතින් ඇතිවිය හැකි බලපෑම් සැලකිල්ලට ගෙන සාර්ව ආර්ථික තත්ත්වයන් සංවර්ධනය කිරීම හා ඒකාබද්ධ කිරීම ඇතුළුව ඉදිරි දැක්ම | මාගේ වාර්තාවේ දිනය දක්වා පැවති තොරතුරු මත පදනම්ව COVID-19 බලපෑම් සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයේහි ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් අදාළ ක්‍රමවේදය තුළින් SLFRS 9 හි අවශ්‍යතා සමඟ සමූහයේ අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම් මම තක්සේරු කළෙමි.<br><br>විගණන ක්‍රියාපටිපාටි පහත සඳහන් දෑ අතර වේ:<br>○ ණය සහ ලැබිය යුතු දේ පිළිබඳ අපහායනය තක්සේරු කිරීම සම්බන්ධ පාලනයේ සැලසුම් ඵලදායීත්වය මම ඇගයීමට ලක්කළ අතර එයට සැලකියයුතු විනිශ්චයන් පිළිබඳ පාලනය, සමාලෝචනය සහ අනුමත කිරීමේ මට්ටම ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ කළමනාකරණය විසින් හානිකරණයට අදාළව තක්සේරු සහ උපකල්පන ඇතුළත් විය.<br>○ ගණනය කිරීම සඳහා භාවිතා කළ දත්ත, ප්‍රභව ලේඛන සහ ගිණුම්කරණ වාර්තාවන් හි සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය මම පරීක්ෂා කළෙමි.<br>○ පාදක වූ ගණනය කිරීම පරීක්ෂා කළෙමි.<br>○ ඉහත සඳහන් කරුණුවලට අමතරව, පහත සඳහන් ප්‍රධාන ක්‍රියා පටිපාටි ද ඉටුකරන ලදී.<br><br>නියැදියක් ලෙස අපහායනය සඳහා තනි තනිව තක්සේරු කළ සහ ලැබිය යුතු දෑ පිළිබඳ:<br>○ අපහායනය සිදුවී තිබේද යන්න තීරණය කිරීම සඳහා කළමනාකරණය විසින් භාවිතා කළ ප්‍රධාන නිර්ණායක තක්සේරු කිරීම. සහ<br>○ අපහායන දර්ශක පවතින අවස්ථාවලදී, නියැදි පදනමක් මත රජයේ සහන ක්‍රියාමාර්ග, වට්ටම් අනුපාත සහ දරන ලද ඇපවල වටිනාකම සලකා බලමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ ඇතුළුව කළමනාකරණයේ ඇස්තමේන්තුගත අනාගත අයකිරීම්වල සාධාරණත්වය මම ඇගයීමට ලක් කළෙමි.<br><br>අපහායනය සඳහා සාමූහිකව තක්සේරු කළ ණය සහ ලැබිය යුතු දේ සඳහා:<br>- අනාගත දත්ත සහ තොරතුරු මූලාශ්‍ර සමඟ සන්සන්දනය කරමින් කළමනාකරණයේ විවේචනාත්මක ආවරණ තුළ ඔවුන් විසින් භාවිතා කළ සාධාරණ උපකල්පන සහ ඇස්තමේන්තු සහ අනෙකුත් සාධක,<br>- COVID-19 වසංගතයේ ඇතිවිය හැකි බලපෑම් සැලකිල්ලට ගනිමින් ආවරණ තීරණය කිරීම සඳහා කළමනාකරණය විසින් භාවිතා කරන පදනම සහ දත්ත තක්සේරු කිරීම.<br>○ සටහන් 11 සහ 25 හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණවල ප්‍රමාණාත්මකභාවය මම ඇගයීමට ලක්කළෙමි. |
| ○ මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති සහ පාලනයන්<br>○ සමූහය සිය මෙහෙයුම් වලදී බහුවිධ තොරතුරු තාක්ෂණ පද්ධති භවිතා කරයි. ප්‍රධාන විගණන කාරණයක් ලෙස මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති සහ පාලනයන් පහත පරිදි මම තෝරා ගත්තෙමි:<br>○ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය එහි තොරතුරු තාක්ෂණ පද්ධති වලින් ලබාගත් තොරතුරු මත දැඩි ලෙස රඳා පවතී. සහ<br>○ බහුවිධ පද්ධති භාවිතය තුළින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන අනාවරණය කිරීම්<br>- ජනනය කරන ලද වාර්තා සහ ගණනය කිරීම්<br>○ දුරස්ථ ප්‍රවේශය තුළින් වෙනස්වන වැඩ පරිසරයක්. | වෙනත් කරුණු ඇතුළත් මගේ ක්‍රියාපටිපාටිවලට පහත දෑ ඇතුළත්ය:<br><br>○ දුරස්ථ ප්‍රවේශය වැඩිවීම සැලකිල්ලට ගෙන මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතිවල ආරක්ෂක අධීක්ෂණ ක්‍රියාපටිපාටි අවබෝධ කරගැනීම.<br>○ බහුවිධ පද්ධති වාර්තා උත්පාදනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශන අනාවරණය කිරීම් සඳහා වැදගත් තොරතුරු ගණනය කිරීමේදී අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ස්වයංක්‍රිය, තොරතුරු තාක්ෂණ මත පදනම් වූ සහ අතින් පාලනය කිරීමේ සැලසුම් සහ මෙහෙයුම් ඵලදායීතාවය අවබෝධ කරගැනීම සහ ඇගයීම.<br>○ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සඳහා සැලකිය යුතු අනාවරණයන් ජනනය කිරීම සඳහා භාවිතා කරන වාර්තාවල ප්‍රභව දත්ත පරීක්ෂා කිරීම;<br>○ පොදු ලෙජර ප්‍රතිසන්ධාන ක්‍රියාපටිපාටිවල සාධාරණත්වය තක්සේරු කිරීම, පද්ධති වාර්තා සහ අදාළ දත්ත මූලාශ්‍ර දත්ත වෙත හරස් පරීක්ෂාව ඇතුළත් වේ. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| ප්‍රධාන විගණන කරුණු | මූලික විගණන කරුණු මාගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය |
|---|---|
| ණය සහන සහ අනෙකුත් දිරි දීමනා තුළින් පොලී ආදායමට ඇති බලපෑම<br><br>COVID-19 වසංගතයේ බලපෑමට ලක්වූ පාරිභෝගිකයින්ට සමූහය විසින් ලබාදෙන ලද ණය සහන සහ වෙනත් සහන ක්‍රියාමාර්ග<br><br>ණය සහන සහ අනෙකුත් දිරි දීමනා තුළින් ණය සහ ලැබිය යුතු දෑ හි පොලී ආදායමට වූ බලපෑම ප්‍රධාන විගණන කරුණක් ලෙස:<br>○ එවැනි තාවකාලික අත්හිටුවීම් සහ වෙනත් සහන ක්‍රියාමාර්ග හේතුවෙන් ගනුදෙනුකරුවන් සමඟ සැලකියයුතු වෙනස්කිරීම් සිදුවී තිබේද නැද්ද යන්න තීරණය කිරීමේදී වැදගත් විනිශ්චයන්.<br>○ එම කාලසීමාව සඳහා හඳුනාගෙන ඇති ආදායම මත ණය සහන සහ අනෙකුත් දිරි දීමනා තුළින් බලපෑම ගණනය කිරීම සඳහා කළමනාකරණය විසින් පැතිරීම් පත්‍ර (Spread Sheet) පදනම් කරගත් ගණනය කිරීම් භාවිතා කිරීම. | වෙනත් කරුණු ඇතුළත් මගේ ක්‍රියාපටිපාටිවලට පහත දෑ ඇතුළත්ය:<br><br>○ ගනුදෙනුකරුවන්ට ලබාදී ඇති සහනකාලය සහ වෙනත් සහන ක්‍රියාමාර්ග ප්‍රදානය කිරීම, වාර්තා කිරීම සහ ගිණුම්කරණය කිරීම සඳහා සමූහය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් මා ලබා ගත්තේය.<br>○ ණය සහන සහ වෙනත් සහන ක්‍රියාමාර්ග හේතුවෙන් නියැදි පදනමක් මත ගනුදෙනුකරුවන්ගේ පහසුකම් සඳහා සැලකියයුතු වෙනස් කිරීම් සිදුවී තිබේද නැද්ද යන්න තීරණය කිරීමේදී කළමනාකාරීත්වය විසින් ගනු ලබන විනිශ්චයන්හි සාධාරණත්වය මම තක්සේරු කළෙමි. පොලී ආදායම හඳුනාගැනීම සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව වෙනස් කරන ලද පහසුකම් සඳහා පොලී ආදායම හඳුනාගෙන තිබේද යන්න ඇගයීම මෙයට ඇතුළත්ය.<br>○ පැතිරුම් පත්‍රිකා (Spread Sheet) පදනම් කරගත් ගණනය කිරීම්වල නිරවද්‍යතාව මම පරීක්ෂා කළෙමි. නියැදි පදනම් මත මූලාශ්‍ර ලේඛන සහ තාවකාලික ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිලාභවලට එකඟවීමෙන් එවැනි පැතිරුම් පත්‍ර (Spread Sheet) පදනම් කරගත් ගණනය කිරීම්වල භාවිතා වන දත්තවල සම්පූර්ණභාවය සහ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම මගේ ක්‍රියා පටිපාටිවලට ඇතුළත්ය. |

### 1.4 සමූහයේ 2021 වාර්ෂික වාර්තාවට ඇතුළත් වෙනත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට (අදාළ වන පරිදි) කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්ප නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්

○ ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාග න්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළයුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

### 2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපත්ති ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂනයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාග මේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව



ඩබ් පී සී වික්‍රමරත්න
*විගණකාධිපති*

# මූල්‍ය ප්‍රකාශනයන් - පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **මූල්‍ය වාර්තා** | | |
| | ආදායම් ප්‍රකාශය | 173 |
| | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 174 |
| | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 175 |
| | ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය | 176 |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 178 |
| **මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්** | | |
| 1. | සංස්ථාපිත සහ සමූහ තොරතුරු | 179 |
| 2. | පිළියෙල කිරීමේ පදනම සහ වෙනත් සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් | 179 |
| 3. | පොදු ගිණුම්කරණ ප්‍රමිතීන් | 182 |
| 4. | නිකුත් කරන ලද නමුත් මෙතෙක් බලාත්මක නොවන ප්‍රමිතීන් | 186 |
| **ආදායම් ප්‍රකාශය** | | |
| 5. | දළ ආදායම | 188 |
| 6. | ශුද්ධ පොලී ආදායම | 188 |
| 7. | ශුද්ධ ඉපැයුම් වාරිකය | 190 |
| 8. | ගාස්තු සහ කොමිස් ආදායම | 191 |
| 9. | මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - FVTPL | 192 |
| 10. | වෙනත් මෙහෙයුම් ආදායම | 192 |
| 11. | ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායනය සහ වෙනත් අලාභ | 193 |
| 12. | කාර්ය මණ්ඩල වියදම් | 196 |
| 13. | ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | 196 |
| 14. | ප්‍රතිලාභ, හිමිකම් පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් | 197 |
| 15. | වෙනත් මෙහෙයුම් වියදම් | 198 |
| 16. | මූල්‍ය සේවා මත බදු | 198 |
| 17. | ආදායම් බදු වියදම | 199 |
| 18. | සාමාන්‍ය කොටසකට මූලික/තනුක කොටසකට ඉපැයීම් | 202 |
| 19. | සාමාන්‍ය කොටසකට ලාභාංශ | 203 |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - වත්කම්** | | |
| 20. | මිනුම්කරණ පදනම අනුව මූල්‍ය සාධනපත්‍රයන් සම්බන්ධ විශ්ලේෂණය | 203 |
| 21. | වත්කම් සහ වගකීම් වල සාධාරණ අගය | 205 |
| 22. | මුදල් හා මුදල් සමාන දෑ | 212 |
| 23. | බැංකු සහ මූල්‍ය ආයතන වල ශේෂයන් | 213 |
| 24. | මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට | 214 |
| 25. | ණය සහ ලැබිය යුතු දේ - ක්‍රමක්ෂය පිරිවැය | 216 |
| 26. | රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ | 233 |
| 27. | මූල්‍ය වත්කම්- වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය | 234 |
| 28. | ණය සාධනපත්‍ර- ක්‍රමක්ෂය පිරිවැය | 236 |
| 29. | පරිපාලිතයන් හි ආයෝජන | 236 |
| 30. | ආයෝජන දේපල | 238 |
| 31. | වෙනත් වත්කම් | 240 |
| 32. | දේපළ, පිරියත හා උපකරණ | 241 |
| 33. | භාවිත හිමිකම් වත්කම් | 245 |
| 34. | කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් | 246 |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - වගකීම්** | | |
| 35. | බැංකු වෙත ගෙවිය යුතු | 248 |
| 36. | ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 251 |
| 37. | නිකුත් කරන ලද ණය සුරැකුම් | 252 |
| 38. | වෙනත් මූල්‍ය වගකීම් | 255 |
| 39. | රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 255 |
| 40. | කල්බදු වගකීම් | 257 |
| 41. | වර්තමාන බදු වගකීම් | 258 |
| 42. | වෙනත් වගකීම් | 259 |
| 43. | විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 259 |
| 44. | විලම්භිත බදු වගකීම්/(වත්කම්) | 262 |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ස්කන්ධ** | | |
| 45. | ප්‍රකාශිත ප්‍රාග්ධනය | 264 |
| 46. | සංස්ථාපිත සංචිත අරමුදල | 265 |
| 47. | රඳවා ගනු ලැබූ ඉපැයීම් | 266 |
| 48. | වෙනත් සම්පත් | 266 |
| 49. | පාලනය කළ නොහැකි පොලී | 268 |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | |
| 50. | මෙහෙයුම් කටයුතු ඔස්සේ ශුද්ධ මූල්‍ය සංහිඳියාවක් ඇති කිරීම | 268 |
| 51. | මෙහෙයුම් වත්කම්වල වෙනස | 269 |
| 52. | මෙහෙයුම් වගකීම්වල වෙනස් වීම | 269 |
| **වෙනත් මූල්‍යමය හෙළිදරව් කිරීම්** | | |
| 53. | අනිශ්චිත වගකීම් සහ බැඳීම් | 270 |
| 54. | සාමාන්‍ය කොටස් සඳහා වන ශුද්ධ තක්සේරුව | 271 |
| 55. | වත්මන්/වත්මන් නොවන විශ්ලේෂණය | 272 |
| 56. | කාණ්ඩ යටතේ මූල්‍ය වාර්තා කිරීම | 273 |
| 57. | පොරොන්දු වූ වත්කම් | 275 |
| 58. | අදාළ පාර්ශවයන් හෙළිදරව් කිරීම | 275 |
| 59. | අවදානම් කළමනාකරණය | 280 |
| 60. | වාර්තාකරණ කාලයට පසු සිදුවීම් | 307 |

# ආදායම් ප්‍රකාශය



| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමාගම වෙනස % | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|
| දළ ආදායම | 5 | 188 | **27,103,798** | 33,599,314 | (19.33) | **33,645,265** | 40,054,830 | (16.00) |
| පොලී ආදායම | 6.1 | 189 | **24,983,445** | 31,459,108 | (20.58) | **26,821,838** | 33,282,879 | (19.41) |
| අඩු කිරීම: පොලී වියදම | 6.2 | 189 | **13,064,310** | 15,786,586 | (17.24) | **13,375,197** | 16,110,935 | (16.98) |
| ශුද්ධ පොලී ආදායම | 6 | 188 | **11,919,135** | 15,672,522 | (23.95) | **13,446,641** | 17,171,944 | (21.69) |
| ශුද්ධ ඉපැයුම් වාරිකය | 7 | 190 | **-** | - | - | **5,028,549** | 5,202,030 | (3.33) |
| ගාස්තු හා කොමිස් ආදායම | 8 | 191 | **1,818,675** | 1,694,014 | 7.36 | **1,198,054** | 1,165,632 | 2.78 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය) - FVTPL | 9 | 192 | **162,616** | 11,017 | 1,376.05 | **228,258** | 19,586 | 1,065.41 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 10 | 192 | **139,062** | 435,175 | (68.04) | **368,566** | 384,703 | (4.19) |
| මුළු මෙහෙයුම් ආදායම | | | **14,039,488** | 17,812,728 | (21.18) | **20,270,068** | 23,943,895 | (15.34) |
| අඩු කිරීම:ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායනය සහ වෙනත් අලාභ | 11 | 193 | **1,043,837** | 4,646,683 | (77.54) | **1,352,489** | 4,901,902 | (72.41) |
| භාවිත හිමිකම් වත්කම් සඳහා අපහායනයු | 33 | 245 | **-** | 36,965 | (100.00) | **-** | 36,965 | (100.00) |
| කීර්තිනාමය සඳහා අපහායනය | 34 | 246 | **99,209** | 68,145 | 45.59 | **99,209** | 68,145 | 45.59 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | | | **12,896,442** | 13,060,935 | (1.26) | **18,818,370** | 18,936,883 | (0.63) |
| අඩුකිරීම: වියදම | | | | | | | | |
| කාර්ය මණ්ඩල වියදම් | 12 | 196 | **3,465,373** | 3,701,385 | (6.38) | **4,354,636** | 4,561,026 | (4.53) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | 13 | 196 | **722,994** | 717,021 | 0.83 | **647,693** | 635,998 | 1.84 |
| ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් | 14 | 197 | **-** | - | - | **2,663,347** | 3,441,937 | (22.62) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 15 | 198 | **1,612,859** | 2,088,244 | (22.76) | **2,048,058** | 2,565,073 | (20.16) |
| මුළු මෙහෙයුම් වියදම් | | | **5,801,226** | 6,506,650 | (10.84) | **9,713,734** | 11,204,034 | (13.30) |
| මූල්‍ය සේවා මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය | | | **7,095,216** | 6,554,285 | 8.25 | **9,104,636** | 7,732,849 | 17.74 |
| අඩු කිරීම: මූල්‍ය සේවා මත බදු | 16 | 198 | **1,222,628** | 2,002,460 | (38.94) | **1,273,966** | 2,030,532 | (37.26) |
| අදායම් බදු වියදමට පෙර ලාභය | | | **5,872,588** | 4,551,825 | 29.02 | **7,830,670** | 5,702,317 | 37.32 |
| අඩු කිරීම: ආදායම් බදු වියදම | 17 | 199 | **1,839,568** | 1,609,317 | 14.31 | **2,234,336** | 2,110,568 | 5.86 |
| වසර සඳහා ලාභය | | | **4,033,020** | 2,942,508 | 37.06 | **5,596,334** | 3,591,749 | 55.81 |
| ලාභය බෙදී යන ආකාරය | | | | | | | | |
| සමාගමෙහි ස්කන්ධ හිමිකරුවන් | | | **4,033,020** | 2,942,508 | 37.06 | **5,294,015** | 3,408,670 | 55.31 |
| පාලනයට යටත් නොවන හිමිකම් | 49 | 268 | **-** | - | - | **302,319** | 183,079 | 65.13 |
| වසර සඳහා ලාභය | | | **4,033,020** | 2,942,508 | 37.06 | **5,596,334** | 3,591,749 | 55.81 |
| සාමාන්‍ය කොටසකට මූලික/තනුක ඉපැයුම් (රු.) | 18 | 202 | **2.37** | 1.73 | 36.99 | **3.11** | 2.00 | 55.50 |
| සාමාන්‍ය කොටසකට ලාභාංශ (රු.) | 19 | 203 | **0.60** | 1.20 | (49.88) | | | |

පිටු අංක 179 සිට 307 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමාගම වෙනස % | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|
| වසර සඳහා ලාභය | | | **4,033,020** | 2,942,508 | 37.06 | **5,596,334** | 3,591,749 | 55.81 |
| **වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු** | | | | | | | | |
| **ඵළඹෙන වසර වලදී ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කිරීමට නියමිත අයිතම (බදු පසු):** | | | | | | | | |
| විදේශ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශයන් පරිවර්තනයෙන් උද්ගත වන ශුද්ධ ලාභ/(අලාභ) | 48.4 | 267 | - | - | - | **141,728** | 139,129 | 1.87 |
| ඵළඹෙන වසර වලදී ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කිරීමට නියමිත ශුද්ධ අයිතම | | | - | - | - | **141,728** | 139,129 | 1.87 |
| **ඵළඹෙන වසර වලදී ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කිරීමට නියමිත නොවන අයිතම (බදු පසු):** | | | | | | | | |
| **නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම් මත ශුද්ධ ආයුගණන ලාභ/(අලාභ)** | | | | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත ශුද්ධ ආයුගණන ලාභ/(අලාභ) | 43.2 | 260 | **107,003** | 172 | 62,111.05 | **106,891** | 1,225 | 8,625.80 |
| ආයුගණන ලාභ සහ අලාභ මත විලම්බිත බදු වගකීම | 44.1 | 263 | **(29,961)** | (49) | (61,044.90) | **(27,690)** | (91) | (30,328.57) |
| **මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට** | | | | | | | | |
| ප්‍රතිමිනුම්කරණය මත ලාභ/(අලාභ) | 48.3 | 267 | **(15,263)** | (49,372) | 69.09 | **(5,512)** | (61,300) | 91.01 |
| ඵළඹෙන වසර වලදී ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කිරීමට නියමිත නොවන ශුද්ධ අයිතම | | | **61,779** | (49,249) | 225.44 | **73,689** | (60,166) | 222.48 |
| වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු | | | **61,779** | (49,249) | 225.44 | **215,417** | 78,963 | 172.81 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | **4,094,799** | 2,893,259 | 41.53 | **5,811,751** | 3,670,712 | 58.33 |
| **බෙදී යන ආකාරය:** | | | | | | | | |
| සමාගමෙහි ස්කන්ධ හිමිකරුවන් වෙත | | | **61,779** | (49,249) | 225.44 | **212,979** | 82,278 | 158.85 |
| පාලනයට යටත් නොවන හිමිකම වෙත | 49 | 268 | - | - | - | **2,438** | (3,315) | 173.54 |
| වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම, බදු වලින් ශුද්ධව | | | **61,779** | (49,249) | 225.44 | **215,417** | 78,963 | 172.81 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | **4,094,799** | 2,893,259 | 41.53 | **5,811,751** | 3,670,712 | 58.33 |

පිටු අංක 179 සිට 307 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමාගම වෙනස % | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 212 | **2,703,031** | 7,164,139 | (62.27) | **3,844,694** | 7,693,032 | (50.02) |
| බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ශේෂයන් | 23 | 213 | **5,399,071** | 3,207,440 | 68.33 | **8,231,101** | 6,661,407 | 23.56 |
| මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට | 24 | 214 | **109,787** | 1,031,719 | (89.36) | **1,281,753** | 1,198,592 | 6.94 |
| ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය | 25 | 216 | **141,387,907** | 147,747,511 | (4.30) | **149,342,332** | 154,134,934 | (3.11) |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ | 26 | 233 | **-** | - | - | **1,024,461** | 1,194,933 | (14.27) |
| මූල්‍ය වත්කම් වෙන්ත විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 27 | 234 | **309,118** | 324,381 | (4.71) | **735,494** | 1,455,702 | (49.47) |
| ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය | 28 | 236 | **6,994,206** | 4,106,963 | 70.30 | **8,593,386** | 4,813,439 | 78.53 |
| පරිපාලිතයන්හි ආයෝජන | 29 | 236 | **3,213,788** | 3,213,788 | - | **-** | - | - |
| ආයෝජන දේපළ | 30 | 238 | **-** | - | - | **820,664** | 1,131,652 | (27.48) |
| වෙනත් වත්කම් | 31 | 240 | **575,220** | 1,147,001 | (49.85) | **932,018** | 1,235,329 | (24.55) |
| දේපළ, පිරියත හා උපකරණ | 32 | 241 | **1,049,250** | 1,143,929 | (8.28) | **4,034,265** | 3,998,370 | 0.90 |
| භාවිත හිමිකම් වත්කම් | 33 | 245 | **2,242,444** | 1,939,450 | 15.62 | **1,591,297** | 1,639,482 | (2.94) |
| විලම්බිත බදු වත්කම් | 44 | 262 | **415,841** | 376,291 | 10.51 | **594,495** | 471,841 | 25.99 |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 34 | 246 | **146,446** | 257,581 | (43.15) | **265,506** | 368,574 | (27.96) |
| **මුළු වත්කම්** | | | **164,546,109** | 171,660,193 | (4.14) | **181,291,466** | 185,997,287 | (2.53) |
| **වගකීම්** | | | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 35 | 248 | **6,439,310** | 7,938,185 | (18.88) | **9,003,873** | 10,978,046 | (17.98) |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 36 | 251 | **101,502,931** | 106,701,027 | (4.87) | **103,743,716** | 107,685,592 | (3.66) |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | 37 | 252 | **13,825,553** | 18,479,260 | (25.18) | **13,684,516** | 18,338,039 | (25.38) |
| වෙනත් මූල්‍ය වගකීම් | 38 | 255 | **4,131,671** | 3,014,117 | 37.08 | **4,110,795** | 2,829,708 | 45.27 |
| රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 39 | 255 | **-** | - | - | **5,015,885** | 5,065,220 | (0.97) |
| කල්බදු වගකීම් | 40 | 257 | **2,286,386** | 1,909,098 | 19.76 | **1,614,660** | 1,594,245 | 1.28 |
| ප්‍රවර්තන බදු වගකීම් | 41 | 258 | **362,450** | 1,803,309 | (79.90) | **883,900** | 2,077,418 | (57.45) |
| වෙනත් වගකීම් | 42 | 259 | **1,069,120** | 975,694 | 9.58 | **1,156,822** | 1,052,756 | 9.89 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 43 | 259 | **587,257** | 592,871 | (0.95) | **657,778** | 647,929 | 1.52 |
| විලම්බිත බදු වගකීම් | 44 | 262 | **-** | - | - | **297,568** | 418,132 | (28.83) |
| **මුළු වගකීම්** | | | **130,204,678** | 141,413,561 | (7.93) | **140,169,513** | 150,687,085 | (6.98) |
| **ස්කන්ධ** | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 45 | 264 | **14,892,036** | 13,915,414 | 7.02 | **14,892,036** | 13,915,414 | 7.02 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 46 | 265 | **2,406,995** | 2,205,344 | 9.14 | **2,464,951** | 2,235,077 | 10.28 |
| රඳවාගත් ඉපැයුම් | 47 | 266 | **17,159,777** | 14,227,988 | 20.61 | **20,682,106** | 16,517,824 | 25.21 |
| වෙනත් සංචිත | 48 | 266 | **(117,377)** | (102,114) | 14.95 | **421,319** | 285,103 | 47.78 |
| **සමාගමෙහි කොටස් හිමිකරුවන් වෙත ආරෝපනය කල යුතු මුළු ස්කන්ධ** | | | **34,341,431** | 30,246,632 | 13.54 | **38,460,412** | 32,953,418 | 16.71 |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතිය | 49 | 268 | **-** | - | - | **2,661,541** | 2,356,784 | 12.93 |
| **මුළු ස්කන්ධ** | | | **34,341,431** | 30,246,632 | 13.54 | **41,121,953** | 35,310,202 | 16.46 |
| **මුළු වගකීම් සහ ස්කන්ධ** | | | **164,546,109** | 171,660,193 | (4.14) | **181,291,466** | 185,997,287 | (2.53) |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | 53 | 270 | **10,998,111** | 5,316,892 | 106.85 | **11,045,100** | 5,350,615 | 106.43 |
| **සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු.)** | 54 | 271 | **20.15** | 18.58 | 8.42 | **22.56** | 20.25 | 11.45 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කරන ලද බව අපි සහතික කරමු.

**ඔමල් සුමනසිරි**
*ප්‍රධාන කළමනාකරු - මූල්‍ය*

**ෂමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී*

මෙම මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී:

**සුජීව රාජපක්ෂ**
*සභාපති*

**රොහාන් පතිරගේ**
*අධ්‍යක්ෂ*

පිටු අංක 179 සිට 307 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

2021 ජූනි 4
කොළඹ

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| සමාගම | | | වෙනත් සංචිත | | |
|---|---|---|---|---|---|
| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | සාධාරණ අගය සංචිතය | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධ |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2019 අප්‍රේල් 1 දිනට ශේෂය | 13,236,073 | 2,058,219 | (52,742) | 13,361,805 | 28,603,355 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | | |
| වසර සඳහා ලාභය | - | - | - | 2,942,508 | 2,942,508 |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු) | - | - | (49,372) | 123 | (49,249) |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (49,372) | 2,942,631 | 2,893,259 |
| ස්කන්ධ තුළ සෘජුව හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු | | | | | |
| සංචිත වෙත මාරු කිරීම් | - | 147,125 | - | (147,125) | - |
| ගෙවන ලද ලාභාංශ - අන්තර්මධ්‍ය | - | - | - | (1,139,392) | (1,139,392) |
| - අවසාන | 679,341 | - | - | (789,931) | (110,590) |
| ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු | 679,341 | 147,125 | - | (2,076,448) | (1,249,982) |
| 2020 මාර්තු 31 දිනට ශේෂය | 13,915,414 | 2,205,344 | (102,114) | 14,227,988 | 30,246,632 |
| 2020 අප්‍රේල් 1 දිනට ශේෂය | 13,915,414 | 2,205,344 | (102,114) | 14,227,988 | 30,246,632 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | | |
| වසර සඳහා ලාභය | - | - | - | 4,033,020 | 4,033,020 |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු) | - | - | (15,263) | 77,042 | 61,779 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (15,263) | 4,110,062 | 4,094,799 |
| ස්කන්ධ තුළ සෘජුව හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු | | | | | |
| සංචිත වෙත මාරු කිරීම් | - | 201,651 | - | (201,651) | - |
| ගෙවන ලද ලාභාංශ - අන්තර්මධ්‍ය | 976,622 | - | - | (976,622) | - |
| ස්කන්ධ හිමියම් සමග මුළු ගනුදෙනු | **976,622** | **201,651** | **-** | **(1,178,273)** | **-** |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 14,892,036 | 2,406,995 | (117,377) | 17,159,777 | 34,341,431 |

පිටු අංක 179 සිට 307 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

| සමූහය | | | වෙනත් සංචිත | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | සාධාරණ අගය සංචිතය | විදේශ මුදල් පරිවර්තන සංචිතය | රඳවාගත් ඉපැයුම් | එකතුව | පාලනයට ප්‍රමාණවත් නොවන අයිතිය | මුළු ස්කන්ධ |
| | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 |
| 2019 අප්‍රේල් 1 දිනට ශේෂය | 13,236,073 | 2,070,667 | (54,705) | 261,979 | 15,198,424 | 30,712,438 | 2,269,520 | 32,981,958 |
| ප්‍රාග්ධන ලාභ බදු | - | - | - | - | 14 | 14 | - | 14 |
| ප්‍රාග්ධන බදු වලට පසු ශේෂය | 13,236,073 | 2,070,667 | (54,705) | 261,979 | 15,198,438 | 30,712,452 | 2,269,520 | 32,981,972 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | | | | | |
| වසර සඳහා ලාභය | - | - | - | - | 3,408,670 | 3,408,670 | 183,079 | 3,591,749 |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු) | - | - | (61,300) | 139,129 | 4,449 | 82,278 | (3,315) | 78,963 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (61,300) | 139,129 | 3,413,119 | 3,490,948 | 179,764 | 3,670,712 |
| ස්කන්ධ තුළ සෘජුව හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු | | | | | | | | |
| සංචිත වෙත මාරු කිරීම් | - | 164,410 | - | - | (164,410) | - | - | - |
| ගෙවන ලද ලාභාංශ - අන්තර්මධ්‍ය | - | - | - | - | (1,139,392) | (1,139,392) | (92,500) | (1,231,892) |
| - අවසන් | 679,341 | - | - | - | (789,931) | (110,590) | - | (110,590) |
| ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු | 679,341 | 164,410 | - | - | (2,093,733) | (1,249,982) | (92,500) | (1,342,482) |
| 2020 මාර්තු 31 දිනට ශේෂය | 13,915,414 | 2,235,077 | (116,005) | 401,108 | 16,517,824 | 32,953,418 | 2,356,784 | 35,310,202 |
| 2020 අප්‍රේල් 1 දිනට ශේෂය | 13,915,414 | 2,235,077 | (116,005) | 401,108 | 16,517,824 | 32,953,418 | 2,356,784 | 35,310,202 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | | | | | |
| වසර සඳහා ලාභය | - | - | - | - | 5,294,015 | 5,294,015 | 302,319 | 5,596,334 |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු) | - | - | (5,512) | 141,728 | 76,763 | 212,979 | 2,438 | 215,417 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | **-** | **-** | **(5,512)** | **141,728** | **5,370,778** | **5,506,994** | **304,757** | **5,811,751** |
| ස්කන්ධ තුළ සෘජුව හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු | | | | | | | | |
| සංචිත වෙත මාරු කිරීම් | - | 229,875 | - | - | (229,875) | - | - | - |
| ගෙවන ලද ලාභාංශ - අන්තර්මධ්‍ය | 976,622 | - | - | - | (976,622) | - | - | - |
| ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු | 976,622 | 229,875 | - | - | (1,206,497) | - | - | - |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 14,892,036 | 2,464,952 | (121,517) | 542,836 | 20,682,105 | 38,460,412 | 2,661,541 | 41,121,953 |

පිටු අංක 179 සිට 307 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත්තේ මෙහෙයුම් ක්‍රියාකාරකම්, ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් වෙන වෙනම හඳුනාගනු ලබන, 'මුදල් ප්‍රවාහ ප්‍රකාශය' සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 7 ට අනුකූලව 'සෘජු ක්‍රමවේදය' භාවිත කරමිනි. මුදල් හා මුදල් සමාන දෑ කෙටිකාලීන, සහ ඕනෑම අවස්ථාවක දන්නා මුදල් වටිනාකම් බවට හරවාගත හැකි ඉහළ ද්‍රවශීලතාවකින් යුතු ආයෝජනයන්ගෙන් සමන්විත වන අතර, ඒවා වටිනාකම වෙනස්වීම පිළිබඳ සැළකිය යුතු අවදානමකට භාජනය නොවේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | | 2021 | 2020 | 2021 | 2020 |
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ වලින් ආදායම | 6.1 | 189 | **73,753** | 40,471 | **103,501** | 70,219 |
| ණය සහ ලැබිය යුතු දෑ වෙත ගෙවීම් | | | **(47,647,269)** | (57,215,121) | **(50,862,600)** | (60,513,293) |
| ණය සහ ලැබිය යුතු දෑ වෙතින් ලැබීම් | | | **78,976,592** | 88,503,718 | **81,166,978** | 91,218,876 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ආයෝජන | | | **(24,145,286)** | (5,345,867) | **(26,225,019)** | (7,914,687) |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ශේෂයන්ගෙන් ලැබීම් | | | **22,294,433** | 5,928,374 | **25,405,664** | 9,558,349 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධනපත්‍ර වල ආයෝජන | | | **(22,598,347)** | (13,139,128) | **(23,741,050)** | (13,845,604) |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධනපත්‍ර වලින් ලැබීම් | | | **20,089,756** | 17,787,435 | **20,339,756** | 17,787,435 |
| ගනුදෙනුකරුවන් වෙත සිදුකල යුතු ගෙවීම් | | | **(99,054,813)** | (108,586,490) | **(97,571,015)** | (106,951,511) |
| ගනුදෙනුකරුවන් වෙතින් ලැබීම් | | | **83,652,942** | 115,741,329 | **83,337,190** | 115,392,706 |
| වෙනත් ආදයම් වෙතින් ලැබීම් | | | **1,711** | 5,598 | **216,256** | 270,654 |
| මූල්‍ය වත්කම් වල ආයෝජන - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට | | | **(8,881,716)** | (1,752,531) | **(10,028,730)** | (1,752,531) |
| මූල්‍ය වත්කම් වලින් ආදායම - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට | | | **9,966,264** | 755,019 | **10,173,826** | 645,911 |
| මූල්‍ය වත්කම් වලින් ලැබීම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | | | **-** | - | **979,028** | (67,226) |
| මූල්‍ය වත්කම් වල ආයෝජන - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | | | **-** | - | **(264,333)** | - |
| පුද්ගල වියදම් සඳහා ගෙවීම | | | **(3,575,458)** | (3,589,152) | **(4,377,522)** | (4,440,214) |
| කල්බදු වගකීම් සඳහා ගෙවීම | 40 | 257 | **(655,969)** | (616,740) | **(409,587)** | (343,968) |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ගෙවීම | | | **(872,388)** | (3,819,688) | **(885,891)** | (4,623,040) |
| ගනුදෙනුකරුවන් වෙතින් ලද වාරික | | | **-** | - | **5,199,021** | 4,892,492 |
| ගෙවන ලද හිමිකම්පෑම් | | | **-** | - | **(2,712,682)** | (3,257,590) |
| ගෙවන ලද පාරිතෝෂික | 43 | 259 | **(10,353)** | (10,726) | **(13,148)** | (12,103) |
| ගෙවන ලද ආදායම් බදු | 41.1 | 258 | **(3,349,938)** | (3,071,709) | **(3,534,648)** | (3,339,472) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල් | 50 | 268 | **4,263,914** | 31,614,791 | **6,294,995** | 32,775,403 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | 32 | 241 | **(104,690)** | (213,928) | **(152,324)** | (284,215) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | | | **54,832** | 9,976 | **210,359** | 17,612 |
| අස්පෘශ්‍ය වත්කම් මිළදී ගැනීම | 34 | 246 | **(360)** | (15,120) | **(11,661)** | (15,120) |
| අයෝජන වලින් ලද ලාභාංශ | | | **110,673** | 113,091 | **918** | 17,280 |
| ආයෝජන ක්‍රියාකාරකම් වල (යොදවන ලද)/වලින් උත්පාදිත ශුද්ධ මුදල් | | | **60,455** | (105,981) | **47,292** | (264,443) |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | | | | | |
| බැංකු වෙත සිදුකල යුතු ගෙවීම් | 35.1 | 248 | **(3,886,355)** | (34,046,652) | **(5,315,691)** | (35,209,177) |
| බැංකු වලින් ණය ලබාගැනීම් | 35.1 | 248 | **1,000,000** | 12,950,000 | **1,500,000** | 12,950,000 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් සඳහා ගෙවීම | 37.1 | 252 | **(6,589,468)** | (5,076,951) | **(6,570,514)** | (5,060,941) |
| කොටස් හිමිකරුවන් වෙත ගෙවන ලද ලාභාංශ | | | **(1,345)** | (1,136,732) | **(1,345)** | (1,136,732) |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතිය වෙත ගෙවන ලද ලාභාංශ | | | **-** | - | **-** | (92,500) |
| මූල්‍යකරණ ක්‍රියාකාරකම් (වල යොදවන ලද) වලින් ශුද්ධ මුදල් | | | **(9,477,168)** | (27,310,335) | **(10,387,550)** | (28,549,350) |
| මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම | | | **(5,152,799)** | 4,198,475 | **(4,045,263)** | 3,961,610 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | | | **7,139,456** | 2,940,981 | **6,998,078** | 3,036,468 |
| වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | | | **1,986,657** | 7,139,456 | **2,952,815** | 6,998,078 |
| මුදල් සහ මුදල් සමාන දෑ | | | **2,703,031** | 7,164,139 | **3,844,694** | 7,693,032 |
| බැංකු අයිරාව | | | **(716,374)** | (24,683) | **(891,879)** | (694,954) |
| වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | | | **1,986,657** | 7,139,456 | **2,952,815** | 6,998,078 |

පිටු අංක 179 සිට 307 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්



1. සංස්ථාපිත සහ සමූහ තොරතුරු

1.1 සංස්ථාපිත තොරතුරු

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී යනු ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ ස්ථිර පදිංචිය සහිත පොදු සීමාසහිත සමාගමකි. සමාගමෙහි සාමාන්‍ය කොටස් කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත කොට ඇත. සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත.

සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 08, මරදාන පාර, අංක 1161 දරණ ස්ථානයේ පිහිටා ඇත.

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්**

2021 මාර්තු31 දින අවසන් වූ වසර සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (මව් සමාගම), එහි පරිපාලිතයන්ගෙන් (එක්ව 'සමූහය' වශයෙන් හැඳින්වෙන) සමන්විත වේ.

**මව් සමාගම සහ පරම මව් සමාගම**

සමාගමෙහි මව් සමාගම වනුයේ ශ්‍රී ලංකා රජයේ හිමිකාරීත්වය සහිත මහජන බැංකුව වේ.

**සේවක සංඛ්‍යාව**

2021 මාර්තු 31 දිනට සමාගමෙහි සහ සමූහයෙහි සේවක පිරිස් බලය පිළිවෙලින් 2,343 ක් සහ 3,304 ක් විය. (2020 මාර්තු 31 දිනට 2,401ක් සහ 3,304).

1.2 සමූහය පිළිබඳ තොරතුරු

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය**

**සමාගම**

***පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී***

ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ මූල්‍ය කල්බදු ලබාදීම, කුලී පිට ගැනුම් වත්කම් මූල්‍යකරණය, කාලසීමා ණය, ඉස්ලාමීය මූල්‍යකරණය, ආන්තික වෙළඳාම, කොටස් ව්‍යාපාර, ණය සාධනපත්‍ර නිකුත් කිරීම, සාධකකරණය, රන් ණය ලබාදීම සහ මහජන තැන්පතු ජංගමකරණය වේ.

**පරිපාලිතයන්**

| පරිපාලිතයන්හි නම | ප්‍රධාන ක්‍රියාකාරකම් | සංස්ථාපිත රට | % ස්කන්ධ | |
|---|---|---|---|---|
| | | | 2021 | 2020 |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | මෝටර් රථ සමූහ කළමනාකරණය, රථවාහන තක්සේරුකරණය, රථවාහන අලෙවිය සහ රථවාහන අළුත්වැඩියාව | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | මිශ්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | රක්ෂණ ව්‍යාපාර කටයුතු සිදුකිරීම | ශ්‍රී ලංකාව | 75% | 75% |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම සහ මෙහෙයවීම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමිටඩ් | අඩු ආදායම්ලාභීන් වෙත සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙත බැංකු නොවන මූල්‍ය සේවා සැපයීම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| ලංකන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් | නිශ්චල හා චංචල දේපළ වෙත කල්බදු ලබාදීම සහ ණය ලබාදීම | බංග්ලාදේශය | 51% | 51% |

විමර්ශනයට ලක් වන වසර තුළදී සමාගමෙහි සහ සමූහයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කිසිදු සැළකිය යුතු වෙනසක් සිදුනොවීය.

2. පිළියෙල කිරීමේ පදනම සහ වෙනත් සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන්

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනත, 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 43 දරණ රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනත හා පසුකාලීනව එය වෙත කෙරුනු සංශෝධනයන්ගේ අවශ්‍යතාවයන්ට සහ කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගතවීමේ නීතිරීති වලට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත. මෙම මූල්‍ය ප්‍රකාශයන්, මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු හැර, පහත දැක්වෙන ගිණුම්කරණ උපචිත පදනම අනුව පිළියෙල කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 'www.casrilanka.com / www.slaasc.lk' වෙබ් අඩවියෙහි පවතී.

සමූහය මගින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ පාලනය සම්බන්ධ SLFRS සහ LKAS ප්‍රමිතීන් සහ රෙගුලාසි වලට අනුකූල නොවන, කිසිදු ගිණුම්කරණ ක්‍රමවේදයක් භාවිත නොකරන ලදී.

වසර තුළ අනුගමනය කරන ලද සමූහයේ පොදු ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ තොරතුරු පිටු අංක 182 හි සටහන 3 හි දැක්වේ.

2.2 මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි වගකීම් සහගතබව

2007 අංක 07 දරණ සමාගම් පනත සහ SLFRS සහ LKAS ප්‍රමිතීන් අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.

"සමාගමෙහි කටයුතු සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව" සහ "මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි මෙම මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහතික කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම භාරගනී.

මෙම මූල්‍ය ප්‍රකාශයන් පහත සඳහන් සංරචකයන්ගෙන් සමන්විත වේ:

- විමර්ශනයට ලක්වන වසර තුළ සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ විස්තර සපයනු ලබන ආදායම් ප්‍රකාශයක් සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයක්;
- වසර අවසානය වන විට සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය තත්ත්වය සම්බන්ධ විස්තර සපයනු ලබන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක්;
- විමර්ශනයට ලක්වන වසර තුළ සමාගමෙහි සහ සමූහයෙහි කොටස් හිමිකරුවන්ගේ ස්කන්ධ සම්බන්ධ සියළුම වෙනස්වීම් විදහා දක්වනු ලබන ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයක්;
- පරිශීලනය කරන්නන් හට මුදල් සහ මුදල් සමාන දෑ උත්පාදනය කිරීම සඳහා සමාගම සහ සමූහය සතු හැකියාව සහ අදාළ මුදල් ප්‍රවාහයන් භාවිත කිරීම සඳහා ආයතනයන්හි අවශ්‍යතාවයන් පිළිබඳ විස්තර සපයනු ලබන මුදල් ප්‍රවාහ ප්‍රකාශයක්,
- ගිණුම්කරණ ප්‍රමිතීන් සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශයන් ආශ්‍රිත සටහන්.

### 2.3 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශයන් සඳහා අනුමැතිය ලබාදීම

2021 ජූනි 4 වැනි දින සිදුකරන ලද අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකට අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා (සන්සන්දනයන්ද ඇතුළුව) සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් අනුමත කිරීම සහ නිකුත් කිරීම සඳහා අවසර ලබාදීම 2021 ජූනි 4 වැනි දින සිදුකෙරිණි.

### 2.4 මිනුම්කරණ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් පහත දක්වෙන ප්‍රමාණාත්මක අයිතම හැරුනුවිට සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය:

| අයිතමය | මිනුම්කරණ පදනම | සටහන් අංකය |
|---|---|---|
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් | සාධාරණ අගය | 24 |
| වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මනින ලද මූල්‍ය වත්කම් | සාධාරණ අගය | 27 |
| ආයෝජන දේපළ | සාධාරණ අගය | 30 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම | විශ්‍රාම ප්‍රතිලාභ බැදීමෙහි ප්‍රවර්තන වටිනාකම සහ ආයුගණන ලාභ සහ අලාභ වශයෙන් වගකීම හඳුනාගැනේ. | 43 |

### 2.5 මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් වත්කම් හා වගකීම් ස්වභාවය අනුව කාණ්ඩගත කොට ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතා සහ කල්පිරීමේ විලාශය පිළිබිඹු වන පරිදි අනුපිළිවෙලින් ලැයිස්තුගත කෙරිණි. වාර්තාකරණ දිනයෙන් පසු (ප්‍රවර්තන) මාස 12 ක් ඇතුළත සහ වාර්තාකරණ දිනයෙන් පසු (ප්‍රවර්තන නොවන) මාස 12 කට පසු අයකරගැනීමේ හෝ පියවීමේ කාලසීමාව පිළිබඳ සමාලෝචනයක් පිටු අංක 272 හි සටහන 55 (ප්‍රවර්තන සහ ප්‍රවර්තන නොවන විමර්ශනය) යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇත. මූල්‍ය ප්‍රකාශයන් සඳහා බලපාන්නා වූ උද්ධමනකාරී සාධක සඳහා ගැලපුම් කිසිවක් සිදු කොට නොමැත.

### 2.6 හිලව් කිරීම

හඳුනාගත් මුදල් ප්‍රමාණයන් හිලව් කිරීම සම්බන්ධ නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට අදහස් කරන අවස්ථාවකදී, හෝ වත්කම් උපලබ්ධි කොට ඒ හා සමගාමීව වගකීම පියවනු ලබන අවස්ථාවකදී පමණක්, මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් හිලව් කිරීමෙන් අනතුරුව ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ. සමූහයෙහි කවර හෝ ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ අර්ථ දැක්වීමකින් අවශ්‍යතාවයක් හෝ අනුමැතියක් පවතින අවස්ථාවකදී හැරුනු විට, සහ සමාගමෙහි ගිණුම්කරණ ප්‍රමිතීන්හි විශේෂිතව දක්වනු ලැබ ඇති පරිදි ආදායම් හා වියදම් ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය තුළ හිලව් කිරීමක් සිදුනොවේ.

### 2.7 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශයන් සමූහයෙහි ව්‍යවහාරික මුදල් ඒකකය (සමූහ ක්‍රියාකාරී මුදල් ඒකකය) වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඉදිරිපත් කරනු ලැබ ඇත.

### 2.8 වැටයීම

වෙනත් අයුරකින් දක්වා නොමැති නම් හැර, මූල්‍ය ප්‍රකාශයන්හි අගයයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 ''මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම'' මගින් අනුමත කොට ඇති පරිදි ආසන්නතම රුපියලට වටයනු ලැබ ඇත.

### 2.9 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 ''මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම'' අනුව සමාන අයිතමයන්හි එක් එක් ප්‍රමාණාත්මක වර්ගය වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හා කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලැබ ඇත.

### 2.10 සැළකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

SLFRS සහ LKAS ගිණුම්කරණ ප්‍රමිතීන් කෙරෙහි අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී කළමනාකාරීත්වය විසින් ගිණුම්කරණ ප්‍රමිතීන් ආදේශ කිරීම සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගනු ලැබ ඇත. තවද, වාර්තා කරනු ලබන දින වන විට මීළඟ මූල්‍ය වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම් වල ධාරණ අගයයන් කෙරෙහි ප්‍රමාණාත්මක ගැළපුම් සිදුකිරීමට හේතුවන ආකාරයේ අනාගත හා වෙනත් ප්‍රධාන අස්ථාරභාව ඇස්තමේන්තුගත කිරීමේ මූලයන් සම්බන්ධයෙන් ද මූලික උපකල්පනයන් සිදුකිරීම කෙරෙහි කළමනාකාරීත්වය විසින් අවධානය යොමුකිරීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස්වීමේ හැකියාව පවතී.

ඇස්තමේන්තු හා ඒවාට පාදක වූ පාදක වූ උපකල්පන නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්මේන්තු වලට අදාළ ප්‍රතිශෝධන ඇස්තමේන්තු ප්‍රතිශෝධිත කාලසීමාව තුළදී හා බලපෑමට ලක් වන කවර හෝ ඉදිරි කාලසීමාවන් හිදී හඳුනාගැනේ.

අස්ථාවරභාවය ආශ්‍රිත ප්‍රධාන සැළකිය යුතු මට්ටමේ ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් පහත සාකච්ඡාවට භාජනය කෙරෙන අතර, එබඳු වත්කම් හා වගකීම් සම්බන්ධ අදාළ ධාරණ අගයයන් ආශ්‍රිත සටහන් වල දක්වනු ලැබ ඇත.

#### 2.9.1 අඛණ්ඩ පැවැත්ම

ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමූහය සතු හැකියාව සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තක්සේරුවක් සිදු කරනු ලැබ ඇති අතර, කල්තබා දැකිය හැකි අනාගතය තුළ අඛණ්ඩව පැවතීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත්ව සිටී. තවද, ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් සුරක්ෂිතව පැවැත්ම සඳහා බැංකුව සතු හැකියාව සම්බන්ධයෙන් සැළකිය යුතු සැකයක් ඉපදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරීත්වය

දැනුවත්ව නොසිටී. එමනිසා අඛණ්ඩවම මූල්‍ය ප්‍රකාශ සැකසීම අඛණ්ඩ පැවැත්ම යන පදනම මත සිදු කෙරේ.

2021 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේ පදනම නිර්ණය කිරීමේදී අඛණ්ඩ පැවැත්ම සැළකිල්ලට ගැනීමේදී, පවතින තොරතුරු මත පදනම්ව, කළමනාකාරීත්වය විසින් සමූහයේ සමාගම් වෙත කෝවිඩ් 19 හි පවතින සහ අපේක්ෂිත බලපෑම් සහ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය ඇගයුමට ලක් කරන ලදී.

සමූහය විසින් අපේක්ෂිත පිරිවැය කළමනාකරණය, ලාභදායිත්වය, අත්‍යාවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් විලම්බන හැකියාව, භාවිත නොකරන ලද ණය ප්‍රවාහ වැනි පුළුල් පරාසයක පැතිරුනු බහුවිධ ආතති පරීක්ෂා තත්ත්වයන් රැසක් සැළකිල්ලට ගනිමින් සිදුවිය හැකි බලපෑම හමුවේ සේවා සැපයීමේ සහ ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව ඇගයුමට ලක් කරන ලදී. සමූහ සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සමූහයේ එක් එක් ක්ෂේත්‍රයෙහි ස්වභාවය පිළිබඳව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සහ ඉහත කරුණු කළමනාකාරීත්වය විසින් ඇගයුමට ලක් කිරීමෙන් පසු, සහ ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳව නිසි පරිදි සැළකිල්ලට ගනිමින්, අනාවැකි පළ කල හැකි අනාගත කාලයක් සඳහා මෙහෙයුම් ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් සමාගම සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වෙමින් ඉදිරියටත් මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම ආදේශ කරගැනීමට තීරණය කෙරිණි.

මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය
SLFRS 9 අනුව, සමූහයේ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් මගින්, පහත දැක්වෙන ක්‍රියාපටිපාටිය යටතේ මූල්‍ය වත්කම් වර්ගීකරණය කොට පසුව ඒවා නම් වශයෙන් ක්‍රමක්ෂය පිරිවැය අනුව, වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට, ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට වශයෙන් විවිධ කාණ්ඩයන් යටතේ මිනුම්කරණය කිරීම සඳහා අවශ්‍ය විෂයපථය සැකසෙනු ලැබේ;

- පිටු අංක 184 හි සටහන 3.5.2. හි දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමාගමෙහි ව්‍යාපාර ආකෘතිය
- පිටු අංක 184 හි සටහන 3.5.2. හි දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ

**මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ**
SLFRS 9 යටතේ සියළුම මූල්‍ය වත්කම් කාණ්ඩයන් පුරා හානිකරණ අලාභ මිනුම්කරණයේදී, විනිසුම, විශේෂයෙන්ම අනාගත මුදල් ප්‍රවාහයන්හි ප්‍රමාණය හා කාලගණනය ඇස්තමේන්තු කිරීමේදී සහ හානිකරණ අලාභ නිර්ණය කිරීමේදී ඇප වටිනාකම් සැළකිල්ලට ගැනීම වැදගත් වේ.

සමූහය/සමාගම මගින් එක් එක් වාර්තාකරණ දිනයේදී, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයට ලක්ව ඇති බවට කවර හෝ වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න ඇගයුමට ලක් කෙරේ.

**ණය සහ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ**
ඒ අනුව, සමූහය මගින් ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභයක් සඳහා වෙන්කිරීමක් සිදු කල යුතුද යන්න තක්සේරු කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී සිය කේවල වශයෙන් සැළකිය යුතු ණය හා අත්තිකාරම් සමාලෝචනයට ලක් කෙරේ. විශේෂයෙන්ම, අනාගත මුදල් ප්‍රවාහයන්හි ප්‍රමාණය හා කාලගණනය ඇස්තමේන්තු කිරීමේදී සහ හානිකරණ අලාභ නිර්ණය කිරීමේදී කළමනාකාරීත්වයේ විනිසුම වැදගත් වේ.

මෙම ඇස්තමේන්තු සාධක රැසක් පිළිබඳ උපකල්පනයන් මත පදනම් වන බැවින් වෙනස් විය හැකි වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදුකෙරෙන හානිකරණ වෙන්කිරීම වෙත අනාගත වෙනස්වීම් සිදුවිය හැක.

'ණය සහ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ' පිළිබඳ විස්තර පිටු අංක 228 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 25.7 හි දක්වේ.

**මූල්‍ය ආයෝජන මත හානිකරණ ගාස්තු**
SLFRS 9 - මූල්‍ය ආයෝජන වලට අනුව මූල්‍ය ආයෝජන හානිකරණයට යටත්ව ක්‍රමක්ෂ පිරිවැය යටතේ කාණ්ඩගත කෙරේ. සමාගම/සමූහය සතුව ක්‍රමක්ෂව පිරිවැය අනුව ණය සාධනපත්‍ර සම්බන්ධ ඓතිහාසික අත්දැකීමක් නොමැත. එමනිසා, සමූහය මගින් බ්ලූම්බර්ග් වැනි බාහිර ණය ශ්‍රේණිගත කිරීම් මගින් ප්‍රකාශිත පැහැර හැරීමේ සම්භාවිතාව (PD). ශ්‍රී ලංකා රජය මගින් රුපියල් වලින් නිකුත් කරන ලද ණය සුරැකුම් සඳහා අලාභ ගෙනදුන් පැහැරහැරීම (LGD) 0% වශයෙන්, සහ සෙසු සියළුම සාධනපත්‍රයන් සඳහා (LGD) වශයෙන් ක්ෂේත්‍රයේ සාමාන්‍යයද සැළකිල්ලට ගැනේ.

මූලික හඳුනාගැනීමේ සිට, මූල්‍ය ආයෝජන ආශ්‍රිතව ණය අවදානම කැපීපෙනෙන අයුරින් ඉහළ ගොස් නොමැත. එමනිසා, සමූහය මගින් එබඳු ආයෝජන සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අපේක්ෂිත ණය අලාභ වාර්තා නොකරන ලදී.

**වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට (FVOCI) හානිකරණය**
'වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට (FVOCI) හානිකරණය' පිළිබඳ විස්තර පිටු අංක 234 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 27 හි දක්වේ.

**දේපළ, පිරියත සහ උපකරණ වල සඵල ජීව කාලය**
සමූහය මගින් එක් එක් වාර්තාකරණ දිනයේදී දේපළ, පිරියත සහ උපකරණ වල අවශේෂ වටිනාකම්, සඵල ජීව කාලයන් සහ ක්ෂයවීමේ ක්‍රමවේදයන් සමාලෝචනයට ලක් කෙරේ. ඒවා අවිනිශ්චිතතාවන්ට ලක් විය හැකි බැවින් එකී වටිනාකම්, අනුපාතයන්, ක්‍රමවේදයන් ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරීත්වයේ විනිසුම යොදා ගැනේ.

**අස්පෘශ්‍ය වත්කම් වල සඵල ජීව කාලය**
'අස්පෘශ්‍ය වත්කම් වල සඵල ජීව කාලය' පිළිබඳ විස්තර පිටු අංක 246 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 34 හි දක්වේ.

GRI 207-1

**පැවරුම් මිළකරණ රෙගුලාසිය**
සමාගම පැවරුම් මිළකරණ රෙගුලාසි ඇතුළු ආදායම් බදු හා වෙනත් බදු වලට යටත් වේ. අදාළ පැවරුම් මිළකරණ රෙගුලාසි සම්බන්ධ පවතින අවිනිශ්චිතතාවන් හේතුවෙන් පැවරුම් මිළකරණ රෙගුලාසි වල බලපෑම පිළිබඳව නිර්ණය කිරීම සඳහා කළමනාකාරීත්වයේ විනිසුම අවශ්‍ය විය. ඒ අනුව ආශ්‍රිත ප්‍රතිඥාවන් හඳුනාගැනීම, අදාළ නුදුරු මිළ ඇස්තමේන්තු කිරීම සහ උචිත මිළකරණ යාන්ත්‍රණයන් තෝරාගැනීම ඇතුළත්ව එනමුත් ඒවාට සීමා නොවී රෙගුලාසි ආදේශ කරගැනීමේදී බරපතල විනිශ්චයන් සහ ඇස්තමේන්තු යොදා ගැණිනි. ප්‍රවර්තන බදු ගාස්තුව එවැනි විනිශ්චයන්ට භාජනය විය. පැවරුම් මිළකරණ ප්‍රතිපත්ති සම්බන්ධ කළමනාකාරීත්වයේ අර්ථනිරූපනයෙහි සහ ක්‍රියාවේ යෙදවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇස්තමේන්තුගත අදායම් බදු ගාස්තුව සහ තථ්‍ය ගෙවීමේ ප්‍රමාණය අතර වෙනස්කම් උද්ගත විය හැක.

GRI 207-1

**විලම්බිත බදු**
විලම්බිත බදු පිළිබඳ විස්තර පිටු අංක 262 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 44 හි දක්වේ.

**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම**
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම පිළිබඳ විස්තර පිටු අංක 259 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 43 හි දක්වේ.

**පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම් සම්බන්ධ තක්සේරුකරණය**
වාර්තාකරණ දිනට වාර්තාගත හිමිකම්පෑම් වල අපේක්ෂිත පරම පිරිවැය සහ වාර්තාකරණ දිනට දරන ලද නමුත් වාර්තා නොකරන ලද (IBNR) හිමිකම්පෑම් සම්බන්ධ අපේක්ෂිත පරම පිරිවැය යන ද්විත්වය සම්බන්ධයෙන්ම සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් සැකසීම අවශ්‍ය වේ. ස්ථාවරවම පරම හිමිකම්පෑම් පිරිවැය ස්ථාපනය කරගැනීම සඳහා සැළකිය යුතු කාලයක් ගත වේ. හිඟ හිමිකම්පෑම් අගයයන් ඇස්තමේන්තු කිරීම සඳහා පාදක වන ප්‍රධාන උපකල්පනය අතීත හිමිකම්පෑම් වර්ධන අත්දැකීමයි.

විශාල හිමිකම්පෑම් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් වෙන වෙනම කටයුතු කෙරෙන අතර, එහිදී අලාභ ගලපන ලද ඇස්තමේන්තු වල මුහුනත අගය මත වෙන්කිරීම හෝ ඒවායේ අනාගත වර්ධනයන් පිළිබිඹු වන අයුරින් වෙන වෙනම ප්‍රක්ෂේපනය කිරීම සිදු කෙරේ. බොහෝ අවස්ථාවන්හිදී, හිමිකම්පෑම් වල අනාගත අනුපාතයන්, උද්ධමනය හෝ අලාභ අනුපාතයන් සම්බන්ධයෙන් නිශ්චිත උපකල්පන සිදු නොකෙරේ.

### 2.11 සන්සන්දනාත්මක තොරතුරු

ප්‍රමාණාත්මක, වාර්තාගත හා විස්තරාත්මක තොරතුරු ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු, වඩාත් ඵලදායී ඉදිරිපත් කිරීමක් හා වර්තමාන වසරේ තොරතුරු සමග සන්සන්දනය කළ හැකි වන පරිදි, අවශ්‍ය ස්ථානයන්හිදී, පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශයන්හි දක්වෙන වත්කම් හා වගකීම් ඉරිදිපත් කිරීම් හා වර්ගීකරණයන් සංශෝධනය කරනු ලැබ ඇත.

## 3. පොදු ගිණුම්කරණ ප්‍රමිතීන්


| විස්තරය | සටහන | පිටු අංකය |
|---|---|---|
| **ගිණුම්කරණ ප්‍රමිතීන් - පොදු** | | |
| සළකාබැලීමේ පදනම | 3.1 | 182 |
| විදේශ මුදල් ගනුදෙනු හා ශේෂයන් | 3.2 | 183 |
| SLFRS 15 – ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් ආදායම | 3.3 | 183 |
| ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම් | 3.4 | 183 |
| මූල්‍ය සාධනපත්‍ර - මූලික හඳුනාගැනීම සහ පශ්චාත් මිනුම්කරණය | 3.5 | 184 |
| මූල්‍ය නොවන වත්කම් හානිකරණය | 3.6 | 186 |
| වෙන්කිරීම් | 3.7 | 186 |
| ණය ලබාගැනීමේ පිරිවැය | 3.8 | 186 |
| ආදායම් බදු | 3.9 | 186 |
| විලම්බිත බදු | 3.10 | 186 |
| **ගිණුම්කරණ ප්‍රමිතීන් - ආදායම් සහ වියදම්** | | |
| පොලී ආදායම් සහ වියදම් | 6 | 188 |
| ශුද්ධ උපයන ලද වාරිකය | 7 | 190 |
| ගාස්තු හා කොමිස් ආදායම | 8 | 191 |
| ශුද්ධ ලාභ/(අලාභ) - FVTPL | 9 | 192 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 10 | 192 |
| ණය සහ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ ගාස්තු සහ වෙනත් අලාභ | 11 | 193 |
| සේවක වියදම් | 12 | 196 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 13 | 196 |
| ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් | 14 | 197 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 15 | 198 |
| සේවා මත බදු | 16 | 198 |
| ආදායම් බදු වියදම | 17 | 199 |
| සාමාන්‍ය කොටසකට මූලික/තනුක ඉපැයුම් | 18 | 202 |

| විස්තරය | සටහන | පිටු අංකය |
|---|---|---|
| **ගිණුම්කරණ ප්‍රමිතීන් - වත්කම් සහ වගකීම්** | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 212 |
| බැංකු හා මූල්‍ය ආයතන වල ශේෂයන් | 23 | 213 |
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට | 24 | 214 |
| ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය | 25 | 216 |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ | 26 | 233 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 27 | 234 |
| ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය | 28 | 236 |
| පරිපාලිතයන්හි ආයෝජන | 29 | 236 |
| ආයෝජන දේපළ | 30 | 238 |
| වෙනත් වත්කම් | 31 | 240 |
| දේපළ, පිරියත සහ උපකරණ | 32 | 241 |
| භාවිත හිමිකම් වත්කම් | 33 | 245 |
| කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් | 34 | 246 |
| බැංකු වෙත ගෙවිය යුතු | 35 | 248 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 36 | 251 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | 37 | 252 |
| වෙනත් මූල්‍ය වගකීම් | 38 | 255 |
| රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු රක්ෂණ | 39 | 255 |
| කල්බදු වගකීම් | 40 | 257 |
| ප්‍රවර්තන බදු වගකීම් | 41 | 258 |
| වෙනත් වගකීම් | 42 | 259 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 43 | 259 |
| විලම්බිත බදු වගකීම්/(වත්කම්) | 44 | 262 |


### 3.1 ඒකාබද්ධකරණ පදනම

2021 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වූ වසර සඳහා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් සමාගම, එහි පරිපාලිතයන් සහ එහි හවුල්කාර සමාගමෙන් සමන්විත වේ. දෙසැම්බර් 31 දිනෙන් මූල්‍ය වර්ෂය අවසන් වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් හි පරිපාලිතයක් වන පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හැරුනු විට, සමාගමෙහි පරිපාලිතයන් සහ හවුල්කාර සමාගම සඳහා වන මූල්‍ය ප්‍රකාශයන් එකම වාර්තාකරණ වසර සඳහා පිළියෙල කෙරේ. ඒකාබද්ධකරණ අරමුණු උදෙසා එකම වාර්තාකරණ වර්ෂය යොදාගැනුනි.

#### 3.1.1. ව්‍යාපාර සංයෝජනය සහ කීර්තිනාමය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 03 (ව්‍යාපාර සංයෝජන) හි අවශ්‍යතාවන්ට අනුකූලව ව්‍යාපාර සංයෝජනයන් අත්පත් කරගැනීමේ ක්‍රමය යොදාගනිමින් ගිණුම්ගත කෙරේ.

සමාගම සහ සමූහය මගින් කීර්තිනාමය මනිනු ලබන්නේ, අත්පත් කරගැනීමට ලක් වූ ආයතනයෙහි කවර හෝ පාලනයට නතු නොවන හඳුනාගත් වටිනාකමක්ද ඇතුළුව මාරු කරන ලද ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගයෙන් හඳුනාගත හැකි අත්පත් කරගත් වත්කම් සහ උපකල්පිත වගකීම් වල ශුද්ධ හඳුනාගත් වටිනාකම අඩුකිරීමෙන් වන අතර, සියළුම මිනුම් අත්පත් කරගන්නා ලද දිනට සිදු කෙරේ. අතිරික්තය සෘණාත්මක වන විටදී, කේවල් කිරීමේ මිළදී ගැනීමේ ලාභයක් වහාම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගන්නා ලද කීර්තිනාමය මූලිකව පිරිවැය අනුව මනිනු ලබන අතර, එය අත්පත් කරගන්නා ලද හඳුනාගත හැකි වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වගකීම් සම්බන්ධ සමූහයේ අයිතිය මත ව්‍යාපාර සංයෝජන පිරිවැයෙහි අතිරික්තය වේ.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, කීර්තිනාමය මනිනු ලබන්නේ පිරිවැය අනුව කවර හෝ සමුච්චිත හානිකරණ අලාභයන් අඩු කිරීමෙනි. සිදුවීම් හෝ තත්ත්වයන් සම්බන්ධ වෙනස්වීම් මගින් ධාරණ අගය හානිකරණයට ලක්ව ඇති බවට දක්වෙන්නේ නම්, කීර්තිනාමය හානිකරණය සඳහා වාර්ෂිකව හෝ එයට වඩා නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. හානිකරණ පරීක්ෂාවන් සඳහා, ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගන්නා ලද කීර්තිනාමය, අත්පත් කරගන්නා ලද දිනයේ සිට, අදාළ සංයෝජනයෙහි හවුල්කාරීත්වයන් මගින් ප්‍රතිලාභ ලබනැයි අපේක්ෂිත සමූහයේ එක් එක් මුදල් උත්පාදන ඒකක (CGU) හෝ මුදල් උත්පාදන ඒකක සමූහයන් (CGU) වෙත බෙදා වෙන් කෙරෙන අතර, එහිදී එකී ඒකකයන් වෙත අත්පත් කරගැනීමට ලක් වූ ආයතනයෙහි වෙනත් වත්කම් හෝ වගකීම් පවරා ඇති බවක් හෝ නොමැති බවක් සැළකිල්ලට නොගැනේ.

කීර්තිනාමය මගින් මුදල් උත්පාදන ඒකකයක (CGU) (හෝ (CGU) සමූහයක) කොටසක් නිර්මාණය වන සහ එකී ඒකකය තුළ මෙහෙයුම බැහැර කරනු ලබන අවස්ථාවකදී, බැහැර කරන ලද මෙහෙයුම ආශ්‍රිත කීර්තිනාමය, අදාළ මෙහෙයුම් බැහැර කිරීමේ ලාභය හෝ අලාභය නිර්ණය කිරීමේදී මෙහෙයුමහි ධාරණ අගය තුළ ඇතුළත් කෙරේ. මෙකී තත්ත්වයන් තුළ බැහැර කරන ලද කීර්තිනාමය මනිනු ලබන්නේ බැහැර කරන ලද මෙහෙයුමෙහි සාපේක්ෂ වටිනාකම් සහ මුදල් උත්පාදන ඒකකය (CGU) මගින් රඳවා ගන්නා ලද කොටස පදනම් කර ගනිමිනි.

පරිපාලිතයන් විකුණා දමනු ලබන අවස්ථාවේදී, විකිණුම් මිල සහ ශුද්ධ වත්කම් අතර වටිනාකම සහ සමුච්චිත ගනුදෙනු වෙනස්කම් සහ කීර්තිනාමය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

### 3.1.2. පොදු පාලන ව්‍යාපාර සංයෝජන

පොදු පාලන ව්‍යාපාර සංයෝජන ගිණුම්ගත කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද නිර්දේශිත ක්‍රියාකාරකම් ප්‍රකාශය (SoRP) - පොදු පාලන ව්‍යාපාර සංයෝජන සඳහා ඒකාබද්ධ ගිණුම්කරණයට අදාළ මාර්ගෝපදේශයන් භාවිත කරමිනි.

### 3.1.3. පාලනය අහිමිවීම

පාලනය අහිමි වීමෙන් අනතුරුව, සමූහය මගින් පරිපාලිතයෙහි වත්කම් හා වගකීම් කවර හෝ පාලනය රහිත අයිතයක් සහ පරපාලිතයෙහි ස්කන්ධ ආශ්‍රිත සෙසු සංරචකයන් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. පාලනය අහිමි වීමෙන් උද්ගත වන කවර හෝ අතිරික්තයක් හෝ ඌනයක් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. සමූහය මගින් පෙර පරිපාලිතයහි කවර හෝ අයිතියක් රඳවාගනු ලබන්නේ නම්, එබඳු අයිතියක් පාලනය අහිමි වන දිනයේදී සාධාරණ අගය අනුව මනිනු ලැබේ.

### 3.1.4. ඒකාබද්ධකරණයේදී ඉවත් කරන ලද ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අභ්‍යන්තර - සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අභ්‍යන්තර - සමූහ ගනුදෙනු වලින් උද්ගත වන කවර හෝ උපලබ්ධි නොවූ ආදායම් හෝ වියදම් ඉවත් කෙරේ. ස්කන්ධ ගිණුම්ගත ආයෝජිතයන් සමග වන ගනුදෙනු වලින් උද්ගත වන උපලබ්ධ නොවූ ලාභයන්, ආයෝජිතයා කෙරෙහි සමූහයේ අයිතිය පවතින තාක් දුරට ආයෝජනයට එරෙහිව ඉවත් කෙරේ. උපලබ්ධ නොවූ අලාභයන්ද උපලබ්ධි නොවූ ලාභයන් ආකාරයටම ඉවත් කෙරෙන නමුත්, එය සිදු කෙරනුයේ කිසිදු හානිකරණ සාක්ෂියක් නොමැති තාක් දුරට පමණි.

### 3.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

සියළුම විදේශ මුදල් ගනුදෙනු අදාළ ගනුදෙනු සිදුකෙරුනු දිනයේ පැවති එතැන් හුවමාරු අනුපාත අනුව ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ. මේ සම්බන්ධයෙන්, සමූහයෙහි ක්‍රියාමාර්ගය වනුයේ ගනුදෙනු දිනයේ මධ්‍ය හුවමාරු අනුපාතය යොදා ගැනීමයි.

වාර්තාකරණ දිනයේදී විදේශ මුදල් ඒකක වලින් දක්වෙන මුදල් වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනයේ පවතින එතැන් හුවමාරු අනුපාතය අනුව ක්‍රියාකාරී මුදල් ඒකකය වෙත ප්‍රතිපරිවර්තනය කෙරේ. මුදල් අයිතම මත විදේශ මුදල් ඒකක ලාභය හෝ අලාභය වනුයේ, සඵල පොලී අනුපාතයට ගලපන ලද වසර ආරම්භයේදී ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි ක්‍රමක්ෂය පිරිවැය හා වසර තුළ සිදුකරන ලද ගෙවීමේ සහ වාර්තාකරණ දිනයේදී හුවමාරු අනුපාතය අනුව පරිවර්තනය කරන ලද විදේශ මුදල් ඒකකයන්හි ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස වේ.

විදේශ මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැයට අදාළව මනින ලද මුදල් නොවන අයිතම හඳුනාගැනීමේ දිනයේදී එතැන් හුවමාරු අනුපාතය යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ මුදල් ඒකකයකින් සාධාරණ අගයට මනින ලද මුදල් නොවන අයිතම සාධාරණ අගය නිර්ණය කරන ලද දිනයේ පැවති එතැන් හුවමාරු අනුපාත අනුව පරිවර්තනය කෙරේ.

### 3.3. SLFRS 15 - ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් ආදායම

SLFRS 15 මගින් "ආදායම" සම්බන්ධ LKAS 18 ප්‍රමිතිය, "ඉදිකිරීම් ගිවිසුම්" සම්බන්ධ LKAS 11 ප්‍රමිතිය සහ "ගනුදෙනුකාර හිතෛෂීත්ව වැඩසටහන්" සම්බන්ධ IFRIC 13 ප්‍රමිතිය ඇතුළුව ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශයන් ප්‍රතිස්ථාපනය කෙරෙන අතර එය 2018 අප්‍රේල් 01 දින හෝ එයට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ.

SLFRS 15 මගින් ආදායමක් හඳුනාගැනීමේදී එය හඳුනාගනු ලැබිද, කොපමණ සහ කෙදිනද යන්න පිළිබඳ පරිපූර්ණ ආකෘතික රාමුවක් සපයනු ලැබේ. SLFRS 15 මගින් නව ගුණාත්මක හා ප්‍රමාණාත්මකව හෙළිදරව් කිරීම් ඉල්ලා සිටිනු ලබන අතර එහි අරමුණ වනුයේ මූල්‍ය ප්‍රකාශයන් භාවිත කරන්නන් හට ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් උද්ගත වන ආදායම සහ මුදල් ප්‍රවාහ වල ස්වභාවය, වටිනාකම, කාලග ණනය සහ අවිනිශ්චිතභාවය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේ අවස්ථාව උදා කිරීමයි.

මෙහිදී සමාගම් මගින් ආදායම සහ කවර වටිනාකමක් ද යන්න හඳුනාගැනීම සඳහා පියවර පහක ආකෘතියක් යොදාගැනීම අවශ්‍ය වේ. මෙම ආකෘතිය මගින් සමාග මක් විසින් එය අපේක්ෂා කරන ආදායම ලබාගැනීම සඳහා කිසියම් ගනුදෙනුකරුවකු වෙත භාණ්ඩ හෝ සේවාවන්හි පාලනය මාරු කරනු ලබන අවස්ථාවේවදී ආදායම හඳුනාගත යුතු බවට විශේෂ කොට දක්වේ.

### 3.4 ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම්

මෙම මූල්‍ය ප්‍රකාශයන්හිදී, සමූහය මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 3: වෙත සංශෝධන : ව්‍යාපාරයක් පිළිබඳ නිර්වචනය, LKAS 1 LKAS 8 වෙත සංශෝධන: මූර්ත පිළිබඳ නිර්වචනය, සහ පළමු වරට 2020 ජනවාරි 1 දිනට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන්ට බලාත්මක වූ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ සංකල්පීය රාමුව වෙත සිදුකරන ලද සංශෝධන යොදා ගනු ලැබීය. සමූහය මගින්, නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන කිසිදු වෙනත් ප්‍රමිතියක්, අර්ථදැක්වීමක් හෝ සංශෝධනයක් කල්තබා ආදේශ කර නොගැනුනි.

### 3.4.1. SLFRS 3: වෙත සංශෝධන : ව්‍යාපාරයක් පිළිබඳ නිර්වචනය

2018 නොවැම්බර් මස, සමාගම් වෙත අත්පත් කරගන්නා ලද ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහයක් ව්‍යාපාරයක්ද යන්න නිර්ණය කරගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් SLFRS 3 හි ව්‍යාපාරයක් පිළිබඳ නිර්වචනය සම්බන්ධ සංශෝධන නිකුත් කරන ලදී. මෙම සංශෝධන මගින් ව්‍යාපාරයක් සඳහා වන අවම අවශ්‍යතා පැහැදිලි කරමින්, කවර හෝ නොපවතින සංරචකයන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වෙළඳපොළ සහභාගීත්වයන්ට හැකිවේද යන්න පිළිබඳ ඇගයුම ඉවත් කරමින්, වෛකල්පිත සාධාරණ අගය සංකේන්ද්‍රණ පරීක්ෂාවක් හඳුන්වාදෙන ලදී.

මෙම සංශෝධන සමූහයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි කිසිදු බලපෑමක් සිදු නොකරන නමුත් අනාගතයේදී සමූහය කවර හෝ ව්‍යාපාර සංයෝජනයකට ඇතුළත් වුවහොත් බලපෑමක් ඇති විය හැකි වේ.

**LKAS 1 LKAS 8 වෙත සංශෝධනː මූර්ත ('material') පිළිබඳ නිර්වචනය**
2018 නොවැම්බර් මස, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති to LKAS 1 සහ to LKAS 8ː ''ගිණුම්කරණ ප්‍රමිතීන්, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂ වෙනස්වීම්'' වෙත සංශෝධන නිකුත් කරමින් ප්‍රමිතීන් සියල්ල සම්බන්ධයෙන් 'මූර්ත' ('material') පිළිබඳ නිර්වචනය සඳහා පැහැදිලි කිරීම් ලබාදෙන ලදී. ඒ අනුව නව නිර්වචනයෙහි දක්වෙන පරිදි ''කිසියම් විශේෂිත වාර්තාකරණ සමාගමක් සම්බන්ධ මූල්‍ය තොරතුරු සපයනු ලබන මූල්‍ය ප්‍රකාශයන්හි ඉවත් කිරීමක්, සාවද්‍ය ප්‍රකාශයක් හෝ සම්මිලනයක් මගින් භාවිත කරන්නන්ගේ තීරණ කෙරෙහි සාධාරණ බලපෑමක් ඇති කල හැකි අන්දමේ ඇති කල හැක ආකාරයේ තොරතුරු මූර්ත වේ.''

මෙම සංශෝධනයන් මගින් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි කිසිදු බලපෑමක් ඇති නොකරන අතර, අනාගතයේදී එවැනි කිසිදු බලපෑමක් අපේක්ෂා නොකෙරේ.

**මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පීය රාමුව වෙත සංශෝධන**
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් සංශෝධිත සංකල්පීය රාමුවක් නිකුත් කරනු ලැබ ඇති අතර එය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රමිතීන් සැකසීමේ තීරණ කෙරෙහි යොදාගැනෙනු ඇත. ප්‍රධාන වෙනස්කම් පහත දක්වෙන පරිදි වේː

- මූල්‍ය වාර්තාකරණ අරමුණ තුළ නියමුත්වය සම්බන්ධ වැදගත්කම ඉහළ නැංවීම
- නෛතික ආයතනයක්, හෝ ආයතනයක කොටසක් විය හැකි වාර්තාකරණ ආයතනයක් නිර්වචනය කිරීම
- මධ්‍යස්ථභාවයේ සංරචකයක් වශයෙන් විචක්ෂණශීලී බව පුනස්ථාපනය කිරීම
- වත්කමක් හා වගකීමක් සම්බන්ධ නිර්වචන සංශෝධනය කිරීම
- හඳුනාගැනීම සඳහා වන සම්භාවිතා කඩඉම ඉවත් කිරීම සහ හඳුනාගැනීමෙන් බැහැර කිරීම සඳහා මාර්ගෝපදේශ එක් කිරීම
- එකිනෙකට වෙනස් මිනුම් පදනම් මත මාර්ගෝපදේශ එක් කිරීම, සහ
- ලාභය හෝ අලාභය මූලික කාර්යසාධන දර්ශකය බවට දක්වමින් සහ, ප්‍රතිපත්තියක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශයන්හි අදාළත්වය සහ විශ්වසනීය ඉදිරිපත් කිරීම ඉහළ නැංවෙන අයුරින් වෙනත් විස්තීර්ණ ආදායමෙහි ඇතුළත් ආදායම් සහ වියදම් ප්‍රතිචක්‍රීකරණය කල යුතු වීම.

මෙම සංශෝධනයන් මගින් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි කිසිදු බලපෑමක් ඇති නොකෙරේ.

## 3.5 මූල්‍ය සාධනපත්‍ර - මූලික හඳුනාගැනීම සහ පශ්චාත් මිනුම්කරණය

**3.5.1. හඳුනාගැනීමේ දිනය**
'නිත්‍ය මාර්ග වෙළඳාම' හැර සියළුම මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව වෙළඳාම් දිනයේදී හඳුනාගැනේ. එනම්, සමූහය සාධනපත්‍රයෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදන වෙත පාර්ශවයක් බවට පත්වන දිනය වේ. 'නිත්‍ය මාර්ග වෙළඳාම' යනු රෙගුලාසි හෝ වෙළඳපොල සම්මුතිය මගින් පොදුවේ ස්ථාපිත කාලසීමාවක් තුළ වත්කම් බෙදාහැරීම අවශ්‍ය වන ආකාරයේ මූල්‍ය වත්කම් මිළදී ගැනීම් හෝ විකිණීම් වේ. එම වෙළඳාම් පියවීම් දිනයේදී මූලිකව හඳුනාගැනේ.

**3.5.2. මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පශ්චාත් මිනුම්කරණය**
SLFRS 9 අනුව, සමූහය මගින් ස්වකීය සියළුම මූල්‍ය වත්කම් අදාළ වත්කම් කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආකෘතිය අනුව වර්ගීකරණය කෙරෙන අතර වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි පහත දක්වෙන අයුරින් මනිනු ලැබේ;

- ක්‍රමක්ෂය පිරිවැය අනුව
- වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට (FVOCI)
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට (FVTPL)

මූල්‍ය වත්කම් වල පශ්චාත් මිනුම්කරණය ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**ව්‍යාපාර ආකෘතිය ඇගයුම**
2018 අප්‍රේල් 1 වැනි දින සිය බලපැවැත්වෙන පරිදි, සමූහය මගින් වත්කමක් කළඹ මට්ටමේ රඳවාගනිමින් සාධනපත්‍රයෙන් සාධනපත්‍රයට පදනමින් ඇගයුමට ලක් නොකරන ආකාරයේ ව්‍යාපාර ආකෘතියක අරමුණ සම්බන්ධ ඇගයුමක් සිදුකරනු ලබන අතර මෙහිදී ව්‍යාපාරය කළමනාකරණය කෙරෙන ආකාරය සහ කළමනාකාරීත්වය වෙත තොරතුරු සැපයෙන ආකාරය විශිෂ්ට අන්දමින් පිළිබිඹු කෙරේ. සැළකිල්ලට ගැනුනු තොරතුරු පහත දක්වෙන පරිදි වේː

- කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රමිතීන් හා අරමුණු සහ අදාළ ප්‍රමිතීන් ප්‍රායෝගිකව මෙහෙයවීම. නිශ්චිතවම, කළමනාකාරීත්වයේ ක්‍රමෝපාය මගින් ගිවිසුම්ගත පොලී ආදායම උපයාගැනීම, නිශ්චිත පොලී අනුපාත ස්වභවයක් පවත්වා ගෙන යාම, මූල්‍ය වත්කම් වල කාලසීමාව අදාළ වත්කම් සඳහා මූල්‍යකරණය සිදුකරනු ලබන වගකීම් වල කාලසීමාව සමග ගැළපීම හෝ අදාළ වත්කම් විකිණීම ඔස්සේ මුදල් ප්‍රවාහ උපලබ්ධි කිරීම කෙරෙහි අවධානය යොමු වන්නේද යන වග;
- කළඹෙහි කාර්යසාධනය ඇගයුමට ලක් කෙරෙන සහ සමූහ කළමනාකාරීත්වය වෙත වාර්තා කෙරෙන ආකාරය;
- ව්‍යාපාර ආකෘතියෙහි කාර්යසාධනය කෙරෙහි බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ රඳවාගැනෙන මූල්‍ය වත්කම්) සහ අදාළ අවදානම් කළමනාකරණය කරනු ලබන ආකාරය;
- ව්‍යාපාරයෙහි කළමනාකරුවන් වෙත ප්‍රතිලාභ පිරිනැමෙන ආකාරය - උදාː ප්‍රතිලාභය කළමනාකරණය කරනු ලබන වත්කම් වල සාධාරණ අගය මත පදනම් වන්නේද නැතිනම් එක්රැස් කරනු ලබන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත පදනම් වන්නේද යන්නː සහ
- පෙර වාර්තාවන්හි විකිණුම් සම්බන්ධ වාර ගණන, පරිමාව සහ කාලගණනය, එබඳු විකිණුම් සඳහා හේතු සහ අනාගත විකිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාව. කෙසේවුවද, විකිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු හුදෙකලාව සැළකිල්ලට ගනු නොලබන අතර, මූල්‍ය වත්කම් කළමනාකරණය සම්බන්ධ සමූහයේ ප්‍රකාශිත අරමුණ සපුරාලන ලද ආකාරය සහ මුදල් ප්‍රවාහ උපලබ්ධි වූ ආකාරය සම්බන්ධ සමස්ත ඇගයුමක කොටසක් වශයෙන් සැළකිල්ලට ගැනේ.

ව්‍යාපාර ආකෘති ඇගයුම සාධාරණ ලෙස අපේක්ෂිත තත්ත්වයන් මත පදනම් වන අතර එහිදී ''නරකම තත්ත්වය' හෝ 'ආතති තත්ත්වය' සැළකිල්ලට නොගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ සමූහයේ මුල් අපේක්ෂාවන්ට වෙනස් ආකාරයකින් උපලබ්ධි වුවහොත්, සමූහය මගින් එම ව්‍යාපාර ආකෘතිය තුළ රඳවාගෙන ඇති ඉතිරි මූල්‍ය වත්කම් වල වර්ගීකරණය වෙනස් නොකරන නමුත්, ඉදිරියට යාමේදී අළුතින් අරඹන ලද හෝ අළුතින් මිලදී ගන්නා ලද මූල්‍ය වත්කම් ඇගයීමේදී අදාළ තොරතුරු ඇතුළත් කෙරේ.

**ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තනිකරම මුල් මුදල සහ පොලිය ගෙවීම්ද යන්න තක්සේරු කිරීම (SPPI පරීක්ෂාව)**
සිය වර්ගීකරණ ක්‍රියාවලියෙහි දෙවැනි පියවරක් වශයෙන් සමූහය මගින් සපුරාලන්නේදැයි හඳුනාගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි ඇගයුමට ලක් කෙරේ.

මෙම ඇගයුම සඳහා, ''මුල් මුදල'' යන්න මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය වශයෙන් සහ එය මූල්‍ය වත්කමෙහි ජීව කාලය පුරා වෙනස් විය හැකි බවට නිර්වචනය කෙරේ. (උදාහරණයක් වශයෙන්, මුල් මුදල ආපසු ගෙවීම් හෝ වාරික/වට්ටම හි ක්‍රමක්ෂය)

''පොලිය'' යන්න නිර්වචනය කෙරෙනුයේ මුදලෙහි කාල වටිනාකම සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා හිඟ මුල් මුදල ආශ්‍රිත ණය අවදානම සඳහා සහ සෙසු මූලික ණය දීමේ අවදානම් සහ පිරිවැය මෙන්ම ලාභ තීරුව සඳහා ද වන ප්‍රතිශ්ඨාව වශයෙනි.

මෙයට එරෙහිව, අවදානම කෙරෙහි නිරාවරනය අවම කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන ගිවිසුම්ගත කොන්දේසි හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් උද්ගත නොකරන මූලික ණය ලබාදීමේ කටයුත්ත ආශ්‍රිත නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි උච්චාවචනයන් තනිකරම හිඟ මුල් මුදලෙහි මුල් මුදල සහ පොලී ගෙවීම් වේ. එවැනි

අවස්ථාවන්හිදී, අදාළ මූල්‍ය වත්කම ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මැනිය යුතු වේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තනිකරම හිඟ මුල් මුදලෙහි මුල් මුදල සහ පොලී ගෙවීම්ද යන්න ඇගයුමට ලක් කිරීමේදී, සමූහය මගින් සාධනපත්‍රයෙහි ගිවිසුම්ගත කොන්දේසි සැළකිල්ලට ගනු ලැබේ. මෙයට අදාළ මූල්‍ය වත්කම මෙම කොන්දේසිය සපුරාලීමට අපොහොසත් වන ආකාරයෙන් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි කාලගණනය හෝ වටිනාකම වෙනස් කල හැකි ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසියකින් යුක්ත වේද යන්න ඇගයුමට ලක් කිරීම ඇතුළත් වේ. ඇගයුම සිදුකිරීමේදී සමූහය මගින් පහත දැක්වෙන කරුණු සැළකිල්ලට ගැනේ:

- මුදල් ප්‍රවාහයන්හි කාලගණනය හෝ වටිනාකම වෙනස් කල හැකි අසම්භාව්‍ය සිදුවීම්;
- වගකීම් ඉටු කිරීම (Leverage) පිළිබඳ විශේෂාංග;
- පෙරදායකවීම් සහ විස්තාරණ කොන්දේසි;
- විශේෂිත වත්කම් වලින් මුදල් ප්‍රවාහ සඳහා සමූහයෙහි හිමිකම්පෑම සීමා කෙරෙන කොන්දේසි; සහ
- මුදලෙහි කාල වටිනාකමෙහි ප්‍රතිශ්ඨාව වෙනස් කරන ආකාරයේ විශේෂාංග.

සමූහය හට ආවර්තිත ප්‍රතිසැකසුම් දිනයන්හිදී පොලී අනුපාතය සංශෝධනය කිරීම සඳහා යෝජනා කළ හැකි ආකාරයේ වරණයක් සහිත දිගු කාලීන ස්ථාවර අනුපාත ණය කළඹක් සමූහය සතු වේ. මෙම ප්‍රතිසැකසුම් අයිතීන් අදාළ සංශෝධනය සිදු කරනු ලබන අවස්ථාවේ පවතින වෙළඳපොල අනුපාතයන්ට සීමා වේ. මෙහිදී ණයගැතියන් හට සංශෝධිත අනුපාතය පිළිගැනීම හෝ දඩ මුදලකින් තොරව ණය මුදල පිරිමුදනු ලැබීම සිදුකල හැකි වේ. සමූහය මගින් මෙම ණය මුදල් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තනිකරම මුල් මුදල සහ පොලිය ගෙවීම් වශයෙන් නිශ්චය කරනු ලැබ ඇති අතර එයට හේතුව මෙම වරණය මගින් හිඟ මුල් මුදල් වටිනාකම ආශ්‍රිත මුදලෙහි කාල වටිනාකම, ණය අවදානම, සෙසු මූලික ණය ලබාදීමේ අවදානම් සහ පිරිවැය සඳහා ප්‍රතිශ්ඨාවට බලපාන අයුරින් පොලී අනුපාතය විචලනය වීමයි.

SOFP මත හඳුනාගනු ලබන විවිධ වර්ගයේ මූල්‍ය වත්කම් පිළිබඳ විස්තර.

**ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය වත්කම්**
ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ එය පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් වන අතර එය ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට වශයෙන් නම් නොකෙරේ:

- වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමේ අරමුණින් වත්කම් රඳවාගනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුළ රඳවාගෙන පැවතීම; සහ
- මූල්‍ය වත්කමෙහි ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හිදී තනිකරම හිඟ මුල් මුදලෙහි මුල් මුදල සහ පොලී ගෙවීම් වන මුදල් ප්‍රවාහ උද්ගත කරවීම.

ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය වත්කම් පිටු අංක 212, 213, 216, 233, 236 සහ 248 සිට 258 දක්වා සටහන් 22, 23, 25, 26, 28 සහ 35 සිට 41 දක්වා ඉදිරිපත් කෙරේ.

**FVOCI අනුව මනින ලද මූල්‍ය වත්කම්**
FVOCI අනුව මනින ලද මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද ණය සහ ස්කන්ධ සාධනපත්‍ර වලින් සමන්විත වේ. FVOCI අනුව මනින ලද මූල්‍ය වත්කම් පිටු අංක 234 හි සටහන 27 හි දැක්වේ.

**FVTPL අනුව මනින ලද මූල්‍ය වත්කම්**
SLFRS 9 අනුව, ක්‍රමක්ෂය පිරිවැය අනුව හෝ ස්කන්ධය අනුව වර්ගීකරණය නොකරන ලද සියළුම මූල්‍ය වත්කම් FVTPL අනුව මනිනු ලැබේ. FVTPL අනුව වන මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා රඳවාගත් හෝ කළමනාකරණය කෙරෙන මූල්‍ය වත්කම් සහ ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සඳහා රඳවාගෙන හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම හා පිටු අංක 2014 හි සටහන 24 හි සාකච්ඡා කෙරෙන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූලික හඳුනාගැනීමෙන් පසු නම් කරන ලද මූල්‍ය වත්කම් විකිණීම යන දෙකම සඳහා නොවන බැවින් සාධාරණ අගය පදනම මත කාර්යසාධනය ඇගයුමට ලක් කෙරෙන මූල්‍ය වත්කම් වලින් සමන්විත වේ.

**ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම්**
SLFRS 9 අනුව, මූලික හඳුනාග ැනීමේදී, සමූහය මගින් මූල්‍ය වත්කමක් නැවත අවලංගු නොකල හැකි පරිදි නම් කරනු ලබන්නේ, නැතිනම් එය ක්‍රමක්ෂය පිරිවැය අනුව හෝ FVTPL හිදී FVOCI අනුව මැනීම සඳහා අවශ්‍යතා සපුරාලමින් එකී නම් කිරීම ඉවත්වීම හෝ නැතිනම් වත්කම් හෝ වගකීම් හෝ ලාභ හෝ අලාභ හෝ වෙනස් පදනමින් මැනීමෙන් ඇති විය හැකි ගිණුම්කරණ නොගැළපීම සැළකිය යුතු අන්දමින් පහත හෙළීම උදෙසාය.

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසන් වන විට සමූහය මගින් කිසිදු මූල්‍ය වත්කමක් මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරනු ලැබ නොමැත.

**3.5.3. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
මූල්‍යමය වත්කමක් (හෝ අදාළ වන අවස්ථාවන්හිදී මූල්‍යමය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍යමය වත්කම් සමූහයක කොටසක්);

- අදාළ මූල්‍යමය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් අහෝසි වූ විට;
- සමූහය සහ සමාගම මගින් මූල්‍යමය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් පවරන ලද විට හෝ 'පාස් ත්‍රෘ' වැඩපිළිවෙලක් යටතේ තෙවන පාර්ශවයක් වෙත මූර්ත ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහ ගෙවීම සඳහා බැඳීමක් උපකල්පනය කරන ලද අවස්ථාවකදී; සහ
    - සමූහය සහ සමාගම මගින් වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පවරන ලද අවස්ථාවකදී හෝ
    - සමූහය සහ සමාගම මගින් වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පැවරීම හෝ රඳවාගැනීම සිදුකොට නැතත්, වත්කමෙහි පාලනය පවරා ඇති විටකදී.

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී, වත්කමෙහි ධාරණ අගය සහ ලද ප්‍රතිශ්ඨාව අතර වෙනස සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගන්නා ලද කවර හෝ සමුච්චිත ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

සමූහය සහ සමාගම මගින් මූල්‍යමය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් පවරන ලද විට හෝ 'පාස් ත්‍රෘ' වැඩපිළිවෙලක් වෙත ඇතුළත් වුනු විට, සහ වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පැවරීම හෝ රඳවාග ැනීම සිදුනොකොට, වත්කමෙහි පාලනයද පවරා නොමැති අවස්ථාවකදී වත්කම ආශ්‍රිතව සමූහයේ අඛණ්ඩ සහභාගීත්වය තාක් දුරට වත්කම හඳුනාගැනේ. එහිදී, සමූහය මගින්ද ආශ්‍රිත වගකීමක් හඳුනාගැනේ. සමූහය මගින් රඳවාගන්නා ලද හිමිකම් සහ බැඳීම් පිළිබිඹු වන පදනමකින් පවරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම මනිනු ලැබේ.

පවරන ලද වත්කම මත ඇපකරයක ස්වභාවය ගන්නා අඛණ්ඩ සහභාගීත්වය මනිනු ලබන්නේ වත්කමෙහි මුල් ධාරණ අගය සහ සමූහය හට ආපසු ගෙවීමට සිදුවිය හැකි ප්‍රතිශ්ඨාවේ උපරිම වටිනාකම යන දෙකෙන් පහළ අගය අනුවය.

**මූල්‍ය වගකීම්**
වගකීම යටතේ ඇති බැඳීම නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමට ලක් කරනු ලැබේ. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණයහිමියා වෙතින් වෙනත් පාර්ශවයක් විසින් සැළකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් කර ඇති විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනාගැනීමෙන් බැහැර කිරීමක් ලෙස සලකනු ලබන අතර නව වගකීම්, සහ ආදායම් ප්‍රකාශයේ අදාළ ධාරණ අගයන්හි ප්‍රමාණවල වෙනස හඳුනා ගැනේ.

**3.5.4. මූල්‍ය සාධනපත්‍ර හිලව් කිරීම**
වටිනාකම් හිලව් කිරීම සඳහා නෛතික හිමිකමක් පවතින විට පමණක් සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධි කොට සමගාමීව වගකීම පියවීමට අදහස් කරන විටකදී මූල්‍ය සාධනපත්‍ර හිලව් කොට ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

LKASs / SLFRSs මගින් අනුමත අවස්ථාවන්හිදී පමණක් හෝ සමූහයේ වෙළඳ ක්‍රියාකාරකම් වැනි සමාන ආකරයේ ගනුදෙනු කාණ්ඩයකින් උද්ගත වන ලාභ හෝ අලාභ සඳහා ආදායම සහ වියදම ශුද්ධ පදනමකින් ඉදිරිපත් කෙරේ.

**3.5.5. සාධාරණ අගය නිර්ණය කිරීම**

වාර්තාකරණ දිනයේදී ක්‍රියාකාරී වෙළඳපොල වල වෙළඳාමේ යෙදවෙන මූල්‍ය සාධනපත්‍රයන්හි සාධාරණ අගය ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩුකිරීමකින් තොරව, ඒවායේ සඳහන් වෙළඳපොල මිළ හෝ අලෙවි නියෝජිත මිලකැඳවුම් (දිගු තත්ත්වයන් සඳහා ලංසු මිළ සහ කෙටි තත්ත්වයන් සඳහා ඉල්ලුම් මිළ) මත පදනම් වේ.

මූල්‍ය සාධනපත්‍රයන්හි සාධාරණ අගයයන් පිළිබඳ සමාලෝචනයක් සහ මිනුම්කරණය පිළිබඳ වැඩිදුර විස්තර පිටු අංක 205 හි සටහන 21 හි දක්වේ.

## 3.6 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

සමූහය මගින් එක් එක් වාර්තාකරණ දිනයේදී වත්කමක හානිකරණය පිළිබඳ කවර හෝ දර්ශකයක් පවතීද යන්න ඇගයුමට ලක් කෙරේ. එවැනි කවර හෝ දර්ශකයක් පවතී නම්, හෝ කිසියම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය වේ නම්, සමූහය මගින් අදාළ වත්කමෙහි පියවාගත හැකි වටිනාකම ඇස්තමේන්තුගත කෙරේ. කිසියම් වත්කමක පියවාගත හැකි වටිනාකම යනු අදාළ වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි සාධාරණ අගය අඩුකිරීම එහි විකිණුම් පිරිවැය සහ එහි ප්‍රයෝජ්‍ය වටිනාකම යන දෙකෙන් ඉහළ අගය වේ. කිසියම් වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක ධාරණ අගය එහි පියවාගත හැකි වටිනාකම ඉක්මවා ගිය විට, අදාළ වත්කම හානිකරණයට ලක්වූ වශයෙන් සැළකෙන අතර එහි පියවාගත හැකි වටිනාකමට ලියා දමනු ලැබේ.

ප්‍රයෝජ්‍ය වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලෙහි කාල වටිනාකම සහ අදාළ වත්කමට විශේෂිත අවදානම් සම්බන්ධ වාර්තමාන වෙළඳපොල ඇගයුම් පිළිබිඹු කරන්නා වූ, පූර්ව බදු වට්ටම් අනුපාතිකයක් භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කෙරේ. සාධාරණ අගය අඩු කිරීම විකිණුම් පිරිවැය තීරණය කිරීමේදී, යෝග්‍ය වූ තක්සේරුකරණ ආකෘතියක් යොදාගැනේ. මෙම ගණනයන් ආගණන ගුණිත, ප්‍රසිද්ධියේ වෙළඳාම් සිදුකරනු ලබන පරිපාලිත වල ප්‍රකාශිත කොටස් ලැයිස්තු මිළ ගණන් හා සෙසු පවතින වටිනාකම් සූචක මගින් සනාථ කෙරේ.

කීර්තිනාමය හැර සෙසු වත්කම් සමබන්ධයෙන්, එක් එක් වර්තාකරණ දිනයේදී, පෙර හඳුනාගත් හානිකරණ අලාභ සම්බන්ධ කවර හෝ දර්ශකයක් තවදුරටත් නොපවතිද නැතිනම් පහළ ගොස් ඇතිද යන්න ඇගයුමට ලක් කෙරේ. එබඳු දර්ශකයක් පැවතියහොත්, සමාගම මගින් අදාළ වත්කම හෝ මුදල් උත්පාදන ඒකකයෙහි පියවාගත හැකි වටිනාකම ඇස්තමේන්තුගත කෙරේ. පෙර හඳුනාගන්නා ලද හානිකරණ අලාභයක් ප්‍රතිවර්තනය කරනු ලබන්නේ, අවසන් හානිකරණ අලාභය හඳුනාගන්නා ලද අවස්ථාවේ සිට අදාළ වත්කමෙහි පියවාගත හැකි වටිනාකම නිර්ණය කිරීම සඳහා යොදාගනු ලැබූ උපකල්පනයන්හි වෙනසක් පැවතියහොත් පමණි. මෙම ප්‍රතිවර්තනය, වත්කමෙහි ධාරණ අගය එහි පියවාගත හැකි වටිනාකම ඉක්මවා නොයාම, නැතහොත් ක්ෂය අඩු කළ පසුව නිශ්චය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයාම, පෙර වසර වලදී කිසිදු හානිකරණ අලාභයක් හඳුනානොගැනීම යන කරුණු වලට සීමා වේ. එබඳු ප්‍රතිවර්තනයන් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

## 3.7 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, සහ අදාළ බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ආශ්‍රිත සම්පත් වල පිටතට ගලායාමක් පැවතීමේ හැකියාවක් ඇති විට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 37 - "වෙන්කිරීම, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව" එම බැඳීමේ අගය පිළිබඳව විශ්වසනීය අයුරින් ඇස්තමේන්තුවක් සිදුකළ හැකි විටකදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. අදාළ දිනයේදී බැඳීම ආශ්‍රිත අවදානම් හා අවිනිශ්චිතතාවන් සැළකීමේදී, හඳුනාගනු ලබන වටිනාකම වාර්තාකරණ දිනයේදී වර්තමාන බැඳීම බේරුම් කිරීම සඳහා වන ප්‍රශස්තතම ප්‍රතිශ්ඨාව සම්බන්ධ ඇස්තමේන්තුව වේ. කිසියම් වෙන්කිරීමකට අදාළ වියදමක් කවර හෝ ප්‍රතිපූරණයකින් ශුද්ධව ආදායම් ප්‍රකාශයෙහි ඉදිරිපත් කෙරේ.

## 3.8 ණය ලබාගැනීමේ පිරිවැය

"ණය ලබාගැනීමේ පිරිවැය" සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 23 අනුව, සමූහය මගින් වත්කමක් සුදුසුකම් ලැබීම සඳහා වන අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුව ආරෝපණය කල හැකි ණය ලබාගැනීම් පිරිවැය අදාළ වත්කමෙහි කොටසක් වශයෙන් ප්‍රාග්ධනීකරණය කෙරේ. සුදුසුකම් ලබන වත්කමක් යනු එහි අභිප්‍රේත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට සැළකිය යුතු කාලයක් ගතවන වත්කමකි. සෙසු ණය ලබාගැනීමේ පිරිවැය ඒවා සිදුවන කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

GRI 207-1

## 3.9 ආදායම් බදු

'ආදායම් බදු වියදම' පිළිබඳ විස්තර පිටු අංක 199 සටහන 17 හි දක්වේ.

GRI 207-1

## 3.10 විලම්බිත බදු

'විලම්බිත බදු' පිළිබඳ විස්තර පිටු අංක 262 සටහන 44 හි දක්වේ.

## 3.11 වගා රක්ෂණ ගාස්තුව

2013 අංක 12 දරණ මුදල් පනතෙහි වගන්ති 14 ප්‍රතිපාදන අනුව, 2013 අප්‍රේල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ ගාස්තුව හඳුන්වාදෙන ලද අතර, එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. වර්තමානයේදී, වගා රක්ෂණ ගාස්තුව බදු වලට පසු ලාභයෙන් 1% කි.

## 3.12 මූල්‍ය සේවා මත බදු

එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැංවීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ ගාස්තුව පිළිබඳ විස්තර පිටු අංක 198 සටහන 16 හි දක්වේ.

## 4. නිකුත් කරන ලද නමුත් මෙතෙක් බලාත්මක නොවන ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති පහත දක්වෙන SLFRS ගිණුම්කරණ ප්‍රමිතීන් නිකුත් කරන ලද නමුත් ඒවා 2021 මාර්තු 31 දිනට බලාත්මක නොවිය. ඒ අනුව මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී යොදා නොගැනුනි. පහත දක්වෙන සංශෝධනය අනාවැකි පළ කල හැකි අනාගත කාලයක් සඳහා සමාගමෙහි/සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි වාස්තවික බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 17 - රක්ෂණ ගිවිසුම්**

යනු රක්ෂණ ගිවිසුම් ආශ්‍රිත හඳුනාගැනීම සහ මිනුම්කරණය, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම ආවරනය කෙරෙන පරිපූර්ණ නව ගිණුම්කරණ ප්‍රමිතියකි. බලාත්මක වීමෙන් අනතුරුව, SLFRS 17 මගින් IFRS 4 රක්ෂණ ගිවිසුම් (SLFRS 4) ප්‍රතිස්ථාපනය කෙරේ. නිකුත් කරනු ලබන සමාගම් පිළිබඳ සැළකිල්ලට ගැනීමකින් තොරව, SLFRS 17 සියළුම වර්ග වල රක්ෂණ ගිවිසුම් (එනම්: ජීවිත, ජීවිත නොවන, සෘජු රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ) කෙරෙහි අදාළ වන අතර, ඇතැම් ඇපකර සහ අභිමත සහභාගීත්ව අංග සහිත මූල්‍ය සාධනපත්‍රයන් කෙරෙහිද එය අදාළ වේ.

2013 ජනවාරි 01 හෝ එයට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ. සමාගමක් මගින් එය පළමු වරට SLFRS 17 ආදේශ කර ගනු ලබන දින හෝ එයට පෙර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 9 "මූල්‍ය සාධනපත්‍ර" සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 15 "ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් ආදායම" යන ද්විත්වය සඳහාම අයදුම් කරනු ලබන්නේ නම් කල්තබා අයැදුම් කිරීම සඳහා අනුමැතිය හිමි වේ.

**SLFRS 9, LKAS 39, SLFRS 7, SLFRS 4 සහ SLFRS 16 - පොළී අනුපාත කඩඉම් ප්‍රතිසංස්කරණ (අදියර 1 සහ 2) වෙත සංශෝධන**

පොලී අනුපාත කඩඉම් ප්‍රතිසංස්කරණයන්ගේ සෘජු බලපෑමට ලක් වන සියළුම හෙජින් සබඳතා වෙත අදාළ වන, SLFRS 9 සහ LKAS 39 ප්‍රමිතීන් වෙත සිදුකෙරෙන සංශෝධන මගින් සහන රැසක් සැපයෙනු ඇත. ප්‍රතිසංස්කරණය මගින් හෙජ් අයිතමයේ හෝ හෙජින් සාධනපත්‍රයෙහි කඩඉම මත පදනම් වූ මුදල් ප්‍රවාහ වල කාලග ණනය සහ/හෝ වටිනාකම පිළිබඳ අවිනිශ්චිතතාවක් උද්ගත වුවහොත් හෙජින් සබඳතාවක් කෙරෙහි එය බලපායි.

IBOR ප්‍රතිසංස්කරණ අදියර 2 සහන සහ අමතර හෙළිදරව් කිරීම් රැසකින් සමන්විත වේ. ප්‍රතිසංස්කරණය හේතුවෙන් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හෝ හෙජින් සබඳතාවයන් වෙත වෙනස්කම් සිදුකිරීමට සිදුවන අවස්ථාවන්හිදී SLFRS ප්‍රමිතීන් යොදාගැනීමේදී අදාළ සංශෝධන සමාගම් වෙත උපකාරී වේ.

විවිධ ප්‍රමිතීන් වෙත සිදුකෙරෙන මෙම සංශෝධනයන් 2021 ජනවාරි 1 දින හෝ ඉන් පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක වේ. සමාගම/සමූහය මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරනු ලබයි.

**SLFRS 16 - කෝවිඩ් 19 ආශ්‍රිත කුලී සහන වෙත සංශෝධන**

සංශෝධන මගින් කෝවිඩ් 19 වසංගතයෙහි සෘජු ප්‍රතිවිපාකයක් වශයෙන් උද්ගත වන කුලී සහන සඳහා කල්බදු නවීකරණ ගිණුම්කරණය සම්බන්ධ SLFRS 16 උපදෙස් යොදාගැනීම මගින් බදු ගැණුම්කරුවන් වෙත සහන සපයනු ලැබේ.

ප්‍රායෝගික උපායමාර්ගයක් වශයෙන්, බදුකරුවකු වෙතින් වන කෝවිඩ් 19 කුලී සහනයක් කල්බදු නවීකරණයක්ද යන්න ඇගයුමට ලක් කිරීමට බදු ගැණුම්කරුවකු ඉදිරිපත් නොවිය හැක. මෙම තෝරාගැනීම සිදුකරන බදු ගැණුම්කරුවකු, අදාළ වෙනස කල්බදු නවීකරණයක් නොවන්නේ නම්, SLFRS 16 යටතේ වෙනස සඳහා ගිණුම්ගත වන ආකාරයෙන්ම කෝවිඩ් 19 ආශ්‍රිත කුලී සහනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් වන කවර හෝ කල්බදු ගෙවීමේ වෙනසක් සඳහා ගිණුම්ගත වේ.

මෙම සංශෝධනය 2020 ජූනි 01 හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා අදාළ වේ. මෙම සංශෝධනය සම්බන්ධ කල්තබා අයැදුම්කිරීමේ අනුමැතිය පවතී. කිසියම් සමාගමක් විසින් කල්තබා මෙම සංශෝධනය ආදේශ කරගනු ලැබුවේ නම් ඉහත හෙළදරව් කිරීම එළඹෙන සම්මත සටහන යටතේ ඇතුළත් නොකල යුතු වේ - එය ''ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම්/වසර තුළදී ආදේශ කරගන්නා ලද නව සහ සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිතීන්'' සටහන යටතේ පිළිබිඹු විය යුතු වේ. සමාගම/සමූහය මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරනු ලබයි.

**SLFRS 3 - වෙත සංශෝධන**

සංශෝධන මගින් SLFRS 3 ප්‍රමිතිය යාවත්කාලීන කෙරෙන අතර එහිදී 1989 රාමුව වෙනුවට 2018 සංකල්පීය රාමුව ක්‍රියාත්මක වනු ඇත. ඒවා මගින් SLFRS 3 වෙත, LKAS 37 විෂයපථය ඇතුළත වන බැඳීම් සඳහා, අත්පත් කරගැනීමේ දිනයේදී අතීත සිදුවීම් හේතුවෙන් වර්තමාන බැඳීමක් පවතීද යන්න නිර්ණය කිරීම සඳහා අත්පත් කරගනු ලබන්නා විසින් LKAS 37 යොදාගැනීමේ අවශ්‍යතාවයක්ද එක් කොට ඇත. IFRIC 21 ගාස්තු වල විෂයපථය ඇතුළත පවතින ගාස්තුවක් සඳහා, අත්පත් කරගැනීමේ දිනය වන විට ගාස්තුව ගෙවීමට වගකීමක් උද්ගත කරන්නා වූ බැඳීම් සිදුවීමක් පවතීද යන්න නිර්ණය කිරීම සඳහා අත්පත් කරගනු ලබන්නා විසින් IFRIC 21 යොදා ගනී. අවසානයේදී, සංශෝධන මගින්, අත්පත් කරගනු ලබන්නකු විසින් ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගනු ලබන අසම්භාව්‍ය වත්කම් හඳුනාගනු නොලබන බවට නිශ්චිත ප්‍රකාශයක් එක් කරනු ලබයි.

මෙම සංශෝධන අත්පත් කරගැනීමේ දිනය 2022 ජනවාරි 1 හෝ ඉන්පසු ඇරඹෙන පළමු වාර්ෂික කාලපරිච්ඡේදය හෝ ඉන්පසුව වන ව්‍යාපාර සංයෝජනයන් සඳහා බලාත්මක වේ. සමාගම මගින් එකම අවස්ථාවේ හෝ කලින් සියළුම සෙසු යාවත්කාලීන කල විමසුම් (යාවත්කාලීන කල සංකල්පීය රාමුව සමග ප්‍රකාශිත) සඳහා අයැදුම් කරන්නේ නම් කල්තබා අයැදුම් කිරීමේ අනුමැතිය හිමි වේ. සමාගම/සමූහය මගින් මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරනු ලබයි.

**දේපළ, පිරියත සහ උපකරණ : අභිප්‍රේත භාවිතයට පෙර ලබන මුදල් - LKAS 16 වෙත සංශෝධන**

2021 මාර්තු මස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ: අභිප්‍රේත භාවිතයට පෙර ලබන මුදල් වෙත සංශෝධන ආදේශ කරන ලද අතර, එමගින් සමාගම් වෙත දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැයෙන්, අදාළ වත්කම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි මෙහෙයුම් සිදු කල හැකි තත්ත්වයට පත්කිරීමේදී සහ පරිශ්‍රය වෙත වත්කම රැගෙන ඒමේදී නිෂ්පාදනය කරන ලද අයිතම විකිණීමෙන් ලද කවර හෝ මුදලක් අඩු කිරීම කෙරෙහි තහනමක් පනවන ලදී. ඒ වෙනුවට, සමාගමක් මගින් එබඳු අයිතම විකිණීමෙන් ලද මුදල් සහ එම අයිතම නිෂ්පාදනය කිරීමේ පිරිවැය අදායම් ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ.

මෙම සංශෝධනය 2022 ජනවාරි 01 සහ ඉන්පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන අතර, සමාගම මගින් පළමු වරට සංශෝධනය යොදාගන්නා ලද අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද කලින්ම කාලපරිච්ඡේදය ආරම්භයේදී හෝ ඉන්පසුව භාවිතය සඳහා පැවති දේපළ, පිරියත සහ උපකරණ සඳහා එය අතීතයට බලපාන පරිදි අදාළ කරගත යුතු වේ. සමාගම/සමූහය මගින් මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරනු ලබයි.

**භාරදූර ගිවිසුම් - ගිවිසුමක් සපුරාලීමේ පිරිවැය - LKAS 37 වෙත සංශෝධන**

2021 මාර්තු මස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින්, කිසියම් ගිවිසුමක් භාරදූර හෝ අලාභ ගෙන දෙන බවත් ඇගයීමේදී සමාගමක් විසින් ඇතුළත් කල යුතු පිරිවැය විශේෂිතව දැක්වීම සඳහා LKAS 37 වෙත සංශෝධන ආදේශ කරන ලදී.

සංශෝධන මගින් ''සෘජුව සම්බන්ධිත පිරිවැය එළඹුමක්'' භාවිත කෙරේ. භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වන ගිවිසුමක් වෙත සෘජුව සම්බන්ධිත පිරිවැය වෘද්ධ පිරිවැය සහ ගිවිසුම් ක්‍රියාකාරකම් වෙත සෘජුව සම්බන්ධිත පිරිවැය වෙන්කිරීමක් යන දෙකෙන්ම සමන්විත වේ. සාමාන්‍ය සහ පරිපාලන පිරිවැය ගිවිසුමක් වෙත සෘජුව සම්බන්ධ නොවන අතර ඒවා ගිවිසුම යටතේ නිශ්චිතව ප්‍රතිපාර්ශවයෙන් අයකර ගත නොහැකි නම් බැහැර කෙරේ.

මෙම සංශෝධන 2022 ජනවාරි 01 සහ ඉන්පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ. සමූහය මගින්, එය මෙම සංශෝධන පළමු වරය යොදාගන්නා වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේදී සිය බැඳීම් තවමත් සපුරා නොමැති ගිවිසුම් වෙත මෙම සංශෝධන අදාළ කර ගනු ඇත. සමාගම/සමූහය මගින් මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරනු ලබයි.

**LKAS 1 - වර්තමාන හෝ වර්තමාන නොවන වශයෙන් වගකීම් වර්ගීකරණය: වෙත සංශෝධන**

2021 මාර්තු මස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින්, වර්තමාන හෝ වර්තමාන නොවන වශයෙන් වගකීම් වර්ගීකරණය සම්බන්ධ අවශ්‍යතා විශේෂිතව දැක්වීම සඳහා LKAS 1 හි ඡේද 69 සිට 76 දක්වා වෙත සංශෝධන ආදේශ කරන ලදී. සංශෝධනයන් මගින් පහත දැක්වෙන කරුණු පැහැදිලි කෙරේ:

- කල්දැමීමට අයිතිය යන්නෙහි අදහස
- කල්දැමීමට අයිතිය වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී පැවතිය යුතුය යන්න
- කිසියම් සමාගමක් කල්දැමීමට අයිතිය භාවිත කිරීමට ඇති අවස්ථාව හේතුවෙන් වර්ගීකරණය වෙත බලපෑමක් ඇති නොවේය යන්න
- පරිවර්ත්‍ය වගකීමක අන්තර්ගත ව්‍යුත්පන්නයක් එයම ස්කන්ධ සාධනපත්‍රයක් වන්නේ නම් වගකීමක කොන්දේසි එහි වර්ගීකරණය කෙරෙහි බලනොපායි.

මෙම සංශෝධන 2022 ජනවාරි 01 සහ ඉන්පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන අතර ඒවා අතීතයට බලපාන පරිදි අදාළ කොට ගත යුතු වේ. සමාගම/සමූහය මගින් මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරනු ලබයි.

## 5. දළ ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමූහය තුළට ආර්ථික ප්‍රතිලාභ ගලා එන තාක් දුරට සහ ආදායම් විශ්වාසනීය අයුරින් මැනියහැකි දුරට ආදායම් හඳුනාගැනේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 6.1 | 189 | **24,983,445** | 31,459,108 | **26,821,838** | 33,282,879 |
| ශුද්ධ ඉපැයුම් ආදායම | 7. | 190 | **-** | - | **5,028,549** | 5,202,030 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 8. | 181 | **1,818,675** | 1,694,014 | **1,198,054** | 1,165,632 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - FVTPL | 9 | 192 | **162,616** | 11,017 | **228,258** | 19,586 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 10 | 192 | **139,062** | 435,175 | **368,566** | 384,703 |
| එකතුව | | | **27,103,798** | 33,599,314 | **33,645,265** | 40,054,830 |

## 6. ශුද්ධ පොලී ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**ආදායම් සහ වියදම් හා හඳුනාගැනීම**

සමූහය තුළට ආර්ථික ප්‍රතිලාභ ගලා එන තාක් දුරට සහ ආදායම් විශ්වාසනීය අයුරින් මැනියහැකි දුරට ආදායම් හඳුනා හඳුනාගැනේ

**පොලී ආදායම සහ වියදම්**

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන සියළුම මූල්‍ය සාධන පත්‍රයන් සඳහා පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාතික භාවිත කරමින් වාර්තා කෙරේ. සඵල පොලී අනුපාතිකය යනු මූල්‍යමය සාධන පත්‍රය මගින් එහි ජීව කාලය හෝ යෝග්‍ය අවස්ථාවන්හිදී කෙටි කාලයකට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් අදාල මූල්‍ය වත්කම් එහි හෝ මූල්‍ය වගකීම් එහි ශුද්ධ ධාරණ අගය ට වට්ටම් කරනු ලබන අලුත් අනුපාතය වන අතර එහිදී සඵල පොලී අනුපාතයෙහි සාධනීය අංගයක් වන සාධන පත්‍රයට ඍජුව ආරෝපණය කළ හැකි කවර හෝ ගාස්තු හෝ වර්ධන පිරිවැය ඇතුළත් වන අතර නමුත් අනාගත ණය අලාභ ඇතුලත් නොවේ.

සමූහය මගින් එහි ගෙවීම් හෝ ලැබීම් ඇස්තමේන්තු සංශෝධනය කරන්නේ නම් මූල්‍ය වත්කම් හි හෝ වගකීම් වල ධාරණ අගය ගලපනු ලැබේ. ගලපන ලද ධාරන අගය මුල් සඵල පොලී අනුපාතිකය පදනම් කරගනිමින් ගණනය කෙරෙන අතර ධාරණ අගයෙහි වෙනස මූල්‍ය වත්කම් සඳහා පොලී ආදායම ලෙස සහ මූල්‍ය වගකීම් සඳහා පොලී වියදම වශයෙන් වාර්තා කෙරේ. කෙසේ වුවද, අදාල මුදල් ලැබීම් වල අයකර ගැනීමේ හැකියාව ඉහල යාමේ ප්‍රතිඵලයක් වශයෙනි. සමාගම මගින් පසුව අනාගත මුදල් ලැබීම් වල ඇස්තමේන්තු පසුව ඉහළ නංවන අවස්ථාවක ප්‍රතිවර්ගීකරණය කරන ලද වත්කමක් සඳහා, ඉහළ යාමේ බලපෑම ඇස්තමේන්තුව වෙනස් කල දිනයේ සිට සඵල පොලී අනුපාතිකය වෙත ගැලපුමක් වශයෙන් හඳුනා ගැනේ.

SLFRS 9 යටතේ, පිළිවෙලින් ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනින ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා පොලී ආදායම සහ පොලී වියදම සඵල පොලී අනුපාතිකය භාවිත කරමින් වාර්තා කෙරේ.

ආදායම් හඳුනාගත හැකි වන්නේ ගනුදෙනුව ආශ්‍රිත හිමිවිය හැකි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ දී පමණි. කෙසේ වුවද, අයකර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවක් පැන ලැබුනහොත් ආදායම් හඳුනාගැනීම අවසන් වේ. SLFRS 9 - මූල්‍ය සාධනපත්‍ර ගනුදෙනුකාර පැහැර හැරීමේ අවස්ථාව (අයකර ගැනීම් පිළිබඳ අවිනිශ්චිතතාව)ආදේශ කර ගැනීමත් සමග ගෙවිය යුතු දිනයෙන් දින අනුවක් වශයෙන් වෙනස් කෙරිනි. ඒ අනුව පොලී ආදායම හඳුනාගත හැක්කේ ගෙවිය යුතු දිනයෙන් දින (90) ක් දක්වා පමණි.

**ගෙවීම කල්පසු වූ කුලී මත පොලිය**

ගෙවීම කල්පසු වූ කුලී මත පොලිය මුදල් පදනමකින් ගිණුම්ගත කොට ඇත.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 6.1 | 189 | **24,983,445** | 31,459,108 | **26,821,838** | 33,282,879 |
| පොලී වියදම | 6.2 | 189 | **13,064,310** | 15,786,586 | **13,375,197** | 16,110,935 |
| ශුද්ධ පොලී ආදායම | | | **11,919,135** | 15,672,522 | **13,446,641** | 17,171,944 |

### 6.1 පොලී ආදායම

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 |
|---|---|---|---|---|---|---|
| මුදල් සහ මුදල් සමාන දෑ | | | **73,753** | 40,471 | **103,501** | 70,219 |
| බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ශේෂයන් | | | **340,778** | 385,414 | **471,229** | 510,760 |
| ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය අනුව | 6.1.1 | 189 | **24,190,261** | 30,280,577 | **25,589,345** | 31,530,367 |
| ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය අනුව | | | **378,653** | 752,646 | **657,763** | 1,171,533 |
| මුළු පොලී ආදායම | | | **24,983,445** | 31,459,108 | **26,821,838** | 33,282,879 |

### 6.1.1 පොලී ආදායම - ණය සහ ලැබිය යුතු දෑ

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 |
|---|---|---|---|---|
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | **14,176,359** | 17,767,878 | **14,178,588** | 17,770,273 |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | **5,479** | 34,709 | **823,834** | 822,222 |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දෑ | **10,008,423** | 12,477,990 | **10,586,923** | 12,937,872 |
| එකතුව | **24,190,261** | 30,280,577 | **25,589,345** | 31,530,367 |

### 6.2 පොලී වියදම්

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 |
|---|---|---|---|---|---|---|
| බැංකු වෙත ගෙවිය යුතු | 6.2.1 | 190 | **671,106** | 1,736,221 | **949,639** | 2,066,943 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 6.2.1 | 190 | **10,228,458** | 11,530,604 | **10,316,632** | 11,595,328 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | 6.2.1 | 190 | **1,935,761** | 2,281,180 | **1,916,991** | 2,264,940 |
| කල්බදු වගකීම් | 6.2.1 | 190 | **228,985** | 238,581 | **191,935** | 183,724 |
| මුළු පොලී වියදම් | | | **13,064,310** | 15,786,586 | **13,375,197** | 16,110,935 |

6.2.1. පොලී වියදම් - සැලසුම් වශයෙන්

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 |
|---|---|---|---|---|---|---|
| **බැංකු වෙත ගෙවිය යුතු** | | | | | | |
| බැංකු අයිරාව මත පොලිය | | | **1,272** | 2,511 | **25,769** | 31,811 |
| කෙටි කාලීන ණය මත පොලිය | | | **14,963** | 286,526 | **16,372** | 286,659 |
| කාලසීමා ණය මත පොලිය | | | **4,980** | 402,721 | **257,608** | 704,009 |
| සුරක්ෂිතකරණය මත පොලිය | | | **649,891** | 1,044,463 | **649,890** | 1,044,464 |
| අනුඑකතුව | | | **671,106** | 1,736,221 | **949,639** | 2,066,943 |
| **ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු** | | | | | | |
| තැන්පතු මත පොලිය | | | **10,228,458** | 11,530,604 | **10,316,632** | 11,595,328 |
| අනුඑකතුව | | | **10,228,458** | 11,530,604 | **10,316,632** | 11,595,328 |
| **නිකුත් කරන ලද ණය සුරැකුම්** | | | | | | |
| ණයකර මත පොලිය | 37.1 | 252 | **1,935,761** | 2,281,180 | **1,916,991** | 2,264,940 |
| අනුඑකතුව | | | **1,935,761** | 2,281,180 | **1,916,991** | 2,264,940 |
| **කල්බදු වගකීම්** | | | | | | |
| SLFRS 16-වාරිකමය ණය ලබාගැනීමේ පිරිවැය | 40 | 257 | **228,985** | 238,581 | **191,935** | 183,724 |
| අනුඑකතුව | | | **228,985** | 238,581 | **191,935** | 183,724 |
| මුළු පොලී වියදම් | | | **13,064,310** | 15,786,586 | **13,375,197** | 16,110,935 |

## 7. ශුද්ධ ඉපැයුම් වාරිකය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**රක්ෂණ ගිවිසුම් සහ ආයෝජන ගිවිසුම් වල සැලසුම් වර්ගීකරණය**

SLFRS (4) "රක්ෂණ ගිවිසුම්" සඳහා පවරනු ලබන රක්ෂණ අවදානම් මට්ටම මත පදනම්ව රක්ෂකයා විසින් රක්ෂණ ගිවිසුම් හෝ ආයෝජන ගිවිසුම් වශයෙන් වර්ගීකරණය කරමින් ලියන ලද ගිවිසුම් වීම අවශ්‍ය වේ.

රක්ෂණ ගිවිසුම් යනු රක්ෂණ වර හිමියන් වෙත විශේෂිත අවිනිශ්චිත අනාගත සිදුවීමක්( රක්ෂිත සිදුවීම්) හේතුවෙන් අහිතකර බලපෑමක් ඇති වූ විට අදාල රක්ෂණ වර හිමියන් වෙත හානිපූරණය කෙරෙහි සමූහය (රක්ෂකයා) එකඟවෙමින් වෙනත් පාර්ශවයක් (රක්ෂණ වර හිමියන්) වෙතින් සැලකිය යුතු රක්ෂණ අවදානමක් බාරගන්නා ගිවිසුම් වේ. පොදු මාර්ගෝපදේශයක් වශයෙන්, රක්ෂිත සිදුවීම සිදුනොවුවහොත් සමාගම මගින් ගෙවන ලද ප්‍රතිලාභ සහ ගෙවිය යුතු ප්‍රතිලාභ සංසන්දනය කරමින් සැලකිය යුතු රක්ෂණ අවදානමක් ඇති ද යන්න නිර්ණය කරන අතර රක්ෂණ ගිවිසුම් වලදී මූල්‍ය අවදානම පැවරීමද සිදුකළ හැකිවේ.

ආයෝජන ගිවිසුම් යනු සැලකිය යුතු රක්ෂණ අවදානමක් නොමැති සැලකිය යුතු මූල්‍ය අවදානමක් පැවරෙන ගිවිසුම් වේ. මූල්‍ය අවදානම යනු නිශ්චිත පොලී අනුපාතයක, මූල්‍ය සාදනපත්‍ර මිලක, විදේශ විනිමය අනුපාතයක, මිල හෝ අනුපාත ලැයිස්තුවක , ණය ශ්‍රේණිගත කිරීම් හෝ වෙනත් විචල්‍යයන් වල සිදුවිය හැකි අනාගත වෙනසක් හේතුවෙන් උද්ගත වන අවදානම වේ.

රක්ෂණ ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් වශයෙන් වර්ගීකරණය කළ පසු, හිමිකම් සහ බැඳීම් අවසන් වීම හෝ කල් ඉකුත් වීම සිදු නොවුණේ නම්, මෙම කාල සීමාව තුළ රක්ෂණ අවදානම සැලකිය යුතු ආකාරයෙන් අඩු වුවද රක්ෂණ ගිවිසුම්ක් එහි ඉතිරි ජීව කාලය තුළ රක්ෂණ ගිවිසුමක් වශයෙන් පවතී. කෙසේ වුවද රක්ෂණ අවදානම ආරම්භ වීම සැලකිය යුතු මට්ටමකට පැමිණි පසු ආයෝජන ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් වශයෙන් ප්‍රතිවර්ගීකරණය කළ හැකි වේ.

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී ( පීපල්ස් ලීසිං හි පරිපාලිතය) අලෙවි කරනු ලබන සියලුම සැලසුම් රක්ෂණ සැලසුම් වන බැවින් SLFRS 4 - රක්ෂණ ගිවිසුම් යටතේ රක්ෂණ ගිවිසුම් වශයෙන් වර්ග කෙරේ. එම නිසා වාර්තාකරන දින වන විට සමූහයේ සැලසුම් කළඹ තුල කිසිදු ආයෝජන ගිවිසුමක් නොවීය.

**දළ ලිඛිත වාරිකයෙහි ආදායම් හඳුනාගැනීම**

දළ ලිඛිත වාරිකය (GWP) මගින් අවදානම් භාරගැනීම වෙනුවෙන් සමාගම් විසින් අයකරනු ලබන වාරිකය නියෝජනය කෙරෙන අතර උපචිතීය පදනමක් මත ගිණුම්ගත කෙරේ.

දළ ලිඛිත වාරිකය, ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මගින් සපයන ලද, මුළු ආවරන කාලපරිච්ඡේදයට අදාළ ලද/ලැබිය යුතු සමස්ත වාරික වලින් සමන්විත වන අතර රක්ෂණවරය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනාගැනේ.

හිමිකම් නොපෑමේ ප්‍රතිදානය වැනි වාරික අනුපාතයෙහි කොටසක් සම්ප්‍රයුක්ත කරනු ලබන ප්‍රතිදානයන් දළ ලිඛිත වාරිකයෙන් අඩු කෙරේ.

**රක්ෂණ - දළ ලිඛිත වාරිකයෙහි ආදායම් හඳුනාගැනීම**

ජීවිත නොවන රක්ෂණ දළ ලිඛිත වාරිකය, ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මගින් සපයන ලද, මුළු ආවරන කාලපරිච්ඡේදයට අදාළ ලැබිය යුතු සමස්ත වාරික වලින් සමන්විත වන අතර රක්ෂණවරය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනාගැනේ.

**ප්‍රතිරක්ෂණ වාරිකය**

ජීවිත නොවන දළ ප්‍රතිරක්ෂණ වාරිකය, කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මගින් සපයන ලද, මුළු ආවරනයට අදාළ ගෙවිය යුතු සමස්ත ප්‍රතිරක්ෂණ වාරිකයෙන් සමන්විත වන අතර රක්ෂණවරය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනාගැනේ. පෙර ගිණුම්කරණ කාලපරිච්ඡේදයන්හිදී ඇරඹුනු ප්‍රතිරක්ෂණගිවිසුම් සම්බන්ධයෙන්, මෙම ගිණුම්කරණ කාලපරිච්ඡේදයේදී උද්ගත වූ කවර හෝ ගැළපුම් ද වාරිකයෙහි ඇතුළත් වේ.

**නොඉපැයූ වාරික සංචිතය**

නොඉපැයූ වාරික සංචිතය මගින් කල්ඉකුත් නොවූ ආවරන කාලසීමාවට අදාළ වසර තුළදී ලියන ලද වාරික කොටස නියෝජනය වේ. නොඉපැයූ වරික 365 පදනමින් ගණනය කෙරේ.

**නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතය**

නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය යනු, වසරකදී ලියන ලද වාර්තාකරණ දිනයෙන් පසු අවදානම් කාලපරිච්ඡේදයන් හා සම්බන්ධ වාරිකයේ කොටස වේ. නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය පාදක වන සෘජු රක්ෂණවරයන්ගේ කාලසීමාව පුරා වෙනස් වේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| දළ ලිඛිත වාරිකය | - | - | **6,133,052** | 5,958,629 |
| අඩුකිරීම: ප්‍රතිරක්ෂකයින් වෙත පවාරනය කරනෙ ලද වාරිකය | - | - | **956,324** | 631,221 |
| අඩු කිරීම: නොඉපැයූ වාරික සංචිතයේ වෙනස | - | - | **148,179** | 125,378 |
| එකතුව | - | - | **5,028,549** | 5,202,030 |

## 8. ගාස්තු සහ කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**ගාස්තු සහ කොමිස් ආදායම**

සමූහය මගින් සිය ගනුදෙනුකරුවන් වෙත පිරිනමනු ලබන සේවා රාශිය වෙනුවෙන් ගාස්තු හා කොමිස් ආදායම අයකරගැනේ. කොමිස් ආදායම උපචිත පදනමක් මත හඳුනාගැනේ. ගාස්තු ආදායම පහත දැක්වෙන කාණ්ඩ දෙකට බෙදිය හැකි වේ;

**නිශ්චිත කාලසීමාවක් තුළ සපයන ලද සේවාවන්ගේ උපයන ගාස්තු ආදායම**

යම් කාලසීමාවක් තුළ සපයන ලද සේවාවන්ගේ උපයන ගාස්තු එම කාලසීමාව පුරා උපචිත කෙරේ.

**ගනුදෙනු සේවාවන් සැපයීම මගින් ගාස්තු ආදායම**

ලේඛණ සැකසීම සහ මෝටර් රථයක් පරීක්ෂා කිරීම වැනි ගනුදෙනුවක් සාකච්ඡා කිරීමෙන් හෝ තෙවන පාර්ශවයක් සඳහා ගනුදෙනුවක් සාකච්ඡා කිරීමකදී උපදින ගාස්තු එයට පාදක වන ගනුදෙනුව සම්පූර්ණ වීමේදී හඳුනාගැනේ. කිසියම් කාර්යසාධනයක් සම්බන්ධ ගාස්තු හෝ සංරචක අදාළ ක්‍රියාපටිපාටිය සම්පූර්ණ කිරීමෙන් පසු හඳුනාගැනේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| සේවා ගාස්තු | **583,452** | 642,507 | **149,021** | 201,485 |
| සෙසු ගාස්තු සහ කොමිස් | **1,235,223** | 1,051,507 | **1,049,033** | 964,147 |
| එකතුව | **1,818,675** | 1,694,014 | **1,198,054** | 1,165,632 |

### 9. මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - FVTPL

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

මෙය ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් වල උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ සාධාරණ අගය වෙනස්වීම් ඇතුලුව සාධාරණ අගයෙහි වෙනස්වීමෙන් වන සියළුම ලාභ සහ අලාභ වලින් සමන්විත වේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021<br>රු. '000 | 2020<br>රු. '000 | 2021<br>රු. '000 | 2020<br>රු. '000 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - FVTPL | | | | |
| ශුද්ධ වෙළඳපොල (අලාභ)/ලාභ | **(10,455)** | 4,772 | **25,864** | 11,448 |
| ශුද්ධ ප්‍රාග්ධන ලාභය | **173,071** | 6,245 | **202,394** | 8,138 |
| එකතුව | **162,616** | 11,017 | **228,258** | 19,586 |

### 10. වෙනත් මෙහෙයුම් ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

වෙනත් මෙහෙයුම් ආදායම සමූහයේ සාමාන්‍ය මෙහෙයුම් වලට සම්බන්ධ නොවන වෙනත් මූලයන්ගෙන් උපයන ලද ආදායමෙන් සමන්විත වන අතර උපචිත පදනමින් හඳුනාගැනේ

**දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීම මත වන ලාභය**

දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීම මත වන ලාභය හෝ අලාභය අදාළ අලෙවිය සිදුකරන ලද කාලපරිච්ඡේදයේදී ආදායම ප්‍රකාශයෙහි මුදල් පදනමින් ගිණුම්ගත කෙරේ

**කුලියට දීමෙන් ආදායම**

වසර සඳහා හිමිකරු සහ කුලීකරු අතර ඇති වූ එකගත්වය මත මෝටර් රථ කුලියට දීමෙන් වන කුලී ආදායම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

**මෙහෙයුම් කල්බදු ආදායම**

මෙහෙයුම් කල්බදු ආදායම දැනට පවතින කල්බදු වල කොන්දේසි අනුව සරල රේඛීය පදනමින් ගිණුම්ගත කෙරෙන අතර ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් ආදායම යටතේ වාර්තා කෙරේ.

**ආයෝජන දේපල වලින් කුලී ආදායම**

ආයෝජන දේපල වලින් කුලී ආදායම උපචිත පදනමින් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

**මෝටර් රථ අලෙවි කිරීමෙන් ශුද්ධ වෙළඳ ආදායම**

ආනයනිත මෝටර් රථ අලෙවියෙන් ලැබෙන ආදායම සාමාන්‍යයෙන් අදාළ රථය ලබාදීමේදී එනම් හිමිකාරීත්වය සම්බන්ධ සැළකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ පැවරීමෙන් පසු හඳුනාගැනේ.

**ලාභාංශ ආදායම**

ගෙවීම ලැබීම අයිතිය ස්ථාපනය වූ පසු ලාභාංශ ආදායම හඳුනාගැනේ.

**ආයෝජන දේපළ විකිණීමෙන් ලාභය/(අලාභය)**

ආයෝජන දේපළ විකිණීමෙන් ලාභ හෝ අලාභ අදාළ අලෙවිය සිදුකරන ලද කාලපරිච්ඡේදයේදී ආදායම ප්‍රකාශයෙහි මුදල් පදනමින් ගිණුම්ගත කෙරේ.

**තක්සේරු ආදායම**

ඒවා උපලබ්ධි වූ පසු හෝ උපලබ්ධි කල හැකි විට තක්සේරු ආදායම හඳුනාගැනේ.

**රක්ෂණ ගාස්තු ආදායම**

රක්ෂණවර පරිපාලන සේවා සහ වෙනත් ගිවිසුම්ගත ගාස්තු වෙනුවෙන් රක්ෂණවර හිමියන්ගෙන් අය කිරීම් සිදු කෙරේ ලද පසු හෝ ගෙවීමට නියමිත වූ විට මෙම ගාස්තු හඳුනාගැනේ.

**වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීම මත වන ලාභය | 22,823 | 6,183 | 74,774 | 6,183 |
| කුලියට දීමෙන් ආදායම | - | - | 24,939 | 26,583 |
| මෙහෙයුම් කල්බදු ආදායම | - | - | 27,487 | 29,061 |
| ආයෝජන දේපල වලින් කුලී ආදායම | - | - | 72,248 | 90,284 |
| මෝටර් රථ අලෙවි කිරීමෙන් ශුද්ධ වෙළඳ ආදායම | 4,620 | 301 | 4,620 | 301 |
| FVOCI වෙතින් ලාභාංශ ආදායම | 640 | 14,658 | 640 | 14,658 |
| - පරිපාලිත | 110,000 | 406,750 | - | - |
| - FVTPL | 33 | 1,683 | 278 | 2,622 |
| ආයෝජන දේපළ විකිණීමෙන් ලාභය/(අලාභය) | - | - | - | - |
| තක්සේරු ආදායම | - | - | 92,166 | 108,448 |
| රක්ෂණ ගාස්තු ආදායම | - | - | 55,761 | 54,838 |
| වෙනත් ආදායම් | 946 | 5,600 | 15,653 | 51,725 |
| එකතුව | 139,062 | 435,175 | 368,566 | 384,703 |

### 11. ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායනය සහ වෙනත් අලාභ

#### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහයේ සමාගම මගින් SLFRS& (9) අනුව මූල්‍ය සාදනපත්‍ර ඇගයුමට ලක් කරමින් ණය සහ ලැබිය යුතු දෑ ද සම්බන්ධ අපහායනය ප්‍රතිපාදන වල වෙනස්වීම් හඳුනාගනු ලැබේ සමාගම් සහ සමූහය මගින් ඒ සඳහා යොදාගනු ලබන ක්‍රමවේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිටු අංක ද (216) සටහන් (25) පැහැදිලි කෙරේ.

**කපාහැරීම ඇතුළුව ඇප බැහැර කිරීම් මත අලාභය**
අයකරගැනීමේ ප්‍රායෝගික අවස්ථාවක් නො නොමැති විටදී ණය සහ ලැබිය යුතු දෑ කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් කපා හැරේ ණය සහ ලැබිය යුතු ද පියවා ගැනීමේ දී සාමාන්‍යයෙන් ඇපය උපලබ්ධි කිරීමෙන් කවර හෝ ආදායමක් ලැබීමෙන් මෙය සිදු කෙරේ.

කපා හැරුනු ණය/ බැහැර කරන ලද අලාභ අය කර ගැනීම.

බොල් ණය සහ අවිනිශ්චිත ණය වශයෙන් කපා හැරුණු මුදල් අය කර ගැනීම මුදල් පදනමකින් හඳුනා ගැනේ.

**වෙනත් ලැබිය යුතු දේ**
මෙයට වෙනත් වත්කම් සඳහා අපහායන ඇතුළත් වේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 | සමාගම 2020 | සමූහය 2021 | සමූහය 2020 |
|---|---|---|---|---|---|---|
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| කේවල අපහායනය | 11.3/11.4 | 195 | (148,063) | 839,569 | (260,794) | 952,300 |
| සාමූහික අපහායනය | 11.3/11.4 | 195 | 665,766 | 2,966,327 | 971,185 | 2,940,618 |
| වෙනත් ලැබිය යුතු දේ | 11.1/11.2 | 194 | 18,672 | - | 55,707 | 34,346 |
| කපාහැරීම ඇතුළුව ඇප බැහැර කිරීම් මත අලාභය | | | 603,692 | 953,786 | 683,057 | 1,090,659 |
| කපා හැරුනු ණය/ බැහැර කරන ලද අලාභ අය කර ගැනීම | | | (96,230) | (112,999) | (96,666) | (116,021) |
| එකතුව | 11.1/11.2 | 194 | 1,043,837 | 4,646,683 | 1,352,489 | 4,901,902 |

11. 1 ණය සඳහා අපහායනය/(ප්‍රතිවර්තනය) සහ සෙසු අලාභ (විස්තරය) - සමාගම

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2021 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) | ගාස්තුව | (ප්‍රතිවර්තනය) | ශුද්ධ වටිනාකම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | **293,766** | **1,519,992** | **(1,733,151)** | **80,607** |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | **(5,316)** | **74,128** | **(10,712)** | **58,100** |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දේ | **219,012** | **3,109,114** | **(2,441,668)** | **886,458** |
| වෙනත් ලැබිය යුතු දේ | **-** | **18,672** | **-** | **18,672** |
| එකතුව | **507,462** | **4,721,906** | **(4,185,531)** | **1,043,837** |

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2020 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) | ගාස්තුව | (ප්‍රතිවර්තනය) | ශුද්ධ වටිනාකම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 586,795 | 2,524,239 | (829,916) | 2,281,118 |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | (9,027) | 58,737 | (11,526) | 38,184 |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දේ | 263,019 | 3,065,761 | (1,001,399) | 2,327,381 |
| එකතුව | 840,787 | 5,648,737 | (1,842,841) | 4,646,683 |

11. 2 ණය සඳහා හානිකරණ ගාස්තුව/(ප්‍රතිවර්තනය) සහ සෙසු අලාභ (විස්තරය) - සමූහය

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2021 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) | ගාස්තුව | (ප්‍රතිවර්තනය) | ශුද්ධ වටිනාකම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | **293,330** | **1,519,992** | **(1,733,151)** | **80,171** |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | **2,437** | **194,347** | **(10,712)** | **186,072** |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දේ | **290,624** | **3,181,582** | **(2,441,667)** | **1,030,539** |
| වෙනත් ලැබිය යුතු දේ | **-** | **55,707** | **-** | **55,707** |
| එකතුව | **586,391** | **4,951,628** | **(4,185,530)** | **1,352,489** |

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2020 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) | ගාස්තුව | (ප්‍රතිවර්තනය) | ශුද්ධ වටිනාකම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 720,646 | 2,524,239 | (829,916) | 2,414,969 |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | (9,027) | 210,150 | (11,526) | 189,597 |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දේ | 263,019 | 3,089,724 | (1,089,753) | 2,262,990 |
| වෙනත් ලැබිය යුතු දේ | - | 34,346 | - | 34,346 |
| එකතුව | 974,638 | 5,858,459 | (1,931,195) | 4,901,902 |

11. 3 ආදායම් ප්‍රකාශය වෙත හානිකරණ ගාස්තුව - සමාගම

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2021 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දේ | | | | |
| - කේවල අපහායනය | **-** | **-** | **(148,063)** | **(148,063)** |
| - සාමූහික අපහායනය | **156,312** | **(69,899)** | **579,353** | **665,766** |
| එකතුව | **156,312** | **(69,899)** | **431,290** | **517,703** |

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2020 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දේ | | | | |
| - කේවල අපහායනය | - | - | 839,569 | 839,569 |
| - සාමූහික අපහායනය | (18,943) | 499,561 | 2,485,709 | 2,966,327 |
| එකතුව | (18,943) | 499,561 | 3,325,278 | 3,805,896 |

11.4 ආදායම් ප්‍රකාශය වෙත හානිකරණ ගාස්තුව - සමූහය

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2021 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දේ | | | | |
| - කේවල අපහායනය | **-** | **-** | **(260,794)** | **(260,794)** |
| - සාමූහික අපහායනය | **244,872** | **(71,348)** | **797,661** | **971,185** |
| එකතුව | **244,872** | **(71,348)** | **536,867** | **710,391** |

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2020 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දේ | | | | |
| - කේවල අපහායනය | - | - | 952,300 | 952,300 |
| - සාමූහික අපහායනය | 9,901 | 602,968 | 2,327,749 | 2,940,618 |
| එකතුව | 9,901 | 602,968 | 3,280,049 | 3,892,918 |

## 12. කාර්ය මණ්ඩල වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

කාර්ය මණ්ඩල වියදම් වැටුප්, දිරිදීමනා, සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ සහ සෙසු ආශ්‍රිත වියදම් වලින් සමන් සමන්විත වේ. බැඳීමක් පියවීම් සඳහා ආර්ථික ප්‍රතිලාභ ආශ්‍රිත සම්පත් ඉවතට ගලායෑමක් සිදු කළ යුතු බවට සහ බැඳීමේ වටිනාකම පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදුකල හැකි විටකදී දිරිදීමනා සඳහා ප්‍රතිපාදන හඳුනාගැනේ.

සේවකයින් සේවක අර්ථ අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබයි.

ශ්‍රී ලංකා ගිණුම් ගිණුම්කරණ ප්‍රමිති LKAS 19 - සේවක ප්‍රතිලාභ අනුව පාරිතෝෂික වගකීම් සම්බන්ධයෙන්ව ආයු ගණන තක්සේරුවක් මත පදනම්ව ආදායම් ප්‍රකාශයේදී විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් හඳුනාගැනේ.

| | | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | | | 2021 | 2020 | 2021 | 2020 |
| | සටහන | පිටු අංකය | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වැටුප් | | | **3,117,406** | 3,361,639 | **3,928,410** | 4,152,280 |
| සේවක ප්‍රතිලාභ - නිර්වචනිත දායකත්ව සැලසුම් - EPF | | | **188,764** | 182,755 | **237,748** | 227,447 |
| සේවක ප්‍රතිලාභ - නිර්වචනිත දායකත්ව සැලසුම් - ETF | | | **47,461** | 45,666 | **58,590** | 56,795 |
| සේවක ප්‍රතිලාභ - විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂිකය | 43 | 259 | **111,742** | 111,325 | **129,888** | 124,504 |
| එකතුව | | | **3,465,373** | 3,701,385 | **4,354,636** | 4,561,026 |

## 13. ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**ක්ෂය වීම්**

දේපල, පිරියත සහ උපකරණ වල එක් එක් කොටසක ඇස්තමේන්තුගත සඵල ජීව කාලය පුරා ඒවායේ අවශේෂ වටිනාකම් වෙත සරල රේඛීය පදනමකින් ආදායම් ප්‍රකාශයේ දී ක්ෂය වීම් හඳුනා ගනී මෙම ක්‍රමය මගින් අදාල වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත ක්‍රමය සමීපව පිළිබිඹු කෙරේ ඉඩම් ක්ෂය වීමට ලක් නොවේ.

අපේක්ෂිත සඵල ජීවකාලයන් පහත දැක්වෙන පරිදි වේ;

| වත්කම් කාණ්ඩය | වසරකට % | කාලසීමාව |
|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2 | අවුරුදු 50 |
| බදු දේපළ වැඩිදියුණු කිරීම් | 25 | අවුරුදු 4 |
| මෝටර් රථ | 12.5 - 20 | අවුරුදු 5 - 8 |
| පරිගනක දෘඩාංග | 20 | අවුරුදු 5 |
| කාර්යාල උපකරණ | 10 - 20 | අවුරුදු 5 -10 |
| ගෘහභාණ්ඩ සහ මෙවලම් | 20 | අවුරුදු 5 |

ඉහත දැක්වෙන අනුපාතයන් සමූහයේ සියලුම ආයතන මගින් භාවිත කෙරේ කළමනාකාරීත්වය විසින් අදහස් කරන පරිදි භාවිතයට සුදුසු තත්ත්වයට පත්කිරීමෙන් අනතුරුව දේපල, පිරියත සහ උපකරණ වල එක් එක් සැලකිය යුතු කොටස් සඳහා ක්ෂයවීමේ අනුපාතයන් වෙන වෙනම තීරණය කෙරේ. කිසියම් වත්කමක් විකිණීම සඳහා රඳවාගෙන ඇති බවට හෝ අදාල වත්කම් හඳුනාගැනීමෙන් බැහැර කිරීම යන දින දෙකෙන් කලින් එලඹෙන දිනයේදී වත්කමක ක්ෂයවීම අවසන් වේ. එක් එක් වාර්තා කරන දිනයේ දී ක්ෂයවීමේ ක්‍රම, සඵල ජීව කාලයන් සහ අවශේෂ වටිනාකම් ප්‍රතිතක්සේරු ගතකොට සුදුසු පරිදි ගලපනු ලැබේ.

වසර ආරම්භයේ දී සහ වසර අවසානයේදී ධාරණ අගයන් සහ සමුච්චිත ක්ෂයවීම් ගැලපුම් ද ඇතුළත්ව සියලුම දේපල පිරියත සහ උපකරණ කාණ්ඩයන් පිටු අංක (241) සටහන් (32) හි දැක්වේ.

**භාවිත හිමිකම් වත්කම් ක්‍රමක්ෂය**

භාවිත හිමිකම් වත්කම් පසුව ක්ෂයවීමට ලක් වේ වත්කමෙහි සඵල ජීවකාලය සහ කල්බදු කාලසීමාව යන දෙකෙන් කෙටි කාලසීමාව පුරා ක්ෂයවීම සිදුකෙරේ (පිටු අංක 245 සටහන 33).

**අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය**

පහත දක්වෙන විශේෂිත අනුපාතයන් අනුව ඒවායේ ඇස්තමේන්තුගත සඵල ජීවකාලය පුරා අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය ලියාහැරීම සඳහා සරල රේඛීය ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය ගණනය කෙරේ:

| වත්කම් කාණ්ඩය | වසරකට % | කාලසීමාව |
|---|---|---|
| පරිගනක මෘදුකාංග | 20 | අවුරුදු 5 |

අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය නොකරන ලද ශේෂයන් හානිකරණය සඳහා වාර්ෂිකව සමාලෝචනයට ලක් කරන අතර හානිකරනය පිළිබඳ කවර හෝ දර්ශකයක් ඇත්නම් තවදුරටත් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ වලින් අය කර ගත නො හැකි තාක් දුරට ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

වසර ආරම්භයේදී සහ අවසානයේදී ධාරණ අගයන් සහ සමුච්චිත ක්‍රමක්ෂය සම්බන්ධ සැසැඳුමක් සමගින් සියලුම අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩයන් පිටු අංක 246 සටහන 34 හි දක්වේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2021 රු. '000 | සමාගම 2020 රු. '000 | සමූහය 2021 රු. '000 | සමූහය 2020 රු. '000 |
|---|---|---|---|---|---|---|
| දේපල පිරියත සහ උපකරණ | 32 | 241 | **167,360** | 164,492 | **292,245** | 292,404 |
| ක්‍රමක්ෂය - භාවිත හිමිකම් වත්කම් | 33 | 245 | **543,769** | 538,230 | **340,349** | 332,830 |
| ක්‍රමක්ෂය - අස්පෘශ්‍ය වත්කම් | 34 | 246 | **11,865** | 14,299 | **15,099** | 10,764 |
| එකතුව | | | **722,994** | 717,021 | **647,693** | 635,998 |

## 14. ප්‍රතිලාභ, හිමිකම් පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**දළ හිමිකම්පෑම් හඳුනාගැනීම**

පසුගිය වසර වලින් හිඟ හිමිකම්පෑම් සඳහා කවර හෝ ගැලපුමක් සහ අබලි ද්‍රව්‍යවල වටිනාකම් සඳහා අඩු කිරීමක් සමගින්, ජීවිත නොවන රක්ෂණ සඳහා දළ හිමිකම් පෑම්, වාර්තා වුවද නොවූවද, හිමිකම්පෑම් සැකසීම සහ පියවීම් සෘජුව සම්බන්ධ ආශ්‍රිත බාහිර හිමිකම්පෑම් කටයුතු ඇතුළුව වසර තුළ සිදු වූ සියලු හිමිකම් පෑම් වලින් සමන්විත වේ. කේවල හිමිකම් පෑම් ලිපිගොනු යොදාගනිමින් හිඟ හිමිකම් ඇගයුමට ලක් කෙරෙන අතර හිමිකම් පෑම් පියවීම් සඳහා වන අවසන් පිරිවැය ඇස්තමේන්තු ගත කෙරේ.

සෘජු රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් හිඟ හිමිකම්පෑම් සඳහා හිමිකම්පෑම් වියදම් සහ වගකීම් හඳුනාගැනේ. වගකීම් මගින් වාර්තා කරන ලද නමුත් පියවන නොලද, දරන ලද නමුත් වාර්තා කල නොලද IBNR හිමිකම්පෑම් සහ අදාල හිමිකම් පෑම් පියවීමේදී අපේක්ෂිත සෘජු හා වක්‍ර පිරිවැය ආවරණය වේ. අතීත අත්දැකීම් සහ ප්‍රවණතා මත පදනම්ව අනාගත වගකීම් පිළිබඳ වඩාත් යථාර්ථවාදී ඇස්තමේන්තුවක් තහවුරු කරනු පිණිස IBNR ආශ්‍රිත වෙන් කිරීම කාර්තුමය පදනමක් මත ආයු ගෙන තක්සේරුවකට ලක් කෙරේ.

දැනට පවතින තොරතුරු මත පදනම්ව හිමිකම්පෑම් සඳහා වෙන් කිරීම සාධාරණව ප්‍රකාශිත බවට අධ්‍යක්ෂවරුන් සලකන නමුත්, පසුව උද්ගතවන තොරතුරු සහ සිදුවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් පරම වගකීම වෙනස් විය හැක. එවැනි වටිනාකම් අදාළ කාල පරිච්ඡේදය සඳහා වන මූල්‍ය ප්‍රකාශ වල දක්වනු ලැබේ. යොදාගනු ලබන ක්‍රමවේදයන් සහ සිදු කරනු ලබන ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ.

**ප්‍රතිරක්ෂණ හිමිකම් පෑම් හඳුනාගැනීම්**
අදාල ගිවිසුමෙහි කොන්දේසි අනුව ආශ්‍රිත දළ රක්ෂණ හිමිකම් පෑම් හඳුනාගැනීමේදී ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් හඳුනාගැනේ.

ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුත්තේ සැලසුම් වර්ගීකරණය සැලකිල්ලට ගනිමින්, ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුත්ත සෘජු රක්ෂණ ව්‍යාපාර කටයුත්තක් ලෙස සලකමින් සමාන ආකාරයෙන්ම උපකල්පිත ප්‍රතිරක්ෂණය සම්බන්ධ හිමිකම්පෑම් ආදායම් හා වියදම් වශයෙන් හඳුනාගැනේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම් | - | - | **2,109,279** | 2,903,951 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කරගැනීමේ පිරිවැය | - | - | **554,068** | 537,986 |
| එකතුව | - | - | **2,663,347** | 3,441,937 |

## 15. වෙනත් මෙහෙයුම් වියදම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

දරන ලද පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතම ඉපැයීම් අතර සෘජු සම්බන්ධය මත පදනම්ව වෙනත් මෙහෙයුම් වියදම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. වසර සඳහා ලාභය නිර්ණය කිරීමේදී ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව යොදා ගැනීම සඳහා දරන ලද සියලු වියදම් ආදායම් ප්‍රකාශය වෙත අය කෙරේ.

**වගා රක්ෂණ බද්ද (CIL)**
(2013)) අංක (12) දරණ මූල්‍ය පනතේ වගන්ති (14) විධිවිධාන ප්‍රකාර, 2013 අප්‍රේල් පලවෙනි දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලද අතර, එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. මේ වන විට, වගා රක්ෂණ බද්ද බදු වලට පසු ලාභයෙන් 1% වශයෙන් ගෙවිය යුතු වේ.

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික**
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද ගාස්තු වලින් සමන්විත වේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | **3,863** | 6,269 | **7,919** | 13,143 |
| විගණකවරුන්ගේ වැටුප් | **7,385** | 7,385 | **13,321** | 13,487 |
| විගණකවරුන් වෙත විගණන නොවන ගෙවීම් | **1,888** | 1,641 | **2,216** | 4,912 |
| වෘත්තීය ගාස්තු | **12,155** | 24,119 | **24,821** | 32,069 |
| ප්‍රචාරණ ගාස්තු | **28,473** | 43,280 | **63,059** | 68,836 |
| නීති ගාස්තු | **11,666** | 16,915 | **12,042** | 17,048 |
| තැන්පතු රක්ෂණ වාරිකය | **151,868** | 141,843 | **151,868** | 141,843 |
| වගා රක්ෂණ බද්ද | **36,745** | 31,751 | **36,745** | 31,751 |
| ආයෝජන දේපළ මගින් උද්ගත වන මෙහෙයුම් වියදම් | - | - | **4,465** | 7,337 |
| කාර්යාල පරිපාලන සහ ආයතනික වියදම් | **1,358,816** | 1,815,041 | **1,731,602** | 2,234,647 |
| එකතුව | **1,612,859** | 2,088,244 | **2,048,058** | 2,565,073 |

## 16. මූල්‍ය සේවා මත බදු

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද**
2002 අංක (14) දරණ එකතු කළ අගය මත බදු පනත් සහ එයට පසුව සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කෙරේ. ගෙවිය යුතු ආදායම් බදු සහ දීමනා වලට පෙර ගිණුම් ගත ලාභය වෙත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පූර්ව නිර්දේශිත අනුපාතයන් මත ආර්ථික ක්ෂවීම් සඳහා ගැලපුම් සමගින් මූල්‍ය සේවා මත එකතු කළ අගය ගණනය කිරීම් සඳහා වන වටිනාකම් පදනම ගණනය කරනු ලැබේ. ගෙවිය යුතු දීමනා මුදල් ප්‍රතිලාභ, මුදල් නොවන ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ වලින් සමන්විත වේ. වර්තමාන වසර සඳහා අදාල වන මූල්‍ය සේවා මත එකතු අගය මත බදු අනුපාතය 15% වෙයි. (2020 - 15%).

**මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද**

200(9) අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව 2014 ජනවාරි පළමුවැනි දින සිට බලපැවැත්වෙන පරිදි පසුව සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කෙරේ. මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කෙරෙනුයේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සඳහා යොදා ගන්නා ලද අගය එකතු කිරීමෙන් සියයට දෙකක් වශයෙනි. (2019) දෙසැම්බර් පලවෙනි දින සිට වබලපැවැත්වෙන පරිදි ජාතිය ගොඩනැගීමේ බද්ද අහෝසි කෙරිණි.

**මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ ගාස්තුව**

(2018) අංක 35 දරණ මුදල් පනත අනුව, 2018 ඔක්තෝබර් පලවෙනි දින සිට බලපැවැත්වෙන පරිදි එක් එක් මූල්‍ය ආයතනය මගින් මූල්‍ය සේවා සැපයීම සඳහා ආරෝපණය කළ හැකි අගය එකතු කිරීම මත (7%) ක ණය ආපසු ගෙවීමේ ගාස්තුවක් හඳුන්වාදෙන ලදී. ඉහත විස්තර කරන ලද පරිදි ණය ආපසු ගෙවීමේ ගාස්තුව ද මූල්‍ය සේවා එකතු කල මත බදු ගණනය සඳහා යොදා ගන්නා ලද පදනමම භාවිත කරමින් අය කෙරේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී අය කරන ලද ණය ආපසු ගෙවීමේ ගාස්තුව පහත දැක්වේ. 2020 ජනවාරි පලවෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ණය ආපසු ගෙවීමේ ගාස්තුව අහෝසි කෙරිණි.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද | **1,222,628** | 1,280,414 | **1,270,773** | 1,245,046 |
| මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද | **-** | 127,682 | **3,193** | 191,122 |
| ණය ආපසු ගෙවීමේ ගාස්තුව | **-** | 594,364 | **-** | 594,364 |
| එකතුව | **1,222,628** | 2,002,460 | **1,273,966** | 2,030,532 |

GRI 207-1, 207-4

## 17. ආදායම් බදු වියදම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 12 - "ආදායම් බදු" අනුව, මෙම සටහනට බදු වියදම සම්බන්ධ ප්‍රධාන සංරචකයන්, බලාත්මක බදු අනුපාතයන් සහ බදු පෙර ලාභය සහ බදු වියදම අතර සැසඳීමක් ඇතුළත් වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 12 - "ආදායම් බදු" අනුව, ප්‍රවර්තන සහ විලම්බිත බදුකරණය සම්බන්ධයෙන් කාලපරිච්ඡේදය සඳහා ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී ඇතුළත් කරන ලද සමුච්චිත වටිනාකම බදු වියදම වේ.

**ප්‍රවර්තන බදු**

වටිනාකම ගණනය කිරීම සඳහා යොදා ගන්නා ලද බදු අනුපාතයන් සහ බදු නීති වාර්තාකරන දිනට ක්‍රියාත්මක කරන ලද හෝ සැලකිය යුතු අයුරින් ක්‍රියාත්මක කරන ලද ඒවා වන අතර එහිදී පෙර වසර ආශ්‍රිතව ගෙවිය යුතු බදු වෙත කවර හෝ ගැලපුමක් සිදුකෙරිණි.

ඒ අනුව, 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත සහ එය වෙත සිදුකරන ලද සංශෝධන, සහ 2018 අප්‍රේල් 01 සිට බලපැවැත්වෙන, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි විධිවිධානයන්ට අනුකූලව, බදු සඳහා ප්‍රතිපාදන පහත දක්වෙන අනුපාතයන් යටතේ බදුකරණ කාර්යයන් සඳහා ගලපන ලද වසර සඳහා ලාභය මත පදනම් වේ.

**විලම්බිත බදු**

විලම්බිත බදු පිළිබඳ ගිණුම්කරණ ප්‍රමිතීන් සම්බන්ධ විස්තරාත්මක හෙළිදරව් කිරීමක් පිටු අංක 262 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 44 හි දක්වේ.

| සමාගම | සටහන | පිටුව අංක | බදු අනුපාතය 2021 | 2020 |
|---|---|---|---|---|
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | | | **24%** | 24%-28% |
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | | **24%** | 24%-28% |
| පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමිටඩ් | | | **24%** | 24%-28% |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | | | **24%** | 24% - 28% |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | 17.1 | 200 | **20%-24%** | 20%-28% |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | 17.2 | 200 | **බදු නිදහස්** | බදු නිදහස් |
| ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | 17.3 | 200 | **40%** | 40% |

